# තුන්වැනි කොටස

# තුන්වැනි කොටස

## මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩ කටයුතු හා මෙහෙයුම්වලට අදාළ රජය හා මුදල් මණ්ඩලය විසින් වසර තුළදී උපයෝගී කරගනු ලැබූ පරිපාලන විධිවිධාන

### මෙහෙයුම් උපදෙස්, චක්‍රලේඛ, නියෝග සහ නිවේදන


| | | යොමු අංකය | පිටුව |
|---|---|---|---|
| **බැංකු අධීක්ෂණ** | | | |
| 1 | බැංකු පනත යටතේ විධානය 2017 අංක 01: මෝටර් රථ සම්බන්ධ ණය පහසුකම් සඳහා වටිනාකම මත ණය අනුපාතය | | 01 |
| 2 | බැංකු පනත යටතේ චක්‍රලේඛය 2017 අංක 01: බැංකු සේවා හා සම්බන්ධව 2017 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම | | 02 |
| 3 | බැංකු පනත යටතේ විධානය 2017 අංක 02: මෝටර් රථ සම්බන්ධ ණය පහසුකම් සඳහා වටිනාකම මත ණය අනුපාතය පිළිබඳ විධානයන් සඳහා සංශෝධනය | | 03 |
| 4 | බැංකු පනත යටතේ නිර්ණායකය 2017 අංක 01: බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කරන ලද සංශෝධිත උකස් තැබීමේ කොන්දේසි | | 03 |
| 5 | බැංකු පනත යටතේ චක්‍රලේඛය 2017 අංක 02: ණය පහසුකම් මත පොලී අනුපාත | | 04 |
| 6 | බැංකු පනත යටතේ චක්‍රලේඛය 2017 අංක 03: ගංවතුරින් හානියට පත් වූ ණය ගනුදෙනුකරුවන් වෙත ලබාදුන් ණය සඳහා සහන සැලසීම | | 05 |
| 7 | බැංකු පනත යටතේ විධානය 2017 අංක 04: මෝටර් රථ සම්බන්ධ ණය පහසුකම් සඳහා වටිනාකම මත ණය අනුපාතය පිළිබඳ විධානයන් සඳහා සංශෝධනය | | 06 |
| 8 | බැංකු පනත යටතේ නිර්ණායකය 2017 අංක 02: බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකුවල වාර්ෂික බලපත්‍ර ගාස්තු | | 06 |
| 9 | බැංකු පනත යටතේ විධානය 2017 අංක 05: බැංකු සඳහා වන අවම ප්‍රාග්ධන අවශ්‍යතාවන් ඉහළ නැංවීම | | 07 |
| 10 | බැංකු පනත යටතේ විධානය 2017 අංක 06: බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල මූල්‍ය ව්‍යුත්පන්න ගනුදෙනු | | 08 |
| 11 | බැංකු පනත යටතේ විධානය 2017 අංක 07: බලපත්‍රලාභී බැංකු විසින් ලබාගන්නා විදේශ ව්‍යවහාර මුදල් ණය | | 12 |
| **විදේශ විනිමය** | | | |
| 12 | විනිමය පාලන පනත යටතේ විධානයන් 2017 අංක 01: වෙනත් රටක ස්ථිර නේවාසික වීසා මත ශ්‍රී ලංකාවෙන් පිටත වාසික ශ්‍රී ලාංකිකයන්ට හා ද්විත්ව පුරවැසිභාවය ලබාගත් පුද්ගලයන්ට ණය ලබාදීම පිළිබඳ බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන් | | 14 |
| 13 | විනිමය පාලන පනත යටතේ විධානයන් 2017 අංක 02: වෙනත් රටක ස්ථිර නේවාසික වීසා මත ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරනු ලබන ශ්‍රී ලාංකිකයන්ට හා ද්විත්ව පුරවැසිභාවය ලබාගත් පුද්ගලයන් හට ලබාදෙන ණය පිළිබඳව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන් | | 15 |
| 14 | විනිමය පාලන පනත යටතේ විධානයන් 2017 අංක 07: අන්තර්ජාතික සේවා සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ සේවකයන් සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පිළිබඳව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන් | | 16 |

| | | යොමු අංකය | පිටුව |
|---|---|---|---|
| 15 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශෙෂ) : 2017 අංක 12 දරන විදේශ විනිමය පනත | 2043/31 | 16 |
| 16 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශෙෂ) : 2017 අංක 12 දරන විදේශ විනිමය පනත | 2045/56 | 17 |
| 17 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශෙෂ) : විදේශ විනිමය පනත යටතේ දැන්වීම | 2046/8 | 42 |
| 18 | විදේශ විනිමය පනත යටතේ විධානයන් 2017 අංක 01: ජංගම ගිණුම් සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන් | | 42 |
| 19 | විදේශ විනිමය පනත යටතේ විධානයන් 2017 අංක 02: විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත් සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන් | | 49 |
| 20 | විදේශ විනිමය පනත යටතේ විධානයන් 2017 අංක 03: පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන් | | 50 |
| 21 | විදේශ විනිමය පනත යටතේ විධානයන් 2017 අංක 04: ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන් | | 52 |
| 22 | විදේශ විනිමය පනත යටතේ විධානයන් 2017 අංක 05: රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (DFAs) හා රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම්. (DRAs) සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන් | | 54 |
| 23 | විදේශ විනිමය පනත යටතේ විධානයන් 2017 අංක 06: නේවාසික ආගන්තුකයින් සඳහා වන යෝජනා ක්‍රමය - (විශේෂිත ගිණුම්) පිළිබඳව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන් | | 55 |
| 24 | විදේශ විනිමය පනත යටතේ විධානයන් 2017 අංක 07: ජ්‍යෙෂ්ඨ විදේශීය ජාතිකයින්ගේ විශේෂ ගිණුම් පිළිබඳව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන් | | 57 |
| 25 | විදේශ විනිමය පනත යටතේ විධානයන් 2017 අංක 08: ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් පිළිබඳ බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන් | | 59 |
| 26 | විදේශ විනිමය පනත යටතේ විධානයන් 2017 අංක 09: ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන් සඳහා වූ ණය පහසුකම් සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන් | | 63 |
| 27 | විදේශ විනිමය පනත යටතේ විධානයන් 2017 අංක 10: විදේශයන්හි සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයන් හට ණය සහ අත්තිකාරම් ලබාදීම පිළිබඳව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන් | | 64 |
| 28 | විදේශ විනිමය පනත යටතේ විධානයන් 2017 අංක 11: ස්ථිර නේවාසික වීසා මත ශ්‍රී ලංකාවෙන් පිටත වාසික ශ්‍රී ලාංකිකයන් (PR) සහ ද්විත්ව පුරවැසිභාවය ලබා සිටින පුද්ගලයන් හට ලබාදෙන ණය පිළිබඳ බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන් | | 65 |
| 29 | විදේශ විනිමය පනත යටතේ විධානයන් 2017 අංක 12: බලයලත් වෙළෙඳුන් හා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා අනුමත නියෝජිතයින් ලෙස පත් කරන ලද ප්‍රාථමික වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන් | | 67 |
| 30 | විදේශ විනිමය පනත යටතේ විධානයන් 2017 අංක 13: ආමුඛ ආයෝජන ගිණුම් සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන් | | 68 |

| | | යොමු අංකය | පිටුව |
|---|---|---|---|
| 31 | විදේශ විනිමය පනත යටතේ විධානයන් 2017 අංක 14: ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන් | | 69 |
| 32 | විදේශ විනිමය පනත යටතේ විධානයන් 2017 අංක 15: බැංකු ඇපකර හෝ බැඳුම්කර, පොරොත්තු ණයවර ලිපි සහ සංස්ථාපිත බැඳුම්කර පිළිබඳ බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන් | | 73 |
| 33 | විදේශ විනිමය පනත යටතේ විධානයන් 2017 අංක 24: රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හා රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම් සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන් | | 74 |
| | **මූල්‍ය බුද්ධි ඒකකය** | | |
| 34 | චක්‍රලේඛය - 01/17 අවදානම මත පදනම් වූ පිවිසුම ප්‍රකාරව, සිදුකරන එතැන් පරීක්ෂණ සැලැස්ම 2017 | 37/06/001/0001/016 | 75 |
| 35 | චක්‍රලේඛය - 02/2017 : 2017 අංක 01 දරන මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් සඳහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ ත්‍රස්තවාදය සඳහා මුදල් සැපයීම වැළැක්වීමට අනුකූල වීමට බැඳී සිටීමේ මාර්ග නිර්දේශය | 37/05/002/0001/016 | 75 |
| | **ගෙවීම් සහ පියවීම්** | | |
| 36 | චක්‍රලේඛ අංක 01/2017: 2017 ජනවාරි මස 20 වැනි දින ලංකාසෙට්ල් පද්ධතියේ ගනුදෙනු වේලාවන් සීමා කිරීම | 34/07/029/0001/002 | 81 |
| 37 | චක්‍රලේඛ අංක 02/2017: 2017 ජනවාරි මස 26 සහ 27 යන දිනයන්හිදී ලංකාසෙට්ල් පද්ධතියෙහි සජීවී මෙහෙයුම් කටයුතු ප්‍රතිප්‍රාප්ති වැඩබිමෙහි සිට සිදු කිරීම | 34/07/029/0001/002 | 81 |
| 38 | චක්‍රලේඛ අංක 04/2017: 2017 පෙබරවාරි මස 2 සහ 3 යන දිනයන්හිදී ලංකාසෙට්ල් පද්ධතියෙහි සජීවී මෙහෙයුම් කටයුතු ප්‍රතිප්‍රාප්ති වැඩබිමෙහි සිට සිදු කිරීම | 34/07/029/0001/002 | 81 |
| 39 | චක්‍රලේඛ අංක 05/2017: 2017 පෙබරවාරි මස 17 වැනි දින ලංකාසෙට්ල් පද්ධතියේ ගනුදෙනු වේලාවන් සීමා කිරීම | 34/07/029/0001/002 | 82 |
| 40 | චක්‍රලේඛ අංක 06/2017: ලංකාසෙට්ල් පද්ධතියෙහි ව්‍යාපාරික වේලාවන් දීර්ඝ කිරීමේ ඉල්ලීම් | 34/07/029/0001/002 | 82 |
| 41 | චක්‍රලේඛ අංක 07/2017: ලංකාසෙට්ල් පද්ධතියෙහි පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමෙහි ව්‍යාපාර කටයුතු සීමා කිරීම | 34/07/029/0001/002 | 83 |
| 42 | චක්‍රලේඛ අංක 08/2017: විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ගනුදෙනුවල සහ අය කරන ගාස්තුවල උපරිම සීමාව | | 84 |
| 43 | චක්‍රලේඛ අංක 09/2017: ලංකාසෙට්ල් පද්ධතියේ දෛනික කාල සටහන සංශෝධනය කිරීම | 34/07/029/0001/002 | 84 |
| 44 | චක්‍රලේඛ අංක 10/2017: ශ්‍රී ලංකා මහ බැංකුව මගින් දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීමේදී ගනුදෙනුකරුවන්ගේ රජයේ සුරැකුම්පත් භාවිතා කිරීම වැළැක්වීම සඳහා පියවර ගැනීම | 34/07/029/0001/002 | 86 |
| 45 | චක්‍රලේඛ අංක 11/2017: 2017 නොවැම්බර් මස 10 වැනි දින ලංකාසෙට්ල් පද්ධතියෙහි සජීවී මෙහෙයුම් කටයුතු ප්‍රතිප්‍රාප්ති වැඩබිමෙහි සිට සිදු කිරීම | 34/07/029/0001/002 | 87 |
| | **රාජ්‍ය ණය** | | |
| 46 | රජයේ සුරැකුම්පත් ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනු අනිවාර්ය වාර්තාකරණය | | 87 |
| 47 | භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රාථමික නිකුතුන් සඳහා වන විධානයන් | 08/21/0005/0012/00 | 88 |

| | | යොමු අංකය | පිටුව |
|---|---|---|---|
| **ප්‍රාදේශීය සංවර්ධන** | | | |
| 48 | මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් සංශෝධනය | RDD/ CSDDLS/2013/01(A-04) | 96 |
| 49 | මෙහෙයුම් උපදෙස්: 'ස්වශක්ති - රැකියා දශ ලක්ෂයක් කරා' ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සංවර්ධනය හා රැකියා උත්පාදනය කිරීමේ ණය යෝජනා ක්‍රමය | RDD/SWASHAKTHI 2017/01 | 97 |
| 50 | ස්වයං රැකියා ප්‍රවර්ධන ණය යෝජනා ක්‍රමය අදියර II හි මෙහෙයුම් උපදෙස් සංශෝධනය | RDD/SEPI/2016/01 (සංශෝධනය) | 110 |
| 51 | කෘෂිකාර්මික අංශය නවීකරණ ව්‍යාපෘතිය | RDD/PCG/2017 | 111 |
| 52 | ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක 'තරුණ දිරිය' තාරුණ්‍ය සවිබල ගැන්වීම සහ රැකියා ව්‍යාපෘතියෙහි මෙහෙයුම් උපදෙස් | RDD/NADeP/YOUTH 2016/01 (සංශෝධනය) | 121 |
| 53 | මෙහෙයුම් උපදෙස්: ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන (NADeP) යටතේ ක්‍රියාත්මක 'ආපදා වලින් පසු ආර්ථික කටයුතු නැවත නගා සිටුවීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය' (PEARL) | RDD/NADeP/ PEARL/2017/01 | 121 |
| 54 | ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන 'තරුණ දිරිය' තාරුණ්‍ය සවිබල ගැන්වීමේ සහ රැකියා ව්‍යාපෘතිය හි මෙහෙයුම් උපදෙස් සංශෝධනය | | 126 |
| 55 | ස්වාභාවික ව්‍යසන මගින් හානියට පත් වූ ආර්ථික කටයුතු නැවත නගා සිටුවීම සඳහා වූ 'අත්වැල' ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් | RDD/READ/2017/01 | 127 |
| 56 | මෙහෙයුම් උපදෙස් සංශෝධන: 'ස්වශක්ති - රැකියා දශලක්ෂයක් කරා' ණය යෝජනා ක්‍රමය | RDD/SWASHAKTHI 2017/01 | 134 |
| **ක්ෂුද්‍ර මූල්‍ය ආයතන අධීක්ෂණ** | | | |
| 57 | ක්ෂුද්‍ර මූල්‍ය පනතේ විධාන, 2017 අංක 01: ව්‍යාපාර ස්ථාන විවෘත කිරීම, වසා දැමීම හා ස්ථානය වෙනස් කිරීම | | 135 |
| 58 | ක්ෂුද්‍ර මූල්‍ය පනතේ විධාන, 2017 අංක 02: ව්‍යුහාත්මක වෙනස්කම් | | 139 |
| **බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ** | | | |
| 59 | මුදල් ව්‍යාපාර පනත යටතේ විධානය 2017 අංක 01: මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබා දීමේදී වටිනාකම් මත ණය අනුපාත | | 140 |
| 60 | මුදල් ව්‍යාපාර පනත යටතේ විධානය 2017 අංක 02: අවම මූලික ප්‍රාග්ධනය | | 141 |
| 61 | මුදල් ව්‍යාපාර පනත යටතේ විධානය 2017 අංක 03: මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබා දීමේදී වටිනාකම් මත ණය අනුපාත විධානය සංශෝධනය කිරීම | | 141 |
| 62 | මුදල් ව්‍යාපාර පනත යටතේ විධානය 2017 අංක 04: මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබා දීමේදී වටිනාකම් මත ණය අනුපාත විධානය සංශෝධනය කිරීම | | 142 |
| 63 | චක්‍රලේඛ අංක 1/2017: ගංවතුරෙන් පීඩාවට පත් ගනුදෙනුකරුවන් වෙත ප්‍රදානය කර තිබූ ණය පහසුකම් සඳහා සහන සැලසීම | | 143 |
| 64 | කල්බදු මූල්‍යකරණ පනත යටතේ විධානය: 2017 අංක 1: මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබා දීමේදී වටිනාකම් මත ණය අනුපාත | | 144 |
| 65 | කල්බදු මූල්‍යකරණ පනත යටතේ විධානය: 2017 අංක 2: මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබා දීමේදී වටිනාකම් මත ණය අනුපාත විධානය සංශෝධනය | | 145 |
| 66 | කල්බදු මූල්‍යකරණ පනත යටතේ විධානය 2017 අංක 3: මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබා දීමේදී වටිනාකම් මත ණය අනුපාත විධානය සංශෝධනය | | 146 |

බැංකු පනත යටතේ නිකුත් කළ විධානය 2017 අංක 01 | 2017 ජනවාරි 13

# මෝටර් රථ සම්බන්ධ ණය පහසුකම් සඳහා වටිනාකම මත ණය අනුපාතය

**1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනතේ 46(1) සහ 76(ඒ)(1) යන වගන්ති ප්‍රකාරව නිකුත් කරන ලදී**

මෝටර් රථ මිලදී ගැනීම හෝ භාවිතය සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු මගින් ලබා දෙන ණය පහසුකම් සම්බන්ධයෙන්, වටිනාකම් මත ණය අනුපාත (LTV) ක්‍රියාවට නැංවීම උදෙසා, මුදල් මණ්ඩලය විසින් පහත සඳහන් විධානයන් නිකුත් කරන ලදී.

1. **බැංකු පනත යටතේ වන බලගැන්වීම**

1.1 මුදල් නීති පනතේ 46(1) සහ 76(ඒ)(1) වන වගන්ති ප්‍රකාරව බැංකු පද්ධතියේ ශක්තිමත් භාවය සහතික කිරීම සඳහා, සියලුම හෝ ඕනෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වෙත එම බැංකු ව්‍යාපාරයේ යම්කිසි ව්‍යාපාර කටයුත්තක් පවත්වාගෙන යෑම පිළිබඳ විධානයන් නිකුත් කිරීමට මුදල් මණ්ඩලය වෙත බලය පැවරී ඇත.

2. **උපරිම වටිනාකම් මත ණය අනුපාතය**

1.2 2017 ජනවාරි 16 දින සිට ක්‍රියාත්මක වන පරිදි සියලුම බලපත්‍රලාභී බැංකු විසින් මෝටර් රථ මිලදී ගැනීම හෝ භාවිතය සඳහා ලබා දෙන ණය පහසුකම්, එම වාහනවල වෙළඳපොළ වටිනාකම මත පහත සඳහන් අනුපාතයන් නොඉක්මවිය යුතුය.

(i) ලියාපදිංචි නොකළ වාහන සහ මෙරට තුළ ලියාපදිංචි කර වසරකට නොවැඩි වාහන සඳහා;

(අ) ව්‍යාපාරික වාහන (ලොරි සහ බර වාහන) සඳහා 90%

(ආ) මෝටර් කාර්, ක්‍රීඩා උපයෝගිතා වාහන (SUVs) සහ වෑන් රථ සඳහා 50%

(ඇ) ත්‍රී රෝද රථ සඳහා 25%

(ඈ) අනෙකුත් වාහන සඳහා 70%

(ii) ප්‍රථම ලියාපදිංචියෙන් අනතුරුව ශ්‍රී ලංකාව තුළ වසරකට වැඩි කාලයක් භාවිත කරන ලද සියලුම වාහන සඳහා 70%

3. **උපරිම වටිනාකම් මත ණය අනුපාතය-න්ගෙන් නිදහස් කිරීම්**

3.1 ඉහත විධාන අංක 2 හි සඳහන් ණය සීමාවන්, සංචාරක ක්ෂේත්‍රයේ හෝ ප්‍රවාහන/ගමනාගමන ක්ෂේත්‍රයේ ප්‍රධාන-ව්‍යාපාරික කටයුතු (core business) උදෙසා යොදා ගැනීම පිණිස මෝටර් රථ සමූහ (vehicle fleet) මිලදී ගැනීම සඳහා ණය පහසුකම් ලබා ගැනීමේ දී අදාළ නොවන අතර, එසේ මිලදී ගන්නා මෝටර් රථ ලියාපදිංචියේ සිට වසරක් ගතවීමට පෙර වෙනත් පුද්ගලයෙකුට හෝ ආයතනයක් වෙත පැවරිය නොහැකි වේ.

3.2 බලපත්‍රලාභී බැංකුවලට මෙම වාහන කාණ්ඩ සඳහා අභ්‍යන්තර සීමාවන් පවත්වාගත හැකි අතර, ප්‍රමාණවත් පරිදි අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ගයන් යොදාගත යුතුය.

4. **මෝටර් රථ සඳහා වන අනෙකුත් ණය පහසුකම්**

4.1 ඉහත සඳහන් විධාන අංක 2 සහ 3 හි යටතේ ඇති ණය පහසුකම්වලට අමතරව මෝටර් රථ මිලදී ගැනීම හෝ භාවිතය සඳහා බලපත්‍රලාභී බැංකු විසින් වෙනත් ණය පහසුකම් ලබා නොදිය යුතුය.

5. **අර්ථ දැක්වීම**

5.1 මෙහි විධානයන්හි :

(i) ණය පහසුකම් යනුවෙන් අදහස් වන්නේ මෝටර් රථ මිලදී ගැනීම හෝ භාවිතය සඳහා ලබාදෙනු ලබන, මූල්‍ය කල් බදු, කුලී පිට ගැනුම් සහ අනෙකුත් සියලුම ණය පහසුකම්ය.

(ii) මෝටර් රථයේ වටිනාකම ලෙස සැලකිය යුත්තේ අදාළ ණය පහසුකම ලබා දෙන අවස්ථාවේ දී පවත්නා රීතිය අනුව වෘත්තීමය තක්සේරුකරුවකු වෙතින් ලබාගන්නා ලද වෙළඳපොළ වටිනාකම වේ.

6. **පෙර පැවති විධානයන් අහෝසි කිරීම**

6.1 පහත සඳහන් විධානයන් මෙයින් අහෝසි කෙරේ.

(i) බැංකු පනත යටතේ නිකුත් කරන ලද, 2015 විධාන අංක 02 දරන මෝටර් රථ මිලදී ගැනීම හෝ භාවිතය සඳහා වන ණය පහසුකම් සහ අත්තිකාරම් සඳහා වන වටිනාකම් මත ණය අනුපාතය.

(ii) බැංකු පනත යටතේ නිකුත් කරන ලද, 2015 විධාන අංක 03 දරන මෝටර් රථ මිලදී ගැනීම හෝ භාවිතය සඳහා වන ණය පහසුකම් සහ අත්තිකාරම් සඳහා වන වටිනාකම් මත ණය අනුපාතය.

අත්සන් කළේ
ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
**මුදල් මණ්ඩලයේ සභාපති සහ**
**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති**

බැංකු පනත යටතේ නිකුත් කළ චක්‍රලේඛය 2017 අංක 01 2017 පෙබරවාරි 01

## බැංකු සේවා හා සම්බන්ධව 2017 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම

පහතින් දැක්වෙන බැංකු සේවා අවශ්‍යතා සඳහා 2017 අයවැයේ දී අනුමත කළ ජාතික ප්‍රතිපත්තියට ඔබගේ අවධානය යොමු කරන අතර, එම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු පියවර අනුගමනය කරන මෙන් සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතින් ඉල්ලා සිටිමු.

1. හඳුනාගත් අංශ සඳහා ණය ලබා දීම

1.1 බලපත්‍රලාභී බැංකු විසින් අදාළ අංශ වෙත ලබාදී ඇති ණය ප්‍රමාණය, මුළු ණය ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස ගත් කල, පහතින් දක්වා ඇති ප්‍රතිශතයන්ට වඩා අඩු නොවිය යුතු වේ.

(i) අපනයන හා සංචාරක කටයුතු, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා 10%

(ii) දැනට පවත්නා චක්‍රලේඛයන්ට අනුකූලව කෘෂිකර්මාන්තය සඳහා 10%

(iii) තරුණ හා කාන්තා ණය අවශ්‍යතා සඳහා 5% බැගින්

2. බැංකු සේවා වැඩිදියුණු කිරීම

2.1 බැංකු ශාඛා විසින් යම්කිසි ප්‍රදේශයක් තුළ ව්‍යාපාර සංවර්ධනය සඳහා ලබාදෙන ණය, අදාළ බැංකු ශාඛාවේ එම ප්‍රදේශයට අදාල තැන්පතුවලින් 15% ට නොඅඩු විය යුතුය.

2.2 බැංකු විසින් රු.මි. 5 ට වඩා අඩු ණය ලබාදීමේ දී මාසයක් තුළ අදාළ ණය මුදල ලබා දිය හැකි වන ආකාරයට පවත්නා ණය ලබා දීමේ ක්‍රියාවලිය නව්‍යකරණය කළ යුතුය.

2.3 අවම වශයෙන් සෑම දිස්ත්‍රික්කයකම එක් ශාඛාවක් හෝ ආගමික නිවාඩු දින හැරුණු විට සතියේ දින හත තුළම විවෘතව තැබිය හැකිය.

3. අර්ථ දැක්වීම

3.1 කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සංවර්ධනය කිරීමේ අරමුණින් අනුගමනය කරන ජාතික ප්‍රතිපත්ති රාමුවේ දක්වා ඇති නිර්වචනය අනුව මෙම චක්‍රලේඛය සඳහා, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් ලෙස සලකනු ලබන්නේ වාර්ෂික පිරිවැටුම රු.මි. 750 නොඉක්මවන ව්‍යවසායකයින් වේ.

3.2 කෘෂිකාර්මික අංශයට අදාළව සියලු ණය ලබාදීම් බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂක විසින් මීට ඉහතදී නිකුත් කළ කෘෂිකාර්මික අංශයට අනිවාර්ය ණය ලබාදීම් පිළිබඳ චක්‍රලේඛ හා බැඳේ.

3.3 මෙම චක්‍රලේඛයට අනුකූල වීම සඳහා ඉහත සඳහන් අංශවලට ණය වර්ගීකරණය කිරීමේ දී හඳුනාගත් අංශ අතර එක් වාරයකට වඩා වැඩියෙන් සටහන් වන අවස්ථාවේදී (overlap) ඉහත අංක 1 හි සඳහන් අංශ යටතේ ඇතැම් ණය ගැනුම්කරුවන් එක් අංශයකට වඩා වැඩියෙන් ඇතුළත් විය හැකිය.

4. වාර්තා කිරීම

4.1 මෙම ජාතික ප්‍රතිපත්තිය සඳහා බැංකුවල අනුකූලතාවය නිරීක්ෂණය කිරීම පිණිස සෑම බලපත්‍රලාභී බැංකුවක් විසින්ම ඉහත අංක 1 යටතේ සඳහන් තොරතුරු බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වෙත 2017 ජූලි මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි සෑම කාර්තුවක අවසානයේ සිට දින 30 ඇතුළතදී ඇමුණුමේ සඳහන් ආකෘතියට අනුකූල වන පරිදි වාර්තා කළ යුතු වේ.

අත්සන් කළේ,
ඒ ඒ එම් තසීම්
අධ්‍යක්ෂ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව

ඇමුණුම I

### 2017 අයවැයට අනුව අංශ අතර ණය බෙදාහැරීම

බැංකුවේ නම ..........................................................................................................................................

දිනට තත්ත්වය ..........................................................................................................................................

| අංශය | | ලබා දී ඇති ණය (රු.මි.) | මුළු ණය ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| 1 | කෘෂිකර්මාන්තය | | |
| 2 | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් | | |
| 3 | අපනයන | | |
| 4 | සංචාරක | | |
| 5 | තරුණ | | |
| 6 | කාන්තා | | |

සටහන 1 : 2017 පෙබරවාරි 01 දින චක්‍රලේඛ අංක 01/2017 දරණ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයට යොමු වේ.
සටහන 2 : ඉහත විස්තර සෑම කාර්තුවක් අවසානයේ දින 30 ක් ඇතුළත banksup@cbsl.lk ඊමේල් ලිපිනයට යොමු කළ හැකිය.

දිනය: ......................................................... .........................................................

බලයලත් නිලධාරියාගේ නම සහ තනතුර

බැංකු පනත යටතේ නිකුත් කළ විධානය 2017 අංක 02 2017 පෙබරවාරි 15

## මෝටර් රථ සම්බන්ධ ණය පහසුකම් සඳහා වටිනාකම මත ණය අනුපාතය පිළිබඳ විධානයන් සඳහා සංශෝධනය

2017 අංක 01 දරන බැංකු පනත් විධානයන්හි, 5 වන විධානයේ අර්ථකථනයන් පහත පරිදි සංශෝධනය කර ආදේශනය කරන ලදී.

5.1 ණය පහසුකම් යන්නෙන් අදහස් වන්නේ මෝටර් රථ මිලදී ගැනීම හෝ භාවිතය සඳහා ලබාදෙනු ලබන, මූල්‍ය කල් බදු පහසුකම්, කුලී පිට ගැනුම් පහසුකම් සහ අනෙක් සියලුම ණය පහසුකම්ය.

5.2 මෝටර් රථයේ වටිනාකම වෙළඳපොළ වටිනාකම් විය යුතුය. බලපත්‍රලාභී බැංකු විසින් පහත ආකාරයෙන් මෝටර් රථ තක්සේරු කිරීම සිදු කළ හැක.

(i) නවතම මෝටර් රථ - බලය ලත් නියෝජිතයන් විසින් ලබාදෙනු ලබන තක්සේරු අගය

(ii) අලුත්වැඩියා කර සැකසූ මෝටර් රථ - රේගු වටිනාකම හෝ විකුණුම්කරු විසින් ලබාදෙන ලද ඉන්වොයිස් වටිනාකම

(iii) ලියාපදිංචි කරන ලද මෝටර් රථ - වෘත්තීමය තක්සේරුකරුවකු විසින් ලබාදුන් වටිනාකම

5.3 බලපත්‍රලාභී බැංකු විසින් ණය පහසුකම් ලබාදෙන අවස්ථාවේදී නිවැරදි සහ සාධාරණ තක්සේරු වටිනාකමක් ලබාගැනීම තහවුරු කරගත යුතුය.

5.4 මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති වාහන පංතීන්, මෙම විධානය සඳහා පහත වගුව - 1 හි සඳහන් වන පරිදි වර්ගීකරණය කළ හැක.

| වාහන කාණ්ඩය | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වර්ගීකරණය | වටිනාකම මත ණය අනුපාතය |
|---|---|---|
| ව්‍යාපාරික වාහන (ලොරි සහ බර වාහන) | C1, C, CE, DE, G1, G, J | 90% |
| මෝටර් කාර්, ක්‍රීඩා උපයෝගීතා වාහන (SUVs) සහ වෑන් රථ | B, D1, D | 50% |
| ත්‍රී රෝද රථ | B1 | 25% |
| අනෙකුත් වාහන | A1, A | 70% |

5.5 විධාන 3.1 හි වාහන සමූහයක් (fleet of vehicles) යන්නෙන් අදහස් වන්නේ වාහන දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවකි.

5.6 විධාන 3.1 හි සංචාරක ව්‍යාපාරයේ යෙදෙන ආයතනයක් යන්නෙන් අදහස් කෙරෙන්නේ, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ හෝ වෙනයම් අධිකාරියක සංචාරක කර්මාන්තය හා අදාළ සේවාවන් ලබා දීම සඳහා ලියාපදිංචි සේවා සපයන ආයතනයක් වේ.

5.7 විධාන 3.1 හි ප්‍රවාහන ක්ෂේත්‍රයට සම්බන්ධ ආයතනයක් යන්නෙන් අදහස් කෙරෙන්නේ, ප්‍රවාහන හෝ ගමනාගමන සේවාවන් සඳහා රජයේ අධිකාරියක ලියාපදිංචි වූ ඕනෑම ව්‍යාපාරික ආයතනයක් වේ.

5.8 2017 ජනවාරි 16 වන දින හෝ ඊට පෙර බලපත්‍රලාභී බැංකුවක් අනුමත කළ හෝ අයදුම්පත් බාරගෙන තිබූ සියලු රථවාහනන සඳහා වන ණය පහසුකම් සඳහා 70% වටිනාකම මත වන ණය අනුපාතයක් අනුමත කළ හැක.

අත්සන් කළේ,
ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
**මුදල් මණ්ඩලයේ සභාපති සහ**
**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති**

බැංකු පනත යටතේ නිකුත් කළ නිර්ණායකය 2017 අංක 01 2017 මාර්තු 22

## බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කරන ලද සංශෝධිත උකස් තැබීමේ කොන්දේසි

1988 අංක 30 දරණ සංශෝධිත බැංකු පනතෙහි 83 A වගන්තියට අනුකූලව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය මගින් කරනු ලබන නිර්ණය.

1988 අංක 30 දරණ සංශෝධිත බැංකු පනතෙහි 83 A වගන්තියට අනුකූලව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත පැවරී ඇති බලතල අනුව නිකුත් කරනු ලබන පහත සඳහන් කොන්දේසි මගින් 1998 සැප්තැම්බර් 07 වන දින බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කරනු ලැබූ උකස් කොන්දේසි මෙසේ සංශෝධනය කරනු ලැබේ.

2 පහත සඳහන් නව කොන්දේසි 1998 සැප්තැම්බර් 07 වන දින බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කරනු ලැබූ උකස් කොන්දේසි පිළිබඳ 15(8) වන වගන්තියට පසුව ඇතුළත් විය යුතුය.

උකස් භාණ්ඩ විකිණීම

15(9) උකස් භාණ්ඩය හෝ උකස් භාණ්ඩවල මුළු වෙන්දේසි වටිනාකම රුපියල් 500,000 හෝ ඊට වැඩි වන අවස්ථාවකදී උකස් ගැනුම්කරු විසින් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත මෙහි සඳහන් ඇමුණුම් 8 හි ආකෘතියට අනුකූල වන පරිදි සෑම මසකම අවසානයේ සිට දින 15 ක් ඇතුළත හෝ ඊට පෙර වාර්තා කළ යුතුය.

15(10) විශාල ප්‍රමාණයක රත්තරන් මිලදී ගැනීම සඳහා පාර්ශ්වයන් දෙකක් හෝ ඊට වඩා වැඩි සංඛ්‍යාවක් අතර වංචා සහගත එකඟතාවක් පිළිබඳ යම්කිසි සැක කටයුතු තත්ත්වයක් පැන නැගුණහොත් ඒ පිළිබඳව උකස් ගැනුම්කරු විසින් වාර්තා කළ යුතුය.

15(11) 2006 අංක 06 දරණ මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතට අනුව, උකස් භාණ්ඩ වෙන්දේසි කරන අවස්ථාවන්වලදී උකස් භාණ්ඩ මිලදී ගැනීම සම්බන්ධයෙන් පැන නගින සැක කටයුතු ගනුදෙනු උකස් ගැනුම්කරු විසින් හඳුනා ගෙන බැංකුවේ අනුකූලතා නිලධාරියා හරහා මූල්‍ය බුද්ධි අංශ අධ්‍යක්ෂ වෙත වාර්තා කළ යුතුය. සැක කටයුතු ගනුදෙනුවල අර්ථ නිරූපණයන් සඳහා 2006 අංක 06 දරණ මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ කාණ්ඩ 6, 7 සහ 2012 මාර්තු 22 දින මූල්‍ය බුද්ධි අංශයේ අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ 03/12 අදාළ වේ.

අත්සන් කළේ,
ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
**මුදල් මණ්ඩලයේ සභාපති සහ**
**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති**

(පරිච්ඡේය 15(9)) **8 වන උපලේඛනය.**

**ලබා දී ඇති සීමාව ඉක්මවා සිදු කෙරෙන උකස් ගත් රන් භාණ්ඩ තොග අලෙවි කිරීම් පිළිබඳ විස්තර වාර්තා කිරීම**

බැංකුවේ නම : ................................................................................

වර්ෂය : ............................................ මාසය : ............................................

| වෙන්දේසිය පැවැත්වූ දිනය | ගැනුම්කරු පිළිබඳ විස්තර | | | බැංකු ශාඛාව හා ස්ථානය | බර | වටිනාකම |
|---|---|---|---|---|---|---|
| | නම | ජා.හැ.අංකය | ලිපිනය | | | |
| | | | | | | |
| | | | | | | |

සෑම මසකම අවසානයේ සිට දින 15 ක් තුළ මෙම තොරතුරු banksup@cbsl.lk යන ලිපිනයට විද්‍යුත් තැපැල මාර්ගයෙන් යොමු කළ යුතුය.

දිනය: ............................................ ............................................

බලයලත් නිලධාරියාගේ නම සහ තනතුර

**බැංකු පනත යටතේ නිකුත් කළ චක්‍රලේඛය 2017 අංක 02** 2017 මැයි 26

## ණය පහසුකම් මත පොලී අනුපාත

2017 ජූලි 01 දින සිට බලාත්මක වන පරිදි බලපත්‍රලාභී බැංකු විසින් ලබාදෙනු ලබන ණය කාඩ්පත්, අනෙකුත් ණය පහසුකම්, අත්තිකාරම් සඳහා වන පොලී අනුපාත සහ හිඟහිටි ණය මුදල් සහ අත්තිකාරම් මත දඩ පොලී අනුපාතයන් අයකිරීම පිළිබඳ මුදල් මණ්ඩලයේ උපදෙස්.

1. පොලී අනුපාත

1.1 2017 ජූලි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි බලපත්‍රලාභී බැංකු විසින් ස්වකීය ප්‍රතිපත්තීන්ට අනුකූල වන පරිදි ණය පහසුකම් සඳහා අය කෙරෙන පොලී අනුපාතයන් අර්පණය කිරීම හෝ සංශෝධනය කිරීම සිදු කළ හැකිය.

2. ප්‍රමාණවත් හෙළිදරව් කිරීම්

2.1 බලපත්‍රලාභී බැංකු විසින් පහත තොරතුරු ප්‍රකාශයට පත් කළ යුතුය.

(i) ණය පහසුකම් පිළිබඳව යම් මාධ්‍යයක ප්‍රවර්ධනය කරනන සෑම අවස්ථාවකදීම ඒ සඳහා අදාළ වන වාර්ෂික පොලී අනුපාතයන් පැහැදිලි ලෙස ප්‍රදර්ශනය කළ යුතුය.

(ii) අදාළ වන වාර්ෂික දඩ පොලී අනුපාතයන් පවතී නම් එම අනුපාතයන් සහ ඒවා ගණනය කරනු ලබන පදනම මහජනතාවගේ දැනගැනීම පිණිස අවම වශයෙන් බැංකු වෙබ් අඩවිය තුළ හෝ පළ කළ යුතු අතර, එම අනුපාතයන් වර්තමාන අගයන් පෙන්නුම් කරන පරිදි නිරන්තරයෙන් යාවත්කාලීන කළ යුතුය.

2.2 බලපත්‍රලාභී බැංකු විසින් පහත දැක්වෙන දෑ ගනුදෙනුකරුවන් හට දැනුම් දිය යුතුය.

(i) අදාළ ණය ගනුදෙනුකරුවන් සමඟ ණය ලේඛන සම්පූර්ණ කිරීමට පෙර ණය ගනුදෙනුව සඳහා අදාළ පොලී අනුපාතයන්

(ii) පවත්නා ණය ගනුදෙනු සඳහා පොලී අනුපාතයන් පසුව වෙනස් කරන අවස්ථාවන්හි එම නව අනුපාතයන් ක්‍රියාත්මක කිරීමට පෙර ඒ පිළිබඳව

(iii) දඩ පොලී අය කිරීමට ප්‍රථමයෙන් ඒ සඳහා අදාළ වන දඩ පොලී අනුපාතයන් හා එම දඩ පොලී අනුපාතයන් ගණනය කිරීමේ පදනම

| | | |
|---|---|---|
| 3. දඩ පොලී ගණනය කිරීමේ පදනම | 3.1 | දඩ පොලී ඇත්නම්, එය හිඟහිටි කාල සීමාව සඳහා හිඟිටි අදාළ ණය ප්‍රමාණය සඳහා පමණක් අය විය යුතුය. |
| 4. සතිපතා වාර්තාකරණය | 4.1 | සියලු ණය අත්තිකාරම් සඳහා පොලී මෙන්ම දඩ පොලී අනුපාතයන් අන්තර්ජාල විතැන් පරීක්ෂණ පද්ධතිය (Web Based Off-Site Surveillance System return BSD-WF-13-IF-Interest Rates) හරහා වාර්තා කළ යුතුය. |
| 5. පූර්ව චක්‍රලේඛයන් අහෝසි කිරීම | 5.1 | බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති පොලී අනුපාතයන් සඳහා අදාළ වන පහත සඳහන් චක්‍රලේඛ මෙයින් අහෝසි කරනු ලැබේ.<br>(i) පොලී අනුපාතයන් අඩු කිරීම පිළිබඳව නිකුත් කර ඇති 2010 සැප්තැම්බර් 21 දිනැති චක්‍රලේඛ අංක 02/17/600/002/001<br>(ii) ණය පත් සහ නිවාස ණය සඳහා වන පොලී අනුපාත පිළිබඳව නිකුත් කර ඇති 2012 අප්‍රේල් 17 දිනැති චක්‍රලේඛ අංක 02/17/600/002/001<br>(iii) ණය පත් සහ අනෙකුත් ණය සහ අත්තිකාරම් සඳහා වන පොලී අනුපාතයන් පිළිබඳව නිකුත් කර ඇති 2013 ජූනි 07 දිනැති චක්‍රලේඛ අංක 02/17/600/002/001<br>(iv) දඩ පොලී අනුපාත මත සීමාවන් පිළිබඳව නිකුත් කර ඇති 2013 ජූලි 26 දිනැති චක්‍රලේඛ අංක 02/17/600/002/001 |

අත්සන් කළේ,
ඒ ඒ එම් තසීම්
අධ්‍යක්ෂ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව

බැංකු පනත යටතේ නිකුත් කළ චක්‍රලේඛය 2017 අංක 03  2017 මැයි 29

## ගංවතුරින් හානියට පත්වූ ණය ගනුදෙනුකරුවන් වෙත ලබාදුන් ණය සඳහා සහන සැලසීම

පසුගිය දිනවල පැවති ගංවතුර, අයහපත් කාලගුණික තත්ත්වයන් සහ ඊට සම්බන්ධ සිද්ධීන් නිසා හානියට පත් ව්‍යාපාර හා සාමාන්‍ය කටයුතු යළි නගාසිටුවීමේ ජාතික ප්‍රතිපත්තිය යටතේ එකී හානියට පත්වූ ණය ලබාගත් ගනුදෙනුකරුවන් සඳහා ඒ ඒ අවස්ථානුකූලව පහත සඳහන් සහනයන් ලබාදිය හැකිය.

| | | |
|---|---|---|
| 1. සහන කාලය | 1.1 | අද දින සිට ක්‍රියාත්මක වන පරිදි ගංවතුර, අයහපත් කාලගුණික තත්ත්වයන් සහ ඊට සම්බන්ධ සිද්ධීන් නිසා හානියට පත් ණය ගනුදෙනුකරුවන්ගේ 2017 මැයි 25 දින තෙක් පැවති සක්‍රීය ණය පහසුකම් සඳහා මාස 3 කට නොවැඩි සහන කාලයක් ලබාදීම. |
| 2. දඩ පොලී | 2.1 | ඉහත සඳහන් සහන කාලයට යටත් වන ණය ගනුදෙනුකරුවන්ගේ සහ ඉහත පරිදි හානියට පත් අක්‍රීය ණය ගනුදෙනුකරුවන්ගේ ව්‍යාපාර කටයුතු නැවත ආරම්භ කිරීම/ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අදාළ බැංකුව සමඟ ගිවිසගත් යළි සැකසූ කොන්දේසි (Rescheduled Terms) මත ගෙවා දැමීමට කැමති අවස්ථාවලදී නොගෙවූ ණය මත පනවා ඇති දඩ පොලී කපා හැරීම. |
| 3. වාර්තාකරණය | 3.1 | බලපත්‍රලාභී බැංකු විසින් ඉහත සඳහන් සහන ලබාදීම පිළිබඳ අවශ්‍ය ලේඛන පවත්වාගත යුතුය. |
| | 3.2 | බලපත්‍රලාභී බැංකු විසින් එකී ණය ගනුදෙනුකරුවන් පිළිබඳ විස්තර පහත ඇමුණුමේ සඳහන් ආකෘතියට අනුව 2017 ජූනි 30 වන දිනට පෙර අධ්‍යක්ෂ, බැංකු අධීක්ෂණ වෙත ලැබීමට සැලැස්විය යුතුය. |

අ.කළේ/ වැ.බ. බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ

ඇමුණුම

2017 චක්‍රලේඛ අංක 03

**ගංවතුරන් හානියට පත්වූ ණය ගනුදෙනුකරුවන් වෙත ලබා දුන් ණය සඳහා සහන සැලසීම.**

මෑතකදී ගංවතුරින් හානියට පත්වූ ණය ගනුදෙනුකරුවන් පිළිබඳ තොරතුරු

බැංකුවේ නම : ..............................................................................................

| අනුක්‍රමික අංකය | ණය ගනුදෙනුකරුගේ නම | ශාඛාව | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ණය පහසුකම පිළිබඳ විස්තරය | 2017.05.25 වන දිනට ශේෂය (රු.'000) |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |

ඉහත වාර්තාවේ සඳහන් සියලුම තොරතුරු මගේ දැනුම හා විශ්වාසය අනුව නිවැරදි බවට සහතික කරමි.

.............................................................................

බලයලත් නිලධාරියාගේ නම සහ තනතුර

මෙම ආකෘති පත්‍රය 2017 ජූනි 30 වන දිනට පෙර dbsd@cbsl.lk යන විද්‍යුත් ලිපිනයට ලැබීමට සලස්වන්න.

**බැංකු පනත යටතේ නිකුත් කළ විධානය 2017 අංක 04** 2017 මැයි 31

## මෝටර් රථ සම්බන්ධ ණය පහසුකම් සඳහා වටිනාකම මත ණය අනුපාතය පිළිබඳ විධානයන් සඳහා සංශෝධනය

2017 අංක 02 දරන මෝටර් රථ සම්බන්ධව වන වටිනාකම මත ණය අනුපාතය පිළිබඳ සංශෝධිත බැංකු පනත් විධානයන්හි 5.1 සහ 5.4 වන විධානයන් පහත පරිදි සංශෝධනය කර ආදේශනය කරන ලදී.

5. අර්ථ දැක්වීම 5.1 ණය පහසුකම් යන්වෙන් අදහස් වන්නේ අවසන් පාරිභෝගිකයන් වෙත මෝටර් රථ මිලදී ගැනීම හෝ භාවිතය සඳහා ලබා දෙනු ලබන, මූල්‍ය කල් බදු පහසුකම්, කුළී පිට ගැනුම් පහසුකම් සහ අනෙක් සියලුම ආකාරයේ ණය පහසුකම්ය.

5.4 මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව (DMT) විසින් නිකුත් කර ඇති වාහන පංතීන්, මෙම විධානය සඳහා පහත වගුව - 1 හි සඳහන් වන පරිදි වර්ගීකරණය කළ හැක.

**වගුව - 1 - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වර්ගීකරණයට අදාළ වාහන කාණ්ඩ**

| වාහන කාණ්ඩය | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වර්ගීකරණය | වටිනාකම මත ණය අනුපාතය |
|---|---|---|
| ව්‍යාපාරික වාහන (ලොරි සහ බර වාහන) | C1, C, CE, DE, D1, D, G1, G, J | 90% |
| මෝටර් කාර්, ක්‍රීඩා උපයෝගීතා වාහන (SUVs) සහ වෑන් රථ | B (සැහැල්ලු ට්‍රක් රථ සහ ඒකල කැබ් රථ - single cabs) හැර | 50% |
| ත්‍රී රෝද රථ | B1 | 25% |
| අනෙකුත් වාහන | A1, A කාණ්ඩය යටතේ වර්ගීකරණය කළ සැහැල්ලු ට්‍රක් රථ සහ ඒකල කැබ් රථ - (single cabs) | 70% |

අත්සන් කළේ,
ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
**මුදල් මණ්ඩලයේ සභාපති සහ**
**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති**

**බැංකු පනත යටතේ නිකුත් කළ නිර්ණායකය 2017 අංක 02** 2017 සැප්තැම්බර් 19

## බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකුවල වාර්ෂික බලපත්‍ර ගාස්තු

1988 අංක 30 දරණ සංශෝධිත බැංකු පනතේ 8 වන හා 76 D (6) යන වගන්ති ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය මගින් නිකුත් කරන ලද නිර්ණායකය

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු 2018 ලිත් වර්ෂයට අදාළ බලපත්‍ර ගාස්තුව, 2018 ජනවාරි 31 ට හෝ එදිනට පෙර, 2017 වර්ෂාවසානයට බැංකුවෙහි ඇති මුළු වත්කම් පදනම් කරගෙන පහත සඳහන් වගුව පරිදි ගෙවිය යුතු යැයි බැංකු පනතේ 8(1) හා 76 D (6) වගන්ති ප්‍රකාරව, මුදල් මණ්ඩලය විසින් තීරණය කර ඇත.

| 2017 වර්ෂාවසානයට මුළු වත්කම් (රු.බි.) | බලපත්‍ර ගාස්තු (රු.මි.) |
|---|---|
| 750 ට වැඩි | 30.0 |
| 500 ට වැඩි - 750 දක්වා | 25.0 |
| 200 ට වැඩි 500 දක්වා | 22.0 |
| 125 ට වැඩි 200 දක්වා | 16.5 |
| 75 ට වැඩි 125 දක්වා | 11.0 |
| 25 - 75 දක්වා | 5.5 |
| 25 ට අඩු | 2.2 |

1989.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි ගෙවිය යුතු බලපත්‍ර ගාස්තු මත වූ බැංකු පනතේ 8 වන වගන්තිය සම්බන්ධයෙන් නිකුත් කර ඇති, බැංකු පනතේ නිර්ණායකයන්හි පරිච්ඡේද අංක 01, මෙමගින් අවලංගු කෙරේ.

අත්සන් කළේ,
ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
**මුදල් මණ්ඩලයේ සභාපති සහ**
**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති**

බැංකු පනත යටතේ නිකුත් කළ විධානය 2017 අංක 05 2017 ඔක්තෝබර් 26

# බැංකු සඳහා වන අවම ප්‍රාග්ධන අවශ්‍යතාවන් ඉහළ නැංවීම

2006 අංක 46 දරණ බැංකු පනත මගින් අවසන් වරට සංශෝධිත 1988 අංක 30 දරණ බැංකු පනතේ 46(1) සහ 76(ඒ) (1) හා සබැඳිව කියැවෙන 19(3) සහ 76උ යන වගන්ති ප්‍රකාරව, විෂය භාර අමාත්‍යවරයාගේ අනුදැනුම සහිතව මුදල් මණ්ඩලය විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා වන අවම ප්‍රාග්ධන අවශ්‍යතාවන් පහත පරිදි නිර්ණය කර ඇත.

1. මුදල් පනත යටතේ වන බලගැන්වීම

1.1 මුදල් නීති පනතේ 46(1) සහ 76(ඒ)(1) වගන්ති ප්‍රකාරව බැංකු පද්ධතියේ ශක්තිමත් භාවය සහතික කිරීම සඳහා සියලුම හෝ ඕනෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වෙත එම බැංකු ව්‍යාපාරයේ යම්කිසි ව්‍යාපාර කටයුත්තක් පවත්වාගෙන යෑම පිළිබඳ නියෝගයක් නිකුත් කිරීමට මුදල් මණ්ඩලය වෙත බලය පැවරී ඇත.

1.2 බැංකු පනතේ අංක 19(3) සහ 76උ වගන්ති ප්‍රකාරව මුදල් මණ්ඩලය මගින් ජාතික ආර්ථිකයේ යහපැවැත්ම බැංකු ක්ෂේත්‍රයේ ශක්තිමත්භාවය සහ ස්ථායීභාවය සහ බැංකුවල වත්කම් සහ වගකීම් සැලකිල්ලට ගනිමින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා වෙන වෙනම අවම ප්‍රාග්ධන අවශ්‍යතා මට්ටම් නියම කිරීමට හැකියාව ඇත.

2. අවම ප්‍රාග්ධන අවශ්‍යතා

2.1 2020.12.31 වන දින සිට ක්‍රියාත්මකව පවත්නා සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා බලපවත්නා අවම ප්‍රාග්ධන අවශ්‍යතාවන් වගුව 01 හි සඳහන් ආකාරයට වේ.

**වගුව 1 : බැංකු සඳහා වන අවම ප්‍රාග්ධන අවශ්‍යතා**

| බැංකු වර්ගය | ප්‍රමාණය (රු.බිලියන) |
|---|---|
| මෙරට ස්ථාපිත බලපත්‍රලාභී වාණිජ බැංකු | 20.0 |
| මෙරටින් පිටත සංස්ථාපිත බැංකු | |
| - රු.බි.100 ට වැඩි වත්කම් සහිත | 10.0 |
| - රු.බි.100 ට අඩු වත්කම් සහිත | 5.0 |
| මෙරට සංස්ථාපිත බලපත්‍රලාභී විශේෂිත බැංකු | 7.5 |

3. අර්ථ කථනය

3.1 මෙම කාරණයේ දී 'ප්‍රාග්ධනය' ලෙස සලකනු ලබන්නේ පහත පරිදි, බාසල් III යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා නියම කරනු ලබන ප්‍රාග්ධන අවශ්‍යතාවන් යනුවෙන් 2016 අංක 01 දරන බැංකු පනත් විධානයේ ඇමුණුම I හි දැක්වෙන උපලේඛනය 1 ට අනුකූලව ජාලගත වාර්තාකරණ (web-based return) කේතයන්ගේ එකතුව වේ.

| ජාලගත වාර්තාකරණ කේත | අයිතම |
|---|---|
| 20.2.1.1.1.1 | සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය හෝ ප්‍රකාශිත ප්‍රාග්ධනය/පැවරූ ප්‍රාග්ධනය |
| 20.2.1.1.1.2 | සංචිත අරමුදල් |
| 20.2.1.1.1.3 | ප්‍රකාශිත රඳවාගත් ඉපයුම්/රඳවාගත් අලාභ |
| 20.2.1.1.1.5 | පොදු හෝ අනෙකුත් අනාවරණය කළ සංචිත |
| 20.2.1.1.6 | මෙම ජාලගත වාර්තාකරණ කේතයේ ඇතුළත් ප්‍රකාශයට පත් නොකළ මෙම වසරේ ලාභ අලාභ පමණක් |
| 20.2.2.1.1.1 | සුදුසුකම් ලබන පළමු ස්ථරයේ අමතර ප්‍රග්ධන උපකරණ |

4. ප්‍රාග්ධන සැලසුම්කරණ ක්‍රියාවලිය

4.1 බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් අවශ්‍ය විටෙක ඉහත ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රාග්ධන වර්ධන සැලසුම් තම වාර්ෂික අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණතා ඇගයීම් ක්‍රියාවලියට (ICAAP) ඇතුළත් කර එම ලියකියවිලි බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වෙත භාර දිය යුතුය.

5. අනුකූලතාව තහවුරු කිරීම සඳහා ගෙන ඇති පියවර

5.1 බලපත්‍රලාභී වාණිජ බැංකු හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකු මෙම විධානයන් සමග අනුකූල වීමට අපොහොසත් වන අවස්ථාවන්හිදී එම බැංකු විසින් ලාභ නැවත සිය රටට යැවීම හෝ ප්‍රාග්ධන මට්ටම් තවදුරටත් අඩුවීමට හේතු වන ක්‍රියාමාර්ග ගැනීම අදාළ බැංකු විසින් යළි අනුකූලතාවයට එළඹෙන තුරු සහ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් එම අනුකූලතාව තහවුරු කරන තුරු අත්හිටුවනු ලැබේ.

5.2 බලපත්‍රලාභී වාණිජ බැංකු සහ විශේෂිත බැංකුවල වත්කම් වර්ධනය සහ ශාඛා ජාල ව්‍යාප්තිය වැනි ක්‍රියාකාරකම් ද ඉහත විධාන සමග අනුකූල නොවන අවස්ථාවන්හි දී සීමා කරනු ලැබේ.

අත්සන් කළේ,
ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
**මුදල් මණ්ඩලයේ සභාපති සහ**
**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති**

බැංකු පනත යටතේ නිකුත් කළ විධානය 2017 අංක 06 2017 නොවැම්බර් 29

## බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වල මූල්‍ය ව්‍යුත්පන්න ගනුදෙනු

මූල්‍ය මණ්ඩලය මගින් පහත රෙගුලාසීන් බලපත්‍රලාභී වාණිජ බැංකු (LCB) සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (LSB) වෙත නිකුත් කරනු ලබයි.

1. **බැංකු පනත යටතේ බලාත්මක කිරීම**

1.1 බැංකු පනතේ පරිච්ඡේද 46(1) මළු 76(ජේ)(1) යටතේ, බැංකු පද්ධතියේ ස්ථාවරත්වය සහතික කිරීම පිණිස, රෙගුලාසීන් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා නිකුත් කිරීමේ බලය මුදල් මණ්ඩලය සතු වේ. මෙමගින් බැංකුවල කටයුතු පවත්වා ගත යුතු ආකාරය නියෝග කරයි.

2. **යෙදවීම**

2.1 ශ්‍රී ලංකා විදේශ විනිමය පනත මගින් ව්‍යුත්පන්න ගනුදෙනු කිරීමට බලය හිමි වී ඇති බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා නිකුත් කරන ව්‍යුත්පන්න ගනුදෙනු මෙම විධාන මගින් ආවරණය වෙයි. ඒ අනුව, මෙම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු මින් ඉදිරියට සුදුසුකම් ලත් බැංකු (සු.බැ.) ලෙස හඳුන්වයි.

2.2 මෙම විධානයන් සු. බැ. දේශීය බැංකු ඒකක (DBU) සහ අක් වෙරළ බැංකු ඒකක (OBU) යන දෙකම සඳහා වලංගු වේ.

3. **ව්‍යුත්පන්න ගනුදෙනු ආරම්භ කිරීම**

3.1 මූල්‍ය ව්‍යුත්පන්න ගනුදෙනුවල නියැලීමට අපේක්ෂා කරන බලපත්‍රලාභී වාණිජ බැංකු, තම ප්‍රථම ගනුදෙනුව සිදු කිරීමට පෙර, තම අපේක්ෂාවන් මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකට දැන්විය යුතුය. එසේම, එහි පිටපතක් මහ බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකට ද යොමු කළ යුතුය.

3.2 මෙහි 5.2 යටතේ දක්වා ඇති ව්‍යුත්පන්න ගනුදෙනු සිදු කිරීමට, බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ ලිඛිත අවසරයක් ලබාගත යුතුය.

4. **ප්‍රතිපත්ති සහ ක්‍රියාවලි සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය**

4.1 ව්‍යුත්පන්න ගනුදෙනු සම්බන්ධ ප්‍රතිපත්ති සහ ක්‍රියාවලීන් සහ අනාවරණයන් ඇගයීමේ, ගණනය කිරීමේ, අවදානම් කළමනාකරණය සහ කාර්ය සාධන නිරීක්ෂණය මෙන්ම අවදානම් කළමනාකරණ රාමුවත් සු.බැ.වල අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ස්ථාපනය කළ යුතුය.

4.2 මූල්‍ය ව්‍යුත්පන්න ගනුදෙනු සිදු කිරීමට අවශ්‍ය ප්‍රවීණත්වය සහ ශක්‍යතා වර්ධනයන් ස්ථාපිත කර ඇති බවට සු.බැ. සහතික විය යුතුය.

5. **පොදු නියමයන් සහ කොන්දේසීන්**

5.1 පහත අරමුණු උදෙසා ව්‍යුත්පන්න ගනුදෙනු යොදාගත හැක.

(අ) **අවසන් පරිශීලන ගනුදෙනු (End User Deals)**

සු.බැ.වල වත්කම් හෝ වගකීම්වලින් (පවරන ලද ප්‍රාග්ධන සහ රඳවා ගත් ලාභ හැර) පැන නගින අවදානම් ආවරණය කිරීම හෝ අවදානම් ස්වරූපය වෙනස් කිරීම සඳහා. නමුත් අනුමාන/සමපේක්ෂණ කටයුතු සඳහා යොදාගත නොහැක.

(ආ) **වෙළඳපොළ නිර්මාණය කිරීමේ අරමුණින් තොර ගනුදෙනු (Non Market Maker Deals)**

සු.බැ. සිය ගනුදෙනුකරුවන් සමඟ ඇති කර ගන්නා ගනුදෙනු එනම් ලාභයක් ලැබීමේ අරමුණින් වෙනත් සු.බැ. සමඟ හෝ සු.බැ. නොවන වෙනත් පාර්ශ්වයක් සමඟ කරන ගනුදෙනු. මෙහිදී සු.බැ. කිසිදු ආකාරයකින් වෙළඳපොළ අවදානමක් නොදැරිය යුතු අතර, ශ්‍රී ලංකාව තුළ සු.බැ. සමඟ හෝ විදේශීය ප්‍රතිපාර්ශ්වයක් සමඟ ක්ෂණික හෝ දිනය තුළදීම ප්‍රති ආවරණයක් ලබාගත යුතුය.

(ඇ) **ව්‍යුත්පන්න වෙළඳපොළ නිර්මාණය කිරීම සඳහා කරන ගනුදෙනු (Derivative Market Maker Deals)**

සු.බැ. වෙළඳපොළ අවදානම් දරමින් තම ගනුදෙනුකරුවන් සමඟින් හේ වෙනත් සු.බැ. සමඟ කරනු ලබන ගනුදෙනුය.

5.2 මෙම විධානයන් යටතේ අනුමත මූල්‍ය ව්‍යුත්පන්න උපකරණයන් පහත දැක්වේ.

(අ) හුවමාරු ගිවිසුම් (Swaps)
(ආ) විකල්ප ගිවිසුම් (Options)
(ඇ) ඉදිරි අනුපාත ගිවිසුම් (Forward Rate Agreements)
(ඈ) ඉදිරි ගිවිසුම් (Forward Contracts)
(ඉ) හුවමාරු ගිවිසුම් ඇති කර ගැනීමට විකල්පයන් (Swaptions)
(ඊ) කලින් කලට මූල්‍ය මණ්ඩලය මගින් ප්‍රකාශ කරනු ලබන උපකරණයන්

5.3 සු.බැ. පහත සඳහන් දෑ සහතික කළ යුතුය

(අ) ගනුදෙනුකරුවන්ට පිරිනමන සියලුම ව්‍යුත්පන්නයන් වලංගු පදනම් ගනුදෙනුවක් මත පදනම් විය යුතුය. වලංගු පදනම් ගනුදෙනු වනුයේ ජංගම ගිණුමේ ගනුදෙනු හෝ අවසරලත් ප්‍රාග්ධන ගිණුමේ ගනුදෙනුය.

(ආ) අවසරලත් ව්‍යුත්පන්නයන් භාවිත කළ යුතු වන්නේ ගනුදෙනුකරුවන්ගේ වත්කම් සහ වගකීම් හේතුවෙන් පැනනගින අවදානම් ආවරණය කර ගැනීමට හෝ කළමනාකරණය සඳහාය. මෙම ව්‍යුත්පන්නයන් සමපේක්ෂණ කටයුතු සඳහා භාවිතා නොකළ යුතුය.

(ඇ) ගනුදෙනුවේ නාමික මුහුණත අගය ව්‍යුත්පන්නයන් තෝලනය වීමත් සමග, පදනම් වත්කමේ/වත්කම්වල හෝ වගකීම්වල හෝ පදනම් නිරාවරණයේ විෂය නොවූ ප්‍රමාණය, නොඉක්මවිය යුතුය.

5.4 සු.බැ. 5.2 දක්වා ඇති ව්‍යුත්පන්න උපකරණ, විදේශීය පාර්ශ්වයන් සමඟ සිදු කරන ප්‍රති ආවරණයන් සඳහා යොදාගත හැක.

5.5 අසම්භාවී නිරාවරණයන් ආවරණය කර ගැනීමට හෝ ගනුදෙනුකරුවන්ගේ ශේෂපත්‍ර නිරාවරණයන් මගින් ඇති වන අවදානම් ආවරණය කර ගැනීමට අවසරලත් ව්‍යුත්පන්න සු.බැ. යොදාගත හැක.

5.6 ආනයනකරුවනට සහ අපනයනකරුවනට තම අනාවරණයන් ආවරණය කර ගැනීමට (අපේක්ෂිත ගනුදෙනු වටිනාකම් සමගින්) සු.බැ. වලට ඉඩහැරිය හැකිය. ඇස්තමේන්තු ගනුදෙනු වටිනාකම තීරණය කළ යුත්තේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන පදනම්ව හෝ ආසන්නතම පූර්වගාමී ගිවිසුම් තුනේ වටිනාකමේ සාමාන්‍යය හෝ ආසන්නතම පූර්වගාමී ගිවිසුමේ වටිනාකම යන තුනෙහි වැඩි වටිනකම පදනම් කොටගෙනය. සු.බැ. විසින් මෙය තහවුරු කළ යුතුය.

5.7 පහත දැක්වෙන පරිදි පාර්ශ්වයන්ට ව්‍යුත්පන්නයන් තවදුරටත් අවශ්‍ය නොවේ නම් එම ව්‍යුත්පන්නයන් සම්පූර්ණයෙන්ම හෝ කොටසක් හෝ අවලංගු කිරීම හෝ නැවත විකිණීම සිදු කළ හැකිය.

(අ) අවලංගු කළ සියලුම ව්‍යුත්පන්නයන් මෙම විධාන වල දැක්වෙන කොන්දේසිවලට අනුකූලව නැවත වෙන්කරවා ගත හැකිය.

(ආ) ගනුදෙනුකරුවෙකු සිය ව්‍යුත්පන්න ගිවිසුම, පදනම් වත්කම අනුව පවතින විට, කල්පිරීමට පෙර අවලංගු කිරීමට බලාපොරොත්තු වන්නේ නම් එසේ කළ හැක්කේ වෙළඳපොළ මිල ලකුණු කිරීමේ පාඩුව ගනුදෙනුකරුගෙන් අයකර ගැනීමෙන් පමණය.

(ඇ) වෙළඳපොළ මිල ලකුණු කිරීමේ ලාභ (මූල්‍ය ලාභ) ගනුදෙනුකරුට නොගෙවිය යුතුය.

(ඈ) අනුපාතයේ (Rate) වාසි ඇත්නම් ගනුදෙනුකරුට ව්‍යුත්පන්න ගිවිසුම නැවත ඇතිකර ගැනීමේ (Re-book) දී ලබාදිය හැකිය.

5.8 පාර්ශ්වයන් බුන්වත් වූ අවස්ථාවක, බුන්වත් පාර්ශ්වය හා ණයගැතියා අතර අන්‍යෝන්‍ය ගනුදෙනුව ශුද්ධ අගය මත පියවීමට හැකි නම් එක් පාර්ශ්වයක් විසින් ගෙවිය යුතු මුදල් ප්‍රමාණය අනෙක් පාර්ශ්වයේ ගෙවිය යුතු ප්‍රමාණයට හිලව් කර ශුද්ධ ඉතිරි අගය ගෙවීම හෝ ලබාගැනීම කළ යුතුවේ.

5.9 ශ්‍රී ලාංකික නිත්‍ය නේවාසිකයින් නොවන්නන් සම්බන්ධ ව්‍යුත්පන්න ගනුදෙනුවල පිරිවැයක් පියවිය හැකි වන්නේ දේශප්‍රත්‍යාවර්තන අරමුදල් සහ/හෝ සාමාන්‍ය බැංකු පද්ධතිය හරහා ශ්‍රී ලංකාව අභ්‍යන්තරයට පැමිණෙන මුදල් මගින් පමණි.

5.10 2009 අගෝස්තු 01 වැනි දින නිකුත් කළ මූල්‍ය ව්‍යුත්පන්න උපකරණ සම්බන්ධිත විධාන (අනු අංක 33/03/001/0029/002) සහ 2010 මාර්තු 11 දින බලයලත් වෙළෙඳුන්ට නිකුත් කළ විදේශ විනිමය ඉදිරි විකුණුම් සහ මිලදී ගැනීම විධින (අනු අංක 06/04/02/2010) අනුව සු.බැ. විසින් ඇති කර ගත් ව්‍යුත්පන්න පදනම් ගනුදෙනු කල්පිරෙන දිනය දක්වා පසුගිය විධානයන්ට අනුව පවත්වා ගත හැක. පසුගිය විධානයන්ට අනුව ඇති කරගත් පසුව අවලංගු කළ ව්‍යුත්පන්න ගිවිසුම්, නව විධානයන්ගේ කොන්දේසිවලට යටත්ව නැවත වෙන්කරවා ගත හැක.

5.11 ගනුදෙනුකරුගේ පදනම් වත්කම වෙනත් බලයලත් අලෙවිකරුවෙකු සමග සනාථ කරගෙන ඇති විට එම වත්කම පදනම් කොටගෙන ව්‍යුත්පන්න ගිවිසුම්වලට එළඹිය හැක. නමුත් වෙනත් බලයලත් අලෙවිකරුවකු එම පදනම් වත්කම සම්බන්ධ ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

6. තහනම් කටයුතු

6.1 සු.බැ. වල අභ්‍යන්තර ගනුදෙනුකරුවෙකු විදේශ හවුල්කරුවෙකු වෙනුවෙන් මූල්‍ය ව්‍යුත්පන්න ගනුදෙනුවල නියැලීම, අභ්‍යන්තර ගනුදෙනුකරු ශ්‍රී ලංකා මහ බැංකුවේ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ අනුමැතිය ලබාගෙන ඇත්නම් පමණක් කළ යුතුය.

6.2 සු.බැ. විසින් ඕනෑම විදේශ නිරාවරණයක් හෝ විදේශයන්හි රඳවාගත් ඉපැයීම් සහ විදේශ විනිමය තැන්පතු සඳහා ව්‍යුත්පන්න ගනුදෙනු සිදු නොකළ යුතුය.

6.3 විකල්පයක් සඳහා ගෙවන අතිරික්තයක් සඳහා හැර පෙර ගෙවීම් සිදුකරන ව්‍යුත්පන්නයන් කිසිදු මුදල් ඒකකයකින් සු.බැ. විසින් ගනුදෙනුකරුවන්ට නිකුත් නොකළ යුතුය.

7. ජාත්‍යන්තර හුවමාරු සහ ව්‍යුත්පන්න සංගමය (ISDA)

7.1 සු.බැ. දෙපාර්ශ්වයම එකග වන්නේ නම් පමණක් ISDA ප්‍රධාන ගිවිසුම අත්සන් නොකර සිටිය හැකිය. නොඑසේ නම් සු.බැ. ISDA ප්‍රධාන ගිවිසුම තම ප්‍රතිපාර්ශ්වයන් සමග අත්සන් කළ යුතුය.

7.2 ISDA ගිවිසුම අත්සන් කිරීමට එකඟ නොවන විට, සු.බැ. එම ප්‍රතිපාර්ශ්වයන්ගෙන් ගිවිසුම අත්සන් නොකිරීමට ලිඛිත අනුමැතියක් ලබාගත යුතුය.

7.3 සු.බැ. ගනුදෙනුවලට අදාළ නිශ්චිත ගිවිසුම සහ වාර්තා තබා ගත යුතුය.

8. ගනුදෙනු-කරුවන්ගේ දැනුවත්කම

8.1 සිය ගනුදෙනුකරුවන් විසින් මෙම ව්‍යුත්පන්න ගනුදෙනුවලින් මතුවන අවදානම් පැහැදිලිව අවබෝධ කරගත් බවට සහ අනාගත ගනුදෙනුවලදී උදාවිය හැකි මෙම උපකරණ හා බැඳුනු අවදානම් කළමනාකරණයට සහ නිරීක්ෂණයට ගනුදෙනුකරුවන් විසින් සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇති බවට සියලු සු.බැ. විසින් සහතික විය යුතුය.

8.2 සු.බැ. විසින් ගනුදෙනු සම්බන්ධව ප්‍රමාණවත් තොරතුරු ලබාදිය යුතු අතර, විශේෂයෙන්ම උපකරණ තුළ ඇතුළත් කර ඇති කොන්දේසි සහ නියමයන්, අදාළ මිණුම්දඬු, තහවුරු කරන අනුපාතයන්, ක්‍රියාත්මක වන මිල ගණන් සහ වාරිකයන්, අඛණ්ඩව ලබාදිය යුතුය. එසේම, උපරිම විනිවිද භාවය තහවුරු කිරීමට අවශ්‍ය විස්තරාත්මක අවස්ථා විශේෂයක් ද ලබාදිය යුතුය.

8.3 ව්‍යුපන්න ගනුදෙනුවකට එළඹීමට මත්තෙන්, ගනුදෙනුකරුවන්, එම උපකරණයන්හි ස්වභාවය සහ නිසඟ අවදානම හොඳින් අවබෝධ කරගත් බවට බලයලත් අලෙවිකරුවන් විසින් ලියවිල්ලක් ලබාගත යුතුය.

8.4 ගනුදෙනුකරුවන්ට සියලු සු.බැ. සමඟ ඇති ව්‍යුත්පන්න ගනුදෙනුවල මුළු වටිනාකම පාදක ගනුදෙනුවේ වටිනාකම හෝ අනාවරණයන් නොඉක්මවන බවට සු.බැ. විසින් ගනුදෙනුවන්ගෙන් ලිඛිත ප්‍රතිඥාවක් ලබාගත යුතුය.

8.5 අදාළ ගිවිසුම්වලට එළඹීමට පෙර සු.බැ. විසින් ආයතනයේ ශක්‍යතාව සහ ගනුදෙනුකරුගේ සුදුසුකම් යන කරුණු සම්බන්ධයෙන් වන වෘත්තීමය විශ්ලේෂණය සම්බන්ධයෙන් සෑහීමකට පත්විය යුතුය.

9. සුදුසුකම්ලත් මුදල් වර්ග

9.1 ගනුදෙනුකරුගේ ඉල්ලීම පරිදි සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අභ්‍යන්තර ප්‍රතිපත්තිවලට අනුකූලව සු.බැ. විසින් නියම කරන ලද මුදල් ඒකකවලින් ව්‍යුත්පන්න ගනුදෙනු සිදු කළ යුතුය.

10. කාල පරාසය

10.1 ව්‍යුත්පන්න ගිවිසුමේ කාලය පදනම් වත්කම් කල්පිරීමේ කාලයට අනුරූප වන බවට සු.බැ. විසින් සහතික විය යුතුය. එසේම, ව්‍යුත්පන්න කාලය කිසි විටෙකත් පදනම් වත්කම් කල්පිරීමේ කාලය නොඉක්මවිය යුතුය. ව්‍යුත්පන්න උපකරණයක කල් පිරීමේ කාලය අවුරුදු 10 නොඉක්මවිය යුතුය.

11. සැසඳුම්/අගය කිරීමේ මිණුම්දඬු

11.1 සැසඳුම් සහ අගය කිරීමේ අරමුණ පිණිස අන්‍යෝන්‍ය එකඟතාව මත ප්‍රමාණවත් විනිවිදභාවයකින් යුතු මිණුම්දඬු සම්බන්ධ පාර්ශ්වයන්ට භාවිතා කිරීමට නිදහස ලැබේ.

12. වාර්තා කිරීම

12.1 ඇමුණුම 1 දක්වා ඇති ආකෘති යොදා ගෙන මාසයක් ඇතුළත සිදු කළ ගනුදෙනු පිළිබඳ ප්‍රකාශනයක් මාසයක් අවසන දින 15 ක් ඇතුළතදී සු.බැ. විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

13. නිර්වචනයන්

13 මෙම විධාන සඳහා පහත සඳහන් නිර්වචනයන් අදාළ වේ.

13.1 ව්‍යුත්පන්න

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව නිර්වචනය කළ මූල්‍ය උපකරණයක් හෝ ගිවිසුමක් ව්‍යුත්පන්නයක් ලෙස හැඳින්වේ.

13.2 විදේශීය ප්‍රතිපාර්ශ්වය

විදේශීය ප්‍රතිපාර්ශ්වය යනුවෙන් අදහස් වන්නේ:

අ) ශ්‍රී ලංකාවෙන් පිටත බැංකුවක්

ආ) ජාත්‍යන්තරව පිළිගත් ව්‍යුත්පන්න හුවමාරුවකි

13.3 අවසරලත් ව්‍යුත්පන්න ගනුදෙනු

අ) හුවමාරු ගිවිසුම් (Swaps)

ගනුදෙනුවක එකඟ වූ කල්පිරීමේ කාලය පුරා නිශ්චිත කාලපරිච්ඡේදයකදී (ගෙවීම් දිනයන්) මුදල් ප්‍රවාහයන් හුවමාරු කර ගැනීමට ද්විපාර්ශවයක් ඇති කර ගන්නා ගිවිසුමකි. සාමාන්‍යයෙන් හුවමාරු ගිවිසුම් වලට ගාස්තුවක් ගෙවීම සිදු නොවේ. මෙම විධාන වලට අනුව සු. බැ. පොලී අනුපාත, හරස් විනිමය සහ භාණ්ඩ හුවමාරු ගිවිසුම් වලට එළඹීමට සුදුසුකම් ලබයි.

ආ) විකල්ප ගිවිසුම් (Options)

ගිවිසුම් කල්පිරෙන දිනයේදී හෝ ඊට ප්‍රථම පදනම් වත්කම එකඟ වූ මිලකට (ක්‍රියාත්මක වන මිල) නිශ්චිත ප්‍රමාණයක් මිලට ගැනීමට හෝ විකිණීමට අදාළ ගිවිසුමෙන් අයිතියක් ලැබේ නම් එම ගිවිසුම් විකල්ප ගිවිසුම් වෙයි. විකල්ප ගිවිසුම් මගින් වගකීමක් මිලට ගන්නට ඇති නොවන අතර ගිවිසුම ආරම්භයේදී මිලට ගන්නා ගෙවීමක් (අතිරික්ත ගෙවීමක්) සිදු කළ යුතුය. ගැනුම් විකල්පයක් පදනම් වත්කමක් මිලට ගැනීමටත් විකුණුම් විකල්පයක් පදනම් වත්කමක් විකිණීමටත් අයිතියක් ලබා දෙයි. මෙම විධානවලට අනුව සු.බැ. වලට, පොලී අනුපාත, විනිමය සහ භාණ්ඩ පදනම් කොට ගෙන විකල්ප ගිවිසුම්වලට එළඹීමට සුදුසුකම් ලබයි.

ඇ) ඉදිරි අනුපාත ගිවිසුම් (FRA)

FRA යනු දෙපාර්ශ්වයක් අතර සිදු වන පොලී අනුපාත ගිවිසුමක් වන අතර, එමගින් යම් පාර්ශ්වයකට පොලී අනුපාත වෙළඳපොළේ ස්ථාපනය වීමට අවස්ථාව ලැබේ. මෙහිදී එක් පාර්ශ්වයක් විසින් නිශ්චිත නාමික මුදලක් සඳහා නිශ්චිත වූ පොලී ගෙවීමක් සිදු කෙරෙන අතර අනෙක් පාර්ශ්වය විසින් ගිවිසුම කල්පිරීමේදී තීරණය වන පොලී අනුපාතයක් මත පොලී ගෙවීම සිදු කරයි. පියවීම් දිනයේදී ශුද්ධ පියවීමක් සිදු කරනු ලබයි.

ඈ) ඉදිරි ගිවිසුම්

ඉදිරි ගිවිසුමකදී, ගිවිසුම්ගත පාර්ශ්වයන්ට නිශ්චිත මුදලකට, නිශ්චිත ප්‍රමාණයක්, නිශ්චිත අනාගත දිනයකදී විනිමය/භාණ්ඩ මිලට ගැනීමට හෝ විකිණීමට වගකීමක් ලැබේ.

ඉ) හුවමාරු ගිවිසුමක් ඇතිකර ගැනීමට විකල්පයක් (Swaptions)

හුවමාරු ගිවිසුමකට එළඹීමට ඇති විකල්පයකි. මෙමගින් විකල්ප අතිරික්තයන් හුවමාරුවකට යටත්ව, මිලදී ගන්නාට නිශ්චිත අනාගත දිනයකදී නිර්දේශිත හුවමාරු ගිවිසුමක් ඇතිකර ගැනීමට අයිතියක් ලැබේ. මෙහිදී වගකීමක් මිලදී ගන්නාට ඇති නොවේ. මෙම විධානයන් යටතේ සු.බැ. මෙම ගිවිසුමේ පොලී අනුපාත, විනිමය සහ භාණ්ඩ පදනම් ගනුදෙනු ඇතිකර ගැනීටම සුදුසුකම් ලබයි.

ඊ) මුදල් හුවමාරු (Fx Swaps)

මුදල් හුවමාරු යනු එකවර සිදුවන, පියවීම් දිනයන් දෙකකදී විනිමය මිලට ගැනීම හෝ විකිණීමට හෝ ප්‍රතිලෝමය ඇතිකර ගන්නා ගිවිසුමකි. මෙහිදී එක් මුදල් ඒකකයක් එක් පියවීම් දිනයකදී මිලදී ගෙන/විකුණා ඇතත් පියවීම් දිනයේදී විකිණීමට/මිලට ගැනීම සිදුවේ.

14. අවලංගු කිරීම 14.1 2009 අගෝස්තු 01 දින විනිමය පාලක හා ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නිකුත් කළ මූල්‍ය ව්‍යුත්පන්න උපකරණ සම්බන්ධව විධාන (33/03/001/0029/002) සහ 2013 ජනවාරි 02 දින විනිමය පාලක විසින් විදේශ විනිමය ඉදිරි විකුණුම් මිලට ගැනීම් විධාන (06/04/04/2013) මෙමගින් අවලංගු කෙරේ.

15. ක්‍රියාත්මක කිරීම 15.1 මෙම විධාන 2018 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වෙයි.

අත්සන් කළේ,
ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

බැංකු පනත යටතේ නිකුත් කළ විධානයන් 2017 අංක 06 ඇමුණුම I

## බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල මූල්‍ය ව්‍යුත්පන්න ගනුදෙනු

බැංකුව.................................. මාසය/අවුරුද්ද ................. /................

1 වගුව

**මාසික ව්‍යුත්පන්න උපකරණ ගනුදෙනු**

උපකරණ වර්ගය - හුවමාරු ගිවිසුම්

| ගනුදෙනු දිනය | උපකරණ | ප්‍රතිපාර්ශ්වය/ ගනුදෙනුකරු | නාමික මුදල | | කල්පිරීමේ දිනය | පදනම් වත්කමේ ස්වභාවය | ප්‍රතිආවරණන ගනුදෙනුවේ විස්තර | ආවරණය නොවූ ප්‍රමාණය | සැසඳුම්/ මිනුම්දඬු | සටහන් |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ව්‍යවහාර මුදල | ප්‍රමාණය | | | | | | |
| | | | | | | | | | | |

2 වගුව

**මාසික ව්‍යුත්පන්න උපකරණ ගනුදෙනු**

උපකරණ වර්ගය - ඉදිරි ගිවිසුම්

| ගනුදෙනු දිනය | ප්‍රතිපාර්ශ්වය/ ගනුදෙනුකරු | මිලදී ගැනීම/ විකිණීම | කල්පිරීමේ දිනය | මුදල් වර්ගය | ප්‍රමාණය | ඉදිරි අනුපාතය | ප්‍රතිආවරණ ගනුදෙනු (ඔව්/නැත) | ප්‍රතිආවරිත ප්‍රතිපාර්ශ්වය | පදනම් ගනුදෙනුව | සටහන් |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | |

3 වගුව

**මාසික ව්‍යුත්පන්න උපකරණ ගනුදෙනු**

උපකරණ වර්ගය - මුදල් විකල්ප

| ගනුදෙනු දිනය | ප්‍රතිපාර්ශ්වය/ ගනුදෙනුකරු | විකල්ප ක්‍රියාත්මක කරන දිනය | ගැනුම් | | බැංකු විකුණුම් | | ක්‍රියාත්මක මිල | ප්‍රතිආවරණ ගනුදෙනු (ඔව්/නැත) | ප්‍රතිආවරණ ප්‍රතිපාර්ශ්වය | පදනම් ගනුදෙනු | සටහන් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | විනිමය | ප්‍රමාණය | විනිමය | ප්‍රමාණය | | | | | |
| | | | | | | | | | | | |

4 වගුව

**මාසික ව්‍යුත්පන්න උපකරණ ගනුදෙනු**

උපකරණ වර්ගය - විකල්ප ගිවිසුම්

| ගනුදෙනු දිනය | ප්‍රතිපාර්ශ්වය/ ගනුදෙනුකරු | උපකරණය | කල්පිරීමේ දිනය | මුදල් වර්ගය | ප්‍රමාණය | ගනුදෙනු අනුපාතය | ප්‍රතිආවරණ ගනුදෙනු (ඔව්/නැත) | පදනම් ගනුදෙනුව | සටහන් |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |
| | | | | | | | | | |

5 වගුව

**අවලංගු කළ සහ අවසන් කළ (අපරිණත) ගනුදෙනු**

| ගනුදෙනු දිනය | ශ්‍රී ලංකා මහ බැංකුවට වාර්තා කළ පරිදි උපකරණ වර්ගය | ප්‍රතිපාර්ශ්වය/ ගනුදෙනුකරු | නාමික අගය | ශ්‍රී ලංකා මහ බැංකුවට දැනටමත් වාර්තා කරන ලද ගනුදෙනුවේ මුල් යොමුව | මුල් ගිවිසුමට අනුව කල්පිරීමේ දිනය | අවලංගු/ අවසන් කළ දිනය | ප්‍රතිආවරණ ගනුදෙනුවේ විස්තර | සැසඳුම්/ මිණුම්දඬු | සටහන්/ අවලංගු කිරීමට හේතු |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |
| | | | | | | | | | |

dfx@cbsl.lk යන විද්‍යුත් ලිපිනය භාවිතා කොට මාසයක් නිමවීමෙන් දින 15ක් ඇතුලත, ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර ගෙවීම් කටයුතු දෙපාර්තමේන්තුවට වාර්තා කිරීම සඳහා

**බැංකු පනත යටතේ නිකුත් කළ විධානය 2017 අංක 07** 2017 දෙසැම්බර් 12

## බලපත්‍රලාභී බැංකු විසින් ලබාගන්නා විදේශ ව්‍යවහාර මුදල් ණය

විදේශ ව්‍යවහාර මුදල් ණය, බැංකුවල අරමුදල් සපයා ගැනීමේ වැදගත් මූලාශ්‍රයක් වන නමුත්, නියාමනයකින් තොරව ලබාගන්නා අධික විදේශ මූල්‍ය ණය රටේ මූල්‍ය සහ සාර්ව ආර්ථික ස්ථායීතාව කෙරෙහි අහිතකර ලෙස බලපෑම් ඇති කළ හැකිය.

බැංකු විසින් ලබාගන්නා මහා පරිමාණ විදේශ ව්‍යවහාර මුදල් ණය නිසා හටගන්නා වූ විදේශ විනිමය අවදානම කෙරෙහි වන නිරාවරණ රටෙහි විදේශ මුදල් සංචිත සහ විනිමය අනුපාතය කෙරෙහි ඇති කරනු ලබන පීඩනය සහ බැංකු විසින් විදේශ මූල්‍ය ණය මත අධික ලෙස යැපීම වැනි කරුණු සැලකිල්ලට ගනිමින් මුදල් මණ්ඩලය විසින් බලපත්‍රලාභී බැංකු ලබාගන්නා විදේශ ව්‍යවහාර මුදල් ණය සම්බන්ධව ප්‍රතිපත්ති රාමුවක් හඳුන්වා දී තිබේ.

ඒ අනුව, මුදල් මණ්ඩලය විසින්, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට පහත විධානයන් නිකුත් කරනු ලැබේ.

1. බැංකු පනත යටතේ වන බලගැන්වීම

 1.1 1988 අංක 30 දරන බැංකු පනතේ 46(I) සහ 76ඒ(I) යන වගන්ති ප්‍රකාරව බැංකු පද්ධතියේ ශක්තිමත්භාවය ආරක්ෂා කර ගැනීම උදෙසා යම්කිසි හෝ සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් කවර හෝ ආකාරයෙන් විධාන නියම කිරීම සඳහා මුදල් මණ්ඩලය වෙත බලය බලය පවරා තිබේ.

2. විෂය පථය

 2.1 මෙම විධානයන් සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල (මතුවට බලපත්‍රලාභී බැංකු ලෙස හැඳින්වෙන) විදේශ ව්‍යවහාර මුදල් ණය සඳහා අදාළ වේ.

3. කාල සීමාව

 3.1 ඉතිරි වී ඇති කල්පිරීමේ කාලසීමාව අනුව විදේශ ව්‍යවහාර මුදල් ණය;

 (i) වසර 3 හෝ ඊට අඩු විට කෙටි-කාලීන ණය ලෙසත්,

 (ii) වසර 3 ට වැඩි වන විට දිගු-කාලීන ණය ලෙසත් සැලකේ.

4. විදේශ ව්‍යවහාර මුදල් ණය සීමාවන්

 4.1 බලපත්‍රලාභී බැංකු විසින් ලබාගන්නා උපරිම විදේශ ව්‍යවහාර ණය මුදල් සීමාව ඒ ඒ බැංකුවල ආසන්නතම විගණනය කළ ගිණුම්හි සටහන් මුළු වත්කම් ප්‍රමාණයෙන් ප්‍රතිශතයක් ලෙස තීරණය කෙරේ.

 4.2 බලපත්‍රලාභී බැංකු සඳහා අදාළ වන විදේශ ව්‍යවහාර ණය ප්‍රතිශතය ඒ ඒ බැංකුවේ බාහිර දිගු කාලීන ණය ශ්‍රේණිගත කිරීම (credit rating) සහ මුළු ප්‍රාග්ධන අනුපාතය සැලකිල්ලට ගනිමින් පහත වගු 1 සහ 2 පරිදි ලබාදෙනු ලබන ලකුණු ප්‍රමාණය මත පදනම් වේ.

**වගුව 01 - ලකුණු ගණනයය කිරීම**

| බැංකුවේ ණය ප්‍රමාණය | බැංකුවේ මුළු ප්‍රාග්ධන අනුපාතය | එක් එක් කොටුවට අයත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| AAA- AA$^-$ හෝ ඒ හා සමාන | >14.0% | 3 |
| A$^+$- A$^-$ හෝ ඒ හා සමාන | 13.6% - 14.0% | 2 |
| BBB$^+$- BBB$^-$ හෝ ඒ හා සමාන | 12.5% - 13.5% | 1 |
| BBB$^-$ ට අඩු | <12.5% | 0 |

**වගුව 02 - මුළු වත්කම් ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස ණය සීමාව**

| ලකුණු එකතුව | කෙටි - කාලීන | මුළු එකතුව |
|---|---|---|
| 1-2 | 1.5% | 5.0% |
| 3-4 | 1.5% | 7.5% |
| 5-6 | 1.5% | 10.0% |

5. **මුදල් මණ්ඩලයේ අනුමැතිය**

5.1 ජාතික වශයෙන් වැදගත්කමක් ඇති විශේෂ අවස්ථාවක දී පමණක් මුදල් මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමැතිය සහිතව ඉහත විධාන 4 හි නිරූපිත සීමාවන්ට වඩා වැඩිපුර විදේශ ව්‍යවහාර ණය ලබාගැනීම සිදු කළ හැකිය.

5.2 මුදල් මණ්ඩලය මගින් සාර්ව ආර්ථික දර්ශක සහ පහත දැක්වෙන 6, 7 සහ 8 දරණ විධානයන්හි ඇතුළත් නියෝග සලකා බලා අවස්ථානුකූලව ඒ ඒ කොන්දේසිවලට යටත්ව බලපත්‍රලාභී අදාළ බැංකුවේ වත්කම්වලින් සියයට 5% ක ප්‍රමාණයකින් ඉහත සඳහන් පරිදි සීමාව ඉක්මවා පරිබාරහිරව වැඩිදුර විදේශ මූල්‍ය ණය ලබාගැනීමට අවසර ලබාදිය හැකිය.

5.3 ඉහත 5.2 හි සඳහන් අනුමත වැඩිපුර ණය ප්‍රමාණයන් මුදල් මණ්ඩලයේ අවසරය ලබාගැනීමෙන් මාස 03 ක් ඇතුළත දී ලබාගත යුතුය.

6. **පොදු කොන්දේසි සහ නියමයන්**

6.1 බලපත්‍රලාභී බැංකු විසින් ලබාගන්නා සියලුම විදේශ ව්‍යවහාර මුදල් ණය ඒ ඒ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මගින් අනුමත විය යුතු වේ.

6.2 බලපත්‍රලාභී බැංකු බාසල් III යටතේ වන අවම ප්‍රාග්ධන මට්ටම්, ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාත, ද්‍රවශීලතා ආවරණ අනුපාත සහ ශුද්ධ විවෘත විදේශ විනිමය ප්‍රමාණය ආදිය ඇතුළත්ව, නමුත් ඒ මගින් සීමා නොවන ආකාරයට සියලුම විචක්ෂණතා අවශ්‍යතාවන්ට අනුකූල විය යුතුය.

6.3 බලපත්‍රලාභී බැංකු විසින් සිය විදේශ ව්‍යවහාර මුදල් ණය නිසා පැන නගින විදේශ විනිමය අවදානම සහ පොලී අනුපාත අවදානම ඉදිරි රැකුම් (Hedge) කළ යුතු අතර, කල්පිරීම් නොපෑහීම ද පාලනය කළ යුතු වේ.

6.4 ලබාගන්නා ලද විදේශීය ව්‍යවහාර මුදල් ණය වෙනත් විදේශීය මුදල් වර්ගයකට මාරු කිරීමක් සිදුවන අවස්ථාවක දී විදේශීය පාර්ශ්වකරුවකු සමඟ ඉදිරි රැකීමකට යොමු වීමට දිරිමත් කරනු ලැබේ.

6.5 කල්පිරීමේ කාලය වසරකට අඩු විදේශ ව්‍යවහාර මුදල් ණය උපයෝගී කර ගනිමින් වසරකට වැඩි පරිණත කාලයක් සහිත ණය පහසුකම් ලබාදීම සිදු නොකළ යුතුය.

6.6 බලපත්‍රලාභී බැංකු විසින් සිය විදේශීය ව්‍යවහාර මුදල් ණය නියමිත කාලානුරූපීව ආපසු ගෙවීමට ඇති හැකියාව සනාථ කළ යුතුය.

7. **සුදුසුකම් ලබන විදේශ ව්‍යවහාර මුදල් ණය**

7.1 ණය ලබාදෙන ආයතන සවිමත් මූල්‍ය ආයතන ලෙස නම් දරා තිබිය යුතු අතර, ණය ලබාදිය හැකි ආයතන වනුයේ,

(i) බහුපාර්ශ්වීය සංවර්ධන බැංකු

(ii) අන්තර්ජාතික කීර්තියක් ඇති බැංකු

(iii) විදේශීය රජයන්ට අයත් හෝ අනුබද්ධ ව්‍යාපාර

(iv) විදේශීය බැංකුවල මූලස්ථාන හෝ ශාඛා

7.2 ණය පොලී අනුපාත (අදාළ සියලුම වියදම් ඇතුළත්ව) තරගකාරී විය යුතුය.

7.3 ණය මුදල් ආරම්භයේ දී සඳහන් කළ පියවීමේ දිනට පෙර නොපියවිය යුතු අතර, call හෝ put විකල්ප විශේෂාංගවලින් තොර විය යුතුය.

7.4 ණය ආපසු ගෙවීම් පොකුරු ආවරණයන්ට තුඩු නොදිය යුතුය.

7.5 ණය ගැනුම් අධික ණය වර්ධනයට හේතු නොවිය යුතුය.

8. **විදේශ ව්‍යවහාර මුදල් ණය උපයෝජනය කිරීම**

8.1 දිගු කාලීන විදේශ ව්‍යවහාර ණය පහත ආකාරයේ මෙරට ආයෝජන/ණය ලබාදීම් සඳහා උපයෝජනයට ගත හැක.

(i) අපනයන සඳහා බරපැන දැරීම, ආනයන ආදේශන, යටිතල පහසුකම්, රජයේ සංවර්ධන ව්‍යාපෘති, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර

(ii) වත්මන් විදේශ ව්‍යවහාර ණය ප්‍රමාණයන් හිලව් කිරීම සහ පියවීම සඳහා

(iii) ශ්‍රී ලංකා රජයේ ස්වෛරී ණයකරවල සහ ජාතික වශයෙන් වැදගත්කමක් ඇති ක්‍රියාකාරකම්වල ආයෝජනය කිරීම

| | | |
|---|---|---|
| 9. | ලබාදිය යුතු අයදුම්පත් | 9.1 ඉහත විධාන අංක 05 ප්‍රකාරව මුදල් මණ්ඩලයේ අවසරය ලබාගැනීමට අදහස් කරන බැංකු පහත විස්තර ලිඛිත ඉල්ලීමක් සමග ඉදිරිපත් කළ යුතුය.<br>(i) ණය ලබාදෙන්නාගේ දත්ත ආකෘතියක් (profile)<br>(ii) ණය පහසුකමේ මුහුණුවර<br>(iii) විශේෂ අරමුණු/අභිප්‍රායයන් සහ ඉලක්ක<br>(iv) පවත්නා විදේශ ව්‍යවහාර ණයවල කාර්යසාධන මට්ටම<br>(v) යෝජනා කරනු ලබන අවදානම් කළමනාකරණ යාන්ත්‍රණය |
| 10. | උපරිම සීමාව අදාළ නොවන අවස්ථා | 10.1 ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත බලපත්‍රලාභී වාණිජ බැංකුවල ප්‍රධාන කාර්යාලයෙන් හෝ එසේ ලංකාවෙන් පිටත ක්‍රියාත්මක වන ශාඛාවකින් ලබාගන්නා විදේශ ව්‍යවහාර මුදල් ණය, පූර්ණ වශයෙන්ම එම ණය මුදල ලබාගත් අරමුණ සඳහා පමණක් යොදවන අවස්ථාවන්හිදී මෙම පනතේ 4 වන වගන්තිය යටතේ බලපවත්වන උපරිම සීමා සඳහා යටත් නොවේ.<br>10.2 වසර 3 කට වැඩි කල්පිරීම තෙක් රඳවා ගනු ලැබූ, ශ්‍රී ලංකා රජය මගින් නිකුත් කරනු ලබන සංවර්ධන බැඳුම්කර, ස්වෛරී බැඳුම්කර සහ භාණ්ඩාගාර බැඳුම්කරයන්හි ආයෝජනය කිරීම සඳහා උපයෝගී කර ගන්නා ණය මුදල්. |
| 11. | අර්ථ කථනයන් | 11.1 මුළු වත්කම් ප්‍රමාණය අවසන් විගණිත වාර්තාවන්ට අනුකූල විය යුතුය.<br>11.2 විදේශ ව්‍යවහාර මුදල් යනු ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල වර්ගයක් වේ. |
| 12. | ක්‍රියාත්මක කිරීම | 12.1 මෙම විධානයන් 2018 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වේ. |
| 13. | සංක්‍රාමී සැලසුම් | 13.1 කිසියම් බැංකුවක් විසින් ඉහත විධාන 04 හි සඳහන් සීමාවෙන් ඔබ්බට විදේශීය ව්‍යවහාර මුදල් ණය ලබාගෙන ඇති විට දී යළි මුළු හිඟ මුදල් ප්‍රමාණය උපරිම ණය සීමාවට වඩා අඩුවන තුරු තවදුරටත් ණය ලබාගැනීම අත්හිටුවිය යුතු වේ.<br>13.2 යම් බලපත්‍රලාභී බැංකුවක් වෙත මුදල් මණ්ඩලය මගින් උපරිම ණය සීමාව ඉක්මවා යෑම සඳහා මෙම විධානය නිකුත් කිරීමට පෙර ලබාදී ඇති අවසරයන්, 2018 මාර්තු 31 වැනිදායින් පසු අහෝසි වේ. |
| 14. | අවලංගු කිරීම් | 14.1 1997 ජනවාරි 13 වැනිදා ප්‍රධාන ගණකාධිකාරි විසින් නිකුත් කරන ලද අංක BD/FX/196 දරණ චක්‍රලේඛය මෙයින් අවලංගු කෙරේ. |

අත්සන් කළේ,
ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
**මුදල් මණ්ඩලයේ සභාපති සහ**
**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති**

**විනිමය පාලන පනත යටතේ විධානයන් 2017 අංක 01** 2017 මාර්තු 07

## වෙනත් රටක ස්ථිර නේවාසික වීසා මත ශ්‍රී ලංකාවෙන් පිටත වාසික ශ්‍රී ලාංකිකයන්ට හා ද්විත්ව පුරවැසිතාවය ලබාගත් පුද්ගලයන්ට ණය ලබාදීම පිළිබඳ බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

විනිමය පාලන පනතේ 3 සහ 5 වගන්ති ප්‍රකාරව, වෙනත් රටක ස්ථිර නේවාසික වීසා මත ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරනු ලබන ශ්‍රී ලාංකිකයන් හට සහ ශ්‍රී ලංකාවේ සහ වෙනත් ඕනෑම රටක ද්විත්ව පුරවැසිභාවය ලබාගෙන ඇති පුරවැසියන් හට ඔවුන්ගේ නේවාසික තත්ත්වය නොසලකා හරිමින් පහත කොන්දේසිවලට යටත්ව දේශීය බැංකු ඒකකවලින් ණය ප්‍රදානය කිරීම සඳහා බලයලත් වෙළෙඳුන් හට මෙමගින් අවසර ලබා දෙනු ලැබේ.

1. **ණය ලබාදීමේ අරමුණ**

    1.1 ශ්‍රී ලංකාව තුළ නේවාසික දේපළක් අත් කර ගැනීම සඳහා

    1.2 ශ්‍රී ලංකාව තුළ නේවාසික දේපළක් ඉදිකිරීම/සංවර්ධනය කිරීම/නවීකරණය කිරීම සඳහා

2. **විදේශ ව්‍යවහාර මුදලින් ප්‍රදානය කෙරෙන ණය (විදේශ මුදල් ණය)**

    2.1 ණය ආපසු ගෙවීම සඳහා ණය ගැණුම්කරු සතුව විදේශ ව්‍යවහාර මුදලින් වන ඉපැයීම් පවතින්නේ නම් පමණක් විදේශ ව්‍යවහාර මුදලින් වන ණය පහසුකම් ප්‍රදානය කළයුතු අතර ණය ප්‍රදානය කිරීමට ප්‍රථමයෙන් විදේශ ව්‍යවහාර මුදලින් ණය ආපසු ගෙවීම සඳහා ණය ගැණුම්කරුවා හට ඇති හැකියාව පිළිබඳව බලයලත් වෙළෙඳුන් විසින් තක්සේරු කොට ඒ පිළිබඳ සෑහීමකට පත් විය යුතුය

    2.2 විදේශ ව්‍යවහාර මුදලින් ණය ආපසු ගෙවීමට ණය ගැණුම්කරුවාට ඇති හැකියාව බලයලත් වෙළෙඳුන් විසින් ස්ථිරව නිගමනය කළ නොහැකිනම් විදේශ ව්‍යවහාර මුදලින් වන ණය ප්‍රදානය නොකළ යුතුය.

    2.3 ණය මුදල මුදා හැරීමේ සහ ණය ආපසු ගෙවීම් ලබාගැනීමේ අරමුණු සඳහා ණය ගැණුම්කරුවාගේ නමින් විදේශ ව්‍යවහාර මුදලින් වන ණය ගිණුමක් විවෘත කළ යුතුය. ණය ආපසු ගෙවා නිදහස් කිරීමත් සමගම එකී ගිණුම වසා දැමිය යුතුය.

    2.4 නේවාසික දේපළ විකුණනු ලබන ශ්‍රී ලංකාවේ නේවාසික (විදේශ ව්‍යවහාර මුදල් භාර ගැනීම සඳහා අවසරලත්) පුද්ගලයන් විසින්

පවත්වාගෙන යනු ලබන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට ණය මුදල මාරු කිරීම සඳහා ණය ගැණුම්කරු ඉල්ලා නොසිටින්නේ නම් විදේශ ව්‍යවහාර මුදලින් වන ණය ගිණුමෙන් ණය අරමුදල් නිදහස් කළ යුත්තේ ශ්‍රී ලංකා රුපියල් වලිනි.

2.5 විදේශ ව්‍යවහාර මුදලින් වන ආමුඛ ප්‍රේෂණයන් හෝ ණය ගැණුම්කරුගේ අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සහ සුරැකුම්පත් ආයෝජන ගිණුම්වල පවත්නා අරමුදල් භාවිතා කිරීම තුළින් ණය ආපසු ගෙවීම සිදු කළ යුතුය.

3. **ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රදානය කෙරෙන ණය (රුපියල් ණය)**

3.1 ණය ආපසු ගෙවීමට ඇති හැකියාව පිළිබඳව තක්සේරු කොට සෑහීමකට පත්වීමෙන් අනතුරුව බලයලත් වෙළෙඳුන් විසින් ශ්‍රී ලංකා රුපියල් ණය ප්‍රදානය කළ යුතුය.

3.2 ණය මුදල නිදහස් කිරීමේ සහ ණය ආපසු ගෙවීම් ලැබීමේ අරමුණු සඳහා ණය ගැණුම්කරුවාගේ නමින් ශ්‍රී ලංකා රුපියල් ණය ගිණුමක් විවෘත කළ යුතුය.

3.3 ණය මුදල ශ්‍රී ලංකා රුපියල්වලින් පමණක් නිදහස් කළ යුතුය.

3.4 විදේශ ව්‍යවහාර මුදලින් වන ආමුඛ ප්‍රේෂණ වලින්, අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සහ සුරැකුම්පත් ආයෝජන ගිණුම්වල පවත්නා අරමුදල් භාවිතා කරමින් සහ ණය ගැණුම්කරුගේ ශ්‍රී ලංකා රුපියල්වලින් වන ඉපැයීම් භාවිතා කරමින් ණය ආපසු ගෙවිය යුතුය.

4. **ගෙවීම් පැහැර හැරීමකදී ණය අය කර ගැනීම**

විදේශ ව්‍යවහාර මුදලින් වන ණය, ශ්‍රී ලංකා රුපියල්වලින් අය කර ගැනීම 2008 අංක 3 දරණ (සංශෝධිත) බැංකු පනතේ විධානයන් ප්‍රකාරව අවම වශයෙන්, අක්‍රමික ණය යටතේ අවප්‍රමාණික ණය ලෙස වර්ගීකරණය කරනු ලබන අදියරේ දී පමණක් පහත පරිදි සිදු කළ යුතුය.

(අ) පළමුව, ණය ගැණුම්කරුගේ විදේශ ව්‍යවහාර මුදලින් වන වත්කම් තුළින්

(ආ) දෙවනුව, උකස් කරන ලද වත්කම් හෝ වෙනත් දේශීය වත්කම් විකිණීමෙන් ලද මුදල් තුළින්

(ඇ) අවසාන පිළියමක් වශයෙන්, ඉතිරිව ඇති ණය ශේෂය ගෙවා පියවීම සඳහා අවශ්‍ය වන ප්‍රමාණය දක්වා පමණක් ශ්‍රී ලංකා රුපියල් පරිවර්තනය කළ යුතුය.

5. **වෙනත් කොන්දේසි**

5.1 බලයලත් වෙළෙඳුන් විසින් ණය මුදල හා සම්බන්ධ සියළු අවදානම් තක්සේරු කළයුතු අතර එම අවදානම් අවම කිරීම සඳහා යෝග්‍ය විචක්ෂණ ක්‍රියාමාර්ග ගත යුතුය.

5.2 ණය ගැණුම්කරුවා ශ්‍රී ලංකාව තුළ නේවාසිකව සිටින අතරතුර, එම ණය ගැණුම්කරුවා හට උරුම වූ හෝ අයිතිය පවතින දේපළක ඉදිකිරීම/ සංවර්ධනය/නවීකරණය පිණිස ණය මුදල යොදා ගනු ලබන්නේ නම්, බලයලත් වෙළෙඳුන් විසින් එම ණය මුදල නිකුත් කිරීමට පෙර, බැංකු පනත යටතේ නිකුත් කරනු ලැබූ විචක්ෂණ රෙගුලාසි ප්‍රකාරව තෝරා ගන්නා ලද තක්සේරු කරුවෙකුගෙන් දේපළ පිළිබඳ තක්සේරුවක් ලබාගත යුතුය.

5.3 5.2 ඡේදය ප්‍රකාරව ණය මුදල භාවිතා කරමින් අත්පත් කරගත්/ඉදිකරනු ලැබූ සංවර්ධනය කරනු ලැබූ/නවීකරණය කරනු ලැබූ දේපළ විකිණීමෙන් ලද මුදල් පහත පදනම යටතේ ශ්‍රී ලංකාවෙන් පිටතට ප්‍රේෂණය කරනු ලබන බවට බලයලත් වෙළෙඳුන් විසින් සහතික විය යුතුය.

(අ) ණය ආපසු ගෙවීම සඳහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරන ලද මුදලට සමානුපාතික විකුණුම් මුදලක් නිදහසේ ප්‍රේෂණය කළහැක.

(ආ) ශේෂ වන යම් විකුණුම් මුදලක් වේ නම් විගමනික දීමනාවට යටත්ව ප්‍රේෂණය කළ යුතුය.

5.4 අනාගත ප්‍රතිමුඛ පර්යේෂණවලට පහසුකම් සැලසීම පිණිස, ණය ආපසු ගෙවීම සඳහා භාවිතා කළ ආමුඛ ප්‍රේෂණය පිළිබඳ තහවුරුවක් ණය ගැණුම්කරුවා වෙත නිකුත් කළ යුතුය.

5.5 බලයලත් වෙළෙඳුන් විසින් ණය මුදල ප්‍රදානය කරන අවස්ථාවේදී ලබාගත් ලේඛනගත සාක්ෂි, ණය මුදල් සම්පූර්ණයෙන්ම ගෙවා පියවන තෙක්, ව්‍යවස්ථාපිත වාර්තා තබා ගැනීමේ අවශ්‍යතාවයන් ඉක්මවා වුවද පවත්වාගෙන යා යුතුය. ණය මුදල ගෙවා පියවූ පසු, අදාළ ලේඛනගත සාක්ෂි ව්‍යවස්ථාපිත වාර්තා තබා ගැනීමේ කාලසීමාව දක්වා පවත්වාගෙන යා යුතුය.

**විනිමය පාලක**

**විනිමය පාලන පනත යටතේ විධානයන් 2017 අංක 02** 2017 මාර්තු 07

## වෙනත් රටක ස්ථිර නේවාසික වීසා මත ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරනු ලබන ශ්‍රී ලාංකිකයන්ට හා ද්විත්ව පුරවැසිභාවය ලබාගත් පුද්ගලයන් හට ලබා දෙන ණය පිළිබඳව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2017 මාර්තු 07 දිනැති 2017 අංක 01 දරන විධානවලින් පැන නැගෙන ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම පිණිස, පහත ගිණුම් සඳහා හර කිරීම් සහ බැර කිරීම් සිදු කිරීමට විනිමය පාලන පනතේ 3 සහ 5 වගන්ති ප්‍රකාරව බලයලත් වෙළෙඳුන් හට මෙමගින් අවසර දෙනු ලැබේ.

1. අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පිළිබඳව නිකුත් කරන ලද 2016 අංක 1 සහ 2016 අංක 5 දරන විධානයන් පහත දැ ඇතුලත් කරමින් 1.4 ඡේදය සංශෝධනය කෙරේ.

(i) එම ගිණුම් හිමියාගේම, විදේශ ව්‍යවහාර මුදලින් වන ණය ගිණුමකට හෝ ශ්‍රී ලංකා රුපියල් ගිණුමකට අරමුදල් මාරු කිරීම.

2. නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පිළිබඳව නිකුත් කරන ලද 2016 අංක 2 සහ 2016 අංක 6 දරන විධානයන් පහත දැ ඇතුළත් කරමින් 1.4 ඡේදය සංශෝධනය කෙරේ.

(ඌ) එම ගිණුම් හිමියාගේම, විදේශ ව්‍යවහාර මුදලින් වන ණය ගිණුමකට හෝ ශ්‍රී ලංකා රුපියල් ගිණුමකට අරමුදල් මාරු කිරීම.

3. සුරැකුම්පත් ආයෝජන ගිණුම් පිළිබඳව නිකුත් කරන ලද 2013 ජුනි 12 දිනැති අංක 06/04/18/2013 දරන විධානයන් පහත දැ ඇතුළත් කරමින් 4 ඡේදය සංශෝධනය කෙරේ.

(vi) එම ගිණුම් හිමියාගේම, විදේශ ව්‍යවහාර මුදලින් වන ණය ගිණුමකට හෝ ශ්‍රී ලංකා රුපියල් ගිණුමකට අරමුදල් මාරු කිරීම.

4. විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් පිළිබඳව නිකුත් කරන ලද 2016 අංක 04 සහ 2016 අංක 8 දරන විධානයන් පහත දැ ඇතුළත් කරමින් 1.4 ඡේදය සංශෝධනය කෙරේ.

(ත) අත්පත් කර ගැනීම/ඉදි කිරීම/සංවර්ධනය හෝ නවීකරණය වෙනුවෙන් විදේශ ව්‍යවහාර මුදලින් වන ණය ගිණුමකින් මාරු කරන අරමුදල්.

විනිමය පාලක

**විනිමය පාලන පනත යටතේ විධානයන් 2017 අංක 07** 2017 ජූලි 05

## අන්තර්ජාතික සේවා සැපයුම්කරුවන් සහ ඔවුන්ගේ සේවකයන් සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පිළිබඳව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදනයන් යටතේ (ශ්‍රී ලංකාවෙන් පිටත සේවා සපයනු ලබන සමාගම්වල සේවකයන්ට අදාළ සහන අනුපාත සම්බන්ධව 2015 අංක 09 දරන (සංශෝධිත) දේශීය ආදායම් පනතේ කරනු ලැබූ සංශෝධන ප්‍රකාරව) 'නිදහස් ව්‍යාපෘති' වල නියැලී සිටින වෘත්තිමය සේවා සැපයුම්කරුවන් හට 'ආදායම් බදු නිදහස් කිරීම්' ප්‍රදානය නොකරන හෙයින්, 2010.05.07 දිනැති අංක 06/04/05/2010 හා 2014.05.28 දිනැති අංක 06/04/06/2014 විධානයන් යටතේ අළුතින් 'අන්තර්ජාතික සේවා සැපයුම්කරුවන් හා ඔවුන්ගේ සේවකයන් සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්' විවෘත කිරීමේ හැකියාව ඉවත් කර ගන්නා බව විනිමය පාලන පනතේ 45 වගන්තිය සමග කියැවෙන එකී පනතේ 3 වගන්තිය ප්‍රකාරව බලයලත් වෙළෙඳුන් හට මෙමගින් දැනුම් දෙනු ලැබේ.

විනිමය පාලක

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2043/31 - 2017 ඔක්තෝබර් මස 31 වැනි අඟහරුවාදා - 2017.10.31

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

**I වැනි කොටස : (I) වැනි ජෙදය - සාමාන්‍ය**

**රජයේ නිවේදන**

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත**

1 වන වගන්තිය යටතේ වූ නියමය

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 1 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මා විසින්, මේ නියමය මගින්, 2017 නොවැම්බර් මස 20 වන දිනය ඉහත කී පනත ක්‍රියාත්මක විය යුතු දිනය වශයෙන් මෙයින් නියම කරනු ලැබේ.

ඉහත කී පනතේ 1 වන වගන්තිය යටතේ සාදන ලද අංක 2040/43 දරන සහ 2017 ඔක්තෝබර් මස 13 දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මෙයින් අවලංගු කරනු ලැබේ.

රනිල් වික්‍රමසිංහ,
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය.

2017 ඔක්තෝබර් මස 31 වැනි දින,
කොළඹ දී ය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2045/56 - 2017 නොවැම්බර් මස 17 වැනි සිකුරාදා - 2017.11.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

**I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය**

**රජයේ නිවේදන**

## 2017 අංක 12 දරන විදේශ විනිමය පනත

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වන වගන්තිය සමග කියවිය යුතු, 29 වන වගන්තිය යටතේ සාදනු ලබන නියෝග.

රනිල් වික්‍රමසිංහ,
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය.

2017 නොවැම්බර් මස 17 වැනි දින,

කොළඹ දී ය.

### නියෝග

1. මේ නියෝග 2017 අංක 1 දරන විදේශ විනිමය (බලයලත් වෙළෙන්දන් වන බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිදු කරනු ලබන විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු අතර පනත ක්‍රියාත්මකවන දිනයේ දී ක්‍රියාත්මක විය යුතු ය.

I වන කොටස

**ප්‍රාග්ධන ගනුදෙනු වර්ග**

2. (1) මේ නියෝගවල කාර්ය සඳහා පහත සඳහන් ප්‍රාග්ධන ගනුදෙනු බලයලත් වෙළෙන්දන් වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිදු කරනු ලබන විදේශ විනිමයෙන් වූ බලයලත් ප්‍රාග්ධන ගනුදෙනු වර්ග විය යුතු ය:-

(අ) මේ නියෝගවල I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් සීමාවන්, නියමයන් සහ කොන්දේසිවලට යටත්ව ශ්‍රී ලංකාවේ යම් නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත දී සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු;

(ආ) මේ නියෝගවල II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් සීමාවන්, නියමයන් හා කොන්දේසිවලට යටත්ව ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු; සහ

(ඇ) මේ නියෝගවල III වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් සීමාවන්, නියමයන් සහ කොන්දේසිවලට යටත්ව, ඉවත් කරන ලද විනිමය පාලන පනතේ විධිවිධාන යටතේ ප්‍රදානය කරනු ලැබූ යම් (සාමාන්‍ය හෝ විශේෂ) අනුමතයක් යටතේ සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු.

(2) මේ නියෝගවල IV වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් වෙනත් ප්‍රාග්ධන ගනුදෙනු, බලයලත් වෙළෙන්දන් වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලයලත් වෙළෙන්දන් වශයෙන් පනතේ 4(1)(ඇ) වගන්තිය යටතේ විදේශ විනිමය වෙළෙඳාම් කිරීම සඳහා බලය ලබා දෙන ලෙස සලකනු ලැබ ඇති බලපත්‍රලාභී විශේෂ බැංකු සහ පනතේ 4(1)(ඇ) වගන්තිය යටතේ මහ බැංකුව විසින් විදේශ විනිමය වෙළෙඳාම් කිරීම සඳහා බලය ලබා දෙනු ලැබිය හැකි බලපත්‍රලාභී විශේෂ බැංකු විසින් IV වන උපලේඛනයේ සඳහන් සීමාවන්ට ද නියමයන් සහ කොන්දේසිවලට ද යටත්ව සිදු කරනු ලැබිය යුතු ය.

3. (1) ශ්‍රී ලංකාවෙන් පිටත යම් බැංකුවක් තුළ යම් ගිණුමක් විවෘත කිරීමට, පවත්වාගෙන යාමට හා ක්‍රියාත්මක කිරීමට සහ එකී ගිණුම් වසා දැමීමට අදහස් කරන්නා වූ, IV වන උපලේඛනයේ උෟ ශීර්ෂය යටතේ නිශ්චිතව සඳහන් යම් තැනැත්තකු විසින් මේ නියෝගවල කාර්ය සඳහා එසේ සිදු කරනු ලැබිය හැකි ය.

(2) (1) වන ඡේදය යටතේ විවෘත කළ යම් ගිණුමක් පනතේ විධිවිධාන යටතේ අවසරලත් ගිණුම් හිමියාගේ විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනුවක් සඳහා, ශ්‍රී ලංකාවෙන් පිටත දී නීත්‍යානුකූලව ලබාගත් හෝ අත්පත්කරගත් විදේශ ව්‍යවහාර මුදල්වලින් හෝ බලයලත් වෙළෙන්දකුගෙන් හෝ IV වන උපලේඛනයේ උෟ ශීර්ෂයේ 1 වන ඡේදයේ නිශ්චිතව සඳහන් ශ්‍රී ලංකාව තුළ සිටින තැනැත්තකුගෙන් ලබාගත් විදේශ ව්‍යවහාර මුදල්වලින් බැර කරනු ලැබිය හැකි ය.

(3) (1) වන ඡේදය යටතේ විවෘත කළ ගිණුම්වල අරමුදල්, ශ්‍රී ලංකාවේ නේවාසික යම් තැනැත්තකු සඳහා වන, අවසරලත් ගිණුම් හිමියාගේ ඕනෑම විදේශ විනිමය ගනුදෙනුවක් සඳහා පනතේ විධිවිධාන යටතේ යොදවනු ලැබිය හැකි ය.

(4) (5) වන ඡේදයේ නිශ්චිතව සඳහන් කොන්දේසිවලට යටත්ව, (1) වන ඡේදය යටතේ ප්‍රදානය කරන ලද අවසරයට අනුකූලව විදේශ බැංකුවක විවෘත කර පවත්වාගෙන යනු ලබන යම් ගිණුමක් වසා දැමූ අවස්ථාවක දී, එකී ගිණුම වසාදැමීම සිදු කර එක් මාසයක් ඇතුළත ගිණුමේ ශේෂය බැංකු පද්ධතිය හරහා ශ්‍රී ලංකාව වෙත ආපසු යවනු ලැබිය යුතු ය.

(5) ඉහත IV වන උපලේඛනයේ උෟ ශීර්ෂයේ (උ) අයිතමය යටතේ ශ්‍රී ලංකාවෙන් පිටත යම් ගිණුමක් විවෘත කිරීමට සහ පවත්වාගෙන යාමට අවසරලත් යම් තැනැත්තකුට ශිෂ්‍ය වීසා ලබා දීම යම් රටකින් ප්‍රතික්ෂේප කරනු ලැබ ඇති අවස්ථාවක දී හෝ ශිෂ්‍ය වීසා ලබා ගැනීමෙන් පසු අධ්‍යයන කටයුතු ආරම්භ නොකිරීමට ඒ තැනැත්තා තීරණය කරනු ලබන අවස්ථාවක දී, එකී තැනැත්තා විසින්, මෙම අවසරය යටතේ ශ්‍රී ලංකාවෙන් පිටත එකී තැනැත්තා විසින් විවෘත කරන ලද ගිණුමේ බැරට පවතින සියලු මුදල්, එකී තීරණය ගත් දිනයේ සිට එක් මාසයක් ඇතුළත ආපසු ගෙවනු ලැබිය යුතු ය.

## II වන කොටස
## සාමාන්‍ය කොන්දේසි යනාදිය

4. (1) යම් බලයලත් වෙළෙන්දකු වශයෙන් වූ සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක්, යම් බලයලත් වෙළෙන්දකු වශයෙන් වූ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හරහා ප්‍රාග්ධන ගනුදෙනු සිදු කළ තැනැත්තන්, සුරැකුම්පත් නිකුත්කරන්නන් හා ණය ගැනුම්කරුවන් විසින්, ඔවුන් විසින් සිදු කරන ලද ප්‍රාග්ධන ගනුදෙනු, මෙම නියෝගය යටතේ අවසරලත් ගනුදෙනු වන බවට ඔප්පු කළ හැකි සියලු තොරතුරු හා ලේඛනගත සාක්ෂි, එකී ගනුදෙනු සිදු කිරීමෙන් වසර හයක කාලසීමාවක් දක්වා රඳවා තබා ගත යුතු ය.

(2) සුරැකුම්පත් ආයෝජනය කිරීම, ණය ලබා ගැනීම් හා බැරකම් මත ඇපවීම් සම්බන්ධයෙන් වන විට, එම තොරතුරු, එකී සුරැකුම්පත් බැහැර කරනු ලබන දිනයේ සිට ණය ආපසු ගෙවනු ලබන දිනයේ සිට හෝ ඇපය කල් ඉකුත් වනු ලබන දිනයේ සිට වසර හයක කාලසීමාවක් දක්වා තබා ගත යුතු ය.

(3) මේ නියෝග යටතේ යම් ප්‍රාග්ධන ගනුදෙනුවක්, බලයලත් වෙළෙන්දකු වන යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හරහා සිදු කරනු ලැබීමට අවසරලත් යම් තැනැත්තකු විසින්, අරමුදල් ගලා ඒම් හෝ ගලා යාම් පිළිබඳව ද, වත්කම් බැහැර කිරීම හෝ අත්පත් කරගැනීම, ප්‍රාග්ධන ගනුදෙනු මත ආදායම් හෝ ප්‍රතිලාභ ලැබීම් පිළිබඳව ද නිසියාකාරයෙන් නීත්‍යානුකූලව පිළිගනු ලබන ලේඛනගත සාක්ෂි සහ එකී ගනුදෙනුවල නීත්‍යානුකූලභාවය ප්‍රමාණවත්ව ඔප්පු කළ හැකි වෙන යම් ලේඛනගත සාක්ෂි තබා ගැනීම සහ පවත්වා ගැනීම සිදු කළ යුතු ය.

(4) බලයලත් වෙළෙන්දකු වන සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හා බලයලත් වෙළෙන්දකු වන බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හරහා ගනුදෙනු සිදු කරනු ලබන සෑම තැනැත්තකු විසින් ම, එම ගනුදෙනු සිදුවන අවස්ථාවල දී අවශ්‍ය වන ලේඛන සැපයීම මගින් මේ නියෝගවල විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීම සඳහා පහසුකම් සලස්වනු ලැබිය යුතු ය.

5. මේ නියෝගවල කාර්ය සඳහා -

"පනත" යන්නෙන් 2017 අංක 12 දරන විදේශ විනිමය පනත අදහස් වේ;

"බලයලත් වෙළෙන්දා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඇති අර්ථය ම තිබිය යුතු ය;

"ප්‍රාග්ධන ගනුදෙනුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඇති අර්ථය ම තිබිය යුතු ය;

"බලපත්‍රලාභී වාණිජ බැංකුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඇති අර්ථයම තිබිය යුතු ය;

"පරිච්ඡින්න කරන ලද විනිමය පාලන පනත" යන්නෙන් (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනත අදහස් වේ;

## I වන උපලේඛනය

(2(අ) වන නියෝගය)

### ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු

1. සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයකු විසින් බලයලත් වෙළෙන්දකු ලෙස ප්‍රාග්ධන ගනුදෙනු සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තන්ට ගෙවීම් සිදු කිරීම පිණිස යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවකින් පහත සඳහන් කාර්ය සඳහා විදේශ විනිමය මිල දී ගත හැකි ය:-

(අ) ශ්‍රී ලංකාවෙන් පිට සංස්ථාපනය කරන ලද සමාගම්වල (විදේශීය සමාගම්) කොටස් හා ණය සුරැකුම්, නියාමනය කරන ලද ඒකක භාරවල සහ අන්‍යෝන්‍ය අරමුදල්වල ඒකක සහ ආයෝජනය සිදු කරන අවස්ථාවේ දී ශ්‍රී ලංකාවේ පවතින ස්වෛරී ණය ශ්‍රේණිගත කිරීම් කර ඇති ශ්‍රේණියක ශ්‍රේණිගත කර ඇති විදේශීය රජයන් විසින් කරනු ලබන ස්වෛරීත්ව බැඳුම්කර අත්කර ගැනීම සහ දැරීම සඳහා ;

(ආ) විදේශ රටක (පුද්ගලයකු නොවන වෙනත් තැනැත්තකු විසින්) ශාඛා, සම්බන්ධීකරණ, අලෙවිකරණ, අනුයෝජිත, ව්‍යාපෘති, නියෝජිත හෝ සමාන කාර්යාල (විදේශීය කාර්යාල) පිහිටුවීම සහ පවත්වාගෙන යාම සඳහා.

2. (1) ඉහත 1 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රාග්ධන ගනුදෙනු පහත දැක්වෙන 1 වන වගුවේ නිශ්චිතව දක්වා ඇති සීමාවන්ට යටත් විය යුතු ය :-

1 වන වගුව - ප්‍රතිමුඛ ආයෝජන සඳහා වන සීමාවන්

| I වන තීරය | II වන තීරය | III වන තීරය |
|---|---|---|
| සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයා | ආයෝජන/සාධන පත්‍ර වර්ගය | අවසරලත් සීමාව |
| (i) කොළඹ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත සමාගමක් | කොටස්, ඒකක, ණය සුරැකුම් සහ ස්වෛරීත්ව බැඳුම්කර | ලිත් වර්ෂයක් සඳහා එ.ජ.ඩො. 2,000,000 ක් හෝ මහ බැංකුව විසින් නම් කරනු ලැබූ යම් විදේශ ව්‍යවහාර මුදල්වලින් ඊට සමාන ප්‍රමාණයක්. |
| (ii) ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී කොටස් වෙළඳපොළක ලැයිස්තුගත නොකළ සමාගමක් | | ලිත් වර්ෂයක් සඳහා එ.ජ.ඩො. 500,000 ක් හෝ මහ බැංකුව විසින් නම් කරනු ලැබූ යම් විදේශ ව්‍යවහාර මුදල්වලින් ඊට සමාන ප්‍රමාණයක්. |
| (iii) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි හවුල් ව්‍යාපාරයක් | | ජීවිත කාලයටම එ.ජ.ඩො. 300,000 ක් හෝ මහ බැංකුව විසින් නම් කරනු ලැබූ යම් විදේශ ව්‍යවහාර මුදල්වලින් ඊට සමාන ප්‍රමාණයක්. |
| (iv) තනි පුද්ගලයෙක් | | ජීවිත කාලයටම එ.ජ.ඩො. 200,000 ක් හෝ මහ බැංකුව විසින් නම් කරනු ලැබූ යම් විදේශ ව්‍යවහාර මුදල්වලින් ඊට සමාන ප්‍රමාණයක්. |

| | | |
|---|---|---|
| (v) සමාගමක් හෝ හවුල් ව්‍යාපාරයක් | විදේශීය කාර්යාල පිහිටුවීම | ලිත් වර්ෂයක් සඳහා එ.ජ.ඩො. 300,000 ක් හෝ මහ බැංකුව විසින් නම් කරනු ලැබූ යම් විදේශ ව්‍යවහාර මුදල්වලින් ඊට සමාන ප්‍රමාණයක්. |

(2) ඉහත 1 වන වගුවේ නිශ්චිතව දක්වා ඇති ආයෝජන සඳහා වන සමස්ත සීමා, මේ නියෝග යටතේ සිදු කරන ලද සමස්ත ආයෝජන සහ පරිච්ඡින්න කරන ලද විනිමය පාලන පනත ප්‍රකාර නිකුත් කරන ලද 2011 ජනවාරි 01 වන දිනැති අංක 1686/50, 1686/52 සහ 1686/53 දරන *ගැසට් නිවේදන* මගින් ප්‍රදානය කරන ලද පොදු අවසරය ප්‍රකාරව මීට පෙර සිදු කරන ලද යම් ප්‍රතිමුඛ ගෙවීම් වලින් සංයුක්ත විය යුතු ය.

3. ඉහත දක්වා ඇති සීමා ඉක්මවන යම් ආයෝජනයක් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත අයදුම්පතක් ඉදිරිපත් කරනු ලැබ, 7 වන වගන්තිය ප්‍රකාරව මුදල් මණ්ඩලයේ විශේෂ අනුමැතියක් ලබා ගත යුතු වේ.

4. අවසරලත් ආයෝජන සිදු කිරීම සඳහා අවශ්‍ය වන ප්‍රතිමුඛ ප්‍රේෂණ, සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයා විසින් බලයලත් වෙළෙන්දකු වශයෙන් වූ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සමග ආරම්භ කර පවත්වාගෙන යන ප්‍රතිමුඛ ආයෝජන ගිණුමක් හරහා සිදු කරනු ලැබිය යුතු ය.

5. එකී ආයෝජනවලින් ලැබෙන ආදායම සහ බහිෂ්කරණ ප්‍රතිෂ්ඨා මුදල් (නිකුත් කරන්නා විසින් කරන ලද සාංගමික ක්‍රියාවක්, අයිතියක් ක්‍රියාත්මක කිරීමක්, හිමිකමක් හෝ පරිවර්තනයක් ප්‍රකාර එම ආයෝජකයාට පසුව පැවරෙන කොටස් ඇතුළුව) ආරම්භක ආයෝජනය සිදු කරන ලද එම ප්‍රතිමුඛ ආයෝජන ගිණුම හරහාම ශ්‍රී ලංකාව තුළට ගෙන ආ යුතු ය.

6. සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයකු ම සියලුම ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් බලයලත් වෙළෙන්දකු වශයෙන් වූ එක් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සමග පවත්වාගෙන යා යුතු අතර බලයලත් වෙළෙන්දකු වශයෙන් වූ බලපත්‍රලාභී වාණිජ බැංකු එකකට වැඩි සංඛ්‍යාවක් සමග ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් ආරම්භ කොට පවත්වාගෙන යාමට අවශ්‍ය යම් ආයෝජකයකු විසින් බලයලත් වෙළෙන්දකු වශයෙන් වූ අදාළ බලපත්‍රලාභී වාණිජ බැංකුව හරහා ඉල්ලීමක් යොමු කිරීම මගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගෙන් විශේෂ අනුමැතියක් ලබා ගත යුතු ය.

7. පරිච්ඡින්න කරන ලද විනිමය පාලන පනතේ හෝ මේ පනතේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකාවේ යම් නේවාසික තැනැත්තකුට විරුද්ධව කරන ලද චෝදනාවක් සම්බන්ධයෙන් එම තැනැත්තාට එරෙහිව නීති කෘත්‍යයක් හෝ විමර්ශන පවත්වාගෙන යන්නේ ද, එම තැනැත්තා මේ උපලේඛනය යටතේ අවසර ලබා දී ඇති කාර්යයන් සඳහා ප්‍රාග්ධන ගනුදෙනු සිදු කරගෙන යාමට සුදුසුකම් නොලබන්නේ ය.

8. යම් සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයකු විසින් අවසරලත් ආයෝජන සම්බන්ධයෙන් ප්‍රතිෂ්ඨාවක් ගෙවීමට නොතිබෙන අවස්ථාවක දී, සීමා රහිතව සහ මේ උපලේඛනයේ 2 වන ඡේදයේ 1 වන වගුවෙහි නිශ්චිතව සඳහන් සීමා නොතකා විදේශීය සමාගමක කොටස් අත්කර ගැනීම සහ දැරීම කරනු ලැබිය හැකි ය.

9. විදේශීය සමාගමක් විසින් ශ්‍රී ලංකාව තුළ ඇති එම සමාගමේ ශාඛාවක හෝ එහි පාලිත සමාගමක සේවකයන් වෙත පිරිනමනු ලැබූ සේවක කොටස් හිමිකම් සැලැස්ම හෝ සේවක කොටස් වරණීය ක්‍රමය හෝ පිළිබඳ සැලැස්ම යටතේ තමා වෙත පැවරුනු කොටස් සඳහා ගෙවීම් සිදු කිරීමට නියම කරනු ලැබ ඇති තැනැත්තකුට මේ උපලේඛනයේ 2 වන ඡේදයේ 1 වන වගුවේ නිශ්චිතව සඳහන් සීමාව අදාළ නොවිය යුතු ය. ඉහත සඳහන් කොටස් ලැබීම් සම්බන්ධයෙන් එම විදේශීය සමාගම් වෙත ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද පාලිත සමාගමෙන් හෝ ශාඛාවෙන් ඍජු ප්‍රේෂණ මත පදනම්ව ප්‍රතිෂ්ඨාවක් වශයෙන් බාහිර ප්‍රේෂණයක් සිදු කිරීම සඳහා යම් නියමයක් පවතින්නේ නම්, ගනුදෙනුවේ සද්භාවය පිළිබඳ සෑහීමට පත් වීම මත බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් බලයලත් වෙළෙන්දකු වශයෙන් එම අරමුදල් හුවමාරුව බලාත්මක කරනු ලැබිය හැකි ය.

10. මේ උපලේඛනයේ 2 වන ඡේදයේ 1 වන වගුවේ නිශ්චිතව සඳහන් අවසරලත් සීමාවන්ට යටත් වීමකින් තොරව, මේ උපලේඛනය යටතේ අවසර දෙනු ලැබූ කාර්යයන් සඳහා සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයකු වෙත, බාහිර ආයෝජන ගිණුම සඳහා බැර කරන ලද පූර්ව බාහිර ආයෝජනවල ප්‍රාග්ධන වටිනාකමින් සියයට පනහ දක්වා අරමුදල් උපයෝගී කර ගනිමින් ආයෝජන සිදු කිරීමට, අවසර ලබා දිය හැකි ය.

11. මේ උපලේඛනයේ කාර්ය සඳහා -

"මහ බැංකුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"කොළඹ කොටස් වෙළෙඳපොළ" යන්නෙන් 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පිහිටුවන ලද හා ලියාපදිංචි කරන ලද සහ 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් කොටස් වෙළෙඳපොළක් වශයෙන් ක්‍රියාත්මක වීම සඳහා බලපත්‍ර ලබා දෙනු ලැබූ කොළඹ කොටස් වෙළෙඳපොළ අදහස් වේ;

"සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයා" යන්නෙන් ඉහත 2 ඡේදයේ 1 වන වගුවෙහි 1 වන තීරයෙහි නිශ්චිතව සඳහන් පරිදි වූ සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයකු අදහස් වේ;

"සේවක කොටස් හිමිකම් සැලැස්ම හෝ සේවක කොටස් වරණීය ක්‍රමය" යන්නෙන් ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කරනු ලැබූ සමාගමක් එහි කොටස් හෝ සමූහ සමාගම්වල කොටස් ශ්‍රී ලංකාව තුළ ඇති එම සමාගමේ ශාඛාවක හෝ පාලිත සමාගමක සේවකයන් හට අත්කර ගැනීමට අවස්ථාවක් පිරිනමන සැලැස්මක් හෝ ක්‍රමයක් අදහස් වේ;

"මුදල් මණ්ඩලය" යන්නෙන් 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

**II වන උපලේඛනය**

**(2 (ආ) නියෝගය)**

**ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවේ දී බාර ගනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු**

අ. අවසරලත් ආයෝජන

1. ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවනු ලැබූ දේශීය අරමුදල්, ප්‍රාදේශීය අරමුදල්, ආයෝජන අරමුදල් සහ අන්‍යෝන්‍ය අරමුදල් ඇතුළත් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවට විදේශ විනිමය ප්‍රේෂණ කිරීම අවශ්‍ය කරනු ලබන විට, පහත සඳහන් වර්ගවල ප්‍රාග්ධන ගනුදෙනුවල ශ්‍රී ලංකාවේ දී නිරත වනු ලැබිය හැකි ය:-

(අ) 3 වන ඡේදයේ නිශ්චිතව සඳහන් බැහැර කිරීම්වලට යටත්ව සහ මේ උපලේඛනයේ අ ශීර්ෂය යටතේ 4 වන ඡේදයේ නිශ්චිතව සඳහන් සීමාවන් ට යටත්ව, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කරනු ලැබූ සමාගම් මගින් නිකුත් කරනු ලැබූ (නිකුත් කරන්නාගේ සංස්ථායී ක්‍රියාවක් ප්‍රකාර හෝ යම් අයිතියක්, හිමිකමක් හෝ පරිවර්තනයක් ක්‍රියාත්මක කිරීම මගින් එකී ආයෝජකයා වෙත පසුකාලීනව පැවරෙන යම් කොටස් ද ඇතුළුව) සියලු පංතිවල කොටස් හෝ කොටස් සඳහා වූ හිමිකමක් ආයෝජනය කිරීම, අත්කර ගැනීම හෝ දැරීම;

(ආ) කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කරනු නොලැබූ සමාගමක සියලු වර්ගයේ කොටස් ආයෝජනය කිරීම, අත්කර ගැනීම හෝ දැරීම;

(ඇ) ණය සුරැකුම්පත්හි ආයෝජනය කිරීම හෝ වසර තුනක කාලයක් හෝ ඊට වැඩි කාලයක් සඳහා (බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, විශේෂිත කල්බදු සමාගම් සහ ඇප මගින් සීමිත සමාගම් සහ විදේශීය සමාගම් හැර) ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කරනු ලැබූ සමාගම් වෙත විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ණය ප්‍රදානය කිරීම;

(ඈ) අදාළ නියාමන අධිකාරිවල අනුමැතියට යටත්ව බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, විශේෂිත කල්බදු සමාගම් විසින් විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් නිකුත් කරනු ලැබූ ණය සුරැකුම්පත් හි ආයෝජනය කිරීම හෝ ඒ සඳහා ණය ප්‍රදානය කිරීම.

(ඉ) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට හෝ සීමාකිරීම්වලට යටත්ව,

(i) ඒකක භාරවල හෝ අන්‍යෝන්‍ය අරමුදල්වල ඒකකයන් හි;

(ii) රජයේ සුරැකුම්පත් (භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර හෝ රජය විසින් නිකුත් කරනු ලබන වෙනත් යම් සුරැකුම්පත්);

(iii) ශ්‍රී ලංකා මහ බැංකුව හෝ වෙනත් යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් විසින් නිකුත් කරනු ලැබූ සුරැකුම්පත් හි;

(iv) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල (SLDBs);

(v) බලපත්‍රලාභී මූල්‍ය ආයතනයන් හි තැන්පතුවල;

(vi) නිශ්චල දේපළවල; හෝ

(vii) අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි විධානවලට අනුකූලව මුදල් මණ්ඩලය විසින් අනුමත කරනු ලබන වෙනත් යම් ආයෝජන වර්ගයන් හි,

ආයෝජනය කිරීම.

2. ඉහත අ ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (අ) සිට (ඊ) දක්වා අයිතමයන් හි නිශ්චිතව සඳහන්, බාර ගනු ලැබූ සියලු ප්‍රාග්ධන ගනුදෙනු බාර ගැනීම පහත සඳහන් කොන්දේසිවලට යටත් විය යුතු ය.

(අ) ඉහත සඳහන් ප්‍රාග්ධන ආයෝජන සඳහා අවශ්‍ය වනු ලබන සියලු අරමුදල් බලයලත් වෙළෙන්දකු වශයෙන් වූ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සමග, මහ බැංකුව විසින් යම් නම් කළ විදේශීය ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් පවත්වාගෙන යනු ලබන ආමුඛ ආයෝජන ගිණුමක් හරහා සපයනු ලැබිය යුතු ය.

(ආ) එකී ආයෝජන මගින් ලද සියලු ආදායම් සහ ආයෝජන බැහැර කිරීමෙන් ලද ප්‍රතිෂ්ඨා මුදල් ආයෝජනය සිදු කරනු ලැබූ ආමුඛ ආයෝජන ගිණුම බැර කරනු ලැබිය යුතු ය.

(ඇ) විජාතිකයකු වන්නා වූ තැනැත්තකුගෙන් උරුමයන් වශයෙන් පැවරෙන ලද්දා වූ (IV වන උපලේඛනයේ ආ ශීර්ෂය යටතේ (1) වන ඡේදයේ (1) වන අනුඡේදයේ නිර්වචනය කරනු ලැබ ඇති පරිදි වූ විගාමිකයන් හැර) සියලු ආදායම්, ඉහත ආයෝජන විකිණීමෙන් ලැබෙන සියලු මුදල්, (නිකුත් කරන්නාගේ සංස්ථායී ක්‍රියාවක්, අයිතිය ක්‍රියාත්මක කිරීමක්, හිමිකමක් හෝ පරිවර්තනයක් ප්‍රකාර ආයෝජකයා වෙත පසුව පැවරෙන යම් කොටස් ද ඇතුළුව) ආයෝජනය මේ උපලේඛනයේ අ ශීර්ෂය යටතේ 1 වන ඡේදයට අනුකූලවෙමින්, මුල් ආයෝජකගේ ආමුඛ ආයෝජන ගිණුම හරහා හෝ ආමුඛ ආයෝජන ගිණුමක් ලෙස නැවත නම් කරන ලද සුරැකුම්පත් ආයෝජන ගිණුමක් හරහා හෝ වෙනත් ගිණුමක් හරහා ආමුඛ ප්‍රේෂණයක් වශයෙන් සිදු කරන ලද්දේ නම්, ප්‍රතිලාභියා විසින් විවෘත කරන ලද ආමුඛ ආයෝජන ගිණුමක් හරහා ආපසු සියරට යැවිය හැකි ය.

(ඈ) ආයෝජනය සඳහා ආමුඛ ප්‍රේෂණයේ සාක්ෂි සැපයීමට යටත්ව ආයෝජකයකු විසින් විවෘත කරන ලද ආමුඛ ආයෝජන ගිණුමක් හරහා, මෙම නියෝගය බලාත්මක වන දිනට පෙරාතුව (පරිවර්තකයන්, හිමිකරුවන්, අයිතිවාසිකමක් ක්‍රියාවට නැංවීමක්, නිකුත්කරන්නා විසින් සිදු කරන ලද සංස්ථාගත ක්‍රියාවක් එකී ආයෝජකයා වෙත පසුව සිදු කරන කොටස් පැවරීමක් ඇතුළුව) ඉහත ආයෝජන විකිණීම මත ලැබූ සියලු ආදායම්, ප්‍රතිෂ්ඨා මුදල් ශ්‍රී ලංකාවෙන් පිටතට යවනු ලැබිය හැකි ය. 2010 ජනවාරි 1 වන දිනට පෙරාතුව සිදු කරන ලද ආයෝජන සම්බන්ධයෙන් ආයෝජනය සඳහා ආමුඛ ප්‍රේෂණයේ සාක්ෂි නොමැති අවස්ථාවක දී, බලයලත් ගනුදෙනුකරුවකු ලෙස බලපත්‍රලත් වාණිජ බැංකුවක් විසින් පාදක ගනුදෙනුවල සද්භාවය පිළිබඳ සෑහීමකට පත්වීම මත නේවාසික නොවන ආයෝජකයකු විසින් විවෘත කරන ලද ආමුඛ ආයෝජන ගිණුමක් හරහා ඉහත සඳහන් ප්‍රතිෂ්ඨා මුදල් සහ යම් ආයෝජන ආදායමක් ශ්‍රී ලංකාවෙන් පිටතට යවනු ලැබිය හැකි ය.

(ඉ) ආයෝජිත සමාගම, සමාගම් ලේකම්වරු සහ කොටස් තැරැව්කරුවන්, ඒකක භාර, අන්‍යොන්‍ය අරමුදල් සහ මූල්‍ය ආයතන ඇතුළු සියලු අතරමැදියන් ඇතුළුව මේ උපලේඛනයේ 1 වන ඡේදයේ නිශ්චිතව සඳහන් කර ඇති ප්‍රාග්ධන ගනුදෙනුවල නියුතු නේවාසික ආස්ථිත්වයන් විසින්, ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තන් විසින් මේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති සියලු අවශ්‍යතාවයන්ට අනුකූලව එකී ප්‍රාග්ධන ගනුදෙනු සිදු කරන බව තහවුරු කිරීමට වගබලා ගතයුතු ය.

3. බැහැර කිරීම් මේ උපලේඛනයේ අ ශීර්ෂය යටතේ වන 1 ඡේදයේ (1)(අ) වන අනුඡේදය යටතේ වන අවසරය මෙහි පහත සඳහන් යම් ව්‍යාපාරයක් කරගෙන යන හෝ කරගෙන යාමට යෝජනා කරන සමාගමක කොටස් සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

(අ) භාණ්ඩ උකසට ගැනීම;

(ආ) වෙරළබඩ ධීවර කටයුතු;

(ඇ) ප්‍රාග්ධනය ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු විසින් ලබා දී ඇ.එ.ජ.ඩොලර් මිලියන 5 කට අඩුවන අවස්ථාවක දී සිල්ලර වෙළෙඳාම;

4. සීමා කිරීම්;

(1) මේ උපලේඛනයේ අ ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (1)(අ) වන අනුඡේදය යටතේ වන අවසරය, මෙහි පහත සඳහන් යම් ව්‍යාපාරයක් කරගෙන යන හෝ කරගෙන යාමට යෝජනා කරන සමාගමක කොටස් සම්බන්ධයෙන්, එකී සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් 40% ක ප්‍රතිශතයක් දක්වා පමණක් හෝ යම් සමාගමක විදේශ ආයෝජන ඉහළ ප්‍රතිශතයක් සඳහා විශේෂ අනුමතයක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ප්‍රදානය කර ඇත්නම්, එකී ඉහළ ප්‍රතිශතය දක්වා පමණක් අදාළ විය යුතු ය.

(අ) ශ්‍රී ලංකාවේ අපනයන ජාත්‍යන්තර වශයෙන් තීරණය කරන ලද සලාක සීමා කිරීම්වලට යටත් වන අවස්ථාවක දී භාණ්ඩ නිෂ්පාදනය;

(ආ) තේ, රබර්, පොල්, කොකෝවා, වී, සීනි සහ කුළුබඩු වගාකිරීම සහ මූලික වශයෙන් සකස් කිරීම;

(ඇ) පතල් කැණීම සහ පුනර්ජනනීය ජාතික සම්පත් මූලික වශයෙන් සකස් කිරීම;

(ඈ) දේශීය දැව භාවිත කරනු ලබන දැව මූලික කර්මාන්ත;

(ඉ) (ධීවර විෂයය භාර අමාත්‍යාංශය විසින් අර්ථ දක්වනු ලබන පරිදි) ගැඹුරු මුහුදෙහි මසුන් ඇල්ලීම;

(ඊ) ජන සන්නිවේදනය;

(උ) අධ්‍යාපනය;

(ඌ) භාණ්ඩ ප්‍රවාහනය;

(එ) සංචාරක නියෝජ්‍යායතන;

(ඒ) නැව් ප්‍රවාහන නියෝජ්‍යායතන.

(2) යම් ව්‍යාපාරවල විදේශ ආයෝජන සඳහා අනුමතය ලබාදීම පිණිස පිහිටුවා ඇති යම් නීතිමය හෝ පරිපාලන අධිකාරියක් විසින් හෝ ශ්‍රී ලංකා රජය විසින් ප්‍රදානය කරනු ලබන පොදු හෝ විශේෂ අනුමතයක් ලබා දී ඇති, එම සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනයේ ප්‍රතිශතය දක්වා පමණක් මෙහි පහත නිශ්චිතව සඳහන් යම් ව්‍යාපාරයක් කරගෙන හෝ කරගෙන යාමට යෝජනා කරන සමාග මක කොටස් සම්බන්ධයෙන්, මෙම අවසරය අදාළ විය යුතු ය:

(අ) ගුවනින් ප්‍රවාහනය කිරීම

(ආ) (නාවික විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යාංශය විසින් තීරණය කරනු ලබන පරිදි) වෙරළබඩ නැව් ප්‍රවාහනය;

(ඇ) 1990 අංක 46 දරන කර්මාන්ත ප්‍රවර්ධන පනතේ දෙවන උපලේඛනයේ දක්වා ඇති කර්මාන්තමය ව්‍යවසායක්, නාමිකව -

(i) ආයුධ, පතරොම්, පුපුරන ද්‍රව්‍ය, යුද්ධ වාහන සහ යුධ උපකරණ, ගුවන් යානා සහ අනෙකුත් යුධමය දෘඩාංග නිෂ්පාදනය කරනු ලබන යම් කර්මාන්තයක්,

(ii) වස, මත්ද්‍රව්‍ය, මද්‍යසාර, අන්තරායකර ඖෂධ සහ විෂ ද්‍රව්‍ය, උපද්‍රව සහිත හෝ පිළිකාකාරක ද්‍රව්‍ය නිෂ්පාදනය,

(iii) ව්‍යවහාර මුදල්, කාසි හෝ ආරක්ෂිත ලේඛන, නිෂ්පාදනය කරනු ලබන යම් කර්මාන්තයක්,

(ඈ) යාන්ත්‍රික කරන ලද මහා පරිමාණ මැණික් කැණීම; සහ

(ඉ) ලොතරැයි.

5. අ ශීර්ෂය යටතේ වන විධිවිධාන අර්ථ නිරූපණය කිරීමේ දී, සැක දුරුකිරීම සඳහා අදාළ වන පොදු මූලධර්මය වන්නේ, ආයෝජකයන් විසින් ශ්‍රී ලංකාවට ලැබෙන විදේශ විනිමය ප්‍රේෂණ භාවිත කරමින් ආයෝජනය සිදු කරන ලද සියලු අවස්ථාවන්හි දී යම් ප්‍රාග්ධන ලාභ ඇතුළු මෙම ඡේදයන් යටතේ අවසර දෙන ලද ආයෝජන බැහැර කිරීමෙන් පැන නගින ආදායම සහ ප්‍රතිෂ්ඨා මුදල් ශ්‍රී ලංකාවෙන් බැහැරට සියරට යැවීම කළ හැකි ය යන්න වන බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ. ආයෝජකයකු විසින් මේ නියෝග යන් හි දක්වා ඇති කාර්ය පටිපාටිය අවශ්‍යතාවයන්ගෙන් අනුගමනය නොකර ඇති අවස්ථාවක දී, බලයලත් වෙළෙන්දකු වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හරහා සිදු කරන ලද ඉල්ලීමක් මත ඉල්ලීමෙහි සද්භාවය පිළිබඳව සෑහීමකට පත්වීමෙන් පසු මෙම මූලධර්මය සමග අනුකූලව ආයෝජකයකු විසින් සිදු කරනු ලබන බාහිර ප්‍රේෂණ සඳහා අනුමැතිය ලබා දීමට ශ්‍රී ලංකා මහ බැංකුව සතුව බලය තිබිය යුතු ය.

**(ආ) ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර ස්ථානයක් ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම.**

1. (1) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති විදේශීය සමාගමකට, ශ්‍රී ලංකාව තුළ -

(අ) මේ උපලේඛනයේ ආ ශීර්ෂය යටතේ 2 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ක්‍රියාකාරකම් හැර, යම් වාණිජ, වෙළෙඳ හෝ කර්මාන්ත කටයුත්තක් කරගෙන යා හැකි ය: එසේ වුව ද, මේ උපලේඛනයේ ආ ශීර්ෂය යටතේ 3 වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ක්‍රියාකාරකම් සඳහා ශ්‍රී ලංකා රජය හෝ විදේශ ආයෝජන සඳහා අනුමතිය ප්‍රදානය කිරීමට පිහිටුවා ඇති යම් නෛතික හෝ පරිපාලන අධිකාරියක පූර්ව අවසරය ලබා ගෙන තිබිය යුතු ය; හෝ

(ආ) සම්බන්ධීකරණ කාර්යාලයක්, නියෝජිත කාර්යාලයක්, ප්‍රාදේශීය කාර්යාලයක් හෝ වෙනත් ඒ හා සමාන කාර්යාලයක් විසින් කිරීමට භාරගෙන ඇති හෝ සිදු කරනු ලබන්නා වූ, එසේ වුව ද එම ක්‍රියාකාරකම් සිදු කිරීමෙන් සමාගමට සෘජුව හෝ වක්‍රව යම් ආදායමක් සපයනු නොලබන්නා වූ, යම් වාණිජ, වෙළෙඳ හෝ කර්මාන්ත කටයුතු, නොවන යම් කටයුත්තක් සිදු කරනු ලැබිය හැකි ය.

(2) ඉහත සඳහන් යම් ක්‍රියාකාරකමක් කරගෙන යාමට භාරගෙන ඇති 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති යම් විදේශීය සමාගමක -

(අ) ව්‍යාපාර ස්ථානය, ශාඛා කාර්යාලයක්, ව්‍යාපෘති කාර්යාලයක් හෝ වෙනත් ඒ හා සමාන කාර්යාලයක් වන අවස්ථාවක දී, ශ්‍රී ලංකාවේ බලයලත් ගනුදෙනුකරුවකු ලෙස බලපත්‍රලත් වාණිජ බැංකුවක විවෘත කර ඇති විදේශීය සමාගමේ ගිණුමකට ආමුඛ ආයෝජන ගිණුමක් හරහා විදේශයන්ගෙන් ලද ප්‍රේෂණවලින් අවම වශයෙන් එ.ජ.ඩො. 200,000 ක් හෝ ඊට සමාන නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලක් එකී විදේශීය සමාගමේ ගිණුමේ බැරට ආයෝජනය කළ යුතු අතර, එම ප්‍රේෂණයට අදාළ සාක්ෂි ලියාපදිංචියේ දින සිට දින තිහක් ඇතුළත් සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව වෙත සැපයිය යුතු ය.

(ආ) ව්‍යාපාර ස්ථානය සම්බන්ධීකරණ කාර්යාලයක්, නියෝජිත කාර්යාලයක් හෝ වෙනත් ඒ හා සමාන කාර්යාලයක් වන අවස්ථාවක දී එවැනි ව්‍යාපාරික ස්ථානයක් පිහිටුවීම සහ පවත්වාගෙන යාම සඳහා, අවශ්‍ය අරමුදල් ශ්‍රී ලංකාවේ බලයලත් ගනුදෙනුකරුවකු ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකුවක විවෘත කරන ලද ආමුඛ ආයෝජන ගිණුමක් හරහා විදේශීය සමාගමක ගිණුමක බැරට ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

(3) ඉහත (1) වන අනුඡේදයේ සඳහන් විදේශීය සමාගමකට, ආයෝජන සිදු කළ එහි මව් සමාගමේ ආමුඛ ආයෝජන ගිණුම හරහා, බදු ගෙවූ පසු ලැබෙන ඔවුන්ගේ ලාභය නිෂ්පාදන භාගය, අධිකාරය හෝ වෙනත් ඊට සමාන ගෙවීම් හෝ අතිරික්ත අරමුදල් ශ්‍රී ලංකාවෙන් පිටතට ප්‍රේෂණය කරනු ලැබිය හැකි ය. මේ නියෝගය බලාත්මක වන දිනට පෙරාතුව ලියාපදිංචි කරන ලද විදේශීය සමාගමක් විසින් පාදක ගනුදෙනුවේ සද්භාවය පිළිබඳව බලයලත් ගනුදෙනුකරු වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුව සෑහීමට පත්වීමෙන් පසු එකී ගෙවීම් මව් සමාගමේ ආමුඛ ආයෝජන ගිණුම හරහා ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

2. මේ උපලේඛනයේ ආ ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (1)(අ) වන අනුඡේදයේ කාර්යය සඳහා, පහත දැක්වෙන වාණිජ, වෙළෙඳ සහ කර්මාන්ත ක්‍රියාකාරකම් විදේශීය සමාගමක් විසින් ක්‍රියාත්මක කිරීමට අවසර ලබා දෙනු නොලැබේ:

(අ) (1988 අංක 30 දරන බැංකු පනත යටතේ ලියාපදිංචි වී ඇති විදේශ බැංකු ශාඛා හැර) මුදල් ණයට දීම;

(ආ) භාණ්ඩ උකස් ගැනීම;

(ඇ) ප්‍රාග්ධනය ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තන් විසින් ලබා දී ඇති සහ එකී ආයෝජනය සිදු කිරීමෙන් පසුව එ.ජ.ඩො. මිලියන 5 කට අඩුවන අවස්ථාවක දී, සිල්ලර වෙළෙඳාම;

(ඈ) වෙරළබඩ මාළු ඇල්ලීම;

(ඉ) තේ, රබර්, පොල් සහ වී වගා කිරීම සහ මූලික වශයෙන් සකස් කිරීම;

(ඊ) පතල් කැණීම සහ නැවත පුනර්ජනනීය ජාතික සම්පත් මූලික වශයෙන් සකස් කිරීම;

(උ) භාණ්ඩ ප්‍රවාහනය;

(ඌ) නැව් ප්‍රවාහන නියෝජිත ව්‍යාපාර;

(එ) යාන්ත්‍රික කරන ලද මැණික් කැණීම; සහ

(ඒ) ලොතරැයි.

3. මේ උපලේඛනයේ ආ ශීර්ෂය යටතේ 1 වන ඡේදයේ (1)(අ) වන අනුඡේදයේ කාර්යය සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් ශ්‍රී ලංකා රජයේ හෝ විදේශ ආයෝජන අනුමතිය ප්‍රදානය කිරීමට පිහිටුවන ලද යම් නීතිමය හෝ පරිපාලන අධිකාරියක් පූර්ව අනුමතිය සහිතව ක්‍රියාත්මක කිරීමට අවසර දෙනු ලැබේ :-

(අ) ශ්‍රී ලංකාවේ අපනයන ජාත්‍යන්තර වශයෙන් තීරණය කරන ලද සලාක සීමාකිරීම්වලට යටත්වන අවස්ථාවක දී, භාණ්ඩ නිෂ්පාදනය;

(ආ) සීනි, කොකෝවා සහ කුළුබඩු වගා කිරීම සහ මූලික වශයෙන් සකස් කිරීම;

(ඇ) දේශීය දැව භාවිත කරනු ලබන දැව මූලික කර්මාන්ත;

(ඈ) ගැඹුරු මුහුදෙහි මාළු ඇල්ලීම;

(ඉ) ජන සන්නිවේදනය;

(ඊ) අධ්‍යාපනය;

(උ) ලංකාවෙන් පිටත සංචාරක නියෝජිත ව්‍යාපාර;

(ඌ) දේශීය ගුවන් මගීන් ප්‍රවාහනය;

(එ) (i) ආයුධ, පතරොම්, පුපුරන ද්‍රව්‍ය, යුධ වාහන සහ ගුවන් යානා උපකරණ සහ යුධමය දෘඪාංග;

(ii) වස, මත්ද්‍රව්‍ය, මත්පැන්, අන්තරාදායක ඖෂධ සහ විෂ සහිත, උපද්‍රව සහිත හෝ පිළිකාකාරක ද්‍රව්‍ය; සහ

(iii) ව්‍යවහාර මුදල්, කාසි සහ ආරක්ෂිත ලේඛන, සකසනු ලබන හෝ නිෂ්පාදනය කරනු ලබන යම් කර්මාන්තයක්.

4. ආ ශීර්ෂය යටතේ වන විධිවිධාන අර්ථ නිරූපණය කිරීමේ දී, සැක දුරුකිරීම සඳහා අදාළ වන පොදු මූලධර්මය වන්නේ, ආයෝජකයන් විසින් ශ්‍රී ලංකාවට ලැබෙන විදේශ විනිමය ප්‍රේෂණ භාවිත කරමින් ආයෝජනය සිදු කරන ලද සියලු අවස්ථාවන්හි දී මෙම ඡේදයන් යටතේ අවසර දෙන ලද ආයෝජන බැහැර කිරීමෙන් පැන නගින ආදායම සහ ප්‍රතිෂ්ඨා මුදල් ශ්‍රී ලංකාවෙන් බැහැරට සියරට යැවීම කළ හැකි ය යන්න වන බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ. ආයෝජකයකු විසින් මේ නියෝගයන් හි දක්වා ඇති කාර්ය පටිපාටිය අවශ්‍යතාවයන්ගෙන් අනුගමනය නොකර ඇති අවස්ථාවක දී, බලයලත් වෙළෙන්දකු වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හරහා

සිදු කරන ලද ඉල්ලීමක් මත ඉල්ලීමෙහි සද්භාවය පිළිබඳව සෑහීමකට පත්වීමෙන් පසු මෙම මූලධර්මය සමග අනුකූලව ආයෝජකයකු විසින් සිදු කරනු ලබන බාහිර ප්‍රේෂණ සඳහා අනුමැතිය ලබා දීමට ශ්‍රී ලංකා මහ බැංකුව සතුව බලය තිබිය යුතු ය.

5. මෙම උපලේඛනයේ කාර්යය සඳහා :-

"මහ බැංකුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"ඇපයෙන් සීමිත සමාගම්" යන්නට 2007 අංක 7 දරන සමාගම් පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"බලපත්‍රලාභී වාණිජ බැංකුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"බලපත්‍රලාභී විශේෂිත බැංකුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"බලපත්‍රලාභී මූල්‍ය සමාගම" යන්නෙන් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ බලපත්‍රලත් සමාගමක් අදහස් වේ;

"බලපත්‍රලාභී මූල්‍ය ආයතනය" යන්නෙන් -

(අ) බලපත්‍රලාභී වාණිජ බැංකුවක්;

(ආ) බලපත්‍රලාභී විශේෂ බැංකුවක්;

(ඇ) 2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනත යටතේ බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගමක්;

(ඈ) විශේෂිත කල්බදු සමාගමක්; හෝ

(ඉ) බලපත්‍රලාභී මූල්‍ය ආයතනයක්;

අදහස් වේ.

"අමාත්‍යවරයා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"මුදල් මණ්ඩලය" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"විදේශ සමාගම" යන්නට 2007 අංක 7 දරන සමාගම් පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"විශේෂිත කල්බදු සමාගම" යන්නෙන් 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගමක් අදහස් වේ;

"ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර" යන්නෙන් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද එක්සත් ජනපද ඩොලර් මගින් හඳුන්වන ලද ණය සාධන පත්‍රයක් අදහස් වේ.

**(2(ඇ) නියෝගය)**

**III වන උපලේඛනය**

**ඉවත් කරන ලද විනිමය පාලන පනතේ විධිවිධාන ප්‍රකාරව දැනටමත් ප්‍රදානය කර ඇති (සාමාන්‍ය හෝ විශේෂ) අනුමැතියක් යටතේ සිදු කරන ලද ප්‍රාග්ධන ගනුදෙනු**

මෙම නියෝග මගින් හෝ යම් පසුව එන නියෝගයක් මගින් විශේෂිතව වෙනස් කර ඇත්නම් මිස, මෙම නියෝගයන් හි I වන, II වන සහ IV වන උපලේඛනයන් හි නිශ්චිතව දක්වා ඇති ප්‍රාග්ධන ගනුදෙනුවලට සමාන, ඉවත් කරන ලද විනිමය පාලන පනතේ විධිවිධාන යටතේ පවතින සියලු ගනුදෙනු එකී ගනුදෙනු සඳහා නිශ්චිතව දක්වන ලද නියමයන් සහ කොන්දේසිවලට යටත්ව තවදුරටත් පවත්වාගෙන යා හැකි ය.

**IV වන උපලේඛනය**

**(2 (2) සහ 4 වන නියෝග)**

**වෙනත් ප්‍රාග්ධන ගනුදෙනු**

මේ උපලේඛනයේ අ සිට ඌ දක්වා වන ශීර්ෂ යටතේ නිශ්චිතව දක්වා ඇති අනෙකුත් සෑම ප්‍රාග්ධන ගනුදෙනුවක් ම බලයලත් ගනුදෙනුකරුවකු වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හරහා හෝ මෙම කාර්ය සඳහා 2 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ බලය ලබා දී ඇති බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් සිදු කළ යුතු ය.

(අ) **ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තන් විසින් දරනු ලබන නිශ්චිත දේපළ (ඉඩම් සහ ගොඩනැගිලි) විකුණුම් ප්‍රතිෂ්ඨා මුදල් ශ්‍රී ලංකාවෙන් පිටතට ප්‍රේෂණය.**

1. ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුට ශ්‍රී ලංකා රුපියල් මගින් ගෙවා ඇති ප්‍රාග්ධන ලාභ ඇතුළු විකුණුම් ප්‍රතිෂ්ඨා මුදල් ඇත්නම්, එකී ගෙවීම් පහත සඳහන් කාර්යය සඳහා සහ ශ්‍රී ලංකාවේ නිශ්චල දේපළ අත්කර ගැනීමට, හිමිකමකට සහ භුක්තියට අදාළ නීතින්ට යටත්ව ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික වන ශ්‍රී ලංකාවේ නිශ්චල දේපළ හිමිකරුවකු හෝ උරුමකරුවකු විසින් එකී දේපළ විකිණීම සම්බන්ධයෙන් ගෙවිය යුතු ප්‍රතිෂ්ඨාවක් වන අවස්ථාවක දී, එම විකුණුම් ප්‍රතිෂ්ඨා මුදල් ශ්‍රී ලංකාවෙන් පිටතට යැවීමට බලයලත් ගනුදෙනුකරුවකු වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවකට හෝ 2 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ බලය පවරන ලද බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට අවසර ලබා දෙනු ලැබේ.

    (අ) නිශ්චල දේපළෙහි මුල් අත්කරගැනීම ආමුඛ ආයෝජන ගිණුමක පැවති අරමුදල් භාවිත කරමින් සිදු කර ඇත්නම්, හිමිකරුගේ හෝ උරුමකරුගේ ආමුඛ ආයෝජන ගිණුමට බැර කිරීම.

    (ආ) එකී දේපළෙහි අත්කර ගැනීම සහ සංවර්ධනය සඳහා වන (හිමිකරු විසින් නිශ්චල දේපළ අත්කර ගැනීම සඳහා පහසුකම් සලසන ලද ශ්‍රී ලංකාවේ තුන්වන පාර්ශ්වයකගේ ගිණුමකට හිමිකරු විසින් යවන ලද අරමුදල් ඇතුළුව) ආමුඛ ප්‍රේෂණයන් ඔප්පු කිරීම නිශ්චිතව දැන ගැනීම මත හිමිකරු හෝ උරුමකරු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත පවත්වාගෙන යනු ලබන ගිණුමකට බැර කිරීම.

**(ආ) සංක්‍රමණික මාරු කිරීම**

1. (1) ශ්‍රී ලංකාවේ නේවාසිකව සිටි ශ්‍රී ලාංකිකයකුට සහ වෙනත් රටක ස්ථිර නේවාසිකත්වය හෝ ද්විත්ව පුරවැසිභාවය ද ඇතුළුව පුරවැසිභාවය ලබාගත් (මෙහි මින්මතු සංක්‍රමණිකයකු වශයෙන් හඳුන්වනු ලබන) තැනැත්තකු, එම සංක්‍රමණිකයා සතුව පැවති චංචල සහ නිශ්චල දේපළ, ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය වත්කම් විකිණීමෙන් ලද ප්‍රතිෂ්ඨා මුදල් සහ ඔහුගේ කලත්‍රයාගෙන් හෝ දෙමව්පියන්ගෙන් ලද ත්‍යාග ඇතුළත් වන සංක්‍රමණික දීමනාවට සුදුසුකම් ලබයි. ප්‍රතිලාභීන් වශයෙන් උරුමයන් ලද වතු ඇතුළුව ශ්‍රී ලංකාවේ අයිතිව තිබෙන වටිනා ගල් වර්ග, වටිනා ලෝහ, පෞද්ගලික ස්වර්ණාභරණ සහ වෙනත් දේපළ වත්කම්වලට ඇතුළත් විය හැකි ය.

(2) පහත දැක්වෙන සීමාවන් ඉහත ආ ශීර්ෂයේ (1) වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ගනුදෙනු සඳහා අදාළ විය යුතු ය:-

(අ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානයන්ට යටත්ව අවුරුදු 18 සහ ඊට වැඩි තැනැත්තකු සඳහා වන ආරම්භක සංක්‍රමණික දීමනාව වන එ.ජ.ඩො. 200,000 ක්.

(ආ) වාර්ෂික සංක්‍රමණික දීමනාව වන එ.ජ.ඩො. 30,000 කි. ආරම්භක සංක්‍රමණික දීමනාව වන එ.ජ.ඩො. 200,000 සම්පූර්ණයෙන් ම භාවිතයෙන් මාස 12 කට පසු පළමු වාර්ෂික දීමනාව ගෙවිය හැකි ය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන විධානවලට යටත්ව, පළමු දීමනාව හැර පසුව ගෙවනු ලබන දීමනා වර්ෂයක් පාසා සහ එකතු කොට ගෙවිය හැකි ය.

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානයන්ට යටත්ව විදේශිකයන්ට උරුම ශ්‍රී ලංකාවේ ඇති දේපළ විකිණීමෙන් ලද ප්‍රතිෂ්ඨා මුදල් සම්බන්ධයෙන් වාර්ෂිකව එ. ජ. ඩො. 30,000 ක වාර්ෂික දීමනාවක්.

(3) සංක්‍රමණික දීමනාව බලපත්‍රලාභී බැංකුවක් හෝ 2 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ බලය දී ඇති බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් හෝ බලපත්‍රලාභී ගනුදෙනුකරුවකු වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සමග ආරම්භ කරන ලද ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම (CTRA) හරහා බැර කරනු ලැබිය යුතු ය.

(4) බලයලත් වෙළෙන්දෙකු වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් හෝ 2 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ බලය ලබා දී ඇති පරිදි බලපත්‍රලාභී නියෝජිත බැංකුවක් විසින් අනුමත කර ඇති පරිදි සුදුසුකම්ලත් විගමන දීමනාව ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමෙන් අයදුම්කරුගේ පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමට සහ/හෝ ශ්‍රී ලංකාවේ වන ආමුඛ ආයෝජන ගිණුමට හෝ ශ්‍රී ලංකාවෙන් පිටත පවත්වාගෙන යනු ලබන විගාමිකයාගේ ගිණුමකට මාරුකරනු ලැබිය හැකි ය.

(5) වර්තමාන ආදායම (පොලිය, ලාභාංශ, විශ්‍රාම වැටුප්, බදු, විශ්‍රාමිකයාගේ කුලී බදු සහ ලාභ සමග) සහ විශ්‍රාම පාරිතෝෂික දීමනා ප්‍රතිලාභ (සේවා නියුක්තිකයන්ගේ අර්ථ සාධක අරමුදල (EPF), සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල (ETF), පාරිතෝෂිකය සහ වෙනත් යම් අනුමත විශ්‍රාම වැටුප් හෝ විශ්‍රාම අරමුදලක්) ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමට බැර කරනු ලැබිය යුතු අතර, විගමන දීමනාවට අමතරව පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට සහ/හෝ ශ්‍රී ලංකාවේ ආමුඛ ආයෝජන ගිණුමට හෝ ශ්‍රී ලංකාවෙන් පිටත පවත්වාගෙන යනු ලබන විගාමිකයාගේ ගිණුමට මාරුකරනු ලැබිය යුතු ය.

2. විගාමිකයන් සහ/හෝ ශ්‍රී ලාංකීය සම්භවයක් ඇති විදේශිකයන් විසින් විදේශ ව්‍යවහාර මුදලකින් ලද උරුමව වූ වත්කම්වලින් ලත් මුදල්/ආදායම වේ නම්, එකී තැනැත්තන්ට එකී මුදල් බැර කිරීමේ කාර්යය සඳහා යම් නම් කළ විදේශ ව්‍යවහාර මුදලකින් ගිණුම් විදේශ විනිමය ආරම්භ කර පවත්වාගෙන යාමට ශ්‍රී ලංකා මහ බැංකුවේ පූර්ව අනුමතය ලබා ගත යුතු ය.

**(ඇ) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයන්ට ශ්‍රී ලංකාව තුළ දී ණය සහ අත්තිකාරම් ප්‍රදානය කිරීම**

බලයලත් වෙළෙන්දකු වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් හෝ 2 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ බලය ලබා දී ඇති පරිදි බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් පහත දැක්වෙන කාණ්ඩවල තැනැත්තන්ට විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් යම් කාර්ය සඳහා ණය සහ අත්තිකාරම් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

1. **ශ්‍රී ලංකාවෙන් පිටත වෙනත් රටක නිත්‍ය වාසික වීසා (PR) යටතේ වාසය කරන සහ ද්විත්ව පුරවැසිභාවය ලබා සිටින ශ්‍රී ලාංකිකයන්,**

(1) ශ්‍රී ලංකාව තුළ නේවාසික දේපළක් අත්පත් කර ගැනීම/ඉදිකිරීම/සංවර්ධනය කිරීම සහ අලුත්වැඩියාව යන කාර්යය සඳහා විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ණය ප්‍රදානය කරනු ලැබිය යුතු ය.

(2) ණය ආපසු ගෙවීම සඳහා විදේශ ව්‍යවහාර මුදල් ඉපැයීම් ණයගැතියා සතුව පවතින්නේ නම් පමණක් විදේශ ව්‍යවහාර මුදල් ණය ප්‍රදානය කළ යුතු ය.

(3) විදේශ ව්‍යවහාර මුදල් පිළිගැනීමට අවසර ලබා දී ඇති නේවාසික දේපළ සංවර්ධනය කරනු ලබන ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් විසින් පවත්වාගෙන යනු ලබන විදේශ විනිමය ගිණුම්වලට ප්‍රතිෂ්ඨා ණය මුදල් මාරු කරන ලෙස ණයගැතියා ඉල්ලා සිටින්නේ නම් මිස ප්‍රතිෂ්ඨා ණය මුදල් ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) විදේශ ව්‍යවහාර මුදලින් ප්‍රදානය කරන ලද ණය, විදේශ ව්‍යවහාර මුදල් ආමුඛ ප්‍රේෂණ මගින් හෝ ණයගැතියාගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල පවතින අරමුදල් සහ ආමුඛ ආයෝජන ගිණුම් භාවිත කරමින් ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(5) ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රදානය කරන ලද ණය, විදේශ ව්‍යවහාර මුදල් ආමුඛ ප්‍රේෂණ මගින් හෝ ණයගැතියාගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල, සහ ආමුඛ ආයෝජන ගිණුම්වල පවතින අරමුදල් භාවිත කරමින් සහ ණයගැතියාගේ ශ්‍රී ලංකා රුපියල් ඉපැයීම් උපයෝගී කරගනිමින් ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(6) 2008 අංක 3 දරන බැංකු පනතේ විධාන (සංශෝධිත පරිදි) ප්‍රකාරව, ශ්‍රී ලංකා රුපියල්වලින් විදේශ ව්‍යවහාර ණය මුදල් අයකර ගැනීම් (ගෙවීම් පැහැර හැරීමේ දී) පියවාගත හැක්කේ අදාළ ණය, අඩුතරමින් අපේක්ෂිත මට්ටමට නැති ප්‍රවර්ගය යටතේ අක්‍රමික ණය ලෙස වර්ගීකරණය කරන ලද අවස්ථාවේ දී පමණක් පහත පරිදි වේ :-

(අ) පළමුව, ණය ගැතියාගේ විදේශ ව්‍යවහාර මුදල් වත්කම් මගින්;

(ආ) දෙවනුව, උකස් වත්කම් හෝ වෙනත් දේශීය වත්කම් විකිණීමෙන් ලද ප්‍රතිෂ්ඨා මුදල් මගින්;

(ඇ) අවසාන පිළියමක් වශයෙන්, ශේෂව පවතින යම් ණය ශේෂයක් පියවීමට අවශ්‍ය වන මුදල් ප්‍රමාණයට පමණක් ශ්‍රී ලංකා රුපියල් ප්‍රතිෂ්ඨා මුදල් පරිවර්තනය කළ යුතු ය.

**2. විදේශයක රැකියාවේ නියුතු ශ්‍රී ලාංකිකයින් (විගාමිකයින් හැර)**

(1) ණයගැතියාට ණය මුදල විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීමට හැකියාවක් පවතින්නේ නම්, බලයලත් වෙළෙන්දෙකු වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවකින් හෝ 2 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ බලය ලබා දී ඇති පරිදි බලපත්‍රලාභී විශේෂිත බැංකුවකින් ඕනෑම කාර්යයක් සඳහා ශ්‍රී ලංකාව තුළ භාවිත කිරීමට විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ණය සහ අත්තිකාරම් ලබාගත යුතු ය.

(2) එකී ණය ප්‍රදානය කිරීමට පෙර බලයලත් වෙළෙන්දකු වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් හෝ 2 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ බලය ලබා දී ඇති පරිදි බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් හෝ එම ණය මුදල පිළිබඳ අවදානම තක්සේරු කළ යුතු ය.

(3) සින්නක්කර දේපළ (ඉඩම් හා ගොඩනැගිලි) මත උකස්කරයක් ලෙස හෝ විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු/වත්කම් මත ලියමක් ලෙස ණය අවදානම අඩු කර ගැනීම සඳහා ප්‍රමාණවත් සුරැකුමක් ලබාගැනීමෙන් අනතුරුව, විදේශ ව්‍යවහාර මුදලින්/ ශ්‍රී ලංකා රුපියල්වලින් ණය සහ අත්තිකාරම් ප්‍රදානය කළ යුතු ය.

(4) ණයගැතියාගේ අපේක්ෂිත විදේශගත සේවා නියුක්ති කාල සීමාව මත ණය මුදලේ කාලසීමාව තීරණය කළ යුතු අතර, බැංකු විසින් සාමාන්‍යයෙන් අනුගමනය කරනු ලබන ක්‍රියාපටිපාටියට අනුකූලව එකී ණය ගෙවනු ලැබිය යුතු ය.

(5) විදේශ ව්‍යවහාර මුදල් පිළිගැනීමට අවසර ලබා දී ඇති නේවාසික දේපළ සංවර්ධනය කරනු ලබන ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් විසින් පවත්වාගෙන යනු ලබන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට ප්‍රතිෂ්ඨා ණය මුදල් මාරුකරන ලෙස ණයගැතියා ඉල්ලා සිටින්නේ නම් මිස රුපියල්වලින් ණයගැතියාට ප්‍රතිෂ්ඨා ණය මුදල ගෙවනු ලැබිය යුතු ය.

(6) විදේශ ව්‍යවහාර මුදල්වලින් ප්‍රදානය කරන ලද ණය, ආමුඛ ප්‍රේෂණ මගින් හෝ ණයගැතියාගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල ඇති ශේෂය හරහා විදේශ ව්‍යවහාර මුදලින් ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(7) ණයගැතියා රටින් පිටත සේවා නියුක්තව සිටින තාක් කල් ණයගැතියාගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල පවතින අරමුදල් පමණක් ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රදානය කරන ලද ණය මුදල් ගෙවීම සඳහා යොදා ගනු ලැබිය යුතු ය. එතෙර සේවා ගිවිසුම් අවසන් වූ පසු ණයගැතියා නැවත ශ්‍රී ලංකාවේ නේවාසිකයකු වන්නේ නම් පමණක් මේ ණයගැතියා සතු ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවීම කරනු ලැබිය හැකි ය.

(8) 2008 අංක 3 දරන බැංකු පනතේ විධාන (සංශෝධිත පරිදි) ප්‍රකාරව, ශ්‍රී ලංකා රුපියල්වලින් විදේශ ව්‍යවහාර මුදල් ණය අයකරගැනීම් (පැහැර හැරීම මත) පියවාගත හැක්කේ අදාළ ණය අඩු තරමින් අපේක්ෂිත මට්ටමට නැති ප්‍රවර්ගය යටතේ අක්‍රමික ණය ලෙස වර්ගීකරණය කරන ලද අවස්ථාවේ දී පමණක් පහත පරිදි වේ :-

(අ) පළමුව, ණයගැතියාගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමවල විදේශ ව්‍යවහාර මුදල් වත්කම්/තැන්පතු/ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල ශේෂය, ණය මුදලක් ගෙවීම සඳහා ඉල්ලුම් කිරීමෙන් පසු;

(ආ) දෙවනුව, ණයගැතියා විසින් උකසට තබන ලද වත්කම් හෝ වෙනත් දේශීය වත්කම් විකිණීමෙන් ලද ප්‍රතිෂ්ඨා මුදල් මගින්; සහ

(ඇ) අවසාන පිළියම වශයෙන්, ශේෂව පවතින යම් ණය ශේෂයක් පියවීමට අවශ්‍යවන මුදල් ප්‍රමාණයට පමණක් ශ්‍රී ලංකා රුපියල් ප්‍රතිෂ්ඨා මුදල් පරිවර්තනය කළ යුතු ය.

**ඈ. විදේශීය රටක අධ්‍යාපනයේ නියුතු ශ්‍රී ලාංකික සිසුන් විසින් ණය ලබා ගැනීම්**

1. අධ්‍යාපනික කාර්යය සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත සිටින යම් ශ්‍රී ලාංකික පුරවැසියකු විසින්, තම අධ්‍යාපන කාලය තුළ අධ්‍යාපනයට/ ජීවන වියදම් සපුරාගැනීමට විදේශ රටවල පවතින බැංකුවලින්, මූල්‍ය ආයතනවලින්, විශ්වවිද්‍යාලවලින් හෝ අධ්‍යාපන ආයතනවලින් ණය ලබාගැනීමට සහ එම ණය මුදල් පියවීම සඳහා බලයලත් වෙළෙන්දෙකු වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හරහා හෝ 2 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ බලය ලබා දී ඇති පරිදි බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් හරහා ශ්‍රී ලංකාවෙන් පිටතට අරමුදල් ප්‍රේෂණය කිරීමට අවසර දෙනු ලැබේ.

2. ශ්‍රී ලංකාවෙන් පිටත අධ්‍යාපන කටයුතුවල නිරත වන ශ්‍රී ලාංකික පුරවැසියන් ලබාගත් ණය පියවීමට ලංකාවේ සිටින ඔවුන්ගේ දෙමාපියන් හෝ භාරකරුවන් විසින් ණය ලබා දෙන ලද අදාළ ආයතනවලට ප්‍රතිමුඛ ප්‍රේෂණ සිදුකිරීම, බලයලත් වෙළෙන්දකු වශයෙන් යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් හෝ 2 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ බලය ලබා දී ඇති පරිදි බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් අදාළ ගනුදෙනු පිළිබඳව සද්භාවය පරීක්ෂා කිරීමෙන් අනතුරුව සිදු කරනු ලැබිය හැකි ය.

**ඉ. මූල්‍ය ව්‍යුත්පන්න ගනුදෙනුවලට අදාළ ගෙවීම්.**

බලයලත් වෙළෙන්දකු ලෙස යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ අවසරලත් යම් ජංගම ගනුදෙනුවලට සහ ප්‍රාග්ධන ගනුදෙනුවලට (පාදක ගනුදෙනුවලට) අදාළ මූල්‍යමය ව්‍යුත්පන්න නිෂ්පාදන සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ විධානයේ ප්‍රකාරව එම පාදක ගනුදෙනුවල සද්භාවය පිළිබඳ සෑහීමට පත්වීමෙන් පසු, විදේශ විනිමය මගින් ගෙවීම් සිදු කළ හැකි ය.

**ඊ. භාණ්ඩ අපනයනකරුවන් විසින් භාණ්ඩ අපනයන මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත නැවත සියරට රැගෙන ඒම.**

1. සෑම භාණ්ඩ අපනයනකරුවකුම විසින් භාණ්ඩ අපනයන කිරීම මගින් ලද මුදල් එම අපනයනය කිරීම සිදු කළ දිනයේ සිට දින 120 ක් තුළ ශ්‍රී ලංකාවට නැවත රැගෙන එනු ලැබිය යුතු ය.

2. ඉහත නියමය උල්ලංඝනය කිරීමට විරුද්ධව යම් නඩු කටයුත්තක් ආරම්භ කිරීමට පෙරාතුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දින 120 අවසන් වීමෙන් පසු ව දින 30 ක සහන කාලසීමාවක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

3. සෑම භාණ්ඩ අපනයනකරුවකුම විසින්ම එක් එක් අපනයනය සම්බන්ධයෙන් අදාළ ලේඛන සාක්ෂි ගෙවීම ලබාගන්නා බලයලත් වෙළෙන්දකු වශයෙන් අදාළ බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත හෝ 2 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ බලය ලබා දී ඇති පරිදි බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් වෙත ඉදිරිපත් කළ යුතු ය.

**ඨ. ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු විසින් නේවාසික නොවන තැනැත්තකු වෙනුවෙන් මුදල් ඇපකර නිකුත් කිරීම.**

1. බැංකු ඇපකර, බැඳුම්කර හෝ පොරොන්දු ණයවර ලිපි.

(1) බලයලත් වෙළෙන්දන් වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවලට හෝ 2 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ බලය ලබා දී ඇති පරිදි බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ විධානයන්ට යටත්ව, ප්‍රාග්ධන ගනුදෙනුවලට අදාළව අවස්ථාවෝචිත පරිදි, පහත දැක්වෙන බැංකු ඇපකර, බැඳුම්කර හෝ පොරොන්දු ණයවර ලිපි නිකුත් කිරීමට සහ අලුත් කිරීමට අවසර ඇත්තේ ය :-

(අ) සාමාජිකත්වය සම්බන්ධයෙන් සාමාජිකයන්ගේ බැඳීම් සම්බන්ධ ගෙවීම් සහ බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ බලපත්‍රලාභී විශේෂ බැංකුවල කාඩ්පත් මධ්‍යස්ථාන වෙනුවෙන් වීසා බලපත්‍ර වියදම් ආපසු ගෙවීම තහවුරු කිරීම සඳහා සමපාර්ශවීය ලෙස වන ඇපකර;

(ආ) ලංසුවෙහි/මිල කැඳවුමෙහි හෝ ගිවිසුමෙහි එකඟ වූ කොන්දේසිවලට යටත්ව, ශ්‍රී ලංකාවේ යම් නේවාසික තැනැත්තකු විසින් සිදුකරන ලද විදේශ කොන්ත්‍රාත්වලට අදාළව, ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසික තැනැත්තකුගේ නමට එම ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තා වෙනුවෙන් නිකුත් කිරීමට අවශ්‍ය ලංසු බැඳුම්කර, කාර්යසාධන බැඳුම්කර, අත්තිකාරම් ගෙවීම්, ඇපකර එකී කාර්යය සඳහා අවශ්‍ය වෙනත් යම් ඇපකර එක් කොන්ත්‍රාත්තුවක් සඳහා එ.ජ.ඩො. මිලියන 1ක් දක්වා වන උපරිම සීමාවක් දක්වා නිකුත් කළ යුතු ය.

(ඇ) ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසිකයකු වන්නා වූ ප්‍රධාන බන්ධනදාරියා, බලයලත් වෙළෙන්දකු වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් හෝ 2 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ බලය ලබා දී ඇති පරිදි බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් පිළිගත හැකි තත්ත්වයෙන් යුත් ශ්‍රී ලංකාවෙන් බැහැර පිළිගත් ජාත්‍යන්තර බැංකුවක් විසින් නිකුත් කළ ප්‍රතිඇපකරයක් ඊට අනන්‍ය කොන්දේසි මත පිළිගැනීමට යටත්ව, ශ්‍රී ලංකාව තුළ ඇති ගිවිසුමකට අදාළව ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකුගේ නමට ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසිකයකු වන්නා වූ ප්‍රධාන බන්ධනදාරියකු වෙනුවෙන් වන ඇපකරයක්;

(ඈ) ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසික ප්‍රධාන බන්ධනදාරියාගෙන් බලයලත් වෙළෙන්දකු ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් හෝ 2 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ බලය ලබා දී ඇති පරිදි බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් පිළිගත හැකි තත්ත්වයෙන් යුත් ශ්‍රී ලංකාවෙන් බැහැර පිළිගත් ජාත්‍යන්තර බැංකුවක් විසින් නිකුත් කළ ප්‍රතිඇපකරයක් ඊට අනන්‍ය කොන්දේසි මත ලබා ගැනීමට යටත්ව ගිවිසුමකට බන්ධනදාරියා ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසික තැනැත්තකු වන්නා වූ සිය ශ්‍රී ලංකාවේ නියෝජිතයා විසින්, ශ්‍රී ලංකාව තුළ ඇති වූ ගිවිසුමකට අදාළව ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකුගේ නමට එම ශ්‍රී ලංකා නියෝජිතයාගේ ඉල්ලීම මත ඇපකරයක් ලබා දිය යුතු විට දී වන ඇපකරයක්;

(ඉ) ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක් (ආයෝජකයා) විසින් එකී ආයෝජකයා කොටස් හිමියකු වන්නා වූ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගමකට (ආයෝජිතයා), එම ආයෝජිතයා සංස්ථාගත කරනු ලැබූ රටේ මූල්‍ය ආයතනවලින් පහසුකම් ලබා ගැනීමට හැකියාව ලබා දීම සඳහා බැංකු ඇපකරයක් ලබා දීමට අවශ්‍ය වන විට දී, ඉවත් කළ විනිමය පාලන පනතේ විධිවිධානවලට හෝ මේ පනතේ විධිවිධානවලට අනුකූලව එකී ආයෝජිතයා විසින් එකී ආයෝජනය සිදු කර ඇත්තේ නම්, එ.ජ.ඩො. 1,000,000ක උපරිම සීමාවකට යටත් වන ඇපකරයක්; එම ඇපකරයේ අංක යම් නිශ්චිත අවස්ථාවක දී ආයෝජිතයා තුළ ඇති ආයෝජකයාගේ කොටස් හිමිකාරිත්වයේ ප්‍රතිශතයට සමානුපාතික විය යුතු ය,

(ඊ) ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක් (ආයෝජකයා) විසින් එකී ආයෝජකයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවන ලද ශාඛාවකට එම ශාඛාව පිහිටුවා ඇති රටේ මූල්‍ය ආයතනවලින් පහසුකම් ලබා ගැනීමට හැකියාව ලබා දීම සඳහා බැංකු ඇපකරයක් ලබා දීමට අවශ්‍ය වන විට දී, ඉවත් කළ විනිමය පාලන පනතේ විධිවිධානවලට හෝ මේ පනතේ විධිවිධානවලට අනුකූලව එකී ශාඛාවේ එකී ආයෝජනය සිදු කර ඇත්තේ නම්, එම ආයෝජකයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවන ලද එක් ශාඛාවක් සඳහා එ.ජ.ඩො. 500,000 දක්වා වන ඇපකරයක් ලබා දිය හැකි ය.

(උ) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු විසින් කොන්ත්‍රාත්කරුවකු ලෙස ශ්‍රී ලංකාව තුළ ව්‍යාපෘතියක් සිදු කිරීමට භාර ගැනීමේ දී සහ ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු විසින් උපකොන්ත්‍රාත්කරුවකුගේ තත්ත්වයෙන් එකී කොන්ත්‍රාත්කරුගේ නමට ඇපයක් ලබා දීමට අවශ්‍ය වන විට දී, ලංසුවෙහි/මිළ කැඳවුමෙහි හෝ ගිවිසුමෙහි එකඟ වූ කොන්දේසිවලට යටත්ව, ලංසු බැඳුම්කර, කාර්යසාධන බැඳුම්කර, අත්තිකාරම් ගෙවීම් නිකුත් කරනු ලැබිය හැකි ය. එකී කාර්යය සඳහා අවශ්‍ය වන යම් ඇපකර එක් කොන්ත්‍රාත්තුවක් සඳහා එ.ජ.ඩො. 1,000,000ක උපරිම සීමාවක් දක්වා ලබා දිය යුතු ය.

(ඌ) ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක් දෙපාර්ශ්වය අතර ඇතිකර ගත් ගිවිසුමකට (නියෝජිත ගිවිසුම) යටත්ව සමාගමක් ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගමක (ප්‍රධානියා) නියෝජිතයා ලෙස කටයුතු කරනු ලබන විට දී එකී නියෝජිත ගිවිසුමේ නියම කර ඇති පරිදි එම නියෝජිතයා වෙනුවෙන් ප්‍රධානියාගේ නමට එ.ජ.ඩො. 2,000,000ක උපරිම සීමාවක් දක්වා වූ ඇපකරයක් ලබා දිය යුතු ය.

**2. සංස්ථාපිත ඇපකර**

(1) ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක් (ආයෝජකයකු) විසින් එකී ආයෝජකයා කොටස් හිමියකු වන්නා වූ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගමකට (ආයෝජිතයා) එම ආයෝජිතයා සංස්ථාපිත රටේ මූල්‍ය ආයතනවලින් පහසුකම් ලබා ගැනීමට හැකියාව ලබා දීම සඳහා සංස්ථාපිත ඇපකරයක් ලබා දීමට අවශ්‍ය වන විට දී, ඉවත් කළ විනිමය පාලන පනතේ විධිවිධානවලට හෝ මේ පනතේ විධිවිධානවලට අනුකූලව එකී ආයෝජිතයා තුළ එකී ආයෝජනය සිදු කර ඇත්තේ නම් සහ සංස්ථාපිත ඇපකරයේ වගකීම පියවීම සඳහා එම සමාගම් මූල්‍ය ශක්‍යතාව ප්‍රමාණවත් වන්නේ නම් එ.ජ.ඩො.1,000,000ක උපරිම සීමාවකට යටත් වන සංස්ථාපිත ඇපකරයක් ලබාදීමට ශ්‍රී ලංකාවේ සංස්ථාපිත යම් සමාගමකට අවසර ඇත්තේ ය. එම සංස්ථාපිත ඇපකරයේ පැන

නගින යම් අහඹු වගකීමක් පියවීම සඳහා එම සමාගමට මූල්‍ය ශක්තිය ඇති බවට එම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කළ යුතු ය. ඇපකරයේ අගය යම් නිශ්චිත අවස්ථාවක දී එකී ආයෝජිතයා තුළ ආයෝජකයාගේ ඇති කොටස් හිමිකාරිත්වයේ ප්‍රතිශතයට සමානුපාතික විය යුතු ය.

(2) ඉහත 1 වන අනුඡේදයේ සඳහන් සමාගම් විසින් එකී ඇපකරය බලාත්මකවන දිනයේ සිට දින 14 ක් ඇතුළත ඉහත අවසරය යටතේ නිකුත් කරන ලද ඇපකරය පිළිබඳව තොරතුරු (සංස්ථාපිත ඇපකරයේ සහ අදාළ මණ්ඩලයේ යෝජනාවල පිටපත් ද ඇතුළුව) මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතු ය.

3. ඉහත 1 වන සහ 2 වන ඡේදවල කාර්ය සඳහා -

(අ) බලයලත් වෙළෙන්දකු වශයෙන් යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවකට හෝ 2 වන නියෝගයේ (2) වන ඡේදය යටතේ බලය ලබා දී ඇති පරිදි බලපත්‍රලාභී විශේෂිත බැංකුවකට, ඉහත සඳහන් ඇපකරවලට අදාළ වලංගු හිමිකම් වලින් පැන නගින ප්‍රතිමුඛ ප්‍රේෂණ සිදු කිරීම සඳහා ද අවසර ඇති අතර එම හිමිකමේ උපරිම සීමාව පාදක පහසුකමේ ඉතිරිව පවතින බැඳීමට සමානුපාතික හෝ ඊට වඩා අඩු විය යුතු ය.

(ආ) ඉහත සීමාවක් ඉක්මවන්නා වූ ඉහත ප්‍රවර්ගයක් යටතට අයත් නොවන්නා වූ යම් ඇපකරයක් සඳහා මේ පනතේ 7 වන වගන්තිය යටතේ මුදල් මණ්ඩලයේ විශේෂ අනුමතය අවශ්‍ය විය යුතු ය. මේ සම්බන්ධයෙන් වන ඉල්ලුම්පත්‍රයක් මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතු ය.

**උෟ. 3 වන නියෝගය යටතේ ශ්‍රී ලංකාවෙන් බැහැර බැංකුවක ගිණුමක් ආරම්භ කිරීමට, පවත්වාගෙන යාමට සහ ක්‍රියාත්මක කිරීමට අවසර ලත් තැනැත්තන්.**

ශ්‍රී ලංකාවෙන් බැහැර බැංකුවක විදේශ විනිමය ගිණුමක් ආරම්භ කිරීමට, පවත්වාගෙන යාමට සහ ක්‍රියාත්මක කිරීමට පහත දැක්වෙන තැනැත්තන්ට අවසර ඇත්තේ ය. :-

(අ) ව්‍යාපාර සඳහා, අධ්‍යාපනය සඳහා හෝ වෛද්‍යමය කාර්ය සඳහා තාවකාලිකව ශ්‍රී ලංකාවෙන් බැහැරව නික්ම ගොස් ඇති ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු;

(ආ) ශ්‍රී ලංකාවෙන් බැහැර වෘත්තීමය හෝ වෘත්තීය සේවා සපයනු ලබන පුද්ගලයකු හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ සමාගමක් හෝ ව්‍යාපාර ආයතනයක්;

(ඇ) ශ්‍රී ලංකාවෙන් බැහැර ආයෝජනය කිරීම සඳහා අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි විධානවලට අනුකූලව මුදල් මණ්ඩලය විසින් අවසර දෙන ලද යම් පුද්ගලයකු හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ සමාගමක් හෝ ව්‍යාපාර ආයතනයක්;

(ඈ) වෙළඳ භාණ්ඩ අපනයනකරුවන්;

(ඉ) වෙනත් රටකින් වලංගු ස්ථිර පදිංචිය සඳහා වන අවසරපත්‍රයක් ලබාගෙන ඇති තැනැත්තකු;

(ඊ) ද්විත්ව පුරවැසියකු; සහ

(උ) වීසා බලපත්‍රයක් ප්‍රදානය කිරීම සඳහා වන කොන්දේසියක් ලෙස එකී රටේ බැංකුවක ගිණුමක් ආරම්භ කිරීමට සහ පත්වාගෙන යාමට වීසා බලපත්‍ර ප්‍රදානය කරනු ලබන අධිකාරිය විසින් එම තැනැත්තාට නියම කරන්නා වූ යම් රටක අධ්‍යාපනය ලැබීම සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව නික්ම යාමට අදහස් කරන්නා වූ ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු.

**එ. මේ උපලේඛනයේ කාර්යය සඳහා -**

"මහ බැංකුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ එයට දී ඇති අර්ථයම තිබිය යුතු ය.

"සේවක අර්ථ සාධක අරමුදල" යන්නෙන් 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනත යටතේ පිහිටුවන ලද සේවක අර්ථ සාධක අරමුදල අදහස් වේ.

"සේවා නියුක්තයන්ගේ භාර අරමුදල" යන්නෙන් 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල පනත යටතේ පිහිටුවනු ලැබූ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල අදහස් වේ.

"අමාත්‍යවරයා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ එයට දී ඇති අර්ථයම තිබිය යුතු ය.

"මුදල් මණ්ඩලය" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ එයට දී ඇති අර්ථයම තිබිය යුතු ය.

එල්.ඩී.බී. 10/2017

## 2017 අංක 12 දරන විදේශ විනිමය පනත

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වන වගන්තිය සමග කියවිය යුතු 29 වන වගන්තිය යටතේ සාදනු ලබන නියෝග.

රනිල් වික්‍රමසිංහ,
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය.

2017 නොවැම්බර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

## නියෝග

1. මේ නියෝග 2017 අංක 2 දරන විදේශ විනිමය (ප්‍රාග්ධන ගනුදෙනුවල යෙදීමේ කාර්යය සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු අතර පනත ක්‍රියාත්මක වන දිනයේ දී ක්‍රියාත්මක විය යුතු ය.

I වන කොටස

**ගිණුම් විවෘත කිරීමේ බලය**

2. ප්‍රාග්ධන ගනුදෙනුවල දී ගනුදෙනු කිරීම සඳහා යම් තැනැත්තකුගේ නාමයෙන් විදේශ විනිමය ගිණුම් හෝ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් විවෘත කිරීමට පහත සඳහන් තැනැත්තන්ට බලය තිබිය යුතු ය.-
   (අ) බලයලත් වෙළෙන්දකු වශයෙන් යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක්;
   (ආ) පනතේ 4 (1) (ඇ) වගන්තිය යටතේ මහ බැංකුව විසින්, බලය ලබාදීමේ දී නිශ්චිතව සඳහන් කරන ලද කාර්ය සඳහා විදේශ විනිමය වෙළඳාම් කිරීමට බලය ලබා දෙන ලද ලෙස සලකනු ලැබිය යුතු යම් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්; සහ
   (ඇ) පනතේ 4 (1) (ඇ) වගන්තිය යටතේ මහ බැංකුව විසින්, බලය ලබාදීමේ දී නිශ්චිතව සඳහන් කරන ලද කාර්ය සඳහා විදේශ විනිමය වෙළඳාම් කිරීමට බලය ලබා දෙනු ලැබිය හැකි යම් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්.
3. ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික යම් මූල්‍ය ආයතනයක් විසින් ශ්‍රී ලංකාවේ තැනැත්තන් වෙත ගෙවීම් සිදු කිරීමේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සමග විදේශ විනිමය ගිණුම් සහ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම සිදු කරනු ලැබිය හැකිය.
4. බලයලත් වෙළෙන්දකු වශයෙන්, ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් හෝ 2 වන නියෝගයේ (ආ) සහ (ඇ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් වෙනත් රටවල විදේශ විනිමය ගනුදෙනු කාර්යක්ෂමව පියවීමේ පහසුකම් සැලසීම උදෙසා, ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවා ඇති බැංකුවක් සමග හෝ එවැනි බැංකුවක ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවා ඇති ශාඛා සමග නොස්ට්‍රො ගිණුම් (Nostro Accounts) විවෘත කිරීම හා පවත්වාගෙන යාම සිදු කරනු ලැබිය හැකිය.

II වන කොටස

**ගිණුම් වර්ග**

5. (1) බලයලත් වෙළෙන්දකු වශයෙන් යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් හෝ 2 වන නියෝගයේ (ආ) සහ (ඇ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් පහත දැක්වෙන ගිණුම් වර්ග විවෘත කිරීම හා පවත්වාගෙන යාම සිදු කළ හැකි ය:-
   (අ) ආමුඛ ආයෝජන ගිණුම් (Inward Investment Accounts - IIAs)
   (ආ) ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් (Outward Investment Accounts - OIAs)
   (ඇ) ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් (Capital Transactions Rupee Accounts - CTRAs)
   (ඈ) රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (Diplomatic Foreign Currency Accounts - DFAs)
   (ඉ) රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම් ( Diplomatic Rupee Accounts - DRAs)
   (2) ආමුඛ ආයෝජන ගිණුම්, ප්‍රතිමුඛ ආයෝජන ගිණුම්, ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් සහ රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් ශ්‍රී ලංකා රුපියල්වලින් හෝ යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් (චෙක්පත් ඇණවීමේ පහසුකම නොමැතිව) ජංගම ගිණුම්, ඉතිරිකිරීමේ ගිණුම් හෝ කාලීන තැන්පතු ගිණුම් වශයෙන් විවෘත කිරීම හා පවත්වාගෙන යාම සිදු කරනු ලැබිය හැකි ය.
   (3) පුද්ගලයන් විසින් පවත්වාගෙන යනු ලබන ආමුඛ ආයෝජන ගිණුම්, රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සහ රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම් තනි ගිණුම් හෝ තවත් සුදුසු තැනැත්තකු සමග බද්ධ ගිණුම් ලෙස පවත්වනු ලැබිය හැකි ය.
   (4) බලයලත් වෙළෙන්දන් වශයෙන්, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් (1) වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ගිණුම් එම බැංකුවල දේශීය බැංකු ඒකකවල විවෘත කිරීම හා පවත්වාගෙන යාම කරනු ලැබිය යුතු ය.
6. 5 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති යම් ගිණුමක් ශ්‍රී ලංකා රුපියල්වලින් හෝ මේ නියෝගවල I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කලට නිශ්චිතව දැක්විය හැකි පරිදි වෙනත් යම් ව්‍යවහාරික මුදලකින් විවෘත කිරීම හා පවත්වාගෙන යාම කරනු ලැබිය යුතු ය.
7. (1) යම් තැනැත්තකු විසින් මේ නියෝගවල II වන උපලේඛනයේ සඳහන් කර ඇති පරිදි යම් ගිණුමක් විවෘත කිරීමට සුදුසුකම් නොලබන අවස්ථාවක දී 5 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති යම් ගිණුමක් විවෘත නොකළ යුතු ය.
   (2) බලයලත් වෙළෙන්දකු වශයෙන්, සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින්ම හෝ 2 වන නියෝගයේ (ආ) සහ (ඇ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් ම 3 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති ගිණුමක් විවෘත කිරීමට හා පවත්වාගෙන යාමට බලාපොරොත්තු වන තැනැත්තන්, II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති නිර්ණායකයන් යටතේ එවැනි ගිණුමක් විවෘත කිරීමට හා පවත්වාගෙන යාමට සුදුසු බව නිසැකව දැන ගැනීමට නිසි උද්යෝගයකින් සහ සාධාරණ සැලකිල්ලක් ඇතිව කටයුතු කළ යුතු ය. බලයලත් වෙළෙන්දකු වශයෙන් සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින්ම හෝ 2 වන නියෝගයේ (ආ) සහ (ඇ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් ගිණුම් හිමියන්ගේ සුදුසුකම් සනාථ කෙරෙන ඔවුන්ට අදාළ තොරතුරු සහ ලේඛනගත සාක්ෂි ගිණුම පවත්වාගෙන යන කාල සීමාවේදී සහ ගිණුමක් අවසන් කිරීමෙන් පසු අවුරුදු හයක කාලයක් පවත්වාගත යුතු ය.
   (3) 3 වන නියෝගයේ නිශ්චිතව සඳහන් එක් එක් ගිණුම් වර්ග විවෘත කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ නිර්ණායක, එකී සෑම ගිණුම් වර්ගයක් සඳහාම අවසරලත් හර කිරීමේ හා බැර කිරීමේ සීමා, මෙම නියෝගවල II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.
   (4) මෙම නියෝගවල සඳහන් කිසිවක් මගින්, බලයලත් වෙළෙන්දන් වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු හෝ 2 වන නියෝගයේ (ආ) සහ (ඇ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති බලපත්‍රලාභී විශේෂිත බැංකු හෝ ගිණුම් හිමියන්, ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වූ වෙනත් යම් නීතියක විධිවිධාන සමග අනුකූල වීමෙන් වළක්වනු නොලැබිය යුතු ය.

III වන කොටස

**දැනට පවතින ගිණුම් නැවත නම් කරනු ලැබීම ආදිය**

8. බලයලත් වෙළෙන්දන් වශයෙන් සියලු බලපත්‍රලාභී වාණිජ බැංකු සහ 2 වන නියෝගයේ (ආ) සහ (ඇ) ඡේදවල නිශ්චිතව දක්වා ඇති බලපත්‍රලාභී විශේෂිත බැංකු, දෙදහස් දහ අටේ අප්‍රේල් 1 වන දින වන විට -

(අ) ඉවත් කරන ලද විනිමය පාලන පනතේ විධිවිධාන යටතේ විදේශ ව්‍යවහාර මුදල්වලින් හා ශ්‍රී ලංකා රුපියල්වලින් විවෘත කරන ලද හා පවත්වාගෙන යන, දැනට පවත්නා සියලු සුරැකුම්පත් ආයෝජන ගිණුම් (SIA) සහ විශේෂ විදේශ ආයෝජන තැන්පතු ගිණුම් (SFIDA), ආමුඛ ආයෝජන ගිණුම් (IIA) ලෙසින්; සහ

(ආ) දැනට පවතින සියලුම අනේවාසික රුපියල් ගිණුම් (NRRA), අනේවාසික අවහිර කළ ගිණුම් (NRBA) සහ සංක්‍රමික අවහිර කළ ගිණුම් (MBA), ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් (CTRA) ලෙසින්,

නැවත නම් කරනු ලැබිය යුතු ය.

9. මෙම නියෝගවල කාර්ය සඳහා -

"පනත" යන්නෙන්, 2017 අංක 12 දරන විදේශ විනිමය පනත අදහස් වේ;

"බලයලත් වෙළෙන්දා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"මහ බැංකුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"මූල්‍ය ආයතනය" යන්නට 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ මූල්‍ය ව්‍යාපාර පවත්වාගෙන යාමට බලපත්‍රලත් සමාගමක් අදහස් වේ;

"තැනැත්තා" යන්නට, (2 වන අධිකාරය වූ) අර්ථ නිරූපණ ආඥාපනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"බලපත්‍රලාභී වාණිජ බැංකුවක්" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"ප්‍රේෂණ" යන්නට, විදුලි පණිවිඩ හුවමාරු, වෙනත් අන්තර් බැංකු හුවමාරු, බැංකු අණකර, වෙනත් ගෙවීම් සාධනපත්‍ර, ජාත්‍යන්තරව පිළිගත් වෙනත් ගෙවීම් යාන්ත්‍රණ හරහා ලබාගත් ගෙවීම් ව්‍යවහාර මුදල් නෝට්ටු හැර විදේශයකින් විදේශ ව්‍යවහාර මුදල්වලින් විනිමය සමාගම්වලින් සහ නිවාසවලින් ලබාගත් අරමුදල් ඇතුළත් වේ;

"ඉවත් කරන ලද විනිමය පාලන පනත" යන්නෙන් (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනත අදහස් වේ.

පළමුවන උපලේඛනය

**(6 වන නියෝගය)**

**නම් කරනු ලැබූ විදේශ ව්‍යවහාර මුදල්**

(1) ඇමරිකා එක්සත් ජනපද ඩොලර්
(2) යූරෝ
(3) ස්ටර්ලිං පවුම්
(4) ඔස්ට්‍රේලියානු ඩොලර්
(5) සිංගප්පූරු ඩොලර්
(6) ස්වීඩන ක්‍රෝනර්
(7) ස්විස් ෆ්‍රෑන්ක්
(8) කැනේඩියානු ඩොලර්
(9) හොං කොං ඩොලර්
(10) ජපන් යෙන්
(11) ඩෙන්මාර්ක් ක්‍රෝනර්
(12) නෝර්වේජියානු ක්‍රෝනර්
(13) චීන රෙන්මින්බි
(14) නවසීලන්ත ඩොලර්

දෙවන උපලේඛනය

**(7 වන නියෝගය)**

**සුදුසුකම් ලැබීම සහ ගිණුම්වල අවසරලත් හර කිරීමේ සහ බැර කිරීමේ සීමා**

1. **ආමුඛ ආයෝජන ගිණුම් (Inward Investment Accounts -IIAs)**

(1) ආමුඛ ආයෝජන ගිණුම් විවෘත කිරීම සඳහා සුදුසුකම් ලබන තැනැත්තන්

(අ) ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විජාතිකයෙක්;

(ආ) ශ්‍රී ලාංකික සම්භවයක් ඇති, ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විජාතිකයෙක්;

(ඇ) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික ශ්‍රී ලාංකික පුරවැසියෙක්;

(ඈ) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කරන ලද සමාගම්;

(ඉ) ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටුවා ඇති රාජ්‍ය සහ කලාපීය අරමුදල්, අන්‍යෝන්‍ය අරමුදල්, ඒකක භාර සහ අනෙකුත් ආයතනික ආයෝජකයින්;

(ඊ) යම් බලයලත් වෙළෙන්දකු සමග ආමුඛ ආයෝජන ගිණුමක් පවත්වාගෙන යනු ලැබූ මියගිය තැනැත්තෙකුගේ බූදලය අද්මිනිස්ත්‍රාසි කර අවසන් වන තෙක් එම මිය ගිය තැනැත්තාගේ බූදලයේ අද්මිනිස්ත්‍රාසිකරු හෝ පොල්මංකරු;

(උ) නඩු කටයුතු අවසන් වනතෙක්, එකී බලපත්‍රලාභී වාණිජ බැංකුව සමග ආමුඛ ආයෝජන ගිණුමක් පවත්වාගෙන යන සමාගමක ලැබුම්කරු හෝ ඈවරකරු;

(ඌ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කලට බලය ලබා දෙනු ලැබිය හැකි වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් වර්ග.

(2) අවසරලත් බැර කිරීම්

(අ) ගිණුම් හිමියා වෙනුවෙන් බැංකු පද්ධතිය හරහා ශ්‍රී ලංකාවට පිටතින් ලැබෙන්නා වූ විදේශ විනිමය ප්‍රේෂණ;

(ආ) එකම ගිණුම් හිමියකුගේ පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, ආමුඛ ආයෝජන ගිණුම් හෝ අක්වෙරළ බැංකු ඒකකයක පවත්වාගෙන යන ගිණුම්වලින් කරනු ලබන හුවමාරු;

(ඇ) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ප්‍රතිපාදන යටතේ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයන් සඳහා ශ්‍රී ලංකාව තුළ කිරීමට අනුමත ප්‍රාග්ධන ගනුදෙනු සඳහා ලද ලාභාංශ, විකුණුම් හෝ කල්පිරීමේ ලැබීම්, ඈවර කිරීමේ බැහැර කිරීම්, ප්‍රාග්ධන නිදහස් කිරීම්, කොටස් නැවත ලබා ගැනීම්, ලාභ, අතිරික්ත මුදල්, කුලී ආදායම්, මුල් මුදල අය කර ගැනීම්, පොලිය හෝ වෙනත් අදාළ ආදායම් යනාදිය;

(ඈ) ප්‍රකාශයට පත් කිරීමෙන් පසු, ශ්‍රී ලංකාව තුළට රැගෙන එන ලද විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු (එනම්, එකී විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු, එ.ජ.ඩො. 15,000 ඉක්මවන හෝ එයට සමාන වන හෝ ශ්‍රී ලංකා රේගුවට ප්‍රකාශයට පත් කිරීමෙන් පසු වෙනත් යම් විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන වන අවස්ථාවක හෝ එකී විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු, එ.ජ.ඩො. 15,000 ට අඩුවන හෝ බලයලත් වෙළෙන්දකුට සුදුසු පරිදි ප්‍රකාශයට පත් කළ පසු වෙනත් යම් විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන වන අවස්ථාවක);

(ඉ) ආයෝජනය, ආමුඛ ආයෝජන ගිණුමක් (හෝ ගිණුම් හිමියාගේ නැවත නම් කරන ලද සුරැකුම්පත් ආයෝජන ගිණුමක් හෝ මේ නියෝග බලාත්මක වීමට පෙරාතුව කරන ලද නිසැකයෙන් තහවුරු කර ගත් ආමුඛ ප්‍රේෂණයන්) හරහා සිදු කර ඇති විට දී, නිශ්චල දේපළවලින් ලද ප්‍රාග්ධන ලාභ, කල්බදු හිමිකම්, උප කල්බදු හිමිකම් ඇතුළු ශ්‍රී ලංකා රුපියල් වලින් ලැබුණු විකුණුම් ලැබීම්;

(ඊ) ශ්‍රී ලාංකික නේවාසික තැනැත්තෙකුගේ (එනම් ණයකරු) ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින්, ඉවත් කරන ලද විනිමය පාලන පනත හෝ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ප්‍රතිපාදන යටතේ ප්‍රදානය කරන ලද යම් සාමාන්‍ය හෝ විශේෂ අනුමැතියක් යටතේ ගිණුම් හිමියාගෙන් (එනම් විදේශ ණය දෙන්නාගේ) විදේශ ව්‍යවහාර මුදලින් ලබාගත් ණය ආපසු ගෙවීමක් ලෙස කරනු ලබන මාරු කිරීම්;

(උ) ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයෙකු (එනම් ණයකරු) විසින් ගිණුම් හිමියාගෙන් (එනම් විදේශ ණය දෙන්නාගෙන්), ඉවත් කරන ලද විනිමය පාලන පනත හෝ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ප්‍රතිපාදන යටතේ ප්‍රදානය කරන ලද යම් සාමාන්‍ය හෝ විශේෂ අනුමැතියක් යටතේ විදේශ ව්‍යවහාර මුදලින් ලබාගත් ණය ආපසු ගෙවීම් සඳහා විදේශ ව්‍යවහාර මුදල්වලට පරිවර්තනය කරන ලද ශ්‍රී ලංකා රුපියල්;

(ඌ) ගිණුම්හිමියාගේම රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම සහ රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම්වලින් සිදු කරනු ලබන මාරු කිරීම්;

(එ) (නිකුත් කරන්නා විසින් ගන්නා ලද සංස්ථාමය ක්‍රියාමාර්ගයක්, අයිතිවාසිකමක් ක්‍රියාත්මක කිරීමක්, හිමිකමක් හෝ පරිවර්තනයක් ප්‍රකාරව ආයෝජකයාට පසුකාලීනව පැවරෙන යම් කොටස් ඇතුළුව) ගිණුම් හිමියා විසින් එම ආමුඛ ආයෝජන ගිණුම මාර්ගයෙන්ම එම ආයෝජනය සිදුකර ඇති විට දී ගිණුම් හිමියා විසින් එම අවසර දෙන ලද ආයෝජන එම ගැණුම්කරුට විකිණීමට අදාළව වෙනත් යම් තැනැත්තකුගේ (එනම් ගැණුම්කරුගේ) ආමුඛ ආයෝජන ගිණුමෙන් සිදු කරන ලද ගනුදෙනු හෝ හුවමාරු කිරීම්;

(ඒ) මහ බැංකුව විසින් නිකුත් කළ විධානයන් මගින් අවසර දී ඇති පරිදි එම ගිණුම් හිමියාගේ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමෙන් සිදුකරන හුවමාරු;

(ඔ) අදාළ ගනුදෙනු හෝ හුවමාරු කිරීම් සිදු කිරීම සඳහා මහ බැංකුව විසින් නිකුත් කළ විධානයන් මගින් අවසර ලබා දී ඇති තාක් දුරට මහ බැංකුව විසින් කලින් කලට පවත්වාගෙන යාමට අවසර ලබා දෙනු ලැබිය හැකි වෙනත් යම් ගිණුම් වර්ග යකින් සිදු කරන ලද ගනුදෙනු හෝ හුවමාරු කිරීම්;

(ඕ) ගිණුමෙහි පවත්වාගෙන යන ලද අරමුදල්වලින් උපයා ගත් පොලී.

(3) අවසර ලත් හර කිරීම්

(අ) ශ්‍රී ලංකා රුපියල්වලින් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරන ගෙවීම්;

(ආ) ගිණුම් හිමියාගේ නමට සිදු කරන ප්‍රතිමුඛ ප්‍රේෂණ;

(ඇ) එම ගිණුම් හිමියාගේ ම ආමුඛ ආයෝජන ගිණුම්වලට, පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට හෝ අක්වෙරළ බැංකු ඒකක තුළ පවත්වාගෙන යන ගිණුම්වලට සිදු කළ හුවමාරු කිරීම්;

(ඈ) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ ප්‍රදානය කරන ලද අවසර ප්‍රකාරව ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසික තැනැත්තන් විසින් ශ්‍රී ලංකාව තුළ සිදු කළ ප්‍රාග්ධන ගනුදෙනුවලට අදාළ ගෙවීම්;

(ඉ) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ ප්‍රදානය කරන ලද සාමාන්‍ය හෝ විශේෂ අනුමැතිය ප්‍රකාරව එකී ණය ලබාගෙන ඇති විට දී ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන්ට ලබා දෙන ලද විදේශ ව්‍යවහාර මුදල් ණයවලට අදාළ ගෙවීම්;

(ඊ) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ අවසරලත් විදේශ ප්‍රාග්ධන ගනුදෙනුවකට (එනම් ප්‍රතිමුඛ ආයෝජනයක්) මුදල් සැපයීමේ කාර්ය සඳහා එකී ණය ලබාගෙන ඇති විටදී, ණය ලබා ගන්නාගේ ප්‍රතිමුඛ ආයෝජන ගිණුමකට (ණය සුරැකුම් ඇතුළුව) විදේශ ව්‍යවහාර මුදල් ණයවලින් ලද ප්‍රතිෂ්ඨා මුදල් හුවමාරු කිරීම;

(උ) එකී ගිණුම් හිමියාගේ රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට සහ රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම්වලට සිදු කළ හුවමාරු කිරීම්;

(ඌ) ගිණුම් හිමියා විසින් එකී විකිණුම්කරුගේ සුරැකුම්පත් හෝ දේපළ මිලදී ගැනීම සම්බන්ධයෙන් වෙනත් තැනැත්තෙකුගේ (එනම් විකුණුම්කරුගේ) ආමුඛ ආයෝජන ගිණුමට සිදු කරන ලද හුවමාරු කිරීම්;

(එ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ විධානයන් මගින් එකී ගනුදෙනු සිදු කිරීම් සඳහා අවසර ලබා දී ඇතිතාක් දුරට, කලින් කලට, මහ බැංකුව විසින් පවත්වාගෙන යාමට අවසර ලබා දිය හැකි වෙනත් යම් ගිණුම් වර්ගයකට සිදු කළ හුවමාරු කිරීම්.

**2. ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් (OIAs)**

(1) ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් විවෘත කිරීමට සුදුසුකම් ලබන තැනැත්තන්:-

(අ) 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වූ යම් වගකීමෙන් සීමිත සමාගමක්;

(ආ) ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි වූ යම් හවුල් ව්‍යාපාරයක්;

(ඇ) ශ්‍රී ලංකාවේ නේවාසික තනි පුද්ගලයකු.

(2) යම් රාජ්‍ය නොවන සංවිධානයක්, ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් විවෘත කිරීමට හෝ පවත්වාගෙන යාමට අවසර නොලැබිය යුතු ය.

(3) ඉවත් කරන ලද විනිමය පාලන පනතේ හෝ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ වන නඩු පැවරීමක් සම්බන්ධයෙන් නීති කෘත්‍යය අවසන් නොවී පවතින්නේ යම් තැනැත්තකු, යම් සමාගමක් හෝ යම් හවුල් ව්‍යාපාරයකට විරුද්ධව ද, එම තැනැත්තා, එම සමාගම හෝ එම හවුල් ව්‍යාපාරය විසින් එම ප්‍රේෂණ සඳහා මහ බැංකුවෙන් ලබාගත් අනුමැතියකින් තොරව අවසරලත් ප්‍රාග්ධන හුවමාරුවක් සම්බන්ධයෙන් කිසිදු බාහිර ප්‍රතිමුඛ ප්‍රේෂණයක් සිදු කිරීම සඳහා අවසර දෙනු නොලැබිය යුතු ය.

(4) අවසරලත් බැර කිරීම්

(අ) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ නිකුත් කරනු ලබන නියෝගවල විධිවිධානයන්හි නිශ්චිතව දක්වා ඇති සීමාවන්ට යටත්ව, ආයෝජනය සඳහා අවශ්‍ය ප්‍රමාණයට පමණක් විදේශ ව්‍යවහාර මුදල් බවට පරිවර්තනය කළ, සුදුසුකම්ලත් නේවාසික ආයෝජකයන්ගෙන් ලද ශ්‍රී ලංකා රුපියල්;

(ආ) ගිණුම් හිමියාගේ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙන් සිදු කරනු ලබන මාරු කිරීම්;

(ඇ) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ අනුමත විදේශීය ප්‍රාග්ධන ගනුදෙනු (එනම් ප්‍රතිමුඛ ආයෝජනයන්) මූල්‍යනය කිරීම සඳහා ණය දෙන්නාගේ ආමුඛ ආයෝජන ගිණුම හරහා එලෙස විදේශ මූලාශ්‍රවලින් ලබා ගන්නා ණය මුදල් (ණය සුරැකුම්පත් නිකුතුව ද ඇතුළත් ව).

(ඈ) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ සහ ඉවත් කරන ලද විනිමය පාලන පනතේ විධිවිධාන යටතේ, ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් හට ශ්‍රී ලංකාවෙන් පිටත දී සිදු කිරීමට අවසර ලබා දී ඇති ප්‍රාග්ධන ගනුදෙනු සඳහා එම ප්‍රාග්ධන ගනුදෙනු එම ප්‍රතිමුඛ ආයෝජන ගිණුමෙන් ම සිදු කර ඇති විට දී, (නිකුත් කරන්නා විසින් සිදු කරන ලද සංස්ථාමය ක්‍රියාමාර්ගයක්, අයිතියක් ක්‍රියාත්මක කිරීමක්, හිමිකමක් හෝ පරිවර්තනයක් ප්‍රකාරව ආයෝජකයා මත පසුව පැවරෙන යම් කොටස් ඇතුළුව) ලාභාංශ, විකුණුම් සහ කල් පිරීම්වලින් ලද ප්‍රතිෂ්ඨා මුදල්, ප්‍රාග්ධන ලාභ සහ ඈවර කිරීමෙන් ලද ප්‍රතිෂ්ඨා මුදල් කොටස්/ස්වෛරීත්ව බැඳුම්කර, ඒකක, ණය සුරැකුම්පත්වලින් ලැබිය යුතු ප්‍රාග්ධන අඩු කිරීම්, ලාභ, පර්යන්ත සහ අතිරික්ත අරමුදල්, කළමනාකරණ ගාස්තු, උපදේශක ගාස්තු සහ කොමිස් මුදල් සහ වෙනත් යම් ආශ්‍රිත ලැබීම් ආදී ප්‍රේෂණ.

(ඉ) අදාළ ගනුදෙනු හෝ හුවමාරු කිරීම් සිදු කිරීම සඳහා මහ බැංකුව විසින් නිකුත් කළ විධානයක් මගින් අවසර ලබා දෙනු ලැබිය හැකිතාක් දුරට මහ බැංකුව විසින් කලින් කලට පවත්වාගෙන යාමට අවසර ලබා දෙනු ලැබිය හැකි වෙනත් යම් ගිණුම් වර්ගයකින් සිදු කරන ලද ගනුදෙනු හෝ හුවමාරු කිරීම.

(ඊ) ගිණුමේ රඳවන ලද අරමුදල් මත උපයාගත් පොලිය.

(5) අවසරලත් හර කිරීම්

(අ) ගිණුම් හිමියා විසින් 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ ප්‍රදානය කරන ලද අනුමතයන්ට අනුව ගිණුම් හිමියා විසින් කරන ලද ප්‍රාග්ධන ගනුදෙනු (ප්‍රතිමුඛ ආයෝජන) සඳහා වන ගෙවීම් (කාර්යාල පිහිටුවීමේ හා නඩත්තු කිරීමේ පිරිවැය, බැංකු ගාස්තු, බ්‍රෝකර් ගාස්තු, කොමිස් හෝ වෙනත් ගෙවීම් ද ඇතුළුව).

(ආ) ගිණුම් හිමියාගේ ජංගම ගනුදෙනු සඳහා ශ්‍රී ලංකාවෙන් පිටතට විදේශ ව්‍යවහාර මුදලින් කරනු ලබන ගෙවීම්.

(ඇ) පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හර කිරීමෙන් මූලික ආයෝජනයක් සිදු කර ඇති විට, එම විදේශීය ප්‍රාග්ධන ගනුදෙනු (ප්‍රතිමුඛ ආයෝජන) වලින්, ප්‍රතිමුඛ ආයෝජන ගිණුමට ලද ප්‍රාග්ධනය හා ප්‍රාග්ධන ලාභ, ගිණුම් හිමියාගේ පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට මාරු කිරීම්.

(ඈ) අදාළ ගනුදෙනු හෝ හුවමාරු කිරීම් සිදු කිරීම සඳහා මහ බැංකුව විසින් නිකුත් කළ විධානයක් මගින් අවසර ලබා දෙනු ලැබිය හැකි තාක් දුරට මහ බැංකුව විසින් කලින් කලට පවත්වාගෙන යාමට අවසර ලබා දෙනු ලැබිය හැකි වෙනත් යම් ගිණුම් වර්ගයක් වෙත සිදු කරන ලද ගනුදෙනු හෝ හුවමාරු කිරීම.

(ඉ) ශ්‍රී ලංකා රුපියල්වලින් සිදු කරනු ලබන මුදල් ආපසු ගැනීම්.

3. **ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් (CTRA)**

(1) ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් විවෘත කිරීමට සුදුසුකම් ලත් තැනැත්තන් -

(අ) ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථිර නේවාසික තනි පුද්ගලයකු,

(ආ) ශ්‍රී ලාංකික සම්භවයක් ඇති , ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විජාතිකයකු,

(ඇ) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විජාතිකයකු,

(ඈ) ශ්‍රී ලාංකික ද්විත්ව පුරවැසිලාභියකු,

(ඉ) ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි කර ඇති විදේශ ආයතන සහ සමාගම්,

(ඊ) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික ශ්‍රී ලාංකික ජාතිකයකු.

(2) අවසරලත් බැර කිරීම්

(අ) බැංකු පද්ධතිය හරහා ගිණුම් හිමියාගේ නමට ශ්‍රී ලංකාවෙන් පිටතින් විදේශ විනිමයෙන් ලැබෙන ප්‍රේෂණ;

(ආ) ගිණුම් හිමියා, ශ්‍රී ලංකාවේ විගාමික තනි පුද්ගලයකු, ශ්‍රී ලංකාවෙන් පිටත විජාතික නේවාසික තැනැත්තකු හෝ ශ්‍රී ලාංකික ද්විත්ව පුරවැසියකු වන අවස්ථාවක, ශ්‍රී ලංකාව තුළ ව්‍යුත්පන්න වූ නිශ්චල හා චංචල දේපළ අලෙවියෙන් ලබාගත් මුදල් සහ ස්පෘශ්‍ය/ස්පෘශ්‍ය නොවන වත්කම් ද ඇතුළුව දේශීය ආදායම;

(ඇ) අදාළ ගනුදෙනු හෝ හුවමාරු කිරීම් සිදු කිරීම සඳහා මහ බැංකුව විසින් නිකුත් කළ විධානයක් මගින් අවසර ලබා දෙනු ලැබිය හැකිතාක් දුරට මහ බැංකුව විසින් කලින් කලට පවත්වාගෙන යාමට අවසර ලබා දෙනු ලැබිය හැකි වෙනත් යම් ගිණුම් වර්ගයකින් සිදු කරන ලද ගනුදෙනු හෝ හුවමාරු කිරීම;

(ඈ) ගිණුමේ රඳවන ලද අරමුදල් මත උපයාගත් පොළිය.

(3) අවසරලත් හර කිරීම්

(අ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධානයන්ට අනුව සුදුසුකම්ලත් යම් ශ්‍රී ලාංකික විගාමිකයකුට සංක්‍රමණික දීමනා ලෙස එ.ජ.ඩො. 200,000 දක්වා ලැබෙන ප්‍රේෂණ;

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධාන ප්‍රකාරව, ඉහත සඳහන් 4 වන ඡේදයේ 3(අ) අනුඡේදයට අතිරේකව, සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික විගාමිකයකුට අදාළව වසරකට එ.ජ.ඩො. 30,000 ක් බැගින් වූ දීමනා ප්‍රේෂණ;

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධාන ප්‍රකාරව, විදේශීය ජාතිකයින්ට අදාළව ප්‍රාග්ධන ගනුදෙනු සඳහා වසරකට එ.ජ.ඩො. 30,000ක් බැගින් කරනු ලබන ප්‍රේෂණ;

(ඈ) ගිණුම්හිමියා, ශ්‍රී ලංකාවේ විගාමික තනි පුද්ගලයකු, ශ්‍රී ලංකාවෙන් පිටත විජාතික නේවාසික තැනැත්තකු හෝ ශ්‍රී ලාංකික ද්විත්ව පුරවැසියකු වන අවස්ථාවක, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධාන ප්‍රකාරව, සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාව, ගිණුම් හිමියාගේ පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට හෝ ආමුඛ ආයෝජන ගිණුමකට හුවමාරු කිරීම;

(ඉ) ශ්‍රී ලංකාව තුළ ශ්‍රී ලංකා රුපියල්වලින් සිදු කරන ලද ගෙවීම්;

(ඊ) අදාළ ගනුදෙනු හෝ හුවමාරු කිරීම් සිදු කිරීම සඳහා මහ බැංකුව විසින් නිකුත් කළ විධානයක් මගින් අවසර ලබා දෙනු ලැබිය හැකිතාක් දුරට මහ බැංකුව විසින් කලින් කලට පවත්වාගෙන යාමට අවසර ලබා දෙනු ලැබිය හැකි වෙනත් යම් ගිණුම් වර්ගයක් වෙත සිදු කරන ලද ගනුදෙනු හෝ හුවමාරු කිරීම.

4. **රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (DFA)**

(1) රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීමට සුදුසුකම්ලත් පුද්ගලයන්

(අ) රාජ්‍ය තාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍රයක් සහ ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලබන රාජ්‍ය තාන්ත්‍රික හැඳුනුම්පතක් සහිතව සහ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන නේවාසික වීසා ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබූ යම් විදේශ පුරවැසියකු;

(ආ) රාජ්‍ය තාන්ත්‍රික නොවන ගමන් බලපත්‍රයක් සහිත සහ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නේවාසික වීසා ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබූ යම් විදේශ පුරවැසියකු;

(2) අවසරලත් බැරකිරීම්

(අ) බැංකු පද්ධතිය හරහා ගිණුම් හිමියාගේ නමට ශ්‍රී ලංකාවට පිටතින් ලැබෙන්නා වූ විදේශ විනිමය ප්‍රේෂණ;

(ආ) ශ්‍රී ලංකා රේගුවට ප්‍රකාශ කොට ගිණුම් හිමියා විසින් මෙරටට රැගෙන ආ විදේශ ව්‍යවහාර මුදල්;

(ඇ) එම ගිණුම් හිමියාගේම ආමුඛ ආයෝජන ගිණුම් හා අක්වෙරළ බැංකු ඒකකයේ පවත්වාගෙන යන ගිණුම්වලින් කරනු ලබන මාරුකිරීම්;

(ඈ) ගිණුම්හිමියා පිළිබඳව නොසළකා රාජ්‍ය දූත විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හා රාජ්‍ය දූත රුපියල් ගිණුම්වලින් කරනු ලබන මාරු කිරීම්;

(ඉ) අදාළ ගනුදෙනු හෝ හුවමාරුකිරීම් සිදු කිරීම සඳහා මහ බැංකුව විසින් නිකුත් කළ විධානයක් මගින් අවසර ලබා දෙනු ලැබිය හැකිතාක් දුරට මහ බැංකුව විසින් කලින් කලට පවත්වාගෙන යාමට අවසර ලබා දෙනු ලැබිය හැකි වෙනත් යම් ගිණුම් වර්ගයකින් සිදු කරන ලද ගනුදෙනු හෝ හුවමාරු කිරීම;

(ඊ) ගිණුමේ රඳවන ලද අරමුදල් මත විදේශ ව්‍යවහාර මුදලින් උපයන ලද පොලිය.

(3) අවසරලත් හර කිරීම්

(අ) ශ්‍රී ලංකාවෙන් පිටතට කරනු ලබන යම් ප්‍රතිමුඛ ප්‍රේෂණයන්;

(ආ) ගිණුම් හිමියාගේ දේශීය වියදම් සඳහා විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් කරනු ලබන ආපසු ගැනීම්;

(ඈ) එම ගිණුම් හිමියාගේම ආමුඛ ආයෝජන ගිණුම්වලට සහ අක්වෙරළ බැංකු ඒකකයේ පවත්වාගෙන යන ගිණුම්වලට කරනු ලබන මාරු කිරීම්;

(ඇ) ගිණුම්හිමියා පිළිබඳව නොසළකා රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට හා රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම්වලට කරනු ලබන මාරු කිරීම්;

(ඉ) වෙනත් යම් තැනැත්තකුගේ පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට කරනු ලබන මාරු කිරීම්;

(ඊ) අදාළ ගනුදෙනු හෝ හුවමාරුකිරීම් සිදු කිරීම සඳහා මහ බැංකුව විසින් නිකුත් කළ විධානයක් මගින් අවසර ලබා දෙනු ලැබිය හැකිතාක් දුරට මහ බැංකුව විසින් කලින් කලට පවත්වාගෙන යාමට අවසර ලබා දෙනු ලැබිය හැකි වෙනත් යම් ගිණුම් වර්ගයක් වෙත සිදු කරන ලද ගනුදෙනු හෝ හුවමාරු කිරීම.

**5. රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම් (DRA)**

(1) රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම් විවෘත කිරීමට සුදුසුකම්ලත් තැනැත්තන් -

(අ) රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍රයක් සහිත සහ ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කරනු ලබන රාජ්‍ය තාන්ත්‍රික හැඳුනුම්පතක් සහිතව සහ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන නේවාසික වීසා ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබූ යම් විදේශ පුරවැසියකු;

(ආ) රාජ්‍ය තාන්ත්‍රික නොවන ගමන් බලපත්‍රයක් සහිතව සහ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නේවාසික වීසා ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබූ යම් විදේශ පුරවැසියකු;

(2) අවසර ලත් බැර කිරීම්

(අ) බැංකු පද්ධතිය හරහා ගිණුම් හිමියා වෙනුවෙන් ශ්‍රී ලංකාවට පිටතින් ලැබෙන විදේශ විනිමය ප්‍රේෂණ ;

(ආ) ශ්‍රී ලංකාවේ යම් තැනැත්තකුගෙන් ගිණුම් හිමියාට ලැබෙන මුදල් ආපසු ගෙවීම් ප්‍රතිපූර්ණය කිරීම් හා ගෙවීම් ;

(ඇ) ගිණුම් හිමියා විසින් ලියවිලි ඉදිරිපත් කිරීම මත ශ්‍රී ලංකාව තුළ ව්‍යුත්පන්න වූ, ගිණුම් හිමියා විසින් හිමිකම දරන මෝටර් වාහන අලෙවියෙන් ලබාගත් මුදල් ;

(ඈ) එම ගිණුම් හිමියාගේම ආමුඛ ආයෝජන ගිණුමෙන් සිදු කරන ලද මාරු කිරීම් ;

(ඉ) ගිණුම් හිමියා පිළිබඳව නොසළකා රාජ්‍ය තාන්ත්‍රික ව්‍යවහාර මුදල් ගිණුම් හා රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම්වලින් කරනු ලබන මාරු කිරීම් ;

(ඊ) අදාළ ගනුදෙනු හෝ හුවමාරු කිරීම් සිදු කිරීම සඳහා මහ බැංකුව විසින් නිකුත් කළ විධානයක් මගින් අවසර ලබා දෙනු ලැබිය හැකි තාක් දුරට මහ බැංකුව විසින් කලින් කලට පවත්වාගෙන යාමට අවසර ලබා දෙනු ලැබිය හැකි වෙනත් යම් ගිණුම් වර්ගයකින් සිදු කරන ලද ගනුදෙනු හෝ හුවමාරු කිරීම ;

(උ) ගිණුමේ රඳවන ලද අරමුදල් මත ශ්‍රී ලංකා රුපියල්වලින් උපයන ලද පොලිය.

(3) අවසර ලත් හර කිරීම්

(අ) ශ්‍රී ලංකාව තුළ ශ්‍රී ලංකා රුපියල්වලින් කරනු ලබන වියදම් ;

(ආ) වීසා ගාස්තු ආපසු ගෙවීම්, ප්‍රතිපූර්ණයන් සහ ගිණුම් හිමියා සතුව තිබූ මෝටර් රථ වාහන විකිණීමෙන් ලත් මුදල් ලෙස ශ්‍රී ලංකාවෙන් පිටතට කරනු ලබන ප්‍රතිමුඛ ප්‍රේෂණ;

(ඇ) ගිණුම් හිමියාගේම ආමුඛ ආයෝජන ගිණුම්වලට කරනු ලබන මාරු කිරීම් ;

(ඈ) ගිණුම් හිමියා පිළිබඳව නොසළකා රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට හා රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම්වලට කරනු ලබන මුදල් මාරු කිරීම්;

(ඉ) අදාළ රේඛීය අමාත්‍යාංශය මගින් අනුමත කරන ලද වෙනත් යම් ගනුදෙනුවක් ;

(ඊ) අදාළ ගනුදෙනු හෝ හුවමාරු කිරීම් සිදු කිරීම සඳහා මහ බැංකුව විසින් නිකුත් කළ විධානයක් මගින් අවසර ලබා දෙනු ලැබිය හැකි තාක් දුරට මහ බැංකුව විසින් කලින් කලට පවත්වාගෙන යාමට අවසර ලබා දෙනු ලැබිය හැකි වෙනත් යම් ගිණුම් වර්ගයක් වෙත සිදු කරන ලද ගනුදෙනු හෝ හුවමාරු කිරීම.

**6. මේ උපලේඛනයේ කාර්යය සඳහා -**

"ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව" යන්නෙන් 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව අදහස් වේ.

**එල්.ඩී.බී. 10/2017**

## 2017 අංක 12 දරන විදේශ විනිමය පනත

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 5 වන සහ 8 වන වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 29 වන වගන්තිය යටතේ සාදනු ලබන නියෝග.

**රනිල් වික්‍රමසිංහ,**
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය.

2017 නොවැම්බර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

1. මේ නියෝග 2017 අංක 3 දරන විදේශ විනිමය (විදේශ විනිමය ගිණුම් විවෘත කිරීමේ හා පවත්වාගෙන යාමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු අතර පනත ක්‍රියාත්මක වන දිනයේ දී ක්‍රියාත්මක විය යුතු ය.

### I වන කොටස
### ගිණුම් විවෘත කිරීමේ බලය

2. යම් බලයලත් වෙළෙන්දකු හෝ ස්වකීය බලපත්‍රයේ නිශ්චිතව සඳහන් ප්‍රමාණය වනතෙක් පරිසීමිත වෙළෙන්දකුහට යම් තැනැත්තකුගේ නමින් විදේශ විනිමය ගිණුමක් විවෘත කිරීමට සහ පවත්වාගෙන යාමට බලය ලැබිය යුතු ය.

### II වන කොටස
### ගිණුම් වර්ග

3. (1) 2 වන නියෝගය යටතේ යම් බලයලත් වෙළෙන්දෙකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් පහත සඳහන් ගිණුම් වර්ග විවෘත කිරීම සහ පවත්වාගෙනයාම සිදුකරනු ලැබිය හැකි ය.
   (අ) පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (Personal Foreign Currency Accounts - PFCAs);
   (ආ) ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (Business Foreign Currency Accounts - BFCAs); හෝ
   (ඇ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කලට නිකුත් කරනු ලබන විධාන ප්‍රකාරව පවත්වාගෙන යාමට අවසර ලබා දෙනු ලැබිය හැකි වෙනත් යම් ගිණුම් වර්ග.
   (2) බලයලත් වෙළෙන්දන් වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු සම්බන්ධයෙන් වන අවස්ථාවකදී, (1) වන ඡේදයේ නිශ්චිතව සඳහන් ගිණුම්, ඒවායේ දේශීය බැංකු ඒකක තුළ විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සිදුකරනු ලැබිය යුතු ය.

4. 3 වන නියෝගයේ නිශ්චිතව සඳහන් යම් ගිණුමක්, ශ්‍රී ලංකා රුපියල්වලින් හෝ මේ නියෝගවල I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කලට නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වෙනත් යම් ව්‍යවහාර මුදලකින් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සිදු කරනු ලැබිය යුතු ය.

5. (1) යම් තැනැත්තකු විසින් මේ නියෝගවල වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් පරිදි යම් ගිණුමක් විවෘත කිරීමට සුදුසුකම් නොලබන අවස්ථාවක දී, එකී තැනැත්තා විසින් 3 වන නියෝගයේ නිශ්චිතව සඳහන් යම් ගිණුමක් විවෘත කරනු නොලැබිය යුතු ය.
   (2) සෑම බලයලත් වෙළෙන්දකු හා පරිසීමිත වෙළෙන්දකු විසින් ම 3 වන නියෝගයේ නිශ්චිතව සඳහන් යම් ගිණුමක් විවෘත කිරීමට සහ පවත්වාගෙන යාමට බලාපොරොත්තු වන තැනැත්තන්, II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් උපමාන යටතේ එකී ගිණුම් විවෘත කිරීමට සහ පවත්වාගෙන යාමට සුදුසුකම් ලබන බව නිශ්චයකර දැන ගැනීම සඳහා නිසි උද්යෝගයකින් සහ සාධාරණ සැලකිල්ලක් සහිතව කටයුතු කළ යුතු ය. සෑම බලයලත් වෙළෙන්දකු හා පරිසීමිත වෙළෙන්දකු විසින්ම ගිණුම් හිමියන්ගේ සුදුසුකම සනාථ කරන්නා වූ ගිණුම් හිමියා පිළිබඳ තොරතුරු හා ලේඛනගත සාක්ෂි ගිණුම පවත්වාගෙන යනු ලබන කාල සීමාව ඇතුළත සහ ගිණුම වසා දැමීමෙන් පසු වසර හයක කාල සීමාවක් දක්වා පවත්වාගෙන යනු ලැබිය යුතු ය.
   (3) 3 වන නියෝගයේ නිශ්චිතව සඳහන් එක් එක් ගිණුම් වර්ග විවෘත කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ උපමාන, එකී සෑම ගිණුම් වර්ගයක් සඳහාම අවසරලත් හර කිරීමේ හා බැර කිරීමේ සීමා, මෙම නියෝගවල II වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති පරිදි විය යුතු ය.
   (4) මේ නියෝගවල සඳහන් කිසිවක් මගින්, බලයලත් වෙළෙන්දන් පරිසීමිත වෙළෙන්දන් හෝ ගිණුම් හිමියන්, ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වූ වෙනත් යම් නීතියක විධිවිධාන සමග අනුකූල වීමෙන් වළක්වනු නොලැබිය යුතු ය.

### III වන කොටස
### දැනට පවතින ගිණුම් නැවත නම් කරනු ලැබීම ආදිය

6. (1) සෑම බලයලත් වෙළෙන්දකු හා පරිසීමිත වෙළෙන්දකු විසින්ම දෙදහස් දහ අටේ අප්‍රේල් මස 1 වන දින වන විට-
   (අ) ඉවත් කරන ලද (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනතේ විධිවිධාන යටතේ විවෘත කරන ලද හා පවත්වාගෙන යන, දැනට පවත්නා සියලුම අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (Non-Resident Foreign Currency Accounts - NRFCs), නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (Resident Foreign Currency Accounts - RFCs), නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (Resident Non Nationals'Foreign Currency Accounts -RNNFCs) සහ අනේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (Non Resident Non National Foreign Currency Accounts - NRNNFAs), පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (Personal Foreign Currency Accounts -PFCAs), ලෙසින් ද;
   (ආ) දැනට පවතින සියලු ම විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම් (Foreign Exchange Earners' Accounts - FEEAs), ආමුඛ ප්‍රේෂණ බෙදා හැරීමේ ගිණුම් (Inward Remittance Distribution Accounts - IRDAs) සහ විදේශ නැව් සේවා හෝ ගුවන්

සේවා නියෝජිතයින් සඳහා වූ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (Foreign Currency Accounts for Agents of Foreign Shipping Lines or Air Lines - FCAASAs), ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (Business Foreign Currency Accounts - BFCAs) ලෙසින් ද, නැවත නම් කරනු ලැබිය යුතු ය.

(2) දැනට පවත්නා සියලු ආගන්තුකයින් සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සහ විදේශීය ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වන විශේෂ ගිණුම්, දෙදහස් දහඅටේ ජනවාරි 1 වන දින සිට නැවත නම් කරනු ලැබීමෙන් තොරව දිගටම පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(3) පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (PFCAs) සහ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් (BFCAs), (චෙක්පත් ලිවීමේ පහසුකම නොමැතිව) ජංගම, ඉතිරි කිරීමේ හෝ කාලීන තැන්පතු ගිණුම් වශයෙන්, නම් කරන ලද යම් විදේශ ව්‍යවහාර මුදලකින් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සිදු කරනු ලැබිය යුතු ය. එම ගිණුම් අතරින්, තනි පුද්ගලයන් විසින් පවත්වාගෙන යනු ලබන පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, වෙනත් සුදුසුකම්ලත් තැනැත්තකු සමග තනි හෝ බද්ධ ගිණුම් වශයෙන් දරනු ලැබිය හැකි ය.

7. මේ නියෝගවල කාර්ය සඳහා -

"බලයලත් වෙළෙන්දා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"මහ බැංකුව" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"බලපත්‍රලාභී වාණිජ බැංකුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"තැනැත්තා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"ප්‍රේෂණ" යන්නට විදුලි මුදල්, වෙනත් අන්තර් බැංකු හුවමාරු, බැංකු අණකර, වෙනත් ගෙවීම් සාධන පත්‍ර, ජාත්‍යන්තරව පිළිගත් වෙනත් ගෙවීම් යාන්ත්‍රණ හා පරිශ්‍ර හරහා ලැබුණු ගෙවීම් හෝ ව්‍යවහාර මුදල් නෝට්ටු හැර, විදේශයකින් විදේශ ව්‍යවහාර මුදල්වලින්, විනිමය සමාගම්වලින්/ නිවාස වලින් ලැබුණු අරමුදල් ඇතුළත් වේ;

"පරිසීමිත වෙළෙන්දා" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

## පළමුවන උපලේඛනය

(4 වන නියෝගය)

### නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්

(අ) එක්සත් ජනපද ඩොලර් (එ.ජ.ඩො.)
(ආ) යූරෝ
(ඇ) ස්ටර්ලිං පවුම්
(ඈ) ඔස්ට්‍රේලියානු ඩොලර්
(ඉ) සිංගප්පූරු ඩොලර්
(ඊ) ස්වීඩන ක්‍රෝනර්
(උ) ස්විස් ෆ්‍රෑන්ක්
(ඌ) කැනේඩියානු ඩොලර්
(එ) හොං කොං ඩොලර්
(ඒ) ජපන් යෙන්
(ඔ) ඩෙන්මාර්ක ක්‍රෝනර්
(ඕ) නෝර්වේජියානු ක්‍රෝනර්
(ක) චීන රෙන්මින්බි
(ග) නවසීලන්ත ඩොලර්

## II වන උපලේඛනය

(5 වන නියෝගය)

### සුදුසුකම් ලැබීම සහ ගිණුම්වල අවසරලත් හර කිරීමේ සහ බැර කිරීමේ සීමා

1. පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (Personal Foreign Currency Accounts - PFCAs)

(1). පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීමට සුදුසුකම් ලබන තැනැත්තන්

(අ) යම් බාලවයස්කරුවකු ඇතුළුව, ශ්‍රී ලාංකික ජාතිකයකු වන යම් පුද්ගලයකු;

(ආ) යම් බාලවයස්කරුවකු ද ඇතුළුව, ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයකු වන, ශ්‍රී ලාංකික සම්භවයක් සහිත පුද්ගලයකු;

(ඇ) විජාතිකයකු වන ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු;

(ඈ) තාවකාලික සංචාරයක් මත ලංකාවට පැමිණි හෝ ශ්‍රී ලංකාවේ සංචාරය කිරීමට අදහස් කරන විජාතික තැනැත්තකු;

(ඉ) බලයලත් වෙළෙන්දා හෝ පරිසීමිත වෙළෙන්දා සමග පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් පවත්වාගෙන යනු ලැබූ මියගිය තැනැත්තකුගේ බූදලය අද්මිනිස්ත්‍රාසි කර අවසන් වන තෙක් එම මිය ගිය තැනැත්තාගේ බූදලයේ අද්මිනිස්ත්‍රාසිකරු හෝ පොල්මඃකරු.

(2). අවසරලත් බැර කිරීම්

(අ) බැංකු පද්ධතිය හරහා ගිණුම් හිමියාගේ නමට, විදේශ විනිමයෙන්, ශ්‍රී ලංකාවෙන් පිටතින් ලබාගත් ප්‍රේෂණ;

(ආ) මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධාන මගින් අවසර දෙන ලද පරිදි, සංචාරක කාර්ය සඳහා පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම හර කිරීම මගින් ගිණුම් හිමියා විසින් ලබාගත්, භාවිතයට නොගත් ව්‍යවහාර මුදල්;

(ඇ) ප්‍රකාශයට පත් කිරීම මත ගිණුම් හිමියා විසින් ශ්‍රී ලංකාවට ගෙන එන ලද විදේශ ව්‍යවහාර මුදල් (එනම්, එකී විදේශ මුදල් නෝට්ටු එ.ජ.ඩො.15000 ඉක්මවන හෝ වෙනත් යම් විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන වන ප්‍රමාණයක් රේගු දෙපාර්තමේන්තුව වෙත ප්‍රකාශයට පත් කිරීම මත හෝ එම විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු එ.ජ.ඩො.15000ට අඩු හෝ වෙනත් යම් විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන වන ප්‍රමාණයක් බලයලත් වෙළෙන්දාට හෝ පරිසීමිත වෙළෙන්දාට සුදුසු ප්‍රකාශයක් කිරීම මත);

(ඈ) ගිණුම් හිමියා නොසලකා, පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලින්, ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලින් හෝ අක්වෙරළ බැංකු ඒකකයක පවත්වාගෙන යනු ලබන ගිණුම්වලින් සිදු කරනු ලබන හුවමාරු;

(ඉ) ගිණුම්හිමියා, ශ්‍රී ලංකාවෙන් පිටත යම් නේවාසික තැනැත්තකු හෝ ශ්‍රී ලංකාවේ නේවාසික විජාතික තැනැත්තකු වන අවස්ථාවක දී, එම ගිණුම් හිමියාගේ ම ආමුඛ ආයෝජන ගිණුමෙන් සිදු කරනු ලබන හුවමාරු;

(ඊ) මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධාන මගින් අවසර ලබා දී ඇති පරිදි, එම ගිණුම් හිමියාගේ ම ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමෙන් සිදු කරනු ලබන හුවමාරු;

(උ) වෙනත් යම් තැනැත්තකුගේ රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලින් සිදු කරනු ලබන හුවමාරු;

(ඌ) පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම හර කිරීම මගින් (හෝ මේ නියමය බලාත්මක වීමට ප්‍රථම, ගිණුම්හිමියාගේ අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙන්, නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙන් හෝ නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙන්) මුල් හුවමාරුව සිදු කරනු ලැබ ඇත්නම්, උපචිත වන ප්‍රාග්ධනය, ප්‍රාග්ධන ලාභ සහ ශ්‍රී ලංකාව තුළ විදේශ ව්‍යවහාර මුදලින් සිදු කරනු ලබන ආයෝජනවලින් උපචිත වන වෙනත් ලැබීම්;

(එ) මේ නියමය බලාත්මක වීමට ප්‍රථම, ගිණුම්හිමියාගේ අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම, නේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම හෝ නේවාසික විජාතික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම හර කිරීම මගින් මුල් ආයෝජනය සිදු කරනු ලැබ ඇත්නම්, විදේශ ආයෝජනවලින් ප්‍රතිමුඛ ආයෝජන ගිණුමට ලැබුණු ප්‍රාග්ධනය සහ ප්‍රාග්ධන ලාභ;

(ඒ) පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙන් විදේශ සංචාරක කාඩ්පත මත තැන්පත් කරනු ලැබූ මුදල් ප්‍රමාණය දක්වා එම ගිණුම් හිමියාගේම විදේශ සංචාරක කාඩ්පතේ ඉතිරිව පවතින භාවිත නොකළ ශේෂය;

(ඔ) ගිණුම් හිමියා ශ්‍රී ලංකාවේ නේවාසික විජාතික සේවකයකු වන අවස්ථාවක දී, සේවා යෝජකයාගේ ශ්‍රී ලංකා රුපියල් ගිණුමෙන් මාසික වැටුප, සේවා ප්‍රතිලාභ හා වෙනත් අදාළ ප්‍රතිලාභ වශයෙන් සිදු කරනු ලබන හුවමාරු;

(ඕ) ගිණුම්හිමියා ශ්‍රී ලංකාවේ නේවාසික විජාතික සේවකයකු වන අවස්ථාවක දී, බැර කිරීම් සිදු කරන ලද දිනයේ දී ලබාගත් විනිමය අනුපාතයට පරිවර්තනය කරන ලද, විදේශ ප්‍රේෂණ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලය ලබාදෙන ලද ශ්‍රී ලංකා රුපියල්වලින් වන යම් මුදල් ප්‍රමාණයක්;

(ක) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධාන මගින් යම් ගනුදෙනුවලට හෝ හුවමාරුවලට අවසරය ලබා දී ඇති ප්‍රමාණය තෙක්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කලට පවත්වාගෙන යාම සඳහා අවසර ලබාදිය හැකි වෙනත් යම් ගිණුම් වර්ගවලින් සිදු කරනු ලබන ගනුදෙනු හෝ හුවමාරු කිරීම්;

(ග) පනතේ 8(3) වගන්තිය ප්‍රකාරව ගිණුම්හිමියාගෙන් ශ්‍රී ලංකාවෙන් පිටත උපචිතවන ප්‍රේෂණ;

(ච) ගිණුමේ රඳවනු ලැබූ අරමුදල් මත විදේශ ව්‍යවහාර මුදල්වලින් උපයාගත් පොළිය.

(3) අවසරලත් හර කිරීම්

(අ) ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරන ලද යම් ප්‍රතිමුඛ ප්‍රේෂණ;

(ආ) ශ්‍රී ලංකාවේ ශ්‍රී ලංකා රුපියල්වලින් සිදුකරන ගෙවීම්;

(ඇ) ගිණුම්හිමියා නොතකා, පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට හෝ අක්වෙරළ බැංකු ඒකකයන්හි පවත්වාගෙන යන ගිණුම්වලට සිදු කරනු ලබන හුවමාරු කිරීම්;

(ඈ) ගිණුම් හිමියා ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයකු හෝ ශ්‍රී ලංකාවේ නේවාසික විජාතිකයකු වන අවස්ථාවක දී එම ගිණුම් හිමියාගේ ම ආමුඛ ආයෝජන ගිණුමකට සිදු කරනු ලබන හුවමාරු කිරීම්;

(ඉ) විදේශ සංචාරක කාඩ්පතක ගබඩා කිරීම සඳහා අරමුදල් මාරු කිරීම;

(ඊ) පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමේ අරමුදල් උපයෝගි කරගනිමින් විදේශීය ව්‍යවහාර මුදලින් ශ්‍රී ලංකාව තුළ සිදු කරනු ලැබීමට අවසරලත් යම් ආයෝජනයක් සම්බන්ධ හුවමාරු කිරීම්;

(උ) ශ්‍රී ලංකාවේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලැබූ විධාන මගින් අවසර දී ඇති පරිදි සංචාරක අරමුණ සඳහා එ.ජ.ඩො. 10,000 දක්වා (හෝ වෙනත් යම් විදේශීය ව්‍යවහාර මුදලින් ඊට සමාන මුදලක්) දක්වා විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු ආපසු ගැනීම;

(ඌ) ගිණුම දරන්නා තාවකාලිකව ශ්‍රී ලංකාවේ නැවතී සිටින ශ්‍රී ලංකාවෙන් පිටත විජාතික නේවාසිකයකු වන අවස්ථාවකදී, විදේශ ව්‍යවහාර මුදලින් වන ආපසු ගැනීම්;

(එ) ගිණුම දරන්නා තාවකාලිකව ශ්‍රී ලංකාවේ නේවාසික විජාතික සේවකයකු වන අවස්ථාවක දී සේවා යෝජකයා වැටුප් වැඩිපුර ගෙවීම් සහ එම සේවා යෝජකයා වෙත ගෙවිය යුතු වන වෙනත් එවැනි ගෙවීමකට අදාළව එම සේවා යෝජකයාගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට සිදු කරන හුවමාරු කිරීම;

(ඒ) මේ උපලේඛනයේ 1 වන ඡේදයේ 2 (ඔ) වන අනුඡේදය පරිදි, ශ්‍රී ලංකාවේ නේවාසික විජාතික සේවකයකුට වැඩිපුර ගෙවීමක් සිදු කර ඇති අවස්ථාවක දී සේවා යෝජකයාගේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම්වලට සිදුකරන හුවමාරු කිරීම්;

(ඔ) මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධානය මගින් එම ගනුදෙනු සඳහා අවසර ලබා දී ඇති තාක් දුරට, යම් ගනුදෙනු හෝ ගනුදෙනු වර්ග සම්බන්ධයෙන් නේවාසිකයන්ට විදේශ විනිමයෙන් කරනු ලබන ගෙවීම්;

(ඕ) මහ බැංකුව විසින් කලින් කලට පවත්වාගෙන යාමට අවසර දෙනු ලැබිය හැකි මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධාන මගින් එම ගනුදෙනුවලට හෝ හුවමාරු කිරීම්වලට අවසර ලබා දී තිබෙන ප්‍රමාණයට, වෙනත් යම් වර්ගයක ගිණුම්වලට සිදු කරන ගනුදෙනු හෝ හුවමාරු කිරීම්.

2. ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (Business Foreign Currency Accounts - BFCAs)

(1) ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීම සඳහා සුදුසුකම් ලත් තැනැත්තන්

(අ) ශ්‍රී ලංකාවේ සිටින, හෝ ශ්‍රී ලංකාවෙහි නේවාසික විදේශීය විනිමය උපයන පහත දැක්වෙන තැනැත්තන්;

(i) ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයකු;

(ii) හිමිකරු හෝ හවුල්කරුවන්ගෙන් බහුතරයක් ශ්‍රී ලංකාවේ නේවාසිකයන් වන අවස්ථාවක දී ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද තනි ව්‍යාපාරයක් හෝ හවුල් ව්‍යාපාරයක් (හවුල්කරුවන් දෙදෙනෙක් සහිත හවුල් ව්‍යාපාරයක් වන අවස්ථාවක දී අවම වශයෙන් එක් හවුල්කරුවකුවත් ශ්‍රී ලංකාවෙහි නේවාසිකයකු විය යුතු ය.);

(iii) ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක්;

(iv) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ විදේශීය සමාගමක් වශයෙන් ලියාපදිංචි කරනු ලැබූ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගමක්;

(v) අදාළ රේඛීය අමාත්‍යාංශය හෝ අදාළ අධිකාරියේ ලේකම්වරයාගේ නිර්දේශ සහිත රාජ්‍ය ආයතනයක්;

(vi) වලංගු බලපත්‍රයක් සහිත හෝ පිළිවෙළින් වෙළඳ නැව් කටයුතු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලැබූ බලය පවරන ලද ලිපියක් සහිත විදේශීය නැව් සේවාවක් හෝ ගුවන් සේවාවක් (විදේශ ප්‍රධානියා) වෙනුවෙන් ශ්‍රී ලංකාවේ නැව් නියෝජිතයකු හෝ සාමාන්‍ය අලවි නියෝජිතයකු වශයෙන් ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලය පවරන ලද තැනැත්තකු;

(ආ) බලයලත් වෙළෙන්දා හෝ පරිසීමිත වෙළෙන්දා සමග ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් පවත්වාගෙන යනු ලැබූ මියගිය පුද්ගලයකුගේ බූදලය අද්මිනිස්ත්‍රාසිකර අවසන් වන තෙක් එම මියගිය තැනැත්තාගේ බූදලයේ අද්මිනිස්ත්‍රාසිකරු හෝ පොල්මංකරු;

(ඇ) බලයලත් වෙළෙන්දා හෝ පරිසීමිත වෙළෙන්දා සමග ව්‍යාපාරික විදේශීය ව්‍යාවහාර මුදල් ගිණුමක් පවත්වා ගෙන යනු ලැබූ සමාගමක නමින්, එහි ක්‍රියා පටිපාටීන් අවසන් වන තෙක් ලැබුම්කරු හෝ ඈවරකරු.

(2) ව්‍යාපාරික විදේශීය ව්‍යවහාර මුදල් ගිණුමක් විවෘත කිරීම හා පවත්වාගෙන යාම සඳහා රාජ්‍ය නොවන සංවිධානයකට අවසර ලබා නොදිය යුතු ය.

(3) අවසරලත් බැර කිරීම්-

(අ) භාණ්ඩ හා සේවා අපනයනවලට, ව්‍යාපාර කේන්ද්‍ර වෙළඳාමට, ගිණුම් හිමියා විසින් සිදු කරන ලද විදේශ ව්‍යාපෘතිවලට, ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කළ ආයෝජනවලට සහ ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසික තැනැත්තකුට දේශීය වශයෙන් සපයන ලද භාණ්ඩවලට අදාළව බැංකු පද්ධතිය මාර්ගයෙන් විදේශයන්ගෙන් විදේශ විනිමයෙන් ලද ප්‍රේෂණ;

(ආ) යම් විදේශ සේවායෝජකයකුට සේවා සපයනු ලබන ශ්‍රී ලාංකිකයන්ගේ වේතන සහ /හෝ ඉපයීම් ගෙවීම සඳහා ගිණුම්හිමියා විසින් සැලැස්මක් සකස් කරගෙන ඇත්තේ යම් විදේශ සේවායෝජකයකු සමග ද එම සේවායෝජකයාගෙන් බැංකු පද්ධතිය මාර්ගයෙන් විදේශයෙන් ලද ප්‍රේෂණ;

(ඇ) ශ්‍රී ලංකාවේ සිටින ගිණුම් හිමියකු විසින්, ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසික තැනැත්තකු වෙත එම තැනැත්තා විසින් සපයන ලද භාණ්ඩ හා සේවාවලට අදාළව, පිළිගත් සංචාරක චෙක්පත්, බැංකු අණකර හෝ ව්‍යවහාර මුදල් නෝට්ටු ආකාරයෙන් වන විදේශ ව්‍යවහාර මුදල්;

(ඇ) ගිණුම් හිමියා ශ්‍රී ලංකාවේ සිටින නැව් නියෝජිතයකු හෝ සාමාන්‍ය අලෙවි නියෝජිතයකු වන විටදී, අදාළ විදේශ ප්‍රධානියාගෙන් හෝ අදාළ නියෝජිත ගිවිසුමේ කාර්ය සඳහා විදේශ ප්‍රධානියා වෙනුවෙන් නම් කරනු ලැබූ තුන්වන පාර්ශවයකින් බැංකු පද්ධතිය මාර්ගයෙන් විදේශ විනිමයෙන් ලද ප්‍රේෂණ;

(ඉ) විදේශ ප්‍රධානියා වෙනුවෙන් ශ්‍රී ලංකාවෙහි සිටින නැව් නියෝජිතයකු හෝ සාමාන්‍ය අලෙවි නියෝජිතයා විසින් ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට හෝ අක්වෙරළ බැංකු ඒකකයේ පවත්වාගෙන යනු ලබන ගිණුමකට සිදු කළ ප්‍රේෂණයක් මගින් විදේශ විනිමයෙන් ලබාගත් නැව් භාණ්ඩ ප්‍රවාහන කුලී;

(ඊ) ගිණුම්හිමියා විසින්, ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමෙන් පසු (එනම්, එම විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු එ.ජ.ඩො. 15000 ක් හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන අගයක් ඉක්මවන හෝ ඊට සමාන වන විටදී ශ්‍රී ලංකා රේගුවට ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමෙන් පසු හෝ එම විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු එ.ජ.ඩො 15,000 කට හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන අගයකට වඩා අඩු වන විට දී බලයලත් වෙළෙන්දාට හෝ පරිසීමිත වෙළෙන්දාට උචිත ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමෙන් පසු) ශ්‍රී ලංකාව තුළට රැගෙන එන ලද විදේශ ව්‍යවහාර මුදල්;

(උ) ගිණුම් හිමියා පිළිබඳ නොසලකමින්, ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලින් හෝ අක්වෙරළ බැංකු ඒකකයන්හි පවත්වාගෙන යන ගිණුම්වලින් සිදු කළ හුවමාරු;

(ඌ) එකී ගෙවීම් සහ ලැබීම් හෝ ගනුදෙනු වර්ග සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ විධානයක් මගින් අවසර ලබා දී ඇති තාක්දුරට, නේවාසිකයකුට සපයන ලද භාණ්ඩ හෝ සේවා සඳහා ප්‍රතිෂ්ඨාවක් වන්නා වූ, ගිණුම්හිමියාගේ නමට විදේශ විනිමයෙන් ලද මුදල්;

(එ) ශ්‍රී ලංකා මහ බැංකුවේ පූර්ව අනුමතය ඇතිව, ගිණුම් හිමියා විසින් බලයලත් වෙළෙන්දකුගේ හෝ පරිසීමිත වෙළෙන්දකුගේ දේශීය බැංකු ඒකකයකින් හෝ අක්වෙරළ බැංකු ඒකකයකින් ලබා ගත් විදේශ විනිමය ණය හෝ අත්තිකාරම්වලින් උපයන ලද මුදල්;

(ඒ) ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමට හර කිරීමෙන් යම් විදේශ වත්කමක් අත්පත් කර ගෙන ඇති විට දී, ගිණුම් හිමියාගේ එකී විදේශ වත්කම විකිණීමෙන් ලද මුදල් හෝ ඉන් යම් කොටසක්;

(ඔ) ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමට හර කිරීමෙන් (හෝ මේ නියෝගය බලාත්මක වීමට පෙරාතුව ගිණුම්හිමියාගේ විදේශ විනිමය උපයන්නාගේ ගිණුමෙන්) මුල් හුවමාරුව සිදු කර ඇත්තේ නම්, ශ්‍රී ලංකාව තුළ සිදු කළ ආයෝජනවලින් විදේශ විනිමයෙන් උපචිත වන ප්‍රාග්ධනය, ප්‍රාග්ධන ලාභ සහ වෙනත් ලැබීම්;

(ඕ) මේ නියෝගය බලාත්මක වීමට පෙරාතුව ගිණුම් හිමියාගේ විදේශ විනිමය උපයන්නාගේ ගිණුමට හර කිරීමෙන් මුල් ආයෝජනය සිදු කර ඇත්තේ නම්, විදේශ ආයෝජනවලින් ප්‍රතිමුඛ ආයෝජන ගිණුමට ලද ප්‍රාග්ධනය සහ ප්‍රාග්ධන ලාභ;

(ක) ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමට හර කරමින් මේ උපලේඛනයේ 4(ඇ) සහ 4(ඈ) ඡේද අනුව ගිණුම් හිමියා විසින් ලබා ගන්නා ලද භාවිත නොකළ විදේශ ව්‍යවහාර මුදල්;

(ග) ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙන් එම ගිණුම් හිමියාගේ විදේශ සංචාරක කාඩ්පතට තැන්පත් කරන ලද ප්‍රමාණය දක්වා, එකී විදේශ සංචාරක කාඩ්පතෙහි ඉතිරිව පවතින භාවිත නොකළ ශේෂය;

(ච) සුදුසුකම්ලත් පාරිභෝගිකයන්ට සහ සම රක්ෂණකරුවන්ට නිකුත් කරන ලද විදේශ ව්‍යවහාරික මුදලින් අධිනාමික රක්ෂණ ඔප්පු මත ගිණුම් හිමියා විසින් ලද රක්ෂණ වාරික සහ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති රක්ෂණ සමාගම්වලට ප්‍රති රක්ෂණකරුවන්ගෙන් සහ ජාතික රක්ෂණ භාර අරමුදලෙන් ලැබෙන රක්ෂණ හිමිකම්;

(ජ) වැටුප් සහ වෙනත් යම් ප්‍රතිලාභ පමණ ඉක්මවා ගෙවීම් වන්නා වූ, ශ්‍රී ලංකාවේ නේවාසික විජාතික සේවකයකුගේ පුද්ගලික විදේශ ව්‍යවහාරික මුදල් ගිණුමෙන් සිදු කරනු ලබන මාරු කිරීම්;

(ට) ශ්‍රී ලංකා මහ බැංකුව මගින් කලින් කලට පවත්වාගෙන යාමට අවසර ලබා දිය හැකි වෙනත් යම් ගිණුම් වර්ගයකින්, මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධානයක් මගින් එකී ගනුදෙනු සඳහා අවසර ලබා දී ඇති තාක් දුරට, සිදු කරනු ලබන හුවමාරු කිරීම;

(ඩ) පනතේ 8(3) වන වගන්තිය ප්‍රකාරව ගිණුම් හිමියකුගෙන් ශ්‍රී ලංකාවෙන් පිටත දී උපචිත වන ප්‍රේෂණ;

(ණ) ගිණුමේ පවතින අරමුදල් මත විදේශ ව්‍යවහාර මුදලින් උපයාගත් පොළිය.

(4) අවසරලත් හර කිරීම්-

(අ) ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරන ලද යම් ප්‍රතිමුඛ ප්‍රේෂණ;

(ආ) ශ්‍රී ලංකාවේ දී ශ්‍රී ලංකා රුපියල්වලින් සිදු කරනු ලබන ගෙවීම්;

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධානයන් මගින් අවසර ලබා දෙන ලද සංචාරක කාර්ය සඳහා එ.ජ.ඩො. 10,000 ක් දක්වා (හෝ වෙනත් යම් විදේශ ව්‍යවහාර මුදලකින් වන ඊට සමාන අගයක්) විදේශ ව්‍යවහාර මුදලින් සිදු කරනු ලබන ආපසු ගැනීම්;

(ඈ) ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය මගින් ලබා ගන්නා ලද ස්ථිර කිරීම ඉදිරිපත් කිරීමෙන් පසු යම් අවස්ථාවක දී මැණික් සහ ස්වර්ණාභරණ වෙළෙන්දන් විසින් විදේශයන්හි දී කපා ඔප දැමූ හෝ රළු මැණික් ගල් සහ අමු ද්‍රව්‍ය මිළ දී ගැනීමේ කාර්යය සඳහා එ.ජ.ඩො. 50,000 ක් දක්වා (හෝ වෙනත් යම් විදේශ ව්‍යවහාර මුදලකින් වන ඊට සමාන අගයක්) විදේශ ව්‍යවහාර නෝට්ටු මගින් සිදු කරනු ලබන ආපසු ගැනීම්;

(ඉ) ගිණුම් හිමියා ශ්‍රී ලංකාවේ නැව් නියෝජිතයකු හෝ සාමාන්‍ය වෙළෙඳ නියෝජිතයකු වන අවස්ථාවක දී බලයලත් වෙළෙන්දකුට හෝ පරිසීමිත වෙළෙන්දාට පිළිගත හැකි හේතු සහිතව කරනු ලබන ඉල්ලීමක් මත, විදේශ ප්‍රධානයාගෙන් හෝ විදේශ ප්‍රධානයා වෙනුවෙන් නම් කරන ලද තුන්වන පාර්ශ්වයකගෙන් ලද ආමුඛ ප්‍රේෂණයන් සඳහා වූ හිලව්වක් වශයෙන් පාලකයා සඳහා වූ මුදලක් (Cash-to-Masters) වශයෙන් කැඳවීමක් වෙනුවෙන් එක් නැවක් සඳහා එ.ජ.ඩො. 50,000 (හෝ වෙනත් යම් විදේශ ව්‍යවහාර මුදලකින් වන ඊට සමාන අගයක්) දක්වා විදේශ ව්‍යවහාර නෝට්ටු මගින් සිදු කරනු ලබන ආපසු ගැනීම්;

(ඊ) ගිණුම් හිමියා ශ්‍රී ලංකාවේ නැව් නියෝජිතයකු හෝ සාමාන්‍ය විකුණුම් නියෝජිතයකු වන අවස්ථාවක දී රජයට ගෙවිය යුතු බදු මුදල් සහ අනුයෝජිත කොමිස් මුදල් ඇතුළු ශ්‍රී ලංකාවේ දී විදේශ ප්‍රධානියා සතු සියලු දේශීය වගකීම් සම්පූර්ණ කිරීම සඳහා ගිණුමෙහි ප්‍රමාණවත් අරමුදල් පැවති බවට ගිණුම්හිමියාගෙන් (එනම් නියෝජිතයා) ලිඛිත ස්ථිර කිරීමක් ලබා ගෙන ඇත්නම්, අතිරික්ත අරමුදල් විදේශ ප්‍රධානියාට ආපසු යැවීම;

(උ) ගිණුම්හිමියා නොතකා, ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ අක්වෙරළ බැංකු ඒකකයන්හි පවත්වාගෙන යන ගිණුම්වලට සිදු කරනු ලබන හුවමාරු කිරීම්;

(ඌ) එම ගිණුම් හිමියාගේම ප්‍රතිමුඛ ආයෝජන ගිණුමට හුවමාරු කිරීම්;

(එ) ගිණුම්හිමියා විසින් විදේශීය ණය දෙනු ලබන තැනැත්තකුගෙන් විදේශ ව්‍යවහාර මුදල් ණයක් ආපසු ගෙවීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයකුගෙන් ආමුඛ ආයෝජන ගිණුමකට හුවමාරු කිරීම;

(ඒ) විදේශ සංචාරක කාඩ්පතක් ප්‍රතිපූර්ණය කිරීම සඳහා අරමුදල් හුවමාරු කිරීම්;

(ඔ) ණය සේවා වියදම් සහ ගිණුම් හිමියා විසින් බලයලත් වෙළෙන්දන්ගෙන් හෝ පරිසීමිත වෙළෙන්දන්ගෙන් ලබාගෙන ඇති විදේශ ව්‍යවහාර මුදල් ණය ආපසු ගෙවීම;

(ඕ) ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක අරමුදල් භාවිත කරමින් ශ්‍රී ලංකාවේ දී විදේශ ව්‍යවහාර මුදලින් සිදු කිරීමට අවසර ලබා දී ඇති යම් ආයෝජනයක් සම්බන්ධයෙන් වන හුවමාරු කිරීම්;

(ක) විදේශ ව්‍යවහාර මුදලින් අධිනාමික ප්‍රතිපත්ති සම්බන්ධයෙන් සුදුසුකම්ලත් පාරිභෝගිකයන්ට සහ සමරක්ෂණකරුවන්ට හිමිකම් ගෙවීම, දේශීය හෝ විදේශීය ප්‍රති-රක්ෂණකරුවන්ට සහ ජාතික රක්ෂණ භාර අරමුදලට වාරික ගෙවීම සහ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ලියාපදිංචි රක්ෂණ සමාගම් විසින් තැරැව් ගාස්තු ගෙවීම්;

(ග) මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධාන මගින් අවසර ලබා දී ඇති තාක් දුරට, ගනුදෙනු හෝ ගනුදෙනු වර්ගයක් සම්බන්ධයෙන් නේවාසිකයන්ට විදේශීය ව්‍යවහාර මුදලින් කරන ගෙවීම්;

(ච) මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධාන මගින් යම් ගනුදෙනු හෝ හුවමාරු කිරීම් සඳහා අවසර ලබා දී ඇති තාක් දුරට ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, කලින් කලට පවත්වාගෙන යාමට අවසර ලබා දිය හැකි වෙනත් යම් ගිණුම් වර්ගයකට සිදු කරන ගණුදෙනු හෝ හුවමාරු කිරීම්.

(5) කිසිදු අවස්ථානුගත කරුණක් යටතේ ශ්‍රී ලංකා රුපියල් විදේශ ව්‍යවහාර මුදලකට පරිවර්තනය කරනු ලැබීම සහ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට බැර කරනු ලැබීම සිදු නොකළ යුතු ය.

3. මේ උපලේඛනයේ කාර්ය සඳහා-

"ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය" යන්නෙන් 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ පනත යටතේ පිහිටුවන ලද ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය අදහස් වේ;

"ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය" යන්නෙන් 2002 අංක 34 දරන සිවිල් ගුවන් සේවා අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය අදහස් වේ;

"වෙළෙඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන් 1971 අංක 52 දරන වෙළෙඳ නැව් පනත යටතේ පත් කරන ලද වෙළෙඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ;

"ජාතික රක්ෂණ භාර අරමුදල" යන්නෙන් 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනත යටතේ පිහිටුවන ලද ජාතික රක්ෂණ භාර අරමුදල අදහස් වේ.

එල්. ඩී. බී 10/2017

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත**

**8 වන වගන්තිය යටතේ වූ නියමය**

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 8 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මා විසින්, මේ නියමය මගින්, ශ්‍රී ලංකාවෙහි සිටින හෝ නේවාසික තැනැත්තකු විසින් -

(අ) යම් විදේශ ව්‍යවහාර මුදල් හෝ ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීම හෝ ශ්‍රී ලංකාව තුළට ආනයනය කිරීම;

(ආ) ශ්‍රී ලංකාව තුළ, විදේශ විනිමය තම සන්තකයේ හෝ බැංකු ගිණුමක තබා ගැනීම, සිදු කිරීමේ දී යටත් විය යුතු කාර්ය, සීමාවන්, නියමයන් සහ කොන්දේසි වන මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාර්ය, සීමාවන්, නියමයන් සහ කොන්දේසි මෙයින් නියම කරනු ලැබේ.

2017 අංක 12 දරන විදේශ විනිමය පනත මගින් ඉවත් කරන ලද විනිමය පාලන පනත යටතේ සාදන ලද සහ මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති නියමයන් මෙයින් අවලංගු කරනු ලැබේ.

රනිල් වික්‍රමසිංහ,
ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය.

2017 නොවැම්බර් මස 17

කොළඹ දී ය.

**I වන උපලේඛනය**

**I වන කොටස**

විදේශ ව්‍යවහාර මුදල් හෝ ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් ආනයනය කිරීම සහ අපනයනය කිරීම සම්බන්ධයෙන් වන කාර්ය, සීමාවන්, නියමයන් සහ කොන්දේසි.

1. (1) ශ්‍රී ලංකාවෙන් පිටතට යන්නා වූ හෝ ශ්‍රී ලංකාවට පැමිණෙන්නා වූ යම් තැනැත්තකු තමන් විසින් රැගෙන යනු ලබන විදේශ විනිමයේ මුළු අගය එක්සත් ජනපද ඩොලර් 15,000 ක් හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන අගයක් ඉක්මවන්නේ නම්, පිළිවෙලින්, පිටත්වන හෝ පැමිණෙන තොටුපොළෙහි දී රේගු දෙපාර්තමේන්තුව වෙත ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට යටත්ව, එම තැනැත්තා විසින් නීත්‍යානුකූලව අත්පත් කරගත් ව්‍යවහාර මුදල් නෝට්ටු, බැංකු අණකර, චෙක්පත්, සංචාරක කාඩ්පත් ආදී ආකාරයෙන් වන විදේශ විනිමය ඕනෑම ප්‍රමාණයක් එම තැනැත්තා විසින් රැගෙන යනු ලැබිය හැකි ය.

(2) එසේ වුව ද, ශ්‍රී ලංකාවට පැමිණෙන තැනැත්තෙකු විසින් එක්සත් ජනපද ඩොලර් 10,000 ක් හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන අගයක් ඉක්මවන්නා වූ විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු ආපසු රැගෙන යාමට අදහස් කරනු ලබන අවස්ථාවක දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටතට යන තැනැත්තකු විසින් එක්සත් ජනපද ඩොලර් 10,000 ක් හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන අගයක් ඉක්මවන්නා වූ විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු රැගෙන යනු ලබන අවස්ථාවක දී එම තැනැත්තා විසින් රේගු දෙපාර්තමේන්තුව වෙත ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම අවශ්‍ය වන්නේ ය.

2. ශ්‍රී ලංකාව තුළ සිටින හෝ නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් රුපියල් 20,000ක් දක්වා පිළිවෙලින් ශ්‍රී ලංකාවෙන් පිටතට රැගෙන යනු හෝ ශ්‍රී ලංකාව තුළට රැගෙන එනු ලැබිය හැකි ය.

3. යම් බලයලත් වෙළෙන්දකු විසින් සිය ව්‍යාපාරය සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාමේ දී හෝ ඒ සඳහා සහ සිය බලය ලබා දීමේ නියමයන් තුළ කටයුතු කිරීමේ දී අත්පත් කරගත් විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීම හෝ ශ්‍රී ලංකාව තුළට ආනයනය කිරීම කළ හැකි ය.

4. මේ කොටසේ කාර්ය සඳහා-

"බලයලත් වෙළෙන්දා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය.

**II වන කොටස**

**විදේශ විනිමය සන්තකයේ තබා ගැනීම සම්බන්ධයෙන් වන කාර්ය, සීමාවන්, නියමයන් සහ කොන්දේසි**

1. (1) ශ්‍රී ලංකාවෙහි සිටින හෝ නේවාසික යම් තැනැත්තකු විසින් එක්සත් ජනපද ඩොලර් (USD) 10,000ක් හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන අගයක් දක්වා විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු වශයෙන් වන විදේශ ව්‍යවහාර මුදල්:

(අ) එම තැනැත්තාගේ විදේශ සංචාර සඳහා එම තැනැත්තා විසින් බලයලත් වෙළෙන්දකුගෙන් හෝ පරිසීමිත වෙළෙන්දෙකුගෙන් මිල දී ගනු ලැබ, ශ්‍රී ලංකාවට නැවත පැමිණීමේ දී භාවිත නොකළ ව්‍යවහාර මුදල් ලෙස ආපසු ගෙන එනු ලබන විදේශ ව්‍යවහාර මුදල් ; හෝ

(ආ) එම තැනැත්තා විසින් ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසික තැනැත්තකු වෙත විදේශයන්හි ලබාදෙන ලද සේවාව හෝ සපයන ලද භාණ්ඩ සඳහා වන ගෙවීම් ලෙස හෝ වෙනත් යම් නීත්‍යානුකූල මූලාශ්‍රයකින් එම තැනැත්තා ලද විදේශ ව්‍යවහාර මුදල් ; හෝ

(ඇ) සංචාරය කිරීමේ අරමුණ වෙනුවෙන් එම තැනැත්තා විසින් සිය පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලින් හෝ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලින් ආපසු ලබා ගත් විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු,

වන්නේ නම්, මෙහි 2 වන ඡේදයේ සඳහන් කාල සීමාව පිළිබඳ සීමාකිරීම් නොසලකා ඕනෑම කාල සීමාවක් දක්වා සිය සන්තකයේ රඳවා ගනු ලැබිය හැකි ය.

(2) (අ) තීරුබදු සහන යටතේ ශ්‍රී ලංකාවේ තොටුපළවලින් ශ්‍රී ලංකාවට පැමිණෙන හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරට යන මගීන් වෙත, නේවාසික තත්ත්වය නොසලකමින් භාණ්ඩ හා සේවා සැපයීම සඳහා අවසරලත් ව්‍යාපාරයක් පවත්වා ගෙනයනු ලබන ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසික තැනැත්තකුට හෝ ශ්‍රී ලංකාවෙහි සිටින හෝ නේවාසික තැනැත්තකුට යම් තැනැත්තකු විසින් සපයන ලද භාණ්ඩ හා සේවා සඳහා භාර ගත් විදේශ ව්‍යවහාර මුදල් එම තැනැත්තා විසින් සිය සන්තකයේ රඳවා තබා ගනු ලැබිය හැකි ය.

(ආ) එම තැනැත්තා විසින් එසේ භාරගත් විදේශ ව්‍යවහාර මුදල් ඒ පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කිරීමෙන් පසු එම විදේශ ව්‍යවහාර මුදල් භාර ගත් තැනැත්තාගේ නමට පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක තැන්පත් කිරීමෙන් හෝ බලයලත් වෙළෙන්දෙකුට හෝ පරිසීමිත වෙළෙන්දෙකුට විකිණීමෙන් තොරව, භාරගත් දිනයේ සිට දින 7 ක් ඉක්මවන කාලසීමාවක් සඳහා රඳවා තබා නොගත යුතු ය.

(3) ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසික යම් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටින විට දී අත්පත් කරගත් හෝ බලයලත් වෙළෙන්දන් හෝ පරිසීමිත වෙළෙන්දන් සමග පවත්වාගෙන යනු ලැබූ විදේශ විනිමය ගිණුම් මගින් අත්පත් කර ගත්තේ විදේශ ව්‍යවහාර මුදල් වන්නේ නම් එම විදේශ ව්‍යවහාර මුදල් එම තැනැත්තා විසින් සීමාවකින් තොරව ශ්‍රී ලංකාව තුළ සිය සන්තකයේ රඳවා තබා ගනු ලැබිය හැකි ය.

2. විදේශ විනිමය රඳවා තබා ගැනීමට අදාළ කාල සීමාව පහත සඳහන් පරිදි විය යුතු ය :-

(1) අදාළ තැනැත්තා විසින් බලයලත් වෙළෙන්දෙකු හෝ පරිසීමිත වෙළෙන්දෙකු වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කාර්යය සඳහා එම බලයලත් වෙළෙන්දාගෙන් හෝ පරිසීමිත වෙළෙන්දාගෙන් ලබාගත් විදේශ ව්‍යවහාර මුදල් එකී කාර්ය සඳහා භාවිත නොකරන යම් තැනැත්තකු විසින් එකී විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීමෙන් තොරව, එම විදේශ ව්‍යවහාර මුදල් ලද දිනයේ සිට දින අනූවක් (90) ඉක්මවන කාල සීමාවක් දක්වා රඳවා තබා නොගත යුතු ය.

(2) (අ) අදාළ තැනැත්තා විසින් බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කාර්යය සඳහා එම බලයලත් වෙළෙන්දාගෙන් හෝ පරිසීමිත වෙළෙන්දාගෙන් විදේශ ව්‍යවහාර මුදල් ලබාගෙන ඉන්පසු එකී විදේශ විනිමය හෝ ඉන් කොටසක් ශ්‍රී ලංකාවට නැවත රැගෙන එනු ලබන යම් තැනැත්තකු විසින් එකී විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීමෙන් තොරව එකී විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකාවට නැවත රැගෙන එන ලද දිනයේ සිට දින අනූවක් (90) ඉක්මවන කාල සීමාවක් සඳහා රඳවා තබා නොගත යුතු ය.

(ආ) වුව ද, සංචාරය කිරීමේ අරමුණ සඳහා 1 වන ඡේදයේ (1) (අ) ඡේදය යටතේ එක්සත් ජනපද ඩොලර් 10,000ක අගයක් දක්වා හෝ ඒ හා සමාන අගයකින් යුත් වෙනත් විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු ලබා ගත් තැනැත්තෙකුට, එම විදේශ ව්‍යවහාර මුදල් බලයලත් වෙළෙන්දෙකු හෝ පරිසීමිත වෙළෙන්දෙකු සමග පවත්වාගෙන යනු ලබන විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක තැන්පත් කිරීම සඳහා අවසර ලබා දිය යුතු ය.

(3) රැකියාවක් සඳහා, වෘත්තීය කාර්යයක නිරත වීම සඳහා හෝ ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලංකාවෙන් පිටතට නික්ම ගොස් එකී රැකියාවෙන්, වෘත්තියෙන් හෝ ව්‍යාපාරයෙන් විදේශ ව්‍යවහාර මුදල් උපයාගෙන හෝ ලබාගෙන එම මුදල් ශ්‍රී ලංකාවට නැවත රැගෙන එනු ලබන යම් තැනැත්තකු විසින් එකී විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීමෙන් හෝ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධි විධානවලට අනුකූලව එම තැනැත්තා විසින් ආරම්භ කර සහ/හෝ පවත්වාගෙන යනු ලබන විදේශ විනිමය ගිණුමකට බැර කිරීමෙන් තොරව එම විදේශ ව්‍යවහාර මුදල් ශ්‍රී ලංකාවට නැවත රැගෙන එන ලද දිනයේ සිට දින අනූවක් (90) ඉක්මවන කාල සීමාවක් සඳහා රඳවා තබා ගැනීමට හිමිකම් නොලැබිය යුතු ය.

3. මේ කොටසේ කාර්යය සඳහා-

"බලයලත් වෙළෙන්දා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට ලබා දී ඇති අර්ථය තිබිය යුතු ය; සහ

"පරිසීමිත වෙළෙන්දා" යන්නෙන් 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 4 වන වගන්තියේ (2) වන උප වගන්තියේ (අ) ඡේදය යටතේ විදේශ විනිමය වෙළඳාම් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසර දී ඇති බලය ලත් වෙළෙන්දෙකු නොවන්නාවූ යම් තැනැත්තකු, තැනැත්තන් වර්ගයක් හෝ වර්ග අදහස් වේ.

**III වන උපලේඛනය**

| ගැසට් අංකය | නිකුත් කළ දිනය | අරමුණ |
|---|---|---|
| 1947/13 | 2015.12.29 | 2017 අංක 12 දරන විදේශ විනිමය පනත මගින් ඉවත් කරන ලද (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනතේ 17 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්ති යටතේ නියමය |
| 1947/15 | 2015.12.29 | 2017 අංක 12 දරන විදේශ විනිමය පනත මගින් ඉවත් කරන ලද (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනතේ 6අආ වගන්තිය සමග කියවිය යුතු 44 වන වගන්තිය යටතේ නියමය |
| 1686/50 | 2011.01.01 | 2017 අංක 12 දරන විදේශ විනිමය පනත මගින් ඉවත් කරන ලද (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනතේ 17 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්ති යටතේ නියමය |
| 1631/36 | 2009.12.11 | 2017 අංක 12 දරන විදේශ විනිමය පනත මගින් ඉවත් කරන ලද (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනතේ 17 වන වගන්තිය යටතේ නියමය |
| 1854/3 | 2014.03.17 | 2017 අංක 12 දරන විදේශ විනිමය පනත මගින් ඉවත් කරන ලද (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනතේ 17 වන වගන්තිය යටතේ නියමය |

එල්.ඩී.බී. 10/2017

## 2017 අංක 12 දරන විදේශ විනිමය පනත

## 31 වන වගන්තිය යටතේ වූ නියමය

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 31 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මා විසින්, මේ නියමය මගින්, එකී පනතේ කාර්ය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් තැනැත්තන්, ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් විය යුතු බවට තීරණය කරනු ලැබේ.

2017 අංක 12 දරන විදේශ විනිමය පනත මගින් ඉවත් කරන ලද විනිමය පාලන පනත යටතේ නිකුත් කරන ලද සහ 1972 අප්‍රේල් 21 දිනැති අංක 15007 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද විධාන මෙයින් අවලංගු කරනු ලැබේ.

රනිල් වික්‍රමසිංහ,
**ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය.**

2017 නොවැම්බර් මස 17 වැනි දින,

කොළඹ දී ය.

**උපලේඛනය**

1. පෙරාතුව වූ මාස 12 තුළ, සමස්තය දින 183ක් හෝ ඊට වැඩි කාල සීමාවක් සඳහා ශ්‍රී ලංකාව තුළ සිටියා වූ යම් ශ්‍රී ලාංකික පුරවැසියකු හෝ ශ්‍රී ලාංකික පුරවැසියකු හා විවාහ වී සිටින විදේශ රටක යම් පුරවැසියකු.
2. (අ) පෙරාතුව වූ මාස 12 තුළ, සමස්තය දින 182කට නොවැඩි වූ කාල සීමාවක්, නිවාඩුවක් සඳහා, අධ්‍යාපනය සඳහා, ව්‍යාපාර සඳහා, වෛද්‍ය ප්‍රතිකාර සඳහා හෝ ඒ හා සමාන වෙනත් යම් හේතුවක් මත තාවකාලිකව ශ්‍රී ලංකාවෙන් බැහැරව නික්ම ගොස් ඇති යම් ශ්‍රී ලාංකික පුරවැසියකු.

   (ආ) වෙනත් රටක් මගින් ප්‍රදානය කළ ශිෂ්‍ය වීසා බලපත්‍රයක් හෝ ඒ හා සමාන වීසා බලපත්‍රයක් මත ශ්‍රී ලංකාවෙන් බැහැරව නික්ම ගොස් ඇති යම් ශ්‍රී ලාංකික පුරවැසියකු.
3. (අ) ශ්‍රී ලංකාවෙන් බැහැර නේවාසික (නම් කරනු ලැබ ඇති නාමය හෝ පදවි නාමය කුමක් වුව ද එම නාමයෙන් හෝ පදවි නාමයෙන්) ශ්‍රී ලංකා රජයේ රාජ්‍ය තාන්ත්‍රික නියෝජිතයන්, කොන්සල්වරුන් හෝ වෙළඳ කොමසාරිස්වරුන්;

   (ආ) ඉහත 3 (අ) ඡේදයේ සඳහන් යම්තැනැත්තකුගේ කාර්ය මණ්ඩල සාමාජිකයකු වන්නා වූ ශ්‍රී ලාංකික පුරවැසියකු වන යම් තැනැත්තකු;

   (ඇ) ශ්‍රී ලංකාවෙන් බැහැර දී බඳවා ගනු ලැබූ තැනැත්තන් හැර, ශ්‍රී ලංකාවෙන් බැහැර සේවය කරනු ලබන, ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරනු ලැබූ රාජ්‍ය සංස්ථාවක, රාජ්‍ය ආයතනයක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක, බලපත්‍රලාභී බැංකුවක හෝ සමාගමක කාර්ය මණ්ඩල සාමාජිකයකු.

   (ඈ) ඉහත 3 (අ) සිට 3 (ඇ) දක්වා වන ඡේද යටතේ ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු ලෙස සලකනු ලබන යම් තැනැත්තකුගේ පවුලේ යම් සාමාජිකයකු;
4. ශ්‍රී ලංකාවේ නේවාසික හෝ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද අදාළ වීසා බලපත්‍රයක් යටතේ සේවා නියුක්තියේ යෙදුණු, එහෙත් වෙනත් රටවලට යන අතරමග සිටින මගීන් හෝ විනෝදය හෝ ව්‍යාපාර සඳහා රටේ සංචාරය කරනු ලබන සංචාරකයන් නොවන, විදේශ රටවල පුරවැසියන්.
5. හිමිකාරත්වය දරනු ලබන, පාලනය කරනු ලබන හෝ කළමනාකරණය කරනු ලබන තැනැත්තන්ගේ පුරවැසිභාවයේ තත්ත්වය නොසලකා ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරනු ලැබූ හෝ ලියාපදිංචි කරනු ලැබූ පහත සඳහන් ආයතන;

   (අ) ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත සමාගම්;

(ආ) ශ්‍රී ලංකාවෙන් බැහැරව සංස්ථාපිත කරනු ලැබූ බලපත්‍රලාභී බැංකුවල (විදේශ බැංකු) ශාඛා ඇතුළුව 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ විදේශ සමාගම්;

(ඇ) අක්වෙරළ සමාගම් ලෙස ලියාපදිංචි කරනු ලැබූ සමාගම්;

(ඈ) රාජ්‍ය නොවන සංවිධාන ඇතුළුව ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි කරනු ලැබූ සමාජ, සංගම් හෝ වෙනත් යම් සංවිධාන.

6. මියයෑම සිදු වූ අවස්ථාවේ දී, මියගිය තැනැත්තා හෝ ගිවිසුම ඇති කරගත් අවස්ථාවේ දී ගිවිසුම්කරු ඉහත 1 සිට 5 දක්වා වන ඡේද ප්‍රකාරව නේවාසිකයකු වූ අවස්ථාවක දී, හුදෙක්ම අදාළ තත්ත්වයෙහි කටයුතු කරනු ලබන විට දී, අන්තිම කැමති පත්‍ර, භාර හෝ ජීවත්වන්නන් අතර වන ගිවිසුම්හි වෙනත් රටක භාරකරුවන් සහ බූදලයන්හි අද්මිනිස්ත්‍රාසිකරුවන් හෝ අන්තිම කැමති පත්‍රයන්හි පොල්මෑකරුවන්

7. 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතේ අර්ථානුකූලව ශ්‍රී ලංකාවේ නැවක සේවය කළ කාල සීමාව තුළ දී, එසේ ශ්‍රී ලාංකික පුරවැසියන්

8. ඉහත 1 වන, 2 වන, 3 වන හෝ 7 වන ඡේදයන්හි කොන්දේසි සපුරා නොමැති ශ්‍රී ලාංකික පුරවැසියන් වන ශ්‍රී ලාංකික සම්භවයක් ඇති තැනැත්තන්, මේ පනත යටතේ නිකුත් කරන ලද නියෝග, නියමයන් සහ විධානයන්ට යටත්ව, පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් ආරම්භ කිරීමේ සහ පවත්වාගෙන යාමේ කාර්ය සඳහා පමණක් ශ්‍රී ලංකාවේ නේවාසිකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2046/8 - 2017 නොවැම්බර් මස 20 වැනි සඳුදා - 2017.11.20

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

**I වැනි කොටස : (I) වැනි ජෙදය – සාමාන්‍ය**

### ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

**විදේශ විනිමය පනත යටතේ දැන්වීම**

1953 අංක 24 දරන විනිමය පාලන පනත (ලංකා ව්‍යවස්ථාදායක ප්‍රඥප්ති සංග්‍රහයේ 423 වන අධිකාරය) යටතේ රජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ විනිමය පාලක විසින් ප්‍රසිද්ධ කරන ලද දැන්වීම් මෙයින් අවලංගු කරනු ලැබේ.

යූ. පී. අලවත්තගේ,
**අධ්‍යක්ෂ - විදේශ විනිමය**

2017 නොවැම්බර් මස 20 වැනි දින,
ශ්‍රී ලංකා මහ බැංකුව;
කොළඹ දී ය.

**2017 අංක 12 දරන විදේශ විනිමය පාලන පනත යටතේ වන 2017 අංක 01 දරන විධානයන්** 2017 නොවැම්බර් 20

## ජංගම ගිණුම් සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ (මින්මතු "පනත" ලෙස හඳුන්වනු ලබන) 9(1) වගන්තිය ප්‍රකාරව, එකී පනතේ 6 වන වගන්තිය යටතේ ජංගම ගනුදෙනු ක්‍රියාත්මක කිරීම සඳහා පහත කොන්දේසිවලට යටත්ව බලයලත් වෙළෙඳුන් හට අවසර ලබා දෙනු ලැබේ.

1. යම් බලයලත් වෙළෙන්දෙකු විසින්, පනතේ 4 වගන්තිය ප්‍රකාරව සිය අදාල අවසරපත්‍රයේ නිශ්චිතව සඳහන් කර ඇති ප්‍රමාණය දක්වා ප්‍රධානියෙකු ලෙස හෝ මැදිහත්කරුවෙකු ලෙස පනතේ 33 වන වගන්තියේ අර්ථ නිරූපණය කර ඇති පරිදි ජංගම ගනුදෙනු සඳහා විදේශ විනිමය වෙළඳාම් කළහැකිය.

2. ශ්‍රී ලංකාව තුළ සිටින හෝ ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකා රුපියල් විදේශ විනිමය වලට පරිවර්තනය කිරීම හෝ විදේශ විනිමය ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීම මගින් තමාගේ (තම කලත්‍රයා, දරුවන් හෝ දෙමාපියන් ද ඇතුළුව) ජංගම ගනුදෙනුවල නිරත විය හැකිය.

3. බලයලත් වෙළෙඳුන් විසින් පනතේ 6(3) වගන්තියේ සඳහන් කර ඇති පරිදි, ඉල්ලීම්වල සද්භාවය පිළිබඳ සෑහීමට පත්වීමෙන් හා සත්‍යාපනය කිරීමෙන් අනතුරුව, මෙම විධානයන්හි I වන උපලේඛනයේ දක්වා ඇති ජංගම ගනුදෙනු සඳහා විදේශ විනිමය නිකුත් කළ යුතුය. මෙම විධානයන්හි I වන උපලේඛනය යම් යම් ජංගම ගනුදෙනු වර්ග සඳහා නිදර්ශන ඉදිරිපත් කිරීමක් වන අතර, ජංගම ගිණුම් පිළිබඳ නිරවශේෂ (සියල්ල ඇතුළත්) ලැයිස්තුවක් නොවේ.

4. ගනුදෙනුවේ සද්භාවය තක්සේරු කිරීමේදී හා සත්‍යාපනය කිරීමේදී, ලේඛනගත සාක්ෂි හෝ ගනුදෙනුවේ ස්වභාවයට අදාළව ලබාගත හැකි වෙනත් යම් තොරතුරු සහ ප්‍රේෂණයේ ප්‍රතිලාභියා පිළිබඳව බලයලත් වෙළෙන්දන් විසින් සැලකිල්ලට ගත යුතුය.

5. ජංගම ගනුදෙනු සම්බන්ධයෙන් විදේශ විනිමය වෙළෙඳාම් කිරීමේදී අදාළ කරගත හැකි මාර්ගෝපදේශයන් මෙම විධානයන්හි උපලේඛන II හි දක්වනු ලැබේ. මෙම ගනුදෙනු මගින් මුදල් ගෙවීම් (මුදල් ගලායාම්) හා මුදල් ලැබීම් (මුදල් ගලාඒම) යන දෙකම ආවරණය කෙරෙන අතර, ඕනෑම ආකාරයේ ජංගම ගනුදෙනුවක් සඳහා වන ඕනෑම ආමුඛ ප්‍රේෂණයක් නිදහසේ සිදු කළහැක.

6. බලයලත් වෙළෙඳුන් විසින් සෑම ජංගම ගනුදෙනුවක්ම සිදු කරන ලද පදනමට අදාළ ඕනෑම තොරතුරක් හෝ ලේඛන, මහ බැංකුව විසින් නිවැරදි බව තහවුරු කර ගැනීම පිණිස, එම ගනුදෙනුව සිදු වූ දිනයේ සිට වසර හයක කාලසීමාවක් දක්වා රඳවා තබා ගත යුතුය.

7. යම් බලයලත් වෙළෙන්දෙකු විසින් පනතේ 6(5) වගන්තියට අනුකූල බවට යටත්ව පනතේ 6(4) වන වගන්තියේ සඳහන් කර ඇති හේතු සැළකිල්ලට ගෙන ජංගම ගනුදෙනුවක් සඳහා විදේශ විනිමය වෙළෙඳාම් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.

8. **ගනුදෙනු වාර්තා කිරීම**

8.1 2018 අප්‍රේල් 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා රුපියල් විදේශ විනිමය බවට පරිවර්තනය කිරීම හෝ විදේශ විනිමය ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම අවශ්‍ය වන්නා වූ අවසරලත් ගනුදෙනුවලට අදාළව විදේශ විනිමය මිලදී ගනු ලබන හා විකුණනු ලබන ගනුදෙනුකරුවන්ගෙන් පිළිවෙළින් ඇමුණුම I හා ඇමුණුම II හි දක්වා ඇති නව ආකෘතිවලට අනුව නිරවද්‍ය හා නිසි අයුරින් සම්පූර්ණ කරන ලද 1 ආකෘතිපත්‍රය (විදේශ විනිමය විකිණීම) හා 2 ආකෘතිපත්‍රය (විදේශ විනිමය මිලදී ගැනීම) බලයලත් වෙළෙඳුන් විසින් ලබාගත යුතුය. ඒ වන තෙක්, බලයලත් වෙළෙඳුන් විසින් මෙම විධානයන්හි පිළිවෙළින් ඇමුණුම III හා ඇමුණුම IV හි දී ඇති I ආකෘතිපත්‍රයේ හා II ආකෘතිපත්‍රයේ සඳහන් දැනට පවතින ආකෘතීන් භාවිතා කළ යුතුය.

8.2 බලයලත් වෙළෙඳුන් විසින් (ගනුදෙනුවල අගය පිළිබඳ නොසළකා) සියළු විදේශ විනිමය විකිණීම් සහ මිලදී ගැනීම් පිළිබඳ තොරතුරු දෛනිකව, විදේශ විනිමය ගනුදෙනු අධීක්ෂණ පද්ධතිය - FOREX Net (https://www.cbsl.lk/forexnet) හරහා විද්‍යුත් මාර්ගයෙන් විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙත දෛනික පදනම මත ඉදිරිපත් කළ යුතුය.

8.3 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවශ්‍ය යැයි සැළකෙන ඕනෑම විටකදී පරීක්ෂාවට ලක් කළ හැකිවන පරිදි බලයලත් වෙළෙඳුන් විසින් පාදක වූ ගනුදෙනුවල සද්භාවය සනාථ කිරීම සඳහා ඉහත 8.1 ඡේදය පරිදි ලබාගත් 1 ආකෘතිපත්‍රය හා 2 ආකෘතිපත්‍රය, අවශ්‍ය ලේඛනගත සාක්ෂි සමග ගනුදෙනුව සිදුවූ දින සිට අවම වශයෙන් වසර හයක් බැංකු/ශාඛා පරිශ්‍රය තුළ හෝ මධ්‍යගත සැකසුම් ඒකකයක් තුළ රඳවා තබා ගත යුතුය.

8.4 විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙත විද්‍යුත් මාර්ගයෙන් ඉදිරිපත් කළ 1 ආකෘතිපත්‍ර හා 2 ආකෘතිපත්‍රවල සඳහන් තොරතුරුවල නිරවද්‍යභාවය හා සම්පූර්ණත්වය සනාථ කිරීමට අදාළ තොරතුරු එහි අභ්‍යන්තර විගණනයන්හි, කාලානුරූපී සමාලෝචනයන්හි සහ අනුකූලතා වැඩසටහන්හි අන්තර්ගත කළයුතු අතර ඒ පිළිබඳ වන සාක්ෂි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පරීක්ෂාවට ලක් කිරීම පිණිස ක්ෂණිකව ලබාගත හැකි විය යුතුය.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව

2017 අංක 01 දරන විධානයන්හි 1 වන උපලේඛනය

**ජංගම ගනුදෙනු පිළිබඳ ප්‍රතියමාන ලැයිස්තුව**

**1. විදේශ වෙළෙඳාම, සේවාවන් සහ සාමාන්‍ය කෙටිකාලීන බැංකු සහ ණය පහසුකම් ඇතුළු අනෙකුත් ජංගම ව්‍යාපාර**

1.1 **විදේශ වෙළෙඳාම**

1.1.1 **ශ්‍රී ලංකාවට භාණ්ඩ ආනයනය කිරීම සහ ශ්‍රී ලංකාවෙන් භාණ්ඩ අපනයනය කිරීම**

1.1.1.1 චංචල භාණ්ඩ ඇතුළු සාමාන්‍ය වෙළෙඳ භාණ්ඩ

1.1.1.2 අළුත්වැඩියා කිරීම හෝ සැකසීම සඳහා භාණ්ඩ ආනයනය කිරීම හෝ අපනයනය කිරීම.

1.1.1.3 වරායන් තුළ බර වාහන මගින් ප්‍රසම්පාදනය කරනු ලබන ඉන්ධන, බඩුබාහිරාදිය, ගබඩා ද්‍රව්‍ය සහ සැපයුම් ද්‍රව්‍ය ආදී භාණ්ඩ

1.1.2 **අන්තරාල වෙළෙඳාම**

1.1.2.1 තෙවන රටකට ප්‍රතිඅපනයනය කරන තුරු ආනයනය කොට බන්ධිත ගුදමක ගබඩා කර තිබෙන භාණ්ඩ

1.1.2.2 ආනයනික භාණ්ඩ වෙනත් රටකට අපනයනය කිරීමට පෙර රේගු බන්ධිත ගුදමකදී හෝ බන්ධිත ප්‍රදේශයෙහි නැවත ඇසුරුම් කිරීම/නැවත ලේබල් කිරීම හෝ මද වශයෙන් සකස් කිරීම

1.1.2.3 භෞතිකව භාණ්ඩ ශ්‍රී ලංකාවට පැමිණීමකින් තොරව දෙවන රටක සිට තෙවන රටකට භාණ්ඩ ඍජුවම අපනයනය කිරීම

1.1.2.4 භාණ්ඩ, බන්ධිත ගුදමක් තුළට නොගෙන ශ්‍රී ලංකා වරායක් තුළදී එක් නැවකින් හෝ ගුවන් යානයකින් වෙනත් නැවකට හෝ ගුවන් යානයකට මාරු කිරීම

1.2 **සේවාවන්ද ඇතුළු අනෙකුත් ජංගම ව්‍යාපාර**

1.2.1 සකස් කිරීම, එකලස් කිරීම, ලේබල් කිරීම හා ඇසුරුම් කිරීම ඇතුළු වෙනත් පුද්ගලයන් විසින් භාවිතා කරනු ලබන භෞතික යෙදවුම්වල නිෂ්පාදන සේවා.

1.2.2 නැව්, ගුවන් යානා සහ වෙනත් ප්‍රවාහන උපකරණ ආදියෙහි අලුත්වැඩියාවන් සහ නඩත්තු කිරීම් ඇතුළු නඩත්තු සහ අළුත්වැඩියා සේවා.

1.2.3 මගීන් ප්‍රවාහනය, භාණ්ඩ එහා මෙහා ගෙනයාම (ප්‍රවාහන භාණ්ඩ) සම්බන්ධ සේවා සහ තැපැල්, කුරියර්, නැව් භාණ්ඩ හැසිරවීම හා ගබඩා කිරීමේ සේවා යනාදී ආශ්‍රිත සහායක සේවා ද ඇතුළු ප්‍රවාහන සේවා.

1.2.4 සංචාරක නියෝජිතයන්/සංචාර මෙහෙයවන්නන් හෝ වෙනත් සේවා සපයන්නන් හරහා සැලසුම් කරනු ලබන සංචාරක සේවාද ඇතුළුව ව්‍යාපාර, අධ්‍යාපන, සෞඛ්‍ය, නිවාඩු, වන්දනා, සම්මන්ත්‍රණ, ක්‍රීඩා, සමුළු, සංස්කෘතික ක්‍රියාකාරකම්, චාරිකා ආදිය හා සම්බන්ධ සංචාර.

1.2.5 නිර්මාණය, ප්‍රතිසංස්කරණය, අලුත්වැඩියාව, සැළසුම් නිර්මාණය, ස්ථාවර වත්කම්වලට අලුතින් කොටස් එකතු කිරීම් (ගොඩනැගිලි, ඉංජිනේරුමය ස්වභාවයේ ඉඩම් සංවර්ධනය ආදී ආකාරවලින්) ව්‍යාපෘති ගොඩනැංවීම සහ ස්ථාපනය කිරීම (මාර්ග, පාලම්, වේලි ආදී) බිම් සැකසීම සහ පින්තාරුකරණය, ජලනල සවි කිරීම, කඩා ඉවත් කිරීම හා ඉදිකිරීම් ව්‍යාපෘති කළමනාකරණය කිරීම වැනි විශේෂිත සේවා ආදිය ඇතුළත් ඉදි කිරීම් සේවා.

1.2.6 තැපැල්, කුරියර්, ගුවන් විදුලි සහ විදුලි සංදේශ සේවා ආදිය ඇතුළු සන්නිවේදන සේවා

1.2.7 රක්ෂණයට අදාල දේශීය රෙගුලාසිවලට යටත්ව නැව් භාණ්ඩ හෝ සමුද්‍රීය රක්ෂණය, ප්‍රතිරක්ෂණය සහ වෙනත් රක්ෂණ ඇතුළු රක්ෂණය හා සම්බන්ධ සේවා.

1.2.8 ගාස්තු, කොමිස් මුදල්, තැරැව්කාර ගාස්තු සාධ්‍යකරණය, ලියා හැරීමේ ගාස්තු හෝ ගෙවීම් නිශ්කාශන ගාස්තු, ණය ශ්‍රේණිගත කිරීමේ ගාස්තු, භාර ගාස්තු සහ වෙනත් අතරමැදි සේවා ගාස්තු යනාදිය ඇතුළත් මූල්‍ය සේවා.

1.2.9 විකාශන සහ සම්ප්‍රේෂණ සේවා, ව්‍යාපාරික ජාල සේවා, පරිගණක දෘඩාංග සහ මෘදුකාංග සේවා, පද්ධති නඩත්තුකරණය සහ අනෙකුත් සහායක සේවා (ස්ථාපනය කිරීම, අලුත්වැඩියාව, භාවිත කිරීමට අදාල බලපත්‍ර ආදිය), නිර්මාණකරණය සහ වැඩසටහන්කරණය, වගකීම්/බලපත්‍ර පිළිබඳ හිමිකම්, අලුත් කිරීමේ ගාස්තු සහ දත්ත සැකසීම් හෝ වෙබ් සත්කාරක සේවා යනාදිය ඇතුළ විදුලි සංදේශ, පරිගණක සහ තොරතුරු සේවා.

1.2.10 බලපත්‍ර ගාස්තු, වරලත් ව්‍යාපාරික ගාස්තු, කළමනාකරණ ගාස්තු, අවසන් කිරීමේ ගාස්තු, නිෂ්පාදන සහායක සේවා ගාස්තු සහ ඇතුළුවීමේ ගාස්තු යනාදිය ඇතුළත් පුරස්කාර සහ අනෙකුත් ව්‍යාපාර හා සම්බන්ධිත ගාස්තු.

1.2.11 පේටන්ට් බලපත්‍ර, කර්තෘ හිමිකම්, කාර්මික ක්‍රියාවලීන්, මෝස්තර, වෙළෙඳ රහස්, අනුග්‍රාහකත්වයන් සම්බන්ධයෙන් වන පරිපූර්ණ හිමිකම්, මාධ්‍ය බලපත්‍ර, කල්බදු කුලී සහ අනෙකුත් පරිවර්ත්‍ය ගිවිසුම් ආදී බුද්ධිමය දේපළ හිමිකම් භාවිතා කිරීමට අදාල ගාස්තු.

1.2.12 පර්යේෂණ හා සංවර්ධන සේවා, වෘත්තියමය හා කළමනාකරණ උපදේශන සේවා (නෛතික, ගණකාධිකරණ, කළමනාකරණ, උපදේශන, මහජන සම්බන්ධතා, ප්‍රචාරණය, වෙළෙඳපොල පර්යේෂණ සේවා ආදිය ඇතුළුව), තාක්ෂණික සේවා (ගෘහ නිර්මාණ, ඉංජිනේරු සේවා ආදිය ඇතුළුව), වෙළෙඳාම හා සම්බන්ධ සේවා [වෙළෙඳ නැව් සේවා (අන්තරාල) දේශීය නැව් සමාගම් විසින් ජාත්‍යන්තර මුහුදු තීරයන්හි කරනු ලබන යාත්‍රා මෙහෙයුම් කටයුතු (විදේශීය නාවුක පිරිස්වල වැටුප් බෙදා හැරීමද ඇතුළුව), ප්‍රතිපාදනයන් සම්පාදනය, අදාළ ව්‍යවස්ථාපිත ගෙවීම්, නැව්, ගුවන් යානා හා බහාලුම් ආදිය කුලියට ගැනීමට අදාළ ගෙවීම්] සහ අනෙකුත් ව්‍යාපාරික සේවා.

1.2.13 ශ්‍රව්‍ය දෘෂ්‍ය හා ඒ ආශ්‍රිත සේවා ඇතුළුව පුද්ගලික, සංස්කෘතික හා විනෝදාත්මක සේවා

1.2.14 සාමාජික ගාස්තු, ගෝලීය සමුළු/සම්මන්ත්‍රණ/පාඨමාලා සඳහා වන ලියාපදිංචිවීමේ ගාස්තු හා සහභාගිවීමේ ගාස්තු, විභාග ගාස්තු, ගෞරව දීමනා, සම්බන්ධීකරණ ගාස්තු, පොරොන්දු ගාස්තු, අන්තර්ජාතික ප්‍රකාශනයන් සඳහා අයකිරීම් යනාදිය ඇතුළත් ගාස්තු සහ අයකිරීම්.

1.2.15 තානාපති කාර්යාලවල වියදම්, වීසා ගාස්තු, කුසලතා ඇගයීම් ගාස්තු, වෛද්‍ය පරීක්ෂණ ගාස්තු සහ වීසා ලියාපදිංචි කිරීමේ ලේඛණ සැකසුම් ගාස්තු වැනි රජයන් අතර, ජාත්‍යන්තර හා කලාපීය සංවිධාන සහ රාජ්‍ය හා පුද්ගලික ආයතන අතර වන සියළුම සේවාද ඇතුළු අනෙකුත් සේවා.

1.2.16 පහත දෑ ඇතුළත් අනෙකුත් ජංගම ව්‍යාපාරික කටයුතු:

1.2.16.1 පාදක වූ ජංගම ගනුදෙනුවකට අදාළව ශ්‍රී ලංකාවෙන් පිටත වාසික පුද්ගලයන් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ වාසික පුද්ගලයන් විසින් හෝ ශ්‍රී ලංකාවේ වාසික පුද්ගලයන් වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් පිටත වාසික පුද්ගලයන් විසින් කල්තියා තබනු ලබන නැවත ගෙවනු ලබන තැන්පතු හෝ සුරැකුම්.

1.2.16.2 පාර්ශ්වයන් අතර වන පාදක වූ ජංගම ගනුදෙනුවක් වෙනුවෙන් ආමුඛ ප්‍රේෂණ ලෙස ලද මුදල් ව්‍යාපාරය, සේවා ගිවිසුම් හෝ කොන්ත්‍රාත් අවලංගු කිරීම හේතුවෙන්, ශ්‍රී ලංකාවෙන් පිටත වාසික පුද්ගලයන් හට නැවත ගෙවීම.

1.2.16.3 නේවාසික සමාගම් විසින් විදේශයන්හි කරගෙන යනු ලබන ව්‍යාපෘති හෝ කොන්ත්‍රාත්වලට අදාළ භාණ්ඩ මිලදී ගැනීම සඳහා (විදේශයන්ගෙන් මිලදී ගනු ලබන එම භාණ්ඩවලට අදාළ නැව්/ගුවන් ප්‍රවාහන ගාස්තු හා අනෙකුත් ප්‍රවාහන වියදම් ආදිය ද ඇතුළුව) කරනු ලබන ප්‍රේෂණ.

1.2.16.4 නේවාසික සේවා යෝජක සමාගම්/ආයතන වෙනුවෙන් ශ්‍රී ලංකාව තුළ කරගෙන යනු ලැබූ ව්‍යාපෘති/කොන්ත්‍රාත් සාර්ථකව නිම කිරීමෙන් පසුව රඳවාගත් මුදල් විදේශ කොන්ත්‍රාත්කරුවන් හට නිදහස් කිරීම.

1.2.16.5 නේවාසික ව්‍යාපෘති සමාගම්/ආයතන විසින් ශ්‍රී ලංකාව තුළ කරගෙන යනු ලබන ව්‍යාපෘති හෝ කොන්ත්‍රාත් වෙනුවෙන් විදේශීය පරිත්‍යාග කරුවන්ගෙන්/ හෝ නියෝජිත ආයතනවලින් ආමුඛ ප්‍රේෂණ ලෙස ලද මුදල් වලින් වියදම් නොකළ හෝ භාවිතා නොකළ යම් මුදලක් වේ නම්, එම අරමුදල් ප්‍රේෂණය කිරීම.

1.2.16.6 ශ්‍රී ලංකාවේ නැව්, ගුවන් සේවා නියෝජිත ආයතන සහ නැව් භාණ්ඩ ප්‍රවාහනය කරන්නන් විසින් භාණ්ඩ ප්‍රවාහන හා මාරු කිරීම් ගාස්තු ලෙස ශ්‍රී ලංකා රුපියල්වලින් එකතු කරන ලද මුදල් එම

සේවා සැපයුම්කරුවන් විසින් නියෝජිත ගිවිසුම් පවත්වාගෙන යනු ලබන අදාළ විදේශීය ප්‍රධානීන් හට ප්‍රේෂණය කිරීම.

1.2.16.7 ශ්‍රී ලංකාව තුළ පිහිටි වීසා සේවා/සැකසුම් මධ්‍යස්ථාන (තානාපති කාර්යාල නොවන) සහ අධ්‍යාපනික/පුහුණු ආයතන විසින් පිළිවෙලින් වීසා අයදුම්කරුවන්ගෙන් සහ දේශීය ශිෂ්‍යයන්ගෙන් වීසා ගාස්තු හා විභාග හෝ ලියාපදිංචිවීමේ ගාස්තු ලෙස ශ්‍රී ලංකා රුපියල්වලින් හෝ විදේශ ව්‍යවහාර මුදලින් එකතු කරන ලද අරමුදල් එම සේවා සැපයුම්කරුවන් විසින් ගිවිසුම් පවත්වාගෙන යනු ලබන විදේශීය ආයතන වෙත ප්‍රේෂණය කිරීම.

1.2.16.8 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදංචි වී ඇති විදේශීය සමාගමක් විසින්, (ශ්‍රී ලංකාව තුළ විදේශීය සමාගමේ මෙහෙයුම් කටයුතුවලට අදාළව දරන ලද වියදම් ප්‍රතිපූර්ණය කිරීමක් ලෙස) විදේශයන්හි පිහිටි මවු සමාගම වෙත කරනු ලබන පර්යේෂණ.

1.2.16.9 බහුජාතික සමාගමකට අනුබද්ධිත ශ්‍රී ලංකාවේ සමාගමක් විසින් (පාදක වූ ගනුදෙනුව ජංගම ගනුදෙනුවක් වන්නේ නම්) අන්තර් සමාගම් ගාස්තු ලෙස කරනු ලබන ප්‍රේෂණ.

1.2.16.10 ශිෂ්‍ය වීසා අයදුම් කරනු ලබන (ශිෂ්‍ය වීසා මූලික වශයෙන් අනුමත කර ඇති) ශ්‍රී ලංකාවේ නේවාසික ශිෂ්‍යයන්ගේ ජීවන වියදම් සපුරා ගැනීම උදෙසා කල්තබා අරමුදල් ප්‍රේෂණය කිරීම අවශ්‍ය යැයි විදේශීය රජයන් විසින් නියම කර ඇති අවස්ථාවකදී කරනු ලබන ප්‍රේෂණ.

1.3 **සාමාන්‍ය කෙටිකාලීන බැංකු සහ ණය පහසුකම්**

1.3.1 ණයවර ලිපි

ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය මගින් ණයවර ලිපි සඳහා සම්පාදනය කර ඇති ප්‍රතිපාදනයන් ( Uniform Custom Practice for Documentary Credits of International Chamber of Commerce) ප්‍රකාරව ණයවර ලිපි ස්ථාපනය කර ඇති අවස්ථාවකදී, ජාත්‍යන්තර වෙළෙඳ ගනුදෙනු පහසුකරලීම පිණිස බලයලත් වෙළෙඳුන් විසින් ණයවර ලිපි නිකුත් කිරීම, වලංගු කාලය දීර්ඝ කිරීම සහ වගන්ති සංශෝධනය කිරීම සිදු කළහැක.

1.3.2 විදේශීය සැපයුම්කරුවන් විසින් ප්‍රදානය කරන ණයපහසුකම් මත පොලී ගෙවීම්:

භාණ්ඩ ආනයනකරුවන් හට විදේශ සැපයුම්කරුවන් විසින් ප්‍රදානය කරන ණය පහසුකම් මත වන පොලිය (ගෙවීම් කොන්දේසි යටතේ ණය සීමාවක් සඳහන් වන්නේ නම්) එවකට පවත්නා ජාත්‍යන්තර පොළී අනුපාත නොඉක්මවන ලෙස හා ප්‍රදානය කරනලද ණය කාලසීමාව අවසානයේදී හෝ සත්‍ය වශයෙන්ම ගෙවා නිම කරන දිනයේදී (කවර හෝ මුලින් පැමිණෙන දිනයේ) බලයලත් වෙළෙඳුන් විසින් ප්‍රේෂණය කළහැක.

1.3.3 බැංකු ඇපකර හා පොරොත්තු ණයවර ලිපි:

බලයලත් වෙළෙඳුන් විසින්, ජංගම ගනුදෙනු සම්බන්ධයෙන් බැංකු ඇපකර හෝ පොරොත්තු ණයවර ලිපි නිකුත් කිරීම හෝ අළුත් කිරීම සහ එවැනි බැංකු ඇපකර හෝ පොරොත්තු ණයවර ලිපිවලට අදාළ හිමිකම් සඳහා ගෙවීම් කළහැක.

**2. ණය මත වන පොලී සහ අනෙකුත් ආයෝජනයන්ගෙන් ලැබෙන ශුද්ධ ආදායම්:**

2.1 ලාභාංශ, පොලී, බදු කුලී සහ ලාභ ඇතුළත් ආයෝජන ආදායම්.

2.1.1 රාජ්‍ය සුරැකුම්පත්, සෘජු සහ කළඹ ආයෝජන ආදියෙන් ලැබෙන ආදායමද ඇතුළු ආයෝජන ආදායම්

2.1.2 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ හෝ අවලංගු කරන ලද 1953 අංක 24 දරන විනිමය පාලන පනතේ ප්‍රතිපාදනයන් යටතේ ලබාගත් ණය පහසුකම් සම්බන්ධයෙන් වන ණය පොලී, පොරොන්දු ගාස්තු, පරිපාලන හා අනෙකුත් ගාස්තු හා අය කිරීම් සඳහා ගෙවීම් කිරීම.

2.1.3 පෙර වර්ෂයේ ලාභ හෝ නොබෙදූ ලාභවලින් ප්‍රකාශයට පත් කරන ලද ලාභාංශ, සමාගමේ සංචිතවලින් හෝ ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද මුදල් වලින් කෙරෙන මාරු කිරීම් ඇතුළත් නොවන පරිදි සමාගම්වල හෝ හවුල් ව්‍යාපාරවල පවත්නා වර්ෂයේ ලාභ සහ එම ඉපැයීම්වලින් ප්‍රකාශයට පත් කරන ලද ලාභාංශ.

**3. ණය ක්‍රමක්ෂය සහ සෘජු ආයෝජන ක්ෂයවීම් සඳහා කරන ගෙවීම්**

3.1 අවලංගු කරන ලද 1953 අංක 24 දරන විනිමය පාලන පනතේ හෝ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ප්‍රතිපාදනයන් යටතේ අනුමත කරන ලද ණය පහසුකම්වල වගන්ති සහ කොන්දේසි සමග ප්‍රාග්ධනය ආපසු ගෙවීම් සහ පොළී ගෙවීමේ ප්‍රමාණයන් හා කාලය අනුගත වන්නේ නම්, එම ණය පහසුකම් සම්බන්ධයෙන් කළයුතු ගෙවීම්.

3.2 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ ආයෝජනයන් සාමාන්‍ය පරිදි හෝ විශේෂයෙන් අනුමත කර ඇති අවස්ථාවකදී, සෘජු ආයෝජන ක්ෂයවීම් ලෙස කරනු ලබන සාධාරණ ගෙවීමක්

**4. පවුලේ ජීවන වියදම් සඳහා ප්‍රේෂණයන්**

4.1 වැටුප්, වේතන සහ විශ්‍රාම වැටුප්, සේවක අර්ථසාධක අරමුදල සඳහා වන දායකයන්, හිමිකම් නොපෑ හෝ ප්‍රතිපූර්ණය කෙරෙන ජීවන හා අනෙකුත් වියදම් ඇතුළු සේවා යෝජකයන් විසින් ප්‍රවාසික (තම රටෙන් බැහැරව සේවයේ යෙදෙන) සේවකයන් හට (ජාතිකත්වය නොසළකාහරිමින්) කරනු ලබන ගෙවීම්.

4.2 පෙර සිටි හෝ දැනට සිටින ප්‍රවාසික සේවකයන්ගේ සමුච්චිත වැටුප් සහ සේවක හෝ වෙනත් අදාළ ප්‍රතිලාභ ගෙවීම් හෝ ප්‍රතිපූර්ණයන් කිරීම් ලෙස විදේශයන්හි පවත්වාගෙන යනු ලබන ප්‍රවාසිකයාගේ ගිණුමට සෘජුවම හෝ නම් කරනලද තුන්වන පාර්ශ්වයක ගිණුම්වලට (එනම් අන්තර්ජාතික විශ්‍රාම අරමුදල් හෝ යෝජනාක්‍රම, මව් සමාගම් වැනි) අරමුදල් ප්‍රේෂණය කිරීම.

4.3 විදේශයන්හි ජීවත් වන පවුල් හෝ යැපෙන්නන්ගේ (දෙමාපියන්, කලත්‍රයා, ළමයි) නඩත්තුව වෙනුවෙන් අරමුදල් ප්‍රේෂණය කිරීම.

**5. විවිධ ජංගම ප්‍රේෂණයන්**

5.1 සහන සැළසීම අරමුණු කර ගනිමින් ආහාර, ඇඳුම් පැළඳුම් සහ අනෙකුත් පාරිභෝගික භාණ්ඩ, වෛද්‍ය සැපයුම් ආදී ප්‍රදානයන් හා සම්බන්ධ රාජ්‍ය සහ පෞද්ගලික ප්‍රේෂණයන්.

5.2 අනුකූල නොවීම හෝ උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් උසාවි හෝ වෙනත් රාජ්‍ය හෝ ආයතනික නියාමන අධිකාරීන් විසින් පනවනු ලැබූ දඩ, දණ්ඩන මුදල්, ගාස්තු හෝ හිමිකම් සහ පුද්ගලයන්ට සිදුවන තුවාල හෝ දේපළවලට සිදුවන හානි හෝ වෙනත් අලාභ (රක්ෂණ ප්‍රතිපත්තිවලින් ආවරණය නොවන) සම්බන්ධයෙන් වන හානි පූර්ණයන් ඇතුළු වන්දි ගෙවීම්, අනිවාර්ය ගෙවීම් හෝ අධිකරණයන්හිදී එකඟ වූ සමථ මුදල් ගෙවීම්.

2017 අංක 01 දරන විධානයන්හි II වන උපලේඛනය

**ජංගම ගනුදෙනු සඳහා විදේශ විනිමය වෙළඳාම පිළිබඳ මාර්ගෝපදේශය**

**(I) වෙළඳ ගෙවීම්**

**1.1 වෙළඳ භාණ්ඩ අපනයන**

**1.1.1 පොදු ප්‍රතිපත්තිය**

1.1.1.1 රටට විදේශ විනිමය ඉපැයීම් උත්පාදනය කරනු ලබන වෙළඳ භාණ්ඩ අපනයනය සඳහා කරනු ලබන ගෙවීම්වලට සීමා කිරීම්වලින් තොරව රජයේ වෙළෙඳ ප්‍රතිපත්තියට යටත්ව අවසර ලබාදී ඇත.

1.1.1.2 අපනයන ඉපැයීම්, අපනයනකරු විසින් බලයලත් වෙළෙන්දෙකු සමග විවෘත කොට පවත්වාගෙන යනු ලබන ඕනෑම ශ්‍රී ලංකා රුපියල් ගිණුමකට හෝ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට බැර කළ යුතුය.

**1.1.2 කොමිස් මුදල් හා හිමිකම් පෑම්**

1.1.2.1 අදාළ අපනයන ඉපැයීම් හෝ ආමුඛ ප්‍රේෂණ ලංකාවට ගෙන්වාගෙන ඇති අවස්ථාවකදී වෙළෙඳ භාණ්ඩ අපනයනය හෝ ශ්‍රී ලංකාවේ නේවාසිකයෙකු විසින් සුරක්ෂිත බවට තහවුරු කළ වෙළෙඳ ගනුදෙනු සම්බන්ධයෙන් පිටරට සිටින නියෝජිතයින් හට කොමිස් මුදල් ප්‍රේෂණය කිරීම.

1.1.2.2 අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාව වෙත ලැබී ඇති අවස්ථාවකදී අපනයනය කරන ලද භාණ්ඩවල ගුණාත්මක භාවයේ හා ප්‍රමාණයේ පවතින ඌණතා සම්බන්ධයෙන් විදේශීය ගැණුම්කරුවන් විසින් කරන හිමිකම් පෑම් මත කරනු ලබන ප්‍රේෂණයන්.

1.1.3 ආමුඛ පර්යේෂණ හරවා යැවීම හෝ අවලංගු කිරීම

අපනයන ඇණවුම් සම්පූර්ණ කර නොමැති අවස්ථාවකදී හෝ අතිරික්ත මුදලක් ලැබී ඇති අවස්ථාවකදී, වෙළෙඳ භාණ්ඩ අපනයනය වෙනුවෙන් ශ්‍රී ලංකාව වෙත ලැබුණු සහ ප්‍රේෂණය කරන්නා විසින් නැවත ඉල්ලා සිටින ලද ආමුඛ ප්‍රේෂණ බලයලත් වෙළෙඳුන් විසින් ආපසු හරවා යැවිය හැකිය.

**1.2 වෙළෙඳ භාණ්ඩ ආනයනය**

1.2.1 **පොදු ප්‍රතිපත්තිය** - භාණ්ඩ ආනයනය සඳහා වන ගෙවීම් සඳහා රජයේ වෙළෙඳ ප්‍රතිපත්තියට යටත්ව, සීමාකිරීම් වලින් තොරව අවසර ලබා දී ඇත.

1.2.2 නම් කරන ලද තෙවන පාර්ශවයන් වෙත කරනු ලබන ආනයන ගෙවීම් - ගැණුම්කරු හා විකුණුම්කරු අතර එකඟ වූ විකුණුම් ගිවිසුම්වලට අනුකූලව, වෙනත් විදේශීය සැපයුම් කරුවකු විසින් සපයනු ලැබූ භාණ්ඩ වෙනුවෙන්, භාණ්ඩ ආනයනකරුවන් විසින් කරනු ලබන ගෙවීම් සඳහා බලයලත් වෙළෙඳුන් විසින් විදේශයන්හි සිටින නම් කරන ලද තෙවන පාර්ශවයන් හට විදේශ විනිමය නිදහස් කළ යුතුය.

**1.3 අන්තරාළ වෙළෙඳාම**

**1.3.1 පොදු ප්‍රතිපත්තිය**

1.3.1.1 අන්තරාල වෙළෙඳාම යටතට ගැනෙන, ප්‍රති අපනයනය අරමුණු කරගෙන ආනයනය කරන ලද භාණ්ඩ සඳහා විද්‍යුත් මුදල් හුවමාරු කාඩ්පත් මගින් හැර බැංකු පද්ධතිය හරහා සිදු කරන ගෙවීම් රජයේ වෙළඳ ප්‍රතිපත්තියට යටත්ව නිදහස් කර ඇත.

1.3.1.2 අන්තරාල වෙළෙඳාම යටතේ භාණ්ඩ ආනයනය කිරීමට අදාල ගෙවීම්, ඊට අනුරූප ලැබීම් වලට වඩා අඩු විය යුතුය. වට්ටනාකම් එකතු කිරීමේ පිරිවැය, බැංකු ගාස්තු ඇතුළු අනෙකුත් දේශීය ගාස්තු හා ලාභ ආදිය ආවරණය කර ගැනීම පිණිස දේශීය වෙළෙන්දා හට ප්‍රමාණවත් ආන්තිකයක් තහවුරු වන පරිදි

**(2) සේවා ගෙවීම්**

2.1 **පොදු ප්‍රතිපත්තිය** - ජංගම ගණුදෙනු යටතට ගැනෙන සේවා සඳහා වන ගෙවීම් නිදහසේ කිරීමට අවසර ලබාදී ඇත.

2.2 **ආමුඛ ප්‍රේෂණ හරවා යැවීම හෝ අවලංගු කිරීම** - ශ්‍රී ලංකාවට එවන ලද ආමුඛ ප්‍රේෂණවලින් ප්‍රයෝජනයට නොගත් හා අතිරික්ත අරමුදල්, එවන්නා විසින් යළි කැඳවනු ලබන අවස්ථාවකදී, බලයලත් වෙළෙන්දන් විසින් හරවා යැවිය හැක.

**(3) පොදු**

3.1 **සංචාර අරමුණු සඳහා විදේශ විනිමය නිදහස් කිරීම** -

3.1.1. සංචාරක, ව්‍යාපාරික, පුහුණු, විදෙස් වෛද්‍ය ප්‍රතිකාර ආදී ඕනෑම අරමුණක් සඳහා විදෙස් ගතවන ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් හට, අදාළ තැනැත්තා, ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන අවස්ථාවකදී ගමන් බලපත්‍රය මත සිදු කරනු ලබන යෝග්‍ය සහතික කිරීමක් සමග, බලයලත් වෙළෙඳුන් විසින් විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු වලින් එ.ජ.ඩොලර් 10,000 (හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් ඊට සමාන ප්‍රමාණයක්) උපරිමයකට යටත්ව ගමන් වියදම් දීමනාවක් මුදාහළ යුතුය.

3.1.2 විදේශ ගමන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත් වන විටදී විදේශ ව්‍යවහාර මුදලින් ගමන් වියදම් දීමනාවක් ලැබීමට සුදුසුකම් ලත් තැනැත්තන් හට බලයලත් වෙළෙඳුන් විසින් විදේශ ගමන් කාඩ්පත් (Foreign Travel Cards - FTCs) නිකුත් කළහැකිය. පනත යටතේ නිකුත් කර ඇති විධානයන්ට අනුව, විදේශ සංචාර අරමුණු සඳහා විදේශ ව්‍යවහාර මුදල් නිකුත් කිරීමට අවසර ලබාදී ඇති ඕනෑම ගිණුමක් හර කිරීමෙන් විදෙස් සංචාරක කාඩ්පතක් නිකුත් කළහැකිය.

3.2 **ගෙවීම් කාඩ්පත්** - කාඩ්පත දරන්නාගේ, කාලත්‍රයාගේ දරුවන්ගේ සහ දෙමාපියන්ගේ වාණිජමය නොවන පුද්ගලික අරමුණු වෙනුවෙන් භාවිතය සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත වාසික පුද්ගලයන් හට විදේශ විනිමයෙන් ගෙවීම් කිරීම් පිණිස ශ්‍රී ලංකාව තුළ සිටින තැනැත්තන් හට බලයලත් වෙළෙඳුන් විසින් විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත් (Electronic Fund Transfer Cards) එනම්, ණය කාඩ්පත්, හර කාඩ්පත් හා වටිනාකම තැන්පත් කළ කාඩ්පත් නිකුත් කළහැක. විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත් නිකුත් කිරීම හා භාවිතා කිරීම ඒ සම්බන්ධයෙන් විශේෂයෙන් නිකුත් කර ඇති විධානයන්ට යටත්ව විය යුතුය.

3.3 **ඉදිරි විකුණුම් හා මිලදී ගැනීම්** - බලයලත් වෙළෙන්දන්, ඔවුන්ගේ පාරිභෝගිකයන් සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී ඔවුන් විසින් අව්‍යාජව කටයුතු කරන බවට සෑහීමට පත්වීම මත යම් පාදක ජංගම ගනුදෙනුවක් සම්බන්ධයෙන් ඇති වියහැකි විනිමය අවදානමෙන් ආවරණය කිරීම පිණිස එම බලයලත් වෙළෙන්දන් විසින් පාරිභෝගිකයන් සමග ඉදිරි ගිවිසුම්වලට එළඹිය හැක.

3.4 **වියදම් නොකළ රුපියල් ප්‍රතිපරිවර්තනය** බලයලත් වෙළෙඳුන් විසින් විදේශ ගමන් බලපත්‍ර හිමියන් විසින් වියදම් නොකළ යම් ශ්‍රී ලංකා රුපියල් ප්‍රමාණයක් මුදල් ලබාදීමේදී නිකුත් කරන ලද කුවිතාන්සි ඉදිරිපත් කිරීම මත බලයලත් වෙළෙඳුන් විසින් නැවත විදේශ විනිමය බවට ප්‍රතිපරිවර්තනය කරනු ලැබිය හැකිය.

2017 අංක 01 දරන විධානය සඳහා වූ ඇමුණුම 1

**බලයලත් වෙළෙන්දෙකු විසින් විදේශ විනිමය විකිණීම** — 1 ආකෘතිය

| | | | |
|---|---|---|---|
| ජා.හැ./වි.ගමන් බලපත්‍රය/ සමාගම් ලියාපදිංචි අංකය | | අනුක්‍රමික අංකය | |
| ආදායම් බදු ගොනු අංකය | | | |
| අයදුම්කරුගේ නම | | බැංකු කේතය | |
| | | අරමුණට අදාළ කේතය | |
| අයදුම්කරුගේ ලිපිනය | | ශාඛා කේතය | |
| | | උප අරමුණකට අදාළ කේතය | |
| | | රටේ කේතය | |
| | | මුදල් වර්ගයට අයත් කේතය | නිකුත් කළ විදේශ විනිමය ප්‍රමාණය |
| ගුවන් ප්‍රවේශපත් අංකය (සංචාරක අරමුණු පමණි) | | බැංකු අණකර | |
| ප්‍රතිලාභියාගේ නම | | | |
| ප්‍රතිලාභියාගේ ලිපිනය | | ටෙලිග්‍රාෆ් මගින් හුවමාරුව | |
| අරමුණ | | සංචාරක කාඩ්පත් | |
| අයදුම්කළ විදේශ විනිමය ප්‍රමාණය | ඇ.එ.ජ. ඩොලර් | | |
| | යූරෝ | වෙනත් (සඳහන් කරන්න) | |
| | ස්. පවුම් | | |
| | | ව්‍යවහාර මුදල් නිකුතුව | |
| මා විසින් සපයන ලද සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවට ප්‍රකාශ කරමි.<br>................ දිනය<br>................ අයදුම්කරුගේ අත්සන | | | |
| බැංකුවේ භාවිතය | ................ දිනය<br>................ ටෙලර්ගේ අත්සන<br>................ බලයලත් වෙළෙන්දගේ අත්සන මුද්‍රාව | සටහන් | |
| සටහන | අයදුම්කරු ශ්‍රී ලංකා රුපියල් විදේශ මුදල් බවට පරිවර්තනය කරනු ලබන තැනැත්තා විය යුතුය. උදා: ලෙස ව්‍යාපාරික සංචාර සඳහා සේවකයෙකු හට විදේශ විනිමය සපයනු ලබන සමාගමක් අයදුම්කරු විය යුතු අතර, සේවකයා ප්‍රතිලාභියා විය යුතුය. | | |

**2017 අංක 01 දරන විධානය සඳහා වූ ඇමුණුම II**

## බලයලත් වෙළෙන්දෙකු විසින් විදේශ විනිමය මිළ දී ගැනීම

**2** ආකෘතිය

| | | | |
|---|---|---|---|
| ජා.හැ./වි.ගමන් බලපත්‍රය/ සමාගම් ලියාපදිංචි අංකය | | අනුක්‍රමික අංකය | |
| ආදායම් බදු ගොනු අංකය | | | |
| අයදුම්කරුගේ නම | | බැංකු කේතය | අරමුණට අදාළ කේතය |
| අයදුම්කරුගේ ලිපිනය | | ශාඛා කේතය | උප අරමුණකට අදාළ කේතය |
| | | රටේ කේතය | මුදල් වර්ගයට අදාළ කේතය |
| | | | නිකුත් කළ ප්‍රමාණය |
| ප්‍රේෂණය කරන්නාගේ නම | | ශ්‍රී ලංකා මුදල් ප්‍රමාණය | |
| ප්‍රේෂණය කරන්නාගේ ලිපිනය | | | |
| අරමුණ | | | |
| භාරගත් විදේශ විනිමය ප්‍රමාණය | ඇ.එ.ජ. ඩොලර් | | |
| | යූරෝ | | |
| | ස්. පවුම් | | |
| | | | |
| මා විසින් සපයන ලද සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවට ප්‍රකාශ කරමි. | | | |
| ........ දිනය | ........ අයදුම්කරුගේ අත්සන | එකතුව | |
| බැංකුවේ භාවිතය | ........ දිනය ........ ටෙලර්ගේ අත්සන ........ බලයලත් වෙළෙන්දගේ අත්සන මුද්‍රාව | සටහන් | |
| සටහන | ප්‍රතිලාභියා විසින් පුද්ගලිකවම 2 ආකෘතිපත්‍රයෙහි අත්සන් කළ යුතුය. ගණුදෙනුකරුවෙකු වෙනුවෙන් බලයලත් වෙළෙන්දා විසින් ආමුඛ ප්‍රේෂණ මිලදී ගනු ලබන අවස්ථාවලදී සහ බැංකු පද්ධතිය හරහා ගිණුමකින් ගිණුමකට මුදල් මාරු කිරීමේදී බලයලත් වෙළෙන්දා විසින් අයදුම්පත්‍රය අත්සන් කළ යුතුය. | | |

**2017 අංක 01 දරන විධානය සඳහා වූ ඇමුණුම III**

## බලයලත් වෙළෙන්දෙකු විසින් විදේශ විනිමය විකිණීම

පෝරමය 1

| | | | | |
|---|---|---|---|---|
| ජා.හැ./වි.ගමන් බලපත්‍රය/ සමාගම් ලියාපදිංචි අංකය | | අනුක්‍රමික අංකය | | |
| ආදායම් බදු ගොනු අංකය | | | | |
| අයදුම්කරුගේ නම | | බැංකු කේතය | අරමුණට අදාළ කේතය | |
| අයදුම්කරුගේ නම | | ශාඛා කේතය | උප අරමුණකට අදාළ කේතය | |
| ගුවන් ප්‍රවේශපත් අංකය (සංචාරක අරමුණු පමණි) | | රටේ කේතය | මුදල් සංකේතය | නිකුත් කරන විදේශ විනිමය ප්‍රමාණය |
| අර්ථලාභියාගේ නම | | බැංකු අණකර | | |
| අර්ථලාභියාගේ ලිපිනය | | ටෙලිග්‍රාෆ් මගින් හුවමාරුව | | |
| අරමුණ | | සංචාරක කාඩ්පත් | | |
| අයදුම්කළ විදේශ විනිමය ප්‍රමාණය | ඇ.එ.ජ. ඩොලර් | | | |
| | යූරෝ | වෙනත් (සඳහන් කරන්න) | | |
| | ස්. පවුම් | | | |
| | | ව්‍යවහාර මුදල් නිකුතුව | | |
| මා විසින් සපයන ලද සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවට ප්‍රකාශ කරමි. | | | | |
| ........ දිනය | ........ අයදුම්කරුගේ අත්සන | | | |
| බැංකුවේ භාවිතයට පමණි | ........ දිනය ........ ටෙලර්ගේ අත්සන ........ බලයලත් වෙළෙන්දගේ අත්සන මුද්‍රාව | සටහන් | | |
| සටහන | ශ්‍රී ලංකා රුපියල් විදේශ විනිමය බවට පරිවර්තනය කරන පුද්ගලයා අයදුම්කරුම විය යුතුය. උදාහරණයක් ලෙස ව්‍යාපාරික ගමන් සඳහා සේවකයෙකුට විදේශ විනිමය ලබා දෙන සමාගමක්, අයදුම්කරු වන අතර සේවකයා අර්ථලාභියා විය යුතුය. | | | |

**2017 අංක 01 දරන විධානය සඳහා වූ ඇමුණුම IV**

**පෝරමය 2**

| | | | |
|---|---|---|---|
| ජා.හැ./වි.ගමන් බලපත්‍රය/ සමාගම් ලියාපදිංචි අංකය | | අනුක්‍රමික අංකය | |
| ආදායම් බදු ගොනු අංකය | | | |
| අයදුම්කරුගේ නම | | බැංකු කේතය | අරමුණෙහි සංකේතය |
| අයදුම්කරුගේ ලිපිනය | | ශාඛා කේතය | උප අරමුණෙහි සංකේතය |
| | | රටේ කේතය | මුදල් සංකේතය |
| | | නිකුත් කරන වටිනාකම | |
| ප්‍රේෂණය කරන්නාගේ නම | | රුපියල් වටිනාකම | |
| ප්‍රේෂණය කරන්නාගේ ලිපිනය | | | |
| අරමුණ | | | |
| අනුමත කළ විදේශ විනිමය වටිනාකම | ඇ.එ.ජ. ඩොලර් | | |
| | යූරෝ | | |
| | බ්‍රි. පවුම් | | |
| මා විසින් සපයන ලද සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවට ප්‍රකාශ කරමි.<br>............ දිනය ............ අයදුම්කරුගේ අත්සන | | එකතුව | |
| බැංකුවේ භාවිතය | ............ දිනය ............ ටෙලර්ගේ අත්සන ............ බලයලත් වෙළෙන්දගේ අත්සන මුද්‍රාව | සටහන් | |
| සටහන | ප්‍රතිලාභියා විසින් පුද්ගලිකවම 2 ආකෘතිපත්‍රයෙහි අත්සන් කළ යුතුය. ගණුදෙනුකරුවෙකු වෙනුවෙන් බලයලත් වෙළෙන්දා විසින් ආමුඛ ප්‍රේෂණ මිලදී ගනු ලබන අවස්ථාවලදී සහ බැංකු පද්ධතිය හරහා ගිණුමකින් ගිණුමකට මුදල් මාරු කිරීමේදී බලයලත් වෙළෙන්දා විසින් අයදුම්පත්‍රය අත්සන් කළ යුතුය. | | |

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2017 අංක 02 දරන විධානයන්** 2017 නොවැම්බර් 20

## විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත් සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 6 හා 7 වගන්ති සමග කියවෙන එකී පනතේ 9(1) හා 9(2) වගන්ති ප්‍රකාරව, ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන පුද්ගලයින් හට විදේශ විනිමය වලින් ගෙවීම් කිරීම සඳහා ශ්‍රී ලංකාව තුළ සිටින පුද්ගලයින් හට විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත් නිකුත් කිරීම සඳහා පහත නියමයන්ට යටත්ව බලයලත් වෙළෙඳුන් හට අවසර දෙනු ලැබේ.

2. ශ්‍රී ලංකාව තුළ සිටින පුද්ගලයෙකු හට (එනම් කාඩ්පත් හිමියා) නිකුත් කරන ලද විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත් පහත අරමුණු සඳහා භාවිතා වන බවට බලයලත් වෙළෙඳුන් විසින් තහවුරු කළ යුතුය.
   - (අ) වාණිජ අරමුණක් උදෙසා ශ්‍රී ලංකාවට භාණ්ඩ ආනයනය කිරීම වෙනුවෙන් කරන ගෙවීමක් සඳහා භාවිතා කිරීම හැර (පෞද්ගලික ස්වභාවයේ ජංගම ගනුදෙනුවක් සඳහා) ශ්‍රී ලංකාවෙන් පිටත වාසික පුද්ගලයෙකු හට කරනු ලබන ඕනෑම ගෙවීමක්.
   - (ආ) ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් හෝ පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට එරෙහිව විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පතක් නිකුත් කර ඇති අවස්ථාවකදී ශ්‍රී ලංකාවෙන් පිටත වාසික පුද්ගලයෙකු හට ඕනෑම අරමුණක් උදෙසා කරනු ලබන ඕනෑම ගෙවීමක්.
   - (ඇ) රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් හෝ ආමුඛ ආයෝජන ගිණුමකට එරෙහිව හරපතක් නිකුත් කර ඇති අවස්ථාවකදී ශ්‍රී ලංකාවෙන් පිටත වාසික පුද්ගලයෙකු හට ඕනෑම අරමුණක් සඳහා කරනු ලබන ඕනෑම ගෙවීමක්.

3. බලයලත් වෙළෙඳුන් විසින් කාඩ්පත් හිමියන්ගේ ගිණුම්වල බැරට පවතින මුදල්වලට එරෙහිව හරපත් නිකුත් කළ යුතුය.

4. "කාඩ්පත් හිමියා විගමනය වන්නේ නම් හෝ පිටරට සේවා නියුක්තියක් සඳහා ශ්‍රී ලංකාව හැර යන්නේ නම්, පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක (PFCA) හෝ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක (BFCA) බැරට පවත්නා මුදල් මත කාඩ්පත නිකුත් කර ඇති අවස්ථාවකදී හැර, එවන් පුද්ගලයෙකුට නිකුත් කර ඇති කාඩ්පත, නිකුත් කරන ලද බැංකුවට නැවත භාර දිය යුතුය" යන කොන්දේසියට යටත්ව හා ගෙවීමට ඇති ශේෂයන් ආමුඛ ප්‍රේෂණ වලින් හෝ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලින් කරනු ලබන මාරු කිරීම්වලින් ගෙවා පියවන්නේ ය යන පදනම මත බලයලත් වෙළෙඳුන් විසින් විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත් නිකුත් කළ යුතුය.

5. හරපතක් භාවිතයෙන් විදේශ ව්‍යවහාර මුදල් ආපසු ගැනීමක් හෝ ණය කාඩ්පතක් හරහා මුදල් අත්තිකාරමක් ලබා ගන්නා අවස්ථාවක එම මුදල් මෙම විධානයන්හි 2(අ) ඡේදය යටතේ අවසර දී ඇති ගනුදෙනු සඳහා භාවිතා කර ඇති බවට සාක්ෂි තමා සතුව තබා ගතයුතු බවට බලයලත් වෙළෙඳුන් විසින් කාඩ්පත් හිමියන්ව දැනුවත් කළ යුතුය.

6. බලයලත් වෙළෙඳුන් විසින් තම ආයතනික ගනුදෙනු කරුවන් හට එම සංස්ථාපිත ආයතනයන්හි නම් කරන ලද සේවකයන් හෝ අධ්‍යක්ෂවරුන්ගේ නමින්, වාණිජ පරමාර්ථයන් සඳහා ශ්‍රී ලංකාවට භාණ්ඩ ආනයනය කිරීම සඳහා ගෙවීම් කිරීම හැර ජංගම ගනුදෙනු සම්බන්ධ ඕනෑම ගෙවීමක් විදේශ විනිමයෙන් සිදු කිරීම සඳහා අනුමත අභ්‍යන්තර ක්‍රියාපටිපාටියට අනුකූලව ආයතනික කාඩ්පත් (ණය කාඩ්පත් හෝ බැරපත්) නිකුත් කළහැක.

7. බලයලත් වෙළෙඳුන් විසින් ණය අවදානම බැහැර කිරීම සඳහා සුදුසු අභ්‍යන්තර පාලනයන් හා යාන්ත්‍රණයන් ක්‍රියාත්මක කිරීමට යටත්ව, පහත පාර්ශ්වයන් හට ණය පහසුකමක් ඇතුළත් මුදල් මාරු කිරීමේ කාඩ්පත් (එනම් ණය කාඩ්පත්) නිකුත් කළහැකිය.

(අ) රාජ්‍ය තාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍ර හා ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද රාජ්‍ය තාන්ත්‍රික හැඳුනුම්පත් දරන විදේශ රටක පුරවැසියන් හට.

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත වාසික පුද්ගලයන් හට; නිකුත් කරනු ලබන විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත් මත හටගන්නා වියදම් විදේශයන්ගෙන් ලද ආමුඛ ප්‍රේෂණවලින් හෝ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලින් කරන මාරු කිරීම්වලින් පියවනු ලබන අවස්ථාවලදී, එම පුද්ගලයන් ශ්‍රී ලංකාවේ පවත්වාගෙන යනු ලබන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල ඇති අරමුදල් ඇපයට තබාගෙන එකී අරමුදලින් 90% ක සීමාවක් දක්වා පමණක්.

8. මෙම විධානයන්ගේ විෂය පථයට පිටතින් වන ඕනෑම අරමුණක් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත වාසික පුද්ගලයෙකු හට විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පතක් හරහා කරනු ලබන ඕනෑම ගෙවීමක් සඳහා විදේශ විනිමය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂකගෙන් පූර්ව ලිඛිත අවසරය ලබාගැනීම සඳහා බලයලත් වෙළෙඳුන් විසින් කාඩ්පත් හිමියන්ව යොමු කළ යුතුය.

9. වෙනත් අවශ්‍යතා

9.1 බලයලත් වෙළෙන්දන් විසින් විද්‍යුත් මුදල් හුවමාරු කාඩ්පත් සම්බන්ධයෙන් පවත්නා රෙගුලාසි පිළිබඳ තම ගනුදෙනුකරුවන් දැනුවත් කළයුතු අතර ඇමුණුම I හි දක්වා ඇති පරිදි එම අයදුම්කරුවන්ගෙන් ප්‍රකාශයක් ලබාගත යුතුය.

9.2 බලයලත් වෙළෙඳුන් විසින් නිසි පරීක්ෂාවන් සිදු කළ යුතු අතර, කාඩ්පත් හිමියා අනවසර ගනුදෙනු සඳහා විදේශ විනිමය වැය කරන බවට සැක කිරීමට සාධාරණ පදනමක් ඇත්නම් එම විද්‍යුත් මාරු කිරීමේ කාඩ්පත්වලින් කරනු ලබන විදේශ විනිමය ගෙවීම් අත්හිටුවීමට වහාම ක්‍රියාමාර්ග ගතයුතු අතර, එම කාරණාව විදේශ විනිමය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂකගේ අවධානයට යොමු කර විය යුතුය.

9.3 කාඩ්පත් හිමියා විසින් විද්‍යුත් මුදල් මාරු කිරීම් කාඩ්පත් භාවිතා කරමින් මෙම විධානයන්හි සඳහන් පරිදි අවසරලත් ගනුදෙනු පමණක් සිදු කරන බවට බලයලත් වෙළෙන්දා විසින් සනාථ කරගත යුතුය.

9.4 බලයලත් වෙළෙන්දා විසින් සෑම කාඩ්පත් හිමියෙකුගේම විදේශ විනිමයෙන් කළ ගනුදෙනු හා ශ්‍රී ලංකා රුපියල්වලින් කරන ලද ගනුදෙනු වෙන් වෙන් වශයෙන් හඳුනාගත යුතුය.

9.5 අවලංගු කරන ලද 1953 අංක 24 දරන විනිමය පාලන පනතේ ප්‍රතිපාදනයන් යටතේ දැනටමත් නිකුත් කර ඇති විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත් මෙම විධානයන්හි දක්වා ඇති නියමයන්ට යටත් වේ.

10. මාසික වාර්තාකරණය

10.1 බලයලත් වෙළෙඳුන් විසින් පහත සීමාවන්ට යටත්ව විදේශ ව්‍යවහාර මුදලින් කරන ලද මුදල් ආපසු ගැනීම් ඇතුළුව විදේශ විනිමයවලින් වියදම් කර ඇති කාඩ්පත් හිමියන්ගේ සියළු ගනුදෙනුවලට අදාළ විස්තර විදේශ විනිමය ගනුදෙනු සුපරීක්ෂණ පද්ධතිය - Forex Net (httpx://www.cbsl.lk/forexnet) හරහා ඉලෙක්ට්‍රොනික් මාධ්‍යයෙන් පමණක් විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත මාසිකව ඉදිරිපත් කළ යුතුය.

අ) වටිනාකම ඇ.එ.ජ. ඩොලර් 5000 (හෝ ඊට සමාන වෙනත් ඕනෑම විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණයක්) ඉක්මවන තනි ගනුදෙනු.

ආ) කැලැන්ඩර මාසයක් තුළ සමුච්චිත භාවිතය ඇ.එ.ජ. ඩොලර් 10,000 (හෝ ඊට සමාන වෙනත් ඕනෑම විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණයක්) ඉක්මවන එක් වරකට වඩා සිදුවූ ගනුදෙනු.

11. මෙම විධානයන්හි කාර්යයන් සඳහා

i. "විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත (EETC)" යන්නෙන් බැර, හර හෝ වෙනත් යම් ආකාරයක වටිනාකමක් මාරු කිරීම සඳහා භාවිතා කරන්නාට හැකියාව ලබා දෙන කාඩ්පතක් හෝ උපකරණයක් අදහස් වන අතර, එයට ණය කාඩ්පත්, හර කාඩ්පත් සහ විනිමය පාලන පනතේ විධිවිධානයන්ට අනුකූල වන බවට බලයලත් වෙළෙඳුන් විසින් ගනුදෙනු විස්තර හඳුනාගත හැකි අවස්ථාවලදී වටිනාකම තැන්පත් කළ කාඩ්පත් ද ඇතුළත් වේ.

ii. "හර කාඩ්පත" යන්නෙන් එම කාඩ්පත දරන්නාගේ ගිණුමේ බැර ශේෂය සෘජුවම හර කිරීම මගින් මුදල් ලබා ගැනීම සහ/හෝ භාණ්ඩ හා සේවා මිලදී ගැනීම වෙනුවෙන් භාවිතා කළහැකි ගෙවීම් කාඩ්පතකි.

iii. "ණය කාඩ්පත" යන්නෙන් කාඩ්පත් දරන්නා වෙත එය නිකුත් කරන්නා විසින් ප්‍රදානය කරන ලද ණය පහසුකමක් සහිත කාඩ්පත් දරන්නා විසින් භාවිතා කරන ලද ණය මුදල සම්පූර්ණයෙන් හෝ කොටසක් නියමිත දින හෝ ඊට පෙර ගෙවා නිම කළහැකි කාඩ්පතක් අදහස් වේ. නියමිත දිනට නොපියවන ලද ණය මුදලට නිකුත් කරන්නා විසින් පොලී හෝ වෙනත් ගාස්තු අය කරනු ලැබිය හැකිය.

iv. "පෞද්ගලික" යන්නෙන් කාඩ්පත් හිමියාගේ, කාලත්‍රයාගේ, දරුවන්ගේ හා දෙමාපියන්ගේ ප්‍රයෝජනය සඳහා භාවිතා කිරීම අදහස් වන අතර, එමගින් කාඩ්පත යම් වාණිජ කාර්යයක් සඳහා භාවිතා කිරීම අදහස් නොවේ.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2017 අංක 03 දරන විධානයන්** 2017 නොවැම්බර් 20

## පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2017 අංක 03 දරන විදේශ විනිමය (විදේශ විනිමය ගිණුම් විවෘත කිරීමේ හා පවත්වාගෙන යාමේ) නියෝගය සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 9(1) සහ 9(2) වගන්ති ප්‍රකාරව, පහත කොන්දේසිවලට යටත්ව පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීමට සහ පවත්වාගෙන යාමට බලයලත් වෙළෙඳුන් වෙත අවසර දෙනු ලැබේ.

**1.1 සුදුසුකම්ලත් පුද්ගලයන්**

සුදුසුකම්ලත් පුද්ගලයන් නියෝගයෙහි සඳහන් පරිදි විය යුතුය.

**1.2 ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම**

නියෝගය මගින් ශ්‍රී ලංකා මහ බැංකුවට ලබාදී ඇති අධිකාරිය ප්‍රකාරව, පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කර පවත්වාගෙන යාමේදී නියෝගයෙහි සඳහන් කොන්දේසිවලට අමතරව පහත සඳහන් කොන්දේසි ද සැළකිල්ලට ගත යුතුය.

(අ) තාවකාලික සංචාරයක් මත ශ්‍රී ලංකාවට පැමිණෙන හෝ ශ්‍රී ලංකාවට පැමිණීමට අදහස් කරන විජාතිකයන්, මෙම ගිණුම් බද්ධ ගිණුම් ලෙස විවෘත කිරීමට හා පවත්වාගෙන යාමට සුදුසුකම් නොලබයි.

(ආ) ශ්‍රී ලාංකික ජාතිකයෙකු වන හෝ ශ්‍රී ලාංකික සම්භවයක් සහිත ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයෙකු වන බාලවයස්කරුවකුගේ නමින් පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීමට ඇති අවස්ථාවකදී, එම ගිණුම් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයෙකු වන ඔවුන්ගේ දෙමාපියන් හෝ භාරකරුවන්ගෙන් ලද විදේශ විනිමය ප්‍රේෂණ බැර කිරීමෙන් හෝ දෙමව්පියන් හෝ භාරකරුවන්ගේ දැනට පවත්නා පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලින් අරමුදල් මාරු කිරීමෙන් පමණක් විවෘත කළ යුතුය.

(ඇ) පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් විවෘත කිරීමට පෙර පහත සඳහන් තොරතුරු සහ ලියකියවිලි අදාළ පරිදි ලබාගත යුතුය.

| සුදුසුකම්ලත් පුද්ගලයන් | තොරතුරු/ලේඛන |
|---|---|
| i. බාලවයස්කරුවෙකු ද ඇතුළුව, ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයෙකු වන, ශ්‍රී ලාංකික සම්භවයක් සහිත පුද්ගලයෙකු | ■ සම්පූර්ණ නම, ජාතිකත්වය හා විදේශ ලිපිනය |
| | ■ විදේශ ගමන් බලපත්‍ර අංකය, නිකුත් කළ දිනය සහ වලංගු කාලසීමාව |
| | ■ ශ්‍රී ලංකාවෙන් පිටත් වූ දිනය |
| | ■ පුරවැසිභාවය හෝ විදේශ රජයකින් පිරිනමන ලද වීසා බලපත්‍රයේ ස්වභාවය |
| ii. විජාතිකයෙකු වන ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු | ■ සම්පූර්ණ නම, ජාතිකත්වය හා විදේශීය ලිපිනය |
| | ■ ශ්‍රී ලංකාවේ රැකියා ස්ථානයේ ලිපිනය සහ තනතුර, ඇත්නම් |
| | ■ සේවා නියුක්ති ගිවිසුමේ පිටපතක් සහ වැටුප් විස්තර |
| | ■ විදේශ ගමන් බලපත්‍රයේ හා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවෙන් ප්‍රදානය කරන ලද වීසා බලපත්‍රයේ පිටපත් |
| iii. තාවකාලික සංචාරයක් මත ශ්‍රී ලංකාවට පැමිණි හෝ ශ්‍රී ලංකාවට පැමිණීමට අදහස් කරන විජාතික තැනැත්තෙකු | ■ සම්පූර්ණ නම, ජාතිකත්වය හා විදේශීය ලිපිනය |
| | ■ විදේශ ගමන් බලපත්‍රයේ සහ වීසා බලපත්‍රයේ පිටපත් |

**1.3 අවසරලත් බැර කිරීම්**

අවසරලත් බැර කිරීම් නියෝගයෙහි සඳහන් පරිදි විය යුතුය.

**1.4 අවසරලත් හර කිරීම්**

නියෝගය මගින් ශ්‍රී ලංකා මහ බැංකුවට ලබාදී ඇති අධිකාරිය ප්‍රකාරව, නියෝගයෙහි සඳහන් කරන ලද හර කිරීම්වලට අමරතව පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට පහත සඳහන් හර කිරීම් සඳහා ද අවසර ඇත.

(අ) ගිණුම් හිමියාගේ විදේශ ව්‍යවහාර මුදල් ණය ගිණුමකට (FCLA) හෝ රුපියල් ණය ගිණුමකට (LLA) අරමුදල් මාරු කිරීම

**2. මාසික වාර්තා කිරීම්**

(අ) බලයලත් වෙළෙඳුන් විසින් ඇමුණුම I හි පරිදි මාසික පදනමින් සකස් කළ වාර්තාවක් එළඹෙන මාසයේ 15 වන දින හෝ ඊට ප්‍රථම dfe@cbsl.lk යන විද්‍යුත් ලිපිනය හරහා මෙම දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.

(ආ) ඉහත වාර්තාව සැපයීම සඳහා අදාල තොරතුරු බැංකුවල ගිණුම් පොත්වලින් උත්පාදනය/උපුටා ගැනීම පිණිස බලයලත් වෙළෙඳුන් විසින් බැංකුව තුළ නිසි පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය.

**අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව**

2017 අංක 3 දරන විධානය සඳහා වූ ඇමුණුම 1

**පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පිළිබඳ මාසික ප්‍රකාශනය**

බැංකුවේ නම:

වාර්තා කරන මාසය සහ වර්ෂය :

| මුදල් වර්ගය | ගිණුම් හිමියන්ගේ නේවාසික භාවය | ආරම්භක ශේෂය | | බැර | | | | | හර | | | | අවසාන ශේෂය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | ගිණුම් ගණන | වටිනාකම | පිටරටින් ලද ආමුඛ ප්‍රේෂණ | වෙනත් ගිණුම්වලින් කරන ලද මාරු කිරීම් | බැර කරනු ලද මුළු පොලිය | අනෙකුත් බැර කිරීම් | එකතුව | ශ්‍රී ලංකාවෙන් පිටතට සිදු කරන ලද ප්‍රතිමුඛ ප්‍රේෂණ | වෙනත් ගිණුම්වලට කරන ලද මාරු කිරීම් | අනෙකුත් හර කිරීම් | එකතුව | ගිණුම් ගණන | වටිනාකම |
| ඇ.එ.ජ. ඩොලර් | නේවාසික | | | | | | | | | | | | | |
| | අනේවාසික | | | | | | | | | | | | | |
| | එකතුව | | | | | | | | | | | | | |
| ස්ටර්ලිං පවුම් | නේවාසික | | | | | | | | | | | | | |
| | අනේවාසික | | | | | | | | | | | | | |
| | එකතුව | | | | | | | | | | | | | |
| යූරෝ | නේවාසික | | | | | | | | | | | | | |
| | අනේවාසික | | | | | | | | | | | | | |
| | එකතුව | | | | | | | | | | | | | |
| වෙනත්* නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් | නේවාසික | | | | | | | | | | | | | |
| | අනේවාසික | | | | | | | | | | | | | |
| | එකතුව | | | | | | | | | | | | | |

* වෙනත් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් සඳහා ඔබට අවශ්‍ය පරිදි පේළි දීර්ඝ කළහැකිය.

බලයලත් වෙළෙඳුන් විසින් ඉහත වාර්තාවෙහි පරිලොකන පිටපත් සහ එම්එස් එක්සෙල් මගින් සකස් කරන ලද වාර්තාවක් සැපයිය යුතුය.

බැංකුවේ ගිණුම් පොත් මගින් උපුටාගත්/උත්පාදනය වූ ඉහත තොරතුරු නිවැරදි බවට අපි සහතික වන්නෙමු

බලයලත් නිලධාරියාගේ නම :
අත්සන :
දිනය :

අනුකූලතා නිලධාරියාගේ නම :
අත්සන :
දිනය :

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2017 අංක 04 දරන විධානයන්** 2017 නොවැම්බර් 20

## ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2017 අංක 3 දරන විදේශ විනිමය (විදේශ විනිමය ගිණුම් විවෘත කිරීමේ හා පවත්වාගෙන යාමේ) නියෝග (නියෝග) සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 9(1) සහ 9(2) වගන්ති ප්‍රකාරව (පනත), පහත කොන්දේසිවලට යටත්ව ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් ආරම්භ කර පවත්වාගෙන යාම සඳහා බලයලත් වෙළෙඳුන් හට අවසර දෙනු ලැබේ.

1.1 **සුදුසුකම්ලත් පුද්ගලයන්**

සුදුසුකම්ලත් පුද්ගලයින් නියෝගයෙහි සඳහන් පරිදි විය යුතුය.

1.2 **ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම**

නියෝගය මගින් ශ්‍රී ලංකා මහ බැංකුවට ලබාදී ඇති අධිකාරිය ප්‍රකාරව, ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීමේදී සහ පවත්වාගෙන යාමේදී නියෝගයෙහි සඳහන් කොන්දෙසිවලට අමතරව පහත සඳහන් කොන්දේසි ද සැළකිල්ලට ගත යුතුය.

(අ) ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක කිසිදු අවස්ථාවක හර ශේෂයක් නොපෙන්විය යුතුය.

(ආ) ගිණුම් හිමියා ඉහත 1.1 ඡේදය යටතේ සුදුසුකම්ලත් නැව් නියෝජිතයෙකු හෝ සාමාන්‍ය අලෙවි නියෝජිතයෙකු වන අවස්ථාවක, ප්‍රවාහන ගාස්තු වශයෙන් සළකනු නොලබන, දේශීය ගාස්තු හෝ අය කිරීම් ලෙස රැස් කරගත් අය කිරීම් හා තැන්පතු බලයලත් වෙළෙඳුන් විසින් ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමට තැන්පත් නොකළ යුතුය.

(ඇ) විදේශීය ණය සපයන්නාගේ ආමුඛ ආයෝජන ගිණුමෙන් මාරු කරන ලද විදේශ ව්‍යවහාර මුදලින් වන ණය (ණය සුරැකුම්පත් ද ඇතුළුව) සහ ගිණුම් හිමියා විසින් දේශීය බැංකු ඒකකයෙන් ලබාගත් විදේශීය ව්‍යවහාර මුදලින් වන ණය, ශ්‍රී ලංකාවෙන් පිටත ප්‍රාග්ධන ගණුදෙනු සඳහා කිසිදු අවස්ථාවක උපයෝගී කර නොගන්නා බවට බලයලත් වෙළෙඳුන් විසින් තහවුරු කර ගත යුතුය.

1.3 **අවසරලත් බැර කිරීම්**

නියෝගය මගින් ශ්‍රී ලංකා මහ බැංකුවට ලබාදී ඇති අධිකාරිය ප්‍රකාරව, නියෝගයෙහි සඳහන් කරන ලද බැර කිරීම්වලට අමතරව, ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට පහත සඳහන් බැර කිරීම් සඳහා ද අවසර ඇත.

(අ) ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියා විසින් සිදු කළ භාණ්ඩ විකුණුම් සහ සේවා සැපයීම් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ බැංකු විසින් ගිණුම් හිමියා වෙනුවෙන් නිකුත් කරනු ලබන විදේශ මුදල් අණකර.

(ආ) විදේශීය ණය සපයන්නාගේ ආමුඛ ආයෝජන ගිණුමෙන් මාරු කරන ලද, පනතෙහි ප්‍රතිපාදන යටතේ ප්‍රදානය කර ඇති අවසරයක් ප්‍රකාරව ලබාගත් (ණය සුරැකුම්පත් ද ඇතුළුව) විදේශීය ව්‍යවහාර මුදලින් වන ණය (ශ්‍රී ලංකාවෙන් පිටත ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීමේ අරමුණින් ලබාගත් ණය හැර).

(ඇ) ගිණුම් හිමියා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයෙකුට විකුණන ලද භාණ්ඩ හෝ සපයන ලද සේවා වෙනුවෙන්, ශ්‍රී ලංකාවෙන් පිටතදී නිකුත් කරන ලද විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පතක් භාවිතයෙන් ඉලෙක්ට්‍රොනික් දත්ත ග්‍රාහක

ටර්මිනලයක් (Electronic Data Capture (EDC) Terminal) හෝ අන්තර්ජාල ගෙවීම් මාධ්‍යය (Internet Payment Gateway (IPG)) හරහා ලද ගෙවීම්. කෙසේ වෙතත්, බලයලත් වෙළෙන්ඳා විසින් එවැනි ගෙවීම් ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට බැර කළයුත්තේ ශ්‍රී ලංකාවෙන් පිටතදී නිකුත් කරන ලද විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පතක් භාවිතයෙන් කරන ලද ගෙවීම් එහි අන්තර්ගත බවට ඉලෙක්ට්‍රොනික් දත්ත ග්‍රාහක/අන්තර්ජාල ගෙවීම් මාධ්‍යය ප්‍රතිපාදකගෙන් ලිඛිත තහවුරුවක් ලබා ගැනීමෙන් අනතුරුවය.

(ඇ) ගිණුම් හිමියා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයෙකුට කල්බදු හෝ කුලී පදනම මත සපයන ලද ශ්‍රී ලංකාවේ නිශ්චිත දේපළක් වෙනුවෙන් බැංකු පද්ධතිය හරහා විදේශයන්ගෙන්, විදේශ විනිමයෙන් ලද ආමුඛ ප්‍රේෂණ.

(ඉ) ගිණුම් හිමියා විසින් ශ්‍රී ලංකාවේ නේවාසික දේපළක් අත්පත් කර ගැනීමේ/ඉදිකිරීමේ/සංවර්ධනය කිරීමේ සහ අළුත්වැඩියා කිරීමේ අරමුණින් විදේශ ව්‍යවහාර මුදල් ණය ගිණුමකින් (Foreign Currency Loan Account) කරනු ලබන මාරු කිරීම්.

**1.4 අවසරලත් හර කිරීම්**

අවසරලත් හර කිරීම් නියෝගයෙහි සඳහන් පරිදි විය යුතුය.

**1.5 මාසික වාර්තා කිරීම්**

(අ) බලයලත් වෙළෙඳුන් විසින් ඇමුණුම I හි දක්වා ඇති පරිදි මාසික පදනමෙන් සකස් කළ වාර්තාවක් එළඹෙන මාසයේ 15 වන දින හෝ ඊට ප්‍රථම dfem@cbsl.lk යන විද්‍යුත් ලිපිනය හරහා මෙම දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.

(ආ) ඉහත වාර්තාව සැපයීම සඳහා අදාල තොරතුරු බැංකුවල ගිණුම් පොත්වලින් උත්පාදනය හෝ උපුටා ගැනීම පිණිස බලයලත් වෙළෙඳුන් විසින් බැංකුව තුළ නිසි පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය.

**1.6 මෙම විධානයන්හි කාර්යය සඳහා**

(අ) "විදේශ නැව් සමාගම" යනු 1972 අංක 10 දරන (සංශෝධිත) නැව් සමාගම් ලියාපදිංචි පනත ප්‍රකාරව ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික වූ ඕනෑම නැව් සමාගමකි.

(ආ) "විදේශ ගුවන් සමාගම" යනු 2010 අංක 14 දරන (සංශෝධිත) සිවිල් ගුවන් කටයුතු පනත ප්‍රකාරව ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික වූ ඕනෑම විදේශ ගුවන් මෙහෙයුම්කරුවෙකි.

**අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව**

**2017 අංක 4 දරන විධානය සඳහා වූ ඇමුණුම I**

## ව්‍යාපාරික විදේශීය ව්‍යවහාර මුදල් ගිණුම් පිළිබඳ මාසික ප්‍රකාශනය

බැංකුවේ නම : ........................................................................................................................................................

වාර්තා කරන මාසය සහ වර්ෂය : ...............................................................

| ගිණුම් කාණ්ඩය | මුදල් වර්ගය | මාසය ආරම්භයේ දී ශේෂය | බැර | | | | | හර | | | | | මාසය අවසානයේදී ශේෂය | මාසය අවසානයේ දී මුළු ගිණුම් ගණන |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ආමුඛ ප්‍රේෂණ | වෙනත් ගිණුම්වලින් කරන ලද මාරු කිරීම් | වෙනත් | බැර කරන ලද මුළු පොළිය | එකතුව | ප්‍රතිමුඛ ප්‍රේෂණ | වෙනත් විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට කරන ලද මාරු කිරීම් | දේශීය ගෙවීම් | වෙනත් බැර කිරීම් | එකතුව | | |
| අපනයනකරුවන් | | | | | | | | | | | | | | |
| වෘත්තීමය සේවා සපයන්නන් | | | | | | | | | | | | | | |
| සංචාරක නියෝජිතයන්/සංචාරක කර්මාන්තය | | | | | | | | | | | | | | |
| හෝටල් සහ භෝජනාගාර | | | | | | | | | | | | | | |
| මැණික් හා ස්වර්ණාභරණ අලෙවිකරුවන් | | | | | | | | | | | | | | |
| රක්ෂණකරුවන් | | | | | | | | | | | | | | |
| විදේශීය රැකියා නියෝජිත ආයතනයන් | | | | | | | | | | | | | | |
| විදේශීය සේවා යෝජකයන්ට සේවා සපයන ශ්‍රී ලාංකිකයන්ට ගෙවීම් සිදු කිරීම පිණිස ලද ආමුඛ ප්‍රේෂණ | | | | | | | | | | | | | | |
| සේවා සැපයුම්, භාණ්ඩ ප්‍රවාහනය සහ ඒ හා සම්බන්ධ සේවාවන් යනාදිය | | | | | | | | | | | | | | |
| නැව් නියෝජිත ආයතන | | | | | | | | | | | | | | |
| සාමාන්‍ය අලෙවි නියෝජිතයන් (ගුවන් සමාගම) | | | | | | | | | | | | | | |
| දේශීය බැංකු ඒකකයෙන් ලද විදේශ ව්‍යවහාර මුදලින් වන ණය | | | | | | | | | | | | | | |
| ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමට මාරු කරන ලද අක්වෙරළ බැංකු ඒකකයෙන් ලත් විදේශ ව්‍යවහාර මුදලින් වන ණය | | | | | | | | | | | | | | |
| විදේශ ණය සපයන්නාගේ ආමුඛ ආයෝජන ගිණුමෙන් මාරු කරන ලද විදේශ ව්‍යවහාර මුදලින් වන ණය පහසුකම් (ආයෝජන අරමුණු සඳහා හැර) | | | | | | | | | | | | | | |
| ශ්‍රී ලංකාව තුළ/පිටත කරන ලද ආයෝජන | | | | | | | | | | | | | | |
| විදේශ ව්‍යාපෘති | | | | | | | | | | | | | | |
| වෙනත් සේවා සැපයුම්කරුවන් (කාණ්ඩය සඳහන් කරන්න) | | | | | | | | | | | | | | |

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පනතෙහි 8 (3) වගන්තිය යටතේ විදේශයන්ගෙන් ලද ආමුඛ ප්‍රේෂණ | | | | | | | | | | | | | | |
| වෙනත් (කාණ්ඩය සඳහන් කරන්න) | | | | | | | | | | | | | | |
| එකතුව | | | | | | | | | | | | | | |

සටහන : සියළුම ගිණුම්වලට අදාල තොරතුරු අදාල නම් කරන ලද මුදල් වර්ග යටතේ දක්වන්න. **(යූරෝ, ඇ.එ.ජ. ඩොලර්, ස්ටර්ලිං පවුම්, වෙනත් (සඳහන් කරන්න))**
**වාර්තාවෙහි පරිලෝකන පිටපතක් සහ මයික්‍රොසොෆ්ට් එක්සෙල් මගින් සකස් කරන ලද පිටපතක් බලයලත් වෙළෙඳුන් විසින් සැපයිය යුතුය.**

අදාළ තොරතුරු මා විසින් විමර්ශනය කරන ලද බවත් ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සනාථ කරමි.

..................................................
බලයලත් නිලධාරියාගේ නම

අත්සන ..................................................

දිනය ..................................................

..................................................
අනුකූලතා නිලධාරියාගේ නම

අත්සන ..................................................

දිනය ..................................................

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2017 අංක 05 දරන විධානයන්** 2017 නොවැම්බර් 20

## රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (DFAs) හා රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම් (DRAs) සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2017 අංක 02 දරන විදේශ විනිමය (ප්‍රාග්ධන ගනුදෙනුවල යෙදීම සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම) නියෝග සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 9(1) සහ 9(2) වගන්ති ප්‍රකාරව, රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සහ රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම සඳහා පහත සඳහන් කොන්දේසිවලට යටත්ව බලයලත් වෙළෙඳුන් වෙත අවසර දෙනු ලැබේ.

1.1 **සුදුසුකම්ලත් පුද්ගලයින්**

සුදුසුකම්ලත් පුද්ගලයින් නියෝගයෙහි සඳහන් පරිදි විය යුතුය.

1.2 **ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම**

නියෝගය මගින් ශ්‍රී ලංකා මහ බැංකුවට ලබා දී ඇති අධිකාරිය ප්‍රකාරව, රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හා රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම් විවෘත කර පවත්වාගෙන යාමේදී, නියෝගයේ සඳහන් කර ඇති කොන්දේසිවලට අමතරව පහත සඳහන් කොන්දේසිද සැළකිල්ලට ගතයුතුය.

(අ) රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම්, ජංගම, ඉතිරිකිරීමේ හෝ කාලීන තැන්පතු ගිණුම් ලෙස විවෘත කර පවත්වාගෙන යාම සිදු කළ හැකිය.

(ආ) රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම්වල අවසරලත් හර කිරීම් සහ බැර කිරීම් චෙක්පත් මගින් සිදු කළහැකිය. කෙසේවුවද, කිසිදු අවස්ථාවකදී රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම් වලට බැංකු අයිරා පහසුකම් ලබා නොදිය යුතුය.

(ඇ) මෝටර් වාහන අලෙවියෙන් ලබාගත් මුදල් රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුමට බැර කිරීමේදී, බලයලත් වෙළෙඳුන් විසින් ඇමුණුම I හි දක්වා ඇති ලියවිලි ලබාගත යුතුය.

1.3 **රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සඳහා වූ අවසරලත් බැර කිරීම් සහ හර කිරීම්**

අවසරලත් බැර කිරීම් සහ හර කිරීම් නියෝගයන්හි දක්වා ඇති පරිදි විය යුතුය.

1.4 **රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම් සඳහා වූ අවසරලත් බැර කිරීම්**

නියෝගයන් මගින් ශ්‍රී ලංකා මහ බැංකුවට ලබාදී ඇති අධිකාරය ප්‍රකාරව, නියෝගයන්හි සඳහන් කර ඇති බැර කිරීම්වලට අමතරව, රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම්වලට පහත සඳහන් බැර කිරීම් සඳහා ද අවසර ඇත.

(අ) ගිණුම් හිමියා වෙනුවෙන් ශ්‍රී ලංකාවට පිටතින් ශ්‍රී ලංකා රුපියල්වලින් බැංකු පද්ධතිය හරහා ලැබෙන ප්‍රේෂණ

1.5 **රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම් සඳහා වූ අවසරලත් හර කිරීම්.**

අවසරලත් හර කිරීම් නියෝගයේ සඳහන් පරිදි විය යුතුය.

2. **මෙම විධානයන්හි කාර්යය සඳහා**

(අ) "රාජ්‍ය තාන්ත්‍රික කාර්යාලය" යන්නෙන් තානාපති කාර්යාල, මහ කොමසාරිස් කාර්යාල, කොන්සල් කාර්යාල, එක්සත් ජාතීන්ගේ ස්ථිර කාර්යාල හෝ යුරෝපීය කොමිසමේ නියෝජිත මණ්ඩල යනාදිය අදහස් වේ.

(ආ) "රාජ්‍ය තාන්ත්‍රිකයන්" යන්නෙන් රාජ්‍ය තාන්ත්‍රික කාර්යාල විසින් නියෝජනය කරනු ලබන විදේශ රටක පුරවැසියන් අදහස් වේ.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව

**2017 අංක 05 දරන විධානයන් සඳහා වූ ඇමුණුම I**

**මෝටර් වාහන අලෙවියෙන් ලබාගත් මුදල් රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුමට බැර කිරීමේදී ලබාගත යුතු ලියවිලි**

i. විකුණුම්කරුගේ නමින් වූ, මෝටර් වාහනයේ ලියාපදිංචි සහතිකය.
ii. මෝටර් වාහනයේ හිමිකම වෙනස්වීමේ ප්‍රකාශය - මෝටර් වාහනයේ හිමිකම ගැණුම්කරුට මාරු වූ බවට තහවුරු කිරීම සඳහා වූ ලේඛනමය සාක්ෂි
iii. ගැණුම්කරු විසින් නිකුත් කළ, මෝටර් වාහනයේ මිළ තහවුරු කිරීමේ ලිපියක්
iv. රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තීරුබදු තක්සේරු වාර්තාවක්
v. මෝටර් වාහනයේ හිමිකම පැවරීම සම්බන්ධයෙන් අදාල අමාත්‍යාංශයෙන් ලබාගත් අවසර ලිපියක්
vi. ශ්‍රී ලංකා රේගුවෙන් ගණනය කරන ලද රේගු බදු සහ අනෙකුත් ගෙවීම්
vii. ශ්‍රී ලංකා රේගුවේ භාණ්ඩ ප්‍රකාශ කිරීමේ පත්‍රිකාව
viii. ශ්‍රී ලංකා රේගුවේ තක්සේරු නිවේදනය

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2017 අංක 06 දරන විධානයන්** 2017 නොවැම්බර් 20

## නේවාසික ආගන්තුකයින් සඳහා වන යෝජනා ක්‍රමය - (විශේෂිත ගිණුම්) පිළිබඳව බලයලත් වෙලෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ වගන්ති 6 සහ 7 සමග කියවෙන 9(1) හා 9(2) වගන්ති ප්‍රකාරව, ආගමන සහ විගමන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන "නේවාසික ආගන්තුකයින් පිළිබඳව වන යෝජනා ක්‍රමය" යටතේ ශ්‍රී ලංකාවට පැමිණෙන අනාගත ආයෝජකයින් හා වෘත්තිකයන්ගේ නමින් මතු දැක්වෙන ගිණුම් විවෘත කිරීමට හා පවත්වාගෙන යාමට පහත සඳහන් කොන්දේසිවලට යටත්ව බලයලත් වෙළෙඳුන් වෙත අවසර දෙනු ලැබේ.

2. ආයෝජකයකු විසින් ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීම සඳහා ඇ.එ.ජ. ඩොලර් 250,000 ක් හෝ වෙනත් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන ප්‍රමාණයක්ද, ආයෝජකයා සහ ඔහු සමග කැටුව එන සෑම යැපෙන්නෙකු සඳහාම ශ්‍රී ලංකාව තුළ ඔවුන්ගේ වියදම් සඳහා එක් අයෙකුට ඇ.එ.ජ. ඩොලර් 35,000 ක මුදලක් ද ප්‍රේෂණය කිරීම හෝ රැගෙන ඒම අවශ්‍ය කෙරේ.

3. වෘත්තිකයෙකු විසින් ශ්‍රී ලංකාව තුළ සිය ජීවන වියදම වශයෙන් මාසිකව ඇ.එ.ජ. ඩොලර් 2,000 ක මුදලක් සහ සෑම යැපෙන්නෙකු වෙනුවෙන් එක් අයෙකුට මාසිකව ඇ.එ.ජ. ඩොලර් 1,000 ක මුදලක් ප්‍රේෂණය කිරීම හෝ රැගෙන ඒම අවශ්‍ය කෙරේ.

4. **ගිණුම් වර්ග**

ඉහත යෝජනා ක්‍රමය යටතේ බලයලත් වෙළෙඳුන් විසින් ඔවුන්ගේ දේශීය බැංකු ඒකක තුළ පහත සඳහන් විශේෂිත ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම කළ යුතුය.

**4.1 නේවාසික ආගන්තුක විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්**

**4.1.1 අවසරලත් බැර කිරීම්**

(අ) ඇ.එ.ජ. ඩොලර් 250,000 හෝ ඒ හා සමාන වෙනත් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණයක් වන මූලික මුදල තැන්පත් කිරීමේ අරමුණ සඳහා බැංකු පද්ධතිය හරහා මෙරටට ප්‍රේෂණය කළ හෝ ශ්‍රී ලංකා රේගුවට හෝ බලයලත් වෙළෙඳුන්ට ප්‍රකාශ කොට මෙරටට ගෙන එනු ලැබූ විදේශ විනිමය.

(ආ) ගිණුමේ ඇති භාවිතයට නොගත් අරමුදල් සඳහා මූලික වශයෙන් අවුරුදු 02 ක කාලයක් සඳහා වන පොලිය. (විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ පූර්ව අනුමැතිය නොමැතිව මුල් වසර දෙක අවසන් වීමෙන් පසු පොලී ගෙවීම සිදු නොකළ යුතුය)

**4.1.2 අවසරලත් හර කිරීම්**

(අ) අදාල අවසරයන් ලබාගත් බවට ලේඛන ගත සාක්ෂි ඉදිරිපත් කිරීමට යටත්ව, පහත දැක්වෙන "අනුමත ව්‍යාපෘතීන්හි" ආයෝජනය කිරීම සඳහා අරමුදල් ආපසු ලබා ගැනීම.

i. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හෝ අදාළ අධිකාරියක් විසින් අනුමත නව ව්‍යාපාර

ii. අදාල අධිකාරිය විසින් අනුමත කර ඇති, පවත්නා හෝ නව සමාගම් විසින් නියැලෙන ව්‍යාපෘති

iii. කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කොටස්

(ආ) මෙරටට රැගෙනවිත් භාවිතා නොකොට ගිණුමෙහිම රඳවා තිබූ ඇ.එ.ජ. ඩොලර් 250,000 ක් හෝ ඊට සමාන වෙනත් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණයක් ඉක්මවා පවතින ශේෂය මාරු කිරීම.

(ඇ) භාවිතා නොකොට ගිණුමෙහිම රඳවා තිබූ මුදල් සඳහා උපයනු ලැබූ පොලිය, ආයෝජකගේ නේවාසික ආගන්තුක රුපියල් ජංගම ගිණුමට (RGRCA) මාරුකිරීම.

(ඈ) යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබන ආයතනයේ එකඟතාව සමගින් ශ්‍රී ලංකා මහ බැංකුව අනුමත කරන ලද වෙනත් ඕනෑම මුදල් ආපසු ගැනීමක් හෝ මාරු කිරීමක්

**4.2 නේවාසික ආගන්තුක රුපියල් ජංගම ගිණුම් - ආයෝජකයන්**

**4.2.1 අවසරලත් බැර කිරීම්**

(අ) ඇ.එ.ජ. ඩොලර් 35,000 ක මුදලක් හෝ ඒ හා සමාන වෙනත් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණයක් තැන්පත් කිරීමේ අරමුණ සඳහා බැංකු පද්ධතිය හරහා මෙරටට ප්‍රේෂණය කළ හෝ සුදුසු පරිදි ශ්‍රී ලංකා රේගුවට හෝ බලයලත් වෙළෙඳුන්ට ප්‍රකාශ කොට මෙරටට ගෙන එනු ලැබූ විදේශ විනිමයවල ශ්‍රී ලංකා රුපියල් අගයන්

(ආ) ආයෝජකයන් විසින් ඔහුගේ සහ ඔහුගේ යැපෙන්නන්ගේ ජීවන වියදම් වෙනුවෙන් සිදු කරනු ලැබූ ආමුඛ ප්‍රේෂණ හෝ මෙරටට ගෙන එන ලද විදේශ ව්‍යවහාර මුදල් වල රුපියල් අගයන්

(ඇ) රුපියල් බවට පරිවර්තනය කරන ලද ආයෝජකයාගේ නේවාසික ආගන්තුක විදේශ ව්‍යවහාර මුදල් ගිණුමේ (RGFCA) අරමුදල් මත ගෙවන ලද පොලී

(ඈ) ආයෝජන මත ලැබූ ආදායම් (ලාභාංශ, ලාභ), නේවාසික ආගන්තුක විදේශ ව්‍යවහාර මුදල් ගිණුමේ අරමුදල් භාවිතා කරමින් අත්පත් කරගත් කොටස් විකිණීමෙන් ලද ආදායම්

**4.2.2 අවසරලත් හර කිරීම්**

(අ) ආයෝජකගේ සහ ඔහුගේ යැපෙන්නන්ගේ දේශීය වියදම්

(ආ) ඉහත 4.1.2 (අ) ඡේදයේ සඳහන් අනුමත ව්‍යාපෘතීන්හි කරනු ලබන ආයෝජනයන්

(ඇ) ආයෝජකයාගේ හෝ ශ්‍රී ලංකාවේ නේවාසික ඔහුගේ යැපෙන්නන්ගේ ජංගම ගණුදෙනු සඳහා කරනු ලබන ප්‍රතිමුඛ ප්‍රේෂණයන්

(ඈ) යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබන ආයතනයේ එකඟතාව සමගින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසර දෙනු ලබන වෙනත් ඕනෑම මුදල් ආපසු ගැනීමක් හෝ මාරු කිරීමක්

**4.3 නේවාසික ආගන්තුක රුපියල් ජංගම ගිණුම - වෘත්තිකයන්**

**4.3.1. අවසරලත් බැර කිරීම්**

(අ) ඇ.එ.ජ. ඩොලර් 2,000 (හෝ ඒ හා සමාන වෙනත් නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් ප්‍රමාණයක්) තැන්පත් කිරීමේ අරමුණ සඳහා බැංකු පද්ධතිය හරහා මෙරටට පර්යේෂණය කළ හෝ සුදුසු පරිදි ශ්‍රී ලංකා රේගුවට හෝ බලයලත් වෙළෙඳුන්ට ප්‍රකාශ කොට මෙරටට ගෙන එනු ලැබූ විදේශ විනිමයවල රුපියල් අගයන්.

(ආ) ගිණුම් හිමියාගේ සහ ඔහුගේ යැපෙන්නන්ගේ ජීවන වියදම් වෙනුවෙන් සිදුකරනු ලැබූ ආමුඛ ප්‍රේෂණ හෝ මෙරටට ගෙන එන ලද විදේශ ව්‍යවහාර මුදල්වල රුපියල් අගයන්

(ඇ) ගිණුම් හිමියා විසින් ශ්‍රී ලංකාවේදී සපයන ලද වෘත්තිමය සේවා වෙනුවෙන් ලද වැටුප්, උපදේශක සේවා ගාස්තු ආදිය

**4.3.2 අවසරලත් හර කිරීම්**

(අ) ගිණුම්හිමියා සහ ඔහුගේ යැපෙන්නන්ගේ දේශීය වියදම්

(ආ) ගිණුම් හිමියාගේ හෝ ශ්‍රී ලංකාවේ නේවාසික ඔහුගේ යැපෙන්නන්ගේ ජංගම ගනුදෙනු සඳහා කරනු ලබන ප්‍රතිමුඛ ප්‍රේෂණයන්

(ඇ) මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබන ආයතනයෙහි එකඟත්වය සමගින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසර දෙනු ලබන වෙනත් ඕනෑම මුදල් ආපසු ගැනීමක් හෝ මාරු කිරීමක්

5. වාර්තාකරණ අවශ්‍යතාවන්

බලයලත් වෙළෙඳුන් විසින් නේවාසික ආගන්තුක විදේශ ව්‍යවහාර මුදල් ගිණුම සහ නේවාසික ආගන්තුක රුපියල් ජංගම ගිණුම් - ආයෝජකයන් යන ගිණුම් සඳහා ඇමුණුම I සහ II පරිදි කාර්තුමය වාර්තා සෑම කාර්තුවක්ම ඉකුත් වී දින 15ක් ඇතුළත සහ නේවාසික ආගන්තුක රුපියල් ජංගම ගිණුම් - වෘත්තිකයන් ගිණුම් සඳහා මාසික වාර්තා ඇමුණුම III පරිදි සෑම මසක්ම ඉකුත් වී දින 15 ක් ඇතුළත dfem@cbsl.lk යන විද්‍යුත් ලිපිනය හරහා එවිය යුතුය.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව

**2017 අංක 06 දරන විධානයන් සඳහා වූ ඇමුණුම I**

**නේවාසික ආගන්තුක විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පිළිබඳව කාර්තුමය ප්‍රකාශනය**

බැංකුවේ නම : ........................................................................................................................................................................

වාර්තා කරන මාසය සහ වර්ෂය : ...................................................................

| ගිණුම් හිමියාගේ නම | ව්‍යවහාර මුදල් | ආරම්භක ශේෂය | බැර | | | හර | | | | | අවසාන ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | මූලික තැන්පතුව | ආමුඛ ප්‍රේෂණ/රට තුළට ගෙන එන ලද විදේශ විනිමය | පොලී බැර කිරීම් | ආයෝජන සඳහා ආපසු ගැනීම් | භාවිතයට නොගත්/ අතිරික්ත අරමුදල් මාරු කිරීම් | නේවාසික ආගන්තුක රුපියල් ජංගම ගිණුම්වලට මාරු කිරීම් | දේශීය ගෙවීම් | ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අනුමත කරන ලද වෙනත් ඕනෑම ආපසු ගැනීමක් | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |

බැංකුවේ ගිණුම් පොත්වලින් උපුටාගත්/උත්පාදනය වූ ඉහත තොරතුරු නිවැරදි බවට අපි සහතික වන්නෙමු.

.................................................................... ..............................................................

බලයලත් නිලධාරියාගේ නම අනුකූලතා නිලධාරියාගේ නම

.................................................................... ..............................................................

අත්සන අත්සන

.................................................................... ..............................................................

දිනය දිනය

**2017 අංක 06 දරන විධානයන් සඳහා වූ ඇමුණුම II**

**නේවාසික ආගන්තුක රුපියල් ජංගම ගිණුම - ආයෝජනයන් (RGRCA) පිළිබඳව කාර්තුමය ප්‍රකාශනය**

බැංකුවේ නම : ..........................................................................................................

වාර්තා කරන මාසය සහ වර්ෂය : ....................................................................

| ගිණුම් හිමියාගේ නම | ආරම්භක ශේෂය | බැර | | | හර | | | | අවසාන ශේෂය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ආමුඛ ප්‍රේෂණ/රට තුළට ගෙන එන ලද විදේශ ව්‍යාවහාර මුදල් | නේ. ආ.වි. ව්‍යවහාර මුදල් ගිණුමෙන් මාරු කිරීම් | ආයෝනයන් මගින් උපයාගත් ආදායම් | දේශීය වියදම් | ආයෝජන සඳහා ආපසු ගැනීම් | ජංගම ගනුදෙනු සඳහා ගෙවීම් | ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අනුමත කරන ලද වෙනත් ඕනෑම ආපසු ගැනීමක් | |
| | | | | | | | | | |
| | | | | | | | | | |

බැංකුවේ ගිණුම් පොත්වලින් උපුටාගත්/උත්පාදනය වූ ඉහත තොරතුරු නිවැරදි බවට අපි සහතික වන්නෙමු.

.............................................. ..............................................

බලයලත් නිලධාරියාගේ නම අනුකූලතා නිලධාරියාගේ නම

.............................................. ..............................................

අත්සන අත්සන

.............................................. ..............................................

දිනය දිනය

**2017 අංක 06 දරන විධානයන් සඳහා වූ ඇමුණුම III**

**"නේවාසික ආගන්තුක රුපියල් ජංගම ගිණුම් වෘත්තිකයන්" පිළිබඳව මාසික ප්‍රකාශනය**

බැංකුවේ නම : ..........................................................................................................

වාර්තා කරන මාසය සහ වර්ෂය : ....................................................................

| ගිණුම් හිමියාගේ නම | ආරම්භක ශේෂය | ආමුඛ ප්‍රේෂණ/රට තුළට ගෙනඑන ලද විදේශ ව්‍යාවහාර මුදල් | බැර | | හර | | අවසාන ශේෂය |
|---|---|---|---|---|---|---|---|
| | | | ශ්‍රී ලංකාවේදී ඉපැයීම් | දේශීය වියදම් | ජංගම ගනුදෙනු සඳහා ගෙවීම් | ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අනුමත කරන ලද වෙනත් ඕනෑම ආපසු ගැනීමක් | |
| | | | | | | | |
| | | | | | | | |

බැංකුවේ ගිණුම් පොත්වලින් උපුටාගත්/උත්පාදනය වූ ඉහත තොරතුරු නිවැරදි බවට අපි සහතික වන්නෙමු.

.............................................. ..............................................

බලයලත් නිලධාරියාගේ නම අනුකූලතා නිලධාරියාගේ නම

.............................................. ..............................................

අත්සන අත්සන

.............................................. ..............................................

දිනය දිනය

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2017 අංක 07 දරන විධානයන්** 2017 නොවැම්බර් 20

## ජ්‍යෙෂ්ඨ විදේශීය ජාතිකයන්ගේ - විශේෂ ගිණුම් පිළිබඳව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්:

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 6 වගන්තිය සමග කියවෙන 9(1) වගන්ති ප්‍රකාරව, ආගමන සහ විගමන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කෙරෙන "ශ්‍රී ලංකාව - මගේ සිහින නිවහන" වැඩසටහන යටතේ ශ්‍රී ලංකාවේ නේවාසික වීසා ලබා ගැනීමට බලාපොරොත්තු වන ජ්‍යෙෂ්ඨ විදේශීය ජාතිකයන් වෙනුවෙන්, පහත ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සඳහා පහත දැක්වෙන කොන්දේසි වලට යටත්ව බලයලත් වෙළෙඳුන් වෙත මෙයින් අවසර ලබා දෙනු ලැබේ.

2. ඉහත යෝජනා ක්‍රමය යටතේ වීසා බලපත්‍ර සඳහා අයදුම් කරන වයස අවුරුදු 55 ට වැඩි ජ්‍යෙෂ්ඨ විදේශීය ජාතිකයින් විසින් අවම වශයෙන් ඇ.එ.ජ. ඩොලර් 15,000 ක් හෝ වෙනත් නම් කරන ලද විදේශ ව්‍යාවහාර මුදල් වර්ගයක් ඒ හා සමාන ප්‍රමාණයක් ශ්‍රී ලංකාවට රැගෙන ආ යුතු අතර එම මුදල් ශ්‍රී ලංකාවේ රැඳී සිටින කාල සීමාව තුලදී විදේශ මුදල් ගිණුමක ස්ථාවර තැන්පතු ලෙස තැන්පත් කළ යුතුය. මීට අමතරව, මාසික ප්‍රේෂණයක් ලෙස ඇ.එ.ජ. ඩොලර් 1,500 ක් හෝ ඊට සමාන මුදලක් ප්‍රධාන අයදුම්කරු සඳහාද ඇ.එ.ජ. ඩොලර් 750 ක් හෝ ඒ හා සමාන මුදලක් ඔහු කැටුව පැමිණෙන එක් එක් යැපෙන්නාට හෝ කලත්‍රයාට අදාළවද ඔවුන්ගේ නඩත්තු සඳහා ශ්‍රී ලංකා රුපියල් ගිණුමක තැන්පත් කළ යුතුය.

3. ගිණුම් වර්ග

ඉහත අරමුණු සඳහා දේශීය බැංකු ඒකකය තුල, ජ්‍යෙෂ්ඨ විදේශිකයන්ගේ ස්ථාවර තැන්පතු ගිණුම (SFNFDA) සහ ජ්‍යෙෂ්ඨ විදේශිකයන්ගේ රුපියල් ගිණුම (SFNRA) විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සඳහා බලයලත් වෙළඳුන්ට අවසර ලබා දෙනු ලැබේ.

3.1 ජ්‍යෙෂ්ඨ විදේශිකයන්ගේ ස්ථාවර තැන්පතු ගිණුම (SFNFDA)

3.1.1 අවසරලත් බැර කිරීම්

(අ) බැංකු පද්ධතිය හරහා රට තුළට ගෙන එනු ලබන ඇ.එ.ජ. ඩොලර් 15,000 ක් හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන ප්‍රමාණයක් අවම මූලික ආරම්භක ශේෂ මුදල ලෙස තැන්පත් කිරීමේ අරමුණින් මෙම ගිණුම් විවෘත කළ යුතුය.

3.1.2 අවසරලත් හර කිරීම්

(අ) ගිණුම්හිමියා විසින් ශ්‍රී ලංකාව තුළ පදිංචිය අවසාන කිරීමට තීරණය කරනු ලබන අවස්ථාවකදී පමණක් පිටත්වයාම සහතික කිරීම සඳහා ලේඛනගත සාක්ෂි ලබා ගැනීමෙන් පසුව, ජ්‍යෙෂ්ඨ විදේශිකයන්ගේ ස්ථාවර තැන්පතු ගිණුමේ පවතින මුදල් ආපසු ගැනීමට අවසර ලබා දිය යුතුය. මුදල් පහත පරිදි නිදහස් කළ යුතුය.

i. ශ්‍රී ලංකාවෙන් පිටත පවත්වාගෙන යනු ලබන ගිණුමකට මුදල් ප්‍රේෂණය කිරීම.

ii. ගිණුම් හිමියාගේ ජ්‍යෙෂ්ඨ විදේශිකයන්ගේ රුපියල් ගිණුම වෙත අරමුදල් මාරු කිරීම.

iii. ඇ.එ.ජ. ඩොලර් 10,000ක් දක්වා විදේශ මුදල් නෝට්ටු වලින් සිදුකරන ආපසු ගැනීම්.

(ආ) ජ්‍යෙෂ්ඨ විදේශිකයන්ගේ ස්ථාවර තැන්පතු ගිණුම මත ගෙවන පොලිය, ගිණුම් හිමියාගේ ජ්‍යෙෂ්ඨ විදේශිකයන්ගේ රුපියල් ගිණුම වෙත මාරු කළ යුතුය.

3.2 ජ්‍යෙෂ්ඨ විදේශිකයන්ගේ රුපියල් ගිණුම

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවට හෝ බලයලත් වෙළෙඳුන්ට අදාළ පරිදි ප්‍රකාශ කොට ශ්‍රී ලංකාවට රැගෙනවිත් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කළ ඇ.එ.ජ. ඩොලර් 1,500 ක් හෝ වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන ප්‍රමාණයක අවම ශේෂයක් සහිතව ජංගම හෝ ඉතුරුම් ආකාරයෙන් මෙම ගිණුම් විවෘත කළහැක.

3.2.1 අවසරලත් බැර කිරීම්

(අ) ගිණුමේ හිමියාගේ නඩත්තු සඳහා (මාසිකව එක්සත් ජනපද ඩොලර් 1,500/-) සහ කලත්‍රයාගේ / අනෙකුත් යැපෙන්නන්ගේ නඩත්තු සඳහා (එක් එක් යැපෙන්නා සඳහා මසකට එක්සත් ජනපද ඩොලර් 750 /-) ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවට හෝ බලයලත් වෙළෙන්දෙකු වෙත ප්‍රකාශ කොට ශ්‍රී ලංකාවට රැගෙන එන ලද විදේශ මුදල්.

(ආ) ගිණුම් හිමියාගේ ජ්‍යෙෂ්ඨ විදේශිකයන්ගේ ස්ථාවර තැන්පතු ගිණුමෙහි ඇති මුදල් මත උපයන ලද පොලිය.

3.2. අවසරලත් හර කිරීම්

(අ) ආයෝජකයාගේ සහ ඔහුගේ යැපෙන්නන්ගේ දේශීය වියදම්.

(ආ) ගිණුම්හිමියා සහ / හෝ ශ්‍රී ලංකාවේ සිටින යැපෙන්නන්ගේ ජංගම ගනුදෙනු සම්බන්ධ ගෙවීම් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටතට සිදු කරන ප්‍රේෂණ.

4 වාර්තා කිරීම් අවශ්‍යතාවන්

බලයලත් වෙළෙඳුන් විසින් ඇමුණුම I සහ ඇමුණුම II පරිදි මාසික වාර්තා එළඹෙන මාසයේ 15 වන දින හෝ ඊට ප්‍රථම dfe@cbsl.lk යන විද්‍යුත් ලිපිනය හරහා මෙම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම අවශ්‍ය කෙරේ.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තුමේන්තුව

**2017 අංක 07 දරන විධානයන් සඳහා වූ ඇමුණුම I**

**මාසික ප්‍රකාශනය - ජ්‍යෙෂ්ඨ විදේශිකයන්ගේ ස්ථාවර තැන්පතු ගිණුම (SFNFDA) පිළිබඳ මාසික ප්‍රකාශනය**

බැංකුවේ නම : ..................................................................................

වාර්තා කරන මාසය සහ වර්ෂය : ..........................................................

| ගිණුම් හිමියාගේ නම | මුදල් වර්ගය | මූලික තැන්පතු | ප්‍රතිමුඛ ප්‍රේෂණ/පිටත් වන අවස්ථාවේ ආපසු ගැනීම් | SFNFDA වෙත මාරු කරන ලද පොලිය | අවසන් ශේෂය |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |

බැංකුවේ ගිණුම් පොත්වලින් උපුටාගත්/උත්පාදනය වූ ඉහත තොරතුරු නිවැරදි බවට අපි සහතික වන්නෙමු.

බලයලත් නිලධාරියාගේ නම .................................................... අනුකූලතා නිලධාරියාගේ නම....................................................

අත්සන .................................................... අත්සන ....................................................

දිනය .................................................... දිනය ....................................................

**2017 අංක 07 දරන විධානයන් සඳහා වූ ඇමුණුම II**

**මාසික ප්‍රකාශනය - ජ්‍යෙෂ්ඨ විදේශිකයන්ගේ රුපියල් ගිණුම (SFNFRA) පිළිබඳ මාසික ප්‍රකාශනය**

බැංකුවේ නම : ..........................................................................................................................................

වාර්තා කරන මාසය සහ වර්ෂය : ..................................................................

| ගිණුම් හිමියාගේ නම | ආරම්භක ශේෂය | හර | | බැර | | අවසාන ශේෂය |
|---|---|---|---|---|---|---|
| | | ආමුඛ ප්‍රේෂණ/තැන්පතු | SFNFRA වෙත ලද පොළිය | ජංගම ගනුදෙනු සඳහා ගෙවීම් | දේශීය ගෙවීම් | |
| | | | | | | |
| | | | | | | |

බැංකුවේ ගිණුම් පොත්වලින් උපුටාගත්/උත්පාදනය වූ ඉහත තොරතුරු නිවැරදි බවට අපි සහතික වන්නෙමු.

බලයලත් නිලධාරියාගේ නම .............................................................. අනුකූලතා නිලධාරියාගේ නම.........................................................

අත්සන .............................................................. අත්සන ..............................................................

දිනය .............................................................. දිනය ..............................................................

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2017 අංක 08 දරන විධානයන්** 2017 නොවැම්බර් 20

# ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් පිළිබඳ බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2017 අංක 02 දරන විදේශ විනිමය (ප්‍රාග්ධන ගනුදෙනුවල නිරත වීමේ කාර්යය සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම) නියෝග සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 6 සහ 7 වගන්ති සමග කියැවෙන එකී පනතෙහි 9(1) සහ 9(2) වගන්ති ප්‍රකාරව පහත කොන්දේසිවලට යටත්ව ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් විවෘත කිරීම සඳහා බලයලත් වෙළෙඳුන් හට අවසර ලබා දෙනු ලැබේ.

1.1 සුදුසුකම්ලත් තැනැත්තන්

නියෝගයන් ප්‍රකාරව අවසරලත් තැනැත්තන් පහත පරිදි විය යුතුය.

i. ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථිර නේවාසික ශ්‍රී ලාංකික තනි පුද්ගලයෙකු
ii. ශ්‍රී ලාංකික ද්විත්ව පුරවැසියෙකු
iii. ශ්‍රී ලාංකික සම්භවයක් ඇති විජාතිකයෙකු
iv. ශ්‍රී ලංකාවෙන් පිටත වාසික විජාතිකයෙකු
v. ශ්‍රී ලංකාවෙන් පිටත වාසික ශ්‍රී ලාංකිකයෙකු
vi. ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි ආයතන හා සමාගම්

1.2 ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම

නියෝගයන් මගින් ශ්‍රී ලංකා මහ බැංකුවට ලබාදී ඇති අධිකාරිය ප්‍රකාරව, ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් විවෘත කිරීමේදී හා පවත්වාගෙන යාමේදී, නියෝගයන්හි සඳහන් කොන්දේසි වලට අමතරව පහත සඳහන් කොන්දේසි සැලකිල්ලට ගත යුතුය.

(අ) දේශීය බැංකු ඒකකයෙහි ශ්‍රී ලංකා රුපියල් වලින් ජංගම (චෙක්පත් නිකුත් කිරීමේ පහසුකම නොමැතිව), ඉතුරුම් හෝ කාලීන තැන්පතු ගිණුම් ආකාරයෙන් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම සිදු කළහැකිය.

(ආ) ඉහත 1.1 ඡේදයේ i සිට iv දක්වා අයිතම යටතේ සුදුසුකම්ලත් තැනැත්තෙකු වන පුද්ගලයෙකු ප්‍රතිමුඛ ප්‍රේෂණ සඳහා එක් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමක් පමණක් විවෘත කිරීම හා පවත්වාගෙන යාම සිදු කළ යුතුය.

(ඇ) තවත් සුදුසුකම්ලත් තැනැත්තෙකු සමග ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම හවුලේ පවත්වාගෙන යා හැකිය.

(ඈ) ඉහත 1.1 ඡේදයේ i සිට iv දක්වා අයිතම යටතේ සුදුසුකම්ලත් තැනැත්තෙකු වන බාලවයස්කරුවෙකු හට ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් විවෘත කළහැකිය.

1.3 අවසරලත් බැර කිරීම්

නියෝගයන් මගින් ශ්‍රී ලංකා මහ බැංකුවට ලබාදී ඇති අධිකාරිය ප්‍රකාරව, නියෝගයන්හි සඳහන් කර ඇති බැර කිරීම් වලට අමතරව, පහත බැරකිරීම් සඳහා අවසර දෙනු ලැබේ.

(අ) ප්‍රාග්ධන ගනුදෙනු මගින් ලැබුණු අරමුදල් හැර අනෙකුත් දේශීය බැර කිරීම්.

(ආ) ගිණුම්හිමියා, ඉහත 1.1 ඡේදයේ i සිට iii දක්වා අයිතම යටතේ සුදුසුකම්ලත් තැනැත්තෙකු වන අවස්ථාවකදී විශ්‍රාම පාරිතෝෂික, පොලී, ලාභාංශ, විශ්‍රාම වැටුප්, කුලී, කල්බදු කුලී සහ ලාභයන් හෝ වෙනත් ඕනෑම අනුමත විශ්‍රාම අරමුදල් යනාදිය.

(ඇ) ගිණුම් හිමියා, ඉහත 1.1 ඡේදයේ iv අයිතමය යටතේ සුදුසුකම්ලත් තැනැත්තෙක් වන අවස්ථාවක, උරුමයෙන් ලද චංචල හා නිශ්චල දේපළ ද ඇතුළුව දේශීය වත්කම් විකිණීමෙන් ලද ආදායම්.

(ඈ) ගිණුම් හිමියා, ඉහත 1.1 ඡේදයේ (v) අයිතමය යටතේ සුදුසුකම්ලත් තැනැත්තෙක් වන අවස්ථාවක, දේශීය වියදම් සඳහා පනතේ ප්‍රතිපාදනයන් ප්‍රකාරව ගිණුම් හිමියා විසින් ශ්‍රී ලංකා රුපියල් වලින් හෝ විදේශ මුදලින් ලබාගත් ණය මුදල් සහ අත්තිකාරම් වලින් ලැබෙන ආදායම්.

1.4 අවසරලත් හර කිරීම්

නියෝගයන් මගින් ශ්‍රී ලංකා මහ බැංකුවට ලබාදී ඇති අධිකාරිය ප්‍රකාරව, නියෝගයන්හි සඳහන් කර ඇති හර කිරීම් වලට අමතරව පහත හර කිරීම් සඳහා අවසර දෙනු ලැබේ.

(අ) ජංගම ගනුදෙනු හා සම්බන්ධ ඕනෑම ප්‍රතිමුඛ ප්‍රේෂණයක්

(ආ) ඉහත 1.1 ඡේදයේ i සිට iii දක්වා අයිතම යටතේ සුදුසුකම් ලත් තැනැත්තන් විසින් සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාව ශ්‍රී ලංකාවෙන් පිටත පවත්වාගෙන යන ගිණුමකට මාරු කිරීම.

(ඇ) ගිණුම් හිමියා, ඉහත 1.1 ඡේදයේ vi අයිතමය යටතේ සුදුසුකම් ලත් තැනැත්තෙක් වන අවස්ථාවක, බලයලත් වෙළෙන්දා විසින් ගිවිසුම්, ඉන්වොයිසි ප්‍රකාශන යනාදිය පරීක්ෂා කර බලා එවැනි අයදුමක සද්භාවය පිළිබඳව සෑහීමකට පත් වීමෙන් අනතුරුව පාදක වූ ජංගම ගනුදෙනුවක් වෙනුවෙන් ශ්‍රී ලංකාව තුළදී උපයා එකතු වූ අරමුදල් ප්‍රේෂණය කිරීම.

1.5 ප්‍රාග්ධන ගනුදෙනු සඳහා ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමක් විවෘත කිරීමේ ක්‍රියාපිළිවෙල

1.5.1 සංක්‍රමණික දීමනාව හුවමාරු කිරීමේ අරමුණ වෙනුවෙන් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමක් විවෘත කිරීමේ ක්‍රියාපිළිවෙල

(අ) ඉහත 1.1 ඡේදයේ i සිට iii දක්වා අයිතම යටතේ සුදුසුකම්ලත් පුද්ගලයෙකු වෙනුවෙන් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමක් විවෘත කිරීමේදී පරිලෝකනය කරන ලද පහත ලියවිලි dfe@cbsl.lk හරහා ඉදිරිපත් කිරීම මගින් බලයලත් වෙළෙඳුන් විසින් විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ අනුමැතිය ලබාගත යුතුය.

i. නිසිපරිදි සම්පූර්ණ කරන ලද ඇමුණුම I

ii. වර්තමාන විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්

iii. මුල් නික්මයාම, ගොඩබෑසීම සඳහා අදාල පිටසන් සහ හඳුනා ගැනීමේ පිටුවද ඇතුළත්ව ශ්‍රී ලාංකික විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක් (අදාළ පරිදි)

iv. ස්ථිර නේවාසිකත්වය (PR) සඳහා අදාළ පිටසනෙහි පිටපතක් හෝ ස්ථිර නේවාසිකත්වය ලබාගත් දිනය හා රට තහවුරු කර ගැනීම සඳහා අදාළ වෙනත් ලියවිල්ලක පිටපතක් (අදාළ පරිදි)

(ආ) විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක විසින් නිකුත් කරන ලද ලියාපදිංචි අංකයක් ලැබීමෙන් අනතුරුව බලයලත් වෙළෙඳුන් විසින් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමක් විවෘත කර එම ගිණුම හරහාම සුදුසුකම් ලත් පුද්ගලයන්ට මූලික දීමනා සහ පසු කාලීන දීමනා වශයෙන් පහත කොන්දේසි වලට යටත්ව විදේශ විනිමය නිකුත් කළ යුතුය.

i. වෙනත් රටක නිත්‍ය නේවාසිකත්වය (PR) ලබාගන්නා අවස්ථාවේදී වලංගු ශ්‍රී ලාංකික ගුවන්ගමන් බලපත්‍රයක් තිබුණේ නම්, තනි පුද්ගලයෙකු හට ඇ.එ.ජ. ඩොලර් 200,000 ක් දක්වා මූලික සංක්‍රමණික දීමනාවක් සහ ඇ.එ.ජ. ඩොලර් 30,000 ක වාර්ෂික සංක්‍රමණික දීමනාවක්.

ii. එම ඇ.එ.ජ. ඩොලර් 30,000 පළමු වාර්ෂික දීමනාව, ඇ.එ.ජ. ඩොලර් 200,000 මූලික දීමනාව සම්පූර්ණයෙන්ම භාවිතා කර මාස 12 ක කාලයක් ගතවූ පසු ප්‍රේෂණය කළහැකිය.

iii. මූලික සංක්‍රමණික දීමනාව හැරුණු කොට පසුකාලීන දීමනාවන් ලිත් වර්ෂයකට වරක් ප්‍රේෂණය කළහැකිය.

iv. විගාමිකයෙකු පෙර වර්ෂයකට අදාළ වාර්ෂික දීමනාව ප්‍රේෂණය කර නොමැති අවස්ථාවදී එය සමුච්චිතව මාරු කළහැකිය.

v. නිත්‍ය නේවාසිකත්වය ලබා පළමුවරට ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන අවස්ථාවේදී, සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාවෙන් ඇ.එ.ජ. ඩොලර් 10,000 ක් දක්වා මුදල් නෝට්ටුවලින් ලබාගත හැකිය.

vi. ඉහත 1.1 ඡේදයේ I සිට III දක්වා අයිතම යටතේ සඳහන් කර ඇති සුදුසුකම්ලත් පුද්ගලයෙකුහට විදේශ විනිමය විකිණීමට අදාල දිනය, නිකුත් කළ විදේශ විනිමය ප්‍රමාණය, ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමේ ලියාපදිංචි අංකය සහ සංක්‍රමණය වන රට යනාදිය සඳහන් කරමින් එම පුද්ගලයාගේ නිත්‍ය නේවාසිකත්වයට අදාළ මුද්‍රාව ඇති ශ්‍රී ලාංකික විදේශ ගමන් බලපත්‍රය බලයලත් වෙළෙඳුන් විසින් නිසි පරිදි පිටසන් කළ යුතුය.

1.5.2 ප්‍රාග්ධන අරමුදල් ප්‍රේෂණය කිරීමේ අරමුණ වෙනුවෙන් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමක් විවෘත කිරීමේ ක්‍රියාපිළිවෙල

(අ) ඉහත 1.1 ඡේදයේ (iv) වැනි අයිතමය යටතේ සුදුසුකම්ලත් පුද්ගලයෙකු වෙනුවෙන් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමක් විවෘත කිරීමේදී පරිලෝකනය කරන ලද පහත ලියවිලි dfe@cbsl.lk හරහා ඉදිරිපත් කිරීම මගින් බලයලත් වෙළෙඳුන් විසින් විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ අනුමැතිය ලබාගත යුතුය.

i. නිසි පරිදි සම්පූර්ණ කරන ලද ඇමුණුම I

ii. වර්තමාන විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්

(ආ) විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක විසින් නිකුත් කරන ලද ලියාපදිංචි අංකයක් ලැබීමෙන් අනතුරුව බලයලත් වෙළෙඳුන් විසින් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමක් විවෘත කළයුතු අතර ශ්‍රී ලංකාවේ උරුම වූ වත්කම් විකිණීමෙන් ලද විකුණුම් ආදායමෙන් වර්ෂයකට ඇ.එ.ජ. ඩොලර් 30,000ක් දක්වා විදේශ විනිමය නිකුත් කළහැකිය.

2 අනෙකුත් අවශ්‍යතා

(අ) ඉහත 1.1 ඡේදයේ i සිට iv දක්වා අයිතම යටතේ සුදුසුකම්ලත් පුද්ගලයන් හට ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් විවෘත කිරීමෙන් පසු එම ගිණුමට වෙන් කළ අංකය, එය වෙන් කළ වහාම මෙම දෙපාර්තමේන්තුවට දැන්විය යුතුය.

(ආ) ඉහත 1.1 ඡේදයේ i සිට iv දක්වා අයිතම යටතේ සුදුසුකම්ලත් පුද්ගලයන් වෙනුවෙන් විවෘත කරන ලද ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ පූර්ව අනුමැතියකින් තොරව වසා නොදැමිය යුතුය.

(ඇ) ශ්‍රී ලංකා රුපියල් ගිණුමක් පවත්වාගෙන යන ගිණුම් හිමියෙකු හෝ හවුල් ගිණුම් හිමියෙකු හෝ ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන ශ්‍රී ලාංකිකයෙකු බවට දැනුවත් වූ වහාම හෝ ඒ බව විශ්වාස කිරීමට තරම් ප්‍රමාණවත් සාධක ඇති අවස්ථාවකදී, බලයලත් වෙළෙඳුන් විසින් එවැනි ගිණුම් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් ලෙස නැවත නම් කළයුතු අතර ඒ පිළිබඳව යෝග්‍ය පරිදි ගිණුම් හිමියාද දැනුවත් කළ යුතුය.

(ඈ) ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් අංකය සහ මෙම දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ලියාපදිංචි අංකය භාවිතයෙන් පුද්ගලයෙකු හඳුනාගත හැකි යාන්ත්‍රණයක් බලයලත් වෙළෙඳුන් හට තිබිය යුතුය.

(ඉ) බලයලත් වෙළෙන්දා විසින් එක් එක් ප්‍රේෂණයට අදාල ලිඛිත සාක්ෂි පුද්ගලයාගෙන් ලබාගත යුතු අතර, එම වාර්තා දෘඪ හෝ මෘදු පිටපත් වශයෙන් පවත්වාගෙන යා යුතුය. මෙම විධානය යටතේ සිදු කරනු ලබන මාරු කිරීම්වලට අදාල වාර්තා පවත්වාගෙන යාමේ කාලය ව්‍යවස්ථාපිත වාර්තා තැබීමේ අවශ්‍යතාවයන්ට සීමා නොවිය යුතුය. ඉහත 1.1 ඡේදයේ i සිට iv දක්වා අයිතම යටතේ සුදුසුකම්ලත් පුද්ගලයන් සඳහා ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් විවෘත කිරීමේදී බලයලත් වෙළෙඳුන් විසින් ඇමුණුම 2 හෝ ඇමුණුම 3 හි (අදාළ පරිදි) දක්වා ඇති ලියවිලි ලබාගත යුතුය.

3. මාසික වාර්තා

බලයලත් වෙළෙඳුන් විසින් මෙම විධානයන් යටතේ විගාමිකයන් හට විදේශ විනිමය විකිණීම සම්බන්ධයෙන් මාසික වාර්තා, ඇමුණුම 4 හි දැක්වෙන ආකෘතියට අනුව විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත විද්‍යුත් තැපැල (dfem@cbsl.lk) හරහා එළඹෙන මාසයේ 15 වැනි දිනට පෙර එවිය යුතුය.

4. මෙම විධිවිධානවල කාර්යය සඳහා

(අ) "සංක්‍රමණික දීමනාව" යන්නට විගාමිකයා සතුව පැවති චංචල හා නිශ්චල දේපළ, ස්පෘශ්‍ය හෝ අස්පෘශ්‍ය වත්කම් විකිණීමෙන් ලද ප්‍රතිෂ්ඨා මුදල් සහ විගාමිකයාගේ කලත්‍රයාගෙන් හෝ දෙමව්පියන්ගෙන් ලද ත්‍යාග යනාදිය ඇතුළත් වේ. වත්කම් යන්නට වටිනා ගල් වර්ග, වටිනා ලෝහ, පෞද්ගලික ස්වර්ණාභරණ සහ ප්‍රතිලාභීන් වශයෙන් උරුම වූ වතු ඇතුළුව ලංකාව තුළ ඇති වෙනත් වත්කම් යනාදිය ඇතුළත් වේ.

(ආ) "විගාමිකයා" යන්නෙන් වෙනත් රටක ස්ථිරව පදිංචි වීම පිණිස ස්වකීය රට හැර දමා යන පුද්ගලයෙකු අදහස් වේ.

(ඇ) "ශ්‍රී ලාංකිකයා" යන්නෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු අදහස් වේ.

(ඉ) "ශ්‍රී ලංකාවෙන් පිටත වාසික ශ්‍රී ලාංකිකයෙකු" යන්නෙන් වෘත්තියක නිරතවීම සඳහා හෝ ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා හෝ වෘත්තියක නියැලීම සඳහා ශ්‍රී ලංකාවෙන් පිටතට ගොස් සිටින ශ්‍රී ලාංකික පුරවැසියෙකු අදහස් වේ.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව

**2017 අංක 08 දරණ විධානයන් සඳහා ඇමුණුම 1**

## විදේශ විනිමය නිකුත් කිරීමේ අයදුම්පත

ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමක් විවෘත කිරීම සඳහා අයදුම්පත (CTRA)

1. ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් හිමියාගේ තොරතුරු

(අ) සම්පූර්ණ නම* : ........................................

(ආ) ජාතික හැඳුනුම්පත් අංකය :........................................

(ඇ) වර්තමාන විදේශ ගමන් බලපත්‍ර අංකය* :........................................

(ඈ) ශ්‍රී ලංකා විදේශ ගමන් බලපත්‍ර අංකය (ඇත්නම්) :........................................

(ඉ) උපන් දිනය :........................................

(ඊ) නිත්‍ය නේවාසිකත්වය ලබාගත් දිනය: ........................................

(උ) නිත්‍ය නේවාසිකත්වය ලබාගත් රට/පුරවැසිභාවය*: ........................................

(ඌ) නිකුත් කිරීමට අපේක්ෂිත විදේශ විනිමය ප්‍රමාණය*: ........................................

2. බලයලත් වෙළෙන්දාගේ තොරතුරු*

(අ) නම :........................................

(ආ) ශාඛාව :........................................

(ඇ) ශාඛාවේ ලිපිනය : ........................................

(ඈ) විද්‍යුත් තැපෑල : ........................................

(ඉ) ඉල්ලුම් කරන නිලධාරියාගේ නම :........................................

(ඊ) තනතුර : ........................................

(උ) දුරකථන අංකය :........................................

(ඌ) දිනය :........................................

සටහන: 1. *බලයලත් වෙළෙඳුන් විසින් ඉහත 1.1 ඡේදයේ iv අයිතමය අනුව සුදුසුකම්ලත් පුද්ගලයන් සඳහා අදාල තොරතුරු ඉදිරිපත් කළ යුතුය.

2 ඉහත නියම කළ පරිදි නිවැරදි හා සම්පූර්ණ තොරතුරු බලයලත් වෙළෙඳුන් විසින් ඉදිරිපත් කළ යුතුය.

**2018 අංක 08 දරණ විධානයන් සඳහා ඇමුණුම 2**

1.1 ඡේදයේ i සිට iii දක්වා අයිතම යටතේ සුදුසුකම්ලත් පුද්ගලයන් වෙත සංක්‍රමණික දීමනාව නිකුත් කිරීමේදී ලබා ගතයුතු ලියවිලි

සංක්‍රමණික දීමනාව නිකුත් කිරීමේදී, බලයලත් වෙළෙන්දා විසින් පහත තොරතුරු/ලියවිලි ලබාගත යුතුය.

i. විගාමිකයා විසින් ඉදිරිපත් කරන විධිමත් අයදුම්පත (මේ සඳහා ආකෘතියක් පවත්වාගෙන යන ලෙස බලයලත් වෙළෙඳුන් හට උපදෙස් දෙනු ලැබේ).
ii. නිත්‍ය නේවාසිකත්වය (PR), පුරවැසිභාවය (අදාළ නම්) සහ ද්විත්ව පුරවැසිභාවය (අදාළ නම්), තහවුරු කිරීම සඳහා අදාල ලියවිලි.
iii. අරමුදල්වල මූලාශ්‍රය තහවුරු කිරීම සඳහා වලංගු ලියවිලි අදාළ පරිදි උප්පැන්න සහතිකයේ හෝ විවාහ සහතිකයේ සහතික කළ පිටපත් සමඟ පැවරුම්කරු විසින් අත්සන් කරන ලද කැමැත්ත ප්‍රකාශ කිරීමේ ලිපියක් අයදුම්කරු ඉදිරිපත් කරන්නේ නම්, අයදුම්කරුගේ දෙමව්පියන්ගෙන් හෝ කලත්‍රයාගෙන් ලැබෙන ත්‍යාග අරමුදල් මූලාශ්‍රයන් ලෙස පිළිගත හැක.
iv. ප්‍රේෂණය කිරීමට බලාපොරොත්තු වන මුදල සඳහා ශ්‍රී ලංකා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජෙනරාල්ගෙන් ලබාගත් බදු නිෂ්කාශන සහතිකය.
v. ඇ.එ.ජ. ඩොලර් 200,000 මූලික මුදල් දීමනාව හෝ ඇ.එ.ජ. ඩොලර් 30,000 වාර්ෂික දීමනාව ඉක්මවා කිසිදු ප්‍රේෂණයක් සිදු කර නොමැති බවට හා එසේ නොකරන බවට සාමදාන විනිශ්චයකාර/දිවුරුම් කොමසාරිස්/සොලිසිටර් වරයෙකු විසින් සහතික කර නිසි පරිදි මුද්‍රා තැබූ දිවුරුම් ප්‍රකාශයක්. දිවුරුම් ප්‍රකාශය නිකුත් කරනු ලබන දිනයට පෙර කිසියම් සංක්‍රමණික දීමනාවක් භාවිතා කර තිබුණේ නම් ඒ බව ප්‍රකාශ කළ යුතුය.
vi. නිත්‍ය නේවාසිකත්වය ලබාගන්නා අවස්ථාවේ සිට මේ දක්වා තිබූ සියළුම ශ්‍රී ලාංකික විදේශ ගමන් බලපත්‍රවල සියළු පිටුවල පිටපත්.
vii. ගුවන් ටිකට්පතෙහි පිටපතක්.
viii. විගාමිකයාගේ ඇටෝර්නි බලපත්‍රයේ පිටපතක් (අදාළ අවස්ථාවේදී).
ix. නිසි පරිදි සම්පූර්ණ කරන ලද පෝරම 3 (ඇමුණුම 5).
x. ඉහත දැක්වෙන ලියවිලිවලට අමතරව, බලයලත් වෙළෙඳුන් විසින් ඔවුන්ගේ අභ්‍යන්තර ක්‍රියාපටිපාටිවලට අනුකූලවීම සඳහා අවශ්‍ය වෙනත් ඕනෑම ලියවිල්ලක් ලබාගත හැකිය.

**2017 අංක 08 දරණ විධානයන් සඳහා ඇමුණුම 3**

1.1 ඡේදයේ IV වැනි අයිතමය යටතේ සුදුසුකම්ලත් පුද්ගලයන් සඳහා ප්‍රාග්ධන අරමුදල් නිකුත් කිරීමේ දී ලබාගත යුතු ලියවිලි

ශ්‍රී ලංකාව තුළ උරුමයෙන් ලද දේශීය වත්කම් විකිණීමෙන් ලද ප්‍රාග්ධන අරමුදල් සඳහා විදේශ විනිමය නිකුත් කිරීමේදී බලයලත් වෙළෙන්දා විසින් පහත තොරතුරු/ලියවිලි ලබාගත යුතුය.

i. අයදුම්කරු විසින් ඉදිරිපත් කරන විධිමත් අයදුම්පතක් (මේ සඳහා ආකෘතිපත්‍රයක් පවත්වාගෙන යන ලෙස බලයලත් වෙළෙඳුන් හට උපදෙස් දෙනු ලැබේ.).
ii. අයදුම්කරන්නාගේ වර්තමාන විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්.
iii. අරමුදල්වල මූලාශ්‍රය තහවුරු කර ගැනීම සඳහා වලංගු ලියවිලි.
iv. ප්‍රේෂණය කිරීමට බලාපොරොත්තු වන මුදල සඳහා ශ්‍රී ලංකා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජෙනරාල්වරයාගෙන් ලබාගත් බදු නිෂ්කාශන සහතිකයක් (අවශ්‍ය නම්).
v. ඉහත දක්වා ඇති ලියවිලිවලට අමතරව බලයලත් වෙළෙඳුන් විසින් ඔවුන්ගේ අභ්‍යන්තර ක්‍රියාපටිපාටීන්වලට අනුකූලවීම සඳහා අවශ්‍ය වන වෙනත් ඕනෑම ලියවිල්ලක් ලබා ගත හැකිය.

**2017 අංක 08 දරණ විධානයන් සඳහා ඇමුණුම 4**

## ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමෙහි මාසික වාර්තාව (CTRA)

බැංකුවේ නම : ..........................................

වාර්තා කරන මාසය සහ වර්ෂය : ..........................................

| ගිණුම් හිමියාගේ තොරතුරු | | | | | | ගිණුමේ තොරතුරු | | | ප්‍රාග්ධන ප්‍රේෂණ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| සම්පූර්ණ නම | විදේශ ගමන් බලපත්‍ර අංකය | ජා.හැ.අ. | නිත්‍ය නේවාසිකත්වය ලබාගත් දිනය | නිත්‍ය නේවාසිකත්වය ලබාගත් රට/ජාතිකත්වය | CTRA ගිණුම් සංඛ්‍යාව | CTRA ලියාපදිංචි අංකය | ගිණුම් අංකය | මුදල් වර්ගය | ගණුදෙනුව සිදු වූ දිනය | PFCA | IIA | ලංකාවෙන් පිටත තිබෙන විදේශීය ගිණුම | මුළු මුදල |
| | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | |

බැංකුවේ ගිණුම් පොත්වලින් උපුටාගනු ලැබූ/උත්පාදනය වූ ඉහත තොරතුරු නිවැරදි බව අපි සහතික කරමු.

බලයලත් නිලධාරියාගේ නම ..........................................
අත්සන ..........................................
දිනය ..........................................

අනුකූලතා නිලධාරියාගේ නම..........................................
අත්සන ..........................................
දිනය ..........................................

**2017 අංක 08 දරන විධානයන් සඳහා ඇමුණුම 5**

| බ.වෙ. | ශාඛාව | අනුක්‍රමික අංකය |
|---|---|---|
| | | |

ශ්‍රී ලංකා මහ බැංකුව

විදේශ විනිමය නිකුත් කිරීම පිළිබඳ තොරතුරු

පෝරම 3 - විගාමිකයන්ට විදේශ විනිමය විකුණුම්

බලයලත් වෙළෙන්දා වෙත

විදේශ විනිමය සඳහා ඉල්ලුම්කරුවා විසින් සම්පූර්ණ කරනු ලැබිය යුතුය.

සම්පූර්ණ නම :

වර්තමාන ලිපිනය :

විදේශීය ලිපිනය :

ජාතිය :

ජා.හැ.අංකය සහ විදේශ ගමන් බලපත්‍ර අංකය :

පිටත්වීමට යෝජිත දිනය :

ගමනාන්තය :

මිලදී ගැනීමේ/ප්‍රේෂණයේ අරමුණ :

විදේශ විනිමය අයදුම් කරනු ලබන්නේ:

විදුලි මුදල් පැවරුම් :

අණකර :

ව්‍යවහාර මුදල් නෝට්ටු :

වෙනත් (නිශ්චිතව සඳහන් කරන්න)

මා ඉහත ගමනාන්තය වශයෙන් දක්වා ඇති රටෙහි ස්ථිර නේවාසිකත්වය සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත් වන/ පිටත් වූ බවත් මේ සමග සපයන ලද ලියවිලි මාගේ දැනුම හා විශ්වාසයන් ප්‍රකාරව සත්‍ය හා නිවැරදි බවත් ප්‍රකාශ කරමි. මෙම අරමුණ සඳහා යම් වෙනත් බලයලත් වෙළෙන්දෙකු වෙත වෙනත් ඉල්ලුම්පතක් යොමු කර නොමැති බවද ප්‍රකාශ කරමි.

...............................................................................

දිනය : ඉල්ලුම්කරුගේ අත්සන

වර්ෂය මාසය දිනය

විදේශ විනිමය අධ්‍යක්ෂ වෙත

විදේශ විනිමය නිකුත් කිරීමට අධිකාරිය ලත් බලයලත් වෙළෙන්දා විසින් සම්පූර්ණ කරනු ලැබිය යුතුය.

බැංකු කේතය :

ශාඛා කේතය :

රටෙහි කේත අංකය :

කාර්ය අරමුණු කේත අංකය :

ව්‍යවහාර මුදල් කේත අංකය :

නිදහස් කරන ලද විදේශ විනිමය :

විදුලි මුදල් පැවරුම් :

අණකර :

ව්‍යවහාර මුදල් නෝට්ටු :

වෙනත් (නිශ්චිතව සඳහන් කරන්න)

බැංකු යොමු අංකය :

මා විසින් ඉහත ලේඛනය පරීක්ෂා කර, ඉල්ලීමේ සද්භාවය පිළිබඳ සෑහීමකට පත්වූ ඉල්ලුම්කරු විසින් සඳහන් කළ අරමුණ සඳහා විදේශ විනිමය විකුණූ බවටත් ස්ථිර කරමි.

...............................................................................

දිනය බලයලත් වෙළෙන්දාගේ අත්සන හා නිල මුද්‍රාව

වර්ෂය මාසය දිනය

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2017 අංක 09 දරන විධානයන්** 2017 නොවැම්බර් 20

# ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන් සඳහා වූ ණය පහසුකම් සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි (පනත) 6 හා 7 වගන්ති සමග කියැවෙන පනතේ 9(1) සහ 9(2) වගන්ති ප්‍රකාරව, ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් සඳහා පහත සඳහන් කොන්දේසිවලට යටත්ව, දේශීය බැංකු ඒකකවලින් විදේශ ව්‍යවහාර මුදලින් ණය පහසුකම් ලබාදීම පිණිස බලයලත් වෙළෙඳුන් හට අවසර ලබාදේ.

2) බලයලත් වෙළෙඳුන් විසින් මෙම ණය පහසුකම්, ඔවුන්ගේ දෛනික ව්‍යාපාරික කටයුතු වලදී ගනු ලබන තීරණයන්හි කොටසක් ලෙස නිර්ණය කරනු ලබන ශ්‍රී ලංකාව තුළ වූ ඕනෑම අරමුණක් වෙනුවෙන් භාවිතා කිරීම සඳහා ප්‍රදානය කළහැකිය.

3) බලයලත් වෙළෙඳුන් විසින් ණය පහසුකම් ප්‍රදානය කළයුත්තේ, මෙම ණය පහසුකම සම්පූර්ණයෙන් හා නියමිත වේලාවට පියවිය හැකි අයුරින් තමන්ගේ දෛනික ව්‍යාපාරික කටයුතුවලදී නිරන්තර විදේශ විනිමය ප්‍රවාහ ලැබේ යැයි බලයලත් වෙළෙඳුන් විසින් සෑහීමකට පත් වූ විදේශ විනිමය උපයන්නන් සඳහා පමණි.

4) ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන්ගේ පවතින හා අපේක්ෂිත විදේශ විනිමය ප්‍රවාහ තුළින් ණය පහසුකම පියවීමේ හැකියාව පිළිබඳව විචක්ෂණශීලී ඇගයීමක් බලයලත් වෙළෙඳුන් විසින් සිදු කළයුතු අතර ඔවුන්ගේ ඇගයීම සනාථ කිරීම සඳහා වාර්තාවන් ද පවත්වාගෙන යා යුතුය.

5) ශ්‍රී ලංකා රුපියල්වලින් ණය ආපසු අය කර ගැනීම සිදු කළහැකි වන්නේ, බලයලත් වෙළෙඳුන් විසින් තමන්ගේ මූල්‍ය ප්‍රකාශනවල එම ණය පහසුකම සම්පූර්ණයෙන් හානිකරණය වී ඇතැයි හඳුනාගත් දින සිට දින 90කට නොඅඩු අවස්ථාවකදී පමණි. එම දිනට ප්‍රථම ශ්‍රී ලංකා රුපියල්වලින් ණය ආපසු අය කර ගැනීම සඳහා විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය.

6) මෙම විධානයන් යටතේ ප්‍රදානය කරන ලද ණය පහසුකම් පිළිබඳව මාසික වාර්තා එළඹෙන මාසයේ 15 වන දින හෝ ඊට පෙර බලයලත් වෙළෙඳුන් විසින් ඇමුණුම 1 හි පරිදි dfem@cbsl.lk යන විද්‍යුත් ලිපිනය හරහා විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

7) අවලංගු කරන ලද 1953 අංක 24 දරන විනිමය පාලන පනත යටතේ විදේශ විනිමය උපයන්නට ප්‍රදානය කරන ලද ණය සම්බන්ධ කොන්දේසි හා නියමයන් සහ ණය ආපසු අය කර ගැනීම මෙම විධානයන් පරිදි විය යුතුය.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව

**2017 අංක 9 දරන විධානය සඳහා වූ ඇමුණුම 1**

## ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන්ට ප්‍රදානය කරන ලද ණය පිළිබඳ මාසික ප්‍රකාශනය

බැංකුවේ නම : ..............................................................................................................................................

වාර්තා කරන මාසය සහ වර්ෂය : ..................................................................

| ණය ගැණුම්කරුගේ නම | ණය ප්‍රදානය කරන ලද දිනය | මුදල් වර්ගය | කාලසීමාව | ප්‍රදානය කරන ලද මුදල | ණය ලබාදීමේ අරමුණ |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |

බැංකුවේ ගිණුම් පොත්වලින් උපුටාගත්/උත්පාදනය වූ ඉහත තොරතුරු නිවැරදි බව අපි සහතික වන්නෙමු.

බලයලත් නිලධාරියාගේ නම ........................................................................ අනුකූලතා නිලධාරියාගේ නම........................................................................

අත්සන ........................................................................ අත්සන ........................................................................

දිනය ........................................................................ දිනය ........................................................................

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2017 අංක 10 දරන විධානයන්** 2017 නොවැම්බර් 20

## විදේශයන්හි සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයන් හට ණය සහ අත්තිකාරම් ලබාදීම පිළිබඳව බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2017 අංක 01 දරන විදේශ විනිමය (බලයලත් වෙළෙඳුන් විසින් විදේශ ව්‍යවහාර මුදලින් සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග (නියෝග) සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 9(2) වගන්තිය ප්‍රකාරව, පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පවත්වාගෙන යනු ලබන විදේශයන්හි සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයන් හට ශ්‍රී ලංකාව තුළ දී ඕනෑම අරමුණක් වෙනුවෙන් භාවිතා කිරීම පිණිස තම දේශීය බැංකු ඒකකවලින් ණය සහ අත්තිකාරම් ප්‍රදානය කිරීම සඳහා පහත සඳහන් කොන්දේසි වලට යටත්ව බලයලත් වෙළෙඳුන් වෙත අවසර දෙනු ලැබේ.

2. විදේශ ව්‍යවහාර මුදලින් ප්‍රදානය කරනු ලබන ණය සහ අත්තිකාරම්

2.1 ණය ආපසු ගෙවීම සඳහා ණය ගැනුම්කරු සතුව විදේශ ව්‍යවහාර මුදල් ඉපැයීම් පවතින්නේ නම් පමණක් විදේශ ව්‍යවහාර මුදලින් ණය සහ අත්තිකාරම් ප්‍රදානය කළ යුතු අතර බලයලත් වෙළෙඳුන් විසින් ණය ගැනුම්කරුගේ විදේශ රැකියාව හෝ ඔහුගේ/ඇයගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙහි පවතින ශේෂයන් සැලකිල්ලට ගනිමින් ඔහුට/ඇයට විදේශ ව්‍යවහාර මුදලින් ණය ආපසු ගෙවීමට ඇති හැකියාව පිළිබඳ ව තක්සේරු කර සෑහීමට පත්විය යුතුය.

2.2 විදේශ ව්‍යවහාර මුදල් පිළිගැනීමට අවසර ලබා දී ඇති නේවාසික හෝ වාණිජ දේපළ සංවර්ධනය කරනු ලබන ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් (එනම්, ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන් සහ ශ්‍රී ලංකාව තුළ දේපළ විකිණීමේ ව්‍යාපාරයෙහි නිරත වන අක්වෙරළ බැංකු ඒකක ගිණුම් හිමියන්) විසින් පවත්වාගෙන යනු ලබන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් වලට ප්‍රතිෂ්ඨා ණය මුදල් මාරු කරන ලෙස ණයගැතියා ඉල්ලා සිටින්නේ නම් මිස ණයගැතියාට ප්‍රතිෂ්ඨාපන ණය මුදල ශ්‍රී ලංකා රුපියල්වලින් නිදහස් කරනු ලැබිය යුතුය.

3. ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රදානය කරනු ලබන ණය සහ අත්තිකාරම්

3.1 ණය මුදල ආපසු අයකර ගැනීමට ඇති අවධානම, විශේෂයෙන්ම, ණය ගැනුම්කරුගේ විදේශ සේවා නියුක්තියට අදාළව ඔහුගේ/ඇයගේ ණය ආපසු ගෙවීමට ඇති හැකියාව පිළිබඳව තක්සේරු කොට සෑහීමට පත්වීමෙන් පසුව ශ්‍රී ලංකා රුපියල්වලින් ණය සහ අත්තිකාරම් ප්‍රදානය කළ යුතු ය.

3.2 ණය ගැනුම්කරු හට ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රතිෂ්ඨා ණය මුදල නිදහස් කරනු ලැබිය යුතුය.

4. විදේශ ව්‍යවහාර මුදලින් සහ ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රදානය කෙරෙන ණය සහ අත්තිකාරම්වල කාල සීමාව, සුරැකුම, ආපසු ගෙවීම හෝ ගෙවීම පැහැර හැරීමක දී විදේශ ව්‍යවහාර මුදලින් ශ්‍රී ලංකා රුපියල්වලින් ණය අයකර ගැනීම නියෝග ප්‍රකාරව විය යුතුය.

5. අනෙකුත් කොන්දේසි

5.1 ණය මුදල සම්පූර්ණයෙන් පියවන තෙක්, බලයලත් වෙළෙඳුන් විසින් ණය මුදල ප්‍රදානය කළ අවස්ථාවේ දී ලබාගන්නා ලද ලේඛනගත සාක්ෂි, ඕනෑම ව්‍යවස්ථාපිත වාර්තා පවත්වාගෙන යාමේ අවශ්‍යතාවක් ඉක්මවා පවත්වාගෙන යා යුතුය. ණය මුදල සම්පූර්ණයෙන් පිය වූ පසු, අදාළ ලේඛනගත සාක්ෂි, ව්‍යවස්ථාපිත වාර්තා තබා ගැනීමේ අවශ්‍යතාවය පරිදි පවත්වාගෙන යා යුතුය.

5.2 බලයලත් වෙළෙඳුන් විසින් ඇමුණුම I පරිදි මෙම විධානයන් යටතේ ප්‍රදානය කරන ලද ණය මුදල් පිළිබඳව මාසික වාර්තාවන් එළඹෙන මාසයේ 15 වන දින හෝ ඊට ප්‍රථම dfem@cbsl.lk යන විද්‍යුත් ලිපිනය හරහා අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම අවශ්‍ය කෙරේ.

5.3 අවලංගු කරන ලද 1953 අංක 24 දරන විනිමය පාලන පනතේ විධිවිධාන යටතේ විදේශයන්හි සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයන් හට ප්‍රදානය කරන ලද ණය සහ අත්තිකාරම් සම්බන්ධයෙන් වූ වගන්ති සහ කොන්දේසි සහ ඒවා පියවාගැනීම ද මෙම නියෝග ප්‍රකාරව බලාත්මක විය යුතුය.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව

**2017 අංක 10 දරන විධානයන් සඳහා වූ ඇමුණුම I**

## විදේශයන්හි සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයන් හට ණය සහ අත්තිකාරම් ප්‍රදානය කිරීම පිළිබඳ ව මාසික ප්‍රකාශනය

බැංකුවේ නම : ..........................................................................................................................................

වාර්තා කරන මාසය සහ වර්ෂය : ..................................................................

| ණය වර්ගය | ණය ගැනුම්කරුගේ නම | ණය ප්‍රදානය කරන ලද දිනය | ණය කාලසීමාව | ප්‍රදානය කරන ලද මුදල | ණය ලබාදීමේ අරමුණ | ඇප සුරැකුමෙහි ස්වභාවය |
|---|---|---|---|---|---|---|
| විදේශ ව්‍යවහාර මුදලින් ප්‍රදානය කරන ලද ණය (විදේශ ව්‍යවහාර මුදල් වර්ගය සඳහන් කරන්න) | | | | | | |
| ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රදානය කරන ලද ණය | | | | | | |

බැංකුවේ ගිණුම් පොත්වලින් උපුටාගත්/උත්පාදනය වූ ඉහත තොරතුරු නිවැරදි බව අපි සහතික වන්නෙමු.

බලයලත් නිලධාරියාගේ නම .............................................................................

අත්සන .............................................................................

දිනය .............................................................................

අනුකූලතා නිලධාරියාගේ නම.........................................................................

අත්සන .............................................................................

දිනය .............................................................................

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2017 අංක 11 දරන විධානයන්** 2017 නොවැම්බර් 20

## ස්ථිර නේවාසික වීසා මත ශ්‍රී ලංකාවෙන් පිටත වාසික ශ්‍රී ලාංකිකයන් (PR) සහ ද්විත්ව පුරවැසිභාවය ලබා සිටින පුද්ගලයන් හට ලබාදෙන ණය පිළිබඳ බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2017 අංක 01 දරන විදේශ විනිමය (බලයලත් වෙළෙඳුන් විසින් විදේශ ව්‍යවහාර මුදලින් සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 9(2) වගන්තිය ප්‍රකාරව, වෙනත් රටක සථිර නේවාසික වීසා යටතේ ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන ශ්‍රී ලාංකිකයන් සහ ශ්‍රී ලංකාවේ සහ වෙනත් රටක ද්විත්ව පුරවැසිභාවය ලබාගෙන සිටින පුද්ගලයන් හට ඔවුන්ගේ නේවාසික තත්ත්වය නොසළකා පහත සඳහන් රෙගුලාසිවලට යටත්ව, තම දේශීය බැංකු ඒකක වලින් ණය ප්‍රදානය කිරීම සඳහා බලයලත් වෙළෙඳුන් වෙත අවසර දෙනු ලැබේ.

**2. ණය ප්‍රදානය කිරීමේ අරමුණ**

2.1 ශ්‍රී ලංකාව තුළ නේවාසික දේපළක් අත්පත් කර ගැනීම සඳහා

2.2 ශ්‍රී ලංකාව තුළ නේවාසික දේපළක් ඉදිකිරීම/සංවර්ධනය/නවීකරණය කිරීම සඳහා

**3. විදේශ ව්‍යවහාර මුදලින් ප්‍රදානය කරනු ලබන ණය (විදේශ ව්‍යවහාර මුදල් ණය)**

3.1 ණය ආපසු ගෙවීම සඳහා ණය ගැනුම්කරු සතුව විදේශ ව්‍යවහාර මුදල් ඉපැයීම් පවතින්නේ නම් පමණක් විදේශ ව්‍යවහාර මුදලින් ණය ප්‍රදානය කළයුතු වන අතර ණය ප්‍රදානය කිරීමට ප්‍රථමයෙන් විදේශ ව්‍යවහාර මුදලින් එම ණය ආපසු ගෙවීමට ණය ගැනුම්කරුට ඇති හැකියාව පිළිබඳව බලයලත් වෙළෙඳුන් විසින් තක්සේරු කර සෑහීමකට පත් විය යුතුය.

3.2 ණය මුදල් නිදහස් කිරීමේ හා ණය ආපසු ගෙවීම් ලබා ගැනීම සඳහා ණය ගැනුම්කරුගේ නමින් විදේශ ව්‍යවහාර ණය මුදල් ගිණුමක් විවෘත කළ යුතුය. ණය මුදල සම්පූර්ණයෙන් පියවා අවසන් වූ වහාම විදේශ ව්‍යවහාර ණය මුදල් ගිණුම වසා දැමිය යුතුය.

3.3 විදේශ ව්‍යවහාර මුදල් පිළිගැනීමට අවසර ලබාදී ඇති නේවාසික දේපළ සංවර්ධනය කරනු ලබන ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් විසින් පවත්වාගෙන යනු ලබන විදේශ විනිමය ගිණුම්වලට ණය මුදල් මාරු කරන ලෙස ණය ගැනුම්කරු ඉල්ලා සිටින්නේ නම් මිස ණය මුදල් ශ්‍රී ලංකා රුපියල්වලින් නිදහස් කළ යුතුය.

3.4 විදේශ ව්‍යවහාර මුදල් ආමුඛ ප්‍රේෂණ මගින් හෝ ණය ගැනුම්කරුගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සහ ආමුඛ ආයෝජන ගිණුම්වල පවතින අරමුදල් භාවිතා කරමින් ණය ආපසු ගෙවිය යුතුය.

4. **ශ්‍රී ලංකා රුපියල්වලින් ප්‍රදානය කරනු ලබන ණය (ශ්‍රී ලංකා රුපියල් ණය)**

4.1 ණය ආපසු ගෙවීමට ඇති හැකියාව තක්සේරු කර සෑහීමකට පත්වීමෙන් පසු බලයලත් වෙළෙඳුන්, ශ්‍රී ලංකා රුපියල් ණය ප්‍රදානය කළ යුතුය.

4.2 ණය මුදල් නිදහස් කිරීම හා ණය ආපසු ගෙවීම් ලබාගැනීම සඳහා ණය ගැනුම්කරුගේ නමින් ශ්‍රී ලංකා රුපියල් ණය ගිණුමක් විවෘත කළ යුතුය.

4.3 ණය මුදල් ශ්‍රී ලංකා රුපියල්වලින් පමණක් නිදහස් කළ යුතුය.

4.4 විදේශ ව්‍යවහාර මුදලින් වන ආමුඛ ප්‍රේෂණ මගින්, ණය ගැනුම්කරුගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල සහ ආමුඛ ආයෝජන ගිණුම්වල පවතින අරමුදල් භාවිත කරමින් සහ ණය ගැනුම්කරුගේ ශ්‍රී ලංකා රුපියල් ඉපැයීම උපයෝගී කර ගනිමින් ණය ආපසු ගෙවිය යුතුය.

5. ගෙවීම් පැහැර හැරීමකදී ණය විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ණය අයකර ගැනීම නියෝග ප්‍රකාරව විය යුතුය.

6. **අනෙකුත් කොන්දේසි**

6.1 බලයලත් වෙළෙඳුන් විසින් ණය මුදල හා සම්බන්ධ සියළු අවදානම් තක්සේරු කළයුතු වන අතර, සින්නක්කර දේපළ මත උකස්කරයක් ලෙස හෝ විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු හෝ වත්කම් මත ලියමක් ඇතුළුව ණය අවදානම අඩු කර ගැනීම සඳහා ප්‍රමාණවත් අදාල විචක්ෂණශීලි පියවර ගත යුතුය.

6.2 ණය ගැණුම්කරු හට උරුමයෙන් ලද හෝ ණය ගැනුම්කරුට ශ්‍රී ලංකාවේ නේවාසිකව සිටියදී අයිති දේපලක ඉදිකිරීම/සංවර්ධනය/නවීකරණය සඳහා ණය මුදල් උපයෝගී කරගනු ලබන්නේ නම්, බලයලත් වෙළෙඳුන් විසින් ණය නිකුත් කිරීමට ප්‍රථමයෙන් 1988 අංක 30 දරන බැංකු පනත යටතේ නිකුත් කර ඇති විචක්ෂණශීලී නියෝග ප්‍රකාරව තෝරා ගනු ලැබූ තක්සේරු කරුවෙකු මගින් දේපළ සඳහා තක්සේරුවක් ලබාගත යුතුය.

6.3 6.2 ඡේදය ප්‍රකාරව ලබාගත් ණය මුදල් උපයෝගී කරගෙන අත්පත් කර ගැනීම/ඉදිකිරීම/සංවර්ධනය/නවීකරණය කරන ලද දේපලක් විකිණීමෙන් ලද මුදල් පහත පදනම මත ශ්‍රී ලංකාවෙන් පිටතට ප්‍රේෂණය කරනු ලබන බවට, බලයලත් වෙළෙඳුන් විසින් සහතික කරගත යුතුය.

(අ) ණය ආපසු ගෙවීම සඳහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලැබූ මුදලට සමානුපාතික විකුණුම් මුදලක් නිදහසේ ප්‍රේෂණය කළහැක.

(ආ) ශේෂ වන යම් විකුණුම් මුදලක් වේ නම් එය සංක්‍රමණික දීමනාවට යටත්ව ප්‍රේෂණය කළ යුතුය.

6.4 අනාගත ප්‍රතිමුඛ ප්‍රේෂණ සඳහා පහසුකම් සැලසීම පිණිස ණය අයකර ගැනීම සඳහා උපයෝගී කරගත් ආමුඛ ප්‍රේෂණයන් පිළිබඳ තහවුරුවක් බලයලත් වෙළෙඳුන් විසින් නිකුත් කළ යුතුය.

6.5 ණය මුදල සම්පූර්ණයෙන් ගෙවා පියවන තෙක්, බලයලත් වෙළෙඳුන් විසින් ණය මුදල ප්‍රදානය කළ අවස්ථාවේ ලබා ගන්නා ලද ලේඛනගත සාක්ෂි, ඕනෑම ව්‍යවස්ථාපිත වාර්තා තබා ගැනීමේ අවශ්‍යතාවන් ඉක්මවා පවත්වාගෙන යා යුතුය. ණය මුදල සම්පූර්ණයෙන් පියවූ පසු, අදාල ලේඛනගත සාකෂි, ව්‍යවස්ථාපිත වාර්තා තබා ගැනීමේ අවශ්‍යතාවන් පරිදි පවත්වාගෙන යා යුතුය.

6.6 බලයලත් වෙළෙඳුන් විසින් ඇමුණුම 1 පරිදි මෙම විධානයන් යටතේ ප්‍රදානය කරන ලද ණය මුදල් පිළිබඳව මාසික වාර්තාවන් එළඹෙන මාසයේ 15 වන දින හෝ ඊට පෙර dfe@cbsl.lk යන විද්‍යුත් ලිපිනය හරහා අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම අවශ්‍ය කෙරේ.

7. අවලංගු කරන ලද 1953 අංක 24 දරන විනිමය පාලන පනතේ ප්‍රතිපාදනයන් යටතේ වෙනත් රටක ස්ථිර නේවාසික වීසා මත ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන ශ්‍රී ලාංකිකයන් සහ ද්විත්ව පුරවැසිභාවය ලබා සිටින පුද්ගලයන් හට ප්‍රදානය කරන ලද ණය සම්බන්ධයෙන් වූ කොන්දේසි හා නියමයන් සහ එම ණය පියවා ගැනීම ද මෙම නියෝග ප්‍රකාරව බලාත්මක විය යුතුය.

**අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව**

2017 අංක 11 දරන විධානයන් සඳහා වූ ඇමුණුම 1

## වෙනත් රටක ස්ථිර නේවාසික වීසා යටතේ ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන ශ්‍රී ලාංකිකයන්ට සහ ද්විත්ව පුරවැසිභාවය ලබා සිටින පුද්ගලයන් හට, ණය ප්‍රදානය කිරීම පිළිබඳව මාසික ප්‍රකාශනය

බැංකුවේ නම : ..........................................................................................................................................

වාර්තා කරන මාසය සහ වර්ෂය : ..................................................................

| ණය වර්ගය | ණය ගැණුම්කරුගේ නම | ණය ප්‍රදානය කරන ලද දිනය | මුදල් වර්ගය | ප්‍රදානය කරන ලද මුදල | ණය ලබාදීමේ අරමුණ |
|---|---|---|---|---|---|
| විදේශ ව්‍යවහාර මුදලින් ප්‍රදානය කරන ලද ණය (විදේශ ව්‍යවහාර මුදල් වර්ගය සඳහන් කරන්න) | | | | | |
| ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රදානය කරන ලද ණය | | | | | |

බැංකුවේ ගිණුම් පොත්වලින් උපුටාගත්/උත්පාදනය වූ ඉහත තොරතුරු නිවැරදි බව අපි සහතික වන්නෙමු.

බලයලත් නිලධාරියාගේ නම ..........................................................................

අත්සන ..........................................................................

දිනය ..........................................................................

අනුකූලතා නිලධාරියාගේ නම ..........................................................................

අත්සන ..........................................................................

දිනය ..........................................................................

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2017 අංක 12 දරන විධානයන්	2017 නොවැම්බර් 20

## බලයලත් වෙළෙඳුන් හා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා අනුමත නියෝජිතයින් ලෙස පත් කරන ලද ප්‍රාථමික වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ (පනත) 7 වන වගන්තිය සමග කියවිය යුතු පනතේ 4 සහ 9 වන වගන්ති ප්‍රකාරව, බලයලත් වෙළෙඳුන්ට හා ශ්‍රී ලංකා රජය (රජය) මගින් නිකුත් කරනු ලබන ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මිලදී ගැනීම හා අලෙවි කිරීම සඳහා අනුමත නියෝජිතයින් ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය අධිකාරී (රාජ්‍ය ණය අධිකාරී) විසින් පත් කළ ප්‍රාථමික වෙළෙඳුන් වෙත පහත පරිදි මෙමගින් අවසර දෙනු ලැබේ.

2.1 ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර අත්පත් කර ගැනීම, රඳවා ගැනීම හා පැවරීම සඳහා එක්සත් ජනපද ඩොලර් (ඇ.එ.ජ. ඩොලර්) වලින් පහත දැක්වෙන විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් දෙක බලයලත් වෙළෙන්දෙකු සමග පවත්වාගෙන යාමට

(අ) පහත 3 වන ඡේදයේ සඳහන් ආයෝජක කාණ්ඩ මගින් රජයෙන් සෘජුවම මිලදී ගන්නා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා රජයට ගෙවිය යුතු මුදල් බැර කිරීම සඳහා රජය වෙනුවෙන් "ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ආයෝජන ගිණුම" (SLDBIA) ලෙස නම් කරන ලද පොළී දරන, ඇ.එ.ජ. ඩොලර් ගිණුමක්

(ආ) රජයෙන් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මිලදී ගැනීමට සහ පහත 3 වැනි ඡේදයේ සඳහන් ආයෝජක කාණ්ඩ සමග ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වෙළඳාම් කිරීම සඳහා "බැඳුම්කර ආයෝජන සඳහා ඩොලර් ගිණුම" (DABI) ලෙස නම් කරන ලද පොළී ගෙවීමේ පදනමෙන් පවත්වාගෙන යාහැකි ඇ.එ.ජ. ඩොලර් ගිණුමක්

2.2 අනුමත නියෝජිතයින් වන ප්‍රාථමික වෙළෙඳුන් විසින් රජයෙන් හෝ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර දරන්නෙකුගෙන් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මිලදී ගැනීමට අවශ්‍ය එ.ජ. ඩොලර් බලයලත් වෙළෙන්දෙකුගෙන් මිලදී ගැනීමේදී එම මිලට ගන්නා ප්‍රමාණය ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මිලදී ගැනීමට අවශ්‍ය ප්‍රමාණයට සීමා වියයුතු අතර, මිලදී ගත් එ.ජ. ඩොලර් ප්‍රමාණය ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මිලදී ගැනීමට අවශ්‍ය නොවන්නේ නම් ප්‍රාථමික වෙළෙන්දා විසින් වහාම එම විදේශ විනිමය බලයලත් වෙළෙන්දෙකුට විකිණිය යුතුය.

3. **ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරයන්හි ආයෝජනයට සුදුසුකම් ලබන ආයෝජකයින් කාණ්ඩ**

අ) 1937 අංක 07 දරන ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥාපනත සහ 1923 අංක 08 දරන දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පත් කරනු ලබන ප්‍රාථමික වෙළෙඳුන්

ආ) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විදේශ රාජ්‍යයන්හි පුරවැසියන්

ඇ) වෙනත් රටක නිත්‍ය නේවාසික වීසා ලබාගෙන ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකව වාසය කරන ශ්‍රී ලාංකික පුරවැසියන්

ඈ) රැකියාවක් සඳහා හෝ ව්‍යාපාර කටයුත්තක් සඳහා හෝ වෘත්තියක නියැලීම සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැර ගොස් සිටින ශ්‍රී ලාංකික පුරවැසියන්

ඉ) ශ්‍රී ලංකාව හැර වෙනත් රටක නීතිය යටතේ සංස්ථාපිත හෝ සංස්ථාපිත නොකළ ආයතනයන්

ඊ ) 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතෙහි 17 වන වගන්තිය යටතේ, අවලංගු කරන ලද 1953 අංක 24 දරන විනිමය පාලන පනතේ ප්‍රතිපාදනවලින් පූර්ණ වශයෙන් නිදහස් කරමින් ගිවිසුමකට බැඳී ඇති සමාගම්, තම අපනයන ඉපයීම් බැර කිරීම සඳහා පමණක් පවත්වාගෙන යනු ලබන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්, හර කිරීම මගින් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මිලදී ගැනීමට යටත්ව

එ) 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය නියාමනය කිරීමේ පනතේ විධිවිධාන යටතේ ශ්‍රී ලංකාව තුළ රක්ෂණ ව්‍යාපාර කරගෙන යාම සඳහා ලියාපදිංචි කරන ලද සමාගම්, අවලංගු කරන ලද 1953 අංක 24 දරන විනිමය පාලන පනතේ ප්‍රතිපාදන යටතේ ලබාදුන් අනුමැතිය යටතේ බලයලත් වෙළෙඳුන් සමග පවත්වාගෙන යන විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හර කිරීම මගින් සියළුම ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මිලදී ගැනීමට යටත්ව

ඒ) පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හා ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන්

ඔ) විදේශ ව්‍යවහාර මුදලින් තැන්පතු භාර ගැනීමට අවසරලත් බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම්

ඕ) පනතේ 4(1) (අ) සහ 4(1) (ආ) වගන්ති යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පත් කරන ලද බලයලත් වෙළෙඳුන්

ක) ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික ද්විත්ව පුරවැසිභාවය සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්

**4. ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ආයෝජන ගිණුම** (SLDBIA)

**4.1 අවසරලත් බැර කිරීම්**

අ) රජයෙන් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මිලදී ගැනීම සඳහා ඉහත 3 වන ඡේදයේ දක්වා ඇති ආයෝජකයන්ගෙන් ඇ.එ.ජ. ඩොලර්වලින් ලද මුදල්

**4.2 අවසරලත් හර කිරීම්**

අ) ඉහත 3 ඡේදයේ සඳහන් කර ඇති ආයෝජකයින් විසින් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මිලදී ගැනීම වෙනුවෙන් රජයට කරනු ලබන ගෙවීම් වශයෙන්, රාජ්‍ය ණය අධිකාරී විසින් නිකුත් කරන ලද අර්පණ ලියවිල්ලෙහි හෝ චක්‍රල්ඛයෙහි දී ඇති උපදෙස්වලට අනුකූලව මුදල් මාරු කිරීම්

ආ) ඉහත 3 වැනි ඡේදයේ දක්වා ඇති ආයෝජකයින්ට රාජ්‍ය ණය අධිකාරිගේ උපදෙස් මත ආපසු ගෙවීම් සහ වෙනත් ඕනෑම අරමුණක් වෙනුවෙන් කරනු ලබන ගෙවීම් සඳහා වන මුදල් මාරු කිරීම්

**5. බැඳුම්කර ආයෝජන සඳහා ඩොලර් ගිණුම** (DABI )

**5.1 අවසරලත් බැර කිරීම්**

අ) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මිලදී ගැනීමේ අරමුණෙන් ලබාගත් හෝ වෙන් කරන ලද ඇ.එ.ජ. ඩොලර්

ආ) ඉහත 3 වන ඡේදයේ දක්වා ඇති ආයෝජකයින්ගෙන්, ඔවුන්හට ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර අලෙවි කිරීමෙන් ලැබුණු මුදල්

ඇ) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල මුල් මුදල් ආපසු ගෙවීම් සහ පොළිය වශයෙන් ගිණුම් හිමියන්ට ලැබුණු මුදල්

**5.2 අවසරලත් හර කිරීම්**

අ) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර අත්පත් කර ගැනීම වෙනුවෙන් රජයට කරනු ලබන ගෙවීම් වශයෙන්, රාජ්‍ය ණය අධිකාරී විසින් නිකුත් කරන ලද අර්පණ ලියවිල්ලෙහි හෝ චක්රෙල්ඛයෙහි දී ඇති උපදෙස්වලට අනුකූලව මුදල් මාරු කිරීම.

ආ) ගිණුම් හිමියා විසින් ද්විතියික වෙළෙඳපොලින් මිලදී ගත් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා එම ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර විකුණුම්කරුවන්ට කරනු ලබන ගෙවීම්.

ඇ) බැඳුම්කර අනුබෙදීම සහ ඒකාබද්ධ කිරීම් සඳහා ගෙවනු ලබන ගාස්තු වැනි රාජ්‍ය ණය අධිකාරී වෙත ගෙවිය යුතු වෙනත් ඕනෑම ගෙවීමක් ලෙස, රාජ්‍ය ණය අධිකාරී විසින් නිකුත් කරන ලද අර්පණ ලියවිල්ලෙහි හෝ චක්‍රල්ඛයෙහි දී ඇති උපදෙස්වලට අනුකූලව මුදල් මාරු කිරීම.

ඈ) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මිලදී ගැනීමට අවශ්‍ය ප්‍රමාණයට අතිරික්තව ගිණුම් හිමියාගේ ගිණුමේ පවතින විදේශ විනිමය බලයලත් වෙළෙන්දෙකුට විකිණීම.

**අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව**

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2017 අංක 13 දරන විධානයන්** 2017 නොවැම්බර් 20

## ආමුඛ ආයෝජන ගිණුම් සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2017 අංක 02 දරන විදේශ විනිමය (ප්‍රාග්ධන ගනුදෙනුවල යෙදීමේ කාර්යය සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම) නියෝග (ගිණුම් පිළිබඳ නියෝග) සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමග කියැවෙන 9(2) වගන්තිය ප්‍රකාරව පනත යටතේ නිකුත් කළ 2017 අංක 1 දරන විදේශ විනිමය (බලයලත් වෙළෙන්දන් විසින් සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග (ප්‍රාග්ධන ගනුදෙනු පිළිබඳ නියෝග) වල සඳහන් ඇ සහ පහත සඳහන් රෙගුලාසිවලට යටත්ව ආමුඛ ආයෝජන ගිණුම් (IIA) විවෘත කිරීමට හා පවත්වාගෙන යාමට බලයලත් වෙළෙඳුන් ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත අවසර ලබා දෙනු ලැබේ.

**2. සුදුසුකම්ලත් පුදගලයන්**

ආමුඛ ආයෝජන ගිණුම් විවෘත කිරීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයන්, ගිණුම් පිළිබඳ නියෝගයන්හි සඳහන් කෙරේ.

**3. අවසරලත් බැර කිරීම්**

3.1 ආමුඛ ආයෝජන ගිණුම්වල අවසරලත් බැර කිරීම්, ගිණුම් පිළිබඳ නියෝගයන්හි සඳහන් කෙරේ.

3.2 ශ්‍රී ලංකා මහ බැංකුවට ලබා දී ඇති අධිකාරිය ප්‍රකාරව ගිණුම් පිළිබඳ නියෝගයන්හි සඳහන් කර ඇති බැර කිරීම්වලට අමතරව ආමුඛ ආයෝජන ගිණුම් සඳහා සහ පහත සඳහන් බැර කිරීම් සඳහා ද අවසර ලබා දේ.

(අ) ලාභාංශ, විකුණුම් ඉපැයුම්, කොටස් නැවත ලබා ගැනීම් සහ අනේවාසික ආයෝජකයන් විසින් සපයන ලද පිරියත උපකරණ වෙනුවෙන් ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක් විසින් නිකුත් කරන ලද සෑම පන්තියකම කොටස් වෙනුවෙන් ලැබෙන වෙනත් ඕනෑම ආදායමක්.

**4. අවසරලත් හර කිරීම්**

4.1 ආමුඛ ආයෝජන ගිණුම්වල අවසරලත් හර කිරීම්, ගිණුම් පිළිබඳ නියෝගයන්හි සඳහන් කෙරේ.

4.2 ශ්‍රී ලංකා මහ බැංකුවට ලබා දී ඇති අධිකාරිය ප්‍රකාරව ගිණුම් පිළිබඳ නියෝගයන්හි සඳහන් කර ඇති හර කිරීම්වලට අමතරව/ ආමුඛ ආයෝජන ගිණුම් සඳහා පහත සඳහන් හර කිරීම් සඳහා ද අවසර ලබා දේ.

(අ) පනතේ ප්‍රතිපාදනයන් ප්‍රකාරව ප්‍රදානය කර ඇති අවසරයන් යටතේ ණය ලබාගෙන ඇති අවස්ථාවක දී (ශ්‍රී ලංකාවෙන් පිටත ප්‍රාග්ධන ගනුදෙනු සිදුකිරීමේ අරමුණින් ලබාගත් ණය හැර) එම ණය මුදල් (ණය සුරැකුම්පත්‍ර ඇතුළුව) ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයෙකු විසින් (එනම් ණය ගැනුම්කරු) පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට මාරු කිරීම.

**5 වෙනත් කොන්දේසි**

5.1 ආමුඛ ආයෝජන ගිණුමක් අයිරාගත නොවිය යුතු අතර ආමුඛ ආයෝජන ගිණුම් හිමියෙකුහට ණය පහසුකම් ලබා නොදිය යුතුය.

5.2 ගිණුම් පිළිබඳ නියෝගයන්හි II වන උපලේඛනයේ 1(2) ඡේදයේ (ඇ), (ඊ), (උ) සහ (එ) උපඡේද හා 1(3) ඡේදයේ (ඈ), (ඉ) සහ (ඊ) උපඡේදයන්හි සඳහන් ගනුදෙනු සිදු කළ යුත්තේ ප්‍රාග්ධන ගනුදෙනු පිළිබඳ නියෝගයන් යටතේ ප්‍රදානය කර ඇති පොදු අවසරය හා කලින් කලට නිකුත් කරනු ලබන නියෝගයන් සහ පනතේ 7 වගන්තිය ප්‍රකාරව ප්‍රදානය කෙරෙන විශේෂ අවසරයන් යටතේය.

5.3 ගිණුම් පිළිබඳ නියෝගයන්හි II වන උපලේඛනයේ 1(2) ඡේදයේ, (ඇ) උපඡේදය යටතේ අවසර දී ඇති ගනුදෙනු ක්‍රියාත්මක කරන අවස්ථාවේදී, ප්‍රාග්ධන ගනුදෙනු පිළිබඳ නියෝග ක්‍රියාත්මක කිරීමේ දිනයට පූර්වයෙන්, නැවත නම් කරන ලද සුරැකුම්පත් ආයෝජන ගිණුම හරහා ආයෝජනය සිදු කර ඇති අවස්ථාවකදී ඊට අදාළ සියළු ආදායම් හා ආයෝජන ඉපැයීම් ආමුඛ ආයෝජන ගිණුමට බැර කරන බවට බලයලත් වෙළෙන්දෙකු ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සනාථ කර ගත යුතුය.

5.4 ගිණුම් පිළිබඳ නියෝගයන්හි II වන උපලේඛනයේ, 1(2) ඡේදයේ, (ඊ) උපඡේදය යටතේ අවසර දී ඇති ගනුදෙනු ක්‍රියාත්මක කරන අවස්ථාවේදී අදාළ ණය ගැනුම්කරුවා විදේශ ව්‍යවහාර මුදල් ණය (ණය සුරැකුම්පත්‍ර ඇතුළුව) ලබාගෙන ඇත්තේ ප්‍රාග්ධන ගනුදෙනුව පිළිබඳ නියෝගයන් හෝ පනතේ ප්‍රතිපාදනයන් යටතේ ප්‍රදානය කෙරුනු විශේෂ අවසරයක් ප්‍රකාරව බවට බලයලත් වෙළෙන්දෙකු ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සනාථ කර ගත යුතුය.

5.5 සිදු කිරීමට නියමිත පාදක වූ ගනුදෙනුවෙහි නීත්‍යානුකූලභාවය හා සද්භාවය තහවුරු කර ගැනීමට හා මෙම විධානයන්හි පනවා ඇති කොන්දේසි වලට අනුකූල බව තහවුරු කර ගැනීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු ලෙස බලයලත් වෙළෙඳුන් විසින් නෛතිකව පිළිගත හැකි මනා ලේඛනගත සාක්ෂි ලබා ගත යුතුය.

5.6 බලයලත් වෙළෙන්දෙකු ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් ව්‍යවස්ථාපිත තොරතුරු තබා ගැනීමේ කුමන හෝ අවශ්‍යතාවයන් ඉක්මවා යමින්, ආයෝජනය නිම වී වසර 6ක් ඉකුත් වනතුරු ගනුදෙනුව සිදු කරන අවස්ථාවේදී ලබා ගන්නා ලද ලේඛනගත සාක්ෂි පවත්වා ගත යුතුය.

5.7 ආමුඛ ආයෝජන ගිණුමක් වසා දැමීම

අ. ගිණුම් හිමියා විසින් ආමුඛ ආයෝජන ගිණුම හරහා සිදු කළ සියළුම ආයෝජනයන් නිම කර ඇත්නම් පමණක් ආමුඛ ආයෝජන ගිණුම් වසා දැමිය හැක.

ආ. කෙසේ නමුත්, ආමුඛ ආයෝජන ගිණුම් හිමියකු විසින් එම ආමුඛ ආයෝජන ගිණුම හරහා සිදු කළ ආයෝජනයන් හමාර කිරීමට ප්‍රථම නව ආමුඛ ආයෝජන ගිණුමක් විවෘත කිරීමට හෝ වෙනත් බලයලත් වෙළෙන්දෙකු සමග නව ආමුඛ ආයෝජන ගිණුමකට මුදල් මාරු කිරීමේ අරමුණු සඳහා ආමුඛ ආයෝජන ගිණුම වැසීමට ඉල්ලීමක් කරන අවස්ථාවේදී, මුල් ආමුඛ ආයෝජන ගිණුම පවත්වාගෙන ගිය බලයලත් වෙළෙන්දා විසින්, ආමුඛ ආයෝජන ගිණුම පවත්වාගෙන යාමට අදහස් කරන බලයලත් වෙළෙන්දා, වෙත ගනුදෙනුකරුගේ ඉල්ලීම පරිදි වසා දැමීමට ඇති ආමුඛ ආයෝජන ගිණුමේ ඇති මුදල්වලින් සිදු කරන ලද හා දැනට පවතින ආයෝජන පිළිබඳ තහවුරු කිරීමක් ඉදිරිපත් කළ යුතුය.

**6. විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත වාර්තා කිරීම.**

6.1 බලයලත් වෙළෙන්දෙකු වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් https://www.cbsl.lk/forexnet හරහා දෛනිකව ආමුඛ ප්‍රේෂණ ගිණුම් විස්තර සැපයිය යුතුය.

6.2 ඉහතකී වාර්තා කිරීමේ අවශ්‍යතාවයට අනුව බලයලත් වෙළෙන්දෙකු වශයෙන් බලයලත් වාණිජ බැංකුවක් අදාල බැංකුවෙහි ගිණුම් පොත් ඇසුරින් අදාල තොරතුරු උපුටා ගැනීමට හෝ ජනනය කිරීමට බැංකුව තුළ ක්‍රියා පිළිවෙතක් ක්‍රියාත්මක කළ යුතුය.

6.3 බලයලත් වෙළෙන්දෙකු වශයෙන් බලයලත් වාණිජ බැංකුවක් විසින් විදේශ විනිමය දෙපාර්තමේන්තුවට සපයන ලද විද්‍යුත් තොරතුරුවල නිරවද්‍යතාවය සහ සම්පූර්ණත්වය එහි අභ්‍යන්තර විගණන, කාලර්තිත නිරීක්ෂණ සහ අනුකූලතා වැඩසටහන් තහවුරු කර ගත යුතු අතර, එකී සාක්ෂි විදේශ විනිමය දෙපාර්තමේන්තුවෙන් කරන පිරික්සුම් සඳහා සූදානමින් තැබිය යුතුය.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2017 අංක 14 දරන විධානයන්** 2017 නොවැම්බර් 20

## ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2017 අංක 02 දරන විදේශ විනිමය (ප්‍රාග්ධන ගනුදෙනුවල යෙදීමේ කාර්යය සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම) නියෝග (ගිණුම් පිළිබඳ නියෝග) සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි (පනත) 7 වගන්තිය සමග කියවෙන 9(2) වගන්තිය ප්‍රකාරව

පහත කොන්දේසිවලට යටත්ව හා 2017 අංක 1 දරන විදේශ විනිමය (බලයලත් වෙළෙඳුන් විසින් සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝගයන්හි (ප්‍රාග්ධන ගනුදෙනු පිළිබඳ නියෝග) අවසර දී ඇති පරිදි ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සඳහා බලයලත් වෙළෙඳුන් ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකු හට අවසර දෙනු ලැබේ.

2. **සුදුසුකම්ලත් තැනැත්තන්**

ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් විවෘත කිරීම සඳහා සුදුසුකම් ලබන තැනැත්තන් ගිණුම් පිළිබඳ නියෝගයන්හි සඳහන් වේ.

3. **අවසරලත් බැර කිරීම්**

3.1 ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් සඳහා අවසරලත් බැර කිරීම්, ගිණුම් පිළිබඳ නියෝගයන්හි සඳහන් වේ.

3.2 ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා දී ඇති අධිකාරිය ප්‍රකාරව, ගිණුම් පිළිබඳ නියෝගයන්හි සඳහන් බැර කිරීම්වලට අමතරව, ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් සඳහා පහත බැර කිරීම් සඳහා අවසරය දෙනු ලැබේ.

(අ) ගිණුම් හිමියාගේ වෙනත් ප්‍රතිමුඛ ආයෝජන ගිණුමකින් කරන මාරු කිරීම්.

(ආ) විදේශ විනිමය පනතේ හෝ අවලංගු කරන ලද 1953 අංක 24 දරන විනිමය පාලන පනතේ ප්‍රතිපාදනයන් ප්‍රකාරව ප්‍රදානය කරන ලද අවසරයක් යටතේ, ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයෙකු විසින්, විදේශයන්හිදී සිදු කරන ලද ප්‍රාග්ධන ගනුදෙනුවලට අදාලව, එම ප්‍රාග්ධන ගනුදෙනු, ගිණුම් හිමියාගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින් හෝ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින් සිදු කර ඇති අවස්ථාවකදී ප්‍රේෂණ ලෙස ලැබෙන ලාභාංශ, විකුණුම් සහ කල්පිරීම්වලින් ලද මුදල්, ප්‍රාග්ධන ලාභ සහ ඈවර කිරීමෙන් ලද මුදල්, කොටස් මත ලැබිය යුතු ප්‍රාග්ධන අඩුකිරීම්, ස්වෛරීත්ව බැඳුම්කර, ඒකක සහ ණය සුරැකුම්පත්, ලාභ, ආන්තික සහ අතිරික්ත මුදල්, කළමනාකරණ ගාස්තු, උපදේශක ගාස්තු සහ කොමිස් මුදල් සහ වෙනත් යම් ආශ්‍රිත ලැබීම් ආදී ප්‍රේෂණ (නිකුත් කරුවන් විසින් සිදු කරන ලද සංස්ථාමය ක්‍රියාමාර්ගයක්, අයිතියක් ක්‍රියාත්මක කිරීමක්, හිමිකමක් හෝ පරිවර්තනයක් ප්‍රකාරව ආයෝජකයා මත පසුව පැවරෙන යම් කොටස් ද ඇතුළුව)

4. **අවසරලත් හර කිරීම්**

4.1 ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් සඳහා අවසරලත් හර කිරීම්, ගිණුම් පිළිබඳ නියෝගයන්හි සඳහන් වේ.

4.2 ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා දී ඇති අධිකාරිය ප්‍රකාරව, ගිණුම් පිළිබඳ නියෝගයන්හි සඳහන් හර කිරීම්වලට අමතරව, ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් සඳහා පහත හර කිරීම් සඳහා අවසරය දෙනු ලැබේ.

(අ) ගිණුම් හිමියාගේ වෙනත් ප්‍රතිමුඛ ආයෝජන ගිණුමකට කරන මාරු කිරීම්

(ආ) ගිණුම් හිමියාගේ රුපියල් ගිණුම්වලට කරන මාරු කිරීම්

(ඇ) පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින් හෝ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින්, ප්‍රතිමුඛ ආයෝජන ගිණුමකට මුදල් මාරු කිරීමෙන් හෝ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් හෝ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් සෘජුවම හර කිරීමෙන් සිදු කරන ලද විදේශ ප්‍රාග්ධන ගණුදෙනුවකින් (එනම් ප්‍රතිමුඛ ආයෝජන) ප්‍රතිමුඛ ආයෝජන ගිණුමකට ලද ලාංභාංශ, විකුණුම් සහ කල්පිරීම්වලින් ලද මුදල්, ප්‍රාග්ධන ලාභ, ඈවර කිරීමෙන් ලද මුදල්, කොටස් මත ප්‍රාග්ධන අඩු කිරීම්, ස්වෛරීත්ව බැඳුම්කර, ඒකක සහ ණය සුරැකුම්පත්, ලාභ, ආන්තික සහ අතිරික්ත මුදල්, කළමනාකරණ ගාස්තු, උපදේශක ගාස්තු සහ කොමිස් මුදල් හෝ වෙනත් යම් ආශ්‍රිත ලැබීම් ආදී ප්‍රේෂණ වලින් (නිකුත් කරුවන් විසින් සිදු කරන ලද සංස්ථාමය ක්‍රියාමාර්ගයක්, අයිතියක් ක්‍රියාත්මක කිරීමක්, හිමිකමක් හෝ පරිවර්තනයක් ප්‍රකාරව ආයෝජකයා මත පසුව පැවරෙන යම් කොටස් ඇතුළුව) ගිණුම් හිමියාගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට (PFCA) හෝ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට (BFCA) කරන මාරු කිරීම්

5. **වෙනත් කොන්දේසි**

5.1 ප්‍රතිමුඛ ආයෝජන ගිණුමක් ක්‍රියාත්මක කළයුත්තේ දේශීය බැංකු ඒකකයෙහි අනුමත විදේශ ව්‍යවහාර මුදල්වලින් පවත්වාගෙන යනු ලබන විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් ලෙසය.

5.2 ප්‍රතිමුඛ ආයෝජන ගිණුමක් සුදුසුකම්ලත් ආයෝජකයන් විසින් හවුල් ගිණුමක් ලෙස පවත්වාගෙන නොයායුතුය.

5.3 නේවාසික ආයෝජකයෙකු විසින් සියළු ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම බලයලත් වෙළෙන්දෙකු ලෙස එක් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සමග සිදු කළ යුතුය.

5.4 නේවාසික ආයෝජකයෙකු විසින් රුපියල් ලැබීම් විදේශ මුදල් බවට පරිවර්තනය කර ප්‍රතිමුඛ ආයෝජන ගිණුමකට බැර කළ යුත්තේ ප්‍රාග්ධන ගනුදෙනු පිළිබඳ නියෝගයන්හි සඳහන් සියළු අවශ්‍යතාවයන් සහ මෙම විධානයන්හි සඳහන් කොන්දේසි සපුරාලීමෙන් අනතුරුව පමණි. කිසිඳු හේතුවක් මත ආයෝජනය කිරීමෙන් තොරව එම මුදල් ප්‍රතිමුඛ ආයෝජන ගිණුම තුළ රඳවා තබා ගැනීම නොකළ යුතුය.

5.5 ගිණුම් පිළිබඳ නියෝගයන්හි II වැනි උපලේඛනයෙහි 2(4) ඡේදයෙහි (අ) (ඈ) (ඇ) උප ඡේදයන්හි සහ 2(5) ඡේදයෙහි (ආ) උප ඡේදයෙහි සඳහන් ගනුදෙනු සිදු කළයුත්තේ ප්‍රාග්ධන ගනුදෙනු පිළිබඳ නියෝගයන් සහ කලින් කලට නිකුත් කරනු ලබන රෙගුලාසි හෝ පනතෙහි ප්‍රතිපාදනයන් ප්‍රකාරව ප්‍රදානය කරන ලද විශේෂ අවසරයන් අනුවය.

5.6 ගිණුම් පිළිබඳ නියෝගයන්හි II වැනි උපලේඛනයෙහි 2(5) ඡේදයෙහි (අ) උප ඡේදයේ සඳහන් ගෙවීම්, විදේශ සමාගමේ (ආයෝජිතයා) ගිණුමකට හෝ අවසරලත් සුරැකුමෙහි විකුණුම්කරුගේ ගිණුමට (ආයෝජිතයා කොටස් හුවමාරුවක ලැයිස්තුගත කර ඇති අවස්ථාවක කොටස් තැරැව්කරු හරහා) හෝ නේවාසික ආයෝජකයා විසින් එම රටෙහි පවත්වාගෙන යන ගිණුමකට (විදේශ ආයෝජන පිළිබඳව එම රටෙහි පවතින නෛතික අවශ්‍යතාවය අනුව) හෝ ආයෝජිත සමාගම සංස්ථාගත කරමින් පවතින අවස්ථාවක පත් කරන ලද ලේකම්වරයාගේ හෝ රෙජිස්ට්‍රාර්ගේ ගිණුමට ප්‍රේෂණය කළ යුතුය.

5.7 ගිණුම් පිළිබඳ නියෝගයන්හි II වන උපලේඛනයෙහි 2(5) ඡේදයෙහි (ඇ) උප ඡේදයෙහි සහ මෙම විධානයන්හි (4) (ආ) ඡේදයෙහි (iii) උප ඡේදයෙහි සඳහන් කර ඇති මාරු කිරීම් ගිණුම් හිමියාගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සහ

ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල පවත්නා අරමුදල් භාවිතා කරමින් සිදු කරන ලද ආයෝජනවල වටිනාකමට සමානුපාතික විය යුතුය.

5.8 නේවාසික ආයෝජකයාට ප්‍රතිමුඛ ආයෝජන ගිණුමක් හරහා, අමතර ආයෝජනයක් සඳහා ආයෝජිතයාට අරමුදල් යැවීමට අවශ්‍ය අවස්ථාවක ආයෝජනයෙන් කොටසක් දැනටමත් ප්‍රතිමුඛ ආයෝජන ගිණුම හරහා සිදු කර ඇති විටෙක, යෝජිත අමතර ආයෝජනය මුල් ආයෝජනය සිදු කරන ලද ප්‍රතිමුඛ ආයෝජන ගිණුම හරහාම සිදු කළ යුතුය.

5.9 ප්‍රතිමුඛ ආයෝජන ගිණුම හරහා කුමන හෝ ප්‍රේෂණයක් සිදු කරනු ලබන්නේ නේවාසික ආයෝජකයා විසින් ඇමුණුම I හි සඳහන් ලේඛන ඉදිරිපත් කිරීමෙන් පසුව පමණක්ම සහ ප්‍රාග්ධන ගනුදෙනු පිළිබඳ නියෝගයන්හි සඳහන් කර ඇති අදාල සීමාවන්ට හෝ පනතේ ප්‍රතිපාදනයන් යටතේ ප්‍රදානය කරන ලද විශේෂ අවසරයන්ට යටත්ව බවට බලයලත් වෙළෙන්දන් ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකු සනාථ කර ගත යුතුය.

5.10 පහත කරුණු තහවුරු කර ගැනීම සඳහා යම් බලයලත් වෙළෙන්දන් ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් අදාළ පරිදි දිවුරුම් ප්‍රකාශයක් ලබා ගත යුතුය.

අ. බලයලත් වෙළෙන්දකු ලෙස වෙනත් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සමග නේවාසික ආයෝජකයා විසින් වෙනත් ප්‍රතිමුඛ ආයෝජන ගිණුමක් පවත්වාගෙන නොයන බව.

ආ. තනි පුද්ගලයෙකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් සිදු කිරීමට යන ආයෝජනයකදී, පනතේ 31(3) වගන්තිය යටතේ නිකුත් කරන ලද විධානයන්ට අනුකූලව එම තනි පුද්ගලයා හෝ හවුල් ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් බව.

5.11 බලයලත් වෙළෙන්දන් ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිදු කිරීමට නියමිත ගනුදෙනුවේ නීත්‍යානුකූලත්වය සහ සද්භාවය තහවුරු කර ගැනීමටත් මෙම විධානයන්හි පනවා ඇති කොන්දේසිවලට අනුකූල බව සනාථ කිරීමටත් මෙම විධානයන්හි සඳහන් කර ඇති ලිපිලේඛනවලට අමතරව නෛතිකව පිළිගත හැකි යෝග්‍ය ලේඛනගත සාක්ෂි (අවශ්‍ය පරිදි) ලබා ගත යුතුය.

5.12 ඇමුණුම 1 හි 1 ඡේදයේ (ඇ) උපඡේදයේ සඳහන් නිශ්කාෂණ ලිපිය ලබා ගැනීමෙන් අනතුරුව කුමන හෝ හේතුවක් මත යෝජිත ආයෝජනය සඳහා ප්‍රතිමුඛ ප්‍රේෂණයක් සිදු නොකළ අවස්ථාවකදී, බලයලත් වෙළෙන්දා ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකුව විසින් ඒ බව වහාම අධ්‍යක්ෂ විදේශ විනිමය වෙත dfe@cbsl.lk යන විද්‍යුත් තැපැල ඔස්සේ දැනුම් දිය යුතුය.

5.13 බලයලත් වෙළෙන්දන් ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ප්‍රතිමුඛ ආයෝජන ගිණුමක් වසා දැමිය යුත්තේ එම ගිණුම හරහා ගිණුම් හිමියා විසින් සිදු කරන ලද සියළුම ආයෝජන බැහැර කිරීමෙන් පසුව වන අතර එම ගිණුමෙන් සිදු කළ ආයෝජන බැහැර කිරීම සම්බන්ධ තොරතුරු සමග අධ්‍යක්ෂ - විදේශ විනිමය වෙත දැනුම් දීම සිදු කළ යුතුය.

**6. විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත වාර්තා කිරීම්**

6.1 බලයලත් වෙළෙන්දන් ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් පිළිබඳ තොරතුරු දෛනිකව https://www.cbsl.lk/forexnet ඔස්සේ මෙම දෙපාර්තමේන්තුව වෙත සැපයිය යුතුය.

6.2 බලයලත් වෙළෙන්දන් ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකු විසින්, ඉහත වාර්තා කිරීමේ අවශ්‍යතාවලට අනුව, අදාල තොරතුරු තම බැංකුවල ගිණුම් පොත්වලින් උත්පාදනය හෝ උපුටා ගැනීම සඳහා බැංකුව තුල පද්ධතියක් ක්‍රියාත්මක කළ යුතුය.

6.3 බලයලත් වෙළෙන්දන් ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකු විසින්, විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙත විද්‍යුත් මාධ්‍යයෙන් සපයන තොරතුරුවල නිරවද්‍යභාවය සහ සම්පූර්ණභාවය පිළිබඳ තහවුරු කිරීම් අභ්‍යන්තර විගණන, කලින් කලට සිදු කරන සමාලෝචන සහ අනුකූලතා වැඩසටහන්වලට අන්තර්ග්‍රහණය කළ යුතු අතර ඊට අදාල සාක්ෂි ඕනෑම අවස්ථාවකදී විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ පරීක්ෂාව සඳහා ලබාගත හැකි විය යුතුය.

6.4 බලයලත් වෙළෙන්දන් ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ඇමුණුම II හි සඳහන් ලිපිලේඛන නේවාසික ආයෝජකයාගෙන් ලබාගත යුතු අතර, එම ලිපිලේඛන සඳහන් කර ඇති කාලසීමාව තුළ අධ්‍යක්ෂ - විදේශ විනිමය වෙත ලබා දියයුතුය.

**අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව**

**ඇමුණුම I**

1. මෙම විධානයන් යටතේ වන සියළු ප්‍රතිමුඛ ආයෝජන සඳහා පහත ලිපිලේඛන ලබාගත යුතුය.

(අ) ඇමුණුම III හි සඳහන් තොරතුරු ඇතුළත් ඉල්ලීමක්

(ආ) ඇමුණුම IV හි සඳහන් ආකෘතිය පරිදි ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී වරුන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙකු විසින් ලබාදුන් නිර්දේශය

(ඇ) 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ හෝ අවලංගු කරන ලද 1953 අංක 24 දරන විනිමය පාලන පනත යටතේ පවත්වාගෙන යනු ලබන විමර්ශනයක් නොමැති බවට, විදේශ විනිමය දෙපාර්තමේන්තුවෙන් ලබාගත් නිශ්කාෂණ සහතිකයක් (ආයෝජන සඳහා වන සෑම ප්‍රතිමුඛ ප්‍රේෂණයක් සඳහාම)

(ඈ) යම් බලයලත් වෙළෙන්දෙකු ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකු එකක් හෝ වැඩි ප්‍රමාණයක (ද්විතීයික බැංකු) ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් විවෘත කොට පවත්වාගෙන යාමට නේවාසික ආයෝජකයකු හට විශේෂ අවසරයක් ලබාදී ඇති අවස්ථාවකදී, අදාල කාලසීමාව සඳහා අවසර දී ඇති සීමාවන්ට අනුකූල බවට තහවුරු කර ගැනීම පිණිස නේවාසික ආයෝජකයා විසින් එම ද්විතීයික බැංකුව සමග ප්‍රතිමුඛ ආයෝජන ගිණුම හරහා සිදු කරන ලද සියළු ආයෝජනවල වටිනාකම පිළිබඳ ද්විතීයික බැංකුව විසින් නිකුත් කරන ලද තහවුරුවක්

2. ඉහත ලේඛනවලට අමතරව, පහත වර්ගීකරණවලට අදාල විශේෂ ලියවිලිද ලබාගත යුතුය.

(අ) ඇපයෙන් සීමිත සමාගම් හැර 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගම්

(i) සංස්ථාපන සහතිකය සහ සාංසමික සංස්ථා පත්‍රය හා ව්‍යවස්ථාවලිය

(ii) යෝජිත ආයෝජනය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය

(ආ) ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි වී ඇති හවුල් ව්‍යාපාරයක්

(i) හවුල් ගිවිසුමෙහි සහ ලියාපදිංචියෙහි සහතික කරන ලද පිටපතක්

(ii) එක් එක් හවුල්කරුගේ ආයෝජන සමූහය ආවරණය කරගන්නා වූ බදු නිශ්කාෂන සහතිකයක් (දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට අවශ්‍ය පරිදි)

(ඇ) ශ්‍රී ලංකාව තුළ නේවාසික තනි පුද්ගලයෙක්

(i) නේවාසික තත්ත්වය තහවුරු කිරීම පිණිස ලේඛනමය සාක්ෂි

(ii) ආයෝජන වටිනාකම ආවරණය කරන්නා වූ බදු නිෂ්කාශන සහතිකයක් (ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය පරිදි)

ඇමුණුම 2

1. විදේශ විනිමය ප්‍රතිමුඛ ප්‍රේෂණය කර තුන් මසක් ඇතුළත ලබාගත යුතු ලියවිලි

(අ) ලැයිස්තුගත නොකළ නව සමාගමක ආයෝජනය සිදු කරන අවස්ථාවකදී ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කරන ලද නව සමාගමේ සංස්ථාපන සහතිකය, සාංසමික සංස්ථාපත්‍රය හා ව්‍යවස්ථාවලිය.

(ආ) එතෙර කාර්යාලවල ලියාපදිංචි සහතිකය.

(ඇ) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කරන ලද ලැයිස්තු ගත නොවූ සමාගමක කොටස්වල ආයෝජනය කරන ලද අවස්ථාවකදී නම්, නිකුත් කරන ලද කොටස් සහතිකපත්වල පිටපත් හෝ වෙනත් ඕනෑම සාක්ෂියක්.

(ඈ) සේවා නියුක්තිකයන්ගේ කොටස් මනාප යෝජනා ක්‍රමයක් යටතට ග්‍රහනය කර ඇති සියළුම නේවාසික සේවකයන් වෙත නිකුත් කරනු ලබන කොටස් ආයෝජන/ලියාපදිංචි සහතිකවල පිටපත්.

(ඉ) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද සමාගම්වල ලැයිස්තුගත කොටස්වල සහ විදේශීය රාජ්‍යයන් සහ රාජ්‍ය සංවිධාන විසින් නිකුත් කරනු ලබන ස්වෛරීත්ව බැඳුම්කරවල ආයෝජනය කිරීම සම්බන්ධයෙන් අදාල එතෙර කොටස් හුවමාරුවල මධ්‍යම තැන්පතු පද්ධතිය මගින් ලබා ගන්නා ප්‍රකාශයන්.

(ඊ) එතෙරදී නිකුත් කළ ඒකක/ණය සුරැකුම්පත් ලියාපදිංචි කිරීමේ සහතිකවල පිටපත්.

2. වාර්ෂික පදනමක් යටතේ ලබා ගත යුතු ලියවිලි

(අ) ලැයිස්තුගත නොකළ එතෙර සමාගම් සහ එතෙර කාර්යාලවල වාර්ෂික විගණන ගිණුම් වාර්තා

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද සමාගම්වල ලැයිස්තුගත කොටස්වල සහ විදේශීය රාජ්‍යයන් සහ රාජ්‍ය සංවිධාන විසින් නිකුත් කරනු ලබන ස්වෛරීත්ව බැඳුම්කරවල ආයෝජනය කිරීම සම්බන්ධයෙන් අදාල එතෙර කොටස් හුවමාරුවල මධ්‍යම තැන්පතු පද්ධතිය මගින් ලබා ගන්නා ප්‍රකාශයන්.

ඇමුණුම 3

**එතෙර ආයෝජන පිළිබඳ තොරතුරු**

1. **සාමාන්‍ය තොරතුරු**

(අ) සමාගමේ/හවුල් ව්‍යාපාරයේ/පුද්ගලයාගේ නම:

(ආ) ව්‍යාපාර ලියාපදිංචි අංකය/ජාතික හැඳුනුම්පත් අංකය/විදෙස් ගමන් බලපත් අංකය (නේවාසික ආයෝජකයා ශ්‍රී ලංකාවේ වාසික විදේශ ජාතිකයෙකුවීම සහ වලංගු ජාතික හැඳුනුම්පතක් නොමැති අවස්ථාවකදී පමණක්):

2. **විදේශ ආයෝජනය පිළිබඳ තොරතුරු (අදාල පරිදි)**

2.1 කොටස්/ස්වෛරීත්ව බැඳුම්කර/ඒකක/ණය සුරැකුම්පත් වල ආයෝජනය;

(i) ආයෝජනය කිරීමට යෝජිත මුළු වටිනාකම (ඇ.එ.ජ. ඩොලර්වලින්) ;

(ii) එතෙර සමාගමේ/නිකුත් කරන්නාගේ නම සහ රට;

(iii) අත්පත් කරගැනීමට යෝජිත කොටස්/බැඳුම්කර/ඒකක/ණය සුරැකුම්පත් ගණන;

(iv) කොටසක/බැඳුම්කරයක/ඒකකයක/ණය සුරැකුම්පතක මිළ;

(v) කල්පිරෙන දිනය ;

(vi) පොළී අනුපාතිකය;

(vii) නිකුත් කරන්නාගේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම;

2.2 එතෙර කාර්යාල පිහිටුවීම සහ නඩත්තු කිරීම සඳහා ආයෝජන

(i) ආයෝජනය කිරීමට යෝජිත මුළු වටිනාකම (ඇ.එ.ජ. ඩොලර්වලින්)

(ii) එතෙර කාර්යාල වර්ගය හා එහි පිහිටුවීමේ අභිමතාර්ථය සහ රට

මාගේ දැනුමට අනුව ඉහත සඳහන් කරන ලද තොරතුරු සත්‍ය හා නිරවද්‍ය බවට මම මෙයින් ප්‍රකාශ කර සිටිමි.

අධ්‍යක්ෂ අධ්‍යක්ෂ

**ඇමුණුම 4**

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ ඇති රෙගුලාසිවල සඳහන් අරමුණු වෙනුවෙන් විදේශ විනිමය නිදහස් කිරීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජික, ........................................................................................ විසින් කරන නිර්දේශය.

යොමුව : කළමනාකරු

ශාඛාව :

බලයලත් වෙළෙන්දා ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකුවෙහි නම : ..............................................................................................................

ශ්‍රී ලංකා මහ බැංකුවෙහි විදේශ විනිමය අධ්‍යක්ෂ තුමා විසින් දක්වා ඇති නිර්ණායකයන් පදනම් කර ගනිමින් පහත ආයෝජනය මා විසින් විශ්ලේෂණය කළ බව තහවුරු කරන අතර, පහත දක්වා ඇති ආයෝජන තොරතුරු නිර්දේශ කරමි.

1. **සාමාන්‍ය තොරතුරු :**
   - (අ) ආයෝජකගේ නම : ......................................................................................................
   - (ආ) ඇමෙරිකානු ඩොලර් ප්‍රමාණය (හෝ වෙනත් අනුමත විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන ප්‍රමාණය): ..........................................

2. **අයෝජනයේ තොරතුරු (අදාළ පරිදි)**
   - (අ) ආයෝජිතගේ නම : ......................................................................................................
   - (ආ) ආයෝජන වර්ගය (සමාගම් කොටස්/ස්වෛරීත්ව බැඳුම්කර/ඒකක/ණය සුරැකුම්පත්/එතෙර කාර්යාල): ..........................................
   - (ඇ) එතෙර කාර්යාලයක් නම් එය පවත්වාගෙන යෑමේ අරමුණ: ......................................................................................
   - (ඈ) සමාගම් කොටස්/ස්වෛරීත්ව බැඳුම්කර/ඒකක/ණය සුරැකුම්පත් ගණන ආදිය: ..........................................................
   - (ඉ) සමාගම් කොටසක/බැඳුම්කරයක/ඒකකයක/ණය සුරැකුම්පතක මිළ: ......................................................................
   - (ඊ) කල්පිරෙන දිනය : ......................................................................................
   - (උ) පොලී අනුපාතිකය: ......................................................................................
   - (ඌ) වෙනත් විශේෂ තොරතුරු (ඇත්නම්): ......................................................................................

අත්සන : ..............................................

දිනය : ..............................................

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2017 අංක 15 දරන විධානයන්** 2017 නොවැම්බර් 20

# බැංකු ඇපකර හෝ බැඳුම්කර, පොරොත්තු ණයවර ලිපි සහ සංස්ථාපිත බැඳුම්කර පිළිබඳ බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2017 අංක 01 දරන විදේශ විනිමය (බලයලත් වෙළෙන්ඳන් විසින් සිදු කරනු ලබන විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග (ප්‍රාග්ධන ගනුදෙනු පිළිබඳ නියෝග) සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 9(2) වගන්තිය ප්‍රකාරව, බැංකු ඇපකර, බැඳුම්කර, පොරොත්තු ණයවර ලිපි නිකුත් කිරීමට සහ අළුත් කිරීමටත් සංස්ථාපිත බැඳුම්කරවලට ආදාල ගෙවීම් සිදු කිරීමටත් පහත කරුණුවලට යටත්ව බලයලත් වෙළෙන්ඳන් වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවලට අවසරය දෙනු ලැබේ.

2. පාදක වූ ගනුදෙනුව, පනතේ ප්‍රතිපාදනයන් යටතේ ප්‍රදානය කර ඇති අවසර ප්‍රකාරව අවසරලත් ගනුදෙනුවක්ද යන වග තහවුරු කර ගැනීමට බලයලත් වෙළෙන්ඳන් වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සාක්ෂි ලබා ගත යුතුය.
3. නිකුත් කිරීමට අපේක්ෂිත ඇපකරයෙන් පැන නැගිය හැකි අවිනිශ්චිත වගකීම දැරීමට සමාගමට ඇති මූල්‍යමය හැකියාව බලයලත් වෙළෙන්ඳන් වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ඇගයීමට ලක් කොට තහවුරු කර ගත යුතුය.
4. පහත ඇපකරයන් නිකුත් කරන අවස්ථාවකදී,

   4.1 **අත්තිකාරම් ගෙවීම් ඇපකරඃ**

   අ. ඇපකරයෙහි වටිනාකම, ශ්‍රී ලංකාවේ වාසික පුද්ගලයාට ශ්‍රී ලංකාවෙන් පිටත වාසික පුද්ගලයාගෙන් ලැබෙන අත්තිකාරම් ගෙවීම් වටිනාකමට සමාන හෝ අඩු විය යුතුය.

   ආ. ශ්‍රී ලංකාවේ වාසික පුද්ගලයාගේ ශ්‍රී ලංකාව තුළ පවත්නා ගිණුම් වලට ශ්‍රී ලංකාවෙන් පිටත වාසික පුද්ගලයාගෙන් අත්තිකාරම් ගෙවීමක් හිමි වීමෙන් පසුව පමණක්ම ඇපකරය වලංගු භාවයට පත්වන බවට කොන්දේසියක් ඇපකරයට ඇතුලත් කළ යුතුය.

   4.2 කාර්යසාධන බැඳුම්කරඃ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට අදාළ සාක්ෂි සහ එහි සඳහන් කොන්දේසි යන තහවුරුවන්ට යටත්ව නිකුත් කළ යුතුයි.

   4.3 ලංසු බැඳුම්කරඃ ටෙන්ඩරයෙහි හෝ මිල කැඳවුමෙහි සඳහන් කොන්දේසිවලට යටත්ව නිකුත් කළ යුතුය.
5. බලයලත් වෙළෙන්ඳන් වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් බලයලත් වෙළෙන්දෙකු වශයෙන් වෙනත් බලපත්‍රලාභී වාණිජ බැංකුවකින් එම අරමුණ වෙනුවෙන්ම ඇපකරයක් ලබාගෙන නොමැති බවට අදාල සමාගමෙන් දිවුරුම් ප්‍රකාශයක් ලබාගත යුතුය.
6. බලයලත් වෙළෙන්දෙකු වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින්, මෙම විධානයන්හි සඳහන් කර ඇති ලිපි ලේඛනවලට අමතරව සිදු කිරීමට අපේක්ෂිත පාදක වූ ගනුදෙනුවෙහි සද්භාවය සහ නිත්‍යානුකූලභාවය සනාථ කිරීමට සහ මෙම විධිවිධානවල දක්වා ඇති කොන්දේසිවලට දක්වන අනුකූලතාවය සහතික කිරීමට අවශ්‍ය නෛතිකව පිළිගතහැකි මනා ලිඛිතමය සාක්ෂි (අවශ්‍ය පරිදි) ලබා ගතුයුතුය.

**7. වලංගු හිමිකම්**

7.1 පාදක වූ ගනුදෙනුවෙහි සද්භාවය පිළිබඳව සෑහීමකට පත් වීමෙන් අනතුරුව ඉහත සඳහන් කළ ගැසට් පත්‍රයෙන් අවසර දී ඇති බැංකු ඇපකර, බැඳුම්කර, පොරොත්තු ණයවර ලිපි සහ සංස්ථාපිත ඇපකරවලට අදාලව වලංගු හිමිකම් නිසා පැන නගින ප්‍රතිමුඛ ප්‍රේෂණ සිදු කිරීමටද බලයලත් වෙළෙන්දන් වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකුවලට අවසරය ලබා දෙනු ලැබේ.

7.2 ඇපකරයක උපරිම වලංගු හිමිකම් වටිනාකම පාදක වූ ප්‍රාග්ධන ගනුදෙනුවෙහි ඉතිරිව පවත්නා බැඳීමෙහි සමානුපාතිකය දක්වා සීමා විය යුතුය. ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සමාගමක් (ආයෝජකයා) වෙනුවෙන් ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගමක් (ආයෝජිතයා) සඳහා නිකුත් කර ඇති ඇපකරයක වලංගු හිමිකමක් පැන නැගුනු අවස්ථාවක, හිමිකමේ උපරිම වටිනාකම, එම හිමිකම බලපවත්නා අවස්ථාවේ ඉතිරිව පවත්නා බැඳීම ආයෝජකයා විසින් ආයෝජිතයාගේ දරන කොටස් හිමිකමේ ප්‍රතිශතයට සමානුපාතික හෝ අඩු විය යුතුය.

**8. විදේශ විනිමය දෙපාර්තමේන්තුවට වාර්තා කිරීම**

ඇමුණුම 01 ට අනුව ප්‍රාග්ධන ගනුදෙනු පිළිබඳ නියෝගයන් මගින් අවසර දී ඇති පරිදි බලයලත් වෙළෙන්දෙකු වශයෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් නිකුත් කරන ලද ඇපකරවල කාර්තුමය වාර්තාවක් එළඹෙන මාසයේ 15වන දින හෝ ඊට පෙර යොමු කළ යුතුය. (පරිලෝකන පිටපත dfem@cbsl.lk හරහා යොමු කළ යුතුය.)

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව

ඇමුණුම 1

## ඇපකර පිළිබඳ වාර්තාව

බලයලත් වෙළෙන්දාගේ නම : ..........

වර්ෂය/කාර්තුව : ..........

1. ඇපකර

| නිකුත් කළ ඇපකර ගණන | කල් පිරුණු ඇපකර ගණන | ඉතිරි වටිනාකම |
|---|---|---|
| | | |
| | | |

2. හිමිකම් යටතේ කරන ලද ප්‍රතිමුඛ ප්‍රේෂණ පිළිබඳව විස්තර

| ආයතනයේ නම | ප්‍රේෂණයේ දිනය සහ වටිනාකම | හිමිකමෙහි ස්වභාවය | ඇපකර වර්ගය (සංස්ථාපිත/අත්තිකාරම් ගෙවීම්/පොරොත්තු ණයවර ලිපි හෝ වෙනත්) |
|---|---|---|---|
| | | | |
| | | | |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික වෙමි.

..........

දිනය .......... බලයලත් නිලධාරියාගේ නම සහ අත්සන

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2017 අංක 24 දරන විධානයන්** 2017 නොවැම්බර් 27

## රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හා රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම් සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2017 අංක 02 දරන විදේශ විනිමය (ප්‍රාග්ධන ගනුදෙනුවල යෙදීමේ කාර්යය සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම) නියෝග සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 9(1) සහ 9(2) වගන්ති ප්‍රකාරව, නියෝගයන්හි දක්වා ඇති සුදුසුකම්ලත් පුද්ගලයින්ට අමතරව පහත සඳහන් පුද්ගලයින්ගේ නමින්ද රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සහ රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම් විවෘත කිරීමට හා පවත්වාගෙන යාමට බලයලත් වෙළෙඳුන් වෙත මෙයින් අවසර දෙනු ලැබේ.

**1.1 සුදුසුකම්ලත් පුද්ගලයින්**

(අ) විදේශීය රාජ්‍ය තාන්ත්‍රික කාර්යාල

(ආ) රාජ්‍ය තාන්ත්‍රික හෝ රාජ්‍ය තාන්ත්‍රික නොවන ගමන් බලපත්‍රයක් සහිත, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නේවාසික වීසා ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබූ, විදේශ රාජ්‍ය තාන්ත්‍රිකයෙකුගේ ශ්‍රී ලංකාව තුළ සිටින පවුලේ සාමාජිකයන්

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව

**චක්‍රලේඛය - 01/17**

**යොමුව - 37/06/001/0001/016** 2017 ජනවාරි 16

බලපත්‍රලාභී බැංකු/ බලපත්‍රලාභී මූල්‍ය ආයතනයන්හි ප්‍රධාන විධායක නිළධාරීන් වෙතටයි.

මහත්මයාණෙනි, මහත්මියෙනි,

## අවදානම මත පදනම් වූ පිවිසුම ප්‍රකාරව, සිදු කරන එතැන් පරීක්ෂණ සැලැස්ම 2017

මූල්‍ය බුද්ධි ඒකකය විසින්, 2016 අංක 1 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීති සහ 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත ප්‍රකාරව, අවදානම මත පදනම් වූ පිවිසුමට යටත්ව, බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය ආයතන එතැන් පරීක්ෂණයන් සිදු කරනු ලබයි. පරීක්ෂණ කාල සීමාව ඇතුළත, පරීක්ෂකයන් විසින් යෝග්‍ය පද්ධති තිබීම සහ මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම හඳුනා ගැනීම සහ අවම කිරීමේ පාලනයන් කිරීම් වෙත කේන්ද්‍ර කරනු ලබයි. උක්ත පරීක්ෂණයන් සම්බන්ධයෙන් පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලබයි.

(අ) මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 18 වන වගන්තිය සමඟ කියැවෙන, 15 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ඉ) ඡේදය ප්‍රකාරව, මූල්‍ය බුද්ධි ඒකකයේ අධ්‍යක්ෂ විසින් අදාළ මූල්‍ය ආයතනයෙහි ප්‍රධාන විධායක නිළධාරි වෙත පරීක්ෂණයේ ආරම්භය පිළිබඳව ලිඛිතව දැනුම් දෙනු ලබයි.

(ආ) එතැන් පරීක්ෂණය සිදු කිරීම සඳහා, පරීක්ෂකයන් විසින් මූල්‍ය ආයතනයේ ප්‍රධාන ශාඛාව/ තෝරාගත් ශාඛා, පරීක්ෂා කරනු ලබයි.

(ඇ) ප්‍රධාන කළමණාකාරීත්වයට අනාවරණයන් දැනුම් දීම සඳහා සමාප්ත කිරීමේ රැස්වීමක් පවත්වනු ලබයි.

(ඈ) අවශ්‍ය වේ නම්, මූලික අනාවරණයන් ගැන සාකච්ඡා කිරීමට සහ අඩුපාඩුකම් නිවැරදි කර ගැනීමේ ක්‍රියාමාර්ග සැලැස්මක් යෝජනා කිරීම සඳහා මූල්‍ය බුද්ධි ඒකකය විසින්, මූල්‍ය ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ රැස්වීමක් කැඳවනු ලබයි.

(ඉ) මූල්‍ය බුද්ධි ඒකකය විසින් පෙන්වාදෙන ලද පද්ධතීන් හා පාලනය කිරීම්හි අඩුපාඩුකම් නිවැරදි කර ගැනීම සඳහා, එම අනාවරණය කිරීම්, පළමුවෙන්ම පැවැත්වෙන මාණ්ඩලික රැස්වීමේදී ලේඛනගත කර, එකී මාණ්ඩලික රැස්වීමේ සිට දින 15ක් ඇතුළත, මණ්ඩලය විසින් අනුමත කරන ලද කාල රාමුවක් සහිත ක්‍රියාමාර්ග සැලැස්මක් යොමු කරන ලෙස මූල්‍ය ආයතනවලට දැනුම් දෙනු ලබයි.

(ඊ) අනුකූල වීම පැහැර හරින අවස්ථාවකදී, මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 19 වන වගන්තියට අනුකූලව කටයුතු කිරීමට මූල්‍ය ආයතන වගකිව යුතුය.

අධ්‍යක්ෂ
**මූල්‍ය බුද්ධි ඒකකය**

පිටපත : අනුකූලතා නිළධාරි

**චක්‍රලේඛය - 02/17**

**යොමුව - 37/05/002/0001/016** 2017 ජනවාරි 20

ප්‍රධාන විධායක නිළධාරී/ ප්‍රධාන කළමණාකරු/ කළමණාකාර අධ්‍යක්ෂ වෙතටයි,

(මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන්ට අදාළයි)

මහත්මයාණෙනි, මහත්මියෙනි,

## 2017 අංක 01 දරන මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් සඳහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ ත්‍රස්තවාදය සඳහා මුදල් සැපයීම වැළැක්වීමට අනුකූල වීමට බැඳී සිටීමේ මාර්ග නිර්දේශය

ඉහත සඳහන් මාර්ග නිර්දේශය ආසන්න ඉදිරි දිනයකදී බලාත්මක වන අතර, එය 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත සහ 2016 අංක 1 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීති සමග කියැවිය යුතුය.

මෙයට විශ්වාසි,
අධ්‍යක්ෂ
**මූල්‍ය බුද්ධි ඒකකය**

පිටපත : අනුකූලතා නිළධාරි

## 2017 අංක 01 දරන මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් සඳහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ ත්‍රස්තවාදය සඳහා මුදල් සැපයීම වැළැක්වීමට අනුකූල වීමට බැඳී සිටීමේ මාර්ග නිර්දේශය

**හැඳින්වීම :**

(අ) 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ, මූල්‍ය බුද්ධි ඒකකය සතු බලතල අනුව, නිකුත් කරන ලද, 2016 ජනවාරි 27 දින අංක 1951/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ 2016 අංක 1 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීති, නිකුත් කරන ලද දින සිට, මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ වගන්ති 33 යටතේ නියම කරන ලද "මූල්‍ය ව්‍යාපාරයන්හි" නියුතු ආයතනවලට අදාල වේ.

(ආ) 2016 අංක 1 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීති 3 වන රීතිය යටතේ අදාළ වන පරිදි, රීතිය විසින් මූල්‍ය ආයතන වලට, වෙනත් කරුණු අතර, තම ගනුදෙනුකරුවන් වෙතින් යොමුවන මුදල් විශුද්ධිකරණ අවදානම් සහ ත්‍රස්තවාදය වෙනුවෙන් මුදල් සැපයීමේ අවදානම් හඳුනාගැනීමේ, තක්සේරු කිරීමේ සහ කළමනාකරණය කිරීමේ කාර්යය සඳහා,

නොකඩවා ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීම මඟින්, මේ රීති වල සඳහන් කරනු ලබන පියවර ගැනීමට අවස්ථාව හඳුන්වා දී ඇත.

(ඈ) 2016 අංක 1 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීති යටතේ අර්ථ දක්වන ලෙස මුදල් හෝ වටිනාකම් පැවරීමේ සේවාවන්, මූල්‍ය බුද්ධි ඒකකය විසින් නිකුත් කරන ලද වර්තමාන මාර්ග නිර්දේශ වලට අනුකූල විය යුතු අතර, එකී රීති වලට හා මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 2 වන වගන්තියට අදාළව, රීතිවල දක්වා ඇති පරිදි අවදානම මත පදනම් වූ පිවිසුම මත පිහිටා නොකඩවා ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීම මගින්, මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත සහ රීතිවල දක්වා ඇති විධිවිධාන අනුව අනුකූලතාව පවත්වා ගැනීමට ඉඩ සලසා ඇති අතර, ජංගම දුරකථන මත පදනම් වූ විද්‍යුත් මුදල් පද්ධති මෙහෙයවන්නන් සඳහා ප්‍රතිපත්තීන් හා ප්‍රමිතීන් සැලැස්මක් සකසා ඇත.

(ඇ) ඉහත සඳහන් මාර්ග නිර්දේශ ආසන්න ඉදිරි දිනයකදී බලාත්මක වන අතර, එය 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්ථා කිරීමේ පනත සහ 2016 අංක 01 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරු පිළිබඳ නිසි උද්යෝගයේන ක්‍රියා කිරීමේ) රීති සමඟ කියැවිය යුතුය. මෙම මාර්ගනීති කඩ කිරීමකදී හෝ අනුකූල නොවීමකදී, මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ අර්ථ දක්වා ඇති, දඩ, සම්බාධක හා ක්‍රියාමාර්ගයන්ට යටත් වේ.

**2. යෝග්‍යතාවය**

2016 අංක 01 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරු පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීතිවල දක්වා ඇති පරිදි, සියළුම මුදල් හෝ වටිනාකම් පැවරීමේ සේවාවන් සපයන ආයතනවලට මෙම මාර්ග නිර්දේශයෙන් අදාළ වන අතර, ඒවාට පමණක් සීමා නොවේ.

i. 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී සහ මුදල් හෝ වටිනාකම් පැවරීමේ සේවාවන් පවත්වාගෙන යන ආයතන;

ii. 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී සහ මුදල් හෝ වටිනාකම් පැවරීමේ සේවාවන් පවත්වාගෙන යන ආයතන;

iii. 1953 අංක 24 දරන විනිමය පාලන පනත යටතේ අවසර ලත් මුදල් හෝ වටිනාකම් පැවරීමේ සේවා සපයන ආයතන;

iv. 2005 අංක 28 දරන ගෙවීම් හා පියවීම් පද්ධති පනතට අනුව බලපත්‍රලාභී, ජංගම දුරකථන මත පදනම් වූ විද්‍යුත් මුදල් පද්ධති මෙහෙයවන්නන්; සහ

v. මූල්‍ය බුද්ධි ඒකකය විසින් හඳුනාගත් මුදල් හෝ වටිනාකම් පැවරීමේ සේවාවන්ට සමානවන, වෙනත් කිසියම් ආයතනයක්.

**3. මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අවශ්‍යතාවය**

3.1 ප්‍රධාන විධායක නිළධාරියා/ මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන ආයතනයේ ප්‍රධානියා විසින් මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 14 වන වගන්තියට අනුකූලව මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අනුකූලතා කාර්යයෙහි වගකීම සහිත ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ නිළධාරියකු ආයතනයේ අනුකූලතා නිලධාරියා ලෙස පත් කරනු ලබන අතර එම නිලධාරියාගේ විස්තර මූල්‍ය බුද්ධි ඒකකය වෙත දැනුම් දෙනු ලබයි.

3.1.1 එසේ පත් කළ අනුකූලතා නිලධාරියා පිළිබඳව ලැබෙන්නා වූ තොරතුරු මත මූල්‍ය බුද්ධි ඒකකයේ වෙබ් අඩවියට ප්‍රවේශ වීමට අවශ්‍ය විධිවිධාන සැකසීම මූල්‍ය බුද්ධි ඒකකය විසින් සිදු කරනු ලබයි.

3.1.2 සියළුම මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් මුදලින් රුපියල් මිලියනයක් (රු. 1,000,000) හෝ විදේශ මුදලින් ඊට සමාන වටිනාකමක් සහිත මුදල් ගනුදෙනු සහ/ හෝ විද්‍යුත් මුදල් ප්‍රේෂණ ගනුදෙනු මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කරනු ලබයි.

3.1.2.1. ඉහත සඳහන් මුදල් ප්‍රමාණය තනි පුද්ගලයකු විසින් එම තැනැත්තා යටතේ ලියාපදිංචි කළ තනි ගිම්පතක් හෝ සිම්පත් කිහිපයක් යොදා ගනිමින් එක් දිනකදී සිදු කරන ලද තනි ගනුදෙනුවක් හෝ ගනුදෙනු කිහිපයක එකතුවක් ලෙස ගත හැකිය.

3.1.3 මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් හට එම මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවාවන් මඟින් නිකුත් කළ උපරිම සිම්පත් ගණන, සිම්පත්වල තොරතුරු සහ ලියාපදිංචිය/ ලියාපදිංචි කළ පුද්ගලයින්ගේ විස්තර හඳුනාගත හැකි විය යුතුය.

3.1.4 මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් විසින් සේවා සපයන්නන් හට එක් දිනකදී සිදු කළ සියලු ගනුදෙනුවල මුළු වටිනාකම හඳුනා ගැනීම සඳහා නිකුත් කළ සිම්පත් එකිනෙක සම්බන්ධ කිරීමට ප්‍රායෝගිකව ගත හැකි සියලු උත්සාහයන් ගැනීමට වග බලා ගත යුතුය.

3.1.5 මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් හැකිතාක් ප්‍රායෝගික ලෙස අරමුදල් හුවමාරුවට අදාල ප්‍රතිලාභී හිමිකාරීත්වය පිළිබඳව හඳුනා ගැනීමට උත්සාහ කළ යුතු අතර, එකිනෙකට සම්බන්ධ ගනුදෙනු ඇත්නම්, එවැනි ගනුදෙනු පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

3.1.6 එවැනි වාර්තා ඇමුණුම 1 හි නිර්දේශිත ආකෘතියට අනුව සති දෙකක කාල රාමුවක් මත පදනම්වන පරිදි සකස්කර "ලංකාෆින්" (LankaFIN) මාර්ගගත වාර්තාකරණ පද්ධතිය හරහා මූල්‍ය බුද්ධි ඒකකයට ලැබීමට සැලැස්විය යුතුය.

3.1.7 සෑම මසකම 01 වන දින සිට 15 වන දින දක්වා වාර්තාවක් එම මස 30 වන දින හෝ ඊට පෙර මූල්‍ය බුද්ධි ඒකකයට යොමු කළ යුතු අතර සෑම මසකම ඉතිරි දින සඳහා වාර්තාවක් ඊළඟ මස 15 වන දින හෝ ඊට ප්‍රථම මූල්‍ය බුද්ධි ඒකකයට යොමු කළ යුතුය.

3.2 ඕනෑම මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නෙක් සතුව නීති විරෝධී කටයුත්තක් සම්බන්ධ ගනුදෙනුවක් හෝ එවැනි ගනුදෙනුවකට තැත් කිරීමක් සම්බන්ධව සාධාරණ පසුබිමක් සහිත සැකයක් වේ නම්, එවැනි මුදල් හෝ වටිනාකම් පැවරීම්

සේවා සපයන්නකු මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ සහ මෙම මාර්ග නිර්දේශයන්හි දක්වා ඇති කාර්ය පටිපාටියට අනුකූලව, සැක කටයුතු මුදල් ගනුදෙනු වාර්තාවක් මූල්‍ය බුද්ධි ඒකකය වෙත ගොනු කළ යුතුය.

3.3. සෑම මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නෙක් සතුවම අසාමාන්‍ය හැසිරීම් රටාවන් සහිත අරමුදල් හෝ ගනුදෙනු හඳුනා ගෙන එවැනි අරමුදල් හෝ ගනුදෙනු කාලීන රාමුවක් තුළ සියුම්ව පරීක්ෂාකර, එම අරමුදල් හා ගනුදෙනු සැකකළ යුතු අරමුදල් හා ගනුදෙනුද නැද්ද යන්න හඳුනා ගැනීම සඳහා අවශ්‍ය කරන ක්‍රියා පිළිවෙළක් පැවතිය යුතුය.

3.4 සෑම මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නෙක්ම ඇමුණුම 2 හි නිර්දේශිත ආකෘතියට අනුව සකස් කළ සැක කටයුතු ගනුදෙනු වාර්තාවන්, "ලංකාෆින්" මාර්ගගත පද්ධතිය හරහා වාර්තා කිරීමට වග බලා ගත යුතුයි.

3.5 ආරම්භක ගනුදෙනුකරු හා ප්‍රතිලාභියා පිළිබඳ අපේක්ෂිත තොරතුරු නොමැති වීම, විද්‍යුත් අරමුදල් හෝ විද්‍යුත් ප්‍රේෂණ සම්බන්ධ ගනුදෙනු සැක කටයුතු ගනුදෙනුවක්ද නැද්ද යන්න තීරණය කිරීමට සහ එය මූල්‍ය බුද්ධි ඒකකයට වාර්තා කළ යුතුද නැද්ද යන්න තීරණය කිරීමට සාධකයක් ලෙස සැලකිය යුතුය.

3.6 සෑම මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නෙක් විසින්ම ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත (ඇත්නම්) සිය ආයතනයේ නියෝජිතයින්, උප නියෝජිතයින් සහ/ හෝ වෙළඳ නියෝජිතයින්ගේ යාවත්කාලීන ලැයිස්තුවක් පවත්වාගත යුතු අතර මූල්‍ය බුද්ධි ඒකකයට, මූල්‍ය බුද්ධි ඒකකයේ ඉල්ලීම මත එම ලැයිස්තුවට ප්‍රවේශ වීමට ඉඩ ලබා දිය යුතුය.

3.7 සෑම මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නෙක්ම ගනුදෙනුකරු පිළිබඳව සුපරීක්ෂාකාරී වීමේ ක්‍රියාවලිය පූර්ණය කිරීම සඳහා ඉලෙක්ට්‍රොනික හෝ ස්වයංක්‍රීය නොවන කළමනාකරණ තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යා යුතුය.

3.8 මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් කිසි විටෙක පාරිභෝගිකයින්ගේ ප්‍රතිලාභය සඳහා ඉදිරිපත් කරනු ලබන නවීකරණයන් වශයෙන් වන තාක්ෂණික වර්ධනයන් අවභාවිතා නොකළ යුතු අතර එවැනි අවභාවිතයන් මූල්‍ය බුද්ධි ඒකකය විසින් නිකුත් කර ඇති ඕනෑම රීතියක් සහ ගනුදෙනුකරු හඳුනා ගැනීම/ ගනුදෙනුකරු පිළිබඳ සුපරීක්ෂාකාරී වීමේ ප්‍රායෝගික භාවිතයන් කඩ කිරීමක් ලෙස සැලකිය හැකිය.

3.9 මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් හට විදේශ නියෝජිතයින්, උප නියෝජිතයින් සහ/ හෝ වෙළෙඳ නියෝජිතයින් සිටින විටෙකදී, එවැනි නියෝජිතයින්/ උප නියෝජිතයින්/ වෙළෙඳ නියෝජිතයින් ශ්‍රී ලංකාවේ නීතිරීති හා රෙගුලාසි මත සකස් වූ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අවශ්‍යතාවයන්ට අනුරූපීව මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමට අදාල දර්ශකයන් ක්‍රියාත්මක කරන බව සහතික කිරීමට සේවා සපයන්නා කටයුතු කළ යුතුය.

3.9.1 විදේශීය රටක මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අවම අවශ්‍යතාවයන් ශ්‍රී ලංකාවේ පසුබිමට වඩා ලිහිල් වූ අවස්ථාවලදී, මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නා විසින් ශ්‍රී ලංකාවේ රාමුව තුළ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අවශ්‍යතාවයන් ක්‍රියාවට නැංවීමට අවශ්‍ය පියවර ගත යුතුය.

**4 අවදානම් කළමනාකරණ කාර්යයන්**

4.1 "අවදානම මත පදනම් වූ ප්‍රවේශ" රාමුව තුළ, අවදානම් කළමනාකරණ කාර්යයේ තීව්‍ර බව සහ පෘථුල බව, මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් සතු කාර්යයන්ගේ සහ මුදල් විශුද්ධිකරණය/ ත්‍රස්තවාදයට මුදල් සැපයීම පිළිබඳ අවදානම් පැතිකඩෙහි ස්වභාවය, තත්ත්වය සහ සංකීර්ණ බවට සමානුපාතික විය යුතුය. ඒ අනුව, මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් විසින් වැදගත්කම හා අවදානම මත පදනම්ව ගනුදෙනුකරු පිළිබඳ සුපරීක්ෂාකාරී වීමේ අවශ්‍යතා ක්‍රියාවට නැංවීමට කටයුතු කළ යුතුය.

4.2 සෑම මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නෙක්ම,

(අ) අවශ්‍ය විශ්ලේෂණයන් සිදු කිරීම සහ ආයතනිකව සහ ක්‍රියාකාරීත්වයේදී බහුල මුදල් විශුද්ධිකරණ/ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම හඳුනා ගැනීම;

(ආ) හඳුනාගත් මුදල් විශුද්ධිකරණ/ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම් කළමනාකරණයට සහ අවම කිරීමට ප්‍රතිපත්ති, පාලනය කිරීම් සහ කාර්යපටිපාටි පවත්වාගෙන යාම;

(ඇ) එම ප්‍රතිපත්ති, පාලනය කිරීම් සහ කාර්ය පටිපාටි ක්‍රියාත්මක කරන ආකාරය නියාමනය කිරීම සහ අවශ්‍ය වේ නම් ඒවා ප්‍රවර්ධනය කිරීම; සහ

(ඈ) හඳුනාගත් ඉහළ අවදානම් පැතිකඩ සඳහා අවදානම් කළමනාකරණය කිරීම සහ අවම කිරීම සඳහා යෝග්‍ය පියවර ගැනීම; සිදු කළ යුතුය.

4.3 සෑම මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නෙක් විසින්ම නව ගනුදෙනුකරුවන් සහ පූර්ව ගනුදෙනුකරුවන් සඳහා, නව බෙදා හැරීම් යාන්ත්‍රණ සහ නවීන හෝ දියුණු වෙමින් පවතින තාක්ෂණය භාවිතා කිරීමද ඇතුළුව, නව ව්‍යාපාර පරිචයන් වර්ධනයට අදාලව උපචිත වන මුදල් විශුද්ධිකරණය/ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ අවදානම හඳුනා ගෙන තක්සේරු කරනු ලැබිය යුතුය.

**5 සේවා නියුක්තිකයන්/ නියෝජිතයින්/ උප නියෝජිතයින් පිරික්සුම් කිරීමේ කාර්ය පටිපාටිය**

5.1 මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් විසින් එහි මෙහෙයුම් ප්‍රමාණය හා වාර්තා කරන ආයතනයන්ගේ මුදල් විශුද්ධිකරණය/ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ ක්‍රියාකාරකම්වලට නිරාවරණය වන අවදානමට අනුව සේවා නියුක්තික/ නියෝජිත/ උප නියෝජිත/ වෙළෙඳ නියෝජිත පරීක්ෂණ කණ්ඩායමක් සහ පිරික්සුම් කිරීමේ ක්‍රියා පටිපාටියක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය.

5.2 පිරික්සුම් කිරීමේ කාර්ය පටිපාටිය සේවා නියුක්තිකයින්/ නියෝජිතයින්/ උප නියෝජිතයින්/ වෙළෙඳ නියෝජිතයින්ගේ බඳවා ගැනීමේ සිට සේවාව/ කටයුත්ත පුරා පැතිර යන පරිදි ක්‍රියාවට නැංවිය යුතුය.

5.3 මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් විසින් ඒවායේ සේවා නියුක්තිකයින් සඳහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ භාවිතයන් සහ නියමයන් සම්බන්ධව දැනුවත් කිරීම් සහ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය. එම වැඩසටහන් ක්‍රමානුකූලව පැවැත්විය යුතු අතර ඊට නවීන පථයන් එක් විය යුතුය.

5.4 මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන් තම නියෝජිතයින්, උප නියෝජිතයින් සහ වෙළෙඳ නියෝජිතයින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමට අදාල ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටියන්ට අනුව කටයුතු කරන බවට තහවුරු කර ගතයුතු අතර ක්‍රමවත් ස්වාධීන විගණන ක්‍රියාවලියක් මඟින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අනුකූලතාවයන් සාධනීය ලෙස ක්‍රියාවට නැංවීම තහවුරු කළ යුතුය.

**ඇමුණුම I**

## මුදල් හෝ වටිනාකම් පැවරීමේ සේවා සපයන්නන් සඳහා මූල්‍ය බුද්ධි ඒකකයේ දත්ත වාර්තා කිරීමේ ආකෘතිය

මූල්‍ය බුද්ධි ඒකකය විසින් පහත අවස්ථා සඳහා ඉලෙක්ට්‍රොනික ගොනු දෙකක් අපේක්ෂා කරයි.

1. ලැබෙන විද්‍යුත් මුදල් හුවමාරු
2. යවන ලද විද්‍යුත් මුදල් හුවමාරු

ලැබෙන විද්‍යුත් මුදල් හුවමාරු (ශ්‍රී ලංකාව තුළට)

නියම කර ඇති සීමාවට වැඩි, සියළුම විද්‍යුත් මුදල් ලැබීම්, පහත දක්වා ඇති ආකෘතියට අනුව වාර්තා කළ යුතුය.

| කාණ්ඩයේ නම | දත්ත වර්ගය | අනිවාර්ය බව | විස්තරය |
|---|---|---|---|
| බැංකු කේතය | Number(4) | ඔව් | මූල්‍ය බුද්ධි ඒකකය විසින් නිකුත් කර ඇති ආයතන කේතය (NNNN) |
| ගනුදෙනුවේ දිනය | Number(8) | ඔව් | YYYYMMDD |
| | | | උදා- 2016/03/05 වෙනුවට 20160305 |
| | | | මුදල් ලැබුණු දිනය |
| විදේශ ව්‍යවහාර මුදල් (FCY) අගය | Number(16,2) | ඔව් | දේශීය හෝ විදේශීය මුදල් අගය |
| ව්‍යවහාර මුදල් කේතය | Text(3) | ඔව් | ව්‍යවහාර මුදල් වර්ගය |
| රුපියල් අගය | Number(16,2) | ඔව් | ශ්‍රී ලාංකික රුපියල් අගය (LKR) |
| ගනුදෙනුවේ විස්තර | Text(120) | ඔව් | අභිමතාර්ථය |
| යවන්නාගේ නම | Text(5) | ඔව් | සම්පූර්ණ නම/යවන්නාගේ මුලකුරු සමඟ නම |
| යවන්නාගේ ලිපිනය | Text(150) | ඔව් | යවන්නාගේ ලිපිනය |
| යවන්නාගේ ව්‍යාපාරය | Text(50) | නැත | යවන්නාගේ ව්‍යාපාරයේ ස්වභාවය/වෘත්තීය/රක්ෂාව |
| යවන්නාගේ නියෝජිත අංකය | Text((12) | ඔව් | කේතය/උප නියෝජිතයාගේ හැඳුනුම්පත් අංකය |
| ගෙවීම් කරන ආකාරය | Text((50) | ඔව් | ගෙවීම් කරන ආකාරය/බෙදාහැරීමේ විකල්පය උදා- නියෝජිත ස්ථානයේදී මුදල්, ජංගම පසුම්බියට සිදු කරන තැන්පතු, බැංකු ගිණුමකට සිදු කරන තැන්පතු ආදිය |
| යවන්නාගේ රට | Text((150) | ඔව් | යවන්නාගේ රට |
| ලබන්නාගේ නියෝජිත හැඳුනුම්පත් අංකය | Text((12) | ඔව් | උප නියෝජිතයාගේ කේතය/හැඳුනුම්පත් අංකය |
| ලබන්නාගේ ගිණුම් අංකය | Text((30) | නැත | |
| ලබන්නාගේ නම | Text((75) | ඔව් | ලබන්නාගේ සම්පූර්ණ නම/මුලකුරු සමඟ නම |
| ලබන්නාගේ ජාතික හැඳුනුම්පත් අංකය | Text((30) | ඔව් | ජාතික හැඳුනුම්පත් අංකය හා ව්‍යාපාර ලියාපදිංචි අංකය |
| ලබන්නාගේ ලිපිනය 1 | Text((75) | ඔව් | |
| ලබන්නාගේ ලිපිනය 2 | Text((75) | ඔව් | |
| ලබන්නාගේ ලිපිනය 3 | Text((75) | නැත | |
| ලබන්නාගේ ව්‍යාපාරය | Text((75) | ඔව් | |
| ගනුදෙනුවේ යොමුව | Text((30) | ඔව් | ගනුදෙනුව හඳුනාගත හැකි අද්විතීය කේතය |

**විද්‍යුත් මුදල් හුවමාරුව (ශ්‍රී ලංකාවෙන් පිටත)**

නියම කර ඇති සීමාවට වැඩි, සියළුම විද්‍යුත් මුදල් ගෙවීම්, පහත දක්වා ඇති ආකෘතියට අනුව, වාර්තා කළ යුතුය.

| කාණ්ඩයේ නම | දත්ත වර්ගය | අනිවාර්ය බව | විස්තරය |
|---|---|---|---|
| බැංකු කේතය | Number(4) | ඔව් | මූල්‍ය බුද්ධි ඒකකය විසින් නිකුත් කර ඇති ආයතන කේතය (NNNN) |
| ගනුදෙනුවේ දිනය | Number(8) | ඔව් | YYYYMMDD |
| | | | උදා- 2016/03/05 වෙනුවට 20160305 |
| | | | මුදල් ලැබුණු දිනය |

| | | | |
|---|---|---|---|
| විදේශ ව්‍යවහාර මුදල් (FCY) අගය | Number(16,2) | ඔව් | විදේශ මුදල් අගය |
| ව්‍යවහාර මුදල් කේතය | Text(3) | ඔව් | ව්‍යවහාර මුදල් කේතය |
| රුපියල් අගය | Number(16,2) | ඔව් | ශ්‍රී ලාංකික රුපියල් අගය (LKR) |
| ගනුදෙනුවේ විස්තර | Text(120) | ඔව් | අභිමතාර්තය |
| යවන්නාගේ නියෝජිත හැඳුනුම්පත් අංකය | Text(12) | ඔව් | කේතය/උප නියෝජිතයාගේ හැඳුනුම්පත් අංකය |
| යවන්නාගේ ගිණුම් අංකය | Text(30) | නැත | යවන්නාගේ ලිපිනය |
| යවන්නාගේ නම | Text(75) | ඔව් | යවන්නාගේ සම්පූර්ණ නම/මුලකරු සමඟ නම |
| යවන්නාගේ හැඳුනුම්පත් අංකය | Text(30) | ඔව් | ජාතික හැඳුනුම්පත් අංකය හෝ ව්‍යාපාරයේ ලියාපදිංචි අංකය |
| යවන්නාගේ ලිපිනය 1 | Text(75) | ඔව් | |
| යවන්නාගේ ලිපිනය 2 | Text(75) | ඔව් | |
| යවන්නාගේ ලිපිනය 3 | Text(75) | නැත | |
| යවන්නාගේ ව්‍යාපාරය | Text(50) | ඔව් | යවන්නාගේ ව්‍යාපාරයේ ස්වභාවය/වෘත්තීය/රක්ෂාව |
| ලබන්නාගේ නම | Text(75) | ඔව් | ලබන්නාගේ සම්පූර්ණ නම/මුලකරු සමඟ නම |
| ලබන්නාගේ ලිපිනය | Text(75) | ඔව් | |
| ලබන්නාගේ ව්‍යාපාරය | Text(75) | නැත | |
| ලබන්නාගේ නියෝජිත හැඳුනුම්පත් අංකය | Text(12) | ඔව් | උප නියෝජිතයාගේ කේතය/හැඳුනුම්පත් අංකය |
| ගෙවීම් සිදු කරන ආකාරය | Text(50) | ඔව් | ගෙවීම් කරන ආකාරය/බෙදා හැරීමේ විකල්පය. උදා- නියෝජිත ස්ථානයේදී මුදල්, ජංගම පසුම්බියට සිදුකරන තැන්පතු, බැංකු ගිණුමකට සිදු කරන තැන්පතු ආදිය |
| ලබන්නාගේ රට | Text(150) | ඔව් | ලබන්නාගේ රට |
| ගනුදෙනුවේ කේතය | Text(30) | ඔව් | ගනුදෙනුවේ කේතය - ගනුදෙනුව හඳුනාගත හැකි අද්විතීය කේතය |

**ඇමුණුම II**

## සැක කටයුතු ගනුදෙනු වාර්තාව (STR)

**සැක කටයුතු ගනුදෙනු වාර්තාව**

අ. 2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ සැක කටයුතු ගනුදෙනු වාර්තා කිරීමේ අවශ්‍යතාවයට අනුව, මෙම වාර්තාව සකස් කර ඇත.

ආ. මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 12 වගන්තිය යටතේ, යහපත් චේතනාවෙන් එවැනි වාර්තාවක් පිළියෙල කරන පුද්ගලයෙකුට විරුද්ධව කිසිදු සිවිල් හෝ විනයානුකූල වාර්තාවක් ඉදිරිපත් කළ නොහැක.

ඇ. සැක සහිත බව, ගනුදෙනුකරුට හෝ වෙනත් පුද්ගලයෙකුට දැනුම් දීම, මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 9 වන වගන්තිය උල්ලංඝනය කිරීමේ දඬුවම් ලැබිය හැකි වරදකි.

ඈ. මෙම කාර්ය සටහන අදාළ වන්නේ,

- i. 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී සහ මුදල් හෝ වටිනාකම් පැවරීමේ සේවාවන් පවත්වාගෙන යන ආයතන;
- ii. 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී සහ මුදල් හෝ වටිනාකම් පැවරීමේ සේවාවන් පවත්වාගෙන යන ආයතන;
- iii. 1953 අංක 24 දරන විනිමය පාලන පනත යටතේ අවසර ලත් මුදල් හෝ වටිනාකම් පැවරීමේ සේවා සපයන ආයතන;
- iv. 2005 අංක 28 දරන ගෙවීම් හා පියවීම් පද්ධති පනතට අනුව බලපත්‍රලාභී, ජංගම දුරකථන මත පදනම් වූ විද්‍යුත් මුදල් පද්ධති මෙහෙයවන්නන්; සහ
- v. මූල්‍ය බුද්ධි ඒකකය විසින් හඳුනාගත්, මුදල් හෝ වටිනාකම් පැවරීමේ සේවාවන්ට සමානවන, වෙනත් කිසියම් ආයතනයක්.

| | |
|---|---|
| **A** | **කොටස - වාර්තාවේ විස්තර** |
| 1. | ආයතනයේ නම |
| 2. | ආයතනයේ ව්‍යාපාරය |
| 3. | වාර්තාව යවන දිනය |
| 4. | මෙය පෙර වාර්තාවක් ආදේශනය කිරීමක්ද? (ඔව්/නැත) |
| 5. | මෙය පෙර වාර්තාවක් ආදේශනය කිරීමක් නම්, පෙර යොමු අංකය? |

| | |
|---|---|
| **B** | **කොටස - සැක සහිත බව ගැන විස්තර** |
| 6. | සම්පූර්ණ නම (සංවිධානයක් නම්, සංවිධානයේ ලියාපදිංචි අංකය, සංවිධානයේ නම ලබා දිය යුතුය) |
| 7. | නේවාසික/ලියාපදිංචි ලිපිනය |
| 8. | ජාතික හැඳුනුම්පත් අංකය/විදේශ ගමන් බලපත්‍ර අංකය/රියදුරු බලපත්‍ර අංකය/ව්‍යාපාර ලියාපදිංචි අංකය/රජයේ කාර්යාංශයකින් නිකුත් කරන ලද වෙනත් හැඳුනුම්පත් අංකය |
| 9. | ජාතිය |
| 10. | ස්ත්‍රී/පුරුෂ බව: පිරිමි ☐ ගැහැණු ☐ |
| 11. | නේවාසික රට (තනි පුද්ගලයෙක් නම්) |
| 12. | ව්‍යාපාරය/රැකියා මාදිලිය |
| 13. | වෘත්තිය (අදාළ නම්, ගනුදෙනුව සිදුකරන පුද්ගලයාගේ ප්‍රධාන ක්‍රියාකාරීත්වය සඳහන් කරන්න) |
| 14. | සේවාදායකයාගේ නම (අදාළ නම්) |
| 15. | සම්බන්ධීකරණ තොරතුරු |
| 16. | අවසන් වරට සමාලෝචනය කළ දිනය |
| **C** | **කොටස - සැක සහිත ගනුදෙනුවේ/ක්‍රියාකාරකමේ සටහන** |
| 17. | ගිණුම් අංකය/ප්‍රතිපත්ති අංකය/ඉන්වොයිස් අංකය/වෙනත් යොමු අංකයක් (අදාළ වේ නම්) |
| 18. | පිහිටුම/ලිපිනය (සැක සහිත ගනුදෙනුව/ක්‍රියාකාරකම සිදු වූ) |
| 19. | ගනුදෙනුව සිදු වූ වාර ගණන |
| 20. | ගනුදෙනුව සිදු වූ දිනය |
| 21. | ව්‍යවහාර මුදල් වර්ගය (කේතය) |
| 22. | සැක සහිත ගනුදෙනුවට භාජනය වූ මුළු මුදල |
| 23. | ව්‍යවහාර විදේශ මුදල් ප්‍රමාණය (අදාළ වේ නම්) |
| 24. | ගෙවීම සිදු කරන ආකාරය (මුදල්/මුදල් හුවමාරුව/චෙක්/වෙනත්) |
| 25. | ගනුදෙනුවේ ප්‍රතිලාභියා, ඇත්නම් |
| 26. | අදාළ බැංකු ගිණුම් විස්තර (අදාළ වේ නම්) |
| 27. | ගනුදෙනුවේ/ක්‍රියාකාරකමේ වෙනත් විස්තර |
| 28. | තෝරා ගත් හේතු/සැක කිරීමට හේතු - සැක කිරීමට වෙනත් හේතු |
| **D** | **කොටස - වාර්තා කරන පුද්ගලයාගේ තොරතුරු** |
| 29. | වාර්තා කරන දිනය |
| 30. | වාර්තා කරන පුද්ගලයා/ඒජන්සියේ නම |
| 31. | ජාතික හැඳුනුම්පත් අංකය |
| 32. | තනතුර/වෘත්තිය |
| 33. | ලිපිනය |
| 34. | සම්බන්ධීකරණ තොරතුරු |
| 35. | අත්සන සහ කාර්යාලීය මුද්‍රාව |

මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ නෛතික අවශ්‍යතාවන්ට අනුකූල වීම සඳහා, වාර්තා කරන ආයතන විසින් සම්පූර්ණ කරන ලද සැක සහිත ගනුදෙනු වාර්තාවේ සහතික කරන ලද පිටපත් මූල්‍ය බුද්ධි ඒකකය වෙත භාර දිය යුතුය.

අධ්‍යක්ෂ
මූල්‍ය බුද්ධි ඒකකය
ශ්‍රී ලංකා මහ බැංකුව
30, ජනාධිපති මාවත,
කොළඹ 01
ශ්‍රී ලංකාව.

දුරකථන: +94112477125
ෆැක්ස්: +94112477692
විද්‍යුත් තැපැල: fiu@cbsl.lk
වෙබ් අඩවිය: http://fiusrilanka.gov.lk

**යොමු අංකය: 34/07/029/0001/002** 2017 ජනවාරි 10

**චක්‍රලේඛ අංකය: ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 01/2017**

ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගිත්ව ආයතන වෙත,

## 2017 ජනවාරි මස 20 වැනි දින ලංකාසෙට්ල් පද්ධතියේ ගනුදෙනු වේලාවන් සීමා කිරීම

ලංකාසෙට්ල් පද්ධතියේ සහභාගිත්ව ආයතනවල ගනුදෙනු වේලාවන් සීමා කිරීම සැලකිල්ලට ගනිමින් 2017 ජනවාරි මස 20 වැනි දින (2017 ජනවාරි 14 වැනි සෙනසුරාදා දිනට යෙදී තිබූ දෙමළ තෛපොංගල් දිනයට හිලව් වශයෙන්) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලංකාසෙට්ල් පද්ධතියේ ගනුදෙනු වේලාවන් පෙ.ව. 8.00 සිට ප.ව. 3.00 දක්වා සීමා කිරීමට තීරණය කර ඇත. ඒ අනුව, 2017 ජනවාරි මස 20 වැනි දින මධ්‍යහ්න 12.00 න් පසු ලංකාසෙට්ල් පද්ධතියේ මෙහෙයුම් කාල සටහන පහත සඳහන් පරිදි සංශෝධනය කර ඇත.

| මෙහෙයුම | සංශෝධිත වේලාව |
|---|---|
| විවට ප්‍රතිමිලදී ගැනුම් (වෙන්දේසිය) පියවීම | ප.ව. 12.45 |
| බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් - ගැලපුම් නිෂ්කාශනය සහ පියවීම් නිෂ්කාශනය | ප.ව. 2.00 |
| තෙවන පාර්ශ්වීය ගනුදෙනු සඳහා අවසන් වේලාව | ප.ව. 2.15 |
| බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් - ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය (දෙවන අදියර), ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණය (දෙවන අදියර), විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය (දෙවන අදියර) | ප.ව. 2.15 |
| නිත්‍ය තැන්පතු පහසුකම පියවීම | ප.ව. 2.30 |
| දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ආපසු ගෙවීම සහ නිත්‍ය ණය පහසුකම පියවීම | ප.ව. 2.45 |
| පද්ධතිය ගනුදෙනු සඳහා වැසීම | ප.ව. 3.00 |
| පද්ධතිය වැසීම | ප.ව. 3.30 |

ඩී. කුමාරතුංග
**අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්**

**යොමු අංකය: 34/07/029/0001/002** 2017 ජනවාරි 09

**චක්‍රලේඛ අංකය: ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 02/2017**

ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගිත්ව ආයතන වෙත,

## 2017 ජනවාරි මස 26 සහ 27 යන දිනයන්හිදී ලංකාසෙට්ල් පද්ධතියෙහි සජීවී මෙහෙයුම් කටයුතු ප්‍රතිප්‍රාප්ති වැඩබිමෙහි සිට සිදු කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිය ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් පරීක්ෂාවට ලක් කිරීමේ අරමුණ ඇතිව 2017 ජනවාරි මස 26 සහ 27 වැනි දිනයන්හිදී (බ්‍රහස්පතින්දා සහ සිකුරාදා) ලංකාසෙට්ල් පද්ධතියෙහි (තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ ලංකාසෙක්‍යු පද්ධතිය) සහ අනිකුත් අදාළ පද්ධතීන්හි මෙහෙයුම් කටයුතු ප්‍රතිප්‍රාප්ති වැඩබිමෙහි සිට සිදු කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සීබීඑස්එල්නෙට් (CBSLNet) සමග සම්බන්ධ කර ඇති ඔබ ආයතනයෙහි පෞද්ගලික පරිගණකයන් ප්‍රතිප්‍රාප්ති වැඩබිම වෙත පිවිසිය හැකි වන පරිදි සකසා ඇත. කෙසේ වෙතත්, 2017 ජනවාරි 26 වන දිනට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව මගින් එම සම්බන්ධතාවයන් පරීක්ෂා කර ගන්නා මෙන් ඉල්ලා සිටිමු. තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ පහත සඳහන් නිලධාරීන් අමතා අවශ්‍ය සහාය ලබා ගත හැකි වේ.

- ලසිත් ප්‍රනාන්දු මයා - 0112 477124 (lasith@cbsl.lk)
- රුසිරු බොරලුගොඩ මයා - 0112 398617 (rusiru@cbsl.lk)

ඩී. කුමාරතුංග
**අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්**

පිටපත්: ප්‍රධාන විධායක නිලධාරී - ලංකාක්ලියර් පුද්. සමාගම
මහ ලේකම් - ශ්‍රී ලංකා බැංකු සංගමය
සභාපති - ප්‍රාථමික අලෙවිකරුවන්ගේ සංගමය
ප්‍රධාන විධායක නිලධාරී - ලංකා මූල්‍ය සේවා කාර්යාංශ සමාගම

**යොමු අංකය: 34/07/029/0001/002** 2017 ජනවාරි 23

**චක්‍රලේඛ අංකය: ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 04/2017**

ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගිත්ව ආයතන වෙත,

## 2017 පෙබරවාරි මස 2 සහ 3 යන දිනයන්හිදී ලංකාසෙට්ල් පද්ධතියෙහි සජීවී මෙහෙයුම් කටයුතු ප්‍රතිප්‍රාප්ති වැඩබිමෙහි සිට සිදු කිරීම

ප්‍රතිප්‍රාප්ති වැඩබිමෙහි සිට සිදු කරන ලංකාසෙට්ල් පද්ධතියෙහි සජීවී මෙහෙයුම් කටයුතු, නොවැළැක්විය හැකි හේතූන් මත, 2017 ජනවාරි මස 26 සහ 27 දිනයන් වෙනුවට, 2017 පෙබරවාරි මස 2 සහ 3 යන දිනයන්හිදී පැවැත්වීමට නැවත ලේඛනගත කළ බව මෙයින් දැනුම් දීමට කැමැත්තෙමු.

ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිය ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් පරීක්ෂාවට ලක් කිරීමේ අරමුණ ඇතිව ඉහත සඳහන් දිනයන්හිදී ලංකාසෙට්ල් පද්ධතියෙහි (තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ ලංකාසෙක්‍යු පද්ධතිය) සහ අනෙකුත් අදාළ පද්ධතීන්හි මෙහෙයුම් කටයුතු ප්‍රතිප්‍රාප්ති වැඩබිමෙහි සිට සිදු කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සීබීඑස්එල්නෙට් (CBSLNet) සමඟ සම්බන්ධ කර ඇති ඔබ ආයතනයෙහි පෞද්ගලික පරිගණකයන් ප්‍රතිප්‍රාප්ති වැඩබිම වෙත පිවිසිය හැකි වන පරිදි සකසා ඇත. කෙසේ වෙතත්, 2017 පෙබරවාරි මස 2 වන දිනට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව මගින් එම සම්බන්ධතාවයන් පරීක්ෂා කර ගන්නා මෙන් ඉල්ලා සිටිමු. තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ පහත සඳහන් නිලධාරීන් අමතා අවශ්‍ය සහාය ලබා ගත හැකි වේ.

- ලසිත් ප්‍රනාන්දු මයා - 0112 477124 (lasith@cbsl.lk)
- රුසිරු බොරලුගොඩ මයා - 0112 398617 (rusiru@cbsl.lk)

ඩී. කුමාරතුංග
**අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්**

පිටපත්: ප්‍රධාන විධායක නිලධාරී - ලංකාක්ලියර් පුද්. සමාගම
මහ ලේකම් - ශ්‍රී ලංකා බැංකු සංගමය
සභාපති - ප්‍රාථමික අලෙවිකරුවන්ගේ සංගමය
ප්‍රධාන විධායක නිලධාරී - ලංකා මූල්‍ය සේවා කාර්යාංශ සමාගම

**යොමු අංකය: 34/07/029/0001/002** 2017 පෙබරවාරි 09

**චක්‍රලේඛ අංකය: ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 05/2017**

ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගිත්ව ආයතන වෙත,

## 2017 පෙබරවාරි මස 17 වැනි දින ලංකාසෙට්ල් පද්ධතියේ ගනුදෙනු වේලාවන් සීමා කිරීම

ලංකාසෙට්ල් පද්ධතියේ සහභාගිත්ව ආයතනවල ගනුදෙනු වේලාවන් සීමා කිරීම සැලකිල්ලට ගනිමින් 2017 පෙබරවාරි මස 17 වැනි දින (2017 පෙබරවාරි මස 04 වැනි සෙනසුරාදා දිනට යෙදී තිබූ ජාතික නිදහස් දිනයට හිලව් වශයෙන්) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලංකාසෙට්ල් පද්ධතියේ ගනුදෙනු වේලාවන් පෙ.ව. 8.00 සිට ප.ව. 3.00 දක්වා සීමා කිරීමට තීරණය කර ඇත. ඒ අනුව, 2017 පෙබරවාරි මස 17 වැනි දින මධ්‍යහ්න 12.00 න් පසු ලංකාසෙට්ල් පද්ධතියේ මෙහෙයුම් කාල සටහන පහත සඳහන් පරිදි සංශෝධනය කර ඇත.

| මෙහෙයුම | සංශෝධිත වේලාව |
|---|---|
| විවට ප්‍රතිමිලදී ගැනුම් (වෙන්දේසිය) පියවීම | ප.ව. 12.45 |
| බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් - ගැලපුම් නිෂ්කාශනය සහ පියවීම් නිෂ්කාශනය | ප.ව. 2.00 |
| තෙවන පාර්ශ්වීය ගනුදෙනු සඳහා අවසන් වේලාව | ප.ව. 2.15 |
| බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් - ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය (දෙවන අදියර), ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණය (දෙවන අදියර), විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය (දෙවන අදියර) | ප.ව. 2.15 |
| නිත්‍ය තැන්පතු පහසුකම පියවීම | ප.ව. 2.30 |
| දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ආපසු ගෙවීම සහ නිත්‍ය ණය පහසුකම පියවීම | ප.ව. 2.45 |
| පද්ධතිය ගනුදෙනු සඳහා වැසීම | ප.ව. 3.00 |
| පද්ධතිය වැසීම | ප.ව. 3.30 |

ඩී. කුමාරතුංග
**අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්**

**යොමු අංකය: 34/07/029/0001/002** 2017 අප්‍රේල් 28

**චක්‍රලේඛ අංකය: ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 06/2017**

ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගිත්ව ආයතන වෙත,

## ලංකාසෙට්ල් පද්ධතියෙහි ව්‍යාපාරික වේලාවන් දීර්ඝ කිරීමේ ඉල්ලීම්

ඉහත සඳහන් කාරණය සම්බන්ධයෙන් අප විසින් 2015 ජූලි මස 02 වැනි දින නිකුත් කරන ලද චක්‍රලේඛ අංක ආර්ටීජීඑස්/03/2015 යන චක්‍රලේඛයට ඔබගේ අවධානය යොමු කිරීමට කැමැත්තෙමු.

ඉහත සඳහන් චක්‍රලේඛයෙහි ඇති ලංකාසෙට්ල් පද්ධති රීතිවලට අනුකූල නොවී තවමත් සහභාගිත්ව ආයතන විසින් දෛනික මෙහෙයුම් කාලසටහන ඉක්මවා, ලංකාසෙට්ල් පද්ධතියෙහි කටයුතු නිම කරන වේලාව දීර්ඝ කිරීම සඳහා ඉල්ලීම් කරන බව නිරීක්ෂණය වී ඇත. එම නිසා කිනම් හෝ සහභාගිත්ව ආයතනයක් කලින් බලාපොරොත්තු නොවූ අවස්ථාවක එවැනි වේලාව දීර්ඝ කිරීමේ ඉල්ලීමක් සිදු කරන

අවස්ථාවක දී, එම ඉල්ලීම සාධාරණීකරණය කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සහිතව සහභාගිත්ව ආයතනයේ ඉහළ කළමනාකාරිත්වයෙහි නිලධාරියෙකු විසින් ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත ලිඛිත ඉල්ලීමක් එදින ප.ව. 4.00 ට පෙර සිදු කළ යුතුය.

තවද, ඉහත සඳහන් කරන ලද චක්‍රලේඛයේ පිටපතක් ඔබගේ පහසුව සඳහා මේ සමඟ අමුණා ඇත.

ඩී. කුමාරතුංග
**අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්**

**ඇමුණුම**

2015 ජූලි 02

**යොමු අංකය: 34/07/029/0001/002**

**චක්‍රලේඛ අංකය : ආර්ටීජීඑස්/03/2015**

ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගිත්ව ආයතන වෙත,

## ලංකාසෙට්ල් පද්ධතියෙහි ව්‍යාපාරික වේලාවන් දීර්ඝ කිරීමේ ඉල්ලීම්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලංකාසෙට්ල් පද්ධති රීති (2.1 සංස්කරණය) හි 4 වැනි වෙළුමෙහි 1.2 සහ 1.3 රීති යටතේ ස්ථාවර ව්‍යාපාර කාලසටහනකට අනුව ලංකාසෙට්ල් පද්ධතියෙහි මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබයි. ඒ අනුව, සහභාගිකරුවන් විසින් සෑම ව්‍යාපාර දිනයකදීම ප.ව. 4.30 වන විට සියලු ගනුදෙනු නිම කිරීම අවශ්‍ය වේ. තවද, ලංකාසෙට්ල් පද්ධතියෙහි සහභාගිකරුවකු විසින් මෙහෙයුම් දිනයක කාලය දීර්ඝ කිරීමක් සඳහා ඉල්ලීම් කළ යුත්තේ ඉතාමත් අත්‍යවශ්‍ය අවස්ථාවකදී පමණි.

එසේ නමුත්, ලංකාසෙට්ල් පද්ධති රීතිවලට අනුකූල නොවී සමහර සහභාගිකරුවන් විසින් පසුගිය මාස කිහිපය තුළ නොයෙක් අවස්ථාවල දී ලංකාසෙට්ල් පද්ධතියෙහි කටයුතු නිම කරන වේලාව දීර්ඝ කිරීම සඳහා, විශේෂයෙන්ම පද්ධතියෙහි කටයුතු නිම කිරීමට ආසන්න අවස්ථාවේ දී, ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කරනු ලබන බව නිරීක්ෂණය වී ඇත. මෙම ක්‍රියා පිළිවෙත ශ්‍රී ලංකා මහ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තුවලට පමණක් නොව ලංකාසෙට්ල් පද්ධතියෙහි අනෙකුත් සහභාගිකරුවන්ට ද ඉමහත් අපහසුතාවයන් ඇති කර ඇත. ලංකාසෙට්ල් පද්ධතියෙහි සියලු ගනුදෙනු නිම වන තුරු ශ්‍රී ලංකා මහ බැංකුවෙහි එම පද්ධතියට සම්බන්ධව කටයුතු කරන දෙපාර්තමේන්තුවලට තම පද්ධතීන් විවෘතව තබා ගැනීමට සිදු වේ.

එමනිසා, අනපේක්ෂිත හදිසි අවස්ථාවල දී හැර දෛනික මෙහෙයුම් කාලසටහනෙහි දක්වා ඇති කාලසීමාවට වඩා ලංකාසෙට්ල් පද්ධතියෙහි ව්‍යාපාර කටයුතු සිදු කරන වේලාව දීර්ඝ කිරීමට ඉල්ලීම් නොකරන ලෙසට අවවාද කරනු ලැබේ. එවැනි ඉල්ලීම් සිදුකරන අවස්ථාවේ දී, එම ඉල්ලීම සාධාරණීකරණය කිරීම සඳහා අවශ්‍ය තොරතුරු සහිතව සහභාගිත්ව ආයතනයේ ඉහළ කළමනාකාරිත්වයෙහි නිලධාරියෙකු විසින් ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත ලිඛිත ඉල්ලීමක් එදින ප.ව. 4.00 ට පෙර සිදු කළ යුතුය.

ආර්. ඒ. එස්. එම්. දයාරත්න මිය
**අධ්‍යක්ෂ, ගෙවීම් හා පියවීම්**

සී. එම්. ඩී. එන්. කේ. සෙනෙවිරත්න මිය
**රාජ්‍ය ණය අධිකාරී**

**යොමු අංකය: 34/07/029/0001/002** 2017 ජූලි 06

**චක්‍රලේඛ අංකය: ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 07/2017**

ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගිත්ව ආයතන වෙත,

## ලංකාසෙට්ල් පද්ධතියෙහි පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමෙහි ව්‍යාපාර කටයුතු සීමා කිරීම

තවදුරටත් දැනුම් දෙන තුරු වහාම ක්‍රියාත්මක වන පරිදි ලංකාසෙට්ල් පද්ධතිය තුළ පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමෙහි ව්‍යාපාර කටයුතු සීමා කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒ අනුව, ඔබ විසින් එම සීමා කරන ලද කාලසීමාව තුළ දී ලංකාසෙට්ල් පද්ධතිය හරහා පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමට ගෙවීම් සිදු කිරීමේ දී පහත සඳහන් ක්‍රියාපටිපාටීන්ට අනුව ක්‍රියා කළ යුතුය.

(1) තත්කාලීන දළ පියවීම් පද්ධතිය සම්බන්ධිත ගෙවීම් පණිවිඩ (T+0 පමණක්) සාමාන්‍ය පරිදි ලංකාසෙට්ල් පද්ධතියට ඇතුළත් කළ යුතුය.

(2) පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම සමඟ සුරැකුම්පත් පියවීමේ ගනුදෙනු සෘජුව ලංකාසෙක්‍යු පද්ධතිය හරහා යැවීමෙන් වැළකී සිටින්න. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයා ඇති එක්සෙල් පත්‍රයෙහි පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම සමඟ සිදු කරන ලංකාසෙක්‍යු සියලුම ගනුදෙනුවල (T+0 පමණක්) විස්තර පිරවීම අවශ්‍ය වන අතර, නිසි පරිදි සම්පූර්ණ කරන ලද එම එක්සෙල් පත්‍රය බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත විද්‍යුත් තැපැල මගින් එවිය යුතුය. (බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ විද්‍යුත් තැපැල : dsnbfi@cbsl.lk සහ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාගේ විද්‍යුත් තැපැල : hdajith@cbsl.lk)

(3) ලංකාසෙට්ල් පද්ධතියෙහි ඇති පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමට අයත් පියවීම් ගිණුම පැය 0800 සිට පැය 1630 දක්වා තාවකාලිකව අත්හිටවනු ලබන අතර, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ අනුමැතියට යටත්ව පැය 1630 සිට පැය 1645 දක්වා පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම සමඟ ඇති සියලු ගනුදෙනු පියවනු ලැබේ.

(4) ලංකාසෙට්ල් පද්ධතියෙහි ව්‍යාපාරික වේලාවන් වෙනස් නොවන අතර, ව්‍යාපාරික වේලාවන් දීර්ඝ කර ගැනීමට කරනු ලබන ඉල්ලීම්, 2013 දී නිකුත් කරන ලද ලංකාසෙට්ල් පද්ධති රීති 2.1 සංස්කරණය (2013 මාර්තු මස 31 දක්වා සංයුක්ත සංශෝධන) හි 4 වැනි වෙළුමෙහි 1.3 කොටසේ දක්වා ඇති පරිදි විය යුතුය.

(5) මෙම කාරණය සඳහා ඔබ විසින් බලයලත් නිලධාරියෙකු පත් කර ගත යුතු අතර, 2017 ජූලි මස 07 වන දින මධ්‍යාහ්න 12.00 ට හෝ ඊට පෙර එම නිලධාරියාගේ නම සහ සම්බන්ධ කරගත හැකි විස්තර අප වෙත සන්නිවේදනය කළ යුතුය.

(6) වැඩිදුර උපදෙස් අවශ්‍ය වූ විට දී නිකුත් කරනු ලැබේ.

ඩී. කුමාරතුංග
**අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්**

සී. පී. එස්. බණ්ඩාර
**අති. අධිකාරී, රාජ්‍ය ණය**

**ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 08/2017** 2017 ජූලි 20

බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

## විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ගනුදෙනුවල සහ අය කරන ගාස්තුවල උපරිම සීමාව

ගනුදෙනුකරුවන්ගේ සහභාගිත්වය වැඩි කිරීම තුළින් විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය ප්‍රවර්ධනය සහ පහසුකම් සැලසීම සඳහා 2005 අංක 28 දරන ගෙවීමේ සහ බේරුම් කිරීමේ පද්ධති පනතෙහි 44 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාරව මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

2. විද්‍යුත් අරමුදල් පැවරීමේ පොදු යාන්ත්‍රණය හරහා තම ගනුදෙනුකරුවන් විසින් සිදු කරන ගනුදෙනුවලදී පහත සඳහන් උපරිම සීමාවන්ට විද්‍යුත් අරමුදල් පැවරීමේ පොදු යාන්ත්‍රණයේ සෑම සාමාජිකයෙකු විසින්ම අනුකූල විය යුතුය.

2.1 ගනුදෙනු කේතය 58 යටතේ සිදු කෙරෙන ගනුදෙනු හැර අනෙකුත් කේතයන් හරහා සිදු කෙරෙන අරමුදල් පැවරීමක උපරිම වටිනාකම රුපියල් මිලියන 5 නොඉක්මවිය යුතුය. ගනුදෙනු කේතය 58 මගින් ශ්‍රී ලංකා රේගුව සඳහා සිදු කෙරෙන අරමුදල් පැවරීමක උපරිම වටිනාකම රුපියල් බිලියන 20 නොඉක්මවිය යුතුය.

2.2 ගනුදෙනු සඳහා අය කළ හැකි උපරිම ගාස්තු පහත දැක්වෙන සීමාවන් නොඉක්මවිය යුතුය.

(අ) පහත සඳහන් ගෙවීම් මාධ්‍යයන් හරහා සිදු කෙරෙන අරමුදල් පැවරීමකදී එක් ගනුදෙනුවක් සඳහා රුපියල් 50 නොඉක්මවිය යුතුය.

I. අන්තර්ජාලය පදනම් කරගත් බැංකු කටයුතු මගින්

II. ජංගම දුරකථන පදනම් කරගත් බැංකු කටයුතු මගින් සහ

III. විද්‍යුත් අරමුදල් පැවරීමේ පොදු යාන්ත්‍රණයෙහි සාමාජිකයකුගේ ගනුදෙනුකරුවකු විසින් එම සාමාජිකයාගේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් මගින්

(ආ) බැංකු කවුන්ටරය වෙත පැමිණ සිදු කරන අරමුදල් පැවරීමක දී එක් ගනුදෙනුවක් සඳහා රුපියල් 100 නොඉක්මවිය යුතුය.

(ඇ) විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි අනෙකුත් සාමාජිකයින්ගේ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හරහා සිදු කරන අරමුදල් පැවරීමක දී එක් ගනුදෙනුවක් සඳහා රුපියල් 100 නොඉක්මවිය යුතුය.

3. ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 01/2015 ප්‍රතිස්ථාපනය කරමින් නිකුත් කෙරෙන මෙම චක්‍රලේඛය 2017 ජූලි 20 දින සිට බලපැවැත්වේ.

ආර්. එම්. ජයවර්ධන
**අති. අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්**

**යොමු අංකය: 34/07/029/0001/002** 2017 සැප්තැම්බර් 14

**චක්‍රලේඛ අංකය: ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 09/2017**

ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගිත්ව ආයතන වෙත,

## ලංකාසෙට්ල් පද්ධතියේ දෛනික කාලසටහන සංශෝධනය කිරීම

(1) 2017 ඔක්තෝබර් මස 02 වැනි දින සිට ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතියේ පියවීම් සඳහා වන නිෂ්කාශන චක්‍ර (සැසි) වාර 3 ක් ක්‍රියාත්මක කරනු ඇත. එක් එක් නිෂ්කාශන චක්‍රයට අදාළ තත්කාලීන දළ පියවීම් පද්ධතියේ අරමුදල් පියවීමේ වේලාවන් සහ ප්‍රතියෝජන දිනයන් පහත සඳහන් පරිදි වේ.

| නිෂ්කාශන චක්‍රය (සැසිය) | තත්කාලීන දළ පියවීම් පද්ධතියේ පියවීම් වේලාව | ප්‍රතියෝජන පියවීම් දිනයන් |
|---|---|---|
| චක්‍ර 1 | පෙ.ව. 8.30 | (T+1) සිට (T+14) |
| චක්‍ර 2 | ප.ව. 1.00 | (T+0) සිට (T+14) |
| චක්‍ර 3 | ප.ව. 3.00 | (T+0) සිට (T+14) |

(2) ඉහත සඳහන් කරන ලද ඕනෑම නිෂ්කාශන චක්‍රයක් හරහා වැටුප් ගෙවීම් ඉදිරිපත් කළ හැකි බවද සහභාගිවන්නන් දැනගත යුතුය.

(3) ඒ අනුව, 2017 ඔක්තෝබර් 02 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි 2013 අගෝස්තු නිකුත් කරන ලද ලංකාසෙට්ල් පද්ධති රීති 2.1 සංස්කරණයෙහි 4 වැනි වෙළුමෙහි 1.2 වගන්තියෙහි දැක්වෙන දෛනික මෙහෙයුම් කාලසටහන පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| වේලාව | මෙහෙයුම | කාර්යයන්/ගනුදෙනු |
|---|---|---|
| පෙ.ව. 6.30 | පද්ධතිය ආරම්භ කිරීම | තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පද්ධතිය ආරම්භ කිරීම |
| පෙ.ව. 7.30 සිට පෙ.ව. 8.00 දක්වා | දිනයේ ආරම්භක සැකසුම් කටයුතු | සුරැකුම්පත් සඳහා වන නිල මිල ගණන් යාවත්කාලීන කිරීම සහ දවස තුළ ලබා දෙන ද්‍රවශීලතා පහසුකම් සඳහා සුරැකුම්පත් හිමිකාරිත්වය සලකුණු කිරීම |
| පෙ.ව. 8.00 | ලංකාසෙට්ල් පද්ධතිය ගනුදෙනු සඳහා විවෘත කිරීම | ගනුදෙනු ආරම්භ කිරීම සඳහා පද්ධතිය විවෘත කිරීම |
| පෙ.ව. 8.00 | දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම්/ ප්‍රතිමිලදී ගැනීම් සහ නිත්‍ය තැන්පතු පහසුකම් ස්වයංක්‍රීයව පියවීම | දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ලබා දීම සහ විවට වෙළඳ කටයුතු සහ නිත්‍ය තැන්පතු පහසුකම් ප්‍රතිමිලදී ගැනීම්වල දෙවැනි පාදයට අදාළ ආපසු ගෙවීම් කටයුතු |
| පෙ.ව. 8.15 | කල්පිරීම්/ පොලී ගෙවීම්, දින ආරම්භක ගොනුව සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් කල්පිරීම් | කල්පිරුණු සුරැකුම්පත්වලට අදාළ පියවීම්/සුරැකුම්පත් කූපන් සඳහා ගෙවීම්, ලංකාසෙට්ල් පද්ධතියේ ගාස්තු/දඩ මුදල් අය කිරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් කල්පිරීම් |
| පෙ.ව. 8.30 | ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවුම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම | ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතියෙහි පළමු වන චක්‍රය/ප්‍රධාන නිෂ්කාශන පද්ධතියට අදාළ ශුද්ධ නිෂ්කාශන ශේෂයන් පියවීම |
| පෙ.ව. 8.30 | ස්ථිර පදනමක් මත මිලදී ගැනීම් හා විකුණුම්/ දිගුකාලීන විකුණුම් වෙන්දේසිය/ දිගුකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් නිකුත් කිරීම | විවට වෙළඳ කටයුතු යටතේ ප්‍රතිමිලදී ගැනීම්, ප්‍රතිවිකුණුම්<br>දිගුකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසිය සහ දිගුකාලීන විකුණුම් වෙන්දේසියෙහි ප්‍රථම පාදය |
| පෙ.ව. 8.45 | ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවුම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම | ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය |
| පෙ.ව. 9.00 | ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවුම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම | විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පළමු චක්‍රය |
| පෙ.ව. 11.00 | ප්‍රතිවිකුණුම් සහ ස්ථාවර ණය පහසුකමට අදාළ ආපසු ගෙවීම් | විවට වෙළඳ කටයුතු සහ නිත්‍ය ණය පහසුකම් යටතේ ප්‍රතිවිකුණුම්වල දෙවන පාදයට අදාළ පියවීම |
| පෙ.ව. 11.45 | දිගුකාලීන ප්‍රතිවිකුණුම් (වෙන්දේසිය) | විවට වෙළඳ කටයුතු යටතේ ප්‍රතිවිකුණුම්වල ප්‍රථම පාදයට අදාළ පියවීම් කටයුතු |
| ප.ව. 1.00 | ලංකා ක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවුම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම | ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතියෙහි දෙවන චක්‍රය |
| ප.ව. 1.00 | ප්‍රාථමික වෙන්දේසියට අදාළ පියවීම් කටයුතු අවසන් කිරීම/කෙටිකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසිය | ප්‍රාථමික වෙන්දේසියේ සුරැකුම්පත් පියවීම<br>කෙටිකාලීන මහ බැංකු සුරැකුම්පත් වෙන්දේසියේ පියවීම |
| ප.ව. 1.15 | කෙටිකාලීන විකුණුම්/ප්‍රතිවිකුණුම් (වෙන්දේසිය) | කෙටිකාලීන විකුණුම් විවට වෙළඳ කටයුතු ආශ්‍රිත ප්‍රතිවිකුණුම්වල ප්‍රථම පාදයට අදාළ පියවීම් කටයුතු |
| ප.ව. 2.45 | ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවුම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම | පියවුම් නිෂ්කාශනය සහ ගැලපුම් නිෂ්කාශනය |
| ප.ව. 3.00 | ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශ්වීය ශුද්ධ පියවුම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම<br>තුන්වන පාර්ශ්වීය ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම | ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතියෙහි තෙවන චක්‍රය<br>ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි දෙවන චක්‍රය<br>අන්තර් බැංකුවලට අදාළ MT2XX කාණ්ඩයේ පණිවුඩ හැර එම දින තුළ තුන්වන පාර්ශ්වයේ අලුත් ගනුදෙනු (T+0) සඳහා පද්ධතිය වැසීම |
| ප.ව. 3.15 | ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහු පාර්ශ්වීය ශුද්ධ පියවුම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම | විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දෙවන චක්‍රය |

| | | |
|---|---|---|
| ප.ව. 3.45 | සහභාගිත්ව ආයතනවලට දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීම අවසන් කිරීම | සහභාගිත්ව ආයතන විසින් ප.ව. 3.45 න් පසු දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ප්‍රතිමිලදී ගැනීම සිදු නොකළ යුතුයි. |
| ප.ව. 4.00 | නිත්‍ය තැන්පතු පහසුකම් | නිත්‍ය තැන්පතු පහසුකම් ප්‍රථම පාදයට අදාළ පියවීම |
| ප.ව. 4.15 | නිත්‍ය ණය පහසුකම් | නිත්‍ය ණය පහසුකම් ප්‍රථම පාදයට අදාළ පියවීම |
| ප.ව. 4.15 | දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු ගෙවීම | දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු අය කර ගැනීම |
| ප.ව. 4.30 | ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම | පද්ධතිය විසින් මෙම වේලාවෙන් පසුව වැඩිදුරටත් ගනුදෙනු බාර නොගනී. ගනුදෙනු සඳහා පද්ධතිය වැසීමෙන් පසු එතෙක් පෙළගැසී තිබුණු ගනුදෙනු කිසිවක් වේ නම් ඒවා නතර වීම හා අවලංගු වීම සිදු වේ. |
| ප.ව. 4.30 සිට ප.ව. 5.00 දක්වා | දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු | දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු<br>උදා: වාර්තා පිළියෙළ කිරීම/ අදාළ ගොනු පොදු ලෙජරය වෙත යොමු කිරීම, ලංකාසෙට්ල් ගාස්තු අය කිරීම සඳහා අදාළ දත්ත පිළියෙළ කිරීම සහ මුද්‍රණ වාර්තා සැකසීම අයත් වේ. |
| ප.ව. 5.00 | පද්ධතිය සංවෘත කිරීම | තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතියට අදාළ සියලුම මෘදුකාංග වසා දැමීම. දත්ත වෙනත් දත්ත ගබඩාවක සටහන් කිරීම. |

(4) සියලුම ගනුදෙනු කටයුතුවල පියවීම් කටයුතු නිසියාකාරයෙන් සිදු කිරීම සඳහා පියවීම් ගිණුම් පිරික්සුම් නිකේතනය මගින් නිරීක්ෂණය කළ යුතු බවටත්, බහු පාර්ශ්වීය ශුද්ධ පියවුම් ගොනු තත්කාලීන දළ පියවීම් පද්ධතිය වෙත පියවීම් සඳහා යොමු කරන අවස්ථාවේ දී තම පියවීම් ගිණුම්වල ප්‍රමාණවත් අරමුදල් ශේෂයන් පවත්වා ගැනීමට වගබලා ගත යුතු බවටත් සහභාගිත්ව ආයතන වෙත මෙයින් උපදෙස් දෙනු ලැබේ.

ඩී. කුමාරතුංග
**අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්**

**යොමු අංකය: 34/07/029/0001/002** 2017 ඔක්තෝබර් 10

**චක්‍රලේඛ අංකය: ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 10/2017**

ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගිත්ව ආයතන වෙත,

## ශ්‍රී ලංකා මහ බැංකුව මගින් දවස ඇතුලත ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීමේදී ගනුදෙනුකරුවන්ගේ රජයේ සුරැකුම්පත් භාවිතා කිරීම වැළැක්වීම සඳහා පියවර ගැනීම

ශ්‍රී ලංකා මහ බැංකු මුදල් මණ්ඩලය මගින්, 2013 අගෝස්තු මස නිකුත් කරන ලද ලංකාසෙට්ල් පද්ධති රීති 2.1 සංස්කරණයෙහි 3 වැනි වෙළුමෙහි 11 වන කාණ්ඩය (2013 මාර්තු මස 31 දක්වා සංයුක්ත සංශෝධන) සහ දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ගිවිසුමෙහි 2 වැනි කොටස සංශෝධනය කිරීම සඳහා අනුමැතිය දී ඇත.

ඒ අනුව, 2017 ඔක්තෝබර් මස 17 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි 2013 අගෝස්තු මස නිකුත් කරන ලද ලංකාසෙට්ල් පද්ධති රීති 2.1 සංස්කරණයෙහි 3 වැනි වෙළුමෙහි 11 වන කාණ්ඩය (2013 මාර්තු මස 31 දක්වා සංයුක්ත සංශෝධන) සහ දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ගිවිසුමෙහි 2 වැනි කොටස පහත දැක්වෙන පරිදි සංශෝධනය කර ඇත.

<u>ලංකාසෙට්ල් පද්ධති රීති 2.1 සංස්කරණයෙහි 3 වැනි වෙළුමෙහි 11 වන කාණ්ඩය</u>

11. **දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම**

11.1 දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකමෙහි මෙහෙයුම් කටයුතු, 2 වැනි වෙළුමෙහි 7 වැනි රීතිය මගින් විස්තර කර ඇත. සහභාගිවන්නන්ගේ දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ගිණුම තුළ සුරැකුම්පත් ස්ථානගත කිරීම සඳහා ලංකාසෙක්‍යු පද්ධතියෙහි ඇති පහසුකම් භාවිතා කරනු ලබයි. උදා: ප්‍රතිස්ථාපන උපදෙස් භාවිතා කිරීම හරහා දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීමේ දී ඊට එදිරිව ඇපකරයක් ලෙස තබන සියලු සුරැකුම්පත් සහභාගිවන්නන්ගේ ස්වකීය ගිණුමෙහි සිට දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ගිණුමට මාරු කළ යුතුය (ප්‍රතිස්ථානගත).

11.2 සහභාගීවන්නන්, ගනුදෙනුකරුවන්ට විකුණූ සුරැකුම්පත් හෝ ගනුදෙනුකරුවන් සමග නැවත මිලදී ගැනීමේ ගනුදෙනු සඳහා භාවිතා කරන ලද සුරැකුම්පත් හෝ සහභාගිවන්නන් තමන්ගේ භාරකාරත්වයේ නොමැති සුරැකුම්පත්, ශ්‍රී ලංකා මහ බැංකුව සමග දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීමේ ගනුදෙනු සඳහා භාවිතා නොකළ යුතුය.

11.3 ඉහත 11.2 වගන්තිය උල්ලංඝණය කිරීමකදී, සහභාගිවන්නන් පහත දැක්වෙන ආකාරයේ ගෙවීමක්, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සිදු කිරීමට වගකිව යුතු වේ.

(අ) ණයට ගත් මුදල රුපියල් මිලියන 1,000 දක්වා නම් දවසට සියයට 2 කි.

(ආ) ණයට ගත් මුදල රුපියල් මිලියන 1,000 ඉක්මවයි නම් දවසට සියයට 2.5 කි.

11.4 සහභාගිවන්නන්ට, ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් ක්‍රියාකාරී මැදිහත්වීමකින් තොරව දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ප්‍රතිමිලදී ගැනීමක් ආරම්භ කළ හැක. දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ප්‍රතිමිලදීගැනීමක් පියවීම ද සහභාගිවන්නෙකුට තමන් විසින්ම කළ හැකි අතර, එය සුරැකුම්පත් පදනම අනුව, සුරැකුම්පත් ඇපකරයක මුළු ප්‍රමාණය හෝ සුරැකුම්පත් ඇපකරයක මුළු ප්‍රමාණයෙන් කොටසක් හෝ සියලු සුරැකුම්පත් ඇපකරවල මුළු ප්‍රමාණයට වුව ද විය හැක. මෙම සහභාගිවන්නන් විසින්ම පාලනය කරන දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ප්‍රතිමිලදී ගැනීමේ පහසුකම වලංගු වන්නේ එයට සුදුසුකම් ඇති සහභාගිවන්නන් හට ව්‍යාපාර දිනයන්හි පෙ.ව. 8.00 සිට ප.ව. 3.45 දක්වාය.

සහභාගිවන්නන් දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ප්‍රතිමිලදී ගැනීම සඳහා ඇපකර වශයෙන් තැබූ සියලු සුරැකුම්පත් සඳහා එම ප්‍රතිමිලදී ගැනීම් පුනරාවර්තනය කරමින්, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් එම පහසුකම පියවීම සෑම ව්‍යාපාර දිනයකම ප.ව. 4.15 ට ආරම්භ කරයි.

<u>දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ගිවිසුමෙහි 2 වැනි කාණ්ඩය</u>

2. දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම සඳහා සුරැකුම්පත් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකමෙහි මෙහෙයුම් උපදෙස් ප්‍රකාරව (සුදුසු සුරැකුම්පත්) විටින් විට තීරණය කර ඇති ආකාරයට සුදුසු සුරැකුම්පත් මගින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම යටතේ සපයන මුදල් සම්පූර්ණයෙන් සුරක්ෂිත කළ යුතුය.

සහභාගිවන්නෙක්, තමන් හැර වෙනත් පුද්ගලයෙකු සතු සුරැකුම්පත් හෝ වෙන කිසියම් ආකාරයකින් උකස් පිට තිබෙන සුරැකුම්පත්, දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම යටතේ ලබාගත් අරමුදල් සඳහා භාවිතා නොකළ යුතුය.

සහභාගිවන්නෙක්, තමන් හැර වෙනත් පුද්ගලයෙකු සතු සුරැකුම්පත් හෝ වෙන කිසියම් ආකාරයකින් උකස් පිට තිබෙන සුරැකුම්පත්, දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම යටතේ අරමුදල් ලබා ගැනීමට භාවිතා කරන ලද අවස්ථාවකදී, එවැනි සහභාගිවන්නෙක් ගිවිසුමෙහි 2 වැනි කොටස උල්ලංඝණය කර තිබෙන බවට සලකනු ලබන අතර එසේ ණයට ගත් මුදල පිළිවෙළින් රුපියල් මිලියන 1,000 දක්වා සහ රුපියල් මිලියන 1,000 ට වැඩි නම් දවසට සියයට 2 සහ 2.5 ක මුදලක්, ශ්‍රී ලංකා මහ බැංකුවට ගෙවීමක් කිරීමට වගකිව යුතු වේ.

ඩී. කුමාරතුංග
**අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්**

ඩී. එම්. රූපසිංහ
**රාජ්‍ය ණය අධිකාරී**

**යොමු අංකය: 34/07/029/0001/002** 2017 ඔක්තෝබර් 24

**චක්‍රලේඛ අංකය: ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 11/2017**

ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගිත්ව ආයතන වෙත,

## 2017 නොවැම්බර් මස 10 වැනි දින ලංකාසෙට්ල් පද්ධතියෙහි සජීවී මෙහෙයුම් කටයුතු ප්‍රතිප්‍රාප්ති වැඩබිමෙහි සිට සිදු කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිය ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් පරීක්ෂාවට ලක් කිරීමේ අරමුණ ඇතිව 2017 නොවැම්බර් මස 10 වැනි දිනයෙහිදී (සිකුරාදා) ලංකාසෙට්ල් පද්ධතියෙහි (තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ ලංකාසෙක්‍යු පද්ධතිය) සහ අනෙකුත් අදාළ පද්ධතීන්හි මෙහෙයුම් කටයුතු ප්‍රතිප්‍රාප්ති වැඩබිමෙහි සිට සිදු කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සීබීඑස්එල්නෙට් (CBSLNet) සමග සම්බන්ධ කර ඇති ඔබ ආයතනයෙහි පෞද්ගලික පරිගණකයන් ප්‍රතිප්‍රාප්ති වැඩබිම වෙත පිවිසිය හැකි වන පරිදි සකසා ඇත. කෙසේ වෙතත්, 2017 නොවැම්බර් මස 10 වැනි දිනට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව මගින් එම සම්බන්ධතාවයන් පරීක්ෂා කර ගන්නා මෙන් ඉල්ලා සිටිමු. තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ පහත සඳහන් නිලධාරීන් අමතා අවශ්‍ය සහාය ලබා ගත හැකි වේ.

- නදීෂ් ප්‍රියංග මයා - 0112 477493 (nadeesh@cbsl.lk)
- සචින්ද කරුණාරත්න මයා - 0112 477325 (sachinda@cbsl.lk)

ආර්. එම්. ජයවර්ධන
**අතිරේක අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්**

පිටපත්: ප්‍රධාන විධායක නිලධාරී - ලංකාක්ලියර් පුද්. සමාගම
මහ ලේකම් - ශ්‍රී ලංකා බැංකු සංගමය
සභාපති - ප්‍රාථමික අලෙවිකරුවන්ගේ සංගමය
ප්‍රධාන විධායක නිලධාරී - ලංකා මූල්‍ය සේවා කාර්යාංශ සමාගම

**චක්‍රලේඛය** 2017 අප්‍රේල් 24

වෙත:- සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ රජයේ සුරැකුම්පත්වල ප්‍රාථමික වෙළඳුන්ගේ ප්‍රධාන විධායක නිලධාරීන්

## රජයේ සුරැකුම්පත් ප්‍රතිමිලදීගැනීම් ගනුදෙනු අනිවාර්ය වාර්තාකරණය

රජයේ සුරැකුම්පත් වෙළඳපොළෙහි විනිවිදභාවය සහ මිල අනාවරණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමේ තවත් ඉදිරි පියවරක් ලෙස, රජයේ සුරැකුම්පත් ස්ථිර පදනම මත ගනුදෙනු කිරීමේදී සිදුවන ක්‍රියාවලිය අනුව යමින්, රජයේ සුරැකුම්පත්වල ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු සහ

වාර්තාකරණය, බ්ලූම්බර්ග් වෙළඳ පද්ධතිය (Bloomberg Trading Platform) හරහා සිදු කිරීමටත්, දෛනික ගනුදෙනු සාරාංශ වාර්තාවක් නිකුත් කිරීමත් හඳුන්වා දීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත.

ඒ අනුව, 2017 අප්‍රේල් 26 දින සිට ආරම්භ වන පරිදි, සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ රජයේ සුරැකුම්පත්වල ප්‍රාථමික වෙළඳුන්, රජයේ සුරැකුම්පත් ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු සිදු කිරීමේදී පහත සඳහන් පරිදි කටයුතු කරනු ඇත.

(I) ශ්‍රී ලංකාව සඳහා තිබෙන බ්ලූම්බර්ග් වෙළඳ පද්ධතිය භාවිතා කරමින්, (ස්ථිර ආදායම් මිලකරණයන් සඳහා - Fixed Income Quote - F1Q)

(අ) දෛනික, සති 1, සති 2, මාස 1, මාස 2, මාස 3, මාස 4, මාස 5, මාස 6 සහ මාස 12 හෝ ඉහත සඳහන් සම්මත කාලසීමාවන්ට අයත් නොවන අනෙකුත් කාලසීමාවන් සඳහා ප්‍රතිමිලදී ගැනුම්කරණ අනුපාතිකය සහ ප්‍රමාණය සඳහා අගයන් ඉදිරිපත් කිරීම.

(ආ) ඉහත ආකාරයට කවුන්ටරය හරහා සිදුවන රුපියල් මිලියන 100 හෝ ඊට ඉහළ ගනුදෙනු කිරීම්වලට අදාළ එලදා අනුපාතිකයන්, කල්පිරීමේ කාලසීමාවන් සහ ප්‍රමාණයන් වාර්තා කිරීම.

(II) අතරමැදියෙකු හරහා සිදුවන ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු සඳහා ණය දෙන්නා විසින් ඉහත 1(ආ) හි අවශ්‍යතාවයට හඬ තහවුරු කිරීමේ අවසරපත් (VTR- Voice Affimation Ticket) භාවිතයෙන් වාර්තා කිරීම.

(III) ප්‍රතිමිලදී ගැනීමේ ගනුදෙනු ඒකපාර්ශ්විකව වාර්තාකරණයේ දී, ගණුදෙනුකරු විසින් ඉහත 1(ආ) හි අවශ්‍යතාව VTR ඔස්සේ pdebt@cbsl.lk වෙත වාර්තා කිරීම යෝග්‍ය වේ. එවැනි අවස්ථාවක ගනුදෙනුකරු විසින් සේවාලාභියාගේ නම, සටහන් තීරයේ සඳහන් කළ යුතුය.

**රාජ්‍ය ණය අධිකාරී** **අධ්‍යක්ෂ - බැංකු අධීක්ෂණ**

**යොමු අංකය: 08/21/005/012/001** 2017 ජූලි 24

## භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රාථමික නිකුතුන් සඳහා වන විධානයන්

1937 අංක 07 දරණ ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනත යටතේ මුදල් අමාත්‍යාංශය මගින් 2009 ජුනි 24 වෙනි දින නිකුත් කරන ලද 2009 අංක 01 දරණ ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) රෙගුලාසි වලට අනුව රෙගුලාසි අංක II (I) යටතේ මෙම විධානයන් නිකුත් කොට ඇති අතර 2017 ජූලි 27 වැනි දින සිට බලාත්මක වේ.

ටී.එච්.බී. සරත්චන්ද්‍ර
**රාජ්‍ය ණය අධිකාරී**

01. 2017 ජූලි 27 වැනි දින සිට භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රාථමික නිකුතුන් මේ සමඟ අමුණා ඇති උපලේඛනයේ සඳහන් වන උපදෙස්වලට අනුකූල විය යුතුය.

02. සියලුම ප්‍රාථමික අලෙවිකරුවන් මෙම උපදෙස්වලට අදාළ විධිවිධාන අනුගමනය කළ යුතුය.

03. යොමු අංක: 08/24/002/0005/003 දරණ 2003 අගෝස්තු 15 වැනි දිනැති භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර වෙන්දේසිවල අවම දායකත්ව මට්ටම සඳහා වන විධානය, 2017 ජූලි 27 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි, භාණ්ඩාගාර බැඳුම්කර සඳහා අදාළ නොවේ.

**උපලේඛනය**

### භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රාථමික නිකුතුන් සඳහා වන උපදෙස්

### පළමු වන කොටස:- පොදු නියමයන්

**01. හැඳින්වීම**

1.1 රාජ්‍ය ණය කළමනාකරණය සඳහා වන ශ්‍රී ලංකා රජයේ නියෝජිතයා ලෙස (මෙයින් පසු නිකුත් කරන්නා ලෙස හැඳින්වේ) කටයුතු කරන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරනු ලබන භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රාථමික නිකුතුන් සඳහා මෙම උපදෙස් අදාළ වේ.

1.2 භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුවට අදාළ කර්තව්‍යයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි. භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම්වලට අදාළ විමසීම් සඳහා එකී දෙපාර්තමේන්තුව සම්බන්ධ කර ගත යුතු වේ.

1.3 මෙම උපදෙස්වල සඳහන් පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ භාණ්ඩාගාර නිකුතුන් (මෙයින් පසුව නිකුතුන් ලෙස හැඳින්වේ) සඳහා සහභාගි වීමට සුදුසුකම් ලද සහභාගීවන්නන්ගේ වගකීම් හා රාජකාරීවල අරමුණ වනුයේ එවැනි නිකුතුන් නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විනිවිද හා කාර්යක්ෂම රාමුවක් සැපයීමයි.

1.4 භාණ්ඩාගාර බැඳුම්කර නිර්ලේඛිත ආකාරයට නිකුත් කරන අතර මධ්‍යම තැන්පතු පද්ධතියේ ලියාපදිංචි කොට ඇත. මුදල් නීති පනතේ 62 (අ) වගන්තිය යටතේ ලංකාසෙට්ල් පද්ධතියට අදාළ නීතිවලට යටත්ව නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතිය මගින් පියවීම් කරනු ලබයි.

### දෙවන කොටස:- ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම් හා රාජකාරි

**02. පොදු වගකීම් හා රාජකාරි**

2.1 ශ්‍රී ලංකා මහ බැංකුව විසින්:

i. නිකුතුන් සුමටව කිරීම සඳහා අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම හා පහසුකම් සැලසීම;

ii. සියලුම සුදුසුකම් ලත් සහභාගිවන්නන් හට සමාන ප්‍රවේශයන් මෙකී නිකුතුන් සඳහා ලබා දීම;

iii. නිකුතුන් සඳහා වන කාලසටහන සැකසීම;

iv. භාණ්ඩාගාර බැඳුම්කර විභජනයේ දී වෙන්දේසියේ සියලුම ලංසු සාධාරණ හා විනිවිද ආකාරයට සලකනු ලබන බවට සහතික කිරීම; සහ

v. කූපන් අනුපාතික, කල්පිරීමේ දිනයන්, නිකුතු දිනයන් හා නොපියවූ තොගයේ ප්‍රමාණය පෙන්වන පරිදි භාණ්ඩාගාර බැඳුම්කර සම්බන්ධ ලේඛනයන්, වෙළඳපොළ මෙහෙයුම් කටයුතු සම්බන්ධ සංඛ්‍යා දත්ත, ඵලදා අනුපාතික, මිල හා සම්බන්ධ දත්ත සහ රාජ්‍ය ණය වෙළඳපොලට අදාළ අනෙකුත් තොරතුරු නිරන්තර යාවත්කාලීන කිරීම, ප්‍රසිද්ධියට පත් කිරීම හා පවත්වාගෙන යාම සිදු කරයි.

**03. ප්‍රාථමික නිකුතුවේ සංවිධානය**

3.1 පහත විස්තර කර ඇති උපදෙස් පරිදි, ශ්‍රී ලංකාවේ ප්‍රාථමික වෙළඳපොළ තුළ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කරනු ලැබේ.

3.2 ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය මගින් පත් කරන ලද ප්‍රාථමික අලෙවිකරුවන් සහ මුදල් මණ්ඩලයේ අනුමැතිය ලත් අනෙකුත් සහභාගිත්ව ආයතනවලට ප්‍රාථමික නිකුතුවලට සහභාගි වී (වෙන්දේසි සහභාගිත්වකරුවන්) ඔවුන්ගේ ලංසු නිකුතුවේ දී ඉදිරිපත් කළ යුතුය.

3.3 අනෙකුත් උනන්දුවක් දක්වන පාර්ශ්වයන්, එනම්, ශ්‍රී ලංකාවේ නේවාසික නෛතික හෝ ස්වාභාවික පුද්ගලයන්, ප්‍රාථමික අලෙවිකරුවන් හරහා රාජ්‍ය සුරැකුම්පත් සඳහා ප්‍රාථමික වෙළඳපොළේ වක්‍රව සහභාගි විය හැකි අතර ප්‍රාථමික අලෙවිකරුවන් එවැනි ගනුදෙනුකරුවන්ගේ ලංසු ද ඔවුන්ගේ ලංසුවලට ඇතුළත් කළ යුතුය.

3.4 ශ්‍රී ලංකා මහ බැංකුව, නිකුතුකරුගේ අනුමැතිය සහිතව ඉදිරිපත් කරනු ලබන නිකුතු ප්‍රමාණයන් මෙහි උපදෙස්වල අයිතම අංක 7 ට අනුව පිහිටුවිය යුතු අතර නිකුතුකරුගේ අනුමැතිය සහිතව සුවිශේෂී නිකුතුවක දී එම ප්‍රමාණය වෙනස් කිරීමක් හෝ සංශෝධනය කිරීමක් අවම වශයෙන් එක් දිනයක හෝ පෙර දැනුම් දීමක් එවැනි සංශෝධන සඳහා සියලුම වෙන්දේසි සහභාගිත්වකරුවන් වෙත දැනුම් දිය යුතුය.

3.5 භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ප්‍රාථමික නිකුතුන් පියවිය යුතු වන්නේ වෙන්දේසි දිනයේ සිට දින 2 ක් (T+2) ඇතුළත හෝ ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ප්‍රකාශයට පත් කර ඇති නිවේදනයේ නිරූපිත ලෙසය.

**04. නිකුතුවක හඳුනා ගැනීම**

4.1 සුරැකුම්පත් හඳුනා ගැනීමේ ජාත්‍යන්තර අංකය සහ කාණ්ඩය රජයේ සුරැකුම්පත්වල අනන්‍ය හඳුනාගැනීමේ අංග විය යුතුයි.

## III **කොටස:- වෙන්දේසි සහභාගිත්වකරුවන්ගේ වගකීම් සහ යුතුකම්**

**05. වෙන්දේසි සහභාගිත්වකරුවන්ගේ වගකීම්**

5.1 සෑම ප්‍රාථමික අලෙවිකරුවකුම, මෙහි සඳහන් උපදෙස්හි අයිතම 9 ට අනුව අවම ලංසු ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය සහ අවම ක්‍රියාකාරී සහභාගිත්වය වෙන්දේසිවල දී පවත්වා ගත යුතුය.

5.2 වෙන්දේසි සහභාගිත්වකරුවෙකු, සුදුසු ලෙස හා හැකි සෑම අවස්ථාවකදීම, මෙම මාර්ග උපදෙස් සහ ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ප්‍රකාශයට පත් කරන ලද සහ නිර්ණය කරන ලද නිකුතුවලට අදාළ අනෙකුත් ඕනෑම කොන්දේසි සහ අවශ්‍යතා, අනුගමනය කළ යුතුය.

5.3 වෙන්දේසි සහභාගිත්වකරුවෙකු, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත බැඳුම්කර සඳහා බලය පවරන, යාවත්කාලීන අත්සන් නිර්දේශකයන් සහතික කළ යුතු අතර එහි නම් සඳහන් පුද්ගලයන්ගේ අත්සන් නිදර්ශක පමණක් විද්‍යුත් මගින් හෝ අතින් භාරදෙන වෙන්දේසි ලංසු ඉදිරිපත් කිරීමට හෝ අත්සන් කිරීමට සුදුසුකම් ලබයි.

5.4 වෙන්දේසි සහභාගිත්වකරුවන් ඔවුන්ගේ ලංසු, නිකුතු අවස්ථාවේදී ඍජුව ඉදිරිපත් කළ යුතු අතර අනෙකුත් වෙන්දේසි සහභාගිත්වකරුවන් හරහා නොඑවිය යුතුයි.

## IV **කොටස:- නිකුතු ක්‍රියාවලිය**

**06. නිකුතු කාල සටහන**

6.1 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුතුන්ට අදාළ සැලසුම් කාර්තුමය වශයෙන් නිවේදනය කරනු ලබන අතර ඉදිරි කාර්තුව සඳහා එම කාර්තුව ඇරඹීමට සතියකට පෙර ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරනු ලබයි.

6.2 නිකුතු කාල සටහනේ නිකුතු දිනයන්ට අදාළ තොරතුරු ඉදිරිපත් කරනු ලබන කාලසීමාවන් සහ ඉදිරිපත් කරන ප්‍රමාණයන් ඇතුළත් වේ.

**07. නිවේදනය**

7.1 ශ්‍රී ලංකා මහ බැංකුව නිකුතු නිවේදනය ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවිය ඔස්සේ භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුවට ව්‍යාපාරික දින 03 කට වත් පෙර ප්‍රකාශයට පත් කරනු ලබයි. ප්‍රකාශන දිනයේ පැය 1530 ට පමණ නිකුතු නිවේදනය නිකුත් කරනු ලබයි. ඉන් අනතුරුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුතු නිවේදනය පිළිගත් මාධ්‍ය හරහා හැකි තරම් ඉක්මනින් ප්‍රකාශයට පත් කරනු ලබයි. කෙසේ වෙතත්, තාක්ෂණික හෝ ස්වභාවික අවහිරතාවක් නිසා ඇති වන විශේෂ තත්ත්වයන්හිදී, ඕනෑම අවස්ථාවක එවැනි නිවේදනයක් සිදු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පවතී.

7.2 නිකුතු නිවේදනයේ ඇතුළත් වනුයේ:

I. සුරැකුම්පත් හඳුනා ගැනීමේ ජාත්‍යන්තර අංකය සහ නිකුත් කරනු ලබන භාණ්ඩාගාර බැඳුම්කරවල කාණ්ඩ;

II. කූපන් අනුපාතිකය;

III. කූපන් වාර ගණන;

IV. මූලික නිකුතු දිනය;

V. පියවීමේ දිනය;

VI. කල්පිරීමේ දිනය;

VII. උපචිත පොලී අනුපාතිකය;

VIII. මුහුණත වටිනාකමින් ඉදිරිපත් කළ මුළු ප්‍රමාණය සහ

IX. මෙම උපදෙස් අයිතම 9 සහ 10 යටතේ නියම කර ගෙන ඇති පරිදි නිකුතු සඳහා ලංසු ඉදිරිපත් කිරීමට ඇති ආරම්භක හා අවසන් වන කාල සීමා වේ.

7.3 මීන් පෙර දී නිකුත් කරනු ලැබූ සුරැකුම්පත් වරක් හෝ කිහිප වරක් නැවත නිකුත් කිරීමට (නැවත විවෘත කිරීම) ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අයිතිය ඇත. එවැනි නිකුතුවල සුරැකුම්පත් හඳුනා ගැනීමේ ජාත්‍යන්තර අංක, කල්පිරීමේ දිනයන් හා කූපන් අනුපාත මූලික නිකුතුවට සමාන වේ.

7.4 නිකුතුවක් කල් දැමීම හෝ අවලංගු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු වන අතර කෙසේ වෙතත් බැරෑරුම් තත්ත්වයන් යටතේ පමණක් එය සලකා බැලිය යුතුය. යම් හේතුවක් නිසා නිකුත් කරන්නෙකු හෝ වෙන්දේසි සහභාගිකරුවන් සැලකිය යුතු සංඛ්‍යාවක් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් අකර්මන්‍යවී ඇති අවස්ථාවක දී එදිනම හෝ ඊළඟ වැඩකරන දිනය දක්වා නිකුතුව කල් දැමිය හැකි අතර ඒ අනුව මුලින් ප්‍රකාශයට පත් කළ දිනය තුළම එම නිකුතුව පියවීම සිදු කළ යුතුය. ලැබී ඇති ලංසු අසාමාන්‍ය සහ බෙහෙවින් විකෘති වූ මිල ගණන් පෙන්නුම් කිරීම මත පදනම්ව නිකුතුවක් අකාර්යක්ෂම ලෙස ප්‍රකාශ කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුය

08. **ක්‍රමවේදය**

8.1 සෑම මාසික නිකුතුවකදීම භාණ්ඩාගාර බැඳුම්කර කාණ්ඩයන් දෙකක් නිකුත් කරනු ලැබේ.

8.2 ඕනෑම ලංසු ප්‍රමාණයක් හෝ සමස්තයම පිළිගැනීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකව සතු වන අතර කිසියම් හෝ හේතුවක් ලබා නොදී ඕනෑම ලංසු ප්‍රමාණයක් හෝ සමස්ත ලංසු ප්‍රමාණයම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ද ශ්‍රී ලංකා මහ බැංකුව සතු විය යුතුය.

8.3 එක් එක් භාණ්ඩාගාර බැඳුම්කර කාණ්ඩ නිකුතුන් සඳහා එක් එක් කාණ්ඩයකට විශේෂිත වූ නිකුතු දිනයක් තිබිය යුතුය. සාමාන්‍යයෙන් කාණ්ඩයක් සඳහා නිකුතු දිනය මාසයේ 01 වන දින හෝ මාසයේ 15 වන දින විය යුතුය.

8.4 නිවේදනය කරන ලද එක් එක් කාණ්ඩයේ බැඳුම්කර නිකුතුන් අදියර 3 කින් සමන්විත වේ. පළමු අදියර දෙකේදී තරඟකාරිත්වය මත පදනම් වූ ලංසු ඉදිරිපත් කිරීම වෙන්දේසි සහභාගිකරුවන් සඳහා විවෘත වන අතර අදියර III යටතේ නිකුත් කිරීම් ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා සීමා වේ.

8.5 අදියර I, II සහ III යටතේ. නිකුත් කර ඇති භාණ්ඩාගාර බැඳුම්කර පියවීම අයිතම 7 යටතේ නිකුත් කිරීමේ නිවේදනයේ දක්වා ඇති පරිදි ගෙවිය යුතු දිනට පියවීම සිදු කළ යුතුය.

8.6 එක් එක් අදියර යටතේ නිකුත් කිරීම්වලට අදාළ ක්‍රමවේදය විස්තර කිරීමක් පහත දක්වා ඇත. (මෙම උපදෙස් මාලාවේ අයිතම 9 - 11 දක්වා එක් එක් අදියරේදී සවිස්තරාත්මක පියවරයන් සාකච්ඡා කෙරේ.

අදියර I : (i) බහු මිල තරඟකාරී වෙන්දේසීන් පැවැත්වීම. මෙම වෙන්දේසියේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එක් එක් කාණ්ඩ යටතේ පිළිගත යුතු ප්‍රමාණය, කඩඉම් අනුපාතිකය සහ අදාළ වෙන්දේසියේ බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකය තීරණය කරනු ලැබේ. මෙම වටයේ සාධාරණ වෙළඳපොළ මිල ගණන් ලැබීම්වලට යටත්ව පළමු අදියර යටතේ ඉදිරිපත් කළ මුළු ප්‍රමාණය පිළිගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සියලු ප්‍රයත්නයන් ක්‍රියාත්මක කළ යුතුය. මෙම අදියරයේ දී වෙන්දේසි සහභාගිකරුවන් ලංසු ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබයි.

(ii) අදියර I යටතේ එම වෙන්දේසියේ ප්‍රතිඵල සමඟ අදාළ වෙන්දේසියේ බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකය සහ අදියර II යටතේ නිකුත් කිරීමේ පද්ධතිය හරහා ලංසු ඉදිරිපත් කිරීම සඳහා පවත්නා ප්‍රමාණයන් එක් එක් ලංසු ඉදිරිපත් කරන්නන්ට දැනුම් දීම.

අදියර II : ඉහත අදියර I ට පසුව ඕනෑම අඩු නිකුතුවක් සඳහා ස්වේච්ඡා, ප්‍රමාණය මත පදනම් වූ ලංසු කැඳවීම විවෘත කිරීම. අදියර 1 හි ප්‍රතිඵල නිකුත් වීමෙන් පසුව මෙම උපදෙස් මාලාවේ අයිතමය 10 සඳහන් කාලසීමාව තුළ එක් එක් වෙන්දේසි සහභාගිකරුවන් හට මෙම අදියරයේ දී ලංසු ඉදිරිපත් කළ හැකිය. අදියර 1 හි එක් එක් වෙන්දේසි සහභාගිකරුවන්ගේ කාර්යසාධනය මත සහ අදියර II ලංසු ඉදිරිපත් කළ ප්‍රමාණය මත පදනම්ව මෙම අදියරයේ දී බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකයට නිකුත් කිරීම සිදු කරනු ලැබේ. මෙම අදියරේ දී වෙන්දේසි සහභාගිකරුවන් ලංසු ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබයි.

අදියර III : යම් ඉතිරි වූ ප්‍රමාණයන් වෙතොත් (අදියර 1 සහ II හි එක් එක් කාණ්ඩ යටතේ නිවේදනය කරන ලද ප්‍රමාණය සහ එක් එක් කාණ්ඩය වෙනුවෙන් නිකුත් කළ සමස්ත ප්‍රමාණය අතර වෙනස) අනිවාර්ය පදනමින්, අදියර 1 සහ II හි එම එක් එක් ප්‍රාථමික අලෙවිකරුවන්ගේ සාර්ථක වූ සහභාගිත්ව අනුපාතය මත පදනම්ව බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකයට ප්‍රාථමික අලෙවිකරුවන් අතර නිකුත් කිරීම සිදු වේ. කෙසේ වුවද, ශ්‍රී ලංකා මහ බැංකුව, 1 වන අදියරයේ දී, නිකුත් කළ ප්‍රමාණයෙන් අවම වශයෙන් 60% ක් වත් පිළිගැනීමක් නොකළහොත් මෙම අදියර ක්‍රියාත්මක කිරීම කළ නොහැකි වේ. මෙම අදියර යටතේ නිකුත් කිරීම ප්‍රාථමික අලෙවිකරුවන්ට පමණක් සීමා වේ.

8.7 ඒ අනුව, අදියර I හි පිළිගත් සමස්ත ලංසු ප්‍රමාණය ඉදිරිපත් කළ ප්‍රමාණයට වඩා අඩු වූ අවස්ථාවක, නිකුතු ක්‍රියාවලියේ II අදියර විවෘත වනු ඇත. අදාළ වෙන්දේසියේ දී ඉදිරිපත් කරන ලද ප්‍රමාණයට අදියර 1 සහ II න් පසුව ද අඩු වෙන් කිරීමක් පවතී නම් නිකුතු ක්‍රියාවලිය තවදුරටත් අදියර III දක්වා දීර්ඝ කළ යුතුය.

8.8 අදියර II සහ අදියර III යටතේ එක් එක් වෙන්දේසි සහභාගිකරුවන් වෙත කරන ලද සමස්ත නිකුතුන් නිකුතු පද්ධතිය හරහා නිවේදනය කරනු ලබයි. ඊට අමතරව, III අදියරය නිමා වීමෙන් පසුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සියලුම අදියරයන් 3 යටතේ සිදු කළ නිකුතුන්ගේ සමස්ත ප්‍රතිඵලය දක්වමින් පුවත්පත් නිවේදනයක් නිකුත් කරනු ලැබේ.

8.9 7 වන අයිතමය යටතේ නිකුත් කිරීමේ නිවේදනයෙහි දක්වා ඇති පියවීමේ දිනට නිකුත් කරන ලද බැඳුම්කරවලට අදාළ සියලුම ගෙවීම් සම්පූර්ණයෙන් සිදු කළ යුතුය.

8.10 මුදල් නීති පනතේ 62අ වගන්තිය යටතේ සකස් කරන ලද ලංකාසෙට්ල්හි (LankaSettle) පද්ධති නීතීන් මගින් නියම කරන ලද වේලාවට පියවීම සිදු කරන දිනය තුළ දී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගෙවීමට එරෙහිව මුදා හැරීමේ (Delivery Versus Payment) පදනම මත ලංකාසෙක්‍යු (LankaSecure) පද්ධතිය හරහා ඉලෙක්ට්‍රොනිකව නිකුත් කිරීම සිදු කරනු ලැබේ.

**09. අදියර 1 යටතේ ලංසු ඉදිරිපත් කිරීම සහ අනුමත කිරීම පිළිගැනීම**

9.1 වෙන්දේසි සහභාගිකරුවන්ගේ බලයලත් පරිශීලකයන් වෙන්දේසි දිනට විද්‍යුත් ලංසු ඉදිරිපත් කිරීමේ පද්ධතිය හරහා පැය 0830 සිට පැය 1100 දක්වා ඔවුන්ගේ ලංසු ඉදිරිපත් කිරීම කළ යුතු වේ.

9.2 ලංසු ඉදිරිපත් කරන්නන් හට සම මිළට, අධි මිලට හෝ අව මිළට ලංසු ඉදිරිපත් කිරීමට හැකියාව ඇත.

9.3 ලංසු ඉදිරිපත් කිරීම රුපියල් මිලියනයේ ගුණාකාරවලින් විය යුතු අතර අවම ලංසු ප්‍රමාණය රුපියල් මිලියන 5 ක් විය යුතුය.

9.4 ලංසු තබන්නෙක් එක් ලංසු මිලකට වඩා ලංසු තැබීමට බලාපොරොත්තු වන්නේ නම්, වෙන් වෙන් වශයෙන් එම ලංසු ඉදිරිපත් කළ යුතුයි. එක් රුපියල් 100 ක් සඳහා ලංසු මිල දශම සංඛ්‍යා 5කින් රුපියල්වලින් දැක්විය යුතුය.

9.5 මෙම අදියර යටතේ බහු මිල ගණන් ඉදිරිපත් කිරීමේ අවස්ථාව ඇත.

9.6 අදියර I යටතේ ඕනෑම වෙන්දේසියක එක් එක් ප්‍රාථමික අලෙවිකරුවෙක් සඳහා අවසරලත් අවම මුළු ලංසු ප්‍රමාණය පහත පරිදි ගණනය කරනු ලැබේ :

*ප්‍රාථමික අලෙවිකරුවෙක් විසින් තැබිය යුතු සමස්ත ලංසු ප්‍රමාණයෙහි අවම වටිනාකකම* = *ඉදිරිපත් කළ මුළු ප්‍රමාණය* / *සලකා බලන ප්‍රාථමික වෙන්දේසියට ලංසු ඉදිරිපත් කිරීමට සුදුසුකම්ලත් ප්‍රාථමික අලෙවිකරුවන් සංඛ්‍යාව*

9.7 සෑම ප්‍රාථමික අලෙවිකරුවකු විසින්ම එක් එක් කාර්තුවක් තුළ, පළමු අදියර යටතේ කාර්තුව ඇතුළත සිදු කරන ලද ප්‍රාථමික අලෙවිකරු නිකුතු සාමාන්‍යයෙන් අවම වශයෙන් 50% ක් ලබා ගැනීමට අවශ්‍ය වේ. (ප්‍රාථමික අලෙවිකරු නිකුතු සාමාන්‍යය ගණනය කිරීමේ දී ප්‍රාථමික අලෙවිකරුවන් නොවන ලංසුකරුවන් වෙත කරන ලද නිකුතුන් නොසලකා හැරිය යුතුය)

එක් ප්‍රාථමික අලෙවිකරුවෙකු සඳහා සාමාන්‍ය නිකුත් කිරීම් (AI) පහත පරිදි ගණනය කරනු ලැබේ.

*ප්‍රාථමික අලෙවිකරුවෙක් සඳහා නිකුතු සාමාන්‍යය* = ( *පළමු අදියර යටතේ නිකුත් කළ සම්පූර්ණ ප්‍රමාණය* - *පළමු අදියර යටතේ ප්‍රාථමික අලෙවිකරුවන් නොවන ලංසුකරුවන් වෙත සිදු කළ නිකුතු ප්‍රමාණය* ) / *ප්‍රාථමික අලෙවිකරුවන් සංඛ්‍යාව**

*සලකනු ලබන කාර්තුවේදී, වැඩිම ප්‍රාථමික අලෙවිකරුවන් සංඛ්‍යාවක් සහභාගි වූ ප්‍රාථමික වෙන්දේසියකදී ලංසු තැබීමට සුදුසුකම් ලත් ප්‍රාථමික අලෙවිකරුවන් සංඛ්‍යාව.

9.8 වෙන්දේසි සහභාගිකරුවන්ගේ බලයලත් පරිශීලකයන්ට ඉහත 9.1 හි දක්වා ඇති කාල පරාසය තුළ ඔවුන්ගේ ලංසු ඉදිරිපත් කිරීමට සහ/හෝ වෙනස් කිරීමට හැකියාව ඇත. එම කාලසීමාව ඉක්මවූ පසු කිසිදු පාර්ශවයකට සිය ලංසු වලට කිසියම් හෝ වෙනසක් සිදු කිරීමට ඉඩ නොදෙනු ලැබේ.

9.9 ඉහත 9.1 අදාළව ලංසු ඉදිරිපත් කිරීම කෙරෙහි නොවැළැක්විය හැකි තාක්ෂණික ගැටලුවක් ඇති වුවහොත්, අදාළ වෙන්දේසි සහභාගිකරු විසින් එම ගැටලුව පිළිබඳ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරියෙක් වෙත දුරකථන ඇමතුමක් මගින් හෝ විද්‍යුත් තැපැල මගින් හෝ ෆැක්ස් පණිවිඩයක් මගින් හැකි ඉක්මනින් දැනුම් දිය යුතු අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එය පිළිගැනීමෙන් පසු, එය දැනුම් දුන් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරියාට හෝ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ වෙනත් බලයලත් නිලධාරියෙක් වෙත නියමිත කාලසීමාව තුළ දී ඔවුන්ගේ ලංසු විද්‍යුත් තැපැල මගින් හෝ ෆැක්ස් පණිවිඩයක් මගින් ඉදිරිපත් කළ යුතුය. විද්‍යුත් තැපැල හරහා එවනු ලබන ලංසු, බලයලත් පරිශීලකයින්ගේ නිලලත් විද්‍යුත් තැපැල් හැඳුනුම්පත් හරහා එවිය යුතු අතර, ලංසු අඩංගු ඕනෑම ෆැක්ස් පණිවිඩයක් බලයලත් පරිශීලකයන් විසින් අත්සන් කළ යුතු ය. වෙන්දේසි සහභාගිවරුවන් නිලලත් දුරකථන අංකය/යන් භාවිතා කර ශ්‍රී ලංකා මහ බැංකුව සමග සම්බන්ධ වීමෙන් විද්‍යුත් තැපැල මගින් හෝ ෆැක්ස් පණිවු මගින් ලංසු ඉදිරිපත් කිරීම තහවුරු කළ හැක. මෙම අවශ්‍යතාවයන්ට අනුකූල නොවීමෙන්, අදාළ ලංසු වෙන්දේසියට ඇතුළත් නොවීම සිදු විය හැක.

9.10 ඉදිරිපත් කර ඇති මිල ගණනක් යටතේ සියලුම ලංසු පිළිගත් විට පළමු අදියර යටතේ නිකුත් කිරීමට නියමිත සම්පූර්ණ ලංසු ප්‍රමාණයට වඩා වෙන්දේසියේ දී පිළිගත් මුළු ලංසු ප්‍රමාණය ඉක්මවා යෑම සිදු විය හැකි අවස්ථාවක එවැනි මිල ගණනක් යටතේ නිකුත් කිරීමට නියමිත ප්‍රමාණයන් ප්‍රේෂණය කරනු ලැබේ.

9.11 පළමු අදියර අවසානයේ දී, එක් එක් වෙන්දේසි සහභාගිකරුවන්ට අදාළ බර තැබූ සාමාන්‍ය ඵලදා අනුපාතිකය සහ දෙවන අදියර යටතේ ලංසු ඉදිරිපත් කිරීම සඳහා ඇති ප්‍රමාණය සමග ඔවුන්ගේ පළමු අදියරේ දී එක් එක් සුරැකුම්පත් හඳුනා ගැනීමේ ජාත්‍යන්තර අංකයන් (ISIN) යටතේ ලංසු තැබීමේ ප්‍රතිඵලය, වෙන්දේසිය පැවැත්වෙන දිනයේ පැය 1330 පමණ වෙන්දේසි පද්ධතිය හරහා දැනුම් දෙනු ලැබේ

**10. දෙවන අදියර යටතේ ලංසු ඉදිරිපත් කිරීම හා ලංසු පිළිගැනීම**

10.1 යම් භාණ්ඩාගාර බැඳුම්කර කාණ්ඩයක් සඳහා, පළමු අදියරේ දී ඉදිරිපත් කරන ලද මුළු ප්‍රමාණයම නිකුත් කිරීමට නොහැකි වුවහොත්, නිකුත් කිරීමේ පද්ධතිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසුව වෙන්දේසි දිනයේ දී පැය 1330 ට පමණ නිකුතු ක්‍රියාවලියේ දෙවන අදියර ආරම්භ වන අතර එය පැයක කාලයක් සඳහා විවෘතව පවතී.

10.2 පළමු අදියරේ ප්‍රතිඵල යටතේ නිවේදනය කළ බර තැබූ සාමාන්‍ය ඵලදා අනුපාතිකයට, දෙවන අදියර යටතේ, එක් එක් වෙන්දේසි සහභාගිකකරුවන් විසින් දෙවන අදියර යටතේ නිකුත් කිරීමට නියමිත සම්පූර්ණ ප්‍රමාණය දක්වා නිකුත් කිරීමේ පද්ධතිය හරහා එක් ලංසුවක් ඉදිරිපත් කිරීමේ හැකියාව පවතී.

10.3 වෙන්දේසි සහභාගිකරුවන්ගේ බලයලත් පරිශීලකයන්ට ඉහත 10.1 හි දක්වා ඇති කාල පරාසය තුළ ඔවුන්ගේ ලංසු ඉදිරිපත් කිරීමට සහ/හෝ වෙනස් කිරීමට හැකියාව ඇත. එම කාලසීමාව ඉක්මවූ පසු කිසිදු පාර්ශ්වයකට සිය ලංසුවලට කිසියම් හෝ වෙනසක් සිදු කිරීමට ඉඩ නොදෙනු ලැබේ.

10.4 ඉහත 10.1 අදාළව, ලංසු ඉදිරිපත් කිරීම කෙරෙහි නොවැළැක්විය හැකි තාක්ෂණික ගැටලුවක් ඇති වුවහොත්, අදාළ වෙන්දේසිය සහභාගිකරු විසින් එම ගැටලුව පිළිබඳ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරියෙක් වෙත දුරකථන ඇමතුමක් මගින් හෝ විද්‍යුත් තැපැල මගින් හෝ ෆැක්ස් පණිවිඩයක් මගින් හැකි ඉක්මනින් දැනුම් දිය යුතු අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එය පිළිගැනීමෙන් පසු, එය දැනුම් දුන් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරියාට හෝ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ වෙනත් බලයලත් නිලධාරියෙක් වෙත නියමිත කාලසීමාව තුළ දී ඔවුන්ගේ ලංසු විද්‍යුත් තැපැල මගින් හෝ ෆැක්ස් පණිවිඩයක් මගින් ඉදිරිපත් කළ යුතුය. විද්‍යුත් තැපැල හරහා එවනු ලබන ලංසු, බලයලත් පරිශීලකයින්ගේ නිලලත් විද්‍යුත් තැපැල හැඳුනුම්පත් හරහා එවිය යුතු අතර, ලංසු අඩංගු ඕනෑම ෆැක්ස් පණිවිඩයක් බලයලත් පරිශීලකයන් විසින් අත්සන් කළ යුතුය. වෙන්දේසි සහභාගිකරුවන් නිලලත් දුරකථන අංකය/යන් භාවිතා කර ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සම්බන්ධ වීමෙන් විද්‍යුත් තැපැල මගින් හෝ ෆැක්ස් පණිවුඩ මගින් ලංසු ඉදිරිපත් කිරීම තහවුරු කළ හැක. මෙම අවශ්‍යතාවයන්ට අනුකූල නොවීමෙන්, අදාළ ලංසු වෙන්දේසියට ඇතුළත් නොවීම සිදු විය හැක.

10.5 දෙවන අදියර යටතේ, එක් එක් වෙන්දේසි සහභාගිකරුවකු සඳහා නිකුත් කිරීමට නියමිත අවම ප්‍රමාණය පහත පරිදි ගණනය කරනු ලැබේ.

දෙවන අදියර යටතේ වෙන්දේසි සහභාගිකරු i ගේ අවම සුදුසුකම් ලත් ප්‍රමාණය (Ei)

$$= \frac{\text{පළමු අදියරේ දී වෙන්දේසි සහභාගිකරු i විසින් ගෙවිය යුතු මුළු මුදල}}{\text{පළමු අදියරේ දී සමස්ත වෙන්දේසි සහභාගිකරුවන් ගෙවිය යුතු මුළු මුදල}} \times \text{දෙවන අදියර යටතේ නිකුත් කිරීමට නියමිත ප්‍රමාණය}$$

පළමු අදියරේ දී වෙන්දේසි සහභාගිකරු i විසින් ගෙවිය යුතු මුළු මුදල = $\sum_{j=1}^{n} Pij\ Vij$

මෙහි, n = පළමු අදියරේ දී වෙන්දේසි සහභාගිකරු i විසින් ඉදිරිපත් කළ සාර්ථක ලංසු ප්‍රමාණය,

Pij = පළමු අදියරේ දී වෙන්දේසි සහභාගිකරු i විසින් ඉදිරිපත් කළ j වන සාර්ථක ලංසුවේ ලංසු මිල, සහ

Vij = පළමු අදියරේ දී වෙන්දේසි සහභාගිකරු i විසින් ඉදිරිපත් කළ j වන සාර්ථක ලංසුවේ පිළිගත් ලංසු වටිනාකම

10.6 කෙසේ වුවද, වෙන්දේසි සහභාගිකරු වෙත කෙරෙන අවසන් නිකුතු වටිනාකම එම වෙන්දේසි සහභාගිකරු විසින් අදියර II දී ඉදිරිපත් කරන අයදුම් වටිනාකම සහ අදියර II දී අනෙකුත් වෙන්දේසි සහභාගිකරුවන් විසින් ඉදිරිපත් කරන අයදුම් වටිනාකම් මත රඳා පවතී.

(i) අදියර II හි සමස්ත ලංසුවල එකතුව, එම අදියර තුළ නිකුත් කිරීමට නියමිත උපරිම වටිනාකම ඉක්මවා ගියහොත්, එක් එක් වෙන්දේසි සහභාගිකරුවකු සඳහා නිකුත් කරන වටිනාකම්, අදියර I හි තරගකාරී වෙන්දේසියේ දී එම වෙන්දේසි සහභාගිකරුගේ කාර්ය සාධනය මත රඳා පවතී. (අදියර I හි දී එක් එක් වෙන්දේසි සහභාගිකරුගේ මුළු ගෙවිය යුතු අගය මගින් බර තැබීමෙන්)

වාතාවරණය 1 - අදියර II යටතේ නිකුතුවට ඇති ප්‍රමාණයට වඩා ක්‍රියාකාරී වෙන්දේසි සහභාගිකරුවන්ගේ උප කුලක (Sub set) මගින් ලංසු තබන මුළු ප්‍රමාණය වැඩි වුවහොත්, අදියර II යටතේ නිකුතුව ක්‍රියාකාරී වෙන්දේසි සහභාගිකරුවන්ට පමණක් සීමා වේ. (ක්‍රියාකාරී වෙන්දේසි සහභාගිකරුවෙක් යනු අදියර I හි තරඟකාරී වෙන්දේසියේ දී කිසියම් ප්‍රමාණයක් නිකුත් කරනු ලබන වෙන්දේසි සහභාගිකරුවකු වේ.) අදියර II දී එක් එක් ක්‍රියාකාරී වෙන්දේසි සහභාගිකරුවන් සඳහා වන නිකුතු පුනරාවර්තී ක්‍රියාවලි වට (iterative process) කිහිපයක් මත රඳා පවතී. පළමු වටයේ දී, එක් එක් වෙන්දේසි සහභාගිකරුට නිකුත් කරන වටිනාකම ඉහත 10.5 අයිතමය යටතේ ගණනය කරන ලද Ei හි සහ අදාළ වෙන්දේසි සහභාගිකරු අදියර II යටතේ ලංසු තබන ලද ප්‍රමාණයෙහි අවමය වේ. පළමු වටය යටතේ නිකුත්කිරීම් අවසානයේ දී, යම් ශේෂයක් නිකුතු සඳහා ඉතිරිව තිබුණහොත් පළමු වටයේ දී ක්‍රියාත්මක වූ පුනරාවර්තී ක්‍රියාවලියට සමානව දෙවන වටයේ දී තවදුරටත් නිකුත් කරනු ලැබේ. එය පළමු වටයේ නිකුත් කිරීමෙන් පසු අදියර II යටතේ ලංසු තබන්නන්ගේ නිකුත් නොකරන ලද ශේෂයන්ට සහ 10.5 අයිතමය යටතේ ගණනය කරන ලද Ei ට අනුකූල වේ. අදියර II යටතේ ඇති මුළු ප්‍රමාණයම ක්‍රියාකාරී වෙන්දේසි

සහභාගිකරුවන් අතර බෙදී යනතුරු මෙම ක්‍රියාවලිය අඛණ්ඩව සිදු වේ. අදියර II යටතේ එක් එක් ක්‍රියාකාරී වෙන්දේසි සහභාගිකරුවන් සඳහා වූ මුළු නිකුතුව ඉහත විස්තර කරන ලද එක් එක් වටයේ සමස්ත නිකුතුන්වල එකතුව වේ.

පළමුවන වාතාවරණයේ උදාහරණයක් ඇමුණුම (අ) හි ඉදිරිපත් කර ඇත.

වාතාවරණය 2 - අදියර II හි නිකුතුව සඳහා ඇති ප්‍රමාණයට වඩා ක්‍රියාකාරී වෙන්දේසි සහභාගිකරුවන්ගේ උප කුලක (Sub set) මගින් ලංසු තබන මුළු ප්‍රමාණ අඩු වුවහොත් ඉහත ක්‍රියාකාරී වෙන්දේසිකරුවන්ගේ සම්පූර්ණ උප කුලකය සඳහා එක් එක් ක්‍රියාකාරී වෙන්දේසි සහභාගිකරුවන් ලංසු තබන මුළු වටිනාකම නිකුත් කරනු ලැබේ. නිකුත් නොකරන ලද ඉතිරි ප්‍රමාණයන් එක් එක් වෙන්දේසි සහභාගිකරු අදියර II යටතේ ලංසු තබන ලද වටිනාකමට සමානුපාතික ලෙස ඉතිරි වෙන්දේසි සහභාගිකරුවන් අතර නිකුත් කරනු ලැබේ. දෙවන වාතාවරණයේ උදාහරණයක් ඇමුණුම (ආ) හි ඉදිරිපත් කර ඇත.

(ii) නිකුත් කරන ලද ප්‍රමාණයන්ට වඩා අදියර II යටතේ ලංසුවල එකතුව අඩු වුවහොත්, ලංසු සියල්ලම පිළිගනු ලැබේ.

**11. අදියර III යටතේ අනිවාර්ය නිකුත් කිරීම.**

11.1 දෙන ලද භාණ්ඩාගාර බැඳුම්කර කාණ්ඩයක් සඳහා, නිකුතුව සඳහා ඉදිරිපත් කරන ලද මුළු ප්‍රමාණය, නිකුතු ක්‍රියාවලියෙහි අදියර I හා අදියර II යටතේ සම්පූර්ණ ලෙස නිකුත් නොකළහොත්, ඉදිරිපත් කළ වටිනාකමින් අවම වශයෙන් සියයට 60 ක් අදියර I හි දී පිළිගෙන ඇත්නම් වෙන්දේසි දිනයේ පැය 1430 ට පමණ අදියර II අවසාන වූ වහාම අදියර III විද්‍යුත් ලෙස ක්‍රියාත්මක වේ.

11.2 අදියර III යටතේ ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා පමණක් නිකුතු වේ.

11.3 අදියර III යටතේ එක් එක් ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා නිකුත් කරන ප්‍රමාණයන් පහත පරිදි නිර්ණය කෙරේ.

K වැනි ප්‍රාථමික අලෙවිකරු ($PD_K$) සඳහා අනිවාර්ය නිකුතුව:

$$PD_K = \frac{M-AK}{\sum_{i=1}^{n} M - A_i} \times \left\{ \begin{array}{ccc} \text{නිකුතුව සඳහා} & & \text{අදියර I හා අදියර II} \\ \text{දැනුම් දුන් මුළු} & - & \text{යටතේ නිකුත් කළ} \\ \text{වටිනාකම} & & \text{මුළු වටිනාකම} \end{array} \right\}$$

මෙහි,

$$M = \frac{\begin{array}{ccc} \text{වෙන්දේසිය සඳහා} & & \text{අදියර I හා II හිදී ප්‍රාථමික අලෙවිකරුවන් නොවන} \\ \text{ඉදිරිපත් කළ වටිනාකම} & - & \text{වෙන්දේසි} \\ & & \text{සහභාගිකරුවන්ට නිකුත් කළ මුළු වටිනාකම} \end{array}}{\text{ප්‍රාථමික වෙන්දේසියේ දී ලංසු තැබීමට සුදුසු ප්‍රාථමික අලෙවිකරුවන් සංඛ්‍යාව}}$$

Ak = අදියර I හා II හිදී $PD_K$ ට නිකුත් කළ ප්‍රමාණය

n = අදියර I හා II තරඟකාරී වෙන්දේසියේදී M අගයට අඩුවෙන් සාර්ථක වූ ප්‍රාථමික අලෙවිකරුවන් සංඛ්‍යාව

සහ $1 \leq k \leq n$

ඒ අනුව, අදියර I හා II හිදී ප්‍රාථමික අලෙවිකරුවකු සඳහා වන සාමාන්‍ය නිකුතු වටිනාකම (එනම් M) සාර්ථක කරගත නොහැකි වූ ප්‍රාථමික අලෙවිකරුවන්ට අදියර III ක්‍රියාත්මක වන අවස්ථාවන්හිදී අනිවාර්ය නිකුතු සිදු කෙරේ.

**12. නිකුත් කිරීමේ ප්‍රතිඵල නිවේදනය කිරීම**

12.1 ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සමස්ත නිකුතු ප්‍රතිඵල පිළිබඳ විස්තර වෙන්දේසි දින පැය 1445 ට පමණ ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් පිටුව හරහා ප්‍රකාශ කළ යුතුය.

12.2 ප්‍රකාශිත නිකුතු ප්‍රතිඵලවල පහත කරුණු අන්තර්ගත වේ.

(i) ඉදිරිපත් කළ මුළු වටිනාකම;

(ii) අදියර I හා II හි දී ලංසු තබන ලද සමස්ත වටිනාකම;

(iii) නිකුත් කළ මුළු ප්‍රමාණය සහ

(iv) බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතිකය

**13. සාමාන්‍ය පාලන විධිවිධාන**

13.1 වෙන්දේසි සඳහා සහභාගි වන ආයතනවල බලයලත් පරිශීලකයන්ගේ නම් සහ ආදර්ශ අත්සන්, දුරකථන අංක සහ ෆැක්ස් අංක ශ්‍රී ලංකා මහ බැංකුවට එවිය යුතු වේ.

13.2 රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවෙහි බලයලත් නිලධාරීන්ගේ නම්, දුරකථන අංක, විද්‍යුත් තැපැල් ලිපින සහ ෆැක්ස් අංකයන් සියලුම වෙන්දේසි සහභාගිකරුවන් වෙත එවනු ලැබේ.

13.3 ලංසුවෙහි තොරතුරුවල නිරවද්‍යතාවය පිළිබඳව එක් එක් සහභාගිකරුවන් වගකිව යුතුය.

13.4 නිකුත් කිරීමේ ප්‍රතිඵල නිවේදනය කර නැතොත් කිසිදු ලංසුවක් නෛතිකව බාරගත් බව නොසැලකේ.

## V කොටස - හිමිකම්

**14. හිමිකම්**

14.1 නිකුත් කිරීම් ප්‍රතිඵලවල යම් තැනක දෝෂයක් හෝ පැනනගින වෙනයම් දෝෂයක් ඇති බව වෙන්දේසියට සහභාගිවන්නකුට හැඟෙන්නේ නම්, එසැනින් ඒ පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව දැනුම්වත් කිරීම යෝග්‍ය වේ.

14.2 ඉහත 14.1 යටතේ සිදුවන දැනුම් දීමකදී මහ බැංකුව විසින් අදාළ වෙන්දේසි සහභාගිවන්නා වෙත, වැඩ කරන දින 3 ක කාලයක් ඇතුළත ප්‍රතිචාර දැක්විය යුතු වේ.

14.3 දක්වනු ලැබූ කරුණ සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය පිළිබඳව වෙන්දේසි සහභාගිකරුවකු සෑහීමකට පත් නොවේ නම්, ශ්‍රී ලංකා මහ බැංකු අධිපති වෙත විධිමත් පැමිණිල්ලක් යොමු කිරීම යෝග්‍ය වේ. එම පැමිණිල්ල පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විමර්ශනය කර, එහි ප්‍රතිඵල සහ නිගමනයන් පැමිණිලිකරුට වැඩ කරන දින 5 ක කාලසීමාවක් තුළ ලබා දිය යුතුය.

14.4 ඉහත 14.3 හි සඳහන් කාලසීමාව තුළ දී මහ බැංකුව විසින් ලබා දෙන නිරාකරණය පිළිබඳව යම් වෙන්දේසි සහභාගිකරුවකු සෑහීමකට පත් නොවේ නම් ඔවුන්ගේ විධිමත් පැමිණිලි, නිකුත් කරන්නා (මුදල් විෂය භාර ඇමති) වෙත යොමු කළ යුතු අතර ඔහු විසින් ඒ සඳහා යෝග්‍ය විමර්ශන කටයුතු හා අදාළ නිර්දේශ කිරීම් සඳහා මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත යොමු කරනු ඇත.

## VI කොටස - විග්‍රහයන්

**15. විග්‍රහයන්**

| | | |
|---|---|---|
| බහු මිල තරගකාරී වෙන්දේසි | : | ලංසු තබන ලංසු අතරින් උපරිම මිලයන්ට හෝ අවම පොලී අනුපාතිකයන්ට වෙන්දේසිය අවසන් වනතුරු මූලික වෙන් කිරීම් සිදු කරන තරගකාරී වෙන්දේසියකි. |
| වෙන්දේසි සහභාගිකරුවන් | : | ප්‍රාථමික නිකුත් කිරීමට සහභාගී වීමට මුදල් මණ්ඩලය විසින් පත් කරනු ලැබූ ප්‍රාථමික ගැනුම්කරුවන් සහ විශේෂිතව නිල ලත් අනෙකුත් සහභාගිකරුවන් |
| වෙන්දේසි සහභාගිකරුගේ බලයලත් පරිශීලක | : | වෙන්දේසි සහභාගිකරු විසින් ප්‍රාථමික නිකුතුන්හිදී විද්‍යුත්ව හෝ අන් අයුරකින් ලංසු තැබීම සඳහා පත් කර ගනු ලැබූ පරිශීලකයෙකි. |
| රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරී | : | රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවෙහි නිලධාරී මණ්ඩලය අතරින් වෙන්දේසි සහභාගිකරුවන් සමඟ ලංසු ලැබීම් කටයුතු පිළිබඳව සන්නිවේදන කටයුතු සිදු කිරීම සඳහා රාජ්‍ය ණය අධිකාරී මගින් බලය පවරන ලද නිලධාරී |

**අදියර II**

**ඇමුණුම (අ)**

වෙන් කිරීමේ අනුරූපනය - වාතාවරණය 1

| | |
|---|---|
| ප්‍රකාශිත අගය (රු. මිලියන) | 90,000 |
| වෙන්දේසියේදී දායක නොවූ ප්‍රමාණය (රු. මිලියන) | 20% |

(රු.මිලියන 18000)

නිකුත් කිරීම සඳහා ඇති මුළු ප්‍රමාණය 18,000

පළමු වටයේ (Round 1) මුළු නිකුත් කිරීම 12,438

දෙවන වටයේ (Round 2) නිකුත් කිරීම සඳහා ඉතිරිය 5,562

දෙවන වටයේ මුළු නිකුත් කිරීම 880

තුන්වන වටයේ (Round 3) නිකුත් කිරීම සඳහා ඉතිරිය 4,682

තුන්වන වටයේ මුළු නිකුත් කිරීම 169

සිව්වන වටයේ (Round 4) නිකුත් කිරීම සඳහා ඉතිරිය 4,513

සිව්වන වටයේ මුළු නිකුත් කිරීම 162

පස්වන වටයේ (Round 5) නිකුත් කිරීම සඳහා ඉතිරිය 4,351

පස්වන වටයේ මුළු නිකුත් කිරීම 157

හයවන වටයේ (Round 6) නිකුත් කිරීම සඳහා ඉතිරිය 4,194

වාතාවරණය 1: ක්‍රියාකාරී ප්‍රාථමික අලෙවිකරුවන් උප කුලකය විසින් තබන ලද මුළු ලංසු ප්‍රමාණය දෙවන වටයේ නිකුත් කිරීමට ඇති මුළු ප්‍රමාණයට වඩා වැඩි වීම

| ප්‍රාථමික අලෙවිකරු | දෙවන අදියර (Phase II) සඳහා අවම සුදුසුකම් % (*) | ඉදිරිපත් කළ ලංසු ප්‍රමාණය (රු.මිලියන) | සුදුසුකම් ලැබූ ප්‍රමාණය 1 | නිකුත් කිරීම 1 (තාවකාලික) | නිකුත් කිරීම 1 | ඉතිරි ලංසු ප්‍රමාණය 2 | සුදුසුකම් ලැබූ ප්‍රමාණය 2 | නිකුත් කිරීම 2 (තාවකාලික) | නිකුත් කිරීම 2 | ඉතිරි ලංසු ප්‍රමාණය 3 | සුදුසුකම් ලැබූ ප්‍රමාණය 3 | නිකුත් කිරීම 3 (තාවකාලික) | නිකුත් කිරීම 3 | ඉතිරි ලංසු ප්‍රමාණය 4 | සුදුසුකම් ලැබූ ප්‍රමාණය 4 | නිකුත් කිරීම 4 (තාවකාලික) | නිකුත් කිරීම 4 | ඉතිරි ලංසු ප්‍රමාණය 5 | සුදුසුකම් ලැබූ ප්‍රමාණය 5 | නිකුත් කිරීම 5 | ඉතිරි ලංසු ප්‍රමාණය 6 | සුදුසුකම් ලැබූ ප්‍රමාණය 6 | නිකුත් කිරීම 6 සහ ඉහළ | මුළු නිකුතුව (රු. මිලියන) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| A | 30.00% | 6,000 | 5,400.00 | 5,400 | 5,400 | 600 | 1,669 | 600 | 600 | - | 1,405 | - | - | - | 1,354 | - | - | - | 1,305 | - | - | 1,258 | | 6,000 |
| B | 25.00% | 3,200 | 4,500.00 | 3,200 | 3,200 | - | 1,391 | - | - | - | 1,170 | - | - | - | 1,128 | - | - | - | 1,088 | - | - | 1,049 | | 3,200 |
| C | 15.00% | 1,600 | 2,700.00 | 1,600 | 1,600 | - | 834 | - | - | - | 702 | - | - | - | 677 | - | - | - | 653 | - | - | 629 | | 1,600 |
| D | 10.00% | 400 | 1,800.00 | 400 | 400 | - | 556 | - | - | - | 468 | - | - | - | 451 | - | - | - | 435 | - | - | 419 | | 400 |
| E | 5.00% | 350 | 899.98 | 350 | 350 | - | 278 | - | - | - | 234 | - | - | - | 226 | - | - | - | 218 | - | - | 210 | | 350 |
| F | 4.00% | 800 | 720.02 | 720 | 720 | 80 | 222 | 80 | 80 | - | 187 | - | - | - | 181 | - | - | - | 174 | - | - | 168 | | 800 |
| G | 3.00% | 6,000 | 540.00 | 540 | 540 | 5,460 | 167 | 167 | 167 | 5,293 | 140 | 140 | 140 | 5,153 | 135 | 135 | 135 | 5,017 | 131 | 131 | 4,887 | 126 | 3,495 | 4,608 |
| H | 3.00% | - | 540.00 | - | - | - | 167 | - | - | - | 140 | - | - | - | 135 | - | - | - | 131 | - | - | 126 | | - |
| I | 2.40% | 80 | 432.00 | 80 | 80 | - | 133 | - | - | - | 112 | - | - | - | 108 | - | - | - | 104 | - | - | 101 | | 80 |
| J | 0.80% | - | 144.00 | - | - | - | 44 | - | - | - | 37 | - | - | - | 36 | - | - | - | 35 | - | - | 34 | | - |
| K | 1.20% | 40 | 216.00 | 40 | 40 | - | 67 | - | - | - | 56 | - | - | - | 54 | - | - | - | 52 | - | - | 50 | | 40 |
| L | 0.60% | 2,400 | 108.00 | 108 | 108 | 2,292 | 33 | 33 | 33 | 2,259 | 28 | 28 | 28 | 2,231 | 27 | 27 | 27 | 2,203 | 26 | 26 | 2,177 | 25 | 699 | 922 |
| M | 0.00% | 150 | - | - | - | 150 | - | - | - | 150 | - | - | - | 150 | - | - | - | 150 | - | - | 150 | - | | - |
| N | 0.00% | 400 | - | - | - | 400 | - | - | - | 400 | - | - | - | 400 | - | - | - | 400 | - | - | 400 | - | | - |
| O | 0.00% | 500 | - | - | - | 500 | - | - | - | 500 | - | - | - | 500 | - | - | - | 500 | - | - | 500 | - | | - |
| P | 0.00% | 50 | - | - | - | 50 | - | - | - | 50 | - | - | - | 50 | - | - | - | 50 | - | - | 50 | - | | - |
| Q | 0.00% | 50 | - | - | - | 50 | - | - | - | 50 | - | - | - | 50 | - | - | - | 50 | - | - | 50 | - | | - |
| එකතුව | 100.00% | 22,020 | 18,000 | 12,438 | 12,438 | 9,582 | 5,562 | 880 | 880 | 8,702 | 4,682 | 169 | 169 | 8,533 | 4,513 | 162 | 162 | 8,371 | | 157 | 8,214 | | 4,194 | 18,000 |
| හිඟ වෙන් කිරීම | | | | | | | | | | | | | | | | | | | | | | | | - |

* දෙවන අදියර (Phase II) සඳහා වෙන්දේසි සහභාගිකරුවෙකුගේ සුදුසුකම, වෙන්දේසි සහභාගිකරු පළමු අදියරේ දී (Phase I) ගෙවිය යුතු මුළු ප්‍රමාණය/සියලුම වෙන්දේසි සහභාගිකරුවන් විසින් පළමු අදියරේදී ගෙවිය යුතු මුළු ප්‍රමාණය, ලෙස ගණනය කරනු ලබයි.

ඇමුණුම (ආ)

**වෙන්කිරීමේ අනුරූපනය - වාතාවරණය 2**

| | | |
|---|---|---|
| ප්‍රකාශිත අගය (රු.මිලියන) | 90000 | |
| වෙන්දේසියේදී ආයක නොවූ ප්‍රමාණය (රු.මිලියන) | 20% | (රු.මිලියන 18000) |

**වාතාවරණය 2**
**ක්‍රියාකාරී ප්‍රාථමික අලෙවිකරුවන් උප කුලකය විසින් තබන ලද මුළු ලංසු ප්‍රමාණය**
**දෙවන වටයේ නිකුත් කිරීමට ඇති මුළු ප්‍රමාණයට වඩා අඩු වීම**

| ප්‍රාථමික අලෙවිකරු | දෙවන අදියර (Phase II) සඳහා අවම සුදුසුකම් % (*) | ඉදිරිපත් කළ ලංසු ප්‍රමාණය (රු.මිලියන) | මුළු නිකුත් කිරීම |
|---|---|---|---|
| A | 30% | 4,670 | 4,670 |
| B | 25% | 3,200 | 3,200 |
| C | 15% | 1,500 | 1,500 |
| D | 10% | 400 | 400 |
| E | 5% | 300 | 300 |
| F | 4% | 750 | 750 |
| G | 3% | 200 | 200 |
| H | 3% | - | - |
| I | 2% | 100 | 100 |
| J | 1% | - | - |
| K | 1% | 30 | 30 |
| L | 1% | 2,300 | 2,300 |
| M | 0% | 6,750 | 3,413 |
| N | 0% | 900 | 455 |
| O | 0% | 1,125 | 569 |
| P | 0% | 113 | 57 |
| Q | 0% | 113 | 57 |
| එකතුව | 100% | 22,450 | 18,000 |
| හිඟ වෙන් කිරීම | | | - |

* දෙවන අදියර (Phase II) සඳහා වෙන්දේසි සහභාගිකරුවෙකු සතු අවම නිකුතු සුදුසුකම; වෙන්දේසි සහභාගිකරු පළමු අදියරේ දී (Phase I) ගෙවිය යුතු මුළු ප්‍රමාණය/සියලුම වෙන්දේසි සහභාගිකරුවන් විසින් පළමු අදියරේදී ගෙවිය යුතු මුළු ප්‍රමාණය, ලෙස ගණනය කරනු ලබයි.

**මෙහෙයුම් උපදෙස් අංකඃ** RDD/CSDDLS/2013/01 (A-04)

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
නො.30, ජනාධිපති මාවත
කොළඹ 01
දු.ක. 2477452, 2398748
ෆැක්ස්: 2477724
2017 පෙබරවාරි 06

සියලු සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත,

මහත්මයාණෙනි/මහත්මියනි,

## මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් සංශෝධනය

පිළිවෙලින් 2014 ජූලි මස 17 දින, 2014 දෙසැම්බර් මස 03 දින සහ 2016 ජනවාරි මස 14 දින සංශෝධිත 2013 මැයි මස 10 දිනැති RDD/CSDDLS/2013/01 අංක දරන මෙහෙයුම් උපදෙස් පහත පරිදි, සංශෝධනය කළ බව මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි වී ඇති සියලුම සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත මෙයින් දන්වා සිටිමු.

8. ණය ආපසු ගෙවීමේ කාලය :- ණය ආපසු ගෙවීම සඳහා උපරිම කාලය ව්‍යාපෘතියේ ස්වභාවය මත පදනම්ව අවුරුදු 01 ක උපරිම සහන කාලයක් ද ඇතුළුව වසර 06 ක් වනු ඇත.
9. සහන කාලය සහ ප්‍රතිලේඛනගතකරණය:- අවශ්‍ය නම්, ව්‍යාපෘතියේ ස්වභාවය මත ණය ගැතියන් සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, ලබා දෙන සහන කාලය පිළිබඳව සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් තීරණය කළ යුතුය. කෙසේ නමුදු, ණය ආපසු ගෙවීමේ කාලය වසර 06 කට නොවැඩි විය යුතුය. මෙම ණය වසර 06 කට වඩා වැඩි කාලයක් සඳහා ප්‍රතිලේඛනගත කිරීමේ යම් අවශ්‍යතාවයක් ඇති වුවහොත්, ඒ සඳහා පූර්ව අනුමැතිය ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ලබා ගත යුතුවේ.

මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් උපදෙස් යටතේ, මීට පෙර නිකුත් කරන ලද සියලුම නියමයන් සහ කොන්දේසි නොවෙනස්ව පවතිනු ඇත.

මෙම සංශෝධනයේ අඩංගු කරුණු අදාළ නිලධාරීන් වෙත දැන්වීමට සලස්වන්න.

ඩී.වී.එස්. දයාවංශ මිය
**අධ්‍යක්ෂ**
**ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

**මෙහෙයුම් උපදෙස් අංක:** RDD/SWASHAKTHI/**2017/01**

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ.පෙ.590,
අංක.30, ජනාධිපති මාවත
කොළඹ 01
2017.02.09

සියලුම සහභාගිත්ව මූල්‍යායතන වෙත,

මහත්මයාණෙනි/මහත්මියනි,

## මෙහෙයුම් උපදෙස් : "ස්වශක්ති - රැකියා දශ ලක්ෂයක් කරා" ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සංවර්ධනය හා රැකියා උත්පාදනය කිරීමේ ණය යෝජනා ක්‍රමය

1. **හැඳින්වීම**

"ස්වශක්ති" ණයයෝජනා ක්‍රමය ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සංවර්ධනය හා රැකියා උත්පාදනය කිරීම අරමුණ කර ගනිමින් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය සමග එක්ව නිර්මාණය කර හඳුන්වාදී ඇත. නව රැකියා අවස්ථා උත්පාදනය කිරීම මූලික අරමුණ වන අතර, කෘෂිකර්මාන්ත, පශු සම්පත්, කර්මාන්ත හා සේවා යන අංශවල ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්හි යෙදෙන නව ව්‍යවසායකයින්ට හා දැනට ව්‍යාපාර පවත්නාගෙන යනු ලබන ව්‍යාපාරිකයන්ට මූල්‍ය පහසුකම් ලබා දීම මේ තුළින් අපේක්ෂා කෙරේ. මෙම යෝජනා ක්‍රමය යටතේ තරුණ තරුණියන්, තරුණ උපාධිධාරීන්ට, කාන්තාවන් හා විවිධ දුබලතා ඇති පුද්ගලයින්ට විශේෂ අවධානය යොමු කර ඇත.

2. **යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම**

ණය සංරචකයන් හා විශේෂ ප්‍රදානයන් මෙම යෝජනා ක්‍රමයට ඇතුළත් වන අතර, මෙය 100% ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමයකි. ප්‍රදානය නව ව්‍යාපාරිකයින්/ව්‍යවසායකයින් සඳහා මූලික වියදම් ආවරණය කර ගැනීම සඳහා ලබා දෙනු ලබයි. මෙය 20 අවුරුදු චක්‍රීය ණය යෝජනා ක්‍රමයකි. මෙම ණය යෝජනා ක්‍රමය ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සහ ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක වන අතර, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය මගින් ප්‍රතිපදාන වෙන් කොට ඇත. මේ සඳහා රුපියල් මිලියන 4,000 ක් අරමුල් ප්‍රමාණයක් වෙන් කර ඇත. ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය මගින් රුපියල් මිලියන 1,000 ක මුදලක් ආරම්භයේදී මුදා හරින අතර, ඉතිරි මුදල් ප්‍රමාණය වැඩසටහන් ප්‍රගතිය සමග කොටස් වශයෙන් මුදා හරිනු ඇත. මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා තෝරා ගන්නා ලද බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු මගින් සුදුසුකම් සපුරාලන උප ණයකරුවන් සඳහා ණය මුදල් ලබා දෙනු ලබයි.

3. **යෝජනා ක්‍රමයේ අරමුණු**

"ස්වශක්ති" ණය යෝජනා ක්‍රමයේ අරමුණු පහත පරිදි වේ.

3.1 රට පුරා ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ඒකක 25,000 ක අධික ප්‍රමාණයක් රට පුරා ස්ථාපනය කිරීම තුළින් මිලියනයක රැකියා උත්පාදනය කිරීම සඳහා වූ රජයේ අරමුණට දායක වීම.

3.2 නවීන හා සුදුසු තාක්ෂණය ලබාදීම තුළින් ග්‍රාමීය ආර්ථිකයේ කාර්යක්ෂම බව හා තරගකාරීත්වය වැඩිදියුණු කිරීම.

3.3 තරුණයින්ගේ පවතින කුසලතා සහ නිපුණතා සහ ග්‍රාමීය ප්‍රදේශවල ඇති සම්පත් ප්‍රයෝජනයට ගැනීම.

3.4 නව වෙළෙඳපොල අවස්ථාවන් හා සම්බන්ධතා සංවර්ධනය කිරීම සහ

3.5 ප්‍රාදේශීය විෂමතාවන් අඩු කිරීම තුළින් රටේ සමස්ත ආර්ථික සංවර්ධනයට දායක වීම.

4. **යෝජනා ක්‍රමය**

4.1 අරමුදල් වෙන් කිරීම: රුපියල් මිලියන 4,000

4.2 ප්‍රතිලාභීන් තෝරා ගැනීම : සෑම ඡන්ද කොට්ඨාශයකම අවම වශයෙන් ප්‍රතිලාභීන් 75 ක්.

4.3 ණය සීමාවන්: තනි පුද්ගල හෝ උපරිමය තිදෙනෙක් යුතු හවුල් ව්‍යාපාර සඳහා ණය මුදල් ලබා දෙයි.

4.3.1 (අ) නව ව්‍යාපාරිකයින්/ව්‍යවසායකයින් සඳහා උපරිම ණය මුදල රු.200,000/- සහ උපරිම ප්‍රදානය රු.500,000 කි.

(ආ)පවත්නා ව්‍යාපාර සහිත ව්‍යවසායකයින් සඳහා උපරිම ණය මුදල රු. 250,000/-

4.3.2 දෙවන ණය සහ අනුක්‍රමික ණය: මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිමූල්‍ය පහසුකම් ලබා ගැනීමෙන් තොරව සහභාගිත්ව මූල්‍ය ආයතනවල අරමුදල් යොදා ගනිමින් දෙවන සහ අනුක්‍රමික ණය මුදල් ලබා දෙනු ඇත ණයගැතියා පළමු ණය මුදලේ හෝ/සහ අනුක්‍රමික ණය මුදලේ පොලී ගෙවීම සාර්ථකව සිදු කරයි නම්, මුල් ණය මුදල හෝ අනුක්‍රමික ණය

මුදල මුළුමනින්ම ආපසු ගෙවීමට පෙර දෙවන ණය හා අනුක්‍රමික ණය ලබා දිය හැක. සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් පවත්නා වෙළෙඳපොළ අනුපාත මත පදනම්ව මධ්‍යස්ථ පොලී අනුපාතයකට ණය මුදල් ලබා දිය හැක. ණයගැතියාගේ අරමුදල් අවශ්‍යතාවය සහ ව්‍යාපෘතියේ ශක්‍යතාවයට යටත්ව දෙවන ණය මුදල සහ අනුක්‍රමික ණය මුදලේ එකතුව පළමු ණය මුදලෙන් 3 ගුණයක් විය යුතුය.

4.4 නව ව්‍යාපාරිකයන්/ව්‍යවසායකයන් සඳහා ප්‍රදානය

4.4.1 ව්‍යාපෘතිය සඳහා අනුමත මුළු ණය මුදලෙන් 25% ක් රු.50,000 ක උපරිමයකට යටත්ව වන ප්‍රදානයන් ලැබීමට නව අයදුම්කරුවන් සුදුසුකම් ලබනු ඇත.

(අ) **ආරම්භක ප්‍රදානය:** ව්‍යාපෘතිය ආරම්භයේදී රු.10,000/- උපරිමයකට යටත්ව ණය මුදලින් 5% ක ප්‍රමාණයක් ව්‍යාපෘතියේ මූලික වියදම් ආවරණය කර ගැනීම සඳහා ලබා දෙනු ලබයි. මෙම මුදල ආරම්භයේදී සහභාගිත්ව මූල්‍යායතනය මගින් ණයගැතියන් වෙත ලබා දෙන අතර, ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අරමුදල් සහභාගිත්ව මූල්‍යායතනය වෙත ප්‍රතිමූල්‍යයන කරනු ඇත.

(ආ) **ප්‍රදානයක් ලෙස ලබා දෙන මුදලේ දෙවන කොටස:** ව්‍යාපෘතියේ සතුටුදායක කාර්යසාධනය අවම වශයෙන් මාස 06 ක කාලසීමාවක් පැවතීම මත පදනම්ව රු.40,000/- උපරිමයකට යටත්ව ණය මුදලින් 20% ක් (උපරිම ණය මුදල රු.200,000/-) ප්‍රදානය කරනු ඇත.

4.5 **ප්‍රාග්ධනය සඳහා දායකත්වය:** නව ව්‍යවසායකයින් සඳහා අවම වශයෙන් ආරම්භක ප්‍රදානයට සමාන මුදලක්, මුදල් හෝ වෙනයම් ආකාරයකින් ප්‍රාග්ධනය සඳහා දායකත්වය ලබා දීමට අපේක්ෂා කෙරේ.

4.6 **ප්‍රදානයක් ලෙස ලබා දෙන මුදලේ දෙවන කොටස ලබාදීම සඳහා වන නිර්ණායක:**

4.6.1 අලුතින් ස්ථාපිත කරන ලද ව්‍යාපාරවලට ප්‍රදානයන් ලෙස ලබා දෙන මුදලේ දෙවන කොටස සඳහා සුදුසුකම් ලැබීමට අවම වශයෙන් පහත ඉලක්කයන්ගෙන් එකක් හෝ සපුරා තිබිය යුතුය.

(අ) පිරිවැටුමේ වර්ධනය අවම වශයෙන් වසරකට 20% වීම.

(ආ) අවම වශයෙන් එක් අතිරේක රැකියා අවස්ථාවක් ජනනය කිරීම.

(ඉ) පළමු මාස 6 සඳහා සැලසුම් කරන ලද ව්‍යාපාර සැලැස්මේ ඉලක්ක වලින් 80% ක් ළඟා කර ගෙන තිබීම.

4.6.2 4.6.1 ඡේදයේ දක්වා ඇති ඉලක්කවලින් එකක් හෝ සපුරා ගැනීමෙන් පසු ප්‍රදානයක් ලෙස ලබා දෙන මුදලේ දෙවන කොටස ලබා ගැනීම සඳහා සුදුසුකම් ලැබූ ණයගැතියන් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය මගින් හෝ අදාළ සහභාගිත්ව මූල්‍ය ආයතනය මගින් අයදුම් කළ යුතුය.

4.6.3 කුඩා ව්‍යාපාර අංශය මගින් ප්‍රදානයක් ලෙස ලබාදෙන මුදලේ දෙවන කොටස සඳහා කුඩා ව්‍යාපාර අංශය වෙතින් ලැබුණ අයදුම්පත් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය මගින් ඇගයීමට ලක් කර අනුමැතිය සමග අදාළ සහභාගිත්ව මූල්‍ය ආයතනය වෙත භාරදිය යුතුය.

4.6.4 සහභාගිත්ව මූල්‍යායතන විසින් ලබා ගන්නා ලද අයදුම්පත්‍ර සහභාගිත්ව මූල්‍ය ආයතනය විසින් ඇගයීමට ලක් කර, ප්‍රදානයක් ලෙස ලබා දෙන මුදලේ දෙවන කොටස ලබා ගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීමට ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය වෙත අයදුම්පත්‍ර යොමු කළ යුතුය.

4.6.5 ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය මගින් අනුමැතිය ලබා ගැනීමෙන් පසුව නව අයදුම්කරුවන්ට ප්‍රදානයක් ලෙස ලබා දෙන මුදලේ දෙවන කොටස ලබා දීම පළමුව සිදු කරනු ලබන අතර, දෙවනුව, සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් එය ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ප්‍රතිපූරණය කර ගැනීමට ඉදිරිපත් කළ යුතු අතර, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මෙම මුදල් සහභාගිත්ව මූල්‍යායතනය වෙත ප්‍රතිපූරණය කරනු ඇත.

**4.7 ඉලක්ක කණ්ඩායම්**

4.7.1 අභියෝගයන් සහ අවදානම් භාර ගැනීමට ඇති හැකියාව සහ කැමැත්ත ඇති නව ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ අංශයෙහි සිටින නවකයින්ට ප්‍රමුඛතාවය ලබා දිය යුතුය.

4.7.2 පවත්නා කුසලතා හා හැකියාවන් තම නව ව්‍යාපාරයක් සඳහා භාවිතා කිරීමට කැමැත්තෙන් සිටින තරුණ තරුණියන්ට.

4.7.3 දැනටමත් ක්ෂුද්‍ර ව්‍යාපාරවල නියැලී සිටින නමුත් තම ව්‍යාපාරය පුළුල් කර ගැනීමට බලාපොරොත්තු වන ව්‍යවසායකයින්ට.

4.7.4 ගම්මානවල පවතින සම්පත් මත පදනම්ව තමන්ගේම නව ව්‍යාපාර ඇති කිරීමටත් තොරතුරු තාක්ෂණය මත පදනම් වූ නිෂ්පාදන හා ආර්ථික ක්‍රියාකාරකම් කිරීමටත් අදහස් කරන ව්‍යවසායකයින්ට.

4.7.5 තරුණ තරුණියන්, තරුණ උපාධිධාරීන්, කාන්තාවන් හා විවිධ දුබලතා ඇති පුද්ගලයින්ට ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත.

4.8 **ව්‍යාපෘතිය තෝරා ගැනීමේ නිර්නායක**

4.8.1 යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම්ලත් ණයගැතියන් හඳුනාගැනීමට ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය හා සහභාගිත්ව මූල්‍ය ආයතන පහත නිර්ණායක සලකා බලනු ලබයි.

(අ) ව්‍යාපාර අදහස්වල ඇති නවතාවය

(ආ) ණය ගැතියන්ගේ ව්‍යවසායකත්ව හා තාක්ෂණික කුසලතා

(ඇ) නිෂ්පාදන සඳහා වෙළෙඳපොලක් ලබා ගැනීම

(ඈ) අලෙවිකරණ හා ඇසුරුම්කරණ උපාය මාර්ග

(ඉ) ව්‍යාපාරයේ රැකියා උත්පාදන හැකියාව

(ඊ) යෝග්‍ය තාක්ෂණය

(උ) ව්‍යාපෘතියේ තාක්ෂණික හා මූල්‍යමය ශක්‍යතාව

(ඌ) හරිත පරිසර හිතකාමී ව්‍යාපෘති

4.8.2 ව්‍යාපෘති සැලැස්මේ හැකියාව මත සුදුසුකම්ලත් ප්‍රතිලාභීන් තෝරා ගනු ලැබේ.

4.8.3 ආර්ථිකයේ කෘෂිකාර්මික, කර්මාන්ත හා සේවා යන අංශවල සියලුම ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සුදුසුකම් ලබයි. ඇමුණුම 1 හි දක්වා ඇති ව්‍යාපෘති/ව්‍යාපාර සඳහා වැඩි අවස්ථාවක් ලබා දෙනු ඇත.

**4.9 සුරැකුම්**

(අ) ව්‍යාපෘති යෝජනාවේ ශක්‍යතාවය හා ශක්තිය මත පදනම්ව ණය ලබා දීමට සහභාගිත්ව මූල්‍ය ආයතන දිරි ගන්වනු ලැබේ.

(ආ) දැනට පවත්නා ස්ථාවර වත්කම් හා පෞද්ගලික ඇප ආවරණ සලකා බලනු ලැබේ.

**4.10 පොලී අනුපාතිකය**

(අ) ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා මහ බැංකුවෙන් කිසිදු පොලියක් අය කරනු නොලැබේ.

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගිත්ව මූල්‍ය ආයතනයන්ගෙන් සියයට 0.5 ක වාර්ෂික පොලියක් අය කරනු ලබයි.

(ඇ) සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් ණයගැතියන්ගෙන් සියයට 5.5 ක වාර්ෂික පොලියක් අය කරනු ලබයි. (සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා සියයට 5ක් ඇතුළත්ව)

4.11 **ප්‍රතිමූල්‍යඃ** ඉහත සඳහන් ණය සීමාවන්ට යටත්ව සහභාගිත්ව මූල්‍යායතනය විසින් මුදා හරින ලද ණය මුදලෙන් 100% ක්ම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිමූල්‍යනය කරනු ලබයි.

4.12 **ණය නැවත අයකර ගැනීමඃ** ණය ආපසු අයකර ගැනීමේ වගකීම සහභාගිත්ව මූල්‍යායතනය විසින් දරනු ඇත.

4.13 **ණය ආපසු ගෙවීමේ කාලය හා සහන කාලයඃ** ව්‍යාපෘතියේ ස්වභාවය මත පදනම්ව, උපරිම වසර 1 ක සහන කාලය ද ඇතුළත්ව ආපසු ගෙවීමේ උපරිම කාලය වසර 05 කි.

4.14 **පශ්චාත් අධීක්ෂණය, අලෙවිකරණ සහය සහ නියාමනයඃ** ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල, කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය හා සහභාගිත්ව මූල්‍ය ආයතන.

4.1.5 **නිපුණතා සංවර්ධනය සහ වෙළෙඳපොල සම්බන්ධතාඃ** ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය, ප්‍රාදේශීය කර්මාන්ත හා වාණිජ දෙපාර්තමේන්තුව, කාර්මික අධ්‍යාපන දෙපාර්තමේන්තුව, අපනයන සංවර්ධන මණ්ඩලය, කර්මාන්ත සංවර්ධන මණ්ඩලය, ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා රෙදිපිළි හා ඇඟළුම් ආයතනය, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ආයතනය හා වෘත්තීය පුහුණු අධිකාරිය වැනි අනෙකුත් පාර්ශවකරුවන්ගේ සහයෝගය ඇතිව කුඩා කර්මාන්ත සංවර්ධන අංශය මගින් සිදු කරයි.

4.1.6 **මූල්‍ය සාක්ෂරතාවය සහ දැනුවත් බව පිළිබඳ පුහුණුවඃ** ශ්‍රී ලංකා මහ බැංකුව අනෙකුත් අදාළ පාර්ශවකරුවන් සමග එක්ව ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල මගින් හා සහභාගිත්ව මූල්‍යායතන මගින් සිදු කරයි.

4.1.7 **මෙහෙයුම් ප්‍රදේශයඃ** මුළු දිවයිනටම

5. **මෙහෙයුම් ක්‍රියාවලියඃ මෙම යෝජනා ක්‍රමයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙහෙයුම් ක්‍රියාවලිය හා සම්බන්ධිත පාර්ශවයන්ගේ වගකීම් ඇමුණුම II හි දක්වා ඇත.**

6. **සහභාගිත්ව මූල්‍ය ආයතනඃ**

- ලංකා බැංකුව
- මහජන බැංකුව
- හැටන් නැෂනල් බැංකුව
- කොමර්ෂල් බැංකුව
- සම්පත් බැංකුව
- සෙලාන් බැංකුව
- ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
- සණස සංවර්ධන බැංකුව
- ජාතික සංවර්ධන බැංකුව
- පැන් ඒෂියා බැංකුව (PABC)
- යූනියන් බැංකුව (UB)
- ඩී.එෆ්.සී.සී. බැංකුව
- නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව
- කාර්ගිල්ස් බැංකුව
- ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව (SLSB)
- රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව (SMIB)
- නේෂන්ස් ට්‍රස්ට් බැංකුව

7. **ණයගැතියන් සඳහා යෝග්‍ය නිර්ණායකඃ**

සුදුසුකම් ලබන ණයගැතියන්,

7.1 ශ්‍රී ලංකාවේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.

7.2 වෙනත් මූල්‍ය ආයතනයක ගෙවීම් පැහැර හරින්නෙකු නොවිය යුතුය.

7.3 යෝජිත ව්‍යාපෘතිය තුළින් පැහැදිලි මුදල් ප්‍රවාහයක් හා ආපසු ගෙවීමේ හැකියාවක් ඇති බවට සහභාගිත්ව මූල්‍ය ආයතනය තෘප්තිමත් කළ හැකි විය යුතුය.

7.4 සහභාගිත්ව මූල්‍ය ආයතනය මගින් තීරණය කරනු ලබන ව්‍යාපාර සැලැස්මක්, සුරැකුම් හෝ පෞද්ගලික ඇප ආවරණයක් ලබා දීමට හැකි විය යුතුය.

**8. කාර්යයන් සහ වගකීම්:**

මෙම වැඩසටහනට සම්බන්ධ වන පාර්ශවයන්ගේ ප්‍රධාන කාර්යයන් සහ වගකීම් පහත පරිදි වේ.

| ආයතනයේ නම | කාර්යය |
|---|---|
| ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය | (අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමග සහයෝගිත්වයෙන් දිස්ත්‍රික් පදනම මත ණය ඉල්ලුම්පත් නිකුත් කිරීම හා එකතු කිරීම.<br>(ආ) ඉල්ලුම්කරුවන් සඳහා රැස්වීමක් කැඳවීම, මූලිකව ව්‍යාපෘතිය නිර්මාණය කිරීම සහ ව්‍යාපාර සැලැස්ම සකස් කිරීම පිළිබඳ ඔවුන් දැනුවත් කිරීම.<br>(ඇ) ව්‍යාපාර සැලසුම් එකතු කිරීම හා ඇගයීම.<br>(ඈ) ප්‍රදානයක් ලෙස ලබා දෙන ණය මුදල සඳහා අනුමැතිය සහ නිර්දේශය ලබා ගැනීමට කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය වෙත සෘජුවම ලැබුණු සුදුසුකම්ලත් ප්‍රතිලාභීන්ගේ අයදුම්පත් අදාළ සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත භාර දෙනු ලබන අතර, සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් භාර දෙන ලද නව අයදුම්කරුවන්ගේ ප්‍රදානයන් ලෙස ලබා දෙන ණය සඳහා ලැබුණු අයදුම්පත් අනුමත කරනු ලබයි.<br>(ඉ) ව්‍යාපෘතිවල ප්‍රගතිය සහතික කිරීම සඳහා අඛණ්ඩව ව්‍යාපෘතියේ කාර්ය සාධනය අධීක්ෂණය කිරීම.<br>(ඊ) වෙළෙඳපොල සම්බන්ධතා සඳහා පහසුකම් සැලසීම.<br>(උ) අනෙකුත් පාර්ශවකරුවන්ගේ සහාය ඇතිව දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් පැවැත්වීම.<br>(ඌ) ප්‍රදානයන් ලෙස ලබා දෙන මුදලේ දෙවන කොටස සඳහා ණයගැතියන්ගෙන් සහ සහභාගිත්ව මූල්‍ය ආයතන මගින් කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය වෙත සෘජුවම ලැබුණු අයදුම්පත්‍ර ඇගයීමට ලක් කර එම ණය මුදල මුදාහැරීමට අනුමැතිය ද සමග අදාළ සහභාගිත්ව මූල්‍ය ආයතනය වෙත අයදුම්පත්‍ර යොමු කිරීම.<br>(එ) ව්‍යාපෘතියේ සමස්ත අධීක්ෂණ කටයුතු සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ, කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ හා ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජිතයන්ගෙන් සමන්විත ව්‍යාපෘති මෙහෙයුම් කමිටුවක් පත් කිරීම හා ව්‍යාපෘතියේ ප්‍රගතිය සමාලෝචනය සඳහා අවශ්‍යතාව මත පදනම්ව රැස්වීම් කැඳවීම.<br>(ඒ) ණය නැවත අයකර ගැනීමේ ක්‍රියාවලියේදී සහභාගිත්ව මූල්‍ය ආයතනයන්ට සහාය වීම.<br>(ඔ) ප්‍රතිලාභීන් සඳහා පුළුල් දත්ත පදනමක් පවත්වාගෙන යෑම. |
| සහභාගිත්ව මූල්‍ය ආයතන | (අ) ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මත කිරීම සඳහා ප්‍රමාණවත් පරිදි සේවකයන් යොදවා ඇති බව සහතික කිරීම.<br>(ආ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සලසා දෙන ලද මාධ්‍ය නිෂ්පාදන මගින් හෝ සහභාගිත්ව මූල්‍ය ආයතනවල අරමුදල්වලින් නිර්මාණය කරන ලද මාධ්‍ය නිෂ්පාදන ණය යෝජනා ක්‍රමයේ ප්‍රචාරණ කටයුතු සඳහා භාවිතා කිරීම.<br>(ඇ) ශාඛා මට්ටමින් ණය අයදුම්පත්‍ර නිකුත් කිරීම හා එකතු කිරීම. අයදුම්කරුවන් සඳහා ලබා දිය යුතු ණය අයදුම්පත්‍රය හා ව්‍යාපාර සැලැස්ම ඇමුණුම III හා ඇමුණුම iv හි අනුපිළිවෙලින් දක්වා ඇත.<br>(ඈ) කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය මගින් සුදුසුකම් ලැබූ ප්‍රතිලාභීන්ගේ අයදුම්පත් ලබා ගැනීම.<br>(ඉ) ලියාපදිංචිය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යැවීමට පෙර ව්‍යාපාර සැලැස්මේ ශක්‍යතාව ඇගයීම., ප්‍රදානයක් ලෙස ලබා දෙන ණය මුදලට අනුමැතිය ලබා ගැනීම සඳහා නව ව්‍යවසායකයින්ගේ අයදුම්පත්‍ර කුඩා ව්‍යාපාර අංශය වෙත යොමු කිරීම.<br>(ඊ) ලියාපදිංචිය සඳහා අයදුම්පත්‍ර සකස් කිරීම:<br>i. සෑම සුදුසුකම් ලැබූ අයදුම්කරුවෙකුම (නව ව්‍යවසායකයින්) ණය හා ප්‍රදානයක් ලෙස ලබා දෙන ණය මුදල ලබා ගැනීම (ආරම්භක ප්‍රදානය හා ප්‍රදාන මුදලේ දෙවන කොටස) සඳහා ඇමුණුම v(A) සහ<br>ii. සෑම සුදුසුකම් ලැබූ අයදුම්කරුවෙකුම (පවත්නා ව්‍යාපාර හිමි අයදුම්කරුවන්) ණය සඳහා ඇමුණුම v(B) සුදුසු පරිදි සම්පූර්ණ කරන ලද කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ අනුමැතිය සහිත අයදුම්පත්‍ර අනුපිටපතක් හා ව්‍යාපාර සැලැස්මේ පිටපතක්ද සමග ලියාපදිංචිය සඳහා ප්‍රධාන කාර්යාලය හරහා පහත ලිපිනයට එවිය යුතුය.<br>අධ්‍යක්ෂ<br>ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව<br>ශ්‍රී ලංකා මහ බැංකුව<br>නො.30, ජනාධිපති මාවත<br>කොළඹ 01.<br>(ඇමුණුම v(A) හා ඇමුණුම v(B) හි එක් පිටපතක් දත්ත සංචිතය පවත්වාගෙන යෑම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය වෙත යවනු ලැබේ.) |

(උ) ණය මුදල හෝ /හා ප්‍රදානයක් ලෙස ලබා දෙන මුදලේ ලියාපදිංචිය ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් තහවුරු කළ පසු සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් සඳහා උප ණය මුදල සහ/හෝ ආරම්භක ප්‍රදානය මුදාහැරීම.

(ඌ) එක් එක් ණය අයදුම්කරුට අදාළව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් විමසීම් අංකයක් ලබා දෙන අතර, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සමග සිදු කරනු ලබන සියලු ගනුදෙනු ප්‍රතිමූල්‍ය මුදාහැරීම/උප ප්‍රදානය සඳහා මෙම විමසීම් අංකය භාවිතා කළ යුතුය.

(එ) සහභාගිත්ව මූල්‍ය ආයතනවල ප්‍රධාන කාර්යාල හරහා ණය අරමුදල් මුදාහැර දින 30 ක් ඇතුළත ණය ප්‍රතිමූල්‍යනය සඳහා අයදුම්පත්‍ර ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත භාර දිය යුතුය. ආරම්භක ප්‍රදානය ප්‍රතිමූල්‍ය අයදුම්පත්‍රයට පහත ලියවිලි ඇතුළත් විය යුතුය.

- අ. ප්‍රතිමූල්‍ය සඳහා අයදුම්පත්‍රය (a): උප ණය (ඇමුණුම vii)
- ආ. ප්‍රතිමූල්‍ය සඳහා අයදුම්පත්‍රය (b): උප ණය - ණය මුදාහැරීමේ ප්‍රකාශය (ඇමුණුම viii)
- ඇ. පොරොන්දු නෝට්ටුව (ඇමුණුම ix) (අදාළ මුද්දර ගාස්තු සමග)
- ඈ. භාරදීමේ ලිපිය (ඇමුණුම x)
- ඉ. පැවරුම් නිවේදනය (ඇමුණුම xi)
- ඊ. මුදාහැරීමේ ලිපිය (ඇමුණුම xii)

(ඒ) නව ව්‍යවසායකයින්ගේ ව්‍යාපෘති සඳහා ආරම්භක ප්‍රදානයට හිමිකම් පෑමේ අයදුම්පත, සහ ණය ප්‍රතිමූල්‍ය අයදුම්පත එකට එවිය යුතුය.

(ඔ) අනෙකුත් පාර්ශවකරුවන්ගේ අනුග්‍රහය ද සමග දැනුවත් කිරීමේ හා පුහුණු වැඩසටහන් පැවැත්වීම.

(ඕ) සහභාගිත්ව මූල්‍ය ආයතන ශාඛා මගින් මූල්‍යනය කරන ලද ව්‍යාපෘති කලින් කලට පරීක්ෂා කර ණයගැතියන් ණය ලබා ගත් ක්‍රියාකාරකම්හි නියැලී ඇතිද යන්න සොයා බැලීම.

(ක) කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ සහ ණයගැතියන්ගෙන් ප්‍රදානයක් ලෙස ලබා දෙන මුදලේ දෙවන කොටස සඳහා අයදුම්පත් ලබා ගැනීම.

(ග) ප්‍රදානයන් ලෙස ලබා දෙන මුදලේ දෙවන කොටස මුදාහැර දින 30 ඇතුළත සහභාගිත්ව මූල්‍ය ආයතනයේ ප්‍රධාන කාර්යාලය හරහා කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ අනුමැතිය සහිතව ප්‍රදානයක් ලෙස ලබා දෙන මුදලේ දෙවන කොටසට හිමිකම් කීම සඳහා ප්‍රතිපූරණ අයදුම්පත්‍රය ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවට භාරදීම. ප්‍රදාන මුදලේ දෙවන කොටස ප්‍රතිපූරණ අයදුම්පත්‍රයට පහත ලියකියවිලි ඇතුළත් කළ යුතුය.

- (a) ප්‍රදාන මුදලේ දෙවන කොටස සඳහා අයදුම්පත්‍රය (ඇමුණුම VI(B)
- (b) ආරම්භක ප්‍රදානය සඳහා අයදුම්පත්‍රය - ප්‍රදාන මුදලේ දෙවන කොටස මුදාහැරීමේ ප්‍රකාශය (ඇමුණුම VII(BB)

(ච) ව්‍යාපෘතිවල ප්‍රගතිය සහතික කිරීම සඳහා අඛණ්ඩවම කාර්ය සාධනය අධීක්ෂණය කිරීම.

(ජ) ණය අයකර ගැනීම සඳහා නිරන්තර පරීක්ෂාවන් සිදු කිරීම, සිහි ගැන්වීමේ ලිපි යැවීම ඇතුළත්ව කළ හැකි සියලුම ක්‍රියාමාර්ග ගැනීම.

(ට) වෙළෙඳපොල සම්බන්ධතා සඳහා පහසුකම් සැලසීම.

(ඩ) යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් ණය මුදල්වලට අදාළව සහභාගිත්ව මූල්‍ය ආයතනවල සෑම ශාඛාවකම යෝජනා ක්‍රමය යටතේ ලෙජරයන් වෙන වෙනම පවත්වාගෙන යාම.

(ණ) ප්‍රතිමූල්‍ය මෙහෙයුම් හා ප්‍රදාන ප්‍රතිපූරණයට අදාළව වාර්තාවන් හා වෙනමම දත්ත සංචිතයක් පවත්වාගෙන යාම.

(ත) සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත ලබා දෙන ලද ප්‍රතිමූල්‍ය ණය මුදලේ මුල් මුදල අර්ධ වාර්ෂිකව සියයට 0.5 ක වාර්ෂික පොලියක් සහිතව ශ්‍රී ලංකා මහ බැංකුවට නැවත ගෙවීම (සෑම වසරකම ජූනි 30 හා දෙසැම්බර් 31)

**ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව**

(අ) ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍ය ව්‍යාපාරය ක්‍රියාත්මක කිරීම.

(ආ) අවශ්‍ය වූ විට සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත මෙහෙයුම් උපදෙස් හා සංශෝධන ඉදිරිපත් කිරීම.

(ඇ) සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් අනුමත කරන ලද අයදුම්කරුවන්ගේ තොරතුරු ලියාපදිංචි කිරීම.

(ඈ) සෑම ලියාපදිංචි ණය අයදුම්කරුවෙකු සඳහාම විමසීම් අංකයක් ලබා දීම හා එය සහභාගිත්ව මූල්‍ය ආයතනයේ ප්‍රධාන කාර්යාලය වෙත දැනුම් දීම.

(ඉ) පළමුව පැමිණි අයදුම්පත් සඳහා ප්‍රමුඛතාවය ලබා දීමේ පදනම මත පළමුව පැමිණි ණය සඳහා ප්‍රතිමූල්‍ය ලබා දීම/ප්‍රදානයන් ලෙස ලබා දෙන ණය සඳහා ප්‍රතිපූරණය කිරීම සිදු කරන අතර, ප්‍රතිමූල්‍ය මුදාහැරීම හා ප්‍රදානයන් ප්‍රතිපූරණය සඳහා අදාළ සහභාගිත්ව මූල්‍ය ආයතනයේ ප්‍රධාන කාර්යාලය වෙත දැනුම් දීම.

(ඊ) සම්පූර්ණ කරන ලද ප්‍රතිමූල්‍ය/ප්‍රතිපූරණ අයදුම්පත් ලද දින සිට දින 30 ක් ඇතුළත ණය ප්‍රතිමූල්‍යනය/ප්‍රදානය ප්‍රතිපූරණය සිදු කරන බවට සහතික වීම.

(උ) කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය වෙත සෑම ලියාපදිංචි අයදුම්පත්‍රයේම පිටපතක් මාසිකව භාර දීම.

(ඌ)අවශ්‍ය වූ විට ණය යෝජනා ක්‍රමයේ කාර්ය සාධනය වාර්තා කිරීම හා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයට වාර්තා කිරීම.

(එ) සෑම වසරකම ජූනි 30 හා දෙසැම්බර් 31 වන විට ප්‍රතිමූල්‍ය ණය සඳහා ලබා දුන් මුල් මුදල සහ ප්‍රතිමූල්‍ය ණය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවට සියයට 0.5 වාර්ෂික පොලියක් අයකර ගැනීම.

(ඒ) ඔවුන්ගේ කාර්ය සාධනය මත සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ණය ඉලක්කයන් ලබා දීම.

(ඔ) අරමුදල හැසිරවීම හා ගිණුම් පවත්වාගෙන යාම.

(ඕ) ණය යෝජනා ක්‍රමයේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ එම මූල්‍ය ප්‍රකාශන විගණන ජෙනරාල්වරයා වෙත ලබා දීම.

(ක) විගණන ජෙනරාල්ගේ වාර්තාවේ සහතික කළ පිටපතක් ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයට ලබා දීම.

අවශ්‍ය වූ විටදී ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ඉහත නියමයන් හා කොන්දේසි වෙනස් කිරීමට හෝ සංශෝධනය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ.

ණය යෝජනා ක්‍රමය 08.02.2017 සිට ක්‍රියාත්මක වේ.

**මෙයට - විශ්වාසී,**
**ඩී.වී.එස්. දයාවංශ මිය**
**අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව**
**දිනය : 09.02.2017**

ඇමුණුම I

**"ස්වශක්ති - රැකියා දශලක්ෂයක් කරා"**

**ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සංවර්ධනය හා රැකියා උත්පාදනය කිරීමේ ණය යෝජනා ක්‍රමය**

පහත අංශවලට අයත් ව්‍යාපෘති සඳහා වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

| කේතය | කෘෂිකාර්මික අංශය | කේතය | කර්මාන්ත අංශය | කේතය | සේවා අංශය |
|---|---|---|---|---|---|
| 101 | පළතුරු හා එළවළු වගා කිරීම හා ආහාර පිරිසැකසුම | 201 | පැස්සුම් කර්මාන්තය | 301 | කෘෂි නිෂ්පාදන එකතු කිරීමේ මධ්‍යස්ථානය |
| 102 | බිම් සැකසීම, ජල සම්පාදනය, පැල හා තවාන් සංවර්ධනය | 202 | නිමි ඇඳුම් හා රෙදිපිළි | 302 | සංචාරක, ආපනශාලා හා විනෝදාත්මක සේවා කටයුතු |
| 103 | කාබනික වගාව හා පොහොර | 203 | කොන්ක්‍රීට් වැඩ හා ගල් ඇතිරීම | 303 | ගෙවතු වගා හා උද්‍යාන අලංකරණ |
| 104 | සත්ව පාලනය හා ආශ්‍රිත නිෂ්පාදන | 204 | හම් හා පාවහන් | 304 | රූපලාවන්‍ය, පෙර පාසල් හා ළමා සුරැකුම් මධ්‍යස්ථාන |
| 105 | ධීවර කර්මාන්තය හා විසිතුරු මසුන් | 205 | පෙදරේරු, පින්තාරු හා වඩු වැඩ | 305 | තොරතුරු තාක්ෂණ, යතුරුලියන, මුද්‍රණ, අන්තර්ජාල කටයුතු හා පරිගණක සහ ජංගම දුරකථන අලුත්වැඩියාව |
| 106 | පෙර හා පසු අස්වනු තාක්ෂණය | 206 | ප්ලාස්ටික් හා රබර් සැකසීම | 306 | ශීතකරණ හා වායුසමීකරණ සේවා |
| 107 | වෙනත් | 207 | ස්වර්ණාභරණ, මැණික් කැපීම හා ඔප දැමීම | 307 | මෝටර් වාහන අලුත්වැඩියාව |
| | | 208 | ලෝහ පිරි සැකසුම් | 308 | පරිගණක වැඩසටහන් නිර්මාණය |
| | | 209 | විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික් කර්මාන්තය | 309 | විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික අලුත්වැඩියාව |
| | | 210 | සූර්ය බලශක්තිය | 310 | සිල්ලර වෙළෙඳාම |
| | | 211 | ආහාර හා බීම | 311 | වෙනත් |
| | | 212 | ගෘහ කර්මාන්ත හා අත්කම් | | |
| | | 213 | වෙනත් | | |

107 පළතුරු විකිණීම, පොල්තෙල් නිෂ්පාදනය

213 පොල් ලෙලි ආශ්‍රිත නිෂ්පාදන, කොහු සැකසුම්, ඇඹරුම් හල්/සහල් මෝල්/කුළු බඩු ඇසුරුම් කිරීම සහ බෙදා හැරීම, ඡායාරූපකරණය, රන් සහ රිදී නිස්සාරණය, කුෂන් ආශ්‍රිත නිෂ්පාදන, ගඩොල් නිෂ්පාදනය, හඳුන්කූරු නිෂ්පාදනය, ලුණු බෙදාහැරීම, බෑග් නිෂ්පාදනය, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය, මල්පෝච්චි නිෂ්පාදනය, නවාතැන් පහසුකම් සැපයීම, ජලය පිරිපහදු කිරීම, සෙල්ලම් බඩු නිෂ්පාදනය, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය,

311 සේවා ස්ථාන, උත්සව භාණ්ඩ කුලියට දීම, වැඩිහිටි නිවාස, පොත්හල්, නවාතැන් පහසුකම් සැපයීම, කායවර්ධන මධ්‍යස්ථාන, යන්ත්‍රෝපකරණ කුලියට දීම, ලොන්ඩ්‍රි සේවා

ඇමුණුම II

**මෙහෙයුම් උපදෙස් අංක : RDD/SWASHAKTHI/2017/01**

## "ස්වශක්ති - රැකියා දශලක්ෂයක් කරා"

### ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සංවර්ධනය හා රැකියා උත්පාදනය කිරීමේ ණය යෝජනා ක්‍රමය

### මෙහෙයුම් ක්‍රියාවලිය සහ එක් එක් පාර්ශවයන් සඳහා වන වගකීම්




**මෙහෙයුම් උපදෙස් අංක : RDD/SWASHAKTHI/2017/01** ඇමුණුම V (A)

**ලියාපදිංචි අංකය:** ..........................................

## "ස්වශක්ති - රැකියා දශලක්ෂයක් කරා"

### ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සංවර්ධනය හා රැකියා උත්පාදනය කිරීමේ ණය යෝජනා ක්‍රමය

### උපණය හා ප්‍රදානය සඳහා ලියාපදිංචි කිරීමේ අයදුම්පත්‍රය - නව ව්‍යවසායකත්වයින්ගේ ව්‍යාපෘති සඳහා

1 සහභාගිත්ව මූල්‍ය ආයතනයේ නම හා ශාඛාව ..........................................

2 ශාඛාවේ ලිපිනය ..........................................

3 දුරකථන/ෆැක්ස් අංක ..........................................

4 අයදුම්පත්‍රය බැංකු ශාඛාවෙන්/කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයෙන් ලැබුණු දිනය ..........................................

5. අයදුම්කරුගේ තත්ත්වය තනි ව්‍යාපාර හවුල් ව්‍යාපාර

6. අයදුම්කරුගේ නම හා ලිපිනය/හවුල්කරුගේ

| නම | ලිපිනය | ජා.හැ.අංකය | ස්ත්‍රී/පුරුෂ භාවය | ඉහළම අධ්‍යාපන සුදුසුකම |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |

7. ව්‍යාපෘතිය පිහිටි ස්ථානයේ ලිපිනය හා විස්තර

..........................................

..........................................

8. දිස්ත්‍රික්කය .......................... 9. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය .......................... 10. ඡන්ද කොට්ඨාශය ..........................

11. ස්වශක්ති ණය යෝජනා ක්‍රමය යටතේ අරමුදල් ලබා ගන්නා ව්‍යාපෘතිය පිළිබඳ කෙටි විස්තරය (කරුණාකර ව්‍යාපෘති සැලැස්මේ පිටපතක් අමුණන්න) ක්ෂේතය (ඇමුණුම Iහි දක්වා ඇති පරිදි)

..........................................

..........................................

12 ව්‍යාපෘතියට තක්සේරු කරන ලද වියදම

13 ණය ගැනුම්කරුගේ කොටස් දායකත්වය

14. තවදුරටත් අවශ්‍ය වන මුදල

15. අනුමත කරන මුදල පාර සංර්ධන අංශය හා සහභාගීත්ව මූල්‍යකුඩා ව්‍යා/ ආයතන මගින් ණය සඳහා අනුමත කරන ලද මුදල කුඩා / ආනය සඳහා යතනය මගින් ප්‍රපාර සංවර්ධන අංශය හා සහභාගිත්ව මූල්‍යාව්‍යා අනුමත කරන ලද

i. ආරම්භක ප්‍රදානය

ii. ප්‍රදාන මුදලේ දෙවන කොටස

ඉහත 10 හි විස්තර කරන ලද ව්‍යාපෘතිය මා/ණය නිලධාරී පරීක්ෂා කර ප්‍රමාණවත් මුදල් ගැලීම් ඇතිව ස්වශක්ති ණය යෝජනා ක්‍රමය සඳහා අනුමත කරන ලද බවට සහතික කරමි.

තවද, මෙම ප්‍රතිලාභියා ස්වශක්ති ණයයෝජනා ක්‍රමය යටතේ ප්‍රදාන මුදල සඳහා යෝග්‍ය බවට සහතික කරමි. කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ අනුමැතිය අමුණා ඇත.

ශාඛා කළමනාකරුගේ අත්සන
නිල මුද්‍රාව

කළමනාකරුගේ අත්සන
සහභාගිත්ව මූල්‍ය ආයතනයේ ප්‍රධාන ශාඛාවේ
........................................ දෙපාර්තමේන්තුවේ
නිල මුද්‍රාව

දිනය: ........................................

දිනය: ........................................

ඇමුණුම V (B)

**ලියාපදිංචි අංකය:** ........................................

**(මෙහෙයුම් උපදෙස් අංක: RDD/ SWASHAKTHI /2017/01 යටතේ)**

## "ස්වශක්ති - රැකියා දශලක්ෂයක් කරා"

### ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සංවර්ධනය හා රැකියා උත්පාදනය කිරීමේ ණය යෝජනා ක්‍රමය උපණය සඳහා ලියාපදිංචි කිරීමේ අයදුම්පත්‍රය - පවත්නා ව්‍යාපාරිකයින්ගේ ව්‍යාපෘති සඳහා

1 සහභාගිත්ව මූල්‍ය ආයතනයේ නම හා ශාඛාව ........................................

2 ශාඛාවේ ලිපිනය ........................................

3 දුරකථන/ෆැක්ස් අංක ........................................

4 අයදුම්පත්‍රය බැංකු ශාඛාවෙන්/කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයෙන් ලැබුණු දිනය ........................................

5. අයදුම්කරුගේ තත්ත්වය තනි ව්‍යාපාර හවුල් ව්‍යාපාර

6. අයදුම්කරුගේ නම හා ලිපිනය/හවුල්කරුගේ

| නම | ලිපිනය | ජා.හැ.අංකය | ස්ත්‍රී/පුරුෂ භාවය | ඉහළම අධ්‍යාපන සුදුසුකම |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |

7. ව්‍යාපෘතිය පිහිටි ස්ථානයේ ලිපිනය හා විස්තර

........................................

........................................

8. දිස්ත්‍රික්කය ........................................ 9. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ........................................ 10. ඡන්ද කොට්ඨාශය ........................................

11. ස්වශක්ති ණය යෝජනා ක්‍රමය යටතේ අරමුදල් ලබා ගන්නා ව්‍යාපෘතිය පිළිබඳ කෙටි විස්තරය (කරුණාකර ව්‍යාපෘති සැලැස්මේ පිටපතක් අමුණන්න) ක්ෂේත්‍රය (ඇමුණුම Iහි දක්වා ඇති පරිදි)

........................................

........................................

12 ව්‍යාපෘතියට තක්සේරු කරන ලද වියදම

13 ණය ගැනුම්කරුගේ කොටස් දායකත්වය

14. තවදුරටත් අවශ්‍ය වන මුදල

15. අනුමත කරන මුදල ආයතන සහභාගිත්ව මූල්‍ය පාර සංවර්ධන අංශය හා කුඩා ව්‍යාපාර මගින් ණය සඳහා අනුමත කරන ලද මුදල දානය සඳහා අනුමත යතනය මගින් ප්‍රසංවර්ධන අංශය හා සහභාගිත්ව මූල්‍යා කරන ලද
 i. ආරම්භක ප්‍රදානය
 ii. ප්‍රදාන මුදලේ දෙවන කොටස

ඉහත 10 හි විස්තර කරන ලද ව්‍යාපෘතිය මා/ණය නිලධාරී පරීක්ෂා කර ප්‍රමාණවත් මුදල් ගැලීම් ඇතිව ස්වශක්ති ණය යෝජනා ක්‍රමය සඳහා අනුමත කරන ලද බවට සහතික කරමි.

තවද, මෙම ප්‍රතිලාභියා ස්වශක්ති ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා ගැනීම සඳහා යෝග්‍ය බවට සහතික කරමි.

ශාඛා කළමනාකරුගේ අත්සන
නිල මුද්‍රාව
දිනය: ........................................

කළමනාකරුගේ අත්සන
සහභාගිත්ව මූල්‍ය ආයතනයේ ප්‍රධාන ශාඛාවේ
........................................ දෙපාර්තමේන්තුවේ
නිල මුද්‍රාව
දිනය: ........................................

ඇමුණුම : VI(A)

**ප්‍රතිමූල්‍ය ඉල්ලුම් පත්‍රය : ආරම්භක ප්‍රදානය**

**ආරම්භක ප්‍රදාන අයදුම්පත් අංකය :** ..........................................

**(මෙහෙයුම් උපදෙස් අංක: RDD/SWASHAKTHI/2017/01)**

ලිපිනය : ..........................................

දිනය : ..........................................

## "ස්වශක්ති - රැකියා දශ ලක්ෂයක් කරා"

### ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සංවර්ධනය හා රැකියා උත්පාදනය කිරීමේ ණය යෝජනා ක්‍රමය

වෙත : ශ්‍රී ලංකා මහ බැංකුව

මහත්මයාණෙනි,

අප ..........................................

(මූල්‍ය ආයතනයේ නම හා ලිපිනය)

බලපත්‍රලාභී වාණිජ බැංකුවක්/බලපත්‍රලාභී විශේෂ බැංකුවක් සත්‍ය බවට සහතික කරන ලද සංයුතියේ/ව්‍යවස්ථාවලියේ පිටපතක් සමග මේ සමග ඔබ වෙත එවා ඇති අතර, ඉහත/උක්ත ප්‍රදානය (රු...........................................) ක ආරම්භක ප්‍රදාන මුදල සඳහා අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමු.

2. මෙම ඉල්ලුම් පත්‍රයට අනුව, 2017.......................................... දින ශ්‍රී ලංකා මහ බැංකුව සමග ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සංවර්ධනය කිරීමේ ණය යෝජනා ක්‍රමය වන ස්වශක්ති ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් අංක RDD/SWASHAKTHI/2017/01 හි සඳහන් නියමයන්ට සහ අවශ්‍යතාවයන්ට අනුකූල වන බවට අපි එකඟ වෙමු.
3. ඉහත සඳහන් කරන ලද මෙහෙයුම් උපදෙස් හා ඒ සමග ඇති අනුකූලතාවයේ ඉල්ලුම් කර ඇති පරිදි, මේ සමග ඉහත ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ අප විසින් ප්‍රදානය කරන ලද ආරම්භක ප්‍රදාන මුදලට අදාළ නිවේදනය/ප්‍රකාශය එවනු ලබන අතර, මෙම ප්‍රදාන මුදල මීට පෙර එවන ලද ප්‍රකාශනයන්හි සඳහන් කර නොමැති බවට ද අපි සහතික වෙමු.
4. 3 වන ඡේදයේ සඳහන් කරන ලද ඉහත ණය යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම්ලත් ව්‍යාපෘතිය සඳහා සුදුසුකම්ලත් ණය ගැනුම්කරු පිළිබඳව
   (i) ආරම්භක ප්‍රදාන මුදල ප්‍රදානය කරනු ලැබ ඇත්තේ නව ව්‍යවසායකයින් සඳහා වන බව
   (ii) ආරම්භක ප්‍රදානය ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ නිශ්චිත අගයන්ට අදාළ බව අප විසින් තෘප්තිමත්භාවයට පත් වූ බවට සහතික වේ.
5. ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ අනුමැතිය අමුණා ඇත.

අත්සන,

**බලයලත් නිලධාරියාගේ නම හා අත්සන**

**කළමනාකරු, ප්‍රතිමූල්‍ය ඒකකය**

ඇමුණුම : **VI**(AA)

**ප්‍රතිපූරණ ඉල්ලුම්පත්‍රය : ආරම්භක (පළමු) ප්‍රදානය**

ආරම්භක

(මෙහෙයුම් උපදෙස් අංක : RDD/SWASHAKTHI/2017/01 ට අනුව)

**ස්වශක්ති - රැකියා දශ ලක්ෂයක් කරා"**

ක්ෂුද්‍ර, කුඩා ............................................................

**ආරම්භක (පළමු) ණය මුදා හැරීමේ ප්‍රකාශනය**

වෙත : ශ්‍රී ලංකා මහ බැංකුව

විසින් : ප්‍රතිමූල්‍ය ඒකකය

මූල්‍ය ආයතන ............................................................ ශාඛාව............................................................ දිස්ත්‍රික්කය ............................................................

| ලියාපදිංචි කරන ලද තොරතුරු | | | | | | පළමු ප්‍රදානයේ තොරතුරු | | | | | ණය තොරතුරු | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| විමසීම් අංකය | ණයකරුගේ නම හා ලිපිනය | ජා.හැ.අංකය | ණය මුදල | ප්‍රදානිත ණය (රු.) | | ආරම්භක ප්‍රදානයේ අරමුණ * | ගෙවන ලද ආරම්භක ප්‍රදානය (රු.) | ණය මුදල මුදාහල දිනය | අපේක්ෂිත ප්‍රතිපූරණ වටිනාකම | ණය මුදලේ අරමුණ | ණය මුදල මුදාහල දිනය | මුදාහල වටිනාකම | ප්‍රතිමූල්‍ය වන්දි ලබා ගත් දිනය | ප්‍රතිමූල්‍ය මුදාහල දිනය |
| | | | | ආරම්භක ප්‍රදානය | ප්‍රදානයේ දෙවන කොටස | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |

දිනය : ............................................................ බලයලත් නිලධාරියාගේ අත්සන : ............................................................

ඇමුණුම : VI(B)

**ප්‍රතිමූල්‍ය ඉල්ලුම් පත්‍රය : ප්‍රදාන මුදලේ දෙවන කොටස**

**ප්‍රදාන මුදලේ දෙවන කොටස අයදුම්පත් අංකය :** ............................................

**(මෙහෙයුම් උපදෙස් අංකः** RDD/SWASHAKTHI/2017/01)

ලිපිනය : ............................................

දිනය :............................................

**"ස්වශක්ති - රැකියා දශ ලක්ෂයක් කරා"**

**ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සංවර්ධනය හා රැකියා උත්පාදනය කිරීමේ ණය යෝජනා ක්‍රමය**

වෙත : ශ්‍රී ලංකා මහ බැංකුව

මහත්මයාණෙනි,

අප.................................................................................................................................................................... (මූල්‍ය ආයතනයේ නම හා ලිපිනය) බලපත්‍රලාභී වාණිජ බැංකුවක්/බලපත්‍රලාභී විශේෂ බැංකුවක් සත්‍ය බවට සහතික කරන ලද සංයුතියේ/ව්‍යවස්ථාවලියේ පිටපතක් සමග මේ සමග ඔබ වෙත එවා ඇති අතර, ඉහත/උක්ත ප්‍රදානය (රු. ............................................) ප්‍රදාන මුදලේ දෙවන කොටස සඳහා අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමු.

2. මෙම ඉල්ලුම් පත්‍රයට අනුව, 2017 ............................................ දින ශ්‍රී ලංකා මහ බැංකුව සමග ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සංවර්ධනය කිරීමේ ණය යෝජනා ක්‍රමය වන ස්වශක්ති ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් අංක RDD/SWASHAKTHI/2017/01 හි සඳහන් නියමයන්ට සහ අවශ්‍යතාවයන්ට අනුකූල වන බවට අපි එකඟ වෙමු.

3. ඉහත සඳහන් කරන ලද මෙහෙයුම් උපදෙස් හා ඒ සමග ඇති අනුකූලතාවයේ ඉල්ලුම් කර ඇති පරිදි, මේ සමග ඉහත ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ අප විසින් ප්‍රදානය කරන ලද ප්‍රදාන මුදලේ දෙවන කොටසට අදාළ නිවේදනය/ප්‍රකාශය එවනු ලබන අතර, මෙම ප්‍රදාන මුදල මීට පෙර එවන ලද ප්‍රකාශනයන්හි සඳහන් කර නොමැති බවට ද අපි සහතික වෙමු.

4. 3 වන ඡේදයේ සඳහන් කරන ලද ඉහත ණය යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම්ලත් ව්‍යාපෘතිය සඳහා සුදුසුකම්ලත් ණය ගැනුම්කරු පිළිබඳව

(i) ප්‍රදාන මුදලේ දෙවන කොටස ප්‍රදානය කරනු ලැබ ඇත්තේ නව ව්‍යවසායකයින් සඳහා වන බව

(ii) ප්‍රදාන මුදලේ දෙවන කොටස ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ නිශ්චිත අගයන්ට අදාළ බව අප විසින් තෘප්තිමත්භාවයට පත් වූ බවට සහතික වේ.

5. ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ අනුමැතිය අමුණා ඇත.

අත්සන,

බලයලත් නිලධාරියාගේ නම හා අත්සන

කළමනාකරු, ප්‍රතිමූල්‍ය ඒකකය

ඇමුණුම VI (B B)

**ප්‍රදානය කරන ලද දෙවන කොටස ප්‍රතිපූරණය කිරීමේ ඉල්ලුම් පත්‍රය**

**දෙවන කොටස ප්‍රතිපූරණය කිරීමේ ඉල්ලුම්පත් අංකය :** ............................................

**(මූල්‍ය උපදෙස්හි අංක** ........................................ **පරිදි)**

**ස්වශක්ති ............................................................................**

**අනුමත ණය මුදලේ දෙවන කොටස මුදා හැරීමේ ප්‍රකාශනය**

වෙත : ශ්‍රී ලංකා මහ බැංකුව

විසින් : ප්‍රතිමූල්‍ය ඒකකය

මූල්‍ය ආයතනය : ............................................................................ ශාඛාව : ........................................ දිස්ත්‍රික්කය : ........................................

| ලියාපදිංචි විස්තරය | | | | | | | අනුමත කරන ලද දෙවන කොටස | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| විමසීම් අංකය | ණයකරුගේ නම හා ලිපිනය | ජා.හැ.අංකය | ප්‍රදානය කරන ලද මුදල (රු.) | | මුදාහල දිනය | ශ්‍රී.ලං.ම.බැ. විසින් ප්‍රතිපූරණය කරන මුදල (රු.) | ණය මුදලේ දෙවන කොටසේ අරමුණ | ණය මුදලේ දෙවන කොටසේ ගෙවන ලද වටිනාකම (රු.) | මුදාහල දිනය | බලාපොරොත්තු වන ප්‍රතිපූරණ වටිනාකම |
| | | | ආරම්භක ප්‍රදානය | ප්‍රදානය කරන ලද දෙවන කොටස | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |
| | | | | | | | | | | |

............................................................................

බලයලත් නිලධාරියාගේ අත්සන

දිනය : ........................................

ඇමුණුම : VII

**ප්‍රතිමූල්‍ය ඉල්ලුම් පත්‍රය : අනු ණය**

**ප්‍රතිමූල්‍ය අයදුම්පත් අංකය :** .......................................

**(මෙහෙයුම් උපදෙස්:** RDD/

ලිපිනය : ..............................................................................................

දිනය : .......................................

**"ස්වශක්ති - රැකියා දශ ලක්ෂයක් කරා"**

වෙත : ශ්‍රී ලංකා මහ බැංකුව

මහත්මයාණෙනි,

අප ........................................................................................................................................................................ (මූල්‍ය ආයතනයේ නම හා ලිපිනය) බලපත්‍රලාභී වාණිජ බැංකුවක්/බලපත්‍රලාභී විශේෂ බැංකුවක් සත්‍ය බවට සහතික කරන ලද සංයුතියේ/ව්‍යවස්ථාවලියේ පිටපතක් සමග මේ සමග ඔබ වෙත එවා ඇති අතර, ඉහත/උක්ත ප්‍රතිමූල්‍ය ණය (රු. .......................................) ක ණය මුදල සඳහා අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමු.

2. මෙම ඉල්ලුම් පත්‍රයට අනුව, 2017 .......................................දින ශ්‍රී ලංකා මහ බැංකුව සමග ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සංවර්ධනය කිරීමේ ණය යෝජනා ක්‍රමය වන ස්වශක්ති ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් අංක RDD/SWASHAKTHI/2017/01 හි සඳහන් නියමයන්ට සහ අවශ්‍යතාවයන්ට අනුකූල වන බවට අපි එකඟ වෙමු.

3. ඉහත සඳහන් කරන ලද මෙහෙයුම් උපදෙස් හා ඒ සමග ඇති අනුකූලතාවයේ ඉල්ලුම් කර ඇති පරිදි, මේ සමග ඉහත ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ අප විසින් ප්‍රදානය කරන ලද ණය මුදලට අදාළ නිවේදනය/ප්‍රකාශය එවනු ලබන අතර, මෙම ණය මුදල මීට පෙර එවන ලද ප්‍රකාශනයන්හි සඳහන් කර නොමැති බවට ද අපි සහතික වෙමු.

3. 3 වන ඡේදයේ සඳහන් කරන ලද ඉහත ණය යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම්ලත් ව්‍යාපෘතිය සඳහා සුදුසුකම්ලත් ණය ගැනුම්කරු පිළිබඳව අප විසින් තෘප්තිමත් භාවයට පත් වූ බවට සහතික වන අතර, එම ණය මුදල් අදාළ ණයකරුවාගේ ණය ගැනීමේ බලය (II) එම ණය නැවත ගෙවීම සඳහා ලබා ගන්නා ලද සුරැකුම්පත් හා ඇපකරුවන් මත රඳා පවතී.

**අත්සන,**

**බලයලත් නිලධාරියාගේ නම හා අත්සන**

**කළමනාකරු, ප්‍රතිමූල්‍ය ඒකකය**

ඇමුණුම : VIII

**ප්‍රතිමූල්‍ය ඉල්ලුම් පත්‍රය : අනු ණය**

**ප්‍රතිමූල්‍ය අයදුම්පත් අංකය :** .......................................

**(මෙහෙයුම් උපදෙස්:** RDD/....................................... **අනුකූලව)**

**ණය මුදා හැරීමේ ප්‍රකාශනය**

**ස්වශක්ති ....................................**

වෙත : ශ්‍රී ලංකා මහ බැංකුව

විසින් : ප්‍රතිමූල්‍ය ඒකකය .......................................

මූල්‍ය ආයතනය : ........................................................................................... ශාඛාව : ....................................... දිස්ත්‍රික්කය : .......................................

| විමසීම් අංකය | ණයකරුගේ නම හා ලිපිනය | ජා.හැ.අංකය | *ණය මුදලේ අරමුණ | ණය මුදල | මුදාහල දිනය | මුදාහල වටිනාකම සඳහා ප්‍රතිමූල්‍ය | | සහන කාලය | නැවත ගෙවීමේ ප්‍රකාශනය/ලේඛනය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | වාරික ගණන. | වටිනාකම රු | | වාරික | | පළමු වාරිකයේ නියමිත දිනය | අවසන් වාරිකයේ නියමිත දිනය |
| | | | | | | | | | අංකය | වටිනාකම | | |
| | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | |
| එකතුව | | | | | | | | | | | | |

අපි, ඉහත නැවත ගෙවීමේ ලේඛනයේ සඳහන් කර ඇති ශ්‍රී ලංකා මහ බැංකුව සමග ඇති කර ගෙන ඇති එකඟතාවයට අනුව, අර්ධ වාර්ෂික වාරික වශයෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ගෙවීමට මෙයින් පොරොන්දු වෙමු.

...............................................................................................

**බලයලත් නිලධාරියාගේ අත්සන**

දිනය : .......................................

*මූල්‍ය උපදෙස්හි ඇමුණුම I හඳුනා ගැනීමේ බෙතය

ඇමුණුම : IX

**පොරොන්දු නෝට්ටුව**
**ප්‍රතිමූල්‍ය ඉල්ලුම්පත් අංක :**
**(මෙහෙයුම් උපදෙස් හි අංක RDD/SWA**

**පොරොන්දු නෝට්ටුව**
**"ස්වශක්ති - රැකියා දශ ලක්ෂයක් කරා"**

ක්ෂුද්‍ර, කුඩා හා ..............................................................
පහත අත්සන් කර ඇති ...................................................................................................................................................................... (මූල්‍ය ආයතනයේ නම හා ලිපිනය) යන අපි විසින් මුල් වටිනාකම රු. ............................................................ (රු. ............................................................) ඊට අදාළ .............................% වූ වාර්ෂික පොලියක් ද සමග පියවීමට මෙයින් පොරොන්දු වෙමු.

වෙනුවට (සහභාගිත්ව මූල්‍ය ආයතනයේ නම)

**(රබර් මුද්‍රාව)** **ප්‍රතිමූල්‍ය ඒකකය**
**ප්‍රධාන කාර්යාලය**

සාක්ෂි :
1. ............................................................ 1. ............................................................
2. ............................................................ 2. ............................................................
බලයලත් නිලධාරීන්ගේ අත්සන

ඇමුණුම : X

**භාරදීමේ ලිපිය**
**ප්‍රතිමූල්‍ය අයදුම්පත් අංක :** ............................................

**භාරදීමේ ලිපිය**
**"ස්වශක්ති ......................................................................**

ශ්‍රී ලංකා මහ බැංකුව වෙත,
ඔබ විසින් එකඟ වූ පරිදි, ස්වශක්ති ණය යෝජනා ක්‍රමයට අදාළ මෙහෙයුම් උපදෙස් අංක RDD/SWASHAKTHI/2017/01 ට අනුකූලව රු. ...................................................................................................................... (රු. ......................................) ක් වූ ණය මුදලට අදාළව ප්‍රදානය කරනු ලබන ප්‍රතිමූල්‍ය වටිනාකම සඳහා වූ රු. ........................................................................................................................... (රු. ........................................) පොරොන්දු නෝට්ටුව ඔබගේ දැනගැනීම පිණිස මේ සමග එවමු.
ඉහත කී පොරොන්දු නෝට්ටුව මුදල් ගෙවීමට හා තහවුරු කිරීම සඳහා අවශ්‍ය නොවන්නේ නම් එය අගරු කරන ලෙස/ නොසලකා හරින ලෙස ඉල්ලා සිටිමි.

වෙනුවට (සහභාගිත්ව මූල්‍ය ආයතනයේ නම)
**ප්‍රතිමූල්‍ය ඒකකය**
**ප්‍රධාන කාර්යාලය**

සාක්ෂි :
1. ............................................................
2. ............................................................ බලයලත් නිලධාරීන්ගේ අත්සන

ඇමුණුම : XI

**පැවරුම් නිවේදනය**
**ප්‍රතිමූල්‍ය අයදුම්පත් අංකය :** ......................................
**(මෙහෙයුම් උපදෙස් අංක : RDD/SWASHAKTHI/2017/01 ට අනුව)**

**මුදල් නීති පනතේ 88 වන වගන්ති ප්‍රකාරව/යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත**
**පොරොන්දු මාර්ගයෙන් පැවරීමේ ආකෘතිය**

.............................................................................................................. (මූල්‍ය ආයතනයේ නම හා ලිපිනය යන අය විසින්, මුදල් නීති පනතේ 88 වන වගන්ති 88A ප්‍රකාරව අප වෙත අදාළ ණය හිමිකමට අදාළ ආකෘතියෙහි සඳහන් විස්තර ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පොරොන්දු මාර්ගයෙන් ලබාදෙනු ලබන අතර, මීට අදාළ වන තෙවන සුරැකුම් රු ........................................................................................................... (රු. ......................................) ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඊට අදාළ ....................% පොලිය ද සමග ගෙවමි.

ආකෘතිය

| ණය මුදල රු | ණයකරුගේ නම හා ලිපිනය | දිනය | නොතාරිස් |
|---|---|---|---|
| | | | |

.......................................................................
බලයලත් නිලධාරියාගේ අත්සන
වෙනුවට (සහභාගිත්ව මූල්‍ය ආයතනයේ නම)
ප්‍රතිමූල්‍ය ඒකකය
ප්‍රධාන කාර්යාලය

*මූල්‍ය උපදෙස්හි ඇමුණුම I හඳුනා ගැනීමේ බේතය

ඇමුණුම XII

**මුදාහැරීමේ ලිපිය**

**(මූල්‍ය උපදෙස් අංක** ...................................... **ට)**

බැංකුවේ නම : ......................................................

බැංකු බේත අංකය : ......................................................

ශාඛාවේ නම : ......................................................

ශාඛාවේ බේත අංකය : ......................................................

ණය මුදලේ අනුක්‍රමික අංකය : ......................................................

දිනය : ......................................................

මුදාහැරීම : ......................................................

**ස්වශක්ති ..............................**

**ණය මුදාහැරීමේ ප්‍රකාශනය**

**විමසීම් අංකය**

1. ණයකරුගේ තොරතුරු
   - 1.1 ණයකරුගේ නම : ......................................................
   - 1.2 ණයකරුගේ ලිපිනය : ......................................................
2. ණය මුදලේ තොරතුරු
   - 2.1 ණය මුදලේ අරමුණ : ......................................................
   - 2.2 ව්‍යාපෘතිය පිහිටි ප්‍රදේශය: ......................................................
   - 2.3 අනුමත කරන ලද මුළු ණය මුදල : ආරම්භයේදී රු. ...................................... මුළු රු. ......................................
   - 2.4 ණය මුදල අනුමත කළ දිනය : ......................................................

     ණය මුදල වැඩිවීම අනුමත වූ දිනය : ......................................................
   - 2.5 ප්‍රතිමූල්‍ය ඉල්ලුම් කරන ලද ණය මුදල නැවත ගෙවන ආකාරය :

     දිනය : ...................................................... වටිනාකම : (රු.) ......................................................
   - 2.6 පොලී ප්‍රතිශතය : ..............................................

**මෙහෙයුම් උපදෙස් අංකඃ RDD/SEPI/2016/01 (සංශෝධනය)**

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ.පෙ. 590, අංක 30
ජනාධිපති මාවත
කොළඹ 01
2017.03.01

සියළුම සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත,

මහත්මයාණෙනි/මහත්මියනි,

## ස්වයං රැකියා ප්‍රවර්ධන ණය යෝජනා ක්‍රමය අදියර II හි මෙහෙයුම් උපදෙස් සංශෝධනය

2016 අප්‍රේල් 27 වැනි දිනැති මෙහෙයුම් උපදෙස් අංක RDD/SEPI/2016/01 හි 01 කොටස, 02 කොටස සහ 03 කොටස් පහත පරිදි සංශෝධනය කර ඇති බව ඔබට කෙරෙන දැනුම් දීමයි

- රුපියල් මිලියන 390 ක් දක්වා ණය මුදල ඉහළ දැමීම:

  හඳුන්වාදීම යටතේ ඇති 1 වන කොටසෙහි : 1 වන ඡෙදය, දෙවෙනි වගන්තිය රුපියල් මිලියන හැත්තෑපහ (රු.75,000,000) යන වචන ඉවත් වී රුපියල් මිලියන තුන්සිය අනූව (රු.390,000) ආදේශ වේ.
- ණය ලබාදීම සඳහා සුදුසුකම්ලත් ණයගැතියන් වෙනස් කිරීම

  සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් ණය ලබාදීම සඳහා සුදුසුකම්ලත් ණයගැතියන් යටතේ 06 වන කොටසෙහිඃ 01ඡේදයෙහි පළමුවෙනි වගන්තියඃ

"ඕනෑම වෘත්තීය පුහුණු පාඨමාලාවක් හෝ" යන වචන ඉවත්වී වාක්‍ය පහත පරිදි,

"සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් ණය ලබාදීම සඳහා සුදුසුකම්ලත් ණයගැතියන්, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වී ඇති පිළිගත් වෘත්තීය පුහුණු ආයතනයකින් ජාතික වෘත්තීය සුදුසුකම වැඩසටහන හා ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධන වැඩසටහනක් සම්පූර්ණ කර තිබිය යුතුය" ලෙස වෙනස් විය යුතුය.

සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ආපසු ගෙවීමේ කාලයඃ

ණය කොන්දේසි යටතේ ඇති 10 කොටසඃ සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ආපසු ගෙවීමේ කාලයඃ

"උපරිම වසර හතර (4)" යන වචන ඉවත්වී, "උපරිම වසර පහ (5) ලෙස ආදේශ වේ.

ඉහත ණය යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් උපදෙස්හි අනෙකුත් සියලුම නියමයන් හා කොන්දේසි නොවෙනස්ව පවතී.

මෙම සංශෝධනයෙහි අන්තර්ගතය අදාළ නිලධාරිගේ අවධානයට යොමු කරන්න.

මෙයට - විශ්වාසී

**ඩී.වී.එස්. දයාවංශ මහත්මිය**

**අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන**

**මෙහෙයුම් උපදෙස් අංකඃ RDD/PCG/2017** 2017 අප්‍රේල් 26

## කෘෂිකාර්මික අංශය නවීකරණ ව්‍යාපෘතිය

**1. පසුබිම**

ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව, කෘෂිකාර්මික අංශය නවීකරණ ව්‍යාපෘතිය යටතේ ආංශික ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට 2016.05.20 දින පැවති මුදල් මණ්ඩල රැස්වීමේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී.

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශය නවීකරණ කිරීම අරමුණු කර ගනිමින් ජාත්‍යන්තර සංවර්ධන සංගමය (IDA) මගින් අරමුදල් සැපයීමේ ව්‍යාපෘතිය යටතේ නව්‍යකරණ අවදානම් බෙදා හැරීමේ මෙවලමක් ලෙස ආංශික ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය හඳුන්වා දී ඇත. මෙම ව්‍යාපෘතියේ සංවර්ධන අරමුණ වනුයේ, ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශවල පවතින කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ කෘෂිකාර්මික ඵලදායිතාව, කාර්යක්ෂමතාව, වෙළෙඳපොල ප්‍රවේශය වැඩි කිරීම සහ විධිමත් ගොවීන්, ගොවි කණ්ඩායම්, කුඩා නිෂ්පාදකයින්ගේ සංවිධාන, සමූපකාර සමාගම්, නිෂ්පාදන සමාගම් සහ කෘෂි ව්‍යාපාර සඳහා සහාය දැක්වීමයි.

මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීමට සුළු හා මධ්‍ය පරිමාණ කෘෂි ව්‍යාපාරයන්හි එකතු කළ අගය සහ කෘෂි නිෂ්පාදනවල වටිනාකම ඉහළ නැංවීම සඳහා විධිමත් ගොවීන්, ගොවි සංවිධාන, කුඩා නිෂ්පාදකයන්ගේ සංවිධාන, සමූපකාර සමාගම්, නිෂ්පාදන සමාගම් හට ආයෝජන ඉඩ ප්‍රස්ථා ඇති කිරීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු වේ. ගැලපුම් දීමනා, තාක්ෂණ සහාය, වාණිජ බැංකු ක්ෂේත්‍රයට ඇති සබඳතා සහ නව්‍ය අවදානම් බෙදාහැරීමේ වැඩපිළිවෙලවල් හරහා එවැනි ආයෝජකයන්ට මූල්‍ය ප්‍රවේශය සැපයීම තුළින් මෙම ව්‍යාපෘතියට සහාය දක්වනු ලබයි.

ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය මෙම ව්‍යාපෘතිය සඳහා මූලිකත්වය ගනු ලබයි. එම අමාත්‍යාංශයෙහි මධ්‍යම ව්‍යාපෘති සම්බන්ධීකරණ කමිටුව මගින් සමස්ත ප්‍රතිපත්ති අධීක්ෂණය, මාර්ගෝපදේශනය සහ ව්‍යාපෘති නිරීක්ෂණය කරනු ලබයි. සමස්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනුයේ ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය සහ කෘෂිකර්ම අමාත්‍යාංශයයි. ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ආංශික ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය මෙහෙයවනු ලබයි. පරිපාලන නිලධාරී වශයෙන්, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත ආංශික ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය මෙහෙයවීම සඳහා අධිකාරී බලය ලබා දී ඇත.

මෙම ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභීන් වනුයේ, විධිමත් ගොවීන්, ගොවි කණ්ඩායම් සහ රාජ්‍ය අංශයේ දෙපාර්තමේන්තු නියෝජිත ආයතන සහ සමූපකාර යටතේ ලියාපදිංචි වී ඇති කුඩා නිෂ්පාදකයන්ගේ සංවිධාන, සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති සමාගම්, රාජ්‍ය අංශයේ දෙපාර්තමේන්තු සහ නියෝජිත ආයතන යටතේ ලියාපදිංචි වී ඇති ගොවි නිෂ්පාදකයන්ගේ සංවිධාන සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ කෘෂි ව්‍යාපාර, සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති මහා පරිමාණ සමාගම්, එකතු කළ වටිනාකම් සහ වාණිජ මෙන්ම අපනයන ඉලක්ක කර ගත් කෘෂි ව්‍යාපාර ප්‍රවර්ධන සහ කෘෂිකාර්මික අගයදාම සංවර්ධනය පිළිබඳ නිර්මාණාත්මක/නවෝත්පාදන ව්‍යාපාරික අදහස් ඇති පුද්ගලයන් වේ.

**2. කෘෂිකාර්මික අංශ නවීකරණ ව්‍යාපෘතිය පිළිබඳව කෙටි හැඳින්වීමක්**

2.1 මෙම ව්‍යාපෘතිය සංරචක තුනකි. එනම්,

- සංරචක 1 : කෘෂිකාර්මික අගයදාම සංවර්ධන
- සංරචක 2 : ඵලදායිතාවය වැඩිදියුණු කිරීම සහ විවිධාංගීකරණය
- සංරචක 3 : ව්‍යාපෘති කළමනාකරණය, අධීක්ෂණය සහ ඇගයීම

අපනයන ඉලක්ක කර ගත් කෘෂි ව්‍යාපාර ප්‍රවර්ධන කටයුතු වලට අදාළ සංරචක 1 ක්‍රියාත්මක කිරීම ප්‍රාථමික කර්මාන්ත දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලැබේ. රජයේ ජාතික ආහාර වැඩසටහනට සහායවීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් සංරචක 2 ක්‍රියාත්මක කරනු ලබයි. සංරචක 3 මගින් පළමු සංරචක 2 ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වනු ඇත.

2.2 පළමුවන සංරචකයෙහි අරමුණ වනුයේ, "ඉහළ වටිනාකමකින් යුතු කෘෂි නිෂ්පාදන සහ අගය එකතු කිරීම සඳහා කුඩා නිෂ්පාදකයන්ගේ සංවිධාන සහ කෘෂි ව්‍යාපාර ව්‍යවසායයන්ගේ ආයෝජන ආකර්ශණය කර ගැනීම තුළින් වාණිජ සහ අපනයන කෘෂිකාර්මික ප්‍රවර්ධනය කිරීමයි". මෙම සංරචක මගින් තාක්ෂණික සහාය, වාණිජ බැංකු අංශය සමග සබඳතාවය සහ නව්‍ය අවදානම් බෙදාහැරීමේ වැඩපිළිවෙලවල් තුළින් එම ආයෝජන සඳහා සුදුසු පරිසරයක් දිරිදීමනා සහ මූල්‍ය ප්‍රවේශයක් සපයනු ඇත.

2.3 පළමු සංරචකයට පහත උප සංරචක ඇතුළත් වේ.

- උප සංරචක 1.1 : අයෝජන පිළියෙල කිරීම සඳහා සහාය
- උප සංරචක 1.2 : නිෂ්පාදන සංවිධාන සහ කෘෂි ව්‍යාපාර සඳහා ගැලපුම් දීමනා
- උප සංරචක 1.3 : කෘෂි ව්‍යාපාර මූල්‍යකරණය සඳහා ආංශික ණය ඇප ආවරණ

**3. ආංශික ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයේ අරමුණු**

ව්‍යාපාර හෝ ගොවිතැන් සඳහා අරමුදල් සම්පාදනය කර ගැනීමේදී ගොවීන් සහ කෘෂි ව්‍යවසායකයින්ට බැංකු විසින් ඇපකර ඉල්ලා සිටීම බරපතල හැටළුවක් බවට පත්ව ඇත. කෘෂිකාර්මික අංශයේ ණය අවදානම මත ප්‍රාග්ධන අවශ්‍යතාවයන්ට සහ ආයෝජන කළඹෙහි අවදානම වැනි ක්ෂේත්‍රයන්හි අතරමැදි මූල්‍ය සේවා සපයන්නන්ගේ නම සහ වෙනස්වන අවශ්‍යතාවයන් හඳුනා ගැනීම ඉලක්ක කර ගනිමින් ආංශික ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය හඳුන්වාදී ඇත. ඒ අනුව, ආංශික ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය පහත කරුණු පිළිබඳ අවධානය යොමු කර ඇත.

3.1.1 රටෙහි විධිමත් ගොවීන්, ගොවි කණ්ඩායම්, කුඩා නිෂ්පාදන සමාගම්, සමූපකාර සමාගම්, නිෂ්පාදන සංගම් සහ කුඩා හා මධ්‍ය කෘෂි ව්‍යාපාර සඳහා මූල්‍ය ප්‍රවේශය ඉහළ නැංවීම.

3.1.2 කෘෂිකාර්මික අංශය සඳහා ණය ලබා දීමට සහභාගිත්ව මූල්‍ය ආයතන දිරිගැන්වීම තුළින් ගොවි ජනතාව අතර මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම.

3.1.3 ණය නොගෙවා පැහැර හැරීමේ අවදානමෙන් කොටසක් ආවරණය කිරීම:

ණය පැහැර හැරීමකදී, ණයෙන් කොටසක් ආපසු ගෙවීම තුළින් ණය ලබා දෙන්නාගේ අවදානම අඩු වේ.

3.1.4 දැනට පවතින ණය යෝජනා ක්‍රම සමග සසඳා බලන කළ, විශාල ණය මුදල් සඳහා ණය වාරිකය වසර ගණනාවක් වන බැවින්, වත්කම් අත්පත් කර ගැනීම සඳහා දීර්ඝකාලීන ණය ලබාදීම ධෛර්යමත් කිරීම.

**4. ආංශික ඇප ආවරණ යෝජනා ක්‍රමය යටතේ අවශ්‍යය සුදුසුකම්**

4.1 ව්‍යාපෘති යටතේ ගැලපුම් ප්‍රදානයන් මගින් ප්‍රතිලාභ ලබන ව්‍යාපෘති සඳහා ලබා දෙන සියලුම ණය සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් ආංශික ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි කළ යුතුය.

4.2 ව්‍යාපෘති යටතේ අංශික ණය ඇප ආවරණ ක්‍රමය අනිවාර්යය අවශ්‍යතාවයකි.

**5. ආංශික ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයෙහි ආරම්භය**

5.1 ප්‍රාථමික කාර්මාන්ත අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරන ලද ගැලපුම් ප්‍රදාන යෝජනා ක්‍රමයේ ආරම්භක දිනයම අංශික ණය ඇප යෝජනා ක්‍රමය ආරම්භක දිනය වශයෙන් සලකනු ලබයි.

**6. සහභාගිත්ව මූල්‍ය ආයතන**

6.1 බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ව්‍යාපෘතියේ ආංශික ඇප ආවරණ යෝජනා ක්‍රමය සඳහා සහභාගිවීමට අදහස් කරන්නේ නම් ලිඛිත ඉල්ලීමක් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත ලිඛිතව යොමු කළ යුතුය. පිළිගත් සම්මතයන්ට අනුකූල නම් ආංශික ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය යටතේ සහභාගිත්ව මූල්‍ය ආයතනක් ලෙස බැංකු ලියාපදිංචි කෙරේ.

6.2 යෝජනා ක්‍රමය යටතේ ලියාපදිංචි වී ඇති සහභාගිත්ව මූල්‍ය ආයතන ලැයිස්තුව ඇමුණුම් V හි දක්වා ඇත.

**7. ප්‍රතිලාභීන්ගේ සුදුසුකම් සහ අරමුණ**

7.1 කුඩා කර්මාන්ත අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද ගැලපුම් ප්‍රදාන අත්පොතෙහි දක්වා ඇති පරිදි ආංශික ඇප ආවරණ යෝජනා ක්‍රමය යටතේ ණය මුදල් ලබා ගත හැකි වනුයේ කෘෂි කර්මාන්තයේ ආර්ථික ඵලදායී අරමුණ සඳහා නිකුත් කරන ණය සඳහායි. ව්‍යාපෘතියට අදාළ ණය මුදලින් කොටසක් ගැලපුම් ප්‍රදානය හරහා පියවෙනු ලබයි. ව්‍යාපෘතියේ අවසාන ප්‍රතිලාභීන් වනුයේ, රාජ්‍ය අංශයේ දෙපාර්තමේන්තු සහ නියෝජ්‍ය ආයතනවල ලියාපදිංචි වී ඇති ගොවි කණ්ඩායම් සහ සංවිධාන, සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති සමූපකාර සහ සමාගම්, රාජ්‍ය අංශයේ දෙපාර්තමේන්තු නියෝජිත ආයතන යටතේ ලියාපදිංචි ගොවි නිෂ්පාදන සමාගම් සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, ශ්‍රී ලංකාවේ සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති විශාල සමාගම් (සැකසීම්, වෙළෙඳාම් ආදිය)

7.2 ව්‍යාපෘතිය යටතේ විභවතාවයකින් යුතු කෘෂි ව්‍යාපාර සහ ප්‍රමුඛතා

නව සහ නව්‍ය තාක්ෂණයෙන් යුත් පුළුල් පරාසයක් සහ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ආයතනික සැකැස්ම, සැකසුම් සහ අලෙවිකරණ, අගය එකතු කළ කෘෂිකාර්මික නිෂ්පාදන, ආහාර සුරක්ෂිතතාවය ප්‍රවර්ධනය කිරීම සහ වැඩිදියුණු කිරීම, ව්‍යාපාර කළමනාකරණය, ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්, නව නිෂ්පාදන සංවර්ධනය සහ සේවා සැපයීම සුදුසු වනු ඇත. ඒ අනුව, ප්‍රාථමික කර්මාන්ත දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ගැලපුම් ප්‍රදාන අත්පොතෙහි දක්වා ඇති පරිදි කෘෂි ව්‍යාපාර සහ ආදර්ශ ක්‍රියාකාරකම් සඳහා ව්‍යාපෘති යෝජනා පුළුල් පරාසයකින් යුතු විභව ව්‍යාපෘති තේමාවන් පහත පරිදි විය හැකිය.

7.2.1 කෘෂි නිෂ්පාදන එකතු කිරීම, ගබඩා කිරීම සහ සැකසීම වැඩිදියුණු කිරීම.

7.2.2 ශ්‍රේණිගත කිරීම, වර්ගීකරණය, ඇසුරුම් කිරීම, ලේබල් කිරීම, වෙළෙඳ නාම සහ නිෂ්පාදන ඉදිරිපත් කිරීම සහ ප්‍රවර්ධනය වැඩිදියුණු කිරීම.

7.2.3 නිෂ්පාදන හා සැකසුම් තාක්ෂණය හඳුන්වාදීම, ගුණාත්මකභාවය හා ආහාර සුරක්ෂිතතා කළමනාකරණ පුරුදු/පද්ධතිය සහ නිෂ්පාදන සහතික කිරීම ඇතුළුව නිෂ්පාදන ගුණත්වය හා ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම.

7.2.4 ඉහළ වටිනාකමකින් යුත් උසස් නිෂ්පාදන හඳුන්වාදීම ඇතුළු කෘෂි නිෂ්පාදන අලෙවි කිරීම.

7.2.5 පසු අස්වනු හැසිරවීම පුරුදු/තාක්ෂණය වැඩිදියුණු කිරීම සහ පසු අස්වනු හානි අවම කිරීම.

7.2.6 විකල්ප ආදායම් උත්පාදන අවස්ථා සහ සේවා සංවර්ධනය කිරීම.
(කෘෂි සංචාරක, මී පැණි, අත්කම්, පශු සම්පත් නිෂ්පාදන, කාබනික ගොවිතැන ඇතුළුව)

7.2.7 ගොවීන්/නිෂ්පාදකයන්, සැකසුම්කරුවන් සහ වෙළෙන්දන් අතර ගිවිසුම් ඇති වීම වර්ධනය කිරීම ඇතුළුව යෝග්‍ය කෘෂි ව්‍යාපාර කළමනාකරණ ක්‍රම හඳුන්වාදීම.

7.2.8 විශේෂ නිෂ්පාදන සඳහා ස්ථිර ක්‍රියාමාර්ග ගැනීමට වෙළෙඳපොල උපායමාර්ග ඇතුළුව වෙළෙඳපොල පර්යේෂණ හා අධ්‍යයන සිදු කිරීම.

7.2.9 ආදාන සැපයුම, පශු වෛද්‍ය සහ කෘතිම සිංචන වැනි සේවාවන් සඳහා කුඩා ගොවීන්ගේ ප්‍රවේශය වැඩි කිරීම.

7.2.10 ගැලපුම් ප්‍රදාන මෙහෙයුම් අත්පොතේ නියමයන් සලකා බලන ඕනෑම වෙනත් ක්‍රියාකාරකම් ගැලපුම් ප්‍රදාන මෙහෙයුම් ප්‍රධාන අත්පොත යටතේ විෂම ව්‍යාපෘති තේමාවන් සහ අදහස් දක්වා ඇත.

7.3 ආංශික ණය ඇප ආවරණ යටතේ සුදුසුකම් නොලබන ආයෝජන සඳහා ණය හෝ ප්‍රධාන පහත පරිදි වේ.

7.3.1 විධිමත් ගොවීන්, ගොවි කණ්ඩායම්, කුඩා තේ වතු නිෂ්පාදකයින්ගේ සංවිධාන සමූපකාර සමාගම්, නිෂ්පාදක සමාගම් සහ සුළු හා මධ්‍ය පරිමාණ කෘෂි ව්‍යාපාර සහ විශාල සමාගම් වලට අඛණ්ඩ මෙහෙයුම් ඵලදායී ආයෝජකයන් සමග ඍජුවම සම්බන්ධ නොවේ.

7.3.2 ඉඩම් අත්කර ගැනීම.

7.3.3 නව ගොඩනැගිලි ඉදිකිරීම වැනි දැවැන්ත සිවිල් කටයුතු ඵලදායි වත්කම් නොවේ.

7.3.4 සමාගමේ කොටස්වල මූල්‍ය දායකත්වය.

**8. සහභාගිත්ව මූල්‍ය ආයතනවල වගකීම්**

සහභාගිත්ව මූල්‍ය ආයතනවල වගකීම් පහත පරිදි වේ.

8.1 ඉහත වගන්ති අංක 7 යටතේ ප්‍රතිලාභීන් සඳහා සුදුසුකම් සපුරා ඇති ණය සඳහා පමණක් ආංශික ණය ඇප ආවරණ ඉල්ලා සිටිය හැක.

8.2 ආංශික ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස්හි 13.4 කාණ්ඩයෙහි විස්තර කර ඇති පරිදි පරිපාලක වෙත වාරික ගෙවීම.

8.3 අවශ්‍ය දත්ත සහ වන්දි මුදල් පසුව අයකර ගැනීම් සහ ණය ඇප ආවරණවලට අදාළ තොරතුරු පරිපාලක වෙත ලබාදීම.

8.4 16 වන වගන්තියේ සඳහන් පරිදි අවසන් දිනට පෙර හෝ අවසන් දිනයේදී ප්‍රධාන කාර්යාලය හරහා අදාළ ආකෘති පත්‍ර සමග වන්දි මුදල් ආපසු අයකර ගැනීම් පරිපාලක වෙත එවිය යුතුය.

8.5 පරිපාලක විසින් පරීක්ෂා කිරීම හෝ විගණනය සඳහා ප්‍රමාණවත් වාර්තා තබා ගන්න.

8.6 එවැනි අයදුම්පත් ලැබී මසක් ඇතුළත එක් එක් ණය ඇප ආවරණ අයදුම්පත පිළිබඳ තීරණය පරිපාලක විසින් සන්නිවේදනය කිරීමට අපේක්ෂා කෙරේ.

8.7 මෙම යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් ණය සඳහා පූර්ව සහ පසු අධීක්ෂණ කාර්යයන් ඉටු කිරීම ණය ගැනුම්කරුවන්ට ණය ලබා දීමේදී සාමාන්‍ය සැළකිල්ලක් සහ විචක්ෂණශීලීත්වය නිරීක්ෂණය කිරීම සහභාගිත්ව මූල්‍ය ආයතනවල වගකීම් වන අතර, ඔවුන් ලබා දෙන ලද ණය එම අරමුණු සඳහාම යොදවා ඇති බවට මග බලා ගැනීම සඳහා සාධාරණ පියවර ගත යුතුය.

8.8 11 වන වගන්තිය දක්වා ඇති පරිදි ගෙවීම් පියවා ගැනීමට හැකි සෑම ආකාරයකම ක්‍රියාමාර්ග ගැනීම.

**9. පරිපාලකගේ වගකීම්**

ආංශික ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා ක්‍රියාත්මක කිරීමේ ආයතනය ලෙස පහත සඳහන් කාර්යයන් පරිපාලක විසින් ඉටු කරනු ඇත.

9.1 ආංශික ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් උපදෙස් නිකුත් කිරීමේ වගකීම පරිපාලක විසින් දරනු ලබයි. අවශ්‍යතාවය මත පදනම්ව මෙහෙයුම් උපදෙස් සංශෝධනය කෙරේ.

9.2 සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් ණය ඇප සඳහා ලැබුණ ණය අයදුම්පත් ණය ගැතියන්ගේ සහ ආයෝජකයන්ගේ සුදුසුකම් සහතික කිරීම සඳහා ඇගයීම සහ අවදානම් පිළිගත හැකි පරාමිතීන්වල පවතින බවට සහතික වීම.

9.3 ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා රජයෙන් අරමුදල් සපයා ගැනීමට යටත්ව රජය වෙනුවෙන් ඇප ආවරණ නිකුත් කිරීම.

9.4 ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස්හි විස්තර කර ඇති පරිදි, සහභාගිත්ව මූල්‍ය ආයතනවලින් වාරික එකතු කිරීම.

9.5 ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස්හි විස්තර කර ඇති පරිදි හිමිකම් සහභාගිත්ව ආයතනවලට පියවිය යුතු වේ.

9.6 යෝජනා ක්‍රමයේ නිරීක්ෂණ සහ ඇගයීම් ක්‍රියාවලිය සිදු කිරීම සහ රජය වෙනුවෙන් අවශ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම.

9.7 ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදු කිරීම සඳහා ඇති හිමිකම, සහභාගිත්ව මූල්‍ය ආයතන අධීක්ෂණය සහ ලෙජරයන් පොත් පරීක්ෂාව ආදිය සහ අවශ්‍ය යැයි හැඟෙන ආංශික ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය හා ඕනෑම අධීක්ෂණ සම්බන්ධව ක්‍රියාමාර්ග සිදු කිරීම.

9.8 එක් ණයගැතියෙකුට ණය කිහිපයක් ලබා දී ඇති විටදී, ලබා දිය හැකි උපරිම ණය ඇප ආවරණය තීරණය කිරීමේ අයිතිය පරිපාලක සතුය.

9.9 සලකා බලන සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා නිකුත් කරන ලද ඇපකරයේ වටිනාකමෙන් සියයට 20 ක අලාභයක් හෝ හිමිකමක් ඉක්මවා ඇත්නම් එම සහභාගිත්ව මූල්‍ය ආයතනය වෙත තම ඇපකර නිකුත් කිරීම පරිපාලනය විසින් අත්හිටවනු ඇත.

9.10 මෙහෙයුම් උපදෙස් හෝ වෙනත් තොරතුරුවල වෙනසක් ඇති වුවහොත් පරිපාලක විසින් එම වෙනස්කම් පිළිබඳව සහභාගිත්ව මූල්‍ය ආයතනයේ මූලස්ථානය වෙත දන්වා සිටිය යුතුය.

9.11 විචක්ෂණශීලී ණය ලබා ගැනීම තුළින් ණයට ගැනීමේදී නිසි අධීක්ෂණය, සැළකිල්ල සහ සුපරීක්ෂාව සහතික කිරීම, ණය ගැනුම්කරුවන් විසින් මුදල් යෙදීම වැරදි ලෙස භාවිතා කිරීම හෝ ණය ලබා දීමේදී සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් ප්‍රයෝගකාරී ක්‍රියාවන් සිදු කර ඇති බවට සාක්ෂි පවතී නම් පරිපාලක ඒ පිළිබඳ වගකීම ප්‍රතික්ෂේප කරනු ඇති අතර, සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත ගෙවන ලද ඕනෑම මුදලක් ආපසු අයකර ගැනීමේ අයිතිය ද සතු වේ.

9.12 මෙම මෙහෙයුම් උපදෙස් යටතේ ඇති කොන්දේසි වලට සහභාගිත්ව මූල්‍ය ආයතන අනුගත නොවන අවස්ථාවකදී, ආංශික ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයෙන් සහභාගිත්ව මූල්‍ය ඉවත් කිරීමේ අයිතිය පරිපාලක සතුය.

9.13 ලැබුණු සියලුම මුදල් සංරචක විචක්ෂණශීලීව ආයෝජනය කිරීමේ අයිතිය ඇත.

9.14 ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් ඉදිරිපත් කළ යෝජනාවට කිසිදු විරෝධතාවක් නොමැති බවට යටත්ව ආංශික ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය සමාලෝචනය කිරීම හා යාවත්කාලීන කිරීම පරිපාලක සහ කුඩා කර්මාන්ත අමාත්‍යාංශයේ අභිමතය පරිදි සිදු කළ හැක. ගැලපුම් ප්‍රධාන පද්ධතියට දායක නොවන ණය සඳහා වන යෝජනා ක්‍රමයට ප්‍රවේශ වීමට ඔවුන්ට ඉඩ සලසනු ඇත. එවැනි තීරණ පරිපාලක හරහා සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත සන්නිවේදනය කෙරේ.

9.15 ආරම්භයේ සිටම (මූල්‍ය ගිවිසුමෙහි ක්‍රියාත්මක වන දිනය) ආංශික ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වීමේ කාලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක වීමේ කාලය හා සමානුපාතික වන අතර, ආංශික ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයේ වලංගු කාලය දීර්ඝ කිරීම සහ සමාලෝචනය කිරීම පරිපාලක සමග ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය කාලීනව සිදු කරනු ලබයි.

**10 නොපියවූ ණය**

ශාඛා කළමනාකරුවන් විසින් විධිමත් ගොවීන්, ගොවි කණ්ඩායම්, කුඩා නිෂ්පාදකයන්ගේ සංවිධාන, සමිති සමාගම්, නිෂ්පාදකයින්ගේ සමාගම් සහ හිතාමතා ණය නොගෙවා පැහැර හරින්නන් සහ හිතාමතා නොවන, ණය නොගෙවා පැහැර හරින්නන් ලෙස කුඩා සහ මධ්‍ය කෘෂි ව්‍යාපාරයන් කොටස් 2 කට බෙදා නොපියවූ ණය පිළිබඳව වර්ග කළ යුතුය. ක්ෂේත්‍ර නිලධාරීන් හරහා කළමනාකරුවන් විසින් ලබා ගන්නා තොරතුරු මත පදනම්ව වර්ගීකරණය සිදු කළ යුතුය.

10.11 හිතාමතා ණය නොගෙවා පැහැර හරින්නන් (පවතින තොරතුරු අනුව), ණය ගැතියන්ට ලබා ගත් ණය මුදල ආපසු ගෙවීමේ හැකියාව පැවතුණත් සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත එම ණය මුදල නොගෙවා පැහැර හරින්නන් "හිතාමතා ණය නොගෙවා පැහැර හරින්නන්" ලෙස හඳුන්වයි.

10.12 හිතාමතා නොවන ණය නොගෙවා පැහැරහරින්නන් - නියඟය, ගංවතුර, කෘමි හානි වැනි හානි නිසා හෝ ණයගැතියාගේ පාලනයෙන් තොරව සිදුවන ක්‍රියාවන් පරිපාලකයාට පිළිගත හැකි නම් ණය ගැතියා ලබාගත් ණය මුදල සහභාගිත්ව ආයතන වෙත නොගෙවා පැහැර හරින්නන් "හිතාමතා නොවන ණය නොගෙවා පැහැර හරින්නන්" ලෙස හඳුන්වයි.

**11. ණය අයකර ගැනීම්**

11.1 මෙම අවස්ථාවන් දෙකේදී ණය අය කර ගැනීම් ක්‍රියාවලිය පහත පරිදි වේ.

11.1.1 නීතිමය ක්‍රියාමාර්ග ගැනීම තුළින් හිතාමතා ණය පැහැර හරින්නන්ගෙන් ණය ආපසු අය කර ගැනීමට සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් වහාම පියවර ගත යුතුය. නීතිමය ක්‍රියාමාර්ග හරහා ණය පියවා ගැනීමේදී, අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග විස්තරාත්මකව 12 වගන්තිය දක්වා ඇත.

11.1.2 15 වැනි වගන්තියේ දක්වා ඇති පරිදි, හිතාමතා නොවන ණය නොගෙවා පැහැර හරින අවස්ථාවකදී, සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් ණයගැතියා සමග පෞද්ගලික සබඳතාවන් පවත්වා ගැනීම සහ ප්‍රතිව්‍යුහගත පහසුකම් ලබා දිය හැක.

11.2 හැකි සෑම ආකාරයකින්ම ඕනෑම හිඟ මුදලක් ආපසු අය කර ගැනීම සඳහා කඩිනම් සහ ඵලදායී ක්‍රියාමාර්ග ගැනීමට සහභාගිත්ව මූල්‍ය ආයතන අපේක්ෂා කරනු ලබයි. හිමිකම් පෑම සඳහා ඉදිරිපත් කිරීමෙන් පසුවත් සහ පරිපාලක විසින් ආංශික ණය ඇප ආවරණ ලැබීමෙන් පසුව වුවද, ණය ආපසු අය කර ගැනීමේ ක්‍රියාවලියෙහි අඛණ්ඩවම සහභාගිත්ව මූල්‍ය ආයතන නිරත වේ යැයි පරිපාලක විසින් අපේක්ෂා කරනු ලබයි. මේ අනුව, පරිපාලක විසින් යෝජනා කළ හැකි ඕනෑම ක්‍රියාවක් කිරීමට සහභාගිත්ව මූල්‍ය ආයතන බැඳී සිටී.

11.3 මේ සම්බන්ධයෙන් පරිපාලකගේ අවම අවශ්‍යතාවයන් පහත පරිදි වේ.

ණයක් හිඟවී ඇති විටදී, සහභාගිත්ව මූල්‍ය ආයතනවල ශාඛා කළමනාකරුවන් ක්ෂණිකව ණය ආපසු ගෙවීමට ණයගැතියන්ට ඒත්තු ගැන්වීම සඳහා වහාම ණය අය කර ගැනීමේ ක්‍රියාමාර්ග ගත යුතුය. ක්‍රියාවන් සඳහා පහත සඳහන් දෑ අඩංගු විය හැකිය.

11.3.1 ණය නොගෙවීමට හේතු කවරේදැයි සොයා බැලීම සඳහා ණයගැතියා සොයා යෑම (අවම වශයෙන් දෙවතාවක්) සහ ණය ආපසු ගෙවීම සඳහා ණයගැතියා පෙළඹවීම.

11.3.2 ණයගැතියන් විසින් මුහුණපානු ලබන දුෂ්කරතාවයන් සොයා බැලීම සහ පරීක්ෂා කිරීමත් එවැනි දුෂ්කරතාවයන් මඟ හරවා ගැනීමට ණයගැතියා විසින් අනුගමනය කළ යුතු ක්‍රියාවන්ගේ ක්‍රියාපටිපාටිය නිර්දේශ කිරීමත්ය.

11.3.3 ණය ගෙවා ගැනීමට ඇති දුෂ්කරතාවයන් සද්භාවයෙන්ම ඇති වූවත් එය ණයගැතියාගේ පාලනයෙන් තොරව නම්, ණයගැතියාගේ ආදායම් රටාවට අනුව, ණය ප්‍රතිව්‍යුහගතකරණය කිරීම සහ නව වාරික සැලැස්මක් සකස් කිරීම.

11.3.4 හිතාමතා ණය පැහැර හරිනු ලැබුවෙකු නම්, ණයගැතියාට සහ ඇපකරුවන්ට ණය ගෙවන මෙන් දන්වා ඉල්ලීමක් නිකුත් කිරීම.

11.3.5 ලබාගත් ණය අනිසි ලෙස යොදා ගෙන ඇති බව ඒත්තු ගැන්වුණොත්, ණය ගෙවීම පිළිබඳව කරන ඉල්ලීම වහාම නිකුත් කළ යුතු අතර, නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගත යුතුය.

11.3.6 හිතාමතා ණය පැහැරහරින පුද්ගලයන් පිළිබඳ තොරතුරු, ණය තොරතුරු කාර්යාංශයට වාර්තා කළ යුතුය.

**12. නීතිමය ක්‍රියාමාර්ග**

12.1 11.3 වගන්තියේ සඳහන් පරිදි ණය ආපසු අය කර ගැනීමේ ක්‍රියාමාර්ග ගැනීමෙන් පසුවත් ණය පැහැර හරින්නන්ගෙන් ණය අය කර ගැනීමට සහභාගිත්ව මූල්‍ය ආයතන අපොහොසත් වුවහොත් එවැනි අවස්ථාවලදී පළමු හිඟ වාරිකයේ නියමිත දින සිට මාස 12 ක් ඇතුළත පළමු දළ සැලැස්මෙහි හඳුනාගත් පරිදි අදාළ අධිකරණ ක්‍රියාපටිපාටියකට යොමු කළ යුතුය.

**13. ණය ඇප ආවරණ පියවීම්**

මුදල් නීති පනතේ 108 A වගන්තියට අනුව, ණය ඇප ආවරණ සැපයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවට බලය ලබා දී ඇත. ඒ අනුව, අපේක්ෂිත ණය ආපසු ගෙවීමේ වාරික නොගෙවීම නිසා පැන නගින ද්‍රවශීලතා හිඟයට පහසුකම් සැපයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව ණය ඇප ආවරණ සපයනු ලබයි. එබැවින්, ණය පැහැර හැරිය පුද්ගලයන්ගෙන් ණය ආපසු අය කර ගත් පසු සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් එම ණය ඇප ආවරණ ගෙවීම් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පියවිය යුතුය.

13.1 ණය වාරික එකතු කිරීම, ඇප ආවරණ අරමුදල් ලබා ගැනීම, ඇප ආවරණ අරමුදල් ආයෝජනය සඳහා පවතින ප්‍රමිති විචක්ෂණ මාර්ගෝපදේශ යටතේ අදාළ වන පරිදි ඇප ආවරණ අරමුදල් ආයෝජනය කිරීම, ඇප ආවරණ හිමිකම් ගෙවීම සහ හිමිකම් පියවීමෙන් පසු ආපසු අය කර ගැනීමට කැඳවීම ආදිය සඳහා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත අධිකාරී බලය ලබා දී ඇත.

13.2 ආංශික ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය යටතේ ආවරණය නොවූ ණය

13.2.1 රජය විසින් හෝ රජයේ ආයතනයකින් ඇප ආවරණ ලබා ගෙන ඇති ඕනෑම ණයක් මෙම ආංශික ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය යටතේ ණය ඇප ආවරණ ලබා ගැනීම සඳහා සුදුසුකම් නොලබයි.

13.2.2 නියමිත කාලය තුළදී පරිපාලක වෙත ණය ඇප ආවරණ වාරික නොගෙවූ ණය සඳහා මෙම ආංශික ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය යටතේ පහසුකම් ලබා ගැනීමට සුදුසුකම් නොලබයි.

13.3 ඇප ආවරණයෙහි ප්‍රමාණය

13.3.1 නොපියවූ හිඟ ණය මුදල සියයට 50 ක් හෝ ඇප ආවරණ ප්‍රමාණයන් අඩු මුදලක් සඳහා මෙම යෝජනා ක්‍රමයෙන් ඇප ආවරණ සපයනු ලබයි. එහි උපරිම අවස්ථාවට ළඟා වූ බවට සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් සපයනු ලබන සාක්ෂි මත ණය ඇප ආවරණ එක් වාරිකයකින් ගෙවනු ලබයි. (දළ සැලැස්ම I හි T ලෙස හඳුනාගත් පරිදි)

13.3.2 මූලික උපරිම ඇප ආවරණය ආංශික ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයේ ආරම්භක දිනයේ සිට වසර 5 කට සීමාවේ. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව යෝජනා ක්‍රමයේ කාර්යසාධනය මත පදනම්ව ඇප ආවරණ ක්‍රමයේ වලංගු කාලය වසර 5 කට වඩා වැඩි කාලයක් සඳහා දීර්ඝ කිරීමේ අයිතිය පරිපාලක සතුය.

13.4 වාරික

13.4.1 ලබාදෙන අවස්ථාවේදී සුදුසුකම් ලබන ණය මත වාරිකය සියයට දශම පහක වාර්ෂික පොලී අනුපාතයකට පරිපාලක වෙත ගෙවිය යුතු අතර, මෙම ණය යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ලබන සම්පූර්ණ ණය ප්‍රමාණය මත එය ගණනය කළ යුතුය. එසේම ණය ඇප ආවරණ ලබා දෙන පළමු අවස්ථාවේදීම එය ගෙවිය යුතුය.

13.4.2 ඇප ආවරණ වාරික ගෙවීමට අසමත් වුවහොත් ඇප ආවරණ නිෂ්ප්‍රභා කෙරේ.

13.4.3 සෑම ණය මුදලක් සඳහා වෙනමම ඇප ආවරණ අයදුම්පතක් තිබිය යුතුය.

13.4.4 ඇප ආවරණ යටතේ කෙටිකාලීන ණය ඇතුළත්ව (බහු වාර්ෂික) ලබා දෙන ලද ණයවල හිඟ ප්‍රාග්ධන ශේෂයන් මත සෑම වර්ෂයකම අලුත් කිරීමකදීම වාරිකයක් සඳහා සියයට දශම පහක පොලී අනුපාතයක් අය කරනු ලබයි.

13.4.5 ණය ඇප ආවරණ ලබා දෙන පළමු අවස්ථාවෙන් පසුව බහු වාර්ෂික ණය සඳහා ඇප ආවරණ ගෙවීම සෑම මාස 12 කදීම සිදු කළ යුතුය.

13.4.6 අවදානම් පිරිවැය පිළිඹිබු කිරීම සඳහා අදාළ පාර්ශවකරුවන් සමග සාකච්ඡා කිරීමෙන් පරිපාලකට වාරික ගැලපුම් සිදු කළ හැකි අතරම දිගුකාලීනව මූල්‍ය ශක්‍යතාවයක් සහිත ඇප ආවරණ යෝජනා ක්‍රමවල ඉලක්ක සමග පරිපාලන වියදම සංගත විය යුතුය.

13.4.7 එක් එක් ප්‍රධාන කාර්යාල හරහා තනි පුද්ගල ණය ඇපකර බලපැවැත්වෙන දිනයේ සිට සහභාගිත්ව මූල්‍ය ආයතන වාර්ෂිකව වාරික ගෙවිය යුතු වේ.

13.4.8 සහභාගිත්ව ආයතනවල ප්‍රධාන කාර්යාල මගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත ගෙවිය යුතු වාරික, මුදල් චෙක්පත් හෝ ඉලෙක්ට්‍රොනික් ගෙවීම් හරහා ඉදිරිපත් කළ යුතුය.

13.4.9 අදාළ පොලී අනුපාත සැකසීමේදී, ඇපකරවල පවතින බලපෑම පිළිබඳ සලකා බැලීමට සහභාගිත්ව මූල්‍ය ආයතන දිරි ගැන්විය යුතුය. චෙක්පත් හෝ විද්‍යුත් ගෙවීම් පියවීම මත සෑම පුද්ගල ඇප ආවරණයක්ම ක්‍රියාත්මක වේ. ඉදිරිපත් කරන ලද එක් එක් කාණ්ඩය සඳහා පරිපාලක විසින් වෙනම ඇප ආවරණ නිකුත් කරනු ඇත.

13.5 හිමිකම් ක්‍රියාවලිය

13.5.1 මේ අරමුණ සඳහා ඇමුණුම් II ආකෘතියේ විස්තර කර ඇති පරිදි ඇප ආවරණයෙහි කිසියම් මුදලක් පාඩු වුවහොත් එය හිමිකම් පෑමට සහභාගිත්ව මූල්‍ය ආයතනය විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත ඉදිපත් කළ යුතුයි. ණය යෝජනා ක්‍රමයේ ආරම්භක දිනයේදී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෙම ආකෘති පත්‍රය සහභාගිත්ව මූල්‍ය ආයතනවල ප්‍රධාන කාර්යාලවලට එවනු ඇත.

13.5.2 පහත දැක්වෙන පියවරයන් සම්පූර්ණ කිරීමෙන් පසු ණය යෝජනා ක්‍රමය යටතේ ණය මුදලක් අහිමි වේ යැයි සලකනු ලැබේ.

13.5.2.1 ණය ආපසු ගෙවීම සඳහා ණයගැතියන් පෙළෙඹවීමට ඔවුන් වෙත යෑම, ඇපකරුවන්ගෙන් සහාය ඉල්ලා සිටීම, ණයගැතියාට ණය ගෙවන මෙන් දන්වා ඉල්ලීම් ලිපියක් නිකුත් කිරීම යනාදී හැකි සෑම ක්‍රමයක්ම ණය ආපසු අය කර ගැනීමට සහභාගිත්ව මූල්‍ය ආයතනයට නොහැකි වී ඇත්නම්, එම ණය මුදල අහිමි වූවක් ලෙස සලකනු ලබයි. හිමිකම් පෑම් සඳහා අදාළ අයදුම්පත් පරිපාලක වෙත භාරදීමට ප්‍රථම ණය ගැතියා හමුවීමට දෙවතාවක්වත් යා යුතුය. එවැනි සංචාර පිළිබඳ වාර්තා ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන් විසින් සහභාගිත්ව මූල්‍ය ආයතන පරීක්ෂා කිරීමේදී හෝ පරිපාලකගේ උපදෙස් හෝ ඉල්ලීම මත ඉදිරිපත් කිරීමට පැවතිය යුතුය.

13.5.2.2 සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් ණයකරුට සහ ඇපකරුවන්ට ණය ගෙවන මෙන් දන්වා ඉල්ලීම් නිකුත් කළ යුතුය. සහභාගිත්ව මූල්‍ය ආයතන ණයගැතියා පිළිබඳව ණය තොරතුරු කාර්යාංශය වෙත වාර්තා කළ යුතු අතර, මෙය ණය පැහැර හැරීමක් ලෙස වර්ගීකරණය කළ යුතුය.

13.5.2.3 ඉහත උප වගන්ති 13.5.2.1 සහ 13.5.2.2 දක්වා ඇති ක්‍රියාවලීන් තුළින් සහභාගිත්ව මූල්‍ය ආයතන සැලකිය යුතු ප්‍රගතියක් ලබා නොගත්තේ නම් දළ සැලැස්ම 1 හි සඳහන් පරිදි අදාළ අධිකරණ ක්‍රියාපටිපාටි අනුගමනය කළ යුතුය.

13.5.2.4 ඒ අනුව, සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් ඉහත පියවරයන් අනුගමනය කළ යුතු අතර, නියමිත කාලසීමාව තුළ සුදුසු පරිදි නීතිමය ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. එසේ ණය ඇප ආවරණ හිමිකම් පෑම් සඳහා යවන දිනයේදී ණය ආපසු අය කර ගැනීම සඳහා අදාළ ක්‍රියාපටිපාටිය අනුගමනය කර තිබිය යුතුය. මෙහෙයුම් උපදෙස්හි දක්වා ඇති පරිදි, පරිපාලක හට වලංගු හිමිකම් ඉල්ලීමක් ලැබීමෙන් පසු දින 45 කට නොඅඩු හිමිකම් ඉල්ලීම් ඉදිරිපත් කරන ලද සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත ඇප ආවරණ ගෙවනු ලැබේ.

13.5.2.5 පරිපාලකගේ පූර්ව අනුමැතියකින් තොරව, ඕනෑම තත්ත්වයක් යටතේ ණය ඇපකර ගෙවා ඇති ණය, කපා හැරීම් නොකිරීමට සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත දැඩිව උපදෙස් ලබා දී ඇත. ණය ඇප ආවරණ ගෙවීමෙන් පසුවත්, ණය ආපසු අය කර ගැනීම සඳහා සහභාගිත්ව මූල්‍ය ආයතන ක්‍රියාමාර්ග ගත යුතුය.

13.5.2.6 ණයගැතියා ප්‍රතිලේඛනගත කරන ලද ණය ගෙවීමේ වගකීම ඉටු කිරීමට නොහැකි වුවහොත් අහිමි වූ ණයක් ලෙස සැලකීමට පෙර සහ හිමිකම් පෑමක් ඉදිරිපත් කිරීමට පෙර 15 වැනි වගන්තියේ දක්වා ඇති පරිදි ක්‍රියාමාර්ගයන් අනුගමනය කළ යුතුය.

13.5.2.7 අවශ්‍ය පරිදි අධීක්ෂණ සහ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට සහභාගිත්ව මූල්‍ය ආයතන අසමත් වුවහොත් හෝ සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් ණය ආපසු අය කර ගන්නා ලද නම් හෝ හිමිකම් ආකෘති ලැබීමෙන් පසු පරිපාලක විසින්ම එම මුදල් ආපසු ලබා ගැනීමට යටත් වූ පරිපාලකගේ වගකීමෙන් සියයට සියයක්ම ගෙවනු ඇත.

**14 අලාභය සහ හිමිකම් ගෙවීම් ගණනය කිරීම.**

අලාභයේ ප්‍රමාණය ගණනය කිරීම සඳහා ඉහත 13.3.1 උප වගන්තියෙන් දක්වා ඇති පරිදි නොපියවූ ණය මුදල සැළකිල්ලට ගනු ලබයි.

**15 හිතාමතා නොවන ණය පැහැර හැරීමේ ප්‍රතිලේඛනගත කිරීම.**

15.1 ණයගැතියන්ට පාලනය කළ නොහැකි සාධක නිසා ණය නොගෙවා පැහැර හරින ණයගැතියන්ගේ ණය මුදල් සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් ප්‍රතිලේඛනගත කිරීමට තීරණය කළ අවස්ථාවකදී සහ පත් කළ ප්‍රතිලේඛනගත කමිටුව විසින් අනුමත කරනු ලැබූ එවැනි තීරණයන් පරිපාලකට දැන්විය යුතුය. විශේෂිත ප්‍රතිලේඛනගත කිරීමේ වැඩසටහනක් යටතේ කිසියම් පැහැර හරින ලද ණයක් ප්‍රතිලේඛනගත කිරීම සඳහා සුදුසුකම් ලබයි නම් පරිපාලකයා ද දැනුවත් විය යුතුය.

15.2 ප්‍රතිලේඛනගත කිරීමේ පහසුකම සඳහා පහත දෑ ඇතුළත් වේ.

15.2.1 ප්‍රතිලේඛනගත කිරීම් තීරණය කිරීම සඳහා වගකිය යුතු කමිටුව පහත නිලධාරීන්ගෙන් සමන්විත විය යුතුය.

(අ) කුඩා කර්මාන්ත අමාත්‍යාංශය සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයෙහි නියෝජිතයින්

(ආ) පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ නියෝජිතයන්

(ඇ) සහභාගිත්ව මූල්‍ය ආයතනය හෝ ආයතනවල නියෝජිතයින්

15.2.2 ඉහත දක්වන ලද අදාළ කමිටුව වෙත ප්‍රතිලේඛනගත කිරීම සඳහා කරන ඉල්ලීම ලැබීමෙන් සති දෙකක උපරිම කාලයක් තුළදී ප්‍රතිලේඛනගත නිර්දේශයන් සම්පූර්ණ කළ යුතුය.

15.2.3 ඇප ආවරණ තවදුරටත් පවත්වාගෙන යෑමට අවශ්‍ය දැයි සහ කිසියම් විශේෂිත ප්‍රතිලේඛනගත යෝජනා ක්‍රමයක් යටතේ යම් ණයක් සඳහා සුදුසුකම් ලබන්නේ දැයි කමිටුව විසින් තීරණය කළ යුතුය.

15.3 ආංශික ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයෙහි තවදුරටත් දිගු කිරීම් අවශ්‍ය කරන ප්‍රතිලේඛනගත ණය වලට අදාළව නිසි පරිදි සම්පූර්ණ කරන ලද වෙනම අයදුම්පත් සහභාගිත්ව මූල්‍ය ආයතනවල ප්‍රධාන කාර්යාල මගින් කොළඹ 01 පිහිටි ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත භාර දිය යුතුය. මෙම අයදුම්පත්වල පිටපත් පවත්වාගෙන යාම සඳහා සහභාගිත්ව මූල්‍ය ආයතන වලට උපදෙස් ලබා දී ඇත (ඇමුණුම III).

15.4 අවශ්‍ය අවස්ථාවලදී සහ ණය ප්‍රතිලේඛනගත කිරීමේදී සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් සම්මත කාර්යයන් මේ සඳහා භාවිතා කළ යුතුය. එසේම ණයගැතියාගේ ණය ආපසු ගෙවීමේ හැකියාව සැළකිල්ලට ගනිමින් ඉදිරි කටයුතු සඳහා අවශ්‍ය ණය ලබා ගැනීමට ණයගැතියාට සහාය වීම.

15.5 ණය මුදලේ ඉදිරි කාලය ආවරණය කරමින් ප්‍රතිව්‍යුහගත කරන ලද ණය සඳහා ඉල්ලුම් පොරොන්දු නෝට්ටු ණයගැතියාගෙන් ඉල්ලා සිටිය යුතුය.

15.6 ණය ප්‍රතිව්‍යුහගතකරණයට අදාළව කාලපරිච්ඡේදය තුළ සිදු කරන ලද ණය අය කර ගැනීම පරිපාලක වෙත වාර්තා කළ යුතුය. මාස 36 ගතවීමට පෙර ණයගැතියෙකු ප්‍රතිලේඛනගත ණය සම්පූර්ණයෙන්ම නැවත ගෙවා ඇත්නම් එවැනි ණය අයකර ගැනීම් පරිපාලක වෙත වාර්තා කළ යුතුය.

15.7 ණයගැතියන්ට ප්‍රතිලේඛනගත ණය ප්‍රතිලාභ තවදුරටත් පුළුල් නොකර ප්‍රතිලේඛනගත පහසුකම යටතේ පවතින ප්‍රතිලාභ සඳහා අයදුම්පත් භාර නොදෙන මෙන් සහභාගිත්ව මූල්‍ය ආයතනවලට දැඩිව උපදෙස් ලබා දී ඇත.

15.8 සෑම කාර්තුවකම අවසන් සති දෙක තුළදී, ණය ප්‍රතිලේඛනගත කිරීම සඳහා එවන ලද අයදුම්පත් පරිපාලක වෙත භාරදිය යුතුය. තම පාලනයෙන් තොරව නමුදු හිතාමතා නොවන ණය පැහැර හරින ණයගැතියන්ට ලබා දෙන ලද ණය ප්‍රතිලේඛනගත

කිරීමට සහභාගිත්ව මූල්‍ය ආයතන තීරණය කරන අවස්ථාවකදී විශේෂිත ඕනෑම ප්‍රතිව්‍යුහගත යෝජනා ක්‍රමයක දී සුදුසුකම් ලබන ණය සඳහා විශේෂිත කොන්දේසි හැර අනෙකුත් කොන්දේසි අදාළ වේ. කෙසේ නමුදු, පරිපාලකගේ උපදෙස් අනුව, ණය ගෙවීම සඳහා වූ කාලසීමාව සහභාගිත්ව මූල්‍ය ආයතනයට මාස 36 කට වඩා වැඩි කළ හැකි අතර, මාස 60 කට වඩා අඩු විය යුතුය.

**16. පසු අයකර ගැනීම්**

16.1 පරිපාලක විසින් හිමිකම් පියවීමෙන් පසු සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් ණයගැතියන්ගෙන් අයකර ගන්නා ලද සියලුම ණය මුදල් පරිපාලක සහ සහභාගිත්ව මූල්‍ය ආයතන අතර 50:50 අනුපාතයකින් බෙදිය යුතුයි. හිමිකම් පියවීමෙන් පසුව ලැබෙන ණය අයකර ගැනීමකින් සියයට පනහක ප්‍රමාණයක් සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් පරිපාලක වෙත පැවරිය යුතුය. මෙම අරමුණ සඳහා පරිපාලක විසින් නියමිත ආකෘතිය භාවිතා කළ යුතුය. (ඇමුණුම IV)

16.2 ඉහත දක්වන ලද ආකෘතිය ජනවාරි සිට ජූනි දක්වා සහ ජූලි සිට දෙසැම්බර් දක්වා කාලය සඳහා අර්ධවාර්ෂිකව ඉදිරිපත් කළ යුතුය. පිළිවෙලින් ජූනි 30 සිට සහ දෙසැම්බර් 31 දින සිට දින 30 ඇතුළත සහභාගිත්ව මූල්‍ය ආයතනවල ප්‍රධාන කාර්යාල හරහා ණය අයකර ගැනීම් පරිපාලක වෙත ලබා දිය යුතුය.

16.3 ණයගැතියාගෙන් සහභාගිත්ව මූල්‍ය ආයතන එකතු කර ගනු ලබන අරමුදල් පරිපාලක වෙත ලබාදීමට ජූනි 30 සිට හෝ දෙසැම්බර් 31 දින සිට දින 30 කටත් වඩා වැඩි කාලයක් ගතවේ නම්, එම කාලය තුළදී ණය ආපසු අයකර ගැනීම් සඳහා පරිපාලක විසින් තීරණය කරනු ලබන දණ්ඩනීය අනුපාතය, ප්‍රමාදවන කාලය සඳහා අදාළ වේ. ප්‍රමාදයක් සිදු වුවහොත්, සහභාගිත්ව මූල්‍ය ආයතන, පරිපාලක විසින් තීරණය කරන ලද දණ්ඩනීය අනුපාතය මුදල් එවීමේදී එයට එකතු කළ යුතුය.

16.4 සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් පරිපාලකගෙන් ලැබුණ මුළු ණය ඇප ආවරණ, අය කරන ලද පොලී අනුපාත, ණය ආපසු අයකර ගැනීම් ආදිය දක්වමින් ලේඛනයක් පවත්වාගෙන යා යුතු අතර, එම ලේඛනය මහ බැංකු නිලධාරීන් විසින් සිදු කරනු ලබන පරීක්ෂණයකදී ඔවුන්ට ලබා දිය යුතුය.

16.5 සහභාගිත්ව මූල්‍ය ආයතනයේ මූලස්ථානය විසින් එක් එක් ශාඛාවන් මගින් ගෙවිය යුතු මුදල් ප්‍රමාණය එක් කළ යුතු අතර, සෑම වසරකම ජූනි 30 සිට සහ දෙසැම්බර් 31 දින සිට දින 30 ක් ඇතුළත ණය ආපසු අයකර ගැනීමේ ආකෘතිය සමග චෙක්පතක් හෝ විද්‍යුත් ගෙවීමක් මගින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත භාර දිය යුතුය. යම් ප්‍රමාදයක් සිදු වුවහොත්, ආකෘතිය සමග චෙක්පත හෝ විද්‍යුත් ගෙවීම භාරදිය යුතු අවසන් දිනයේ සිට ප්‍රමාද වන කාලය සඳහා පරිපාලක විසින් තීරණය කරන ලද දණ්ඩනීය අනුපාතය, සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් එකතු කළ යුතුය.

**17. පරීක්ෂණ**

17.1 යෝජනා ක්‍රමය යටතේ ලබාදෙන ලද ණය පරීක්ෂණය පිළිබඳ පරීක්ෂා කිරීමට ක්ෂේත්‍ර චාරිකා සිදු කිරීම සහ සහභාගිත්ව මූල්‍ය ආයතනවල ගිණුම් සහ වෙනත් පොත්පත් පරීක්ෂා කිරීමේ අයිතිය පරිපාලක සතුය. සහභාගිත්ව ආයතන විසින් හිමිකම් නිකුත් කිරීමේ සිට වසර 3 ක කාලයක් දක්වා පරිපාලක වෙත එවැනි විගණනයකට අයිතියක් ඇත.

**18. වාර්තාකරණය**

18.1 ඇප ආවරණ භාවිතා කිරීම, එකතු කළ වාරික ඇත්නම් ආයෝජන ආදායම, හිමිකම් ගෙවීම් සහ මෙම ඇප ආවරණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වීමට අදාළ දත්ත සහ තොරතුරු ඇතුළත් වාර්තාවක් පරිපාලක විසින් සෑම 6 මසකටම වරක් ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය වෙත ලබා දිය යුතුය.

**19. වෙනස් කිරීම සහ පරිපූරක නියෝග**

19.1 වෙනස් කිරීමට හෝ අයිතීන්ට බලනොපාන පරිදි යෝජනා ක්‍රමය අහෝසි කිරීමට හෝ එවැනි දැනුම් දීමේ දිනට පෙර මෙම යෝජනා ක්‍රමය යටතේ නිකුත් කරන ලද ඕනෑම ඇපකරයක් මගින් පැන නගින වගකීම් සඳහා ශ්‍රී ලංකා රජය සහ පරිපාලක අයිතිය රඳවා තබා ගනී. මෙයට අදාළව මෙම ණය යෝජනා ක්‍රමයේ විශේෂයෙන් සඳහන් කර නොමැති යම් කරුණක් නම්, සහ එය මෙම ණය යෝජනා ක්‍රමයේ අරමුණ සඳහා අවශ්‍ය විය හැකි නම් පරිපාලක විසින් එවැනි අතිරේක හෝ අමතර නියෝගයන් සකස් කළ යුතුය.

මෙම මෙහෙයුම් උපදෙස්, ගැලපුම් ප්‍රදාන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වන දිනයේ සිට ක්‍රියාත්මක වේ.

ඩී.වී.එස්. දයාවංශ මිය
**අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන**
**දෙපාර්තමේන්තුව**

ඇමුණුම I

## ලියාපදිංචි වීමේ අයදුම්පත

### ආංශික ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය - කෘෂිකාර්මික අංශය නවීකරණ ව්‍යාපෘතිය

සහභාගිත්ව ආයතනයේ නම .................................................................... ශාඛාව ..................................................

1. ණයගැතියාගේ/සමාගමේ නම: ....................................................................................

2. ණයගැතියාගේ/සමාගමේ ලිපිනය: ....................................................................................

3. ණයගැතියාගේ ජාතික හැඳුනුම්පත් අංකය/සමාගමේ ලියාපදිංචි අංකය: ..........................................

4. ව්‍යාපෘතියේ ස්වභාවය (කෙටියෙන්): ....................................................................................

5. මුළු ණය ප්‍රමාණය: ...............................................................

6. ණය මුදල මුදා හරින ලද දිනය: (මාසය/දිනය/වර්ෂය): ...............................................................

7. ණය ඇප ආවරණ වාරිකය සියයට 0.5 දී (රු.): ...............................................................

කළමනාකරුගේ නම: .......................................... අත්සන: ..........................................

දිනය: .......................................... ශාඛා නිල මුද්‍රාව:

ඇමුණුම II

**ණය ඇප ආවරණ සඳහා හිමිකම් අයදුම්පත**

**ආංශික ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය - කෘෂිකාර්මික අංශය නවීකරණ ව්‍යාපෘතිය**

සහභාගිත්ව මූල්‍ය ආයතනයේ නම: .......................................... ශාඛාව: ..........................................

1. ණය ගැතියාගේ/සමාගමේ නම: ...............................................................

2. ප්‍රදානය කරන ලද ණය මුදල (රු): ...............................................................

3. ආපසු අයකර ගන්නා ලද මුදල (රු.): ...............................................................

4. වාර්තා කරන දිනය වන විට ගෙවීමට ඇති ණය ප්‍රමාණය (රු.): ...............................................................

5. උසාවියේ නම: ...............................................................

6. නීතිමය ක්‍රියාමාර්ග ගන්නා ලද දිනය: ...............................................................

(මාසය/දිනය/වර්ෂය)

7. නඩු අංකය : ..........................................

8. ශුද්ධ අලාභය : ..........................................

කළමනාකරුගේ නම: .......................................... අත්සන: ..........................................

දිනය: .......................................... ශාඛාවේ නිල මුද්‍රාව:

ඇමුණුම III

**ප්‍රතිලේඛනගතකරණය සඳහා අයදුම්පත**

**ආංශික ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය - කෘෂිකාර්මික අංශය නවීකරණ ව්‍යාපෘතිය**

සහභාගිත්ව මූල්‍ය ආයතනයේ නම: .......................................... ශාඛාව: ..........................................

1. ණයගැතියාගේ/සමාගමේ නම: ...............................................................

2. ණයගැතියාගේ/සමාගමේ ලිපිනය: ...............................................................

3. ලබාදෙන ලද ණය මුදල: ...............................................................

4. ප්‍රතිලේඛනගත කරන ලද මුදල: ...............................................................

5. ප්‍රතිලේඛනගත කරන ලද දිනය: ...............................................................

6. ණය ප්‍රතිලේඛනගත කරන ලද කාලසීමාව: ...............................................................

(මාස ගණන)

කළමනාකරුගේ නම: .......................................... අත්සන: ..........................................

දිනය: .......................................... ශාඛා නිල මුද්‍රාව:

ඇමුණුම IV

**ලබා දෙන ලද හිමිකම් ආපසු අයකර ගැනීම පිළිබඳ විස්තර**

**ආංශික ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය - කෘෂිකාර්මික අංශය නවීකරණ ව්‍යාපෘතිය**

සහභාගිත්ව මූල්‍ය ආයතනයේ නම : .......................................... ශාඛාව : ..........................................

1. ණයගැතියාගේ/සමාගමේ නම : ...............................................................

2. ලබාදෙන ලද ණය ප්‍රමාණය (රු) :...............................................................

3. ණය ඇපආවරණ ලෙස පියවූ මුදල : ...............................................................

4. ණයගැතියාගෙන් ආපසු අයකර ගත් මුදල (රු) : ..........

5. ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා දිය යුතු මුදල (රු) : ..........

කළමනාරුගේ නම : .......... අත්සන : ..........

දිනය : .......... නිල මුද්‍රාව :

ඇමුණුම V

ණය මුදල් ලබා ගත හැකි සහභාගිත්ව මූල්‍ය ආයතන

- ලංකා බැංකුව
- මහජන බැංකුව
- කොමර්ෂල් බැංකුව
- හැටන් නැෂනල් බැංකුව
- සම්පත් බැංකුව
- සෙලාන් බැංකුව
- ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
- පෑන් ඒෂියා බැංකුව
- ඩී එෆ් සී සී බැංකුව
- ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව
- නේෂන්ස් ට්‍රස්ට් බැංකුව
- කාගීල්ස් බැංකුව
- රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

**දළ සැලැස්ම - 1 හිමිකම් පෑමේ ක්‍රියාවලිය**



**මෙහෙයුම් උපදෙස් අංකඃ RDD/NADeP/YOUTH 2016/01 (සංශෝධනය)** 2017 ජූලි 11

සියලුම සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත,

## ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක "තරුණ දිරිය" තාරුණ්‍ය සවිබල ගැන්වීම සහ රැකියා ව්‍යාපෘතියෙහි මෙහෙයුම් උපදෙස්

ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහනෙහි (NADeP) ක්‍රියාකාරී ජාතික කමිටුව විසින් ගත් තීරණයකට අනුව "තරුණ දිරිය" යෞවනය සවිබල ගැන්වීමේ සහ රැකියා ව්‍යාපෘතියෙහි විශේෂ සැලසුමක් යටතේ තෝරාගත් තරුණ, තරුණියන් සඳහා ලබා දෙන උපරිම ණය ප්‍රමාණය රුපියල් මිලියන 1 දක්වා වැඩි කෙරෙනු ඇත.

ඒ අනුව, 2016 අගෝස්තු 03 දිනැති මෙහෙයුම් උපදෙස් අංක RDD/NADeP/YOUTH 2016/01 හි 07 වන වගන්තිය, ඇමුණුම 01 හි පරිදි සංශෝධනය කර ඇති බව මෙයින් ඔබට දැනුම් දෙනු ලැබේ.

රු.150,000 - රු.1,000,000 කාණ්ඩය යටතේ උපණය ලබා ගැනීම සඳහා තෝරා ගැනීමේ නිර්ණායක ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහනෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මගින් ඉදිරියේදී ඔබට දැනුම් දෙනු ඇත.

අනෙකුත් සියලුම නියමයන් හා කොන්දේසි නොවෙනස්ව පවතී.

සංශෝධිත මෙහෙයුම් උපදෙස් ක්‍රියාත්මක වන දිනය වන්නේ 2017.07.11

මෙම සංශෝධනයේ අඩංගු තොරතුරු ඔබේ බැංකු ශාඛාවල අදාළ නිලධාරීන් වෙත දැනුම් දෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

මෙයට - විශ්වාසී
**ඩී.වී.එස්. දයාවංශ මිය**
**අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන**

පිටපත්: ආචාර්ය යසන්තා මාපටුන,
ව්‍යාපෘති කළමනාකාරිනි,
NADeP

**මෙහෙයුම් උපදෙස් අංකඃ RDD/NADeP/PEARL/2017/01**

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ.පෙ. අංක 590
අංක. 30, ජනාධිපති මාවත
කොළඹ 01
2017 ජූලි 21

සියලුම සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත,

## මෙහෙයුම් උපදෙස්

## ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැටසටහන (NADeP) යටතේ ක්‍රියාත්මක, "ආපදා වලින් පසු ආර්ථික කටයුතු නැවත නගා සිටුවීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය" (PEARL)

**01. හැඳින්වීම**

මෑතකදී ඇතිවූ ගංවතුර හා නියඟයන් හේතුවෙන් පීඩාවට පත් වූ ව්‍යාපාර/කුඩා ව්‍යවසායයන් නැවත ආරම්භ කිරීම සඳහා සහයෝගය දැක්වීමේ අරමුණින් ආපදා වලින් පසු ආර්ථික කටයුතු නැවත නගා සිටුවීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය (PEARL) (මින් මතු ණය යෝජනාක්‍රමය ලෙස හැඳින්වෙන) ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන (මින් මතු වැඩසටහන ලෙස හැඳින්වෙන) යටතේ හඳුන්වා දී ඇත. ඒ සඳහා, කෘෂි කාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල මගින් අරමුදල් සපයන අතර ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති ඒකකය (PMU) මගින් ක්‍රියාත්මක වේ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL), ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව ණය වැඩසටහනේ විධායක නියෝජිතයා ලෙස ක්‍රියා කරයි.

**02. අරමුදල් වෙන් කිරීම**

2.1 ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා පළමු වාරිකය ලෙස මෙම වැඩසටහන සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 3.4 ක් වෙන් කර ඇත. 2017 අගෝස්තු මාසය අවසානය වන විට අරමුදල් මුදා හැරීම සම්පූර්ණ කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය අපේක්ෂා කරනු ලබන අතර, 2017 සැප්තැම්බර් මස අවසානය වන විට මෙම ණය යෝජනා ක්‍රමය සඳහා අරමුදලේ දෙවැනි වාරිකය ලබා දෙනු ඇත.

2.2 වැඩසටහනේ පෙර ණය යෝජනා ක්‍රම සඳහා සහභාගි වූ සියලුම සහභාගිත්ව මූල්‍ය ආයතන (PFIs) හරහා මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලැබේ.

2.3 මෙම යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් හි කොන්දේසි සහ විධානයන් අනුව, 2017 ඔක්තෝබර් අග වන විට ණය යෝජනා ක්‍රමය යටතේ වෙන් කරන ලද මුළු මුදල් ප්‍රමාණයම මුදා හැරීම සහභාගිත්ව මූල්‍ය ආයතනය විසින් සිදු කළ යුතුය.

2.4 ඉහත 2.3 වගන්තියේ දක්වා ඇති මුදා හැරීම් ඉලක්ක සපුරා ගැනීම සඳහා ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම ආරම්භයේදීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සමග ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සම්බන්ධීකරණය කරන අතරම එක් එක් සහභාගිත්ව මූල්‍ය ආයතන සමග සාකච්ඡා කිරීම සහ මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා දීම සඳහා සෑම සහභාගිත්ව මූල්‍ය ආයතනයක් වෙතම ණය ඉලක්කයන් හා අරමුදල් වෙන් කිරීම සිදු කරනු ලැබේ.

**03. ණය යෝජනා ක්‍රමයේ අරමුණු**

3.1 ණය යෝජනා ක්‍රමයේ මූලික පරමාර්ථය වන්නේ, මෑතකාලීන ගංවතුර හා නියඟයෙන් පීඩාවට පත් වූ ව්‍යාපාර/කුඩා ව්‍යාපාර සඳහා අරමුදල් අවශ්‍යතා සැපයීම මගින් ඔවුන්ගේ ව්‍යාපාර හෝ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් නැවත ආරම්භ කිරීම සඳහා සහාය දැක්වීම.

**04. ක්‍රියාත්මක වන ප්‍රදේශ**

ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වන ප්‍රදේශ පහත 4.1 සහ 4.2 අංශයන්හි දක්වා ඇත.

මීට අමතරව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ STARR කුඩා තේ වතු හා රබර් පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති කාර්යාලය මගින් නිවේදනය කරනු ලබන ජල ගැලීම් හා නියඟයෙන් හානියට පත් ප්‍රදේශ මෙම ණය යෝජනා ක්‍රමය යටතේ සලකා බලනු ලැබේ.

4.1 ගංවතුරෙන් හානියට පත් ප්‍රදේශ

ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් තීරණය කරන ලද ගංවතුරින් ආපදාවලට ලක්වූ දිස්ත්‍රික්ක පහත සඳහන් පරිදි වේ.

1. කෑගල්ල
2. රත්නපුර
3. ගාල්ල
4. හම්බන්තොට
5. මාතර
6. නුවරඑළිය
7. කළුතර
8. ගම්පහ
9. කොළඹ

4.2 නියඟයෙන් ආපදාවලට ලක් වූ ප්‍රදේශ : දිවයින පුරා

**05. ණය යෝජනා ක්‍රමයේ මූලික ලක්ෂණ**

5.1 උපරිම උපණය සීමාව : රුපියල් 150,000/-

5.2 සුදුසුකම්

ඉහත 04 වගන්තියේ සඳහන් කර ඇති ප්‍රදේශයන්හි මෑතකදී ඇති වූ ගංවතුර/නියඟයෙන් හානියට පත් වූ ඕනෑම ව්‍යාපාරික/කුඩා ව්‍යාපාරයක් නැවත ආරම්භ කිරීමට අරමුදල් සැපයීම සඳහා

5.3 ප්‍රතිමූල්‍ය

සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් මුදා හරින ලද උපණය සඳහා ලබා දෙන මුදලෙන් සියයට සියයක්ම ප්‍රතිමූල්‍ය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දෙයි.

5.4 පොලී අනුපාතය

සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත : වාර්ෂිකව සියයට 3.25
අවසාන ණයලාභියාට : වාර්ෂිකව සියයට 6.5

5.5 ණය ආරක්ෂණය

ව්‍යාපාර/කුඩා ව්‍යවසාය ක්‍රියාකාරකම් ශක්‍යතාවයට ප්‍රමුඛත්වය ලබා දිය යුතුය. මීට අමතරව, අනෙකුත් ණය ලබා ගන්නන් දෙදෙනෙකුගේ අන්තර්-ඇප සහතිකය වැනි වෙනත් ආදේශක ඇපයක් හෝ සහභාගිත්ව මූල්‍ය ආයතනයට පිළිගත හැකි පුද්ගල ඇප දෙකක් මෙම ණය යෝජනා ක්‍රමය යටතේ සුරැකුම්පත් වශයෙන් සැලකිය හැකිය.

5.6 උපණය සඳහා ආපසු ගෙවීමේ කාලය හා සහන කාලය

ව්‍යාපාරයේ/කුඩා ව්‍යවසායේ ස්වභාවය අනුව, මාස 04 ක උපරිමයක සහන කාලයක් ඇතුළත්ව උපරිම මාස 12 කි. කෙසේ වෙතත් සහන කාලසීමාව තුළ ණයගැතියන් විසින් පොලී ගෙවීමට බැඳී සිටී.

**06. සුදුසුකම්ලත් ප්‍රතිලාභීන්**

6.1 04 වන වගන්තියේ සඳහන් ප්‍රදේශවල ගංවතුර/නියඟය හේතුවෙන් පීඩාවට ලක් වූ ව්‍යාපාර/කුඩා ව්‍යවසායයන් පුනර්ජීවනය කිරීමට අවශ්‍ය අරමුදල් සපුරා ගැනීම සඳහා ණය ලබා ගැනීමට කැමති තනි පුද්ගලයන් හෝ පුද්ගල කණ්ඩායමක් සඳහා ණය යෝජනා ක්‍රමය විවෘතව පවතී.

6.2 උපණය අයදුම්කරුවන් විසින් සහභාගිත්ව මූල්‍ය ආයතනයට පිළිගත හැකි ග්‍රාම නිලධාරී, පූජකවරු ආදීන්ගෙන් ලබා ගන්නා ලද ලිපියක් එය සනාථ කිරීම සඳහා සාක්ෂි ලෙස ඉදිරිපත් කළ යුතුය.

(අ) මෑත කාලයේ පැවති ගංවතුර/නියඟය මගින් උපණය ඉල්ලුම්කරුගේ ව්‍යාපාරය/කුඩා ව්‍යවසායයට බලපෑම් සිදු වීම සලකා බැලීමට සහ

(ආ) මෑත කාලයේ පැවති ගංවතුර/නියඟය අවස්ථාවේ ව්‍යාපාර/කුඩා ව්‍යවසාය ක්‍රියාත්මක වී ඇති බව

මෙම සාක්ෂි කළමනාකරුගේ හෝ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකුගේ පරීක්ෂණ වාර්තාවක් මගින් සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් තහවුරු කළ යුතුය.

**07. සහභාගිත්ව මූල්‍ය ආයතනවල කාර්යභාරය හා වගකීම්**

ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කළ යුතුය. සහභාගිත්ව මූල්‍ය ආයතන විසින්;

7.1 ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය වෙන් කරන ලද බවට සහතික වීම.

7.2 ණය ලබා දීම සහ අයකර ගැනීම පිළිබඳ පූර්ණ වගකීම භාර ගැනීම.

7.3 මෙම ණය යෝජනා ක්‍රමය යටතේ 5.4 හි සඳහන් වන අනුපාතයට වඩා වැඩි පොලී අනුපාතිකයක් යටතේ කිසිදු හේතුවක් මත අවසාන ණයකරුවන්ට නොදෙන බවට සහභාගිත්ව මූල්‍ය ආයතනයේ ඕනෑම ශාඛාවක් විසින් සහතික වීම.

7.4 ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව තෘප්තියට පත් වන අයුරින් ඉහත 6 වගන්තියට අනුව, උපණය අයදුම්කරුවන්ගෙන් අලාභය පිළිබඳ තහවුරුවක් ලබා ගැනීම.

7.5 එක් එක් ව්‍යාපාරය/කුඩා ව්‍යවසාය මූල්‍යමය වශයෙන් ශක්‍ය වීම සහ ආර්ථික වර්ධනයට දායක වීම සහ අලෙවිකරණයට සුදුසු වීම.

7.6 ගිණුම් සහ මූල්‍ය වාර්තා පවත්වා ගැනීම

(අ) උපණය ඇගයීම්, අනුමැතීන්, ණය මුදාහැරීම් හා ණය ආපසු අයකර ගැනීම් සඳහන් කිරීමට අදාළ වාර්තා සහ සුදුසු ගිණුම් සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් පවත්වා ගෙන යා යුතුය.

(ආ) ණය ලබා ගැනීම් සහ ප්‍රතිමූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වෙන වෙනම ගිණුම් පවත්වාගෙන යාම සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් සිදු කළ යුතුය.

(ඇ) සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවට හා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (IFAD වෙනුවෙන්) වෙත විමර්ශනය හා සමාලෝචනය සඳහා ගිණුම් හා මූල්‍ය වාර්තා ලබා දිය යුතුය. තවද, සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් අවශ්‍ය ඕනෑම අවස්ථාවකදී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සහ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත ගිණුම් හා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය.

7.7 මෙහෙයුම් උපදෙස්හි සඳහන් ලියාපදිංචි ක්‍රියාවලිය හා ප්‍රතිමූල්‍ය ක්‍රියාවලිය අනුගමනය කළ යුතුය.

**8. ණය ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය**

ණය ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය පහත පරිදි සිදු කළ යුතුය.

8.1 ණය ඇගයීමෙන් පසු සහභාගිත්ව මූල්‍ය ආයතනය විසින් මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා ගැනීමට අපේක්ෂා කරන සෑම ණය අයදුම්කරුවෙකුගෙන්ම සම්පූර්ණ කරන ලද ලියාපදිංචි කිරීමේ ආකෘති (ඇමුණුම 1) ලබා ගත යුතුය.

ඇමුණුම II හි දක්වා ඇති ආකෘතිය අනුව, අයදුම්කරුවන්ගේ සාරාංශගත විස්තර සහභාගිත්ව මූල්‍ය ආයතනයේ ප්‍රධාන කාර්යාලය හරහා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුය.

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ණය ඉල්ලුම්පත්හි මුල් පිටපත් අවශ්‍ය අවස්ථාවන්හිදී, සහභාගිත්ව මූල්‍ය ආයතන වෙතින් ඉල්ලුම් කරනු ලැබේ.

8.2 සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගේ විස්තර ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි කරන අතර, ලියාපදිංචි වී ඇති සෑම ණය ඉල්ලුම්පතක් සඳහාම විමසීම් අංකයක් ලබා දීමත් එය සහභාගිත්ව මූල්‍ය ආයතනයේ ප්‍රධාන ශාඛාව වෙත දැනුම් දීමත් සිදු කෙරෙනු ඇත.

8.3 ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවට තවදුරටත් පැහැදිලි කිරීමක් අවශ්‍ය වූ විට ලියාපදිංචි කිරීමේ අයදුම්පත සහභාගිත්ව මූල්‍ය ආයතනය වෙත යොමු කිරීමට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවට හිමිකම ඇත.

ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන් නිලධාරීන් විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ කළමනාකරුගේ අවසරය මත විටින් විට හා අවශ්‍ය අවස්ථාවන්හිදී ශාඛා හා ප්‍රධාන කාර්යාලය වෙත පැමිණ ණය එතැන් පරීක්ෂණ සිදු කරනු ඇත.

**9. ප්‍රතිමූල්‍ය ක්‍රියාවලිය**

9.1 මෙම මෙහෙයුම් උපදෙස්වල නියමයන් සහ කොන්දේසිවලට යටත්ව කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන අන්තර්ජාතික අරමුදල විසින් සපයනු ලබන අරමුදල් යොදා ගනිමින් ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දී ඇති සියලුම ණය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 100% ප්‍රතිශතයක් ප්‍රතිමූල්‍ය සපයයි.

9.2 බැංකු ශාඛා මගින් ණය නිදහස් කළ පසුව සම්පූර්ණ කරන ලද ප්‍රතිමූල්‍ය අයදුම්පත් සහභාගිත්ව මූල්‍ය ආයතනවල ප්‍රධාන කාර්යාලය විසින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත එවිය යුතුය. කෙසේ වුවද, මෙම වැඩසටහන යටතේ ණය ලබා දීම 2017 ඔක්තෝබර් අවසානයේ අවසන් විය යුතු අතර, මෙම ණය යෝජනා ක්‍රමය යටතේ සියලු ප්‍රතිමූල්‍ය හිමිකම් 2017 නොවැම්බර් 15 දිනට පෙර ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

9.3 සෑම ප්‍රතිමූල්‍ය අයදුම්පතක්ම පහත සඳහන් ලේඛන සමග ඉදිරිපත් කළ යුතුය.

(අ) ඇමුණුම I ප්‍රතිමූල්‍ය අයදුම්පත (අ)

(ආ) ඇමුණුම II ප්‍රතිමූල්‍ය සඳහා මුදා හරින ලද ණය අයදුම්පතෙහි ප්‍රකාශනය (ආ)

(ඇ) ඇමුණුම III ඉල්ලීම් පොරොන්දු නෝට්ටුව

(ඈ) ඇමුණුම IV බෙදාහැරීමේ ලිපිය

(ඉ) ඇමුණුම V ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ප්‍රතිඥා පැවරුම්

(ඊ) මුදාහැරීමේ ලිපිය

9.4 ඉහත 9.2 වගන්තියේ දක්වා ඇති නියමිත කාලසීමාවට යටත්ව, ණය මුදාහල දිනයේ සිට මසක් ඇතුළත සහභාගිත්ව මූල්‍ය ආයතනයේ ප්‍රධාන කාර්යාලය හරහා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ප්‍රතිමූල්‍ය අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

9.5 පළමු සේවා සැපයීමේ ක්‍රමය මත ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිමූල්‍ය අයදුම්පත අනුමත කරනු ලබන අතර, සම්පූර්ණ කරන ලද ප්‍රතිමූල්‍ය අයදුම්පත් ලැබීමෙන් සති 02 ක් ඇතුළත ප්‍රතිමූල්‍ය ලබාදීමට කටයුතු කෙරේ.

**10. ණය ආපසු ගැනීම**

10.1 සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ලබා දෙන ප්‍රතිමූල්‍ය සඳහා වන ප්‍රාග්ධනය හා පොලිය අර්ධ වාර්ෂිකව අයකර ගනු ලැබේ.

උදා:- සෑම වසරකම ජූනි 30 සහ දෙසැම්බර් 31

10.2 ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි ඇති ප්‍රතිමූල්‍ය ගෙවීම් සඳහා වූ ආපසු ගෙවීම් කාලසටහනට අනුව, ප්‍රතිමූල්‍ය ණය සඳහා ප්‍රාග්ධනය සහ පොලී සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ගෙවිය යුතුය.

10.3 මෙම ණය යෝජනා ක්‍රමය යටතේ සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත උපරිම මාස 12 කින් ණය ආපසු ගෙවිය යුතුය.

**11. ගිණුම් විගණනය**

11.1 ණය යෝජනා ක්‍රමයෙහි වාර්ෂික මූල්‍ය ප්‍රකාශන හා එවැනි මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති විසින් විගණනය කරනු ඇත. විගණකාධිපතිගේ වාර්තාවේ සහතික කළ පිටපතක් එය ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවට ලද විගස කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික අරමුදල වෙත යොමු කෙරෙනු ඇත.

11.2 කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ අන්තර්ජාතික අරමුදලෙහි අවශ්‍යතාවයක් වන නිසා මෙම ණය යෝජනා ක්‍රමය පිළිබඳ විගණනය කරන ලද මූල්‍ය හා ගිණුම්/ප්‍රකාශන ලබා ගැනීම සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් සිදු කළ යුතුය.

**12. සාමාන්‍ය කොන්දේසි**

12.1 ණය යෝජනා ක්‍රමයට අදාළ වන නියමයන් හා කොන්දේසි අවශ්‍ය විටදී සංශෝධනය කිරීමට

12.2 මෙම ණය යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් උපදෙස් වලට අනුකූල නොවන ආකාරයෙන් ඕනෑම බැංකුවක් කටයුතු කර ඇති අවස්ථාවකදී එහි සහභාගිත්ව මූල්‍ය ආයතනයක් ලෙස මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම අත්හිටුවීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයට අයිතිය ඇත.

ඩී.වී.එස්. දයාවංශ මහත්මිය
**අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

**උප ග්‍රන්ථ 01: ප්‍රතිමූල්‍ය අයදුම්පත (අ)**

**ප්‍රතිමූල්‍ය අයදුම්පත් අංකය :** ..........................................

**(මෙහෙයුම් උපදෙස් අංක : (RDD/NADeP/PEARL/2017/01)**

ලිපිනය : ..........................................................................................................................................................

දිනය : ..........................................

**ප්‍රතිමූල්‍ය අයදුම්පත :**
**ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක "PEARL" යෝජනා ක්‍රමය**

ශ්‍රී ලංකා මහ බැංකුව වෙත,

මහත්මයාණෙනි,

.......................................................................................................................... (සහභාගිත්ව මූල්‍ය ආයතනයේ නම) වන අප බලපත්‍රලාභී වාණිජ බැංකුවක්/බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් සහ ව්‍යවස්ථාපිත දැනට පවතින ආයතනයක් ලෙස ඉහත ණය යෝජනා ක්‍රමය යටතේ රුපියල් .......................................................................................................................... (රු ..........................................) ණය මුදල අයදුම් කරමු.

2. මෙම අයදුම්පත ඉදිරිපත් කිරීමේදී ඔබගේ මෙහෙයුම් උපදෙස් අංකය RDD/NADeP/PEARL/2017/01 හි දක්වා ඇති නියමයන් හා කොන්දේසිවලට යටත්ව මෙම අයදුම්පත ඉදිරිපත් කරමු.

3. ඉහත කී මෙහෙයුම් උපදෙස්වලට අනුකූලව ඉහත ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ අයදුම් කළ දිනට අප විසින් මසක් ඇතුළත ප්‍රදානය කරන ලද ණය ප්‍රකාශනයෙහි අනු පිටපතක් මේ සමග අප එවා ඇත. මෙම ප්‍රකාශනයෙහි සඳහන් ණය කිසිවක් ප්‍රතිමූල්‍ය ණය සඳහා මීට පෙර ඉදිරිපත් කරන ලද කිසිම ප්‍රකාශනයක සඳහන් නොවන බවට සහතික කරමු.

4. (i) තුන්වන ඡේදයේ සඳහන් පරිදි ඉහත ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා දෙන ව්‍යාපෘති සඳහා සුදුසුකම්ලත් උපණයකරුවන්ට ණය ප්‍රදානය කිරීමත්,

(ii) එම ණය අදාළ උපණයකරුවන්ට ණය ලබා ගැනීමේ බලයට යටත්ව ණය ලබා දී ඇත.

(iii) ඇපකරුවන් සම්බන්ධව සලකන විට ණය ආපසු ගෙවීම සම්බන්ධව ඇපවන පුද්ගලයන් එවැනි ඇප වීමක් ලබා දීම සඳහා බලයලත් තැනැත්තෙකු ද යන්න බව.

අප සහතික වන බව දන්වා සිටිමු.

**මූල්‍ය ආයතනයේ බලයලත් නිලධාරියාගේ නම**
**විස්තර හා අත්සන**
**කළමනාකරු,**
**ප්‍රතිමූල්‍ය ඒකකය**

**උප ග්‍රන්ථය II: ප්‍රතිමූල්‍ය අයදුම්පත (අ)**

**ප්‍රතිමූල්‍ය අයදුම්පත් අංකය :** ..........................................

**(මෙහෙයුම් උපදෙස් අංකය :** (RDD/NADeP/PEARL/2017/01)

**ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන**
**"PEARL" යෝජනා ක්‍රමය**

වෙත : ශ්‍රී ලංකා මහ බැංකුව

වෙතින් : ප්‍රතිමූල්‍ය ඒකකය

සහභාගිත්ව මූල්‍ය ආයතනය : .......................................... ශාඛාව : .......................................... දිස්ත්‍රික්කය : ..........................................

<table>
<tr><th rowspan="3">විමසුම් අංකය</th><th rowspan="3">ණයකරුගේ නම හා ලිපිනය</th><th rowspan="3">ජා.හැ.අංකය</th><th rowspan="3">ණය ලබා ගැනීමේ අරමුණ*</th><th colspan="2">ණය මුදල</th><th rowspan="3">මුදාහරින දිනය</th><th colspan="2">මුදා හැරීමට බලාපොරොත්තු ප්‍රතිමූල්‍ය ප්‍රමාණය</th><th rowspan="3">සහන කාලය</th><th colspan="4">නැවත පියවීමේ ආකෘතිය</th></tr>
<tr><th rowspan="2">ණය චක්‍රය**</th><th rowspan="2">ණය මුදල</th><th rowspan="2">වාරික ගණන</th><th rowspan="2">මුදල (රු.)</th><th colspan="2">වාරික</th><th rowspan="2">පළමු වාරිකය ගෙවිය යුතු දිනය</th><th rowspan="2">අවසන් වාරිකය ගෙවිය යුතු දිනය</th></tr>
<tr><th>වාරික ගණන</th><th>වටිනාකම</th></tr>
<tr><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td></tr>
<tr><td>එකතුව</td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td><td></td></tr>
</table>

ශ්‍රී ලංකා මහ බැංකුව හා සහභාගිත්ව මූල්‍ය ආයතන අතර ප්‍රතිමූල්‍ය ගිවිසුමට එකඟ වූ පරිදි, ඉහත දක්වා ඇති ණය මුදල නැවත ගෙවීමේ උපලේඛනය අනුව, අර්ධ වාර්ෂිකව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පියවන බවට අප විසින් පොරොන්දු වෙමු.

**බලයලත් නිලධාරියාගේ අත්සන**

දිනය :

*මෙහෙයුම් උපදෙස්හි 4 වන ඡේදයේ සඳහන්ව ඇති පරිදි
**පළමු ණය මුදල, දෙවන ණය මුදල, තෙවන ණය මුදල ආදී ලෙස

**උප ග්‍රන්ථය III: ප්‍රතිමූල්‍ය අයදුම්පත (අ)**

**ප්‍රතිමූල්‍ය අයදුම්පත් අංකය :** ..........................................

**(මෙහෙයුම් උපදෙස් අංක :** (RDD/NADeP/PEARL/2017/01)

**ඉල්ලුම් පොරොන්දු නෝට්ටුව**

.......................................................................................................................................................................................... (සහභාගිත්ව මූල්‍යායතනයේ නම හා ලිපිනය) වන අප විසින් පහත අත්සන් කළ මුළු ණය මුදල වන රුපියල් .......................................... (රු.......................................... ) මුදල වාර්ෂිකව .......................................... % පොලී අනුපාතය යටතේ වූ පොලී මුදල ද සමග මෙහි සඳහන් දිනට, ශ්‍රී ලංකා මහ බැංකුව ඉල්ලන විට පියවීම සිදු කරන බවට කොළඹ දී මෙයින් පොරොන්දු වෙමු.

............................................................
(සහභාගිත්ව මූල්‍යායතනයේ නම)
ප්‍රතිමූල්‍ය ඒකකය
ප්‍රධාන කාර්යාලය

..........................................
(රබර් මුද්‍රාව)

සාක්ෂි :

1. ............................................................ 1. ............................................................
2. ............................................................ 2. ............................................................

**උප ග්‍රන්ථ IV: භාරදීමේ ලිපිය**

**ප්‍රතිමූල්‍ය අයදුම්පත් අංකය :** ..........................................

**(මෙහෙයුම් උපදෙස් අංක :** (RDD/NADeP/PEARL/2017/01)

**භාරදීමේ ලිපිය**

ශ්‍රී ලංකා මහ බැංකුව වෙත,

ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක "PEARL" යෝජනා ක්‍රමයට අදාළව 2016.08.03 දිනැති (NADeP) මෙහෙයුම් උපදෙස් අංක RDD/NADeP/PEARL/2017/01 පරිදි ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමය යටතේ ණය ලබාදීම සලකා බලා එකඟ වූ ණය ප්‍රමාණය වන රුපියල් ........................................................................................................................ (රු. ..........................................) මුදල සඳහා වූ පොරොන්දු නෝට්ටුවේ රුපියල් ........................................................................................................................ (රු. ..................................) ක මුදල, ඉල්ලුම් කරන ලද පොලී මුදල ද සමග මෙයින් එවනු ලැබේ.

ඉහත කී පොරොන්දු නෝට්ටුව ගෙවීම සඳහා ඉදිරිපත් කිරීමෙන් වැළකෙන බැවින්, එය අගරු කිරීමට දැනුම්දීමේ අවශ්‍යතාවයක් ඇති නොවනු ඇත.

.............................................................

1. ............................................................ වෙනුවෙන් (සහභාගිත්ව මූල්‍යායතනයේ නම)

2. ............................................................ ප්‍රතිමූල්‍ය ඒකකය

(බලයලත් නිලධාරීන්ගේ අත්සන්) ප්‍රධාන කාර්යාලය

**උප ග්‍රන්ථ V: පැවරුම් ලිපිය**

**ප්‍රතිමූල්‍ය අයදුම්පත් අංකය :** ............................................................

**(මෙහෙයුම් උපදෙස් අංක : (RDD/NADeP/PEARL/2017/01)**

**දිනය :** ............................................................

**මුදල් නීති පනතේ පරිච්ඡේද අංක 88 A යටතේ, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයට ඇප වන බවට දෙනු ලබන ප්‍රතිඥාව***

අපි ............................................................ (සහභාගිත්ව මූල්‍යායතනයේ නම හා ලිපිනය) මුදල් නීති පනතේ පරිච්ඡේද අංක 88 A හි කොන්දේසිවලට අනුව සහ පහත දැක්වෙන උප ලේඛනයට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවට අප විසින් ලබා ගත් ණය මුදල වන රුපියල් ............................................................ (රු.................................. ) ක මුදල ............................................................ ක වාර්ෂික පොලී අනුපාතිකය යටතේ අදාළ පොලිය ද සමග නැවත ගෙවීමට ඇප වෙමු.

**උප ලේඛනය**

| ණය මුදල (රු.) | ණයකරුගේ නම හා ලිපිනය | දිනය | නොතාරිස් |
|---|---|---|---|
| | | | |
| | | | |

*බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා පමණි.

.............................................................

බලයලත් නිලධාරියාගේ අත්සන

වෙනුවෙන් (සහභාගිත්ව මූල්‍ය ආයතනයේ නම)

**ප්‍රතිමූල්‍ය ඒකකය**

**ප්‍රධාන කාර්යාලය**

**2017 අගෝස්තු 02**

සියලුම සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත,

මහත්මයාණෙනි/මහත්මියනි,

## ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන "තරුණ දිරිය" තාරුණ්‍ය සවිබල ගැන්වීමේ සහ රැකියා ව්‍යාපෘතිය හි මෙහෙයුම් උපදෙස් සංශෝධනය කිරීම

2016.08.03 දිනැති අංක RDD/NADeP/Youth 2016/01 මෙහෙයුම් උපදෙස් හා ඉන්පසුව 2017.07.11 දින සිදු කරන ලද සංශෝධනයට අදාළ වේ.

ඉහත සඳහන් මෙහෙයුම් උපදෙස්වල 7.2(ඈ) වගන්තිය පහත පරිදි සංශෝධනය කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

7.2 රු.1,000,000 උපරිම ණය සීමාවක් දක්වා ලබා දීමට නියමිත ණයවල මූලික ලක්ෂණ

(ඈ) මාස 6 ක සහන කාලයක් සමග ණය ආපසු ගෙවීමේ උපරිම කාලය මාස 48 කි.

අනෙකුත් සියලුම නියමයන් හා කොන්දේසි නොවෙනස්ව පවතී.

සංශෝධිත මෙහෙයුම් උපදෙස් සඳහා බලපැවැත්වෙන දිනය 2017.07.21

මෙම සංශෝධනයේ අඩංගු තොරතුරු ඔබේ බැංකු ශාඛාවල අදාළ නිලධාරීන් වෙත දැනුම් දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

මෙයට - විශ්වාසී

**ඩී.වී.එස්. දයාවංශ මිය**

**අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන**

පිටපත්: ආචාර්ය යසන්තා මාපටුන මහත්මිය,
වැඩසටහන් කළමනාකාරිනී
NADep

**මෙහෙයුම් උපදෙස් අංක : ප්‍රා.සං.දෙ./අත්වැල/2017/01**

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ.පෙ.590
නො.20
ජනාධිපති මාවත
කොළඹ 01
2017 සැප්තැම්බර් 07

සියලු සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත,

## උපදෙස් - ස්වාභාවික ව්‍යසන මගින් හානියට පත් වූ ආර්ථික කටයුතු නැවත නගා සිටුවීම සඳහා වූ "අත්වැල" ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස්

1. **හැඳින්වීම**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් ස්වාභාවික ව්‍යසන මගින් හානියට පත් වූ ආර්ථික කටයුතු නැවත නගා සිටුවීම සඳහා වූ "අත්වැල" ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කෙරුණි. මෙහිදී, එම ස්වාභාවික ව්‍යසන මගින් ඇති විය හැකි විනාශකාරී ප්‍රතිඵල පිළිබඳ සලකා බලන අතර, ශ්‍රී ලංකාව තුළ ඇති වන ස්වාභාවික ව්‍යසන මගින් සිදු වන ආර්ථික හා සමාජයීය බලපෑම අවම කිරීමේ අවශ්‍යතාවය ද හඳුනා ගන්නා ලදී. මෙම ණය යෝජනා ක්‍රමය පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වන්නේ, ශ්‍රී ලංකා රජය විසින් ප්‍රකාශිත ඕනෑම ස්වාභාවික ව්‍යසනයකදී, හානියට පත් වූ ආර්ථික කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා අවශ්‍ය මූල්‍යමය පහසුකම් ණයගැතියන් වෙත ලබා දීමය. මේ සඳහා ශ්‍රී ලංකා රජය විසින් ලබා දෙන මූලික අරමුදල් මගින් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව අරමුදලක් පිහිටුවා ඇත. මෙය ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක වේ.

මෙම ණය යෝජනා ක්‍රමය යටතේ වූ ණය, සුදුසු උපණයගැතියන් වෙත මුදා හැරීම සහභාගිත්ව මූල්‍ය ආයතන හරහා සිදු වේ. එනම්, මෙම ණය යෝජනා ක්‍රමය හා සම්බන්ධ වීමට කැමැත්තක් දක්වන සහ ශ්‍රී ලංකා මහ බැංකුව සමග අනු ණය ගිවිසුමකට එළඹී සිටින බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වේ.

ඒ අනුව, ශ්‍රී ලංකා රජය විසින් හඳුනාගෙන දැනුම් දෙන ස්වාභාවික ව්‍යසන සඳහා මූල්‍ය පහසුකම් සැපයීමට අවශ්‍ය මාර්ගෝපදේශයන් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත දන්වනු ලබයි.

2. **ණය යෝජනා ක්‍රමයේ අරමුණු**

මෙම ණය යෝජනා ක්‍රමයෙහි ප්‍රධාන අරමුණ වන්නේ, ස්වාභාවික ව්‍යසනයන්ට ලක්ව හානියට පත් වූ ආර්ථික කටයුතු නැවත නගා සිටුවීම සඳහා සහනදායී කොන්දේසි යටතේ ණය පහසුකම් ලබා දීමයි.

3. **යෝග්‍ය ස්වාභාවික ව්‍යසන සහ ණයගැතියන්**

ස්වයං රැකියා සහ කුඩා පරිමාණ ව්‍යාපාරිකයින් ප්‍රධාන වශයෙන් අරමුණු කර ගනිමින්, ශ්‍රී ලංකා රජය විසින් හඳුනාගෙන ප්‍රකාශයට පත් කරන ස්වාභාවික ව්‍යසන මගින් හානියට පත් වූ ආර්ථික කටයුතු නැවත නගා සිටුවීම සඳහා මේ යටතේ ණය මුදා හරිනු ලැබේ.

4. **අරමුදල්**

ණය යෝජනා ක්‍රමයෙහි ප්‍රතිමූල්‍ය සඳහා අවශ්‍ය අරමුදල් ශ්‍රී ලංකා රජය මගින් සපයනු ලැබේ.

5. **ණය යෝජනා ක්‍රමයෙහි සමස්ත කළමනාකරණය**

ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් දරනු ලබයි.

6. **ණය යෝජනා ක්‍රමයෙහි මූලික ලක්ෂණ**

| | | |
|---|---|---|
| 6.1 | වෙන් කළ අරමුදල් ප්‍රමාණය | : ශ්‍රී ලංකා රජය විසින් රුපියල් මිලියන 2,000 වසර 20 ක් දක්වා ණය චක්‍රීයව ලබා දේ. |
| 6.2 | ණය සීමාව | : ඇස්තමේන්තු කරන ලද ආර්ථික කටයුතු නැවත ආරම්භ කිරීමේ හෝ ප්‍රතිෂ්ඨාපන කිරීමේ වියදම, ලැබුණ හෝ ලැබිය යුතු මුළු රක්ෂණ හිමිකම, රු.500,000 ක උපරිමයකට යටත් වේ. |
| 6.3 | ප්‍රතිමූල්‍ය | : සහභාගිත්ව මූල්‍ය ආයතන මගින් මුදා හරින ලද ණය ප්‍රමාණයෙන් 100% ක්ම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතිමූල්‍යනය කරනු ලැබේ. |
| 6.4 | යෝග්‍ය ආර්ථික කටයුතු | : ස්වයං රැකියා හා කුඩා පරිමාණ ව්‍යාපාරකරුවන් සඳහා විශේෂ අවධානයක් යොමු කරමින් කෘෂිකර්මාන්ත, වැවිලි, පශු සම්පත් හා ධීවර, වෙළෙඳ ව්‍යාපාර හා වෘත්තීමය සේවා යන අංශවලට අදාළ ඕනෑම ආර්ථික කටයුත්තක් මේ සඳහා අදාළ වේ. |
| 6.5 | සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත ලබා දෙන ප්‍රතිමූල්‍ය සඳහා වූ පොලී අනුපාතය | : ප්‍රතිමූල්‍ය සඳහා පොලී අය නොකෙරේ. |
| 6.6 | අවසන් ණයකරු සඳහා පොලී අනුපාතය | : වසරකට 2% |
| 6.7 | සුරැකුම් | : ආර්ථික ක්‍රියාකාරකමෙහි ශක්‍යතාව අනුව ප්‍රමුඛතාව හිමිවේ.<br>ඊට අමතරව, ආර්ථික ක්‍රියාකාරකමේ ස්වභාවය අනුව සහභාගිත්ව මූල්‍ය ආයතන මගින් පිළිගන්නා ඕනෑම සුරැකුම්පත් අදාළ වේ. |

| | | |
|---|---|---|
| 6.8 සහන කාලය | : | ආර්ථික කටයුත්තේ ස්වභාවය මත පදනම්ව, ණය මුදලේ අවසන් වාරිකය මුදා හරින දිනයේ සිට උපරිම මාස 6 ක් දක්වා. |
| 6.9 නැවත ගෙවීමේ කාලය | : | ආර්ථික කටයුත්තේ ස්වභාවය මත පදනම්ව සහන කාලය ද ඇතුළත්ව උපරිම කාලසීමාව අවුරුදු 3 කි. |
| 6.10 ක්‍රියාත්මක වන ප්‍රදේශ | : | ශ්‍රී ලංකා රජය විසින් ස්වාභාවික ව්‍යසනයට ලක් වූ බවට හඳුනාගෙන ප්‍රකාශයට පත් කර ඇති ප්‍රදේශ. |

**7. ණයගැතියන් සඳහා වූ සුදුසුකම්**

ණයගැතියන්,

7.1 ශ්‍රී ලංකාවේ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය.

7.2 වෙනත් මූල්‍ය ආයතනයකින් ලබා ගත් ණය පැහැර හැර නොතිබිය යුතුය.

7.3 යෝජිත ව්‍යාපෘතිය යහපත් මුදල් ප්‍රවාහයක් සහ ණය ආපසු ගෙවීමේ හැකියාවක් සහිත බවට සහභාගිත්ව මූල්‍ය ආයතනය තහවුරු කළ යුතුය.

7.4 සහභාගිත්ව මූල්‍ය ආයතනය විසින් තීරණය කරන පරිදි පුද්ගලික ඇප ආවරණ හෝ අවශ්‍ය නම් සුරැකුම් ව්‍යාපාර සැලැස්ම ඉදිරිපත් කළ යුතුය.

7.5 8 වන ඡේදයෙහි සඳහන් පරිදි ස්වාභාවික ව්‍යසනය මගින් සිදු වූ හානිය තහවුරු කළ හැකි සාක්ෂි ඉදිරිපත් කළ හැකි විය යුතුය.

**8. ණයගැතියන් විසින් ඉදිරිපත් කළ යුතු තහවුරු කිරීමේ සාක්ෂි**

සියලු උපණය අයදුම්කරුවන් විසින් තහවුරු කිරීමේ සාක්ෂි ග්‍රාම නිලධාරී සහ ප්‍රාදේශීය ලේකම් විසින් ලබා ගෙන, සහභාගිත්ව මූල්‍ය ආයතන සහ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලබා දිය යුතුය.

8.1 සලකන ලද ස්වාභාවික ව්‍යසන මගින් ඔහුගේ/ඇයගේ ආර්ථික කටයුතු හානියට පත් වූ බව.

8.2 අදාළ ව්‍යාපෘතිය හෝ ව්‍යාපාරය එම ස්වාභාවික ව්‍යසනය සිදු වූ කාලසීමාව ඇතුළත ක්‍රියාකාරීව පැවති බව.

**9. ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය**

9.1 අවශ්‍යය වූ විටදී මෙහෙයුම් උපදෙස් හා සංශෝධන, අදාළ සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත සැපයීම.

9.2 සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් නිර්දේශ කරන ණය අයදුම්කරුවන් ලියාපදංචි කිරීම.

9.3 ලියාපදිංචි කරන සෑම ණය අයදුම්පතක් සඳහාම විමසුම් අංකයක් ලබාදීම සහ එය අදාළ සහභාගිත්ව මූල්‍ය ආයතනයේ ප්‍රධාන කාර්යාලය වෙත දැනුම් දීම.

9.4 සම්පූර්ණ කරන ලද ණය අයදුම්පත් ලැබෙන අනුපිළිවෙල අනුව, ඒ සඳහා ප්‍රතිමූල්‍ය නිකුත් කිරීම හා එම තොරතුරු අදාළ සහභාගිත්ව මූල්‍ය ආයතනවල ප්‍රධාන කාර්යාල වෙත ලැබීමට සැලැස්වීම.

නිවැරදි ලෙස සම්පූර්ණ කරන ලද ප්‍රතිමූල්‍ය ණය අයදුම්පත ලැබී සති 03 ක් ඇතුළත ප්‍රතිමූල්‍ය ලබා දීමට කටයුතු කරනු ලැබේ.

9.5 අවශ්‍යය වූ විට ණය යෝජනා ක්‍රමයෙහි කාර්ය සාධනය ශ්‍රී ලංකා රජය වෙත ලබා දීම.

9.6 සහභාගිත්ව මූල්‍ය ආයතනවල කාර්ය සාධනය පදනම්ව අවශ්‍යතාව මත හෝ මාසිකව ණය ඉලක්ක ලබා දීම.

9.7 රජය විසින් ලබා දෙන අරමුදල් කළමනාකරණය කිරීම සහ ණය යෝජනා ක්‍රමයේ චක්‍රීය අරමුදල් ගිණුම් පවත්වා ගැනීම.

9.8 සහභාගිත්ව මූල්‍ය ආයතනවල කාර්ය සාධනය අධීක්ෂණය හා ඇගයීම.

9.9 සහභාගිත්ව මූල්‍ය ආයතනවල ශාඛාවන්හි කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම.

**10. සහභාගිත්ව මූල්‍ය ආයතන සතු වගකීම් හා කාර්යභාරය**

ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් පහත පරිදි ක්‍රියාකාරී කාර්යභාරයක් ඉටු කළ යුතු වේ.

10.1 බැංකු ශාඛාවන්හි ණය යෝජනා ක්‍රමය සම්බන්ධ කටයුතු අධීක්ෂණය හා පරිපාලනය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණය කිරීම සඳහා ප්‍රධාන ශාඛාවෙහි ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කිරීම.

10.2 ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් අනුව, ණය මුදා හැරීම සඳහා ප්‍රමාණවත් පරිදි ශාඛා නියම කිරීම හා ඒ සඳහා ප්‍රමාණවත් පරිදි ශාඛා ජාලය තුළ කාර්ය මණ්ඩලය යෙදවීම.

10.3 ස්වාභාවික ව්‍යසනයෙන් සිදු වූ හානිය පරීක්ෂා කිරීමට, ණය පරිහරණය කිරීම අධීක්ෂණය කිරීමට හා ණය ආපසු අය කර ගැනීමට අවශ්‍ය පරිදි ක්ෂේත්‍ර නිලධාරීන් හා කාර්ය මණ්ඩලය යෙදවීම.

10.4 ණයකරුවන් හඳුනා ගැනීම, ණය සැකසීම හා මුදා හැරීමේ ක්‍රියාවලිය අධීක්ෂණය සහ පසු විපරම් කිරීම හා නියමිත කාලය ඇතුළත ණය නැවත අය කර ගැනීම හා අධීක්ෂණය සම්බන්ධව බැංකු කළමනාකරුවන් වෙත විස්තරාත්මක මාර්ගෝපදේශ සැකසීම.

10.5 ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මත කිරීම සම්බන්ධව ශාඛා කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම.

10.6 සෑම ණය වාරිකයක් මුදා හැරීමට ප්‍රථමයෙන් ස්ථානීය පරීක්ෂාවක් සිදු කොට ආර්ථික ක්‍රියාකාරකමෙහි භෞතික ප්‍රගතිය තහවුරු කිරීම.

10.7 ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම, ප්‍රගතිය හා ණය ආපසු අයකර ගැනිමේ කාර්යසාධනය පිළිබඳව නියමිත පරිදි ශාඛා මගින් ප්‍රධාන කාර්යාලය හරහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලැබීමට කටයුතු කිරීම. එම වාර්තා කාර්තුමය වශයෙන් අදාළ ශාඛා මගින් ගොනු කර ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ලබා දිය යුතුය.

10.8 අනාගත ණයගැතියන් සමග රැස්වීම්, සාකච්ඡා පැවැත්වීම හෝ වෙනත් සුදුසු මාර්ගයකින් ණය යෝජනා ක්‍රමය ප්‍රචලිත කිරීම.

10.9 ණය ප්‍රදානය කිරීමේ හා නැවත අයකර ගැනීමේ සම්පූර්ණ වගකීම දැරිය යුතුය.

10.10 ශාඛා මට්ටමින් ණය අයදුම්පත් නිකුත් කිරීම හා රැස් කිරීම.

10.11 ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සෑහීමකට පත්වන පරිදි, ඉහත 8 වන ඡේදයට අනුකූලව ණය අයදුම්කරුවන් මගින් සිදු වූ අලාභය පිළිබඳ තහවුරුවක් ලබා ගත යුතුය.

ඊට අමතරව, ආර්ථික ක්‍රියාකාරකම්වල යෝග්‍යතාවය පිළිබඳ සෑහීමට පත්වීමට ශාඛාවේ කළමනාකරු හෝ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු විසින් හානියට පත් වූ ව්‍යාපාරය නිරීක්ෂණය කළ යුතුය.

10.12 ඇමුණුම 1 හි පරිදි සෑම සුදුසුකම් සහිත ණය අයදුම්කරුවකුගේ ණය අයදුම්පත්‍රයක් සැකසීමේදී සිදු වූ හානිය පිළිබඳ තහවුරුවක් ඉහත 8 ඡේදය අනුව සකසා ඇමිණිය යුතු අතර, නිවැරදි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් සහභාගිත්ව මූල්‍ය ආයතන හරහා ප්‍රධාන කාර්යාලය වෙත ලබා දී අනතුරුව පහත ලිපිනයට එවිය යුතුය.

අධ්‍යක්ෂ
ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
නො.30, ජනාධිපති මාවත
කොළඹ 01.

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් වැඩිදුර තොරතුරු විමසන අවස්ථාවලදී, ණය අයදුම්පත් නැවත ශාඛා වෙත යොමු කිරීමේ අයිතිය ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සතු වේ.

10.13 ශ්‍රී ලංකා මහ බැංකුව සමග ලියාපදිංචියෙන් අනතුරුව, බැංකු ගිණුම් හරහා ණයගැතියන්ගේ ණය ඔවුන් වෙත ලබා දීම.

10.14 මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා දීමේදී කිසිදු තත්ත්වයක් යටතේ මොනයම් හෝ බැංකු ශාඛාවකින් 2% ට ඉහළ පොලී අනුපාතිකයක් යටතේ ණය ලබා නොදිය යුතුයි.

10.15 ප්‍රතිමූල්‍ය පහසුකම් ලබා ගැනීමට අදාළව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව ණය සඳහා ලබා දී ඇති සහ ලෙජරයෙහි ණය සම්බන්ධව හඳුනා ගැනීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති විමසුම් අංකය සඳහන් කළ යුතුය.

10.16 ණය මුදා හැරීමෙන් දින 30 ක් ඇතුළත ප්‍රතිමූල්‍ය ණය අයදුම්පත් ප්‍රධාන ශාඛාව හරහා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පහත ලියකියවිලි සමග ලැබීමට සැලැස්විය යුතුය.

(අ) ප්‍රතිමූල්‍ය ණය අයදුම්පත (ඇමුණුම II)
(ආ) ප්‍රතිමූල්‍ය ණය අයදුම්පත - ණය මුදාහැරීමේ ප්‍රකාශය (ඇමුණුම III)
(ඇ) ඉල්ලුම් පොරොන්දු නෝට්ටු (ඇමුණුම IV)
(ඈ) බෙදාහැරීමේ ලිපිය (ඇමුණුම V)
(ඉ) පැවරීමේ ලිපිය (ඇමුණුම VI)
(ඊ) මුදාහැරීමේ ලිපිය (ඇමුණුම VII)

10.17 ශාඛා මට්ටමින් ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම, ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අදාළව ක්‍රමවත් ලෙස ප්‍රගති වාර්තා ලබාදීම, ණය ආපසු ලබා ගැනීම ආදී තොරතුරු ප්‍රධාන ශාඛාව වෙත ලබා දීම.

10.18 ණය ආපසු අය කර ගැනීම සම්බන්ධව ණයගැතියන්ට සිහි කැඳවීම් පිළිබඳව සහතික වීම හා නිරන්තර ඔවුන් නිරීක්ෂණය කිරීම.

10.19 ණය තක්සේරු කිරීම, අනුමැතීන්, ණය මුදාහැරීම, නැවත අයකර ගැනීම සහ වෙනත් කරුණු සඳහා සුදුසු වාර්තා සටහන් සහ ලෙජර ගිණුම් පවත්වා ගැනීම සහ ණය යෝජනා ක්‍රමය සම්බන්ධ තොරතුරු සහිත දත්ත ගබඩාවක් වෙන්ව පවත්වා ගැනීම.

10.20 ගිණුම් හා මූල්‍ය වාර්තා පවත්වා ගැනීම.

(අ) ණය පවත්වාගෙන යාම සහ ප්‍රතිමූල්‍යන ක්‍රියාවලිය සම්බන්ධයෙන් වෙන්ව ගිණුම් සහ පොත් පවත්වා ගැනීම.

(ආ) ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් අධීක්ෂණය හා විමර්ශනය කරන අවස්ථාවලදී මෙම ගිණුම් හා මූල්‍ය වාර්තා ඉදිරිපත් කළ යුතු අතර, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් විමසන ඕනෑම අවස්ථාවක දී මෙම ගිණුම් හා මූල්‍ය වාර්තා ඉදිරිපත් කළ යුතු වේ.

**11. කොන්දේසි**

අවශ්‍ය වූ විට ණය යෝජනා ක්‍රමය සම්බන්ධ කොන්දේසි හා නියම සංශෝධනය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුවේ.

ඩී.වී.එස්. දයාවංශ මිය
**අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

ඇමුණුම I

**ස්වාභාවික ව්‍යසන මගින් හානියට පත් වූ ආර්ථික කටයුතු නැවත නගාසිටුවීම සඳහා වන**
**"අත්වැල" ණය යෝජනා ක්‍රමය**
**ණය ලියාපදිංචි කිරීමේ අයදුම්පත**

| කාර්යාල භාවිතය සඳහා පමණි |
|---|
| ලියාපදිංචි අංකය:................................... |

1. සහභාගීත්ව මූල්‍ය ආයතනයේ නම :- ..........................................................
2. බැංකු ශාඛාව :- ..........................................................
3. බැංකු ශාඛාවේ ලිපිනය :- ..........................................................
4. දුරකථන / ෆැක්ස් අංක :- ..........................................................
5. ව්‍යාපාර ස්වාභාවය : තනි ☐ හවුල් ☐
6. අයදුම්කරු / හවුල්කරු / අධ්‍යක්ෂ ගේ නම සහ ලිපිනය : ..........................................................

| නම | ලිපිනය | දුරකථන අංකය | ජාතික හැඳුනුම්පත් අංකය |
|---|---|---|---|
| | | | |
| | | | |

7. ව්‍යසනයේ ස්වාභාවය :- ..........................................................
8. ව්‍යසනය පැවති කාල වකවානුව ................................................ සිට ................................................දක්වා
(ණය අයදුම්කරුගේ හානියට පත් ආර්ථික කටයුතු ව්‍යසනය සිදුවන කාලය තුල ක්‍රියාකාරීව පැවති බවට තහවුරු කිරීම සඳහා අවශ්‍ය ලියකියවිලි වල මුල් පිටපත් ග්‍රාම නිලධාරී හා දිස්ත්‍රික් ලේකම් මගින් සහතික කිරීමෙන් පසු ඉදිරිපත් කල යුතු අතර එම ලියකියවිලි සහභාගීත්ව මූල්‍ය ආයතනය හා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් පිළිගත යුතුය)
9. ව්‍යාපෘතිය පිහිටි ස්ථානයේ සම්පූර්ණ ලිපිනය හා පිහිටීම:
..........................................................
..........................................................
..........................................................
10. දිස්ත්‍රික්කය :- ..........................................................
11. ආර්ථික කටයුත්තේ ස්වභාවය :- ..........................................................
    1. කෘෂිකාර්මික ☐
    2. වැවිලි ☐
    3. පශු සම්පත් හා මත්ස්‍ය ☐
    4. සේවා (වෙළඳ, ව්‍යාපාර, වෘත්තීමය හා ස්වයං) ☐
    5. වෙනත් (විස්තර) ☐
12. අත්වැල ණය යෝජනා ක්‍රමය යටතේ මූල්‍යනය කිරීමට බලාපොරොත්තු වන ව්‍යාපෘතිය පිළිබඳ හැඳින්වීමක් (ණය ලබා ගැනීමේ අරමුණ ආදී වශයෙන්)
..........................................................
..........................................................
..........................................................
13. ව්‍යාපෘතියේ ඇස්තමේන්තු කරන ලද වියදම : රු ................................................
14. ණයකරුගේ කොටස් ප්‍රදානය : රු. ................................................
15. අවශ්‍ය ණය මුදල : රු. ................................................
16. බැංකුව විසින් නිර්දේශ / අනුමත කරන ප්‍රමාණය : රු. ................................................

ඉහත අංක (10) හි විස්තර කරන ලද ව්‍යාපෘතිය මා විසින් / ණය නිලධාරී විසින් පරීක්ෂා කරන ලද අතර ලාභ ලැබීම සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රවාහයක් සහිත අතර "අත්වැල" ණය යෝජනා ක්‍රමය යටතේ මූල්‍යනය කිරීමට නිර්දේශ කිරීමට සුදුසු බවට සහතික කරමි.

.................................................. ..................................................
**දිනය** **කළමනාකරුගේ අත්සන / නිල මුද්‍රාව**

**ඇමුණුම් II: ප්‍රතිමූල්‍ය අයදුම්පත**

**ප්‍රතිමූල්‍ය අයදුම්පත් අංකය :** ..............................................................

**(මෙහෙයුම් උපදෙස් අංක :** (RDD/READ/2017/01deted 07/09/2017)

ලිපිනය : ...............................................................

දිනය : ...............................................................

ප්‍රතිමූල්‍ය අයදුම්පත : "අත්වැල"

ශ්‍රී ලංකා මහ බැංකුව වෙත,

මහත්මයාණෙනි,

....................................................................................................................................................................... (සහභාගිත්ව මූල්‍ය ආයතනයේ නම) වන අප බලපත්‍රලාභී වාණිජ බැංකුවක්/බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් සහ ව්‍යවස්ථාපිත දැනට පවතින ආයතනයක් ලෙස ඉහත ණය යෝජනා ක්‍රමය යටතේ රුපියල් ....................................................................................................................... (රු ................................) ණය මුදල අයදුම් කරමු.

2. මෙම අයදුම්පත ඉදිරිපත් කිරීමේදී ඔබගේ 07.09.2017 දිනැති මෙහෙයුම් උපදෙස් අංකය RDD/READ/2017/01 හි සහ ඉහත ණය යෝජනා ක්‍රමයේ උපණය ගිවිසුමෙහි දක්වා ඇති නියමයන් හා කොන්දේසිවලට යටත්ව මෙම අයදුම්පත ඉදිරිපත් කරමු.

3. ඉහත කී මෙහෙයුම් උපදෙස්වලට අනුකූලව ඉහත ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ අයදුම් කළ දිනට අප විසින් මසක් ඇතුළත ප්‍රදානය කරන ලද ණය ප්‍රකාශනයෙහි අනු පිටපතක් මේ සමග අප එවා ඇත. මෙම ප්‍රකාශනයෙහි සඳහන් ණය කිසිවක් ප්‍රතිමූල්‍ය ණය සඳහා මීට පෙර ඉදිරිපත් කරන ලද කිසිම ප්‍රකාශනයක සඳහන් නොවන බවට සහතික කරමු.

4. (i) තුන්වන ඡේදයේ සඳහන් පරිදි ඉහත ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබා දෙන ව්‍යාපෘති සඳහා සුදුසුකම්ලත් උපණයකරුවන්ට ණය ප්‍රදානය කිරීමත්,

   (ii) එම ණය අදාළ උපණයකරුවන්ට ණය ලබා ගැනීමේ බලයට යටත්ව ණය ලබා දී ඇත.

   (iii) ඇපකරුවන් සම්බන්ධව සලකන විට ණය ආපසු ගෙවීම සම්බන්ධව ඇපවන පුද්ගලයන් එවැනි ඇප වීමක් ලබා දීම සඳහා බලයලත් තැනැත්තෙකු ද යන්න බව.

   අප සහතික වන බව දන්වා සිටිමු.

මූල්‍ය ආයතනයේ බලයලත් නිලධාරියාගේ
නම විස්තර හා අත්සන
**කළමනාකරු,**
**ප්‍රතිමූල්‍ය ඒකකය**

ඇමුණුම III: ප්‍රතිමූල්‍ය අයදුම්පත

**ප්‍රතිමූල්‍ය අයදුම්පත් අංකය :** ............................................

**(මෙහෙයුම් උපදෙස් අංක : (RDD/READ/2017/01deted 07/09/2017)**

**ස්වභාවික ව්‍යසන මගින් හානියට පත්වූ ආර්ථික කටයුතු නැවත නගා සිටුවීම සඳහා වන "අත්වැල" ණය යෝජනා ක්‍රමයේ ණය මුදා හැරීමේ ප්‍රකාශනය**

වෙත : ශ්‍රී ලංකා මහ බැංකුව

වෙතින් : ප්‍රතිමූල්‍ය එකකය

සහභාගිත්ව මූල්‍ය ආයතනය : ............................................ ශාඛාව : ............................................ දිස්ත්‍රික්කය : ............................................

| විමසුම් අංකය | ණයකරුගේ නම හා ලිපිනය ජා.හැ.අංකය | ව්‍යාපෘති විස්තරය හා ණය ලබා ගැනීමේ අරමුණ* | උප ණය ප්‍රමාණය රු. | මුදා හරින ලද මුදල | මුදාහරින දිනය | මුදා හැරීමට බලාපොරොත්තු ප්‍රතිමූල්‍ය ප්‍රමාණය | සහන කාලය | නැවත පියවීමේ ආකෘතිය | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | වාරික | | පළමු වාරිකය ගෙවිය යුතු දිනය | අවසන් වාරිකය ගෙවිය යුතු දිනය |
| | | | | | | | | වාරික ගණන | වටිනාකම | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |
| එකතුව | | | | | | | | | | | |

ශ්‍රී ලංකා මහ බැංකුව හා සහභාගිත්ව මූල්‍ය ආයතන අතර ප්‍රතිමූල්‍ය ගිවිසුමට එකඟ වූ පරිදි, ඉහත දක්වා ඇති ණය මුදල නැවත ගෙවීමේ උපලේඛනය අනුව, අර්ධ වාර්ෂිකව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පියවන බවට අප විසින් පොරොන්දු වෙමු.

බලයලත් නිලධාරියාගේ අත්සන

ඇමුණුම IV

**ප්‍රතිමූල්‍ය අයදුම්පත් අංකය :** ..........................................

**(මෙහෙයුම් උපදෙස් අංක :** (RDD/READ/2017/01deted 07/09/2017)

**ස්වාභාවික ව්‍යසන මගින් හානියට පත් ආර්ථික කටයුතු නැවත නගා සිටුවීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය "අත්වැල" ඉල්ලුම් පොරොන්දු නෝට්ටුව**

........................................................................ (සහභාගිත්ව මූල්‍යායතනයේ නම හා ලිපිනය) වන අප විසින් පහත අත්සන් කළ මුළු ණය මුදල වන රුපියල් ........................................ (රු. ........................................ ) මුදල වාර්ෂිකව ............................% පොලී අනුපාතය යටතේ වූ පොලී මුදල ද සමග මෙහි සඳහන් දිනට, ශ්‍රී ලංකා මහ බැංකුව ඉල්ලන විට පියවීම සිදු කරන බවට කොළඹ දී මෙයින් පොරොන්දු වෙමු.

..............................................................................

(සහභාගිත්ව මූල්‍යායතනයේ නම)

........................................... ප්‍රතිමූල්‍ය ඒකකය

(රබර් මුද්‍රාව) ප්‍රධාන කාර්යාලය

සාක්ෂි :

1. ................................................................ 1. ................................................................

2. ................................................................ 2. ................................................................

ඇමුණුම V

**ප්‍රතිමූල්‍ය අයදුම්පත් අංකය :** ..........................................

**(මෙහෙයුම් උපදෙස් අංක :** (RDD/READ/2017/01deted 07/09/2017)

**ස්වාභාවික ව්‍යසන මගින් හානියට පත් ආර්ථික කටයුතු නැවත නගා සිටුවීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය "අත්වැල"**

## භාරදීමේ ලිපිය

ශ්‍රී ලංකා මහ බැංකුව වෙත,

මූල්‍ය නීති පනතේ (422 වන පරිච්ඡේදයේ) 88A වනඅංශයට අදාළව 07.09.2017 දිනැති මෙහෙයුම් උපදෙස් අංක : (RDD/READ/2017/01 පරිදි ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමය යටතේ ණය ලබාදීම සලකා බලා එකඟ වූ ණය ප්‍රමාණය වන රුපියල් ........................................

(රු. ................................) මුදල සඳහා වූ පොරොන්දු නෝට්ටුවේ රුපියල් ........................................

(රු. ............................) ක මුදල, ඉල්ලුම් කරන ලද පොලී මුදල ද සමග මෙයින් එවනු ලැබේ.

ඉහත කී පොරොන්දු නෝට්ටුව ගෙවීම සඳහා ඉදිරිපත් කිරීමෙන් වැළකෙන බැවින්, එය අගරු කිරීමට දැනුම්දීමේ අවශ්‍යතාවයක් ඇති නොවනු ඇත.

.............................................................

1. ................................................................ වෙනුවෙන් (සහභාගිත්ව මූල්‍යායතනයේ නම)

2. ................................................................ ප්‍රතිමූල්‍ය ඒකකය

(බලයලත් නිලධාරීන්ගේ අත්සන්) ප්‍රධාන කාර්යාලය

ඇමුණුම **VI**

**මෙහෙයුම් උපදෙස් අංක : 2017/09/07 දිනැති අංක RDD/READ/2017/01**

**ප්‍රතිමූල්‍ය අයදුම්පත් අංකය :** ........................................................

**ස්වාභාවික ව්‍යසන මගින් හානි වූ ආර්ථික කටයුතු නැවත නගා සිටුවීම සඳහා වූ "අත්වැල" ණය යෝජනා ක්‍රමය මුදල් නීති පනතේ 88 A වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයට ඇප වන බවට දෙනු ලබන ප්‍රතිඥාව**

කොළඹ

දිනයඃ

........................................................................ (සහභාගීත්ව මූල්‍ය ආයතනයේ නම හා ලිපිනය) වන අප, ශ්‍රී ලංකා මහ බැංකුවේ, 1963 මූල්‍ය පනතේ අංක 11 සහ 1968 (සංශෝධිත) මූල්‍ය නීති පනතේ අංක 21 මගින් සංශෝධනය කරන ලද මුදල් නීති පනතේ 88A වගන්තියේ පරිදි ප්‍රතිඥා මාර්ගයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අය විය යුතු ණය කුමක්ද යන්න ආකෘතියේ සඳහන් පරිදි සුරැකුමක් ලෙස / තවදුරටත් සුරැකුම්පත් ලෙස පියවීමට ඇති රු. ........................................ (රු.............................................) සමග ........................................වාර්ෂික අනුපාතිකය යටතේ පොලියද සම ගෙවන බවට මෙයින් ප්‍රකාශ කරමු.

**ආකෘතිය**

| ණය මුදල (රු) | ණයකරුගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය | දිනය | ඇප ස්වභාවය හා විස්තර (අදාල වේ නම්) | නොතාරිස් |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |

.......................................................

බලයලත් නිලධාරියාගේ අත්සන

වෙනුවෙන් (සහභාගීත්ව මූල්‍ය ආයතනයේ නම)

ප්‍රතිමූල්‍ය ඒකකය

ප්‍රධාන කාර්යාලය

ඇමුණුම VII

**(මෙහෙයුම් උපදෙස් අංක : (RDD/READ/2017/01deted 07/09/2017)**

**ණය මුදාහැරීමේ ලිපිය**

බැංකුවේ නම : ..........

බැංකුවේ කේතය : ..........

ශාඛාවේ නම : ..........

ශාඛා කේතය : ..........

අනු අංකය : ..........

දිනය : ..........

ණය මුදාහැරීම : ..........

ස්වාභාවික ව්‍යසන මගින් හානියට පත් ආර්ථික කටයුතු නැවත නගා සිටුවීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය "අත්වැල"

විමසුම් අංකය :

1. ණයකරුගේ විස්තර
   - 1.1 ණයකරුවාගේ නම : ..........
   - 1.2 ණයකරුගේ ලිපිනය : ..........

2. ණය පිළිබඳ විස්තර
   - 2.1 ණය ලබා ගන්නා අරමුණ : ..........
   - 2.2 උප ව්‍යාපෘතියේ පිහිටීම : ..........
   - 2.3 අනුමත වූ මුළු ණය මුදල : රු. ..........
     ඉන්පසුව ණය මුදලේ වැඩි කිරීම රු. ..........
     මුළු මුදල : රු. ..........
   - 2.4 ණය අනුමත වූ මුල් දිනය : ..........
     ණය වැඩිවීම අනුමත වූ දිනය : ..........
   - 2.5 ඉල්ලුම් කළ ප්‍රතිමූල්‍ය සඳහා වූ පියවීමේ වැඩසටහන් කළ

..........                ..........

දිනය                රු.ගණන

   - 2.6 පොලී අනුපාතිකය

3. ණය මුදලේ තත්ත්වය
   - 3.1 පෙර නිකුත් කළ මුදල් සහ මහ
     බැංකුවෙන් ප්‍රතිමූල්‍ය ලබන මුදල : රු. ..........
   - 3.2 බලාපොරොත්තු වූ ප්‍රතිමූල්‍ය සඳහා
     දැන් නිකුත් කළ හැකි මුදල : රු. ..........
     මුළු මුදල : රු. ..........

ඉහත විස්තරයන් සත්‍ය හා නිවැරදි බවට මම මෙයින් සහතික කරමි.

..........

දිනය

ශාඛා කළමනාකරුගේ අත්සන

..........

ශාඛා කළමනාකරුගේ නම

වාරිකය පළමු, දෙවන හෝ කී වැන්නක් ද යන්න සුදුසු කොටුව තුළ කතිරයක් යොදා සඳහන් කරන්න.

**මෙහෙයුම් උපදෙස් අංකඃ** RDD/SWASHAKTHI/2017/01

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ.පෙ. 590
නො.30, ජනාධිපති මාවත
කොළඹ 01
2017 ඔක්තෝබර් 09
දුරකථනඃ 2477440/2477422/2477015
ෆැක්ස්ඃ 1477733/2477734

සියලුම සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත,

මහත්මයාණෙනි/මහත්මියනි,

## මෙහෙයුම් උපදෙස් සංශෝධන - "ස්වශක්ති - රැකියා දශලක්ෂයක් කරා" ණය යෝජනා ක්‍රමය

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් ස්වශක්ති ණය යෝජනා ක්‍රමය සඳහා නිකුත් කරන ලද 2017.02.09 දිනැති මෙහෙයුම් උපදෙස් අංක RDD/SWASHAKTHI/2017/01 (මින් මතු "ප්‍රධාන මෙහෙයුම් උපදෙස්" ලෙස හඳුන්වනු ලබන) මෙයින් පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

1. ප්‍රධාන මෙහෙයුම් උපදෙස්හි 1 වන ඡේදය මෙයින් අවලංගු කර පහත ඡේදය ඒ සඳහා ආදේශ කෙරේ.

   ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය සංවර්ධනය කිරීමේ හා රැකියා උත්පාදනය කිරීමේ අරමුණින් "ස්වශක්ති" ණය යෝජනා ක්‍රමය ශ්‍රී ලංකා මහ බැංකුව, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය සමග එක්ව නිර්මාණය කර හඳුන්වා දී ඇත.

   කෘෂිකර්මාන්ත, පශු සම්පත්, කර්මාන්ත හා සේවා යන අංශවල ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්හි යෙදෙන මුලතිව්, කිලිනොච්චි, මන්නාරම, පොළොන්නරුව, වව්නියාව, ත්‍රිකුණාමලය, මාතලේ, මොණරාගල, යාපනය, නුවරඑළිය හා අම්පාර යන දිස්ත්‍රික්කවලට අයත් නව ව්‍යවසායකයින්ට මූල්‍ය පහසුකම් සලසාදීම මගින් නව රැකියා අවස්ථා උත්පාදනය කිරීම මෙම යෝජනා ක්‍රමයේ මූලික අරමුණ වේ.

2. 4.3.1(ආ) ඡේදය මෙයින් අවලංගු වේ.

3. ප්‍රධාන මෙහෙයුම් උපදෙස්හි 4.7 ඡේදය මෙයින් ප්‍රතිස්ථාපනය කර පහත ඡේදය ඒ සඳහා ආදේශ කෙරේ.

   4.7 ඉලක්ක කණ්ඩායම්

   මුලතිව්, කිලිනොච්චි, මන්නාරම, පොළොන්නරුව, වව්නියාව, ත්‍රිකුණාමලය, මාතලේ, මොණරාගල, යාපනය, නුවරඑළිය හා අම්පාර යන දිස්ත්‍රික්කවල නව ව්‍යවසායකයින් ණය ලබාදීම සඳහා සලකා බලනු ලැබේ.

4. ප්‍රධාන මෙහෙයුම් උපදෙස්හි 4.17 ඡේදය මෙයින් අවලංගු කර පහත ඡේදය ඒ සඳහා ආදේශ කෙරේ.

   4.17 ක්‍රියාත්මක වන ප්‍රදේශ

   මුලතිව්, කිලිනොච්චි, මන්නාරම, පොළොන්නරුව, වව්නියාව, ත්‍රිකුණාමලය, මාතලේ, මොණරාගල, යාපනය, නුවරඑළිය හා අම්පාර යන දිස්ත්‍රික්ක

5. ප්‍රධාන මෙහෙයුම් උපදෙස්හි 7.1 ඡේදය මගින් අවලංගු කර පහත ඡේදය ඒ සඳහා ආදේශ කෙරේ.

   7.1 මුලතිව්, කිලිනොච්චි, මන්නාරම, පොළොන්නරුව, වව්නියාව, ත්‍රිකුණාමලය, මාතලේ, මොණරාගල, යාපනය, නුවරඑළිය, අම්පාර යන දිස්ත්‍රික්කයක ස්ථිර පදිංචිකරුවකු ලෙස ජීවත්වීම.

6. 8 ඡේදය - සහභාගිත්ව මූල්‍ය ආයතන

   (ඊ)(ii) ඡේදයෙහි සඳහන් ඇමුණුම V (B) පරිදි "සෑම සුදුසුකම් ලැබූ අයදුම්කරුවෙකුටම (පවත්නා ව්‍යාපාර හිමි අයදුම්කරුවන්) උපණය සඳහා" යන වචන අවලංගු වේ.

මෙම සංශෝධනයන් 2017.09.19 දින සිට ක්‍රියාත්මක වේ.

මෙහෙයුම් උපදෙස්හි මෙම සංශෝධනයන්හි අන්තර්ගතයන් අදාළ නිලධාරීන්ට දැනුම් දෙන ලෙස කාරුණිකව දන්වමි.

මෙයට - විශ්වාසී

**ඩී.වී.එස්. දයාවංශ**
**අධ්‍යක්ෂ/ප්‍රාදේශීය සංවර්ධන**

**ක්ෂුද්‍රමූල්‍ය පනතේ විධාන 2017 අංක 1** 2017 මාර්තු 03

## ව්‍යාපාර ස්ථාන විවෘත කිරීම, වසා දැමීම හා ස්ථානය වෙනස් කිරීම

2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනතේ 11 වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලදී.

1. අධ්‍යක්ෂ වෙත දැනුම් දීම.

1.1 බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් ශ්‍රී ලංකාවේ කිසිදු ප්‍රදේශයක් තුල ව්‍යාපාර ස්ථානයක් විවෘත කිරීමක් හෝ දැනට පවත්නා ව්‍යාපාර ස්ථානයක් වසා දැමීමක් හෝ යම් ව්‍යාපාර ස්ථානයක් දැනට පවත්නා ස්ථානය වෙනස් කිරීමක් හෝ සිදු කිරීමට පෙර අධ්‍යක්ෂ වෙත දැනුම් දිය යුතුය.

2. නව ව්‍යාපාර ස්ථාන විවෘත කිරීම

2.1 බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් ව්‍යාපාර ව්‍යාප්ත කිරීමේ විචක්ෂණ ප්‍රතිපත්තියක් ස්ථාපිත කළ යුතු අතර ව්‍යාපාර ව්‍යාප්ත කිරීමේ වාර්ෂික සැලැස්ම සෑම වසරකම ජනවාරි 31 දිනට පෙර අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

2.2 ඉහත 2.1 විධානයෙහි සඳහන් ව්‍යාපාර ව්‍යාප්ත කිරීමේ වාර්ෂික සැලැස්ම සඳහා ප්‍රතිපත්ති ස්ථාපිත කිරීමේදී සෑම බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගමක්ම ප්‍රධාන වශයෙන් නව ව්‍යාපාර ස්ථාන වල ව්‍යාපාර කටයුතු සඳහා පවතින හැකියාව, ලාභදායීත්වය, අභ්‍යන්තර පාලන පද්ධතියෙහි කාර්යක්ෂමතාව, සේවක අතිරික්තයන් හඳුනාගත් අවස්ථා වලදී සේවකයන් නැවත යොමු කිරීම, සේවාලාභීන් වෙත ක්ෂණික හා පිරිවැය ඵලදායී පාරිභෝගික සේවාවන් ව්‍යාප්ත කිරීම ආදිය සැලකිල්ලට ගත යුතුය.

2.3 බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් නව ව්‍යාපාර ස්ථානය/න් විවෘත කිරීමට අදාළ වන තොරතුරු ඇමුණුම 1 හි දැක්වෙන ආකෘතියට අනුව විවෘත කිරීමට ප්‍රථම අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

2.4 බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් විසින් ව්‍යාපාර ස්ථානය විවෘත කිරීමට බලාපොරොත්තු වන ප්‍රදේශ තුල මූල්‍ය සේවාවන් සඳහා පවතින අවශ්‍යතාව පෙන්නුම් කරමින් එක් එක් ව්‍යාපාර ස්ථානය සඳහා, ආර්ථික ශක්‍යතා අධ්‍යයනයක් ඉදිරිපත් කල යුතුය. එවන් අධ්‍යයනයක් අවම වශයෙන් පහත සඳහන් කරුණු ආවරණය කළ යුතුය.

අ) යෝජිත ප්‍රදේශය තුළ පවත්නා මූල්‍ය ආයතන ඝනත්වය මත පදනම්ව මූල්‍ය සේවාවන් සඳහා පවතින අවශ්‍යතාවය. (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජනගහණය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඇති මූල්‍ය ආයතන වල ශාඛා ගණනෙන් බෙදීමෙන් මූල්‍ය ආයතන ඝනත්වය ගණනය කරනු ලැබේ.)

ආ) එම ප්‍රදේශය තුල මූල්‍ය සේවාවන් සඳහා ඇති ඉල්ලුමෙහි අපේක්ෂිත වර්ධනය සහ ව්‍යාපාර ස්ථානයේ කටයුතු ලාභදායී වීමට ගතවන කාලය.

ඇ) ව්‍යාපාර ස්ථානයේ අපේක්ෂිත ව්‍යාපාර ප්‍රමාණය, ව්‍යාපාර වර්ධනය, සංස්ථාපන හා මෙහෙයුම් පිරිවැය සහ වසර තුනකට නොඅඩු ප්‍රමාණවත් කාල පරිච්ඡේදයක් සඳහා ප්‍රතිඵල පදනම් කරගෙන අයදුම්කරන ව්‍යාපාර ස්ථාන සඳහා මූල්‍ය උපකල්පනයන්.

2.5 බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් නව ව්‍යාපාර ස්ථානය/න් විවෘත කිරීමට පෙර ඒ සඳහා එම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබා තිබීම තහවුරු කළ යුතුය.

2.6 බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් අදාල රාජ්‍ය ආයතනයන්ගෙන් නිෂ්කාශනයක් ලබා තිබීම තහවුරු කළ යුතුය.

2.7 බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් යෝජිත නව ව්‍යාපාර ස්ථානය සඳහා පොලිස් නිෂ්කාශන සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

2.8 බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම්, සිය නව ව්‍යාපාර ස්ථානය ස්ථාපනය කිරීමේදී හෝ ස්ථාපනය කිරීමෙන් පසු මුල් තොරතුරු වල ඇතුලත් ඕනෑම බැඳීම්, නියෝජනය කිරීම් හෝ ගණනය කිරීම් කෙරෙහි බලපාන සැලකිය යුතු වෙනස්වීම් අධ්‍යක්ෂ වෙත දැනුම් දිය යුතුය.

2.9 බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් විසින් නව ව්‍යාපාර ස්ථානය විවෘත කළ පසු ව්‍යාපාරික දින දහයක් ඇතුළත නව ව්‍යාපාර ස්ථානය විවෘත කළ දිනය අධ්‍යක්ෂ වෙත දැනුම් දුන් බව තහවුරු කළ යුතුය.

3. ව්‍යාපාර ස්ථාන වසා දැමීම

3.1 බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් විසින් දැනට පවත්නා ව්‍යාපාර ස්ථාන වසා දැමීමට පෙර ඇමුණුම II හි දැක්වෙන ආකෘතියට අනුව අධ්‍යක්ෂ වෙත දැනුම් දිය යුතුය.

3.2 බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් ව්‍යාපාර ස්ථානයක් වසා දැමීමට පෙර ඒ සඳහා එම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබා තිබීම තහවුරු කළ යුතුය.

3.3 බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් විසින් ව්‍යාපාර ස්ථානය වසා දැමීමෙන් පසු එම ව්‍යාපාරය පැවති ස්ථානයේ තවදුරටත් ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාර කටයුතු සිදු නොකරන බවට තහවුරු කළ යුතුය.

3.4 බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් විසින් ව්‍යාපාර ස්ථානය වසා දැමීමෙන් පසු ව්‍යාපාරික දින දහයක් ඇතුලත එම ස්ථානය වසා දැමූ දිනය අධ්‍යක්ෂ වෙත දැනුම් දීම තහවුරු කළ යුතුය.

4. ව්‍යාපාර ස්ථාන වෙනස් කිරීම

4.1 බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් විසින් දැනට පවත්නා ව්‍යාපාර ස්ථාන වෙනස් කිරීමට පෙර ඇමුණුම III හි දැක්වෙන ආකෘතියට අනුව අධ්‍යක්ෂ වෙත දැනුම් දිය යුතුය.

4.2 බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් යෝජිත නව ව්‍යාපාර ස්ථානය සඳහා පොලිස් නිෂ්කාශන සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

4.3 බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් දැනට පවත්නා ව්‍යාපාර ස්ථානය වෙනස් කිරීමට පෙර ඒ සඳහා එම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබා තිබීම තහවුරු කළ යුතුය.

4.4 බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් විසින් ව්‍යාපාර ස්ථානය වෙනස් කිරීමෙන් පසු එම ව්‍යාපාරය මුලින් පැවති ස්ථානයේ තවදුරටත් ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාර කටයුතු සිදු නොකරන බවට තහවුරු කළ යුතුය.

5. අර්ථ නිරූපනය

5.1 මෙම විධානයේ,

(අ) "ව්‍යාපාර ස්ථාන" යන්නෙන් බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් විසින් ක්ෂුද්‍රමූල්‍ය ව්‍යාපාර කටයුතු සිදු කරන ඕනෑම ස්ථානයක් හැඳින්වේ.

(ආ) "අධ්‍යක්ෂ" යන්නෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ක්ෂුද්‍රමූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ අදහස් වේ.

ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
**මුදල් මණ්ඩලයේ සභාපති**
**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති**

ඇමුණුම I

## නව ව්‍යාපාර ස්ථානයක් විවෘත කිරීම

| | |
|---|---|
| 1 | **සාමාන්‍ය** |
| 1.1 | බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගමේ නම |
| 1.2 | යෝජිත විවෘත කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගත් දිනය |
| 1.3 | සම්බන්ධ කර ගත හැකි පුද්ගලයා |
| අ. | නිලධාරියාගේ නම |
| ආ. | තනතුර |
| ඇ. | දුරකථන අංකය |
| ඈ. | විද්‍යුත් තැපැල |
| 2 | **මූල්‍ය තොරතුරු ප්‍රක්ෂේපනයන්: කරුණාකර යෝජිත ව්‍යාපාර ස්ථානය/න් ද ඇතුළුව සමාගමේ මෙහෙයුම් කටයුතු වල ඉදිරි වසර තුනක කාලය සඳහා මූල්‍ය ප්‍රක්ෂේපනයන් ඉදිරිපත් කරන්න** |

| | අයිතමය | වසර 1 | වසර 2 | වසර 3 |
|---|---|---|---|---|
| 2.1 | අක්‍රමික ණය පහසුකම් අනුපාතය,% | | | |
| 2.2 | සමස්ත තැන්පතු, රු. මිලියන | | | |
| 2.3 | සමස්ත ණය සහ අත්තිකාරම්, රු. මිලියන | | | |
| 2.4 | මූලික ප්‍රාග්ධනය, රු. මිලියන | | | |
| 2.5 | ලාභය/(අලාභය), රු. මිලියන | | | |

3 **නව ව්‍යාපාර ස්ථාන විවෘත කිරීම**

| | | | | |
|---|---|---|---|---|
| 3.1 | යෝජිත නව ව්‍යාපාර ස්ථාන ගණන | | | |
| | | | | මුළු ගණන |

| | |
|---|---|
| 3.2 | නව ව්‍යාපාර ස්ථාන වල තොරතුරු, කරුණාකර ඇමුණුම I (අ) පරිදි යෝජිත ව්‍යාපාර ස්ථාන වල තොරතුරු වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්න |
| 4 | **සහතික කිරීම** |
| | සමාගම වෙනුවෙන් පහත අත්සන් කළ අය වෙත අයදුම්පත ඉදිරිපත් කිරීම සඳහා බලය ඇති අතර මෙහි සපයා ඇති තොරතුරු මගේ දැනුම හා විශ්වාසය අනුව සත්‍ය හා නිවැරදි වේ. |
| | නම: |
| | තනතුර: |
| | අත්සන: |
| | |
| | දිනය: දින/මාස/අවු |

ඇමුණුම I (අ)

## නව ව්‍යාපාර ස්ථානය පිළිබඳ තොරතුරු

**1 සාමාන්‍ය**

1.1 ව්‍යාපාර ස්ථානය විසින් භාවිතා කිරීමට යෝජිත කාර්යාලීය නම ඉදිරිපත් කරන්න

1.2 ස්ථානය

අ. පරිපාලන දිස්ත්‍රික්කය

ආ. නගරය

ඇ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

ඈ. මහ නගර සභාව/ නගර සභාව තුළ හෝ පිටින් පිහිටයිද යන වග සඳහන් කරන්න.

ඉ. තැපැල් ලිපිනය, තිබේ නම්

**2 සේවක අවශ්‍යතාවයන්**

2.1

| විධායක ශ්‍රේණිය | ලිපිකරු | සුළු සේවක | ආරක්ෂක | මුළු ගණන |
|---|---|---|---|---|
| | | | | |

2.2 යෝජිත ව්‍යාපාර ස්ථානයේ සේවකයින් පිළිබඳ තොරතුරු ඔවුන්ගේ සුදුසුකම්, අත්දැකීම් සහ රැකියා විස්තරය ඇතුලත් කරමින් ඉදිරිපත් කරන්න. (මෙම තොරතුරු වෙනත් ඇමුණුමක් මගින් ඉදිරිපත් කරන්න)

**3 මූල්‍ය තොරතුරු - මුල් වසර 3 සඳහා යෝජිත ව්‍යාපාර ස්ථානයේ මූල්‍ය ප්‍රක්ෂේපනයන් ඉදිරිපත් කරන්න.**

| | අයිතමය (රු. මිලියන) | වසර -1 | වසර -2 | වසර -3 |
|---|---|---|---|---|
| 3.1 | තැන්පතු | | | |
| 3.2 | ණය සහ අත්තිකාරම් | | | |
| 3.3 | පොලී ආදායම | | | |
| 3.4 | පොලී වියදම් | | | |
| 3.5 | සේවක වියදම් | | | |
| 3.6 | ලාභ/(අලාභ) | | | |

**4 ව්‍යාපාර ස්ථානය පිහිටුවීමට යෝජිත ස්ථානය අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ප්‍රදේශය තුල ක්‍රියාත්මක වන වෙනත් මූල්‍ය ආයතන වල තොරතුරු**

| | අයිතමය | ප්‍රමාණය |
|---|---|---|
| 4.1 | බලපත්‍රලාභී බැංකු/ශාඛා | |
| 4.2 | බලපත්‍රලාභී මුදල් සමාගම්/ශාඛා | |
| 4.3 | විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්/ශාඛා | |
| 4.4 | බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම්/ව්‍යාපාර ස්ථාන | |
| 4.5 | බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය රාජ්‍ය නොවන සංවිධාන/ ව්‍යාපාර ස්ථාන | |
| 4.6 | දිවිනැගුම ප්‍රජා මූල බැංකු | |

**5 යෝජිත ව්‍යාපාර ස්ථානය අයත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජනගහනය**

**6 ආර්ථික ශක්‍යතා වාර්තාව**

| |
|---|
| |
| නම:<br>තනතුර:<br>අත්සන:<br>දිනය: |

සටහන: යෝජිත ව්‍යාපාර ස්ථාන සංඛ්‍යාව එකකට වඩා වැඩි නම්, කරුණාකර එම තොරතුරු වෙන වෙනම කඩදාසි වල සපයන්න.

ඇමුණුම II

## ව්‍යාපාර ස්ථානය වසාදැමීම

| | |
|---|---|
| 1 | **සාමාන්‍ය** |
| 1.1 | බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගමේ නම |
| 1.2 | යෝජිත වසාදැමීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගත් දිනය |
| 1.3 | ව්‍යාපාර ස්ථානය වසා දැමීම සඳහා හේතු |
| 2 | **ස්ථානය** |
| 2.1 | පරිපාලන දිස්ත්‍රික්කය |
| 2.2 | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය |
| 2.3 | තැපැල් ලිපිනය |
| 3 | **වසා දැමීමට යෝජිත ව්‍යාපාර ස්ථානයේ වත්කම්, වගකීම් සහ සේවකයන් සම්බන්ධව ගැනීමට නියමිත ක්‍රියාමාර්ගයන් විස්තර කරන්න** |
| 4 | **සහතික කිරීම** |
| | සමාගම වෙනුවෙන් පහත අත්සන් කළ අය වෙත අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා බලය ඇති අතර මෙහි සපයා ඇති තොරතුරු මගේ දැනුම හා විශ්වාසය අනුව සත්‍ය හා නිවැරදි වේ. |
| | නම: |
| | තනතුර: |
| | අත්සන: |
| | දිනය: |

ඇමුණුම III

## ව්‍යාපාර ස්ථානය වෙනස්කිරීම

| | |
|---|---|
| 1 | **සාමාන්‍ය** |
| 1.1 | බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගමේ නම |
| 1.2 | යෝජිත ස්ථානය වෙනස්කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගත් දිනය |
| 1.3 | ව්‍යාපාර ස්ථානය වෙනස්කිරීම සඳහා හේතු |
| 2 | **ස්ථානය** |
| 2.1 | **පවතින ස්ථානය** |
| | අ. පරිපාලන දිස්ත්‍රික්කය |
| | ආ. නගරය |
| | ඇ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය |
| | ඈ. තැපැල් ලිපිනය |
| 2.2 | **නව ස්ථානය (යෝජිත)** |
| | අ. පරිපාලන දිස්ත්‍රික්කය |
| | ආ. නගරය |
| | ඇ. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය |
| | ඈ. තැපැල් ලිපිනය |
| 3 | **යෝජිත ස්ථානය වෙනස්කිරීම සම්බන්ධ ප්‍රධාන තොරතුරු (රු. මිලියන)** |
| 3.1 | මුළු වත්කම් |
| 3.2 | ණය සහ අත්තිකාරම් |
| 3.3 | වෙනත් වත්කම් |
| 3.4 | තැන්පතු |
| 3.5 | මුළු ණය ගැනීම් |

| | |
|---|---|
| 3.6 | වෙනත් වගකීම් |
| 3.7 | සේවකයන් සංඛ්‍යාව |
| **4** | **සහතික කිරීම** |
| | සමාගම වෙනුවෙන් පහත අත්සන් කළ අය වෙත අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා බලය ඇති අතර මෙහි සපයා ඇති තොරතුරු මගේ දැනුම හා විශ්වාසය අනුව සත්‍ය හා නිවැරදි වේ. |
| | නම: |
| | තනතුර: |
| | අත්සන: |
| | දිනය: |

**ක්ෂුද්‍රමූල්‍ය පනතේ විධාන 2017 අංක 2**

2017 මාර්තු 03

## ව්‍යුහාත්මක වෙනස්කම්

2016 අංක 6 දරන ක්ෂුද්‍රමූල්‍ය පනතේ 11 වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලදී.

1. මුදල් මණ්ඩලයේ අනුමැතිය අවශ්‍ය ව්‍යුහාත්මක වෙනස්කම්

1.1. කිසිදු බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගමක්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව:-

අ) යම් පාලිත සමාගමක්, අනුමත පාලිත සමාගමක පාලිත හෝ ආශ්‍රිත සමාගමක් හෝ ආශ්‍රිත සමාගමක් පිහිටුවීම;

ආ) සම්පූර්ණ ව්‍යාපාරය හෝ එහි කොටසක් විකිණීම;

ඇ) යම් ආයතනයක හෝ සමාගමක සම්පූර්ණ ව්‍යාපාර කටයුතු හෝ ඉන් කොටසක් අත්පත් කරගැනීම;

ඈ) යම් ආයතනයක් හෝ සමාගමක් සමඟ සම්බන්ධ කිරීම, ඒකාබද්ධ කිරීම හෝ සංයෝග වීම;

ඉ) සමාගමේ නම වෙනස් කිරීම;

නොකළ යුතුය.

2. අධ්‍යක්ෂගේ අනුමැතිය අවශ්‍ය වන ව්‍යුහාත්මක වෙනස්කම්

2.1. කිසිදු බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගමක්, අධ්‍යක්ෂගේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව:-

අ) තැපැල් සේවා, පණිවිඩ සේවා, ගෘහ පාලන හා පිරිසිදු කිරීමේ සේවා, පරිශ්‍ර ආරක්ෂා කිරීමේ සේවා, වැටුප් හා ලේඛක කටයුතු හැර වෙනත් කටයුතු සඳහා බාහිර සේවාවන් ලබා ගැනීම;

ආ) සමාගමේ කොටස් ප්‍රාග්ධනය වැඩි කිරීම හෝ අඩු කිරීම;

ඇ) අනුමත පාලිත හෝ ආශ්‍රිත සමාගමක කොටස් ප්‍රාග්ධනයෙහි කර ඇති ආයෝජනයන් වැඩි කිරීම;

ඈ) අනුමත පාලිත හෝ ආශ්‍රිත සමාගමක සම්පූර්ණ ව්‍යාපාර කටයුතු හෝ ඉන් කොටසක් විකිණීම;

ඉ) සාංගමික ව්‍යවස්ථාවලිය වෙනස් කිරීම;

ඊ) පොත් අගය රුපියල් මිලියන එකකට (රු.1,000,000) වඩා වැඩි වත්කම්, පවත්නා වෙළඳපොල වටිනාකමට වඩා අඩු අගයකට පැවරීම හෝ විකිණීම;

උ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකුගේ හෝ ප්‍රධාන විධායක නිලධාරියාගේ තනතුර වෙනස් කිරීම;

ඌ) මූල්‍ය ප්‍රතිෂ්ඨාවකට හැර වෙනත් ප්‍රතිෂ්ඨාවකට එහි වත්කම් පැවරීම හෝ විකිණීම;

නොකළ යුතුය.

3. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු හෝ ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරීවරයාගේ ඉල්ලා අස්වීම

3.1. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු හෝ ප්‍රධාන විධායක නිලධාරියා, අධ්‍යක්ෂගේ පූර්ව ලිඛිත අනුමැතියකින් තොරව සමාගමෙන් ඉල්ලා අස් නොවිය යුතුය.

4. අර්ථ දැක්වීම

4.1 මෙම විධානයේ,

අ) "පාලිත" සහ "ආශ්‍රිත" යන්නට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි භාවිතා කරන අර්ථ ගෙනදේ.

ආ) "පවත්නා වෙළඳපොල වටිනාකම" යන්නෙන් කැමැත්තක් ඇති ගැණුම්කාර හා විකුණුම්කාර පාර්ශවයන් අතර අපක්ෂපාතී පදනමකින් සිදුවන ගණුදෙනුවකදී වත්කමක් හුවමාරු විය යුතු අගය ලෙස බලපත්‍ර ලත් තක්සේරුකරුවකු විසින් තීරණය කරනු ලබන තක්සේරු වටිනාකම අදහස් වේ.

ඇ) "අධ්‍යක්ෂ" යන්නෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ ක්ෂුද්‍රමූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ අදහස් වේ.

ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
**මුදල් මණ්ඩලයේ සභාපති**
**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති**

මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන විධානය 2017 අංක 1 2017 ජනවාරි 13

## මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබා දීමේදී වටිනාකම් මත ණය අනුපාත

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 12 වන වගන්තිය යටතේ නිකුත් කරන ලදී.

මෝටර් වාහන මිලදී ගැනීමේ හෝ භාවිතා කිරීමේ අරමුණු සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් ප්‍රදානය කරනු ලබන ණය පහසුකම් වෙනුවෙන් වටිනාකම් මත ණය අනුපාත හඳුන්වා දීම සඳහා, මුදල් මණ්ඩලය විසින් පහත විධානයන් නිකුත් කරනු ලැබේ.

1. මුදල් ව්‍යාපාර පනත යටතේ බලගැන්වීම

1.1 මුදල් ව්‍යාපාර පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව, මුදල් සමාගම්වලට හෝ යම් කණ්ඩායමකට හෝ වර්ගයකට අයත් මුදල් සමාගම්වලට එම සමාගම්වල ව්‍යාපාර සහ ආයතනික කටයුතුවල යම් අංගයක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් මුදල් මණ්ඩලයට විධාන නිකුත් කළ හැකිය.

2. උපරිම වටිනාකම් මත ණය අනුපාත

2.1 2017 ජනවාරි 16 සිට, මෝටර් වාහන මිලදී ගැනීමේ හෝ භාවිතා කිරීමේ අරමුණු සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් ලබාදෙන ණය පහසුකම එම වාහන වල වෙළඳපොල වටිනාකමෙන් පහත දැක්වෙන ප්‍රතිශත වටිනාකම නොඉක්මවිය යුතුය.

(i) ලියාපදිංචි නොකල වාහන සහ පළමු ලියාපදිංචියෙන් පසු වසරකට වඩා අඩු කාලයක් ශ්‍රී ලංකාව තුළ භාවිතා කරන ලද ලියාපදිංචි වාහන සම්බන්ධයෙන්,

අ. වාණිජ වාහන (ලොරි සහ බර වාහන) සඳහා සියයට 90;

ආ. මෝටර් කාර්, ක්‍රීඩා උපයෝගි වාහන (SUV) සහ වෑන් රථ සඳහා සියයට 50;

ඇ. ත්‍රීරෝද රථ සඳහා සියයට 25; සහ

ඈ. වෙනත් ඕනෑම වාහන සඳහා සියයට 70ක් වේ.

(ii) පළමු ලියාපදිංචියෙන් පසු වසරකට වඩා වැඩි කාලයක් ශ්‍රී ලංකාව තුළ භාවිතා කරන ලද ලියාපදිංචි වාහන සම්බන්ධව සියයට 70 ක් වේ.

3. උපරිම වටිනාකම් මත ණය අනුපාතයෙන් නිදහස් කිරීම්

3.1 සංචාරක සහ / හෝ ප්‍රවාහන කටයුතු වල නිරත ඕනෑම සමාගමකට ඒවායේ මූලික ව්‍යාපාර කටයුතු සඳහා උපයෝගි කරගැනීමට වාහන සංචිත මිලදී ගැනීමේදී ප්‍රදානය කරනු ලබන ණය පහසුකම් සඳහා ඉහත විධාන 2හි සඳහන් සීමාවන් අදාල නොවේ. එසේ වුවද, එලෙස මූල්‍යනය කරන ලද වාහන පළමු ලියාපදිංචි කිරීමේ දින සිට වසරක් ඇතුළත කිසිදු පුද්ගලයෙකුට හෝ ආයතනයකට පැවරීම සිදු කල නොහැක.

3.2 මෙම වාහන ප්‍රභේදය සඳහා ණය පහසුකම් ලබාදීමේදී බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් අභ්‍යන්තර සීමාවන් පවත්වා ගත යුතු අතර ප්‍රමාණවත් අවදානම් කළමනාකරණ ක්‍රමවේදයන් අනුගමනය කල යුතුය.

4. වාහන සඳහා වෙනත් ණය පහසුකම්

4.1 ඉහත 2 හා 3 විධානයන්ට අනුව ප්‍රදානය කරන ලද ණය පහසුකම් හැර, මෝටර් වාහන මිලදී ගැනීමේ හෝ භාවිතා කිරීමේ අරමුණු සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් ණය පහසුකම් ප්‍රදානය නොකළ යුතුය.

5. අර්ථ නිරූපන

5.1 මෙම විධානයන්හි,

i. ණය පහසුකම් යන්නෙන් කල්බදු මූල්‍යකරණ, කුලී සින්නක්කර පහසුකම් සහ මෝටර් වාහන මිලදී ගැනීමේ හෝ භාවිතා කිරීමේ අරමුණු සඳහා ප්‍රදානය කරන වෙනත් ණය පහසුකම් අදහස් වේ.

ii. ණය පහසුකම ප්‍රදානය කරනු ලබන අවස්ථාවේදී පවත්නා ක්‍රියාපටිපාටියට අනුව වෘත්තිය තක්සේරු-කරුවෙකු වෙතින් ලබා ගන්නා වෙළඳපොල වටිනාකම, මෝටර් වාහනයේ වටිනාකම ලෙස සැලකිය යුතුය.

| | | |
|---|---|---|
| 6. | පෙර විධානයන් අහෝසි කිරීම් | 6.1 මෙයින්, පහත දැක්වෙන විධානයන් අහෝසි කෙරේ.<br>i. 2015 අංක 01 දරන මුදල් සමාගම් (මෝටර් වාහන සඳහා ණය සහ අත්තිකාරම් ලබා දීමේදී වටිනාකම මත ණය අනුපාතය) විධානය<br>ii. 2015 අංක 02 දරන මුදල් සමාගම් (මෝටර් වාහන සඳහා ණය සහ අත්තිකාරම් ලබා දීමේදී වටිනාකම මත ණය අනුපාතය) විධානය |

ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
**මුදල් මණ්ඩලයේ සභාපති සහ**
**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති**

**මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන විධානය 2017 අංක 2** 2017 පෙබරවාරි 23

## අවම මූලික ප්‍රාග්ධනය

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතෙහි 12 සහ 17 වන වගන්ති වලින් පැවරී ඇති බලතල අනුව බලපත්‍රලාභී මුදල් සමාගම් අංශයේ සුරක්ෂිතභාවය හා අඛණ්ඩ පැවැත්ම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් ඒකාබද්ධ වීම සඳහා උනන්දු කිරීමේ අරමුණින් බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් පවත්වා ගත යුතු අවම මූලික ප්‍රාග්ධන ප්‍රමාණය සම්බන්ධව මුදල් මණ්ඩලය විසින් පහත දැක්වෙන විධානයන් නිකුත් කරනු ලැබේ.

| | | |
|---|---|---|
| 1. | අවම මූලික ප්‍රාග්ධනය | 1.1 සෑම බලපත්‍රලාභී මුදල් සමාගමක්ම 2017.12.31 දින තෙක් රුපියල් මිලියන 400 කට නොඅඩු මට්ටමක ක්ෂය නොවූ මූලික ප්‍රාග්ධන ප්‍රමාණයක් පවත්වා ගත යුතු අතර, ඉන්පසු පහත දක්වා ඇති ප්‍රමාණයට නොඅඩු වටිනාකමකින් යුත් ක්ෂය නොවූ මූලික ප්‍රාග්ධන ප්‍රමාණයක් පවත්වා ගත යුතුය.<br>(i) 2018.01.01 දින සිට රුපියල් බිලියන 1.0<br>(ii) 2019.01.01 දින සිට රුපියල් බිලියන 1.5<br>(iii) 2020.01.01 දින සිට රුපියල් බිලියන 2.0<br>(iv) 2021.01.01 දින සිට රුපියල් බිලියන 2.5 |
| 2. | අනුකූලතාව සුරක්ෂිත කිරීම සඳහා ගනු ලබන නියාමන ක්‍රියාමාර්ග | 2.1 බලපත්‍රලාභී මුදල් සමාගම් ඉහත විධානයන් සමග අනුකූල නොවන අවස්ථාවකදී, අධ්‍යක්ෂ විසින් පහත දැක්වෙන ක්‍රියාමාර්ග එකක් හෝ කිහිපයක් ගනු ලැබේ.<br>(i) එවැනි බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා තැන්පතු වගකීම් සහ ණයගැනීම් මත උපරිම සීමාවන් පැනවීම.<br>(ii) එවැනි බලපත්‍රලාභි මුදල් සමාගම් වල ලාභාංශ හෝ ලාභ බෙදා හැරීම අත්හිටුවීම.<br>(iii) එවැනි බලපත්‍රලාභි මුදල් සමාගම් වල ව්‍යාපාර මෙහෙයුම් ව්‍යාප්ත කිරීම සීමා කිරීම.<br>2.2 මෙම අනුකූල නොවීම් නිවැරදි කල පසු අධ්‍යක්ෂ විසින් ඉහත නියාමන ක්‍රියාමාර්ග ඉවත්කරනු ලැබේ. |
| 3. | අර්ථ නිරූපන | 3.1 මෙම විධානයන්හි,<br>(i) "මූලික ප්‍රාග්ධනය" යන්නෙහි අර්ථය 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතෙහි දක්වා ඇති අර්ථයම වේ.<br>(ii) "අධ්‍යක්ෂ" යන්නෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා අදහස් වේ. |
| 4. | පෙර විධානය අහෝසි කිරීම | 4.1 2011 අංක 01 දරන මුදල් සමාගම් (අවම මූලික ප්‍රාග්ධනය) විධානය මෙමගින් අහෝසි කෙරේ. |

ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
**මුදල් මණ්ඩලයේ සභාපති සහ**
**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති**

**මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන විධානය 2017 අංක 3** 2017 පෙබරවාරි 17

## මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබා දීමේදී වටිනාකම් මත ණය අනුපාත විධානය සංශෝධනය කිරීම

මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද 2017 අංක 1 දරන විධානයන්හි, විධාන අංක 5 හි සඳහන් අර්ථ නිරූපනයන් පහත දැක්වෙන කොටස මගින් ප්‍රතිස්ථාපනය කර සංශෝධනය කෙරේ.

| | | |
|---|---|---|
| 5. | අර්ථ නිරූපන | 5.1 ණය පහසුකම් යන්නෙන් කල්බදු මූල්‍යකරණ, කුලී සින්නක්කර පහසුකම් සහ මෝටර් වාහන මිලදී ගැනීමේ හෝ භාවිතා කිරීමේ අරමුණු සඳහා ප්‍රදානය කරන වෙනත් ණය පහසුකම් අදහස් වේ. |

5.2 මෝටර් වාහනයේ වටිනාකම යන්නෙන් වෙළඳපොල වටිනාකම අදහස් වේ. මෝටර් වාහන වල වටිනාකම තක්සේරු කිරීමේදී බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා පහත දැක්වෙන ක්‍රම උපයෝගි කළ හැක.

(i) අළුත්ම වාහන සඳහා - බලයලත් නියෝජිතයෙකු විසින් දෙනු ලබන වටිනාකම

(ii) පාවිච්චි කර මෙරටට ආනයනය කරනු ලබන වාහන සඳහා - රේගුවේදී සලකා බලන ලද වටිනාකම හෝ වාහන වෙළඳ ආයතන විසින් ලබා දෙන වටිනාකම

(iii) ලියාපදිංචි වාහන සඳහා - වෘත්තීය තක්සේරුකරුවෙකු විසින් ලබාදෙන වටිනාකම

5.3 වාහනයේ තක්සේරු වටිනාකම ණය පහසුකම ප්‍රදානය කරන අවස්ථාවේදීම ලබා ගැනීම සහ එමගින් නිවැරදි හා සාධාරණ වටිනාකමක් සැපයීම බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් සහතික කල යුතුය.

5.4 මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති වාහන පන්ති මෙම විධානයෙහි අරමුණ සඳහා පහත දැක්වෙන වගු අංක 01 අනුව වර්ගීකරණය කල හැක.

**වගු අංක 01 - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාහන පන්ති වර්ගීකරණය**

| වාහන වර්ගය | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාහන පන්තිය | වටිනාකම් මත ණය අනුපාතය |
|---|---|---|
| වාණිජ වාහන (ලොරි සහ බර වාහන) | C1, C, CE, DE,G1, G, J | 90% |
| මෝටර් කාර්, ක්‍රීඩා උපයෝගි වාහන (SUV) හා වෑන් රථ | B, D1, D | 50% |
| ත්‍රී රෝද රථ | B1 | 25% |
| වෙනත් ඕනෑම වාහන | A1, A | 70% |

5.5 විධාන 3.1 හි සඳහන් වාහන සංචිත යන්නෙන් වාහන දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් අදහස් වේ.

5.6 විධාන 3.1 හි සඳහන් සංචාරක කටයුතු වල නිරත සමාගමක් යන්නෙන් සංචාරක කටයුතු වෙනුවෙන් සේවා සැපයීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය හෝ වෙනත් අධිකාරියක් සමග ලියාපදිංචි වී ඇති සමාගමක් අදහස් වේ.

5.7 විධාන 3.1 හි සඳහන් ප්‍රවාහන කටයුතු වල නිරත සමාගමක් යන්නෙන් භාණ්ඩ හෝ මගීන් ප්‍රවාහනය කිරීමේ ව්‍යාපාර අරමුණු සඳහා ඕනෑම රාජ්‍ය අධිකාරියක් සමග ලියාපදිංචි වී ඇති ඕනෑම ව්‍යාපාර ආයතනයක් අදහස් වේ.

5.8 2016 ජනවාරි 16 දිනට හෝ ඊට ප්‍රථම ණය සඳහා අයදුම්පත ලැබී ඇති හෝ බලපත්‍රලාභී මුදල් සමාගමක් විසින් ණය පහසුකම අනුමත කර ඇති හෝ සියලුම වාහන සඳහා වටිනාකම් මත ණය අනුපාතය 70%ක් වන සේ ණය පහසුකම අනුමත කල හැක.

ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
**මුදල් මණ්ඩලයේ සභාපති සහ**
**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති**

**මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන විධානය 2017 අංක 4** 2017 ජූනි 02

## මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබා දීමේදී වටිනාකම් මත ණය අනුපාත විධානය සංශෝධනය කිරීම

මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද 2017 අංක 3 දරන මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබා දීමේදී වටිනාකම් මත ණය අනුපාත සංශෝධිත විධානයෙහි, විධාන අංක 5.1 හා 5.4 පහත දැක්වෙන කොටස් මගින් ප්‍රතිස්ථාපනය කර සංශෝධනය කෙරේ.

5. අර්ථ නිරූපන 5.1 ණය පහසුකම් යන්නෙන් අවසාන පාරිභෝගිකයා වෙත ප්‍රදානය කරනු ලබන කල්බදු මූල්‍යකරණ, කුලී සින්නක්කර පහසුකම් සහ මෝටර් වාහන මිලදී ගැනීමේ හෝ භාවිතා කිරීමේ අරමුණු සඳහා ලබාදෙන වෙනත් ණය පහසුකම් අදහස් වේ.

5.4 මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති වාහන පන්ති මෙම විධානයෙහි අරමුණ සඳහා පහත දැක්වෙන වගු අංක 01 අනුව වර්ගීකරණය කල හැක.

**වගු අංක 01 - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාහන පන්ති වර්ගීකරණය**

| වාහන වර්ගය | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාහන පන්තිය | වටිනාකම් මත ණය අනුපාතය |
|---|---|---|
| වාණිජ වාහන | C1, C, CE, D1, D, DE, G1, G, J | 90% |
| මෝටර් කාර්, ක්‍රීඩා උපයෝගී වාහන (SUV) හා වෑන් රථ | B ((සැහැල්ලු ට්‍රක්රථ සහ තනි ආසන (single cab) කැබ් රථ හැර)) | 50% |
| ත්‍රී රෝද රථ | B1 | 25% |
| වෙනත් ඕනෑම වාහන | A1, A, B පන්තිය යටතේ වර්ගීකරණය කර | |
| | ඇති සැහැල්ලු ට්‍රක්රථ සහ තනි ආසන (single cab) | 70% |

ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
**මුදල් මණ්ඩලයේ සභාපති සහ**
**ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති**

**චක්‍රලේඛය 2017 අංක 1** 2017 මැයි 30

## ගංවතුරින් පීඩාවට පත් ගනුදෙනුකරුවන් වෙත ප්‍රදානය කර තිබූ ණය පහසුකම් සඳහා සහන සැලසීම

මෑතකදී ඇතිවූ ගංවතුර, අහිතකර කාලගුණික තත්වයන් සහ ඒ හා සම්බන්ධිත ආපදා අවස්ථාවන්ගෙන් පීඩාවට පත් බලපත්‍රලාභී මුදල් සමාගම්/ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල ණයගනුදෙනුකරුවන්ගේ ව්‍යාපාර කටයුතු යථා තත්වයට පත්කර ගැනීමට හා සාමාන්‍ය මෙහෙයුම් කටයුතු පවත්වා ගැනීම සඳහා පහසුකම් සැලසීමේ ජාතික ප්‍රතිපත්තියක් ලෙස, පොදු යහපත සඳහා එවන් ණයගනුදෙනුකරුවන් වෙත අවස්ථානුකූල කරුණු අනුව පහත දැක්වෙන සහනයන් ප්‍රදානය කල හැක.

| | | | |
|---|---|---|---|
| 1. | පමා සහනය | 1.1 | අද දින සිට බලපැවැත්වෙන පරිදි ගංවතුර, අහිතකර කාලගුණික තත්වයන් සහ ඒ හා සම්බන්ධිත ආපදා අවස්ථාවන්ගෙන් අහිතකර බලපෑමට ලක්වූ ණය ගනුදෙනුකරුවන්ගේ 2017 මැයි 25 දිනට පැවති සියලුම සක්‍රීය ණය පහසුකම් සඳහා මාස 3 ක් නොඉක්මවන පමා සහනයක් ලබා දීම. |
| 2. | දඩ පොලිය | 2.1 | ඉහත පමා සහනය සඳහා යටත් වන ණය ගනුදෙනුකරුවන් සහ අහිතකර බලපෑම් වලට ලක්වූ අක්‍රීය ණය ගනුදෙනුකරුවන්, බලපත්‍රලාභී මුදල් සමාගම් හා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සමග එකඟ වූ පරිදි නැවත සැලසුම් කරන ලද කොන්දේසි යටතේ තම ව්‍යාපාර කටයුතු යලි ආරම්භ කිරීමෙන් / ප්‍රතිව්‍යුහගත කිරීමෙන් ණය පියවීම සඳහා කැමැත්තක් දක්වන්නේ නම් හිඟ ණය වෙනුවෙන් අය කරනු ලබන දඩ පොලිය කපා හැරීම. |
| 3. | වාර්තා කිරීම | 3.1 | අදාල සහන ප්‍රදානය කිරීම සනාථ කිරීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් හා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් සුදුසු ලේඛණ පවත්වා ගත යුතුය. |
| | | 3.2 | අදාල ණය ගනුදෙනුකරුවන්ගේ තොරතුරු බලපත්‍රලාභී මුදල් සමාගම් හා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් මේ සමග අමුණා ඇති ආකෘතිය මගින් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත 2017 ජූලි 30 දිනට පෙර වාර්තා කළ යුතුය. |

යූ. පී. අලවත්තගේ
**අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය ආයතන**
**අධීක්ෂණ දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

ඇමුණුම

2017 අංක 1 දරන චක්‍රලේඛය

**ගංවතුරින් පීඩාවට පත් ණය ගනුදෙනුකරුවන් වෙත ප්‍රදානය කල ණය පහසුකම් සඳහා සහන සැලසීම**

**මෑතකදී ඇතිවූ ගංවතුරින් පීඩාවට පත් ණය ගනුදෙනුකරුවන්ගේ තොරතුරු**

බලපත්‍රලාභී මුදල් සමාගමේ / විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමේ නම :

| අනු අංකය | ණය ගනුදෙනුකරුගේ නම | ශාඛාවේ නම | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ණය පහසුකමෙහි අරමුණ | හිඟ හිටි මුදල (රු. '000) (2017.05.25 දිනට) |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |

ඉහත වාර්තාවේ ඉදිරිපත් කරනු ලබන තොරතුරු මගේ දැනුම හා විශ්වාසය අනුව නිවැරදි බවට සහතික කරමි.

නම සහ බලයලත් නිලධාරියාගේ තනතුර

කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරනු ලබන විධානය 2017 අංක 1 2017 පෙබරවාරි 16

## මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබා දීමේදී වටිනාකම් මත ණය අනුපාත

**2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ 34 වන වගන්තිය යටතේ නිකුත් කරන ලදී.**

මෝටර් වාහන මිලදී ගැනීමේ හෝ භාවිතා කිරීමේ අරමුණු සඳහා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් ප්‍රදානය කරනු ලබන ණය පහසුකම් වෙනුවෙන් වටිනාකම් මත ණය අනුපාත හඳුන්වා දීම සඳහා, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (මෙහි මින්මතු "අධ්‍යක්ෂ" යනුවෙන් සඳහන් කරනු ලබන) විසින් පහත විධානයන් නිකුත් කරනු ලැබේ.

1. කල්බදු මූල්‍යකරණ පනත යටතේ බලගැන්වීම

1.1 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ 34 වන වගන්තිය ප්‍රකාරව, එම පනතේ 3 වන වගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධානයන්ට අනුව ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන ලෙස සඳහන් කරන පොදු සමාගම් වලට (මෙහි මින්මතු "විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම" යනුවෙන් සඳහන් කරනු ලබන සමාගම් වලට) පොදු විධාන නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ වෙත බලතල පැවරී ඇත.

2. උපරිම වටිනාකම් මත ණය අනුපාත

2.1 2017 ජනවාරි 16 සිට, මෝටර් වාහන මිලදී ගැනීමේ හෝ භාවිතා කිරීමේ අරමුණු සඳහා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් ලබාදෙන ණය පහසුකම එම වාහන වල වෙළඳපොල වටිනාකමෙන් පහත දැක්වෙන ප්‍රතිශත වටිනාකම නොඉක්මවිය යුතුය.

(i) ලියාපදිංචි නොකල වාහන සහ පළමු ලියාපදිංචියෙන් පසු වසරකට වඩා අඩු කාලයක් ශ්‍රී ලංකාව තුළ භාවිතා කරන ලද ලියාපදිංචි වාහන සම්බන්ධයෙන්,

අ. වාණිජ වාහන (ලොරි සහ බර වාහන) සඳහා සියයට 90;

ආ. මෝටර් කාර්, ක්‍රීඩා උපයෝගි වාහන (SUV) සහ වෑන් රථ සඳහා සියයට 50;

ඇ. ත්‍රීරෝද රථ සඳහා සියයට 25; සහ

ඈ. වෙනත් ඕනෑම වාහන සඳහා සියයට 70ක් වේ.

(ii) පළමු ලියාපදිංචියෙන් පසු වසරකට වඩා වැඩි කාලයක් ශ්‍රී ලංකාව තුළ භාවිතා කරන ලද ලියාපදිංචි වාහන සම්බන්ධව සියයට 70 ක් වේ.

3. උපරිම වටිනාකම් මත ණය අනුපාතයෙන් නිදහස් කිරීම්

3.1 සංචාරක සහ / හෝ ප්‍රවාහන කටයුතු වල නිරත ඕනෑම සමාගමකට ඒවායේ මූලික ව්‍යාපාර කටයුතු සඳහා උපයෝගි කරගැනීමට වාහන සංචිත මිලදී ගැනීමේදී ප්‍රදානය කරනු ලබන ණය පහසුකම් සඳහා ඉහත විධාන 2හි සඳහන් සීමාවන් අදාල නොවේ. එසේ වුවද, එලෙස මූල්‍යනය කරන ලද වාහන පළමු ලියාපදිංචි කිරීමේ දින සිට වසරක් ඇතුළත කිසිදු පුද්ගලයෙකුට හෝ ආයතනයකට පැවරීම සිදු කල නොහැක.

3.2 මෙම වාහන ප්‍රභේදය සඳහා ණය පහසුකම් ලබාදීමේදී විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් අභ්‍යන්තර සීමාවන් පවත්වා ගත යුතු අතර ප්‍රමාණවත් අවදානම් කළමනාකරණ ක්‍රමවේදයන් අනුගමනය කල යුතුය.

4. වාහන සඳහා වෙනත් ණය පහසුකම්

4.1 ඉහත 2 හා 3 විධානයන්ට අනුව ප්‍රදානය කරන ලද ණය පහසුකම් හැර, මෝටර් වාහන මිලදී ගැනීමේ හෝ භාවිතා කිරීමේ අරමුණු සඳහා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් ණය පහසුකම් ප්‍රදානය නොකළ යුතුය.

5\. අර්ථ නිරූපන 5.1 මෙම විධානයන්හි,

i. ණය පහසුකම් යන්නෙන් කල්බදු මූල්‍යකරණ, කුලී සින්නක්කර පහසුකම් සහ මෝටර් වාහන මිලදී ගැනීමේ හෝ භාවිතා කිරීමේ අරමුණු සඳහා ප්‍රදානය කරන වෙනත් ණය පහසුකම් අදහස් වේ.

ii. ණය පහසුකම ප්‍රදානය කරනු ලබන අවස්ථාවේදී පවත්නා ක්‍රියාපටිපාටියට අනුව වෘත්තිය තක්සේරුකරුවෙකු වෙතින් ලබා ගන්නා වෙළඳපොල වටිනාකම, මෝටර් වාහනයේ වටිනාකම ලෙස සැලකිය යුතුය.

6\. පෙර විධානයන් අහෝසි කිරීම් 6.1 මෙයින්, පහත දැක්වෙන විධානයන් අහෝසි කෙරේ.

i. 2015 අංක 01 දරන කල්බදු මූල්‍යකරණ (මෝටර් වාහන සඳහා ණය සහ අත්තිකාරම් ලබා දීමේදී වටිනාකම මත ණය අනුපාතය) විධානය

ii. 2015 අංක 02 දරන කල්බදු මූල්‍යකරණ (මෝටර් වාහන සඳහා ණය සහ අත්තිකාරම් ලබා දීමේදී වටිනාකම මත ණය අනුපාතය) විධානය

යූ. පී. අලවත්තගේ
**අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය ආයතන**
**අධීක්ෂණ දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

**කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරනු ලබන විධානය 2017 අංක 2** 2017 පෙබරවාරි 17

## මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබා දීමේදී වටිනාකම් මත ණය අනුපාත විධානය සංශෝධනය කිරීම

කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරන ලද 2017 අංක 1 දරන විධානයන්හි, විධාන අංක 5 හි සඳහන් අර්ථ නිරූපනයන් පහත දැක්වෙන කොටස මගින් ප්‍රතිස්ථාපනය කර සංශෝධනය කෙරේ.

5\. අර්ථ නිරූපන

5.1 ණය පහසුකම් යන්නෙන් කල්බදු මූල්‍යකරණ, කුලී සින්නක්කර පහසුකම් සහ මෝටර් වාහන මිලදී ගැනීමේ හෝ භාවිතා කිරීමේ අරමුණු සඳහා ප්‍රදානය කරන වෙනත් ණය පහසුකම් අදහස් වේ.

5.2 මෝටර් වාහනයේ වටිනාකම යන්නෙන් වෙළඳපොල වටිනාකම අදහස් වේ. මෝටර් වාහන වල වටිනාකම තක්සේරු කිරීමේදී විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා පහත දැක්වෙන ක්‍රම උපයෝගි කළ හැක.

i. අළුත්ම වාහන සඳහා - බලයලත් නියෝජිතයෙකු විසින් දෙනු ලබන වටිනාකම

ii. පාවිච්චි කර මෙරටට ආනයනය කරනු ලබන වාහන සඳහා - රේගුවේදී සලකා බලන ලද වටිනාකම හෝ වාහන වෙළඳ ආයතන විසින් ලබා දෙන වටිනාකම

iii. ලියාපදිංචි වාහන සඳහා - වෘත්තීය තක්සේරුකරුවෙකු විසින් ලබාදෙන වටිනාකම

5.3 වාහනයේ තක්සේරු වටිනාකම ණය පහසුකම ප්‍රදානය කරන අවස්ථාවේදීම ලබා ගැනීම සහ එමගින් නිවැරදි හා සාධාරණ වටිනාකමක් සැපයීම විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් සහතික කල යුතුය.

5.4 මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති වාහන පන්ති මෙම විධානයෙහි අරමුණ සඳහා පහත දැක්වෙන වගු අංක 01 අනුව වර්ගීකරණය කල හැක.

**වගු අංක 01 - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාහන පන්ති වර්ගීකරණය**

| වාහන වර්ගය | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාහන පන්තිය | වටිනාකම් මත ණය අනුපාතය |
|---|---|---|
| වාණිජ වාහන (ලොරි සහ බර වාහන) | C1, C, CE, DE, G1, G, J | 90% |
| මෝටර් කාර්, ක්‍රීඩා උපයෝගි වාහන (SUV) හා වෑන් රථ | B, D1, D | 50% |
| ත්‍රී රෝද රථ | B1 | 25% |
| වෙනත් ඕනෑම වාහන | A1, A | 70% |

5.5 විධාන 3.1 හි සඳහන් වාහන සංචිත යන්නෙන් වාහන දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් අදහස් වේ.

5.6 විධාන 3.1 හි සඳහන් සංචාරක කටයුතු වල නිරත සමාගමක් යන්නෙන් සංචාරක කටයුතු වෙනුවෙන් සේවා සැපයීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය හෝ වෙනත් අධිකාරියක් සමග ලියාපදිංචි වී ඇති සමාගමක් අදහස් වේ.

5.7 විධාන 3.1 හි සඳහන් ප්‍රවාහන කටයුතු වල නිරත සමාගමක් යන්නෙන් භාණ්ඩ හෝ මගීන් ප්‍රවාහනය කිරීමේ ව්‍යාපාර අරමුණු සඳහා ඕනෑම රාජ්‍ය අධිකාරියක් සමග ලියාපදිංචි වී ඇති ඕනෑම ව්‍යාපාර ආයතනයක් අදහස් වේ.

5.8 2016 ජනවාරි 16 දිනට හෝ ඊට ප්‍රථම ණය සඳහා අයදුම්පත ලැබී ඇති හෝ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගමක් විසින් ණය පහසුකම අනුමත කර ඇති හෝ සියලුම වාහන සඳහා වටිනාකම් මත ණය අනුපාතය 70%ක් වන සේ ණය පහසුකම අනුමත කල හැක.

යූ. පී. අලවත්තගේ
**අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය ආයතන**
**අධීක්ෂණ දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

**කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරනු ලබන විධානය 2017 අංක 3** 2017 ජූනි 02

## මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබා දීමේදී වටිනාකම් මත ණය අනුපාත විධානය සංශෝධනය කිරීම

කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරන ලද 2017 අංක 2 දරන මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබා දීමේදී වටිනාකම් මත ණය අනුපාත සංශෝධිත විධානයෙහි, විධාන අංක 5.1 හා 5.4 පහත දැක්වෙන කොටස් මගින් ප්‍රතිස්ථාපනය කර සංශෝධනය කෙරේ.

5. අර්ථ නිරූපන 5.1 ණය පහසුකම් යන්නෙන් අවසාන පාරිභෝගිකයා වෙත ප්‍රදානය කරනු ලබන කල්බදු මූල්‍යකරණ, කුලී සින්නක්කර පහසුකම් සහ මෝටර් වාහන මිලදී ගැනීමේ හෝ භාවිතා කිරීමේ අරමුණු සඳහා ලබාදෙන වෙනත් ණය පහසුකම් අදහස් වේ.

5.4 මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති වාහන පන්ති මෙම විධානයෙහි අරමුණ සඳහා පහත දැක්වෙන වගු අංක 01 අනුව වර්ගීකරණය කල හැක.

**වගු අංක 01 - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාහන පන්ති වර්ගීකරණය**

| වාහන වර්ගය | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාහන පන්තිය | වටිනාකම් මත ණය අනුපාතය |
|---|---|---|
| වාණිජ වාහන | C1, C, CE, D1, D, DE, G1, G, J | 90% |
| මෝටර් කාර්, ක්‍රීඩා උපයෝගි වාහන (SUV) හා වෑන් රථ | B ((සැහැල්ලු ට්‍රක්රථ සහ තනි ආසන (single cab) කැබ් රථ හැර)) | 50% |
| ත්‍රී රෝද රථ | B1 | 25% |
| වෙනත් ඕනෑම වාහන | A1, A, B පන්තිය යටතේ වර්ගීකරණය කර ඇති සැහැල්ලු ට්‍රක්රථ සහ තනි ආසන (single cab) | 70% |

යූ. පී. අලවත්තගේ
**අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය ආයතන**
**අධීක්ෂණ දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව**